

සිංහල

තෙපිටකාටීවණ්ණනා.

සිංහල

චයස්ථාපිටකාථවණ්ණනා

—/—

අම්බලම්ගොඩ

සුභූතාරාම මහාවිහාරාධිපති විද්‍යාලෝක විශ්වවිද්‍යාලය පරිවේණාධිකාරී
ශ්‍රී සද්ධම්මාරතීශ්වර ධම්කීර්ති ශ්‍රී

විලේගොඩ ධම්මානන්දාභිධාන

අමරපුර නිකායේ අධිකරණ නායක මහාසඵවිරයන් වහන්සේ විසින්

ප්‍රණීතය.

දෙවන මුද්‍රණය

සීමාසහිත

සවහාෂා ප්‍රකාශකයෝ

කොළඹ 10

2506

පළමු වන මුද්‍රණය 1938
දෙ වන මුද්‍රණය 1962

මුද්‍රණය:
සීමාසහිත සෙනසුරා ප්‍රකාශකයෝ
29, මාලිගාකන්ද පාර,
කොළඹ 10.

විශෙෂ නිවේදනය

(දෙ වන මුද්‍රණය)

අපගේ භ්‍රාතෘවර සමාදෘත විනිශ්චයකාරක එච්. ද ඇස්. කුලරත්න නීතීඥ තුමාගේ සමාරාධනය පරිදි අම්බලම්ගොඩ සුනඤ්ඤරාම මහාවිහාරාධිපති විද්‍යාලොක විශ්වවිද්‍යාලය පරිවේණාධිශ්වර ශ්‍රී සඛ්ඛීහාරතීශ්වර ධර්මකීර්ති ශ්‍රී විජ්ජොඩ ධම්මානන්දඝ්‍රිධාන අමරපුරනිකායේ අධිකරණ නායක සංඝරත්නයන් වහන්සේ විසින් සිංහලෙට නගනලද මේ ග්‍රන්ථය අප භ්‍රාතෘවරයාගේම ධනව්‍ය-යෙන් මීට තෙතිස් වසකට පෙර මුද්‍රණවාරයෙන් ප්‍රවාරිත විය.

බෞද්ධ මහජනතාවට අතිශයින් ප්‍රයෝජනවත් වූ මේ ග්‍රන්ථයෙහි ප්‍රථම මුද්‍රණය පිළිබඳ පොත් සියල්ලම ඒ කාලයෙහි-දීම අවසානවූ නමුත් දෙවන මුද්‍රණය මේතාක් ප්‍රමාදව පවත්නා බව දැනගත් මාවිසින් ග්‍රන්ථ කතෘන් වහන්සේගේ ද අප භ්‍රාතෘවර එච්. ද ඇස්. කුලරත්න නීතීඥ තුමාගේ ප්‍රිය පුත්‍ර දෙස්තර ඩී. ජී. ද ඇස්. කුලරත්න මහතාගේ ද අවසරය අනුව සීමාසහිත සවභාෂා ප්‍රකාශකයෝ සමාගම් ලවා මෙම ද්විතීය මුද්‍රාඞ්කණය කරවන ලදී.

මේ සඳහා අප උනන්දුකළ කළුතර පුලිනතලාරාම මහා විහාරාධිපති අතිගරු අගගම්භාපණ්ඩිත ඩේරුවල ශ්‍රී සුමංගල ශ්‍රී නිවාසාභිධාන අමරපුරනිකායේ මහානායක මාහිම්යන් වහන්සේටද, මේවර මුද්‍රණයේදී යථාවකාශ පරිදි ශොධ්‍ය පත්‍ර බලා දුන් විද්‍යාලොක විශ්වවිද්‍යාලය පිරිවෙතේ උප ප්‍රධානාචාර්‍ය පණ්ඩිත ඇන්දගනේ දඟානන්ද ස්ථවිරයන් වහන්සේටද අපගේ ගෞරවාදර සතුතිය මෙහිලා පළවිය යුතුය.

මෙයට,

පී. ද ඇස්. කුලරත්න

කළමනාකාර අධ්‍යක්ෂක.

සීමාසහිත සවභාෂා ප්‍රකාශකයෝ

සංඥාපනය

පළමුවැනි මුද්‍රණය

——(o)——

ශ්‍රී සාර විරාජිත වූ දෙවාතිදෙව වූ සම්නහඳ වූ අප තථාගත යන් වහන්සේ විසින් පන්සාළිස් වසක් මුළුල්ලෙහි අනන්ත සත්ව ඝිතාභිවෘඬිය පිණිස දෙශනා කොට වදාරන ලද සුවාසූ දහසක් ධම්මක්ඛන්ධය වනාහි ජම්බුවිපයෙහි බෞද්ධමතය සෞගතවාදය යන නාමයන්ගෙනුදු ප්‍රසිද්ධියට පැමිණියේය. තද්ධම්ය වනාහි ධම්සවාමිවූ තථාගතයන් වහන්සේගේ පරිනිර්ණයෙන් සත් වන දවස්හි සුභද්‍ර නම් මහලු පැවිද්ද විසින් "අලං ආවුසො මා සොචිත්ථ, මා පරිදෙවිත්ථ, සුමුත්තාමයං තෙන මහාසමණෙන, උපද්දුතාව හොම ඉදං වො කප්පති ඉදං න කප්පතීති; ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම; යං න ඉච්ඡිස්සාම තං න කරිස්සාම" යයි කියන ලද අහද්‍ර භාෂිතය සිහි කරන්නා වූ එකල සඞ්ඝ ස්ථවිර වූ ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ අනාගතයෙහිදු සඞ්ඝයාගේ විරසථිතිය කැමැත්තෝ මහ ධෛශාඛ වූ අජාතශත්තු මහරජාණන්ගේ සාහාය්‍යයෙන් සිවු පිළිසිඹියා පත් පන්සියයක් මහ රහතුන් වහන්සේ සමඟ තථාගත පරිනිර්ණයෙන් තුන්මසක් ගිය කල රජගහ නුවර වෙහාර පර්ත පාර්ශ්වයෙහි වූ සත්තපණ්ණි ගුහාවාරයෙහි කරන ලද විචිත්‍ර ධම් මණ්ඩපයෙහි දී උපාලි ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට විනයද, ආනන්ද ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට ධම්මදෑයි මෙලෙස සත් මසකින් සඞ්ගායනාරූඪ කළ සේක.

මේ ප්‍රථම සඞ්ගීති නොමෝ පන්සියයක් මහරහතුන් විසින් කළ හෙයින් පඤ්චසතිකා යයිද, ස්ථවිරෝත්තමයන් විසින් ම කළ හෙයින් "ථෙරිකා" යයිද කියනු ලැබේ. එහෙයින් කිහ:-

"සතෙහි පඤ්චහි කතා තෙන පඤ්චසතාති ච,
ථෙරෙහෙව කතත්තා ච ථෙරිකාති පවුච්චති" යි

එතැන් සිට ශතවර්ෂයක් පමණ ශාරිපුත්‍රාදී මහාසම්ඝාශ්‍රව පරම්පරානුගත වූ ථෙරිය නිකායයි ලබ්ධ නම් ඇති එකම නිකාය සින් එම තථාගත ධම්ය අත් නොහැර ගෙන එන ලද්දේය.

තථාගත පරිනිර්වාණයෙන් ශතවර්ෂයක් වූ කල කාලාශෝක රජු දවස විශාලාමහනුවර මහාවන විහාරයෙහි වජ්ජිපුත්තක භික්ෂූන් විසින් "කප්පති සිඞ්ගිලෝණකප්පෝ" යනාදි වශයෙන් උපදවන ලද දශ අධර්ම වස්තුවක් හෙතු කොට ගෙන මහත් ශාසනාර්බුදයෙක් විය.

එකල කාළණ්ඩුපුත්‍ර වූ යශ ස්ථවිරයන් වහන්සේ සබ්බකාමී ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට ඇති සත්සියයක් භික්ෂූන් වහන්සේ සමඟ කාලාශෝක මහරජහුගේ සාහාය්‍යයෙන් විශාලා මහනුවර වාළුකාරාමයෙහිදී ආයුෂ්මත් සබ්බකාමී ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට අටමසකින් සියලු ධර්ම විනය යළිත් සඞ්ගායනාරූඪ කොට ථෙරිය නිකාය ස්ථාපිත යෙහි පිහිට වූහ.

මේ ධර්ම සඞ්ගීති තොමෝ සත්සියයක් රහතුන් විසින් කරන ලද හෙයින් සත්තසතිකා යයිද, ප්‍රථම සඞ්ගායනාපෙක්ෂායෙන් විනය සඞ්ගීති යයිද කියනු ලැබේ. එහෙයින් කිහ:-

"සතෙහි සත්ත හි කතා තෙන සත්තසතාති ව
පුබ්බ කතං උපාදාය දුතියා ති ව වුච්චති" සී

විනය සඞ්ගීතිකාරක මහාස්ථවිරයන් විසින් නිග්‍රහ කරන ලද දසදහසක් වජ්ජිපුත්‍ර භික්ෂූහු දුර්ල පක්ෂ බල ලැබ අනිකුදු ධර්ම සඞ්ගායනාවක් කළාහුය. ඊට මහාසඞ්ගීති යයි කියනු ලැබේ. ඔවුහු වනාහි මහා සාඞ්ඝික යයි හිත්ත නිකායයක් ඉපද වූහ. එයින් බිඳී ගොකුලිකය, එකබ්බොහාරිකයයි නිකාය දෙකෙක් විය. ගොකුලික නිකායයෙන් බිඳී පණ්ණත්තිවාදය, බාහුලි යයි තවත් නිකාය දෙකෙක් විය. ඒ දෙනිකායට බහුස්සුතිකය යන අපර නාමයෙක්ද ඇත. ගොකුලික නිකායයෙන් භෙදවූවත් අතුරෙහිම වෙතියවාද නම් වූ අත්‍යාවාය්‍ය වාදයක්ද ඇති විය. මේසේ මහාසඞ්ඝික නිකායයෙන් විනය ශතවර්ෂයෙහි නිකාය පසෙක් උපත. ඔහු වනාහි මහාසංඝික නිකායයන් සමඟ සදෙනෙක් වෙත්. එම විනය ශතවර්ෂයෙහි ථෙරිය නිකායයෙන් බිඳී මහිංසාසකය, වජ්ජිපුත්තකයයි නිකාය දෙකෙක් විය. එහි වජ්ජි පුත්තක නිකායයෙන් බිඳී ධම්මුත්තරිය, භද්‍රයානිකය, ඡන්නාගාරිකය, සම්මිත්තිය යයි නිකාය සතරෙක් විය. තැවත එම විනය

ශතවර්ෂයෙහිම මහිංසාසක නිකායයෙන් බිඳී සබ්බත්ථිවාදීය *ධම්ම ගුත්තික යනි දෙනිකායයෙක් විය. සබ්බත්ථිවාදී නිකායයෙන් බිඳී කැවත කස්සපික නම් නිකායයක්ද, එයින් සඞ්කන්තික නම් වූ තවත් නිකායයක්ද එයින් සුත්තවාද නම් නිකායයක්ද ඇති විය. මේසේ ථෙරිය නිකායයෙන් බිඳී මේ එකොළොස් නිකායයෝ ඇතිවූහ. ඔවුහු ථෙරියවාදයත් සමග නිකායයෝ දෙළොසක් වෙත්. මේසේ මේ අටළොස් නිකායයෝ ත්‍රිතීය ශතවර්ෂයෙහි උපන්හ. මොවුන් අතුරෙන් වනාහි ථෙරිය නිකාය හැර සෙසු සතළොස් නිකායයෝ භින්න නිකායයෝයනි දත යුත්තාහුය තථාගත පරිනිර්වාණයෙන් ත්‍රිතීය ශතවර්ෂය අවසාන වූ කල්හි ශාසනයෙහි ප්‍රතිලබ්ධවූ ශ්‍රද්ධා ඇති ධර්මාශෝක මහරජ තුමන් දවස පිරිහී ගිය ලාභසත්කාර ඇති නිර්භකයෝ භූමිම ශාස නයට වැද කසාවත් පොරවාගෙන ඒ ඒ විහාරයට වැද අනෙක ප්‍රකාර දුර්බ්බිධි උද්භාවනය කෙරෙමින් මහත් ශාසනාර්බුදයක් ඇති කළාහුය. එකල ආයුෂ්මත් මොග්ගලිපුත්තතිස්ස මහරහ තුන් වහන්සේ සිවුපිළිසිඹියා පත් දහසක් පමණ මහරහතුන්

---

* මේ දෙනිකායයන් අතුරෙන් සබ්බත්ථිවාදිහු වනාහි ක්‍රිසතු වර්ෂයෙන් 78 වැන්නෙහි රජ පැමිණි කුසාණ වංශිය කනිෂ්ක රජතුමාගේ සාහාය්‍යයෙන් මහාසංගිනී නම් වූ සඞ්ගායනාවක් පැවැත්වූ චෝය. ඒ වනාහි ථෙරිය නිකායයට අයත්නුවූ හෙයින්දෝ ලංකා ඉතිහාසයට නොනැඟුසේ පෙණේ. කනිෂ්ක රජතුමාණෝ පාර්ශ්ව නම් ආචාර්‍යයන් සම්පයෙහි බෞද්ධ ධර්මය ඉගෙනගෙන එකල පැවති නානාමත හැරපියා සත්‍යය හෙළිකොට තබන පිණිස මේ සඞ්ගායනාව කරවූහ මේ සඞ්ගායනාව වනාහි කාශ්මීර කුණ්ඩලාවන නම් වූ විහාරයෙහි දී වසුමිත්‍ර මහතෙරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත් වන ලදී.

ඔවුන් විසින් සූත්‍රපිටකයට උපදෙශයනි ද, විනය පිටකයට විනය විභාෂායනිද අභිධර්ම පිටකයට අභිධර්ම විභාෂායනි ද අටුවා තුනක් කරනලද බව රිස්ඩේවිඩ්ස් පඬිතුමා විසින් මැනුවල් ඔෆ් බුද්ධිසම් (Manual of Buddhism) යන ග්‍රන්ථයෙහි දක්වන ලදී. මහාවිභාෂා නමින් අභිධර්ම පිටකයට ලියනලද අටුවාවක් චීන භාෂාවෙන් ද නිබේ.

මේ ධර්ම සඞ්ගායනාව වනාහි බෞද්ධ ධර්මය හීනයාන මහායානයනි සාධා දෙකක් ඇතිවීමට හෙතු විය. තවද මහායාන මතය ඇති කිරීමට ප්‍රමුඛ වූයේ නාගාර්ජුන යනිද ඉතිහාසයෙහි පෙනේ. මෙයින් හීනයානය ථෙරිය නිකාය යනි සමහර වර්තමාන ඉතිහාසඥයන් විසින් නිර්දිෂ්ටවූවත් මේ ග්‍රන්ථයෙහි ප්‍රකීර්ණික කථාව කියවීමෙන් එය එසේම යනි පිළිගත නොහැකි බව මනාව වැටහේ.

වහන්සේ සමඟ පාටලි පුත්‍ර නුවර ධර්මාශෝක රජ්ජුරුවන් කරවූ අශෝකාරාමයෙහිදී එම මහරජතුමාණන්ගේ උපකාරය ලැබ තව මහකින් ධර්ම විනය සඞ්ගායනා කොට යථාස්ථානයෙහි තුබූහ.

මේ සඞ්ගීති තොමෝ දහසක් රහතුන් විසින් කරන ලද හෙයින් සාහස්සිකා යයි ද, පූජ්‍ය වර්‍යාපේක්ෂාවෙන් තෘතීය සඞ්ගීති යයිද කියනු ලැබේ. එහෙයින් කිහ:-

"කතා හිකඛූ සහස්සේන තෙසමා සාහස්සිකාති ච,
පුරිමා වෙ උපාදාය තතියාති ච වුච්චති "යි

එකල්හි ශාසනයෙන් පහ කරන ලද නීලිකයෝ තැවත ථේරිය නිකායට වැදී තොහී එයින් හළ මහාසඞ්ඝිකාදී වූ සත ලොස් නිකායයන්ට තමන් නීලික බව තොසඟවා අනන්‍යගීතව පිටකත්‍රය ඔවුන් වෙතින් දැන ඉගෙන ධර්ම විනය බිඳින පරිදි සාකච්ඡා කොට ගෙන බුදුන් පිරිනිවී දෙසිය පන්හිස් අවුරුද්දක් ගියකල සතැනක වෙසෙමින් හෙමවතය, රාජගිරිකය, සිඛාවලිකය, පුබ්බ සෙලිය අපරසෙලිය, වාජිරියයි නිකාය සයෙක් වූහ. එයින් බිඳී වෛතුල්‍යය, අන්ධකය, අන්‍ය මහාසඞ්ඝිකය යන නිකායත්‍රයෙක් විය. මොවුන් අතුරෙන් හෙමවතයන් විසින් වණ්ණිපිටකයද, රාජ ගිරිකයන් විසින් අඞ්ගුලිමාලපිටකයද, සිඛාවලිකයන් විසින් ගුයවෙස්සන්තරයද, පුබ්බසෙලිකයන් විසින් රට්ඨපාලගජ්ජිත යද, අපරසෙලිකයන් විසින් ආලවකගජ්ජිතයද වෙන වෙනම් නිපදවන ලද්දාහුය. වජ්‍රපර්වතවාසී වාජිරියයන් විසින් ගුය විනය, මායාජාලතන්ත්‍රය, සමාජතන්ත්‍රය, මහාසමයතන්ත්‍රය, තන්ත්‍රසංග්‍රහය, භූතවාමරය, වජ්‍රාමෘතය, චක්‍රසංවරය, වාදශ චක්‍රය, හේරුකාද්බුදය, මහාමායාය, පදනිඃක්ෂේපය, චතුෂ්පීඨය, පරාමර්දය, මරිච්‍යුද්භවය, සර්වබුඛය, සර්වගුහ්‍යය, සමුච්චය යනාදි තාන්ත්‍රික ග්‍රන්ථද, මායාමරීචි කල්පය, වෛරම්භකල්පය, ත්‍රිසමය කල්පය, රාජකල්පය, වජ්‍රගර්භාරකල්පය මරීචිගුහ්‍යකල්පය, ගුය සමුච්චයකල්පය යනාදි කල්ප ශාස්ත්‍රයෝද නිපදවන ලද්දාහුය.

වෛතුල්‍යවාදීන් විසින් වෛතුල්‍යපිටකයද අන්ධකයන් විසින් රත්නකූටාදි වූ ශාස්ත්‍රාන්තරද අන්‍ය මහාසංඝිකයන් විසින් අක්ෂරසාරියාදී වූ සූත්‍රාන්තර ද රචනා කරන ලද්දාහුය.

මෙසේ කොයෙක් ශාසනභෙදක ප්‍රකරණයන් ප්‍රාදුර්භූතවූවද ථෙරියනිකාය තුන්වන ධම් සඞ්ගායනාවේ පටන් අසම්මිශ්‍රව නිමිලව පැවැත්තේය.

යටකියතලද මොග්ගලිපුත්තතිස්ස මහරහතුන් වහන්සේ අනාගතයෙහි ශාසනය කොතැන්හි පිහිටෘේහෝයි පරීක්ෂා කරණසේක් ප්‍රත්‍යන්ත ජනපදයන්හි මනාකොට පිහිටන්නේයයි දැන මජ්ඣන්තික සථවිරයන් වහන්සේ කාශ්මීර ගන්ධාර දෙශයටද, මහාදෙව සථවිරයන් වහන්සේ මහිංසක මණ්ඩලයටද, රක්ඛිත සථවිරයන්වහන්සේ වනවාසි දෙශයටද, යොනක ධම්ම රක්ඛිත සථවිරයන් වහන්සේ මහාරට්ඨ ජනපදයටද මහා ධම්ම රක්ඛිත සථවිරයන් වහන්සේ අපරන්ත ජනපදයටද, මහාරක්ඛිත සථවිරයන්වහන්සේ යොනක දෙශයටද, මජ්ඣිම සථවිරයන් වහන්සේ හිමවන්ත ප්‍රදෙශයටද, සොනක සථවිරයන් වහන්සේ හා උත්තර සථවිරයන් වහන්සේ සුවණ්ණ භූමියටද, තමන්ගේ සඞ්ඝ විහාරිකවූ මහෙන්ද්‍ර සථවිරයන් වහන්සේ තම්බපණ්ණි ද්වීපයටද යැවූසේක.

මුන්වහන්සේ අතුරෙන් තථාගත පරිනිර්වාණයෙන් 236 වැන්නෙහිදී දෙවානම්පියතිස්ස මහරජතුමාණන්ගේ සාහාය්‍යයෙන් ලක්දිව බුදුසසුන් පිහිටුවා වදාළ මහාමහෙන්ද්‍ර සථවිරයන් වහන්සේ විසින් සාළිකථා ත්‍රිපිටක ධම්ය මෙහි ගෙනඑත ලද්දේය. නිකායාන්තර ලබ්ධීන් හා සඞ්කර නොවනු පිණිස එම අටුවාවෝ හෙළබසින් සථාපිතයහ. එසේම උන්වහන්සේ අරිට්ඨාදි මහරහතුන් සමඟ ථූපාරාම මහාවිහාරයෙහිදී ඉතරවැනි ධම්ම සඞ්ගායනාවද කොට ථෙරීයවාදයයි කියනලද මහානිකාය සථිරකොට තුබූහ.

එසේම තථාගත පරිනිර්වාණයෙන් සාරසිය සතළිස් වැන්නෙහි වට්ටගාමිණී අභයනම් රජකෙනෙක් ලඞ්කාවෙහි රාජ්‍යාභිෂෙක ලැබූහ එකල උපාලිය, දාසකය, සොණකය, සිගගවිය, මොග්ගලිපුත්තතිස්සයන, මහාමහින්දය, ඉට්ඨිය, උත්තිය, සම්බලය, භද්දසාලය, අරිට්ඨය, තිස්සදත්තය, කාලසුමනය, දීඝනාමය, දීඝසුමනය, කාලසුමනය, මහානාගය, බුද්ධරක්ඛිතය, තිස්සය, දෙවිය සුමනය, චූලනාගය, ධම්මපාලය, ඛෙමය, උපතිස්සය, ථූසදෙවය, සුමනය, පුපථනාමය, මහාසිවය, උපාලිය, මහානාගය, අභයය, තිස්සය, ථූසය, චූලාභය, තිස්සය, චූලදෙවය, සිවය, යන ආචාර්‍ය

පරම්පරාවෙන් ගෙනඑනලද ධම්ම පත්සියයක් මහරහතුන් වහන්සේ මාතුලජනපදයෙහි අලුලෙන්වෙහෙර වැඩහිඳ එක්තරා ජනපදාධිපතියන්හුගේ ආරක්ෂා ඇතිව සඞ්ගායනාකොට පොත්හි ලියවූහ. මෝතොමෝ පඤ්චම්ඵඩයිතියයි කියනු ලැබේ.

නැවතද වට්ටගාමිණී රජහුගේ කාලයෙහි පටන් ලක්දිව නිකායභෙදය පටන් ගත්තේය. එකල බහලමයසුතිස්ස නම් සථවිරයන් වහන්සේ ථේරිය නිකායයෙන් නික්මව වට්ටගාමිණී මහරජාණන් විසින් කරනලද අභයගිරි වෙහෙරට ගොස් එහි වසන්කාලු කාලාසොක රජු දවස උපදවනලද මිථ්‍යා ලබ්ධි ඇති වජ්ජිපුත්‍රකයන්ගේ පරම්පරාවෙහිවූ ධම්මරුචි නම් ආචාර්‍ය්‍යයන්ගේ ශිෂ්‍යයන් දඹදිවින් මෙහි පැමිණිකල ඔවුන් හා සමාන ලබ්ධිකව විසූහ. එතැන් සිට අභයගිරි වාසීහු ධම්මරුචික නිකායිකයෝ වූහ. මේසේ ථේරියනිකාය මහාවිහාරය ධම්මරුචියයි දෙනිකායකට බෙදී ගියේය.

බුදුන් පිරිනිවි සත්සිය සුපනස් අවුරුද්දක් ගියකල වොහොර තිස්ස රජාණන් සමයෙහි ධම්මරුචිකයෝ ධම්මාශොක රජුදවස උපදවනලද වෛතුල්‍යපිටකය ගෙන බුදුන්ගේ ධම්මය මේයයි ප්‍රකාශ කළහ. වොහොර තිස්ස රජතුමාණෝ සවී ශාස්ත්‍රයෙහි කෙළ පැමිණි කපිල නම් අමාත්‍යයා ලවා විනිශ්චය කරවා දුර්ලබ්ධි ගත් පාපභික්ෂූන්ට නිග්‍රහකොට එම පොතපතද ගෙන්වා ගිනි ලැවූහ.

ඉක්බිති බුදුන් පිරිනිවි සත්සිය අනූඅය වැන්නෙහි රජ පැමිණි ගොඨාභය රජුගේ සමයෙහි එම අභයගිරි වාසී ධම්මරුචිකයෝ යළිදු වෛතුල්‍යවාද ගෙන බුඩභාෂිතයයි දැක්වූහ. එකල ධම්මරුචි නිකායික උසසිලියතිස්ස නම් මහාසථවිර කෙනෙක් ඒ නො පිළිගෙන තවත් භික්ෂූන් තුන්සියයක් සමග අභයගිරි වෙහෙරින් නික්ම ගොස් ධම්මරුචි නිකායයෙන් වෙන්ව දකුණු ගිරි වෙහෙර විසූහ. ඔවුන් අතුරෙන් සාගල නම් සථවිර කෙනෙක් එහි වැඩහිඳ ධම් ව්‍යාඛ්‍යාන නිපදවූහ. එතැන්සිට ඒ භික්ෂූහු සාගලීය නමින් වෘාප්ත වූහ.

මේසේ ලක්දිව මහාවිහාරිකයන්ගෙන් හික්තව මහා විහාරීය ධම්මරුචිය, සාගලියයි ආචාර්‍ය්‍ය නිකාය තුනෙක් වියයි දතයුතු.

කැවතද වරින්වර මෙහි පැමිණි කොයෙක් වෙතුලූ වාද යන් දූකැමි රජවරුන් විසින් තැනිකොට පියා (1) මහාවිහාර (= ථෙරියනිකාය) (2) අභයගිරි (= ධම්මරුචික) (3) ජේතවන (= සාගලිය) යන තුන්නිකාය පමණක් පවත්නා කල අප බුදුන් පිරිනිවි එක්දහස් සයිය සයාතු අවුරුද්දක් ගියකල ශ්‍රී සඞ්ඝබොධි ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන් විසින් ඒනිකායත්‍රයට අයත් භික්ෂූන් එක් තැන්කොට මෙතදග්ගායන, ශාරිපුත්‍ර මෙඛඞ්කරාදි යති ශ්‍රෙෂ්ඨයන් විසින් පිරිවරන ලද්දාවූ අරණ්‍යවාසි ඔත්දුම්බරගිරි මහා කාශ්‍යප සථවිරයන් වහන්සේගේ ප්‍රමුඛත්වයෙන් තාතාමන දුරු කරවාපියා නිකායත්‍රය සෙමෙහි පිහිටුවා මහාවිහාරීය ථෙරිය නිකායම යථාසථාතයෙහි තුබූහ.

එදවස පටන් ශිවභක්තිකවූ රාජසිංහ රජු දක්වා ගංගා ජලප්‍රවාහයක් මෙන් නිමිල වූ ථෙරිය පාරම්පරීය ධම්ය මෙම ලක්දිව පැවැත්තේයයි දනයුතු. මේ අතුරෙහි ථෙරිය නිකාය ගාමණ්‍යායතන, අරඤ්ඤායතන වශයෙන් විවිධ විය. එහෙත් සංඝ කර්මාදියෙහි භෙදයෙක් නොවීය. ටීකාචාර්‍ය්‍ය ශාරිපුත්‍ර, සඞ්ඝරක්ෂිත, අනවමදර්ශි, වනරතන රාහුල, මඞ්ගලාදි මහා සථවිර පාදයෝ වනාහි ග්‍රාමාන්තායතනවාසීහු වූහ. එසේම ආනන්ද මෙඛඞ්කර, මහා ධම්මකීර්ත්‍යාදි, චිනීය ධම්මකීර්ත්‍යාදි, ප්‍රමුඛ මහා සථවිර පාදයෝ වනාහි අරඤ්ඤායතන වාසීහු යයිද කියත්. පුස්තක යන්ගේ පාඨාන්තරොත්පත්තිය ඒ දෙපක්ෂය විසින් පරිශීලනය කළ ග්‍රන්ථයන්ගේ වශයෙනැයි සලකනු ලැබේ.

යටකියන ලද පරිද්දෙන් ප්‍රථම සඞ්ගායනාවෙහිදී ධම්ම සංග්‍රාහකයන් විසින් සඞ්ගායනා කරන ලද සියලු බුඞ්වචනය සූත්‍ර අභිධම්ම විනය කියා පිටකත්‍රයකට අන්තර්ගත වේ. ඒ වනාහි ප්‍රථම සඞ්ගායනා වේදී සඞ්ගීත වූද (සඞ්ගීතිකඛන්ධක සථා වසතු ප්‍රකරණාදි) අසඞ්ගීත වූද සියල්ලම එක්කොට එසේ සලකනු ලැබේ. ඔවුන් අතුරෙන් උභය ප්‍රාතිමොක්ෂය, විභඞ්ගවරය, දෙවිසිඛන්ධකය, ශොඞ්ෂ පරිවාරය, යන මොහු විනය* පිටකයට ඇතුළත්වේති.

---

* මේ වනාහි ශික්ෂා පද මාත්‍ර වූ ප්‍රාතිමොක්ෂ සංඛ්‍යාත මාතෘකාව හා තවිභාගය වූ භික්ෂු භික්ෂුණී විභඞ්ගවය ඇතුළත් කොට පාරාජිකා, පාචිත්තිය. [දෙ විසිඛන්ධක අන්තර්ගත] මහාවග්ග, චූලවග්ග, [සොළොස් පිරිවරක් ඇති] පරිවාරය යන නමින් පොත් පසකින් ප්‍රමාණකොට සලකනු ලැබේ එහතොත් විභඞ්ග, ඛන්ධක, පරිවාර යයි සැකවින් කියනු ලැබෙත්.

දීඝනිකාය ද, මජ්ඣිම නිකායද, සංයුත්ත නිකායද, අඞ්ගුත්තර නිකාය ද, බුද්ධක පාඨය, ධම්ම පදය, උදානය, ඉතිවුත්තකය, සුත්තනිපාතය, විමානවත්ථුය, පෙතවත්ථුය, ථෙරගාථාය, ථෙරිගාථාය, ජාතකය, නිද්දෙසය. පටිසම්භිදා මග්ගය, අපදානය, බුද්ධවංසය, චරියාපිටකය, යන මේ පසළොස් ප්‍රකරණයකින් සංගෘහිත බුද්ධක නිකාය ද යන මේ තෙම සූත්‍රපිටකය නම් වේ. නෙත්ති ප්‍රකරණ පෙටකොපදෙස යන ප්‍රකරණ ද බුද්ධක නිකායට ඇතුළත් වීමට යොග්‍යයේ පෙනේ.

"ඨපෙත්වා චතුරොපෙතෙ නිකායෙ දීඝආදිකෙ,
තදඤ්ඤං බුද්ධවචනං නිකායෝ බුද්ධකෝ මතෝ"ති.

අර්ථ කථාවන්හි කී බැවිනි.

පළමු කොට විනය පිටකය ද, ඉක්බිති දීඝනිකායාදි නිකාය සතර ද, අභිධම් පිටකය ද, ඊට පසු ජාතකාදි බුද්ධක නිකායද සඞ්ගායනා කොට අභිධම් පිටක ගෙහි සංග්‍රහයට නැගුහයි දීඝ භාණකාචාර්‍යයෝ කියත් යි ද මධ්‍යම භාණකාචාර්‍යයෝ වනාහි චරියාපිටකය හා බුද්ධවංසය සමග සියලු බුද්ධක ග්‍රන්ථය සූත්‍ර පිටකයට ඇතුළත් යයි කියත් යි ද සාරත්ථදීපනී තම්, විනය ටීකා වෙහි දක්වන ලදි.

ධම්මසඞ්ගණීය, විභඞ්ගය, ධාතු කථාය, පුග්ගලපඤ්ඤත්තිය, කථාවත්ථුය, යමකය, පට්ඨාන්‍ය යන මේ තෙම අභිධම් පිටකය නම් වේ.

විනය, සූත්‍ර, අභිධම් යන ත්‍රිකය වනාහි පර්‍යාප්ති වාචක වූද, භාජන වාචක වූද "පිටක" ශබ්දය හා "විනයෝ ච සෝ පිටකං චෙති=විනය පිටකං" යි ද "සුත්තා ච තං පිටකංචෙ"ති=සූත්‍රපිටකං යි ද "අභිධම්මා ච සෝ පිටකංචෙ"ති - අභිධම්ම පිටකය යි ව්‍යවහාර වේ.

ත්‍රිපිටක ධර්‍මයාගේ අර්ථවර්ණනාව අට්ඨකථා (-අට්ඨා) යයි කියනු ලැබේ. අර්ථකථාවෝද තථාගතයන් වහන්සේ විසින් දෙශිතය හ. මෙම කී සාරත්ථදීපනී ටීකායෙහි:- "න හි භගවතා අබ්‍යාකතං තතනිපදං නාම අත්ථි, සබ්බේසං යෙව අත්ථෝ කථිතෝ සම්මාසම්බුද්ධෙනෙව නිණ්ණං පිටකානං අට්ඨවණ්ණ නාකතමොපි භාසිතොනි දට්ඨබ්බං. තස්ථ තස්ථ භගවතා

පවතනිත පකිණණක දෙසනායෙව හි අට්ඨකථා''යි. ''භගවත්හු විසින් ප්‍රකාශ නොකරන ලද තනනි පදයෙක් නම් නැත. සියලු පදයන්ගේම අර්ථය වදරන ලද්දේය. එහෙයින් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින්ම තුන් පිටකයෙහි අර්ථ වණීතා ක්‍රමයද වදරන ලද්දේයයි දතයුතු. ඒ ඒ තන්හි භගවත්හු විසින් පවත්වන ලද ප්‍රකිණීක දෙශනාවම අර්ථකථා වන්නීය'' යනු එහි භාවයයි.

ඒ **අර්ථකථාවෝ** වනාහි ප්‍රථම මහා ධර්මසංග්‍රාහක ස්ථවිරයන් විසින් පළමුකොට තුන් පිටකය සංගායනාවට නඟා ඒ තුන් පිටකයාගේ අර්ථවණීතා සවරූපයෙන්ම වාචනා මාගීයට නඟන ලද්දාහ. ඔහු යට කියන ලද පරිද්දෙන් මිහිදු මාහිමියන් වහන්සේ විසින් නෙත එන ලදින් ලක්දිව් වැසි මහතෙරුන් විසින් නිකායානතර ලබ්ධින් හා සංකිණී නොවනු පිණිස සිංහල භාෂාවෙන් තබන ලද්දාහ.

ඒ **සිංහලාර්ථකථාවෝ** වනාහි මහා අට්ඨකථා, පච්චරියට්ඨ කථා, කුරුන්දියට්ඨ කථායි* තුනෙකි. තවද මේ හැර අන්ධට්ඨ කථාය සංඛෙපට්ඨ කථායයි අටුවා දෙකක් පැවති බැව් සාරාර්ථ දීපනී ටීකාවෙහි කීයන ලදි.

එකල දෙශානතරයෙහි පැවති අටුවා විනාශ වූවාක් මෙන් පෙනේ. සිංහලභාෂාවෙන් ලියන ලද අර්ථ කථාවෝ යම්හෙයකින් දෙශානතර වාසීන්ගේ අභිමතාර්ථ සාධනය නොකෙරෙද්ද, එහෙයින් හෙළු අටුවාවන් පෙළ බසට නහනු පිණිස සවකියාචාර්යවූ රෙවත නම් මහ තෙරුන් වහන්සේ විසින් මෙහෙයන ලද බුද්ධඝොෂාචාර්යයන් වහන්සේ දඹදිව සිට ලක්දිවට පැමිණියෝය.

බුද්ධඝොෂාචාර්යයෝ වනාහි දඹදිව මහබෝමැඩ සමීපයෙහි උපන් ත්‍රිවෙද පාරගතවූ බ්‍රාහ්මණයාණ කෙනෙකි. පූර්වෝක්ත රෙවත මහ තෙරුන් වහන්සේ ඔහු පැවිදි කරවා ත්‍රිපිටක බුද්ධවචනය ප්‍රගුණ කරවූ සේක. ඉක්බිති උන්වහන්සේ එහිදී ''ඥානොදය'' නම් ප්‍රකරණයක්ද කොට බුද්ධ වර්ෂ 953 වැන්නෙහි

---

* එහි මුළු තුන් පිටකයටම ප්‍රථම ඇකාව කරන ලද අටුවාව මහා අටුවාව නම්. පවවරියයි පසුරට නම්, එහි වැඩහිඳ කළ අටුවාව පවවරියයි, කුරුන්දිවෙල්ලි නම් විහාරයෙක් ඇත, එහි හිඳ කළ බැවින් කුරුන්දි නම් වියයි කියති.

අන්ධට්ඨ කතාව වනාහි තෙළිඟු බසින් ලියන ලද්දක්ය යනු එහි කාම සෙන්ම හැඟේ.

මහානාම නම් රජ කෙනකුන් දවස ලක්දිවට පැමිණියහ. එහෙත් බුද්ධඝෝෂාචාර්යයන් විසින් කරන ලද අට්ඨකථාවන්හි එකල ලේඛකාචාර්යයන්ගේ නාමය "සිරිනිවාස" යයිද, "සිරිකුඩ්ඩය" යිද පෙනේ. ඒ නම් දෙක වනාහී මහානාම රජුගේ නාමාන්තරයයි වතීමාත ඉතිහාසඥයන්ගේ මතය වේ. බුද්ධඝෝෂාචාර්ය පාදයෝ අනුරාධපුර මහා විහාරයෙහි පධාන ඝරයෙහිදී සඞ්ඝපාල මහා ස්ථවිරයන් වහන්සේ වෙතින් සිංහලාට්ඨකථාවන් ඉගෙන දූරඝඞ්කර පිරිවෙනෙහි වෙසෙමින් හෙළ අටුවාවන් පෙළ බසට නැඟුහ. උන්වහන්සේ විසින් දීඝ මජ්ඣිම සංයුත්ත අඞ්ගුත්තර ඛුද්ද නිකාය සතරටම යොග්‍යවනසේ පළමු කොට විසුද්ධිමග්ග නම් ප්‍රකරණය කරන ලදි. ඊට අනතුරුව මූළ විනය පිටකයටම සමන්තපාසාදිකා නම් අටුවාවද, ප්‍රාතිමොක්ෂයට කංඛාවිතරණී නම් අටුවාවද, දීඝනිකායට සුමඞ්ගල විලාසිනී නම් අටුවාවද, මජ්ඣිම නිකායට පපඤ්චසූදනී නම් අටුවාවද, සංයුත්ත නිකායට සාරත්ථප්පකාසිනී නම් අටුවාවද, අඞ්ගුත්තරනිකායට මනෝරථපූරණී නම් අටුවාවද, බුද්දකනිකායයෙහි ධම්මපද සුත්තනිපාත ජාතක බුද්ධ පාඨ ඇත ග්‍රන්ථයන්ට පරමත්ථජෝතිකා නම් අටුවා සතරද, අභිධම්පිටකයෙහි ධම්මසඞ්ගණියට අත්ථසාලිනී නම් අටුවාවද, විභඞ්ගප්‍රකරණයට සම්මොහවිනොදනී නම් අටුවාවද, සෙසු පඤ්චප්‍රකරණයන්ට පරමත්ථදීපනී නම් අටුවාවද කරන ලද්දහ.

සමහර ග්‍රන්ථයන්හි කුරුන්දි අටුවාව පාළියට නඟා විනය අටුවාවද, මහා අඞ්ගුත්තර කථාව පාළියට නගා සඟි අටුවාද, මහා පච්චරිය පෙළ බසට නඟා විජම් අටුවාවද කරන ලද්දේයයි සඳහන් වේ. එහෙත් ඊට සාධක වශයෙන් කිසිවක් ඒ ග්‍රන්ථයන්හි නොකියන ලදි. මහා අට්ඨ කථාව ආදි අටුවා සියල්ලම ත්‍රිපිටකයටම කරන ලද අටුවා යයි හැඟේ. බුද්ධඝෝෂාචාර්යයන් විසින් විනයාට්ඨ* කථාරම්භයෙහි සියලු අටුවාවන් ගෙන්ම කරුණු

---

* සංවණ්ණනං තංච සමාර භතෝනා
තස්මා මහා අට්ඨකථං සරිරං,
කත්වා මහා පච්චරියං තථෙව
කුරුන්දි නාමාදිසු: විසසුතාසු.

විනිච්ඡයෝ අට්ඨ කථාසු වුත්තෝ
යෝ ග්‍රන්ථමජ්ඣං අපරිච්ච ජනෝනා,
තතොපි අත්තෝගධ ථෙර වාදං
සංවණ්ණනං සම්මි සමාරභිස්සං.

උපුටාගත් බව කියන ලද හෙයිනි. එහෙත් මෙහි මින හෙදයක් පවත්නා බව පෙනේ.

බුදුකනිකායයෙහි ඉතිවුත්තකය, උදාන, චරියාපිටක, ථෙරගාථා, ථෙරිගාථා, විමානවත්ථු, පෙතවත්ථු, යන පොත් සතට පරමත්ථදීපනී නමින් අට්ඨකථා සතක්ද, අපදානයට විසුද්ධජනවිලාසිනී නම් අට්ඨකථාවද, චෙතනිප්‍රකරණයට චෙතනි අට්ඨකථාවද, ආචාර්‍ය්‍ය බුදරතීඵ ධම්පාල මහා සථවිරයන් වහන්සේ විසින්ද බුබවංශයට මධුරත්ථවිලාසිනී නම් අට්ඨකථාව බුබදත්ත සථවිරයන් වහන්සේ විසින්ද නිදෙසයට සද්ධම්මපජ්ජොතිකා නම් අට්ඨකථාව ආචාර්‍ය්‍ය උපසෙන සථවිරයන් වහන්සේ විසින්ද පටිසම්භිදාවට සද්ධම්මපකාසිනී නම් අට්ඨකථාව ආචාර්‍ය්‍ය මහාකාම සථවිරයන් වහන්සේ විසින්ද රචනා කරන ලදහ.

අප විසින් සිංහලට නගන ලද චරියාපිටක අට්ඨකථාව කරන ලද්දේ ආචාර්‍ය්‍ය ධම්පාල මහා සථවිරයන් වහන්සේ විසිනි. උන් වහන්සේ වනාහි දක්ඛිණ ජම්බුදීපයෙහි කාඤපච්චනමේහි ධම්මාශොක මහරජතුමාණන් විසින් කරවන ලද බදරතීඵ විහාරයෙහි වැඩවිසූ සෙනෙකි. මෙ ම කීහ. තෙකන්ති අට්ඨකථාවෙහි:-

> "සද්ධමෙමාතරණට්ඨානෙ පටිඤ්ඤෙ කාඤසව්හයෙ,
> ධම්මාසොකමහාරාජ විහාරෙ වසතා මයා "ති

මුත්වහන්සේ තෙළිඟු දෙශයෙහි බ්‍රාහ්මණ වංශයෙහි උපන් සෙනෙක්යයිද කියනුලැබෙත්. බුබඝොෂාචාර්‍ය්‍යයන්ට පසුව අවු කථා කළ හෙයින් උන්වහන්සේට චිරන්තනට්ඨකථාචාර්‍ය්‍යෝයයිද කියති. යට කියන ලද අට්ඨකථා හැර මුත්වහන්සේ විසින් විසුද්ධිමග්ග ටීකාවද, පඤ්චපකරණ අනුටීකාවද, සච්චසංඛෙප නම් අභිධම්ම ප්‍රකරණයද කරන ලද්දහ.

ඉක්බිති අට්ඨකථාවන්හි ග්‍රන්ථිසන්ධාන නිර්ග්‍රන්ථකය කරමින් බොහෝ ටීකාවෝද විරචිතයහ. අට්ඨකථාචාර්‍ය්‍ය ධම්පාල, ශ්‍රී ශාරිපුත්‍ර, ඔෂදුම්බරගිරි කාශ්‍යප, ආනන්ද, වනරතන, වජිරබුද්ධ යනාදී මහාසථවිරපාදයන් විසින් ඒ ටීකාවෝ නිපදවන ලදහ. ඉක්බිති අනුටීකාද, ත්‍රිපිටක පාලියෙහිත් අට්ඨකථායෙහිත් ටීකානුටීකායෙහිත් ප්‍රකාශව ඇ අති විස්තරාර්ථයන් සංක්ෂෙප කොට ත්‍රිපිටකධර මහා සථවිරයන්විසින් සම්භාවනීයවූ පාලි ප්‍රකරණද නිපදවන ලද්දහ. ආචාර්‍ය්‍ය ධම්පාල මහා සථවිරයන් විසින් කරන ලද සච්චසංඛෙප ප්‍රකරණයද ආචාර්‍ය්‍ය අනුරුද්ධ මහා සථවිරයන් විසින් කරන ලද අභිධම්මාර්ථ සංග්‍රහයද, නාමරූපපරිච්ඡෙදය ද

පරමාභිධර්මිකශ්‍රේෂ්ඨයද, ආචාර්ය්‍ය බුද්ධදත්ත මහාස්ථවිරයන් විසින් කරන්නලද අභිධම්මාවතාරයද, විනයවිනිශ්චයප්‍රකරණයද එයින් සමහරෙක් වෙති. මේසේ හෙයින් මේ ආචාර්ය්‍ය ධම්මපාල ස්ථවිරයන් වහන්සේගේ නාමය අට්ඨකථාචාර්ය්‍යයන් කෙරෙහිද, ටීකාචාර්ය්‍යයන් කෙරෙහිද, අනුටීකාචාර්ය්‍යයන් කෙරෙහිද, ප්‍රකරණාචාර්ය්‍යයන් කෙරෙහිද අතිශයින් ප්‍රකටව පෙනෙන බැවින් මුන් වහන්සේ වැනිවූ ග්‍රන්ථ කර්තෘ කෙනෙක් මේ ශාසනයෙහි නොවූවාහු යයිද කියති.

යටකී මහානාම රජු දවස පටන් පර්‍යාප්තිය වර්ධනය කළ ආචාර්ය්‍යවරයන් දක්වන දෙවරක්ෂිතාභිධාන චීනීය ධම්මකිත්ති සංඝරාජයෝ මෙසේ කියති:-

"යටකී මහානාම රජු දවස බුද්ධඝෝෂ නම් අට්ඨකථාචාර්ය්‍ය මහාස්ථවිරපාදයන් පටන් මේ අතුරෙහි බුද්ධදත්තයන්, ධම්මපාලයන්, ජෝතිපාලයන්, ඛේමයන්, ධම්මශ්‍රීයන්, නන්දයන්, ආනන්දයන්, අනුරුද්ධයන් උපතිෂ්‍යයන්, බුද්ධරක්ෂිතයන්, මෞද්ගල්‍යායනයන් යනාදීවූ ආචාර්ය්‍ය මහා ස්ථවිරයන් හා එසේම එකශ්‍රැතින් සෙසු සහස්‍ර ග්‍රන්ථධාරණයට සමර්ථවූ වජ්‍රඥන ඇති ශාරීපුත්‍ර මහා සේනාපතිපාදයන් පටන් සංඝරක්ෂිතයන්, සුඛලයන්, වාතිශ්වරයන්, ධම්මකිත්තියන්, ඥානසෙනයන්, ආනන්දයන්, වෙදෙහයන්, බුද්ධිලයන්, අනවමදර්ශියන් යනාදී මහාස්ථවිර-වරයෝ තෙපයෙක් ටීකාර්ථ කථා හා තන්ත්‍රවෙශෝපායවූ අනෙක ප්‍රකාර ධර්ම්ප්‍රබන්ධ හා සන්න ගැටපද පිටපත් ආදීන උපදවා බුදුන්ගේ පර්‍යාප්ති ශාසනය බැබළූ වූහ.

එසේම ශ්ලෝකසිද්ධාර්ථන්, සාහිත්‍ය විල්ගම්මූලයන්, අනුරුද්ධයන්, දීපංකරයන්, මයුරපාදයන්, ධම්මසෙනයන් යනාදි ස්ථවිරවරයන් හා ගුරු පාදයන්, ධම්මකිත්ති පාදයන්, ධිරනාග පාලයන්, රාජගුරුන්ගේ කවිරාජ ශෙඛරයන්, ගුරුළුදුම්ය, ආනම චක්‍රවර්ත්තියන්, පරාක්‍රමපණ්ඩිතයන්, අග්‍රපණ්ඩිතයන් යනාදිවූ ගෘහස්ථ පණ්ඩිතජනයෝ ධර්ම්ානුගත ශ්ලෝකප්‍රබන්ධ හා විචිත්‍රාර්ථ ප්‍රකාශවූ සන්න ගැටපද හා තෙපයෙක් ධර්ම්ව්‍යාඛ්‍යාන ඉපදවූහ. එම ව්‍යාඛ්‍යාන මුඛගෙන මේකල් දක්වා කාලානුරූප ධර්ම් ව්‍යාඛ්‍යාන උපදවමින් ප්‍රාඥවරයෝ බුදුන්ගේ පර්‍යාප්ති ශාසනය බබුළුවමින් සිටියාහුමය"යි. මීට අනතුරුවද ශ්‍රීහර්ෂ පැවිදි පණ්ඩිතයෝ තෙපයෙක් ධර්ම් ව්‍යාඛ්‍යාන උපදවූහ.

ඒ මේ ධර්ම්ව්‍යාඛ්‍යාන ඉපදවීම් වනාහි ලෝවැඩ අටක් වන්නාවූ ගරුතර කර්තව්‍යයකැයි පූජාවලියෙහි දක්වන ලද්දේය. (ඒ කරුණු අට මෙහි ගෙනහැර දක්වතොත් ඉතා බෙහෙව. එහෙයින් එය පූජාවලියෙන් දතයුතු.) එබඳු ලොකාර්ථසිද්ධියක් කරනු පිණිස පිටකත්‍රයට අයිති කිසිදම් අර්ථකථාවක් සිංහලට නගනු පිණිස අපට මහත් අභිලාෂයක් ඇතිවිය.

කිසියම් ග්‍රන්ථයක් සිංහලට නඟමුදෝ නෝයි විතර්කයක් කරන්නාවූ අපට චර්‍යාපිටකාර්ථ කථාව මැනවි යයි හැඟී ගියේය.

ඒ මේ චර්‍යාපිටකාර්ථ කථාව තම් අප තථාගතයන් වහන්සේ විසින් මේ භද්‍රකල්පයෙහිදී පුරන ලද අතිදුෂ්කරවූ පරමෝත්කෘෂ්ට භාවයට ගියාවූ දානාදි දශපාරමී ධර්මයන් ගර්භකොට වදාළ චරියාපිටකපාලිය වණීතාමූඛයෙන් විතීයාර්ථකථාවයක්‍යි හදන්නා ධර්මපාල මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් පරමාර්ථදීපනී නම් විශෙෂ නාමයෙන් කර වදාළ අර්ථවණීනාවයි. චර්‍යාපිටක ධර්ම පර්‍යාය පිළිබඳ දෙශකාලාදීන් පොතෙහි නිදන කථාවෙහි විස්තාරව පෙනෙන බැවින් ඒ හැර මෙහි යම්ක් තොලියමු. චරියාපිටකයෙහි බොධිසත්ත්වචරිත පන්හිසක් පෙනේ. මේයින් මහා සුදස්සන, සවචතාපස, මහාලොමහංස යන චරිත තුන හැර සෙසු සියල්ලම ජාතකාර්ථකථාවෙහි ප්‍රකාශව ආ කථාවන් සමඟද මහා සුදස්සන චරිතය දීඝ නිකායෙහි මහා සුදස්සන සූත්‍රය සමඟද හැළපේ ජාතකාර්ථකථාවෙහි විස්තර කයින් ප්‍රකාශව ආ බොධිසත්ත්වචරිත මෙහි සංක්ෂෙපයෙන් දක්වා ඇත.

මෙහි දානාදි බොධිසම්භාර ධර්මයන්ගේ විභාගය මැනවින් දක්වන ලදී. දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්ෂා යන මොවුහු බොධිසම්භාර ධර්මයෝ නෙවත් දශ පාරමිතාවෝ වෙති. ඔවුහු පාරමී, උප පාරමී, පරමාර්ථ පාරමීන්ගේ වශයෙන් ඒ ඒ ජාතීවල පිරූ පරිදි මෙහි වර්ණිතය. එහෙත් ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති යන පාරමිතා පිරූ පරිදි දක්වන නිදසුන් කථාවෝ චරියාපිටකයෙහි නොපෙනෙති. ඒ පාරමිතාවෝ ද මේ චරියාවන්ම ගර්භකොට ඇත්තාහු යයි සැලකිය හැකිවේ. එහි ප්‍රඥා පාරමිතාව මහාගොවින්ද චරිතයෙන්ද, වීර්‍ය්‍ය පාරමිතාව සංඛ බ්‍රාහ්මණ චරිතයෙන්ද, ක්ෂාන්ති පාරමිතාව මහිස, ඛණ්ඩහාල, භූරිදත්ත චරිතයන් හෙත්ද ප්‍රකාශ වන බැවිනි. මෙහි ප්‍රකීර්ණක කථාවෙහි දශ පාරමිතාවන්ගේ ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථානාදි වශයෙන් දතයුතු සියලු විස්තරය මනාව දක්වා තිබේ. "පාරමී විභාගය චර්‍යාපිටකාර්ථ කථාවෙන් දතයුතු යයි" අර්ථකථාවන්හි සඳහන්කොට තිබීමෙන් එය වැඩියක් පැහැදිලි වේ. එබැවින් මහාබොධියාන ප්‍රතිපත්තිය කුමක්දැයි දැන ඊට අනුව පිළිපදිනු කැමැත්තන් විසින් මේ චර්‍යාපිටකාර්ථ වර්ණනාවෙහි සවිස්තරයෙන් ආදර බුහුමන් කටයුත්තේමය. විස්තර කථා ලීමෙන් කම්කැති.

මෙසේ සර්ව්‍රකාරයෙන්ම බෞද්ධ මහජනයාට මහත් ප්‍රයෝජනවත්වූ මේ අර්ථකථාව අප අදහස් පරිදි සිංහල භාෂාවට පරිවර්තනය කළ මැතවසි තථාගත ධර්මයාගේ විරසර්තිය ප්‍රාර්ථනාකරන්නාවූ **එච්. ද ඇස්. කුලරත්න** නීතිඥ තුමාණන්ගේ සමාරාධනයද අපට මහත් ධෛර්‍යයෙක් විය. තථාගත ධර්මයට ව්‍යාඛ්‍යාලිවීම භාරදූර කර්තව්‍යයකි. එබදු කර්තව්‍යයන් නිපදවාලීම පිණිස කරනු ලබන්නාවූ ප්‍රයත්නය ධර්මතත්ත්වඥ විද්වද්වරයෝ ම දනිත්.

අපේ මේ සම්‍යක් උත්සාහයෙන් සාමාන්‍ය බෞද්ධ ජනතාවට මැඩක් සැලසුණේ නම් එයම අපගේ ශ්‍රම සාර්ථ්‍යයට ප්‍රමාණ වේ. තවද මෙහි අපගේ මති භ්‍රමයෙන්වූ අර්ථාර්ථ, සදර්ථවිවේචනයෙහි ප්‍රවීණවූ බුද්ධිමතුන් විසින් සංශෝධනයකොට යථාර්ථයම ගනු ලැබේවා යි අපෙක්ෂක වම්හ.

තවද මෙ කෘතියෙහි කළුතර පුලිනතලාරාමාධිපති ආචාර්‍ය්‍ය **බේරුවල සිරිනිවාස** මහා සර්වරයන් වහන්සේ වෙතින් බොහෝ උපකාර ලබනලද බව ගෞරවයෙන් සදහන් කරම්හ.

එසේම මෙහි අප ආචාර්‍ය්‍ය පාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ ප්‍රාච්‍ය ප්‍රතීච්‍ය භාෂාදන් **පොල්වත්තේ ප්‍රඥාලෝක** නිර්ග්‍රන්ථ විසින් ද බොහෝ ප්‍රයාස දරන ලද බව සදහන් කිරීමට කොමසුරු වම්හ.

මේ වගට,

විල්ගොඩ ධර්මානන්ද සර්වර

ශ්‍රී: බු: ව 2472
1929 පෙබරවාරි 5 දින දීය.

සැ. යු:- මේ වර්ෂාභි ප්‍රථම මුද්‍රණයෙහි සංක්ෂේපයයි.
වි. ධ.

25 – 3 – 62

සිංහල

චරියාපිටකාර්ථ වර්ණනා

ප්‍රස්තාවනා

පූජනෞ ත්‍රිලොකෙ මනසාං සතාං නුතා
යථාවාරුචරියා ප්‍රභවෙත් ප්‍රණම්‍ය තම්,
කරොමි චරියාපිටකාර්ථවර්ණනා
ත්‍රිතානුවාදං නිජභාෂයාධුනා.

ශාක්‍යකුලතිලකවූ, පරදුඃඛ දුඃඛිතවූ, කරුණා නිධානවූ අප සම්‍යක් සම්බුඩ- සර්ව්ඥ රාජොත්තමයාණන් වහන්සේට මෙසේ භක්ති ශ්‍රඩාතිශයෙන් ප්‍රණාමය කොට උන්වහන්සේ විසින් සකල සත්ත්වයා කෙරෙහි පතළ මහා කරුණාවෙන් පුරන ලද දානාදි දශවිධ පාරමී ධර්මයන් ගැබීකොට ඇති චරියාපදනයන්ගේ ආනුභාව විභාවනය කරනු පිණිස දෙශනා කර වදාරන ලද "චරියාපිටක" නම්වූ ධර්ම පර්‍යායය සම්බන්ධවූ අර්ථ කථාව පාලි භාෂාවෙහි සෙ හසළ බුඩි ඇති සත් පුරුෂයන් සඳහා සිංහල භාෂාවෙන් ගෙනහැර දක්වනු ලැබේ. සත්පුරුෂයන් විසින් මේ සවණේ භාජනයෙහි ප්‍රක්ෂිප්ත සිංහතෙලය මෙන් මනාව සිත්හි ලා දරිය යුතු.

සූචී පත්‍රය

පිට		
	ප්‍රස්තාවනා	
1	ග්‍රන්ථාරම්භය	
3	නිදාන කථා	
23	අකිත්ති	චරිතය
38	සංඛ බ්‍රාහ්මණ	,,
39	කුරුධම්ම	,,
44	මහාසුදර්ශන	,,
49	මහාගෝවින්ද	,,
56	නිමිරාජ	,,
63	චන්දකුමාර	,,
68	සිවිරාජ	,,
80	වෙස්සන්තර	,,
107	සසපණ්ඩිත	,,
115	මාතුපෝසක	,,
120	භූරිදත්ත	,,
133	චම්පෙය්‍ය නාග	,,
136	චුල්ලබෝධි	,,
142	මච්ඡරාජ	,,
145	රුරුමිග රාජ	,,
152	මාතඞ්ග ඡණ්ඩිත	,,
161	ධම්මදේවපුත්ත	,,

පිට		
167	අලීනසත්තු	චරිතය
176	සංඛපාල	,,
181	යුධඤ්ජය	,,
185	සෝමනස්ස	,,
193	අයෝඝර පණ්ඩිත	,,
196	මහාසුදස්සන	,,
205	සෝණ පණ්ඩිත	,,
211	තෙමිය පණ්ඩිත	,,
223	කපිරාජ	,,
226	සච්චකිරිය	,,
228	වට්ටකරාජ	,,
232	මච්ඡරාජ	,,
236	කණ්හදීපායන	,,
243	සුතසෝම	,,
254	සාමපණ්ඩිත	,,
260	එකරාජ	,,
264	මහාලෝමහංස	,,
268	උද්දාලක ඛාථා	
275	පකිණ්ණක කථා	
357	දෙශනානිගමනය	

සිංහල චරියාපිටකාර්ථවර්ණනා

——(:)——

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

——÷——

1 චරියා සබ්බලොකස්ස හිතා යස්ස මහෙසිනො
අච්චන්තයය්හානුභාවන්තං වන්දෙ ලොකගහනායකං.

යන මේ ගාථාව චරියාපිටකාර්ථ සංවර්ණනා කරනු කැමතිවූ සවසමය සමයාන්තර පාරගතාශෙෂ කවිවක්‍ර චූඩාමණි **අර්ථකථාචාර්ය භදන්ත ශ්‍රී ධම්මපාලාචාර්යපාදයෝ** පළමුකොට බුද්ධ **රත්නයට** නමස්කාර දක්වන පිණිස උපන්‍යාස කළහ.

"මහත්වූ ශීලසමාධි ප්‍රඥා විමුක්ති විමුක්ති ඥාන දර්ශන ආදී යම් තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්ව්ඥ රාජෝත්තමයන් වහන්සේගේ සම්භාරාංශත් පාරමිතා ධර්ම සංගෘහීතවූ දානාදී ප්‍රභේදත සංඛ්‍යාත චරියා තොමෝ මුළුලොවට වැඩ පිණිස වන්නිද, කොසිතිය හැකි ආනුභාව ඇති ලොකාග්‍ර තායකවූ **ඒ බුදුරජාණන් වහන්සේට** හය ලොභ කුලාචාර විරහිත භක්ති ශ්‍රද්ධාතිශයෙන් ප්‍රණාමය කෙරෙමි" යනු එහි අභිප්‍රායයි.

මෙසේ පළමුකොට බුද්ධ රත්නයට නමස්කාර දක්වා ඉක්බිති ධර්ම රත්නයට නමස්කාර දක්වන්නෝ:—

2 "විජ්ජාචරණසම්පන්නා යෙන නීයන්ති ලොකතො
වන්දෙ තමුත්තමං ධම්මං සම්මාසම්බුද්ධපූජිතං"

යනු කීහ. "යම් නවලොකොත්තර ශ්‍රී සද්ධර්මයක් හෙතුකොට ගෙන උපාදානස්කන්ධ සංඛ්‍යාත ලොකයෙන් අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ ආර්‍යපුද්ගලයෝ නිර්වාණක්ෂෙම භූමියට පමුණුවනුලබත්ද, සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් පුදකලද්දවූ ඒ උතුම්වූ නවලොකොත්තර **ශ්‍රී සද්ධර්ම** ප්‍රණාමය කෙරෙමි" යනු එහි භාවයි.

ධර්මරත්නයට අනතුරුව **සංඝරත්නයට** නමස්කාර කිහ:

3 "සීලාදිගුණසම්පන්නා යිතො මිගඵලෙසු යෝ,
වන්දෙ අරියසංඝං තං පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං යි"

මෙහි අභිප්‍රාය නම්:- "ශීලසමාධි ප්‍රඥාදි ගුණ සමූහයෙන් යුක්තවූ සතරමහ සතර ඵලයෙහි පිහිටියාවූ ඔම් අෂ්ටාංශී පුද්ගල සංඝ රත්නයක්වේද, නිරුත්තර පුණ්‍යක්ෂේත්‍රවූ ඒ **ආර්‍ය සංඝ රත්නය** මස්සාකයෙන් ප්‍රණාම කෙරෙම්" යනුයි.

මෙසේ රත්නත්‍රය විෂයෙහි කරන ලද ප්‍රණාමයෙන් ලත් කුශලානුභාවයෙන් නසන ලද උපද්‍රව ඇතිව තමන් විසින් අභිප්‍රේත **වඩියාපිටකාර්ථ වර්ණනාව** කරන පරිදි දක්වන්නෝ "වන්දනා" යනාදිය කිහ:-

4 වන්දනාජනිතං පුඤ්ඤං ඉති යං රතනත්තයෙ,
හතන්තරායෝ සබ්බත්ථ හුත්වාහං තස්ස තෙජසා.

5 ඉමස්මිං භද්දකප්පස්මිං සම්භතා යා සුදුක්කරා,
උක්කංසපාරම්පප්පත්තා දානපාරම්තාදයෝ.

6 තාසං සම්බොධිචරියානං ආනුභාවවිභාවනං,
සක්කාසු නිග්‍රොධාරාමෙ වසන්තෙන මහෙසිනා.

7 යං ධම්මසෙනාපතිනෝ සබ්බඤ්ඤුකෙතුනෝ,
ලොකනාථෙන චරියා පිටකං නාම දෙසිතං.

8 යං බුද්ධනිකායසම්ං සංගායිංසු මහෙසයෝ,
ධම්ම සංගාහකා සත්ථු හෙතුසම්පත්ති දීපනං.

9 තස්ස සම්බොධිසම්භාර විභාගනය යොගතෝ,
කිඤ්චාපි දුක්කරා කාතුං අත්ථසංවණ්ණනා මයා.

10 සහ සංවණ්ණනං යස්මා ධරතෙ සත්ථුසාසනං,
පුබ්බාචරියසීහානං නිට්ඨිතෙව විනිච්ඡයෝ.

11 තස්මා තං අවලම්බිත්වා ඔගාහිත්වා ච සබ්බසෝ,
ජාතකානුපනිස්සාය පොරාණට්ඨකථානයං.

12 නිසිතං වාචිනාමග්ගං සුවිසුද්ධං අනාකුලං,
මහාවිහාරවාසීනං නිපුණත්ථවිනිච්ඡයං.

13 නීතනෙය්‍යත්ථහෙදඤ්ච පාරමීපරිදීපනං,
කරිස්සාමීති චරියා පිටකස්සත්ථවණ්ණනං.

14 ඉති ආකංඛමානස්ස සබ්බම්මස්ස විරඔතිං,
විභජන්තස්ස තස්සත්ථං නිසාමයථ සාධවෝ'' යි.

ධම් සංවණ්ණනා කරනුවන් විසින් වණ්නීය ධම්යට ආදි කොට නිදාන කියයුතු හෙයින් මේහිදු පළමුකොට **නිදානකථාව** ආරම්භ කරනු ලැබේ.

කෙසේද යත්? එහි "**චරියාපිටක**" යනු කවර අර්ථයකින් චරියාපිටකයයි කියනු ලැබේද? අතීත ජාතිවල ශාස්තෘන්වහන්සේ ගේ චරියානුභාව ප්‍රකාශවූ පඤ්ඤත්ති (පාළි) ධම්ය චරියා පිටකයයි කියනු ලැබේ. නොහොත් ඒ පඤ්ඤත්ති තොමෝ යම් හෙයකින් ශාස්තෘන් වහන්සේගේ දැඩි ජාතිවල චරියාවන්ගේ ආනුභාව ප්‍රකාශකිරීම කරණකොටගෙන භාජන වූවාද, එහෙයිනුදු චරියාපිටකයයි කියනු ලැබේ. මෙසේ පඤ්ඤත්ති අර්ථයෙනුදු භාජනාර්ථයෙනුදු චරියාපිටකයයි කියනු ලැබේයයි දතයුතු.

ඒ මේ චරියාපිටකය තෙම වනාහි විනයපිටකය සූත්‍රපිටකය අභිධම් පිටකය යි කියූ පිටකත්‍රය අතුරෙන් **සූත්‍රපිටක පඤ්ඤාපනය** වෙයි. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අඞ්ගුත්තර නිකාය, බුද්දක නිකාය යන නිකාය පස අතුරෙන් බුද්දක නිකාය පඤ්ඤාපනා වෙයි.

සූත්‍රය, ගෙයය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තක කථ, ජාතකය, අබ්භූත ධම්මය, වෙදල්ලය, යන ශාසනාඞ්ගතවය අතුරෙන් **ගාථාඞ්ගයෙන්** සංගෘහීතයි.

15 "චසීතිං බුද්ධතෝ ගණ්හිං වෙසහස්සානි භික්ඛුතෝ
චතුරාසීතිසහස්සානි යෙ මේ ධම්මා පවත්තිතෝ" යි.

ධම් භාණ්ඩාගාරික ආනන්දස්ථවිරයන් වහන්සේ **ඔයින්** ප්‍රතිඥාකරනලද සුවාසූ දහසක් ධම්සකන්ධයත් අතුරෙන් **ඉන්ද්‍රියප** ධම්සකන්ධයකින් සංගෘහීතයි.

චය්‍යාවශයෙන් අකිත්තිනි වගීයෙහි දශයෙක, හත්ථිනාග වගීයෙහි දශයෙක, යුධඤ්ජය වගීයෙහි අසම්භින්නසුත්‍රය යි එකසිය **පන්තිසකින්** සංගෘහීතය, **වගීත්‍රය** අතුරෙන් අසීත්‍යන්ත වග්ගයේ වය්‍යාවන් අතුරෙන් **අකිත්තිනිවය්‍යාවද** මුල්වූයේය. ඒ අකිත්තිනි වය්‍යාවගේද

කප්පෙ ච සතසහස්සෙ ච චතුරෝ ච අසංඛ්‍යෙ,
එත්‌ථන්තරෙ යං චරිතං සබ්බං තං බොධිපාචනං.

යන මේ ගාථා තොමෝ මුල්වූවාය. ඒ චරියා පිටකයාගේ මෙතැන් පටන් පිළිවෙළින් අපි වණ්නාව වන්නේය. ඒ මේ අපි සංවණ්නා තොමෝ වනාහි යම්හෙයකින් **දූරෙනිදානය, අවිදූරෙ නිදානය, සන්තිකෙ නිදානය** යන මේ නිදානත්‍රය දක්වා කියනු ලබන්නී අසන්නවුන් විසින් මූලපටන් මනාකොට දන්නාලද්දීනම් වේද, එහෙයින් ඒ නිදානත්‍රය පිළිබඳවූ මේ විභාගය දනයුතු.

ත්‍රෛලොක්‍යෙක දීපායමානවූ ශ්‍රීමත් දීපඞ්කර දශබලධාරීන් වහන්සේගේ පාදමූලයෙහි කරතලද අනිනිහාර ඇති මහබෝ සත්ත්‍වයාගේ තුෂිතපුරයෙහි ඉපදීම දක්වා පැවති කථාමාර්ගය තෙම **දූරෙනිදාන** නම්වේ. තුෂිත භවනයෙහි උපන්නැන්පටන් බොධිමණ්ඩයෙහිදී සම්බෝධඥාන ප්‍රාප්තිය දක්වා පැවැති කථා මාර්ගයතෙම **අවිදූරෙනිදාන** නම් වේ. මහබෝමැඩ පටන් වනී මාන වසතුව දක්වා පැවැති කථා මාර්ගයතෙම **සන්තිකෙනිදාන** නම් වේ.

මේ නිදානත්‍රය අතුරෙන් යම්හෙයකින් දූරෙනිදාන අවිදූරෙ නිදානයෝ සාධාරණවූවාහු වෙත්ද, එහෙයින් ඒ නිදානවය ජාතක අට්ඨවාවෙහි විස්තර කරතලද නයින්ම විස්තර වශයෙන් දනයුත්නාහ සන්තිකෙ නිදානයාගේ වනාහි විශෙෂයක් ඇත්නුයි ඒ නිදානත්‍රය පිළිබඳවූ මේ මූලපටන් සංක්ෂෙප කථාවයි.

සකල ලොක ශිවඞ්කර වූ ශ්‍රීමත් වූ **දීපංකර භාග්‍යවතුන් වහන්සෙගේ** ශ්‍රී පාදමූලයෙහි කරතලද අනිනිහාර ඇති **ශ්‍රී මහා බොධිසත්ත්ව** වූ **අපගේ ලොකනාථයන් වහන්සේ** ආතමාභිනිහාරයට අනුරූපවූ සමන්ත්‍රිංශත් පාරම්ධර්මයන්පුරා සම්බෝධඥාන සම්භාරය මුදුන් පමුණුවා **තුෂිතභවනයෙහි** උපන්සේක් බුදුවීමට උත්පත්තිකාලය බලමින් එහි ආයුපමණින් වැස ඉන් සැව **ශාක්‍යරාජකුලයෙහි** ඉපද අපමණ පෙරහරින් හා මහත් ශ්‍රී සෞභාග්‍යයෙන් වැඩෙමින් අනුක්‍රමයෙන් යොවුන්විය පැමිණ එකුන්තිස් වයස්හි කරතලද මහාභිනික්මත් ඇතිසේක් සාවුරුද්දක් මුළුල්ලෙහි මහත් වියරු වඩා **වෙසඟපුණු පොහොයෙහි** මහබෝරුක් මුල්හි වැඩහුන්සේක් භිරු අවරපත් කොවත්ම

මරසෙන් පලවා පෙරයම් පෙර විසූ සඳ පිළිවෙළ සිහිකොට මැදිමියම දිවැස පිරිසිදුකොට පැසිමියම්හි එක්දහස් පන්සියයක් කෙලෙසුන් නසා නිරුහාරවූ **සම්‍යක් සම්බොධිය** අවබොධ කර වදාළසේක.

ඉක්බිති එහිම සත්සති යවා **ඇසළපුරපොහොයෙහි** බ්‍රහ්මැස් වැඩ මිගදාය නම්වූ ඉසිපතන්හි **අඤ්ඤාකොණ්ඩඤ්ඤ සථවිර** ප්‍රමුඛවූ අටළොස්කෙළක් බ්‍රහ්මයන්හට දහම් දම්පොවමින් දම්සක් පවත්වා **යසකුලපුත්‍රයා** ආදිකොට ඇති විනෙය ජනයන් රහත්පලයෙහි පිහිටුවා ඒ සියලු සැටනමක් රහතුන් ලොකානුග්‍රහ පිණිස ඒ ඒ දිග යවා තමන්වහන්සේ **උරුවෙලා** නම් දනව්වට වඩනාසේක් කපපාසික වනසණ්ඩයෙහි (කපුවතළුයන්හි) **භද්දවර්ගිය** නම්වූ තිසක් පමණ රාජකුමාරයන් සොවාන් ඵලාදියෙහි පිහිටුවා උරුවෙල් දනව්වට වැඩ තුන්දහස් පන්සියයක් පෙළහර දක්වා දහසක් ජටිලයන් පිරිවරකොට ඇති **උරුවේලකාශ්‍යපාදි** තුන්බැජටිලයන් විනයනය කොට ඔවුන් විසින් පිරිවරනලදසේක් රජගහා නුවර සම්පයෙහිවූ ලඨිවන නම් උයන්හි වැඩඋන්සේක් **බිම්සර මහරජාණන්** ප්‍රමුඛකොට ඇති එක්ලක්ෂ විසිදහසක් පමණ බ්‍රාහ්මණ ගෘහපතීන් සසුන්බස්වා මගධෙශ්වරවූ බිම්බිසාර මහරජාණන් කැරවූ වෙළුවන නම් මහාවිහාරයෙහි වැඩ වාසය කර වදාරනසේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවාසය කර වදාරනකල්හි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ අගසවු තනතුරෙහි තුබූ කළු ශ්‍රාවක සන්නිපාතයවූ පසු සුදෙවුන් මහරජාණෙන් "මාගේ ප්‍රතිණුවන් වහන්සේ සාවුරුද්දක් මුළුල්ලෙහි දුෂ්කාරක්‍රියාකොට උතුම්වූ අභිසම්බොධියට පැමිණ පවත්වනලද උතුම් **දම්සක්** ඇතිව රජගහා නුවර නිසා වේළුවනාරාමයෙහි වැඩවාසයකර වදාරනසේකැයි අසා මප්‍රතිණුවන් මෙහි ගෙනවුත් දක්වවුයයි කියා ප්‍රාර්ථනයන් දස දහසක් පිරිවරකොට ඇති ඇමතියන් දශදෙනකු පිළිවෙළින් යැවූහ. ඔවුන් රජගහනුවරට ගොස් බුදුරජාණන් වහන්සේගේ ධම් දෙශනාව අසා රහත්වූකල්හි **ඤාණදස්සී** සථවිරයන් විසින් රජ්ජුරුවන්ගේ අදහස දැන්වූකල්හි භාග්‍යවතුන් වහන්සේ විසිදහසක් පමණ රහතුන් වහන්සේ විසින් පිරිවරන්ලදසේක් රජගහනුවරින් නික්ම සැටයොදුන් මඟ ගෙවා දෙමසකින් **කිඹුල්වත්** පුරයට පැමිණිසේක.

ශාක්‍ය රජදරුවෝ "අපගේ ඥාතිශ්‍රේෂ්ඨයන් වහන්සේ දක්නෙමු" යයි රැස්ව කැවිව **න්‍යග්‍රෝධාරාමය** භාග්‍යවතුන් වහන්සේගේ හා භික්ෂු සංඝයාගේ වාසයට යොග්‍යකරවා ගඳමල් ආදිය ගත් අත් ඇතිව පෙරගමන් කොට ශාස්තෘන් වහන්සේ **න්‍යග්‍රෝධාරාමයට** වැඩමකැරැවූහු. එහි භාග්‍යවතුන් වහන්සේ විසිදහසක් මහරහතුන් විසින් පිරිවරන ලද්දහු පනවනලද උතුම්වූ බුදු අස්නෙහි වැඩඋන්සේක. මානයෙන් තදවූ ශාක්‍යයෝ ශාස්තෘන් වහන්සේට පිණිපා නො කොළෝ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අදහස් බලා මන්බිදපියා ධර්මදේශනාවට භාජන කරනු සඳහා අනිඤ්ජාදක චතුර්ධ්‍යානයට සමවැද හුනස්නෙත් නැගී ඔවුන්හිස පාපස් වගුරුවන්නාසේ අහසට නැගී ගන්ධමූලිවෘක්ෂ මූලයෙහි කළ ප්‍රාතිහාර්‍ය බඳුවූ **යමකප්‍රාතිහාර්‍ය** කළසේක. සුදොවුන් මහරජාණෝ ඒ අසිරිමත් පෙළහර දැක "මේතෙම ලොකයෙහි අග්‍රපුද්ගලය" යි වැන්දෝ. මහරජ්ජුරුවන් වැඳි කල හැම ශාක්‍යයෝම වැන්දහ. එකල්හි වතාහි යමාමහ පෙළහර කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ **ලොකවිවරණ** නම් ප්‍රාතිහාර්‍යයක්ද කළසේක.

යම් ඒ ප්‍රාතිහාර්‍යයක් පවත්නාකල මනුෂ්‍යයෝ මිනිස්ලොව සිටිපරිද්දෙන් සිටියාහුම උන්පරිද්දෙන් උන්නාහුම සිවුමහර ජය පටන් අකනිට්ඨ බඹලොව දක්වා ඒ ඒ තැන තමතමන්ගේ විමන්හි කෙළනාවූද දෙවානුභාවයෙන් බබලන්නාවූද මහත් දිව්‍යඇප්පත් වළඳන්නාවූද, ශාන්තාවූ සමවත්සුව විඳින්නාවූද ඔවුනොවුන් ධර්මසාකච්ඡා කරන්නාවූද සියලු දෙව්යන්ද බුඩානුභාවයෙන් තමතමන්ගේ මසැසින්ම දකිත්ද. එසේම පොළොවෙන්යට අටමහ නරකයන්හිද සොළොස් වැදෑරුම් ඔසුපත් නිරයෙහිද ලොකාන්තරික නරකයෙහිදයි ඒ ඒ තැන අති මහත් දුක් අනුභව කරන්නාවූ සත්වයන් දකිත්ද දස දහසක් ලෝදහි දෙවියෝ මහත් දෙවානුභාවයෙන් තථාගතයන් කරා එළඹ ආශ්චර්‍ය අද්භූත සිත් ඇත්තාහු දෙහොත් මුදුනෙහි තැබුවාහු නමස්කාර පර්‍යුපාසන කෙරෙත්ද බුඩගුණ ප්‍රතිසංයුක්තවූ ගාථාවන් උදහරණ කෙරෙමින් සතුති කෙරෙත්ද අත්පොළසන් දෙත්ද සිතාසෙත්ද ප්‍රීතිසෞමනස්‍ය දන්වත්ද එබඳුවූ **ලොකවිවරණ** නම් පෙළහරක් කළසේක. යමක් සඳහා වදරණලද්දේද:-

16. "භුම්මා චාතුම්මහාරාජිකා තාවතිංසා
යාමා ව දෙවා තුසිතා ව නිම්මිතා,
පරනිම්මිතා යෙපි ච බ්‍රහ්මකායිකා
අනඤ්ඤිතා විපුලමකංසු ඝොසං" යි.

එකල්හි දශබලධාරීවූ තථාගතයන් වහන්සේ තමන්ගේ අතුලවූ බුඩබලය දක්වන්නෙමියි මහකුළුණින් ඉසවන ලද සිත් ඇතිසේක් දසදහසක් සක්වල වැස්සන්ගේ සමාගමයෙහි අහසෙහි සක්මනක්මවා දෙලොස් යොදුන් පතළාවූ සවිරත්නමයවූ ඒ සක්මනෙහි වැඩ සිටිසේක් දිව්‍ය මනුෂ්‍ය නයන තමැති පඹුන්ගේ පානීය සථානයක් වැනිවූ ආශ්චර්‍යවූ අනන්‍යසාධාරණවූ බුදුවරයන්ගේ සාමඩිඤ්ඤානුභාව දීපනය කරන්නාවූ පෙළහර දක්වා නැවත එම සක්මනෙහි සක්මන් කරමින් විනෙය ජනයන්ගේ අදහස් පරිදි නොසිතිය හැකි ආනුභාවයෙන් අනොපමෙය්‍යවූ බුඩලීලාවෙන් දහම් දෙසූසේක. එහෙයින් වදරන ලද්දේය.

17. "නහෙතෙ ජානන්ති සදෙවමානුසා
බුඩො අයං කීදිසකො තරුත්තමෝ,
ඉද්ධිබලං පඤ්ඤාබලං ච කීදිසං
බුඩබලං ලොකහිතස්ස කීදිසං.

18. න හෙතෙ ජානන්ති සදෙව මානුසා
බුඩො අයං එදිසකො තරුත්තමෝ,
ඉඩිබලං පඤ්ඤාබලං ච එදිසං
බුඩබලං ලොකහිතස්ස එදිසං

19. හන්දාහං දස්සයිස්සාමි බුඩබලමනුත්තරං
වඩ්ඪමං මාපයිස්සාමි නහෙ රතනමණ්ඩිතං"යි.

මෙසේ තථාගතයන් වහන්සේ තමන් වහන්සේගේ බුඩානුභාව ප්‍රකාශකවූ ප්‍රාතිහාර්‍යය දක්වා දහම්දෙසන කල්හි **ආයුෂ්මත් දම්සෙනෙවි සෑමියුත් මහතෙරුන් වහන්සේ** රජගහනුවර ගිජුකුළු පව්වෙහි සිටිසේක් දිවැසින් දැක ඒ බුඩානුභාව සඳහාගත යෙන් ආශ්චර්‍යවූ අද්භූත සිත් ඇත්තාහු ඒකාන්තයෙන් "මම බොහෝ සෙයින් බුඩානුභාවය ලොකයාට ප්‍රකාශ කරන්නෙමැ" යි උපන් පරිවිතර්කී ඇතිව තමන් පිරිවර වූ පන්සියයක් භික්ෂූන්ට ඒ කාරණය කියා යෑඩියෙන් අහසින් ඒ ඇසිල්ලෙහිම අවුත් පිරිවර සහිතව බුදුන් කරා එළඹ පසඟ පිහිටුවීමෙන් වැඳ දශනඛසමොඩාන සමුජ්ජලිතවූ අඤ්ජලිපුට මස්තකයෙහි කොට තථාගතයන් වහන්සේගේ **මහාභිනීහාරය** හා **පාරමී පූරණයද** විවාලෝය.

භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රාතිහාර්‍යයක් කොට එහි රැස්වූ මනුෂ්‍යාමනුෂ්‍යයන්ට ද දසදහසක් සක්වළ දෙවි බ්‍රහ්මයන්ට ද තමන් වහන්සේගේ බුද්ධානුභාවය පරිදීපනය කරන්නෝ බුද්ධවංශය දෙශනා කළසේක. එහෙයින් වදාරනලදී.

20. සාරිපුත්තොතා මහාපඤ්ඤා සමාධිඤ්ඤාන කෝවිදෙ
පඤ්ඤාය පාරම්පපත්තෙතා පුච්ඡති ලොකනායකං.

21. කිදිසෝ? තෙ මහාවීර අභිනීහාරෝ තරුතනම,
කිතියි කාලෙ තයා වීර පත්ථිතා බොධිමුත්තමා.

22. දානං සීලං ච තෙකඛම්මං පඤ්ඤා විරියං ච කිදිසං?
ඛන්ති සච්චමධිට්ඨානං මෙත්තුපෙකඛා ච කිදිසං?

23. දසපාරමියෝ වීර කිදිසා ලොකනායක
කථං? උපපාරම් පූණණා පරමත්ථපාරම්කථං.

24. තස්ස පුට්ඨෝ වියාකාසි කරවික මධුරංගිරෝ
නිබ්බාපයන්තෝ හදයං හාසයන්තෝ සදෙවකං"සි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් බුඛවංශය දෙශනාකළ කල්හි ආයුෂ්මත්වූ දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ "බුදුවරයන්ගේ **හෙතුසම්පදා** නොමෝ විසමයෙක. **සමුදාගම සම්පදා** නොමෝ විසමයෙක, **මහාභිනීහාර සමාඛ්‍යා** විසමයෙක. මෙපමණකලක් මුළුල්ලෙහි මෙසේ පැරැම් පුරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ විසින් එකාසනයෙන් දුෂ්කරයක් කරන ලද්දේය. යම් මේ සම්භෘතාබලයෙහි වශී භාවයක්වේද මෙබඳුවූ මහත් ඍද්ධි ඇති බවක්වේද මෙබඳු මහත් ආනුභාව ඇති බවක්වේද ඒ වනාහී එබඳුවූ බොධි සම්භාර සම්භරණයට සුදුසුවූම විපාක වන්නේයයි බුඛගුණාලම්බනඥානය මෙහෙයූහ.

උන්වහන්සේ අනන්‍ය සාධාරණවූ භගවත්හුගේ ශීලය, සමාධිය, ප්‍රඥාවය, විමුක්තිය, විමුක්තිඥාන දර්ශනය, හිරිඔතප්පදෙකය, ශ්‍රද්ධාවීර්‍ය්‍ය දෙකය, සතිසම්පජඤ්ඤ දෙකය, සීල විසුද්ධි දිට්ඨිවිසුද්ධි දෙකය, ශමථවිදර්ශිතා දෙකය, කුසල් මුල් තුනය, ත්‍රිවිධ සුචරිතය, ත්‍රිවිධසම්‍යක්විතර්කය, ත්‍රිවිධ අනවද්‍යසංඥය, ත්‍රිවිධ ධාතුය, චතුස්සතිපට්ඨානයෝය, සතර සම්‍යක් ප්‍රධානය, සතර ඍද්ධිපාදය, සතර (ආර්‍ය්‍ය) මාර්ගය, චතුරාර්‍ය්‍ය ඵලය, ශික්ෂාත්‍රය සිඛියාය, චතුර්විධ යොනි පරිච්ඡේදක ඥානය, චතුර්විධ ආර්‍ය්‍යවංශය, චතු

වෛශාරද්‍යඥානය, ප්‍රධාන අභිනිවේශය, පඤ්චාඵික සම්‍යක් සම්බන්ධිය, පඤ්චේන්ද්‍රියය, පඤ්චබලය, පඤ්චනිස්සරණීය ධාතුය, පඤ්චවිමුක්තායතන ඥානය, එකාදසවිමුක්තිපරිපාචනීය ධර්මය, ඡසාරණීය ධර්මය, අට්ඨඅනුසන්ධිනිසථානය, අභිගාරව ධර්මය, ඡනිස්සරණීය ධාතුය, ඡසතතවිහාරය, අඛනුබන්ධනීය ධර්මය, අට්ඨිවේධභාගීය ප්‍රඥය, අඛිඥාය, අඛිඅසාධාරණඥානය, සප්ත අපරිහාණීය ධර්මය, සප්තාර්‍යධනය, සප්තබොධ්‍යඞ්ගය, සප්තසත්පුරුෂ ධර්මය, සප්තනිර්‍දරවස්තුය, සප්තසංඥාය, සප්තදක්ෂිණාවිශුද්ධිගල දෙශනාය, සප්තදක්ෂිණාශ්‍රවබල දෙශනාය, අෂ්ටප්‍රඥා ප්‍රතිලාභ හෙතු දෙශනාය, අෂ්ටසම්මත්තනය, අෂ්ටලෝකධර්මාතික්‍රමය, අෂ්ට ආරම්භ වස්තුය, අෂ්ටඅක්ෂණ දෙශනාය, අෂ්ටමහාපුරුෂ චිතකය, අෂ්ට අභිභායතන දෙශනාය, අෂ්ට විමෝක්ෂ ධර්මය, නවයෝනිසෝ මනසිකාර මූලකධර්මය, නවපාරිශුද්ධි ප්‍රධාන්‍යඞ්ගය, නව සත්ත්වාවාස දෙශනාය, නව ආඝාත පටිවිනය සංඥාය, නවතානාත්ත්වදෙශනාය, නවානුපූර්‍ව විහාරය, දශනාථකරණ ධර්මය, දශකසිණායතනය, දශ කුශල කර්මපථය, දසසම්මත්තනය, දශාර්‍ය වාසය, දශඅශෛක්ෂ්‍යධර්මය, දශරත්නය, දශ තථාගතබලය, එකාදස්මෙත්තානිසංසය, වාදශ ධර්මචක්‍රාකාරය, තෙළෙස් ධුතගුණය, තුදුස් බුද්ධඥානය, විමුක්ති පරිපාවණීය ධර්මපඤ්ඤාසය, සොළොස් වැදෑරුම් ආනාපාන සතිය, ඔවඩශ අපරන්තපනීයධර්මය, අට ලොස් බුදුදහම, එකූන්විසි පස්විකුම්තැණය, සුසාළිස් ඥානවර වස්තුය, සම්පතස් උදයව්‍යය ඥානය, පරොපණ්ණාස කුශල ධර්මය (පතසින්වැඩි කුසල්ය) ඥානවස්තු සත්සැත්තෑවය, සුවිසි කෙළලක්ෂයක් සමාපත්ති සඤ්චාරිත මහාවජ්‍රඥානය, අතන්ත නය සමන්තපට්ඨාන පවිවය පච්චවෙක්ඛණ දෙශනා ඥානය, එසේම අපරිමාණ ලොකධාතුයෙහි අපරිමාණසත්ත්වයන්ගේ ආසයානුසයාදිවිභාවත ඥානයයන මේ ආදීවූ අචින්ත්‍යානුභාව ඇති බුඩ ගුණයන් ධම් පරම්පරා විසින් අනුව යෙමින් සිහි කරන්නාහු කෙළවරක් පමණක් නොදුටහ. ඒ එසේමය. ශාරිපුත්‍ර සථවිරයන් වහන්සේ ආවජ්ජිතා කරන්නාහු තමන් ගුණයන්ගේද කෙළවරක් හෝ ප්‍රමාණයක් නොදක්නාහ. උන් වහන්සේ භගවත්හුගේ ගුණයන්ගේ ප්‍රමාණය කෙසේනම් දක්නාහුද? යමක්හුගේ ප්‍රඥව විපුලද නුවණ තියුණුද ඒ තැනැත්තේ බුදුගුණයන් මහත්වශයෙන් අදහයි. මෙසේ සැරියුත් තෙරුන්වහන්සේ බුදුන්ගේ ගුණයන් පිළිබඳවූ මෙතකැයි පමණක් හෝ පරිච්ඡේදයක් හෝ නොදක්නාහු "ශ්‍රාවක පාරමී ඥානයෙහි සිටියාවූ මාවැන්නකුට පවා බුඩගුණයෝ නුවණින්

පිරිසිදින්නට නොහැක්කාහුය. සෙස්සන් පිළිබඳව කියනුම් කවරේදැයි **සවිඤ්ඤාණකෝ** වනාහි ආශ්චර්යයහ. අවින්ත්‍යයහ. අප්‍රමේය ප්‍රභෙදයහ. මහත් ආනුභාව ඇත්තාහ. හුදෙක් මේ බුඩගුණයෝ වනාහි **එකම** බුඩඤාණයටම සම්ප්‍රකාරයෙන් ගොවර වන්නාහ. සෙස්සන්ගේ ඥානයට ගොදුරු නොවන්නාහ. සම්‍යක් සම්බුඩයන් විසිනුදු, විසාර විසින්... වදාරනු නොහැක්කාහුම යයි නිෂ්ඨාවට ගියෝ.

මේ වදාරන ලද්දේමැයි.

25. "බුඩෝ'පි බුඩසස භණෙය්‍ය වණ්ණං
කපපම්පි වෙ අඤ්ඤමහාසමාතෝ
බියෙථ කපෙපා විරදීඝමන්තරෙ
වණ්ණෙණා න බියෙථ තථාගතස්ස" යි

මෙසේ බුදුවරයන්ගේ ගුණ මහත්වය නිසා උපන් බලවත් ප්‍රීති සෞමනස්‍ය ඇත්තාහු නැවත මෙසේ සිතූහ. "මෙබඳුවූ බුඩ ගුණයන්ට හෙතුවූ බුඩකාරක ධර්මයයි කියනලද **පාරමිඉ** අනේ මහත් ආනුභාව ඇත්තාහුය. කවරතම් ජාතිවලදී පාරමිතාවෝ **මූකරවන ලද්දාහුද, කෙසේ** හෝ **මූකිරීමට ගියාහුදැයි,** එබැවින් මම මේ කාරණය විචාරමින් මෙසේද මූලපටන් බුඩානුභාවය මේ දෙවියන් සහිත ලොකයාට අනිශයින් ප්‍රකට කරන්නෙමි"යි ශාරිපුත්‍ර සථවිරයන් වහන්සේ මෙසේ සිතා බුදුන් අතින් මේ පැන විචාළෝය. එනම් - "සවාමීනි, භාග්‍යවතුන් වහන්ස! කවර තම් ජාතිවලදී මේ බුඩකාරක ධර්මයෝ මූකරවන ලද්දාහුද? කෙසේ මූකුරා ගියාහුදැ"යි යනුයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ **රත්න චංක්‍රමණයෙහි** පලක් බැඳ යුගදුරු මුදුනෙහි ළඟිරු මඩලක්මෙන් බබලමින් වැඩහුන්සේක් උන්වහන්සේට "ශාරිපුත්‍රය! මාගේ බුඩකාරක ධර්මයෝ සමාදානයෙහි පටන් නිරතුරුව සකස්කොට කළ බැවින් හා වීසෙන්‍යිපසථම්භයෙන් ද හැමකලපයෙහි භවයෙන් භවය ජාතියෙන් ජාතිය මූකරවන්නාහු වූහ. මේ භද්‍රකලපයෙහි මේ **චක්ඛුමාත** ජාතිවලදී මූකුරාගියහ"යි දක්වන්නාහු **"කපෙපච සතසහස්සෙ"** යනාදීන් **'බුඩාපදාන"** යන නිරුත්‍යභිධානයක් ඇති **චරියාපිටක** නම් මේ ධර්මපර්‍යාය වදළසේක.

සමහර ආචාර්‍ය කෙනෙක් වනාහි, රත්නචංක්‍රමණයෙහි සක්මන් කරන්නා වූ දෙවාතිදෙවවූ සම්‍යක් සම්බුඩයන් වහන්සේ

දෙවබ්‍රහ්මාදීන් විසින් පුදනු ලබමින් නාගලොකාරාමයට බැස විසි දහසක් රහතුන් විසින් පිරිවරන ලද්දහු පණවන ලද උතුම් බුද්ධාසන ප්‍රඥාකයෙහි වැඩහුන්හේක් යටකියනලද ක්‍රමයෙන්ම ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් පුළුවුන්කා ලදින් "වරියා පිටකය දෙශනාකළසේකැ"යි කියත්.

මෙපමණකින් දූරෙනිදාන අවිදූරෙනිදානයන් සැකෙවින් දක්වා වරියාපිටකයාගේ සන්තිකෙ නිදානය විස්තාර විසින් දක්වන ලද්දේයයි දතයුතු. දූරෙනිදානය වනාහි "අසංඛෙය්‍ය" යන පදයාගේ විභාවනයේදී පහළවන්නේයයි දැන් "**කප්පෙව සතසහස්සෙ**" * යනාදී නයින් පැවැත්නාවූ චරියාපිටක පාළියෙහි අථ වණ්නාව වන්නේය.

එහි මේ **කල්පශබ්දයතෙම** "උපසගී සහිතවද උපසගී රහිතවද, විතර්කී, විධාන, ප්‍රතිභාග, ප්‍රඥප්ති, **කාල**, පරමායු, ශ්‍රමණ ව්‍යවහාර, සමන්තභාව, අභිසද්දහන, ඡේදන, විනියොග, විකය ක්‍රියා, ලෙශ, අන්තර කල්ප, තෘෂ්ණා, දෘෂ්ටි, අසංඛ්‍යකල්ප, මහා කල්පාදියෙහි දක්නා ලැබේ. එහෙයින් මේ කල්පශබ්දය "**නෙකඛම්ම සංඛපෙපා**" "**අව්‍යාපාද සංඛපෙපා**" යනාදි තන්හි විතර්කියෙහි ආයේය. "**වීවරෙ විකපපං ආපජ්ජේය්‍ය**" යනාදි තන්හි විධානයෙහි ආයේය. අධික විධානයට පැමිණෙන්නේය යනු එහි අර්ථයි. "**සක්‍ඛි කපෙපන වතනො සාවකෙන සඛිං මන්තයමානා නජානිම්හ**" යනාදි තන්හි ප්‍රතිභාගයෙහි ආයේය. ("බුදුන් හා සමවූ" යනු එහි අර්ථයි.) "**ඉඛ්‍යසමා කප්පො**" යන ආදිතන්හි ප්‍රඥප්තියෙහි ආයේය. "**යෙන සුදං නිවවකපපං විහරාමි**" යනාදි තන්හි කාලයෙහි ආයේය. "**ආකංඛමානො ආනන්ද තථාගතො කප්පංවා තිට්ඨෙය්‍ය කප්පාව සෙසංවා**" යනාදි තන්හි පරමායුෂයෙහි ආයේය. මෙහි කල්පය යනු "ආයුෂ් කල්පය"යි "**අනුජානාමි භික්ඛවෙ පංචහිසමණකප්පෙහි ඵලං පරිභුඤ්ජිතං**" යනාදි තන්හි ශ්‍රමණ ව්‍යවහාරයෙහි ආයේය. "**කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා**" යනාදි තන්හි සමන්ත භාවයෙහි ආයේය. "**සඛා සද්දහනා ඔකප්පනා අභිප්පසාදෙ**" යනාදිතන්හි අභිසද්දහනයෙහි ආයේය. "ශ්‍රද්ධායෙහි" යනු එහි අර්ථයි. "**අලඞකතො කප්පිතකෙසමස්සු**" යනාදි තන්හි ඡේදනයෙහි ආයේය. "**එව මෙව ඉතො දින්නං පෙතානං උපකප්පති**"

---

* කපෙපව සතසහසෙසව චතුරොව අසංඛියෙ,
එත්ථන්තරෙ යං චරිතං සබ්බං තං බොධිපාචනං.

යනාදි තන්හි විනියොගයෙහි ආයේය. "කපඤ්ඤතෙන අඤ්ඤප්ප කතං සංඛිපිතං හොති" යනාදිතන්හි විධිය ක්‍රියායෙහි ආයේය. "අඤ්ඤ කපෙපා නිපජ්ජිතුං හඤ්ඤං නිපජ්ජාමි" යනාදි තන්හි ලෙඝයෙහි ආයේය. "අපායිකෙඛා නෙරයිකෙඛා කප්පට්ඨෙයා සඤ්ඤාභෙදෙඛා කපපං නිරයම්හි පච්චති" යනාදි තන්හි අන්තර කල්පයෙහි ආයේය.

26. "න කපපයන්ති න ප්‍රරුඛරොන්ති
ධම්මාපි තෙසං න පවිච්ඡ්නාසෙ,
න බ්‍රාහ්මණෙ සීලවතෙන තෙය්‍යා
ඉාරංගතො න පවිචෙති තාදී"

යනාදි තන්හි තෘෂ්ණා දෘෂ්ටින්හි ආයේය. එහෙයින් නිද්දෙසයෙහි කියනලදී. "කපෙපාති උද්ධනතො චෙඛපා තණ්හා කපෙපා දිට්ඨිකපෙපා" සි "අනෙකෙපි සංවට්ටකපෙප අනෙකෙපි විවට්ටකපෙප" යනාදි තන්හි අසංඛ්‍යකල්පයෙහි ආයේය. "චත්තාරිමානි භික්ඛවෙ කපසස අසංඛෙය්‍යානි" යනාදිතන්හි මහාකල්පයෙහි ආයේය. මෙහිදු මහාකල්පයෙහි ම දතයුතුයි.

එහි මෝනොමෝ පදසිඩියයි: "කපියතිති කපෙපා" යනු නිම්වතහෙයින් සංකල්පනා කරනු ලැබේනුයි කල්පනම්. මෙතෙක් අවුරුදු සියගණනක්ය මෙතෙක් අවුරුදු දහස් ගණනක්ය කියා හෝ මෙතෙක් අවුරුදු ලක්ෂගණනක්ය කියා හෝ අවුරුදු විසින් සංඛ්‍යාකරන්නට නොපිළිවන් බැවින් හුදෙක් සාසපරාසි වශයෙන් උපමාදියෙන් කල්පනා කටයුතුවූ ප්‍රමාණය යන අර්ථයි මේ කියන ලද්දේමය. "කිවදිඝො නුඛො භනෙන කපෙපානි? දිඝො වො භික්ඛු කපෙපා න සුකරෝ එත්තකානි වස්සානිති වා එත්තකානි වස්සසතානිති වා එත්තකානි වස්සසහස්සානිති වා එත්තකානි වස්ස සතසහස්සානිති වා සංඛාතුං" යනාදියයි. සවාමිනි, භාග්‍යවතුන් වහන්ස! කල්පයතෙම කොපමණ දීඝිදූයි. මහණ, කල්පයතෙම දීඝිවෙයි. මෙතෙක් අවුරුදුය කියා හෝ මෙතෙක් අවුරුදු සියගණනකැයි කියා හෝ මෙතෙක් අවුරුදු ලක්ෂගණනකැයි කියා හෝ ගණන්කරන්ට පහසු නොවෙයි. "සවාමිනි බුදුරජාණන් වහන්ස! උපමාවක් කටහැකිදැ"යි. හැකිය. මහණයයි (බුදුහු) වදළහ. මහණ යම්සේ වනාහි දිගින් යොදුනක්ද පළලින් යොදුනක්ද උසින් යොදුනක්ද ඇති මහත් සම්පි රාශියක් (අඹරැසක්) වේද, එයින් අවුරුදු සියයක්හුගේ දහසක්හුගේ ඇවැමෙන් එක එක අඹ ඇටයක්ම උදුරන්නේද (උඩටතහන්නේ නම්) මහණ, ඉතා ශීඝ්‍රව ඒ මහාසම්පරාශිය

මේ උපක්‍රමයෙන් ගෙවීමට - අවසානයට යන්නේය. කල්පය නො ගෙවෙන්නේය. මහණ, කල්පය මෙසේ දිගු වන්නේය. ඒ මේ මහාකල්පය වනාහි සංවර්තාදි වශයෙන් සාරාසඞ්ඛ්‍යකල්පයන්ගි සංගෘහිත වේ. මේ කියන ලද්දේවෙයි. **"මහණෙනි, මහාකල්පය සම්බන්ධවූ අසංඛ්‍ය කල්ප සතරෙක. ඒ සතර දෙන කවරහුදයන් සංවර්තය, සංවර්තස්ථායිය, විවර්තය, විවර්ත ස්ථායියයි.** එහි තෙජස් සංවර්තනය, ආප්‍ය සංවර්තනය, වායුසංවර්තනයයි සංවර්තන තුනෙක. ආභස්සරය, සුභකිණ්ණය, වෙහප්ඵලයයි සංවර්තන සීමා තුනෙක. යම්කලෙක වනාහි කල්පය ගින්නෙන් විනාශවේද එකල වනාහි ආභස්සර බඹලොවින් යට (ගින්නෙන්) නස්නේය. යම්කලෙක කල්පය ජලයෙන් විනාශවේද, එකල සුභකිණ්ණතම් බඹලොවින්යට (දියෙන්) විලීනවේ. යම්කලෙක වාතයෙන් නස්නේද, වෙහප්ඵල බඹලොවින්යට (වාතයෙන්) විධ්වසනවේ. විසතර වශයෙන් වනාහි යම්ක් බුදුවරයන්ගේ ආඥා ක්ෂේත්‍රයයි කියනු ලැබේද, ඒ කෙළ සුවහස් සක්වළ විනාශ වන්නේය. ඒ සංවර්තන කල්ප තුන අතුරෙන් පිළිවෙළින් කල්ප විනාශක මහාමෙඝය පටන් වහ්නිජ්වාලාවගේ හෝ ජලයාගේ හෝ වාතයාගේ හෝ උපවෙජ්දය (සිදීයාම) දක්වා මේ එක් අංඛ්‍යයක් **සංවර්ත නම්. කල්පවිනාශක** ජ්වාලොපවෙජ්දය (ගිනිනිවී ගිය තැන්) පටන් කෙළ ලක්ෂයක් සක්වළ පුරා වස්තාවූ සම්පත්ති මහාමෙඝය යම්තාක් නැගීසිටිද ඒ දක්වා මේ දෙවන අසංඛ්‍යය සංවර්තස්ථායි නම්. සම්පත්ති මහා මෙඝයෙහි පටන් සදහිරු දෙදෙනාගේ පහළවීම දක්වා පැවැති මේ තුන්වන අසංඛ්‍යය **විවර්ත නම්.** සඳ හිරු දෙදෙනාගේ පහළවීම පටන් වැලිදු කල්ප විනාශක මහා මෙඝය දක්වා පැවැති මේ සතරවන අසංඛ්‍යය **විවර්තස්ථායි නම්.** ඔනුත් අතුරෙන් සූසැට අතුරු කපක් **විවර්තස්ථායි නම්.** විවර්තාදි කල්පයෝ ඒ විවර්තස්ථායි අසංඛ්‍ය කල්පය හා සමාන කාලපරිච්ඡේදයක් ඇත්තාහුයයි දතයුත්තාහ. **සමහර ආචාර්යවරයෝ** විසි අතුරුකපැයි කියති. මෙසේ මේ සතර අසංඛ්‍ය කල්පයෝ **එක්මහා කල්පයක් වෙයි.** එහෙයින් කියන ලදී **"සඩ්ඪායං මහාකප්පෙපා සංවට්ටාදි වසෙන චතු අසංඛෙය්‍ය කප්ප සංගණ්හාති"** යි කප්පෙප යනුද අත්‍යන්ත සංයෝග වශයෙන් ලීතීයා බහුවචනයි **"සතසහස්සෙඝ"** යනු කල්පශබ්ද සම්බන්ධයෙන් පුල්ලිඞ්ග නිර්දේශයි. මේහිදු අත්‍යන්ත සංයෝග වශයෙන් බහුවචනයැ. මේ පද දෙක තුල්‍යාධිකරණ මැ යි **"චතුරො ච**

අසංඛ්‍යෙය්‍ය" යන මෙහිදු මෙම ක්‍රමයමැයි. කවරක්හුගේ අසංඛ්‍යයක්දැයි අනිකක්හු නොකියන ලද බැවින් හා කල්ප ශබ්දය තමා කියනලද බැවින්ද ප්‍රකරණ හෙයින් (කප්පානං) කල්පයන්ගේ යන මේ අර්ථය හැගේමය. කියන ලද්ද හැර නොකියන ලද්දාවූ කිසිවක්හුගේ ගැනීම් නුසුදුසුද. එහෙයිනි, "ච" ශබ්දයතෙම සම්පිණ්ඩනාර්ථයි. **"මහාකල්පයන් සම්බන්ධවූ සාරාසංඛ්‍යෙය්‍යයන්ද මහා කල්පලක්ෂයන්ද මුළුල්ලෙහි"** යනු මෙහි අර්ථයි. **"අසංඛ්‍යෙය්‍ය"** යන මෙහි සංඛ්‍යා (ගණනක්) කරන්නට නොහැකිහුයි අසංඛ්‍ය නම්. ගණනපථයඉක්මගියේය යන අර්ථයි. "අසංඛ්‍යෙය්‍ය" යනු එක් ගණන් විශෙෂයක්යයි **සමන්තපාසාදිකායෝ** කියත්. ඔවුහු වතාහි එකේ පටන් මහාබලක්ෂය අවසන්කොට ඇති එකුන්සැටක් තැන් හැර දශමහාබලක්ෂයන් අසංඛ්‍ය නමැයිද, ෂෂ්ඨිමසථානානන්තරයකැයිද කියත්. ඒ නොයෙදේ. සංඛ්‍යාසථානානන්තර නම් ගණන් විශෙෂයකි. ඔහුගේ අසංඛ්‍යභාවඥයන්හු තැනි හෙයිනි. එක් සථානානන්තරයෙක්ද අසංඛ්‍යයෙක්ද යන මේ විරුඬ නොවේදයත්? අසංඛ්‍යයක්හුගේ අභාවයෙන් අසංඛෙයාවිය හිතම් ඔහුගේ චතුර්ඬ භාවය නොයෙදේ නොවේද? නොයෙදෙන්නේ නොවෙයි. සතරසථානයෙක්හි අසංඛ්‍යභාවඥා කැමතිවන ලද හෙයිනි. එහි මූල පටන් මෝ විභාවනායි.

යටගිය දවස එක් කල්පයෙක **තණ්හඞ්කරය, මෙඛඞ්කරය, සරණඞ්කරය, දීපඞ්කරයයි** සතර සම්‍යක් සම්බුඬකෙනෙක් පිළිවෙළින් ලොව පහළවි වදාළාහුය. උන්වහන්සේලා අතුරෙන් **දීපඞ්කර** නම් බුදුන්ගේ කාලයෙහි **අමරවති** නම් නුවරෙක් විය. එනුවර මවුපිය දෙපසින් මනාව උපන්නාවූ පිරිසිදු කුල ඇත්තාවූ සත්වෙනි කුල පරම්පරාව දක්වා ජාතිවාදයෙන් (කුල පිළිබඳ තෙපුලෙන්) නොදමන ලද්දාවූ නොගරහන ලද්දාවූ විශිෂ්ට රූ ඇත්තාවූ දශිනියවූ දුටුවන් පහදවන්නාවූ උතුම් වණ්ණපොක්ඛරතායෙන් යුක්තවූ **සුමෙඛ නම්** බ්‍රාහ්මණයෙක් වෙසෙයි. ඔහු අනික් කර්මයක් නොකොට බ්‍රාහ්මණ (බමුණන් හික්මියයුතු) ශිල්පයම ඉගෙන ගත්හ. ඔහු ළදරුකලම මවුපිය දෙදෙන කාලක්‍රියා කළහ. ඉක්බිති **අයකූමි ඇමතියාණෝ** අය පොත ගෙන හැර රන් රිදී මුතු මිණි ආදියෙන් පිරුණාවූ ගබඩාවන් හැරපියා "කුමාරයෙනි! තොපගේ මවුසතු ධනය මෙතෙක, පියසතු ධනය මෙතෙක, මුතුන් මිමුතුන් ආදීන් සතු ධනය

මෙතෙකැයි සත්වත කුල පරම්පරාව දක්වා වෙත් වෙත් වශ යෙන් ධනය කියාදී මේ ධනය අනුභව කරවයි" කිහ. ඉක්බිති සුමෙධපණ්ඩිතයාණෝ සිතන්නාහු. "මාගේ මවුපිය ආදීහු මේසා මහත් ධනය උපයාතබා මිය පරලොව යන්නාහු කහවණු වක් පමණකුදු නොගෙන ගියාහුය. මා විසින් වනාහි රැගෙනම යන්ට සුදුසුය"යි සිතා රජ්ජුරුවන්ට දන්වා නුවර බෙරහසුරුවා මහා ජනයාහට දන්දී හිමාලය වනප්‍රදේශයට ගොස් තවුස් පැවිද්දෙන් පැවිදිවී සතියක් ඇතුළත පංචාභිඥ අෂ්ටසමාපත්ති උපදවා සමවත් විහරණයෙන් වාසය කරන්නාහ.

එසමයෙහි දීපඞ්කරදශබලධාරීන්වහන්සේ පරමාභිසම්‍යක් සම්බෝධියට පැමිණ පවත්වනලද උතුම් දම්සක් ඇතිසේක් සාරලක්ෂණයක් ක්ෂීණාශ්‍රවයන් විසින් පිරිවරනලද්දාහු පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙමින් රඹගම් නුවරට පැමිණ නගරාසන්න යෙහිවූ සුදර්ශනාරාම විහාරයෙහි වැඩවසන සේක. රඹගම්නුවර වැස්සෝ "ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ අපගේ නුවරට වැඩ සුදර්ශන මහා විහාරයෙහි වැඩවෙසෙති" ඇසූ අසා ගඳ මල් ගත් අත් ඇතිව බුදුන්කරා එළඹ වැඳ සුවඳ දුම් පහත් ආදියෙන් පුදා එකත් පසෙක හිඳ බණ අසා සෙට දවස පිණිස ආරාධනාකොට හුනස්නෙන් නැගිගියාහ. ඔව්හු දෙවන දවස් මහදන් පිළියෙළ කොට නුවර අලංකාරකොට බුදුන්වඩනා මග එළිකරන්නාහුය. එසමයෙහි සුමෙධ තාපසයෝ අහසින් යන්නාහු තුටුපහටුව මං ඉදිකරන්නාවූ ඒ මිනිසුන් දැක එම්බා පින් වත්නි, තෙපි අතිශයින් තුටුපහටුව කවරක්හට මේ මං ඉදි කෙරෙන්දැයි විවාළෝය. ඔවුන් "බුදුන් වැඩමවනු පිණිස" යයි කිකල්හි සුමෙධ පණ්ඩිතයාණෝ පෙර බුදුවරයන් කෙරෙහි කරනලද අධිකාර ඇති බැවින් "බුඩ" යන වචනය අසා උපන් ප්‍රීති සෞමනස්‍ය ඇත්තාහු එකෙණෙහිම අහසින් බැස මීටත් එක් අවකාසයක් දුන මැනව. මමත් මං එළිකරන්නෙමියි කියා ඔවුන් විසින් දක්වනලද අවකාසය පිළිබඳව මෙසේ සිතුයේය. "මම මේ ප්‍රදේශය සෘඩියෙන් සත්රුවනින් විසිතුරුකොට සරසන්නට පොහොසත් වෙමි. අදවනාහි කයින් වනාවත් කරන්නට වටනේයයි කායප්‍රසාද කුශලය ගන්නෙමැ"යි සිතා තෘණ කසල ආදිය ඉවත්කොට පස්ගෙනවුත් සමකරමින් සුඩකරනන්නාහ. සුමේධ තාපසයන් ඒ පෙදෙස සදා නොනිමි කල්හිම දීපඞ්කර භාග්‍යවතුන් වහන්සේ මහත් ආනුභාව ඇත්තාවූ ෂඩභිඥ ප්‍රාප්තවූ සාරලක්ෂණයක් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් පිරිවරන ලද්දාහු ඒ මඟට පිළිපන් සේක.

සුමේධ පණ්ඩිතයාණෝ සම්‍යක් "සම්බුධියන් වහන්සේද බුධ ශ්‍රාවකයෝද මිසි නොපාගත්වා"යි තමන් වැහැරී සිටුරද සම් කඩිද දළකලප්ද අහුරා හුළුත් භාග්‍යවතුන් වහන්සේ වඩනා පෙදෙසට හිඳලා මුහින් වැදගෙව මෙසේ සිතුහ. කෙසේදයත්? "ඉදින් මම කැමැත්තෙම් නම් මේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයාණ කෙනෙක්වැ අදම කෙලෙස් නසන්නෙම්. හුදකලාව සංසාර මහොඝය එතර කිරීමෙන් මට කිනම් ප්‍රයෝජනද, මම්ත් මෙබඳුවූ සම්‍යක් සම්බුධිව දෙව්යන් සහිත ලොකයා සංසාර මහාණ්වයෙන් එතර කරවන්නෙම් නම් මැනවැ"යි මෙසේ ඒ සුමේධ පණ්ඩිතයාණෝ අෂ්ටාඩ්ග සමන්විතවූ මහාභිනිහාර වශයෙන් සිත පිහිටවූහ. එකල්හි දීපඞ්කර භාග්‍යවතුන් වහන්සේ එතැනට වැඩ වදරා සුමේධ පණ්ඩිතයන්ගේ ඉස්දෙර සිට ඔබගේ චිත්තාචාරය සම්ඍධිවත බව දැන වදරා මේතෙම මෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි ගෞතම නම් සම්‍යක් සම්බුධ වන් නේයයි **විවරණ** දී වැඩසේක.

නැවත ඔබට ඉක්බිතිව ලොව පහළවී වදළ අනිකුදු **කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේ** ආදිකොට **කාශ්‍යප දශ බලධාරීන් වහන්සේ** කෙළවරකොට පිළිවෙළින් ලොව පහළවූ සම්‍යක් සම්බුධියන්වහන්සේලා "ඒ මහාසත්ත්වයන් බුදුවන්නේ"යයි විවරණ දුන්හ. මෙසේ අපගේ බොධිසත්ත්වයන් පාරමිතාවන් පුරද්දිම "සුවිසි බුදුකෙනෙක් ලොව පහළවූහ. යම් කල්පයෙක දීපංකර දශබලධාරීන් වහන්සේ පහළවූසේක්ද; එකප තණ්හංකරාදි අනික් බුදුවරයෝ තුන් නමක්වූහ. උන්වහන්සේලාගේ සමීපයෙන් බොධිසත්ත්වයන්ගේ විවරණ ගැනීමක් නොවූයේය. එහෙයින් උන්වහන්සේලා මෙහි නොගන්නාලද්දහ. **පුරාතන අට්ඨාණයහි** වනාහි එකප පටන් සියලු බුදුවරයන් දක්වනු පිණිස මේ කිහ.

27. තණ්හඞ්කරෝ මෙධඞ්කරෝ අථොපි සරණඞ්කරෝ,
දීපඞ්කරෝ ච සම්බුද්ධා කොණ්ඩඤ්ඤෝ දිපදුත්තමෝ

28. මඞ්ගලෝ සුමනෝ චෙව රෙවතෝ සොභිතෝ මුනි,
අනොමදස්සී පදුමෝ කාරදෙ පදුමුත්තරෝ.

29. සුමේධෝ ච සුජාතෝ ච පියදස්සී මහායසෝ,
අත්ථදස්සී ධම්මදස්සී සිඛතෙථා ලොක නායකෝ.

30. තිසෙසා ඵුසෙසා ච සම්බුඩෝ විපසසී සිඛී වෙසසභූ,
කකුසඣෝ කොණාගමනෝ කසසපෝ චාපි නායකෝ.

31. එතෙ අහෙසුං සම්බුඩා ඒතරගා සමාහිතා,
සතරංසී'ව උපපනනා මහාතම විනොදනා;
ජලිචා අගගික්ඛන්ධාව නිබ්බුතා තෙ අසාවකා"යි.

එහි දීපඞ්කර බුදුන්ට හා කොණ්ඩඤ්ඤ බුදුන්ටද අතර මහා කල්පයන් සම්ඛ්‍යාවූ එක් අසඞ්ඛ්‍යයක් ලොකය තෙම් බුදු වරයන්ගෙන් ශූන්‍ය විය. එසේම කොණ්ඩඤ්ඤ බුදුන්ට හා මංගල බුදුන්ටත් අතර එක් අසඞ්ඛ්‍යයක් බුඩශූන්‍ය වූයේය. එසේම සොභිත බුදුන්ට හා අනොමදසසී බුදුන්ටත් අතරද එසේම නාරද බුදුන්ට හා පියුමතුරා බුදුන්ටත් අතරද එක් එක් අසඞ්ඛ්‍යයක් බැගින් බුඩ ශූන්‍ය කාලය විය.

මෙමෑ කියන ලද **බුඩවංසයෙහි:—**

32. "දීපඞ්කාරසස භගවතො කොණ්ඩඤ්ඤසස ච සත්ථුනො,
එතෙසං අනතරා කපපා ගණනාතො අසඞ්ඛ්‍යා.

33. කොණ්ඩඤ්ඤසස අපරෙන මඞ්ගලො නාම නායකො
තෙසම්පි අනතරා කපපා ගණනාතො අසඞ්ඛියා.

34. සොභිතසස අපරෙන අනොමදසසී මහායසො,
තෙසමපි අනතරා කපපා ගණනාතො අසඞ්ඛියා.

35. නාරදසස භගවතො පදුමුතතරසස සත්ථුනො,
තෙසමපි අනතරා කපපා ගණනාතො අසඞ්ඛියා"යි.

මෙසේ ගණනාතීතයෙන් අසඞ්ඛ්‍යචයක් ඇතද සතර සථානයෙක්හි මහා කල්පයනගේ ගණනාතීත ක්‍රමයෙන් **"චතුරසංඛෙයය"** යයි නියනලදී. සඞ්ඛ්‍යා විශෙෂයෙන් නො වේයයි දතයුතු. යම් හෙයකින් පියුමතුරා බුදුන්ට හා සුමෙධ බුදුන්ටද අතර කල්ප තිස් දහසක්ද, සුජාත බුදුන්ට හා පියදසසී බුදුන්ටද අතර නවදහසක් අධිකකොට ඇති සැට දහසක් හා දෙදසුවක් ඉතිරිකොට ඇති අටසියයක් හෙවත් කල්ප සැට නවදහස් අටසිය අසූදෙකක්ද, ධම්මදසසී බුදුන්ට හා සිඛාඊ බුදුන්ටද අතර විසිකපක්ද සිඛාඊ බුදුන්ට හා තිසස බුදුන්ටද අතර එක් කල්පයක්ද විපසසී බුදුන්ට හා සිඛී නම් බුදුන්ටද අතර සැටකපක්ද, වෙසසභූ බුදුන්ට හා කකුසඳ බුදුන්ටද අතර තිස්කපක්දැයි මෙසේ පියුමතුරා බුදුන් උපන් කල්පයෙහි පටන් යට ඒ ඒ බුදුවරයන් උපන් කල්පයන් හා මේ මහාභද්‍ර

කල්පයක් සමඟ මහාකල්ප ලක්ෂයක් වෙයි. ඒ සඳහා **"කඅපෙව සතසහසෙස"** යි කියනලදී. මේ අර්ථය විස්තර කරනු ලබන කල්හි වනාහි සියලු බුඩවංස පාළිය ගෙනහැර දක්වා වර්ණනා කටයුතු වේනුයි විස්තර භීරුක මහාජනයාගේ චිත්තානුරක්ෂණය කෙරෙමින් විස්තර නොකෙළෙමු. අර්ථින් විසින් බුඩවංසයෙන් ගතයුතු. මෙහි කියයුතු යම් කථාමාර්ගයක් වේද හෙද **අත්ථසාලිනි** නම් ධම්මසඞ්ගණී වර්ණනාවෙහි හා **ජාතකට්ඨකථාවෙහිද** කියන ලද ක්‍රමයෙන්ම දතයුතු.

"එත්ථන්තරෙ" යන මෙහි අන්තර ශබ්දය තෙම:

36. "නදිනිරෙ සුසානට්ඨානෙ සභාසු රථියාසු ච
ජනා සඞ්ගම්ම මන්තෙන්ති මක්ඛ තක්ඛ කිමන්තරං"

යනාදි තන්හි කාරණයෙහි ආයේය. **"අද්දසාඩෙ මං භණෙන අඤ්ඤතරා අම්හේ විජ්ඣනත්ථාය භාජනං ඩොවන්ති"** යනාදි තන්හි ක්ෂණයෙහි ආයේය. විදුලිය ගසන ක්ෂණයෙහි යනු එහි අර්ථයි. **"යසසන්තරතො නසන්ති ඛොපා"** යනාදිහන්හි චින්තයෙහි ආයේය. **"අන්තරාව ඛොධිං අන්තරාව ගයං"** යනාදි තන්හි විවරයෙහි ආයේය. **"න උපජ්ඣායස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා"** යනාදි තන්හි මධ්‍යයෙහි ආයේය. මෙහිද මධ්‍යයෙහිම දතයුතු. එහෙයින් මෙදූතුරෙහිය, මධ්‍යයෙහිය යන අර්ථයි, මෙමැ කියනලද්දේ වෙයි. යම් මහා කල්පයෙක්හි අපගේ භාග්‍යවතුන් වහන්සේ සුමේධ පණ්ඩිත වැදිවිකුරු බුදුන් පාමුල්හි:—

37. **"මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති හෙතු සත්ථාරදස්සනං පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරෝ ච ඡන්දතා"** යි

මෙසේ කියනලද අටහින් යුක්තවූ **මහාභිනීහාරය** කළ සේක්ද, **සමතිස් පැරැමි** රැස්කළසේක්ද, සමාදන්වූසේක්ද, සියලු **බුඩකාරක ධර්මයන්** සම්පාදනය කරන්නට පටන්ගත්සේක්ද, යම් මේ **මහානඳ කල්පයෙහි** සම්ප්‍රකාරයෙන් පුරන ලද පාරමිතා ඇතිව නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධකළ සේක්ද, මේ මහාකල්ප දෙක අතුරෙහිවූ යථොක්ත පරිවේඡද යෙන් යටකියනලද පිරිසිදුම් ඇති කාලය වෙසෙසා දක්වයි. ඒ කෙසේ දැනගනු ලැබේද?යත්:

"කපෙපව සතසහසසෙව චතුරොව අසංඛෙය්‍ය" යන මේ වනාහි මහාකල්පයන්ගේ පරිච්ඡේද වශයෙන් හා අපරිච්ඡේද වශයෙන්ද සංඛ්‍යා දර්ශනයයි. ඒ මේ සංඛ්‍යානොමේ අසංඛෙය්‍ය-යාගේ මූල අග ගැන්ම විනා සම්භව නොවෙයි. යම් තැනක සිට බොධිසම්භාරයන්ගේ පටන්ගැන්ම වේද යම්තැනක සිට ඒ බොධි සම්භාර ධර්මයෝ අවසාන කරන ලද්දාහුද ඒ දෙකම අවධිභාවයෙන් **"එකනනරෙ"** යි මෙහි අර්ථවශයෙන් දක්වන ලද්දේයයි හැඟේ. මේ අවධිතොමෝත් අනිර්විධි වශයෙන් දතයුතු, මියාහු, විශයෙන් නොගතයුතු. ආරම්භාවසාන (මූල අග) කල්පයන්ගේ එක දෙශයකින් ඇතුළත් හෙයිනි. ඔවුන් නිෂ්ප්‍රදෙශ වශයෙන් නොගන්නා හෙයින් අනිර්විධියත් මෙහි සම්භව නොවේදයත්? මේ කාරණය වනාහි මෙසේ නොවන්නේය. තදෙක දෙශයෙහින් තද්වාවහාරය කරන හෙයිනි. යම් තදෙකදෙශවූ කල්පයක් ඇද්ද හේ නිෂ්ප්‍රදෙශ වශයෙන් ගන්නා ලද්දේය.

"යං චරිතං සබබං තං බොධිපාචනං" යන මෙහි හැසිරීම චරියා නම්. සම්භාරත් පාරමිතා සංගෘහිතවූ දානශීලාදි ප්‍රති-පත්තියයි. **ඤාතත්ථචරියා ලොකත්ථ චරියා බුද්ධත්ථචරියා** යන් මොවුන් ඊට ඇතුළත් බැවිනි. එසේම යම් මේ **චරියාවෝ අට දෙනෙක්** ඇද්ද, ඔහු කවරහුද? ප්‍රණිධිසම්පන්නයන්ගේ සතර ඉරියව්වෙහි **ඉරියාපථචරියාය,** ඉන්ද්‍රියයන්හි වසනලද දෙර ඇත්ත වුන්ගේ ආධ්‍යාත්මික ආයතනයන්හි **ආයතන චරියාය,** අප්‍රමාද විහරණ ඇත්තවුන්ගේ සතර සීවටන්හි **සතිචරියාය,** සතර තැනෙක්හි අධිචිත්තයෙහි යෙදුනවුන්ගේ **සමාධි චරියාය,** චතුරාර්ය සත්‍යයන්හි බුද්ධිසම්පන්නයන්ගේ **ඤාණචරියාය,** සතර ආර්ය මාර්ගයන්හි මනාව පිහිටියවුන්ගේ **මග්ගචරියාවය,** සතර ශ්‍රාමණ්‍ය ඵලයෙහි පැමිණි ඵල ඇත්තවුන්ගේ **පකතිචරියාය,** නිර්විධ බුදුවරයන්ගේ සකල සත්වයන් කෙරෙහි **ලොකත්ථචරියාය** යන මොහුයි. එහි ප්‍රදෙශවශයෙන් ප්‍රත්‍යෙකබුද්ධ – බුද්ධශ්‍රාවක යන විවිධ බොධිසත්ත්වයන්ගේ ලොකත්ථචරියාව ද සම්‍යක් සම්බුද්ධ මහාබොධිසත්ත්වයන්ගේ ලොකත්ථචරියාවද නිෂ්ප්‍රදෙශ වශයෙන්ද වෙති. මේ කියන ලදී. (මහා) නිදෙසයෙහි:—

"චරියානි අට්ඨචරියා ඉරියාපථ චරියා ආයතන චරියා"ති විත්ථාරෙ අධිමුච්චනෙනා සද්ධාය චරති, පගුණභාවනෙනා විරියෙන චරති, උපට්ඨහනෙනා සතියා චරති, අවික්ඛිපනෙනා සමාධිනා චරති, පජානනෙනා පඤ්ඤාය චරති, විජානනෙනා විඤ්ඤාණෙන

චරති, එවම්පි පටිපන්නස්ස කුසලා ධම්මා ආයතන්තීති ආයතන චරියාය චරති, එවම්පි පටිපන්නා විසෙසමධිගච්ඡන්තීති විසෙස චරියාය චරන්තීති, යා ඉමා අපරාපි අට්ඨචරියා වුත්තා තාසං සබ්බාසං පාරමිතාසෙවව සමොරොධෝ වෙදිතබ්බෝ" ති.

සම්බුද්ධත්ව පාරමිතා සංග්‍රහ දැන ශීලාදි ප්‍රතිපත්තියයි. **හෙතුචරියාවම** මෙහි කැමතිවන ලද බැවින් **මාගිවයඤ්ඤා ප්‍රඥාති වයඤ්ඤවන්** සඳහාද විරුඬ නොවේයයි දතයුතු. **"සබ්බඤ්ඤුතං බොධි පාචනං"** යි එහෙයින් කියනලදි.

එහි "සබ්බ" ශබ්දය සබ්බඤ්ඤබ්බය, ආයතනසබ්බය, සක්කාය සබ්බය, පදෙස සබ්බයයි සතර අර්ථයෝහි දක්නා ලැබේ. ඒ එසේමැයි. **"සංඛ්ත ධම්මා සබ්බාකාරෙන බුද්ධඤ්ඤ භගවතෝ ඤාණමුඛෙ ආපාථමාගච්ඡන්තීති"** යනාදි තන්හි සබ්බ සබ්බඤ්ඤයෙහි වැටෙයි. **"සබ්බං වෝ භික්ඛවෙ දෙසිස්සාමි චක්ඛුඤ්ඤෙව රූපං ච—පෙ—මනොවෙව ධම්මා ච"** යන මෙහි ආයතන සබ්බයෙහි වැටෙයි. **"සබ්බං සබ්බතෝ සඤ්ඤානාති"** යනාදි තන්හි සක්කාය සබ්බයෙහි වැටෙයි. **සබ්බම්පි වෝ සාරිපුත්ත සුභාසිතං පරියායෙන"** යනාදි තන්හි ප්‍රදෙශ සබ්බයෙහි වැටෙයි. මෙහිදු ප්‍රදෙශ සබ්බයෙහිම දතයුතු. බොධිසම්භාරභූත චරිතය අභිප්‍රේත හෙයිනි.

"බොධි" යයි වෘක්ෂයද ආර්‍ය මාගීයද නිර්‍වාණයද සර්ව්ඥතා ඥානයද කියනු ලැබේ. කෙසේදයත්? **"බොධිරුක්ඛමූලෙ පඨමාභි සම්බුද්ධෝ"** සිද **"අඤ්ඤතරා ච බොධිං අඤ්ඤතරා ච ගයං"** යි ආහන්–හිද **(බුජ්ඣති එත්ථාති)** මෙහි අවබොධ කෙරේනුයි වෘක්ෂය නෙම බොධියයි කියනු ලැබේ. **"බොධි වුච්චති චතූසු මගෙසු ඤාණං"** යි ආ තන්හි චතුරාර්‍ය සත්‍යයන් මේ කරණකොටගෙන අවබොධ කෙරේනුයි ආර්‍යමාගීය නෙම බොධිනම්. **"පඤ්ඤා බොධිං අමතං අසංඛත"** යි ආහන්හි නිමිත්තවූ මෙහි අවබොධ කෙරේනුයි නිර්‍වාණය බොධි නම්. **"පපොති බොධිං වරභූරි මෙධසො"** යි ආතන්හි මේ කරණකොටගෙන සම්බුද්ධත්වයන් සර්ව්ඥතාඥානය බොධි නම්. මෙහිදු සර්ව්ඥතාඥානය කැමතිවනලදි. අතීත් මාගී සර්ව්ඥතා ඥානයෝ හෝ මෙහි බොධියයි දතයුත්තාහුය. මහාබොධිය අභිප්‍රේත බැවින් භගවත්හුගේ ආශ්‍රවක්ෂය ඥානයට ආසන්න කාරණවූ. සර්ව්ඥතාඥානය හා සර්ව්ඥතාඥානයට ආසන්න කාරණයවූ ආශ්‍ර–වක්ෂයඥානයද මහාබොධියයි කියනු ලැබේ. මේ මෙහි සංක්ෂෙපාර්‍ථයි.

යථොක්ත කාලපරිච්ඡේදයෙහි මාගේ දානශීලාදි ප්‍රතිපත්තියයි කියනලද යම් චරිතයක්වේද, ඒ සියල්ලම් (නිරවශේෂ කොට) මහාබොධිය මූකර වන්නේය, සිදුකරන්නේය, උපදවන්නේය. මෙයින් වනාහි බොධිසම්භාරයන්ගේ **නිරන්තර භාවනය** දක්වයි. නොහොත් "සබ්බා" යනු මේදැනුරෙහි (යථොක්ත කාල පරිච්ඡේද යෙහි) යම් චරිතයක් වේද ඒ සියල්ලම් (නිරවශේෂ කොට) බොධි සම්භාර වූයේ මිය. මෙයින් **සච්චසම්භාර භාවනාව** දක්වයි.

බොධිසම්භාරයෙහි මෙනාහි **භාවනාවෝ සතෙරකි. සච්චසම් භාර භාවනාය, නිරන්තර භාවනාය, චිරකාල භාවනාය, සක්කච්ච භාවනාව"** යයි කියයි. ඔවුන් අතුරෙන් **"කප්පෙව සතසහස්සෙ ච චතුරො ච අසංඛ්‍යෙය්‍ය"** යන මෙයින් චිරකාල භාවනා හොමෝ කියන ලද්දිය. මේහි යම් අන්‍යෝන්‍ය සංයොග-යෙක් වේද එයින් ප්‍රථම අළුවිකල්පයෙහි "සබ්බා" යනුදග්‍රහණයෙන්ද නිරන්තර භාවනාව දක්වයි. දෙවන අළුවිකල්පයෙහි "සබ්බා චරිතා" යන මෙයින් සච්චසම්භාර භාවනා හොමෝ කියන ලද්දිය. **බොධිපාචනං** යන මෙයින් සක්කාය භාවනා හොමෝ කියන ලද්දේ වෙයි. යම්සේ වනාහි ඒ චරිතය සම්‍යක් සම්බොධිය මූකරවාද එසේවූ බව දක්වන හෙයිනි. එහෙයින් වනාහි ඒ බොධිය මූකරන්නේයයි කියනුහු බවම් සුදුසුවෙයි. අන් ප්‍රතිදෑකින් නොවේයයි දතයුතු. හෙයේනම් මේහි බොධිචරියාවගේ නිරන්තර භාවය **දතයුතුද; ඉදින් චින්ත නිරන්තරත්වයෙන් නිරන්තර භාවය** වේද? ඒ නොයෙදෙයි. මහාබොධි සත්වයන්ගේ මහානිහාරයෙන් මුදු බොධිසම්භාර සම්හරණ චිත්තයෙන් අනික් සිතක් නොපවත්නේයයි කියන්නට නො හැකිවෙයි. එකද්‍රහි ක්‍රියාමය චිත්ත ප්‍රවෘත්තිය සඳහා කියන්නේද, එසේත් නොයෙදෙයි. ඒ බොධිසත්ත්වයන්ගේ සියලු ක්‍රියාමය චිත්තයෝ බොධි සම්භාර සම්හරණ වශයෙන් නො පවතින්. මේ කාරණයෙන්ම ප්‍රයොග **නිරන්තරතාව ද ප්‍රතික්ෂෙප කරන ලද්දී යයි දත යුත්තිය.** ජාතිනිරන්තරත්වයෙන් වනාහි නිරන්තර භාවනා හොමෝ දත යුත්තිය. යම් ජාතියෙක්හි මහාබෝසතාණන් විසින් මහා ප්‍රධානය කරන ලද්දේද, එවක්පටන් පූර්ණත්වය දක්වා ඒ ජාතිය නම් නොලැබෙන්නී වෙයි. යටත්පිරිසෙයින් දානපාරමී මාත්‍රය සඳහා යමක් සියල්ලෙන් සියල්ල බොධි සම්භාරසම්හරණය කරනලද්දේ නොවන්නීද, මෝ වනාහි නියත ප්‍රාප්තිනා ඇති බොධිසත්ත්වයන්ගේ ධර්මතාවෙක. හේතුමත්ද? යම්තාක් ඒ බෝධිසත්ත්වයෝ කම්මාදියෙහි

වසීභාවයට නොපැමිණෙන්ද ඒදක්වා ප්‍රදෙශ සතිනවූ සම්භාර-යන්ගේ ප්‍රයොජනයට පැමිණෙන් යම්කාලෙක්හි සම්ප්‍රකාරයෙන් කෙළදින්ගේ වසී භාවයට පැමිණියානු වෙද්ද, එකල්හි එහැන්පටන් නිෂ්ප්‍රදෙශ වශයෙන්ම බොධිසම්භාරයෙහි සම්භනය හා සහත ක්‍රියාවද සිඩවෙයි සතක්කොට කරනලද බව වනාහි හැමකල්හිම වෙයි මේසේ යම් යම් පරිද්දෙනින් බොධිසත්ත්වයන්ගේ ඒ ඒ තැන්හි යථානිප්‍රාය සම්ඛ්‍රිම සිඩවේ යයි මේසේ මේ ගාථාවෙන් බොධි සම්භාරයන්ගේ සම්සම්භාර භාවනාය, චිරකාල භාවනාය, නිරන්තර භාවනාය, සක්කච්චභාවනාදයි භාවනාවෝ සහර දෙනම ප්‍රකාශ කරන ලද්දේයයි දතයුත්තාහ.

එහි යම්හෙයකින් **බොධිසත්ත්ව චරිතය, බෝධිසම්භාරයෝය, බොධිචරියාය, අග්‍රයානය, පාරමිතාය** යන මොහු අර්ථවශයෙන් එකක්මි මේද ව්‍යඤ්ජනය පම්ණක්ම වෙනස් මේද, යම්හෙයකින් පසුව විභාග වශයෙන් කියනු ලබන්නාවූ දැන පාරමිතාදීන්ගේ චරිතය යන මේ අවිශෙෂ වචනය මේද, එහෙයින් සියලු බොධි සම්භාරයන්ගේ කෞශල්‍යය උපදවන පිණිස පාරමිතාවෝ මෙහි සංවණිනා කළ යුත්තානුය. ඒ පාරමිතාවන් පසුව ප්‍රකිණිණක කථාවෙහි සම්ප්‍රකාරයෙන් වණිනා කරන්නෙමු.

මේසේ භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ බොධි සත්ත්ව භූමියෙහිවූ චරිතය මූලපටන් අග දක්වා මහාබොධිය මූකිරීමය යි අවිශෙෂයෙන් දක්වා දැන් ඒපරමොහකෂියට පැමිණීමෙන් අනිශයින් බොධිය මූකරන බව දක්වන්නට මේ මහාභද්‍රකල්පයෙහි කනිපය පූර්වචරිත කෙනෙකුන් විභාග වශයෙන් විභාවනය (පහළ) කරන සේක්:

"අතීතඤපෙ චරිතං ඨපයිත්වා භවාභවෙ,
තුම්හිහි කපෙ චරිතං පවක්ඛිස්සං සුණොහි මෙ" යි.

මෙසේ අප භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේද දෙවි මිනිසුන් සහිත පිරිසද තමන් වහන්සේගේ පූර්වචරිත ශ්‍රවණයෙහි උත්සාහ ජනවා දැන් ඒ (යථොක්ත) භවාන්තර ප්‍රතිවිඤ්ඤත්තවූ පූර්වචරිත, හසනාමලකායක්මෙන් ප්‍රත්‍යක්ෂ කරවමින්:

"යදා අහං බ්‍රහාරඤ්ඤෙ සුඤ්ඤෙ විපිනකානනෙ
අජෙඨාගහෙඨා විහරාමි අකිතති නාම තාපසෙ" යි.

යනාදි වදුළසේක. එහි "අකිත්ති නාම තාපසෝ" යන්නෙන් ශාස්තෘන් වහන්සේ යටගිය දවස අකිත්ති නම් තාපස කෙනෙකුන්ව උපන් බව ශාරිපුත්‍ර සථවිරයන් වහන්සේට වදාරති. ඒ කෙසේද? යත්:

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි පළමුවන

1. අකිර්ති චරිතය.

යටගිය දවසැ මේ **මහාභද්‍ර කල්පයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන්** රජය කරවන සමයෙහි **අප මහබෝසතාණෝ** අසූකෙළක් ධනය ඇති බ්‍රාහ්මණ මහසල් කුලයෙක්හි උපන්හ. උන්වහන්සේට **අකිර්ති**යයි නම්කළාහුය. උන් වහන්සේ පියනහා ඇවිදින අවස්ථාවෙහි නැගණි කෙනෙක් උපන්හ. උන්ට **යසවතී** යයි නමක් කළාහුය. මහසතාණන් වහන්සේ සොළොස් හැවිරිදි වයසට පැමිණිකල්හි තක්ෂශිලා නුවරට ගොස් සියලු ශිල්පයන් ඉගෙන නැවත සිය නුවරට ආවාහුය. ඉක්බිති උන්වහන්සේගේ මවුපියෝ කාලක්‍රියා කළාහුය. බෝසතාණෝ මවුපියන්ට කළමනා ප්‍රෙතකෘත්‍යය කරවා කිපදිනක් ඉක්මවා රන්රුවන් බැලීමෙහි නියුක්තයන් විසින් මෙතෙක් ධනය නුබවහන්සේගේ මවු සන්තකය, මෙතෙක් ධනය පියසන්තකය, මෙතෙක් ධනය මුත්තණුවන් සන්තකයයි මෙසේ පෙන්වනලද ධනය අසාබලා කළකිරුණු සිත් ඇත්තාහු "මෙහි වූකලී ධනය පමණක් පෙනෙන්නේය. ධනය රැස්කළ සියල්ලෝම ධනය හැරපියා මියගියාහුය. මම වූකලී මේ ධනය කැටුව ඇරගෙන යම්"යි සිතා රජහට දන්වා "ධනයෙන් ප්‍රයෝජනය ඇත්නෝ අකිත්ති පණ්ඩිතයාණන්ගේ ගෙදෙරට පැමිණෙන්වායය"යි නුවර බෙර හසුරුවා පැමිණියවුන්ට සද්දවසක් මුළුල්ලෙහි මහ දන්දීන් ධනය නොගෙවෙන හෙයින් "මට මේ ධන ක්‍රීඩාවෙන් කවර ප්‍රයෝජනද? ධනයෙන් ප්‍රයෝජන ඇත්නෝ ධනය ඇරගනිත්වායය"යි රන්රුවන්පිරූ ගබඩාවල දොරහරවා "මා විසින් (මේ සියලු ධනය) දෙනලද්දේමය. ප්‍රයෝජන ඇත්නෝ ගෙන යෙත්ව"යි ගිහිගේ හැර ඥාතිවර්ගයා අඬ අඬා සිටිද්දීම බරණැස් නුවරින් නික්ම (ගංගානම්) ගඟින් එතරව දෙතුන් යොදුනක් පමණ ගොස් පැවිදිව සිත්කලු භූමිභාගයෙක්හි පන්සලක් කොට ගෙන වාසය කෙරෙති. අකිත්ති පණ්ඩිතයෝ යම් මාර්ගයකින් නික්මුණුසේක්ද, ඒ **අකිර්තිමාර්ග**ය

විය. යම් නොටකින් ගංගාව එතරකළසේක්ද, ඒ **අකිර්තිතිඨ** නම් විය. උන්වහන්සේ පැවිදිවූ කැවි අසා බොහෝ ගම් නියම්ගම් රාජධානිවල මනුෂ්‍යයෝ උන්වහන්සේගේ ගුණයෙන් අදිනු ලබන හෘදය ඇත්තාහු උන්වහන්සේ අනුව පැවිදි වූවාහුය.

මහපිරිවර හා මහත් ලාභසත්කාර උපන්නේය. බුඩොන් පාද කාලයක් මේන් විය. ඉක්බිති මහබෝසතාණෝ යහන්නාහු මේ ලාභසත්කාරය සහ පිරිවරත් ඉහා මහත. මේහි කාය විවේක මාත්‍රයකුදු නැත. දැන් මාවිසින් හුදකලාව වසන්ට වටනේය"යි සිතා පරමාලෙපවිඡ්ඡාවයෙන්ද, විවේකයට නැමුණු සිත් ඇති බැවින්ද, කිසිවකුහට නොදන්වා හුදෙකලාව නික්මී පිළිවෙළින් **දම්ලරටට** පැමිණ **කාර**නම් පටුහුගම සමීපයෙහි උයනෙක්හි වාසය කරන්නෝ ධ්‍යානානිඥ ඉපදවූහ. එහිද උන්වහන්සේට මහත් ලාභ සත්කාර උපන්නේය. ඒ පිළිකුල් කෙරෙමින් හැර දමා ආකාශයෙන් ගොස් **කාරදිවසිනට** බටහ. එසමයෙහි කාර දිවසින **අහිදිප** නම් විය. උන්වහන්සේ එහි මහත් කරරුකෙක් ඇසුරුකොටගෙන පන්සලක් මවා වාසය කළහ. අලෙපවිඡ බැවින් කිසිහැනකට නොගොස් කරගස පල හටගත් කල්හි ඒ ඵල අනුභව කොටද පලනැතිකල්හි කොළ දියවත්කොට පිස අනුභව කරමින්ද ධ්‍යානසමාපත්තියෙන් දවස් යවති.

මේසේ වාසය කරන්නාවූ බොධිසත්ත්වයන්වහන්සේගේ සිල් තෙදින් සක්දෙව් රජහුගේ පඬුපුල් සලස්න හුණුවිය. සක්දෙව් රජාණෝද "මා මෙතැනින් මුදවහ කැමැත්තෝ කවර කෙනෙක් දෝනෝ"යි ලොව බලන්නෝ අකිර්ති පණ්ඩිතයන් දැක මේ තාපසයාණෝ කුමක්නිසා දුෂ්කර තපසක් කෙරෙද්ද, "ශක්‍රත්ව භාවය හෝ පතද්ද, නොහොත් අනිකක් පතද්දෝහෝ"යි විමසන්නෙමියි සිතා මේ මහතාණෝ විශුඛකායවත් මනොසමාචාර ඇතිසේක. ජීවිතයෙහි හරනලද ඇල්ලම් ඇතිසේක. පැන් පමණක් වත් කොට පිසූ කරකොළ අනුභව කරති. "ඉදින් ශක්‍රත්ව භාවය පතන් නම් කරකොළ මටදෙති. ඉදින් එසේ නොවේ නම් නොදෙති"යි සිතා බ්‍රාහමණ වෙශයකින් උන්වහන්සේ සමීපයට ගියාහ. බොධිසත්ත්වයන් වහන්සේද කරකොළ පිස නිවීගිය කල අනුභව කරන්නෙමි"යි පන්සල් දොරකඩ හුන්හ. ඉක්බිති ශක්‍රයෝ බොධිසත්ත්වයන් ඉදිරියෙහි බ්‍රාහමණවෙශයෙන් සිහා සිටියාහ. මහසතාණෝ ශක්‍රයන් දැක සොම්නස්ව මටවූයේ "මහත් ලාභයෙක. මාවිසින් ලබනලද්දේ මනා ලැබීමක,

බොහෝකාලයකින් මා වසින් යාච්ඤයෙක් දක්නා ලද්දේය. අද මාගේ මනදොළ මුදුන් පමුණුවා දන් දෙන්නෙමි"යි පිසු බදුනම ගෙන ගොස් **දානපාරමිතාව** ආවර්ජනා කොට (මාගේ මේදානය සම්‌බුදුඤාණයට කාරණවේවයි සිතා) තමන්ට හබා නොගෙනම යියල්ලම ඔහුගේ භික්‍ෂා භාජනයෙහි බහාදුන්හ. ශක්‍රයෝ ඒ කොළඹ දන් ගෙන මඳක් නැන ගොස් අතුරුදන් වූහ. බෝසතාණෝ ඕහට දන්දී දෙවනු සරකොළඹ නොවිසා එම ප්‍රීති සැපයෙන්ම දවස යැවූහ. දෙවන දවසුත් එලෙසම කර කොළඹ වසනබා රජේදින දක්‍ෂිණාභාගීයකු ලැබීය; අද කෙසේදැයි පන්සල් දොරකඩ බලාහුන්හ. ශක්‍රයෝ දෙවන දවසේද පෙර සේම ආහ. බොධිසත්ත්වයන් වහන්සේ පළමු දිනයෙහි මෙන් දන්දී ප්‍රීති සැපයෙන්ම දවස් යැවූහ. තුන්වන දවසත් එලෙසම දන්දී "අහෝ ඒකාන්තයෙන් මටවූයේ මහත් ලාභයෙක, ඉදින් මම දක්‍ෂිණාභාගීයකු ලබන්නෙම් නම් බොහෝ පින් උපයන්නෙමි. මෙලෙසම මසක් දෙමසක් නමුදු දන්දෙන්නෙමි"යි සිතුවේය. තුන්දිනයෙහිම දෙනලද්දාවූ ඒ දානානිසංසය හෙතු කොටගෙන ලාභ සත්කාර කීර්තියක් හෝ චක්‍රවර්ති සම්පත්තියක් හෝ ශක්‍ර සම්පත්තියක් හෝ බ්‍රහ්ම සම්පත්තියක් හෝ ශ්‍රාවක සම්පත්තියක් හෝ ප්‍රත්‍යේකබෝධිය හෝ ප්‍රාර්ථනා නොකෙරෙමි. වැළි මාගේ මේ දානය සම්‌බුදුඤාණය ලැබීමට හෙතුවේවායි අධිෂ්ඨානයවූ පරිදි යහ පිහිටවූහ. එහෙයින් කියන ලදී:—

තදහං තපතෙජෙන සන්තත්තෙනා නිදිවාහිහු,
ඛාරජනනා බ්‍රාහ්මණවණ්ණං භික්ඛාය මං උපාගමි. (4)

පවනා ආහතං පණ්ණං අතෙලං ච අලොණිකං,
මම මාරෙ ඨිතං දිස්වා සක්කටාහෙන ආකිරිං. (5)

තස්ස දත්වානහං පණ්ණං නික්කුජ්ජිත්වාන භාජනං,
පුබ්බාසනං ජහිත්වාන පාවිසිං පණ්ණසාලකං. (6)

දුතියම්පි දිවසං තතියං උපගඤ්ඡිං මමන්තිකං,
අඤ්ඤාපිතෝ අනොලීනෝ එවමෙවමදාසහං. (7)

න මෙ තපපච්චයා අත්ථි සරීරස්මිං විවණ්ණියං,
පීතිසුඛෙන රතියා විතිනාමෙමි තං දිවං. (8)

යදි මාසම්පි දොමාසං දක්ඛිණෙය්‍යං වරං ලහෙ
අඤ්ඤාපිතෝ අනොලීනෝ දදෙය්‍යං දානමුත්තමං. (9)

න තස්ස දුනං දදමානෝ යඤ්ඤං ලාභං ච පත්ථයි
සබ්බඤ්ඤුතං පත්ථයානෝ තානි ඨානානි ආචරි. (10) සි.

මෙසේ අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඒ අකිත්ති පණ්ඩිතවූ ආත්මයෙහි තමන් වහන්සේ විසින් කරනලද ඉතා දුෂ්කරවූ කුශල චරිත මාත්‍රයන්ම මෙහිදී ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ප්‍රකාශ කොට වදාළසේක. **ජාතක දේශනාවෙහි** වනාහි සහරවන දවස්හි සක්දෙව්රජ අවුත් බොධිසත්ත්වයන්ගේ අදහස දැනගැනීම්ද වරයෙන් උපනිමන්ත්‍රණයද බොධිසත්ත්වයන් වරපිළිගැනීම් ශිෂ්‍යයෙන් ධර්මදේශනා කළබවද දක්ෂිණාවී ශක්‍රයාගේ දෙවනු නෙවනුත් එළඹීම් නොකමැති බවද ප්‍රකාශ කරනලදු. එහෙයින් කියන ලදි.

38. අකිත්තිං දිස්වාන සම්පන්නං සක්කෝ භූතපති බ්‍රූවි,
කිම්ඉච්ඡයං මහාබ්‍රහ්මෙ එකෝ සම්මසි සම්මති.

සම්බවූ මනදෙළ ඇති අකිත්ති තාපසයන් දැක සක්දෙව් රජාණෝ මෙසේ කිහ. මහොත්තමයාණනි, මෙබඳු වනයෙහි කවර සම්පත්තියක් ප්‍රාර්ථනාකොට ගැටෙන්නෙහිද වැයම් කරන්නෙහිදැයි. එබස් අසා මහබෝසතාණෝ උන් ශක්‍රයා නියාව දැන මම ශක්‍ර සම්පත් ආදිය පතන්නෙමි නොවෙමි. සම්බුදුතාඥානය ප්‍රාර්ථනා කෙරෙමින් තපස් කෙරෙමියි ප්‍රකාශ කරන්නාහු:—

39. දුක්ඛා ජාතිජරා නාම සරීරස්ස ච භෙදනං,
සමෙමාහමරණං දුක්ඛං තස්මා සම්මාමි වාසව සි.

ශක්‍රදෙවේන්ද්‍රයෙනි, යම් හෙයකින් නැවත ඉපදීමද නැවත නැවත පඤ්චස්කන්ධයාගේ භෙදයද සමෙමාහ මරණයද යන මේ තුන සත්ත්වයන්ට එකාන්තයෙන් දුක්වන්නේවේද, එහෙයින් ඒ තුනින් විනිර්මුක්තවූ නිර්වාණය ප්‍රාර්ථනාකොට ඊර්ෂ්‍යාවෙන්නෙමියි කිහ. එබස් අසා ශක්‍රයෝ සතුටුසින් ඇතිව මොහුතුමූ සියලු භවයෙහි කලකිරුණාහුය. නිවන්පතා. මේ වනයෙහි හිඳිති. එහෙයින් උන්ට වරයක්දෙමි"යි වරයෙන් ආරාධනා කරන්නාහු මේ ගාථාව කියත්:—

40. එතස්මිං භෙසු ලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං කස්සප තෙ දම්මි යංකිඤ්චි මනසිච්ඡසි සි.

කාශ්‍යප ගොත්‍රයෙහි උපන්නාවූ අකිත්ති පණ්ඩිතයාණනි, තොපවිසින් මනාකොට කියනලද ප්‍රතිරූපවූ මේ සුභාෂිතය හෙතුකොටගෙන තොපට වරයක් දෙමි. යම් වරයක් ගනුකැමති නම් ඒදෙමිසි. එබස් අසා බෝසතාණෝ වර ගන්නාහු:—

41. වරං වෙ මේ අදෙ සක්‍ක සබ්බභූතානමිස්සර,
යෙන පුත්තෙන‍ව දූරෙ ව ධනධඤ්ඤම්පි යාති ව;
ලබ්‍භා නරා න තප්පන්ති සො ලොභො න මයි වසෙ සි

සියලු සත්ත්වයන්ට අධිපතිවූ ශක්‍ර දෙවෙන්ද්‍රයාණනි, ඉදින් තෙපි මට වරදෙනු කැමැත්තාහු නම් "යම් ලොභයක් කරණ කොටගෙන පුත්‍ර දූර ධන ධාන්‍ය යන යම්බඳු දෙයක් ලැබූ සත්ත්වයෝ එයින් තෘප්තියට නොපැමිණෙත්ද, ඒ ලොභය මාගේ සන්තානයෙහි නොඋපදීවයි යන වරය දුන මැනව"යි කිහ. එවිට ශක්‍ර දෙවෙන්ද්‍රයාණෝ මතුත් වරදෙනු කැමැති වූහ. බොධි සත්ත්වයෝද වර ගනු කැමැත්තෝ:—

43. වරං වෙ මෙ අදෙ සක්‍ක සබ්බභූතානමිස්සර,
ඛෙත්තං වත්‍ථුං හිරඤ්ඤං ව ගවාස්සං දාසපොරිසං;
යෙන ජාතෙ න ජීයන්ති සො දොසො න මයි වසෙ.

44. වරං වෙ මෙ අදෙ සක්‍ක සබ්බභූතානමිස්සර,
බාලං න පස්සෙ න සුණෙ නව බාලෙන සංවසෙ;
බාලෙන අල්ලාපසල්ලාපං න කරෙ නව රොචයෙ සි.

යන ගාථා කියත්. එහි අදහස නම්:–සියලු සත්ත්වයන්ට ප්‍රධානවූ ශක්‍රයාණනි, ඉදින් තෙපි මට වරයක් දෙනු කැමැත්තහු නම් "යම් සන්තානයෙක්හි හටගත් යම් ක්‍රොධයක් කරණකොටගෙන කිපියාවූ සත්ත්වයෝ ප්‍රාණවධාදියකොට රාජදණ්ඩනයට පැමිණ හෝ විෂ අනුභව කිරීම් වශයෙන් හෝ කරවැලලීම් වශයෙන් තමන් මැරීමෙන් හෝ රත්‍රුවන්ද අශ්වයන් හා ගවයන්ද දැසි දැසයන්ද යන ආදී සම්පත්තීන්ගෙන් හෝ විනාශයට යෙදුද? ඒ නපුරු වෙෂය මාතුළ නොඉපදිව" යි වර දුන මැනව. ශක්‍ර දෙවෙන්ද්‍ර යාණනි, අඥන සත්ත්වයා නොදකිම්වයිද, අසවල්තැන වෙසේ යි නො අසම්වයිද, නුවණ නැත්තන් සමග වාසය නොකෙරෙම්වයිද, පසුපෙර කථාවකුත් නොකෙරෙම්වයිද, ඔහුගේ බස් කිසිකලෙකත් ප්‍රිය නොවෙම්ද, එබදු වරයක් දුන මැනව. යනුයි එවිට" සක්-දෙවි රජහු ඒ කාරණය විමසන්නාහු:—

46. කිනනු තෙ අකරං බාලො වද කස්සප කාරණං,
කෙන කස්සප බාලස්ස දස්සනං නාභිකඞ්ඛසි.

කාශ්‍යප ගොත්‍ර ඇති අකිත්ති පණ්ඩිතයාණනි, අඥනතෙම නුඹවහන්සේගේ මැණියන් පියාණන් මරාපිද, අන් කවර අවැඩක් කරපිද, කුමක්නිසා අඥන සත්ත්වයා දක්නා නොකමැත්තහුද,

ඊට කරුණු කියනු මැනවැයි කිහ. එබස් අසා බොධිසත්ත්වයෝ උත්තර දෙන තැනැත්තෝ:—

48. අනයං නයති දුම්මේධෝ අධුරායං නියුඤ්ජති.
දුන්නයෝ සෙය්‍යසෝ හොති සම්මාවුත්තෝ ච කුබ්බති;
විනයං සෝ නජානාති සාධු තස්ස අදස්සනං.

යනුවෙන් නුවණැත්තාවූ සත්ත්වතෙමේ අකාරණය කාරණයයි ගන්නේය. "ප්‍රාණවධකොට ජීවත්වෙමි" යනදී අවැඩම සැදැසුනාසියයි සිතන්නේය. ශ්‍රද්ධාධුර ශීලධුර ප්‍රඥාධුරයන්හි නොයොදා නො කටයුත්තෙහි ම යොදන්නේය. ප්‍රාණඝාතාදිවූ දුශ්ශීල කර්මය සම්මාදන්ව පැවැත්ම යහපත්යයි ගන්නේය. හෙතු වශයෙන් කියන ලද්දේ නමුදු කිපෙන්නේය. මෙසේ යම් ඊම් ආදී ඉරියවූ පැවැත්මය සුඛය යන ආචාර විනය නොදන්නේය. අවවාද නොපිළිගන්නේය. එහෙයින් එබදු බාලයාගේ නොදැක්ම යහපතැයි වදාළේ:—

49. වරං වේ මේ අදෙ සක්‍ය සබ්බභූතානමිස්සර,
ධිරං පසෙස්ස සුණෙ ධිරං ධිරෙන සහ සංවසෙ;
ධිරෙන අල්ලාපසල්ලාපං තං කරෙ තං ච රොචයෙ.

මෙලෝ පරලෝ දන්නා නුවණැති සත්පුරුෂයා හැමවේලෙහි දකිවසිද, අසවල්තැන උපන්නේයයි අසාවසිද, ඒ නුවණැති සත් පුරුෂයා හා සමග එකතැන වෙසේවසිද, ඔහුබස මට ප්‍රියවේවයිද යන මේ වර දුන මැනව. එම කාරණයද විමසන්නාවූ ශක්‍රයාණෝ:—

50. කිත්තු තෙ අකරං ධිරෝ වද කස්සප කාරණං,
කෙන කස්සප ධිරස්ස දස්සනං අභිකංඛසි.

කාශ්‍යප ගොත්‍ර ඇති පණ්ඩිතයාණනි; ඒ නුවණැති සත්පුරුෂ තෙම නොපට ගමක් බිමක් දීපිද, නොහොත් කොපමණ ඓශ්වර්‍ය යකට පමුණුවාපිද, කවර කාරණයකින් හෙවි නුවණැති සත් පුරුෂයා දැකීමට කැමැත්තාහුදැයි ඒ වදාළ මැනවයි ඇසූහ. එසඳ බොධිසත්ත්වයෝ:—

51. නයං නයති මේධාවී අධුරායං න යුඤ්ජති,
සුනයෝ සෙය්‍යසෝ හොති සම්මාවුත්තෝ න කුප්පති;
විනයං සෝ පජානාති සාධු තෙන සමාගමෝ.

යනුවෙන් පණ්ඩිතතෙම නොකටයුත්තෙහි නොයොදා කට-යුත්තෙහි යොදන්නේය. යහපත ප්‍රධාන කොට ගනී. යහපත්

දෙයක් කියනලද්දේ නොකිපෙයි, දුනගිලාදි සුචරිතයම් යහපතැයි ගන්නේය. කුශල කම් සමාදන්ව පැවැත්ම යහපතැයි ගන්නේය. කාරණයෙන් කීකල රිට නොකිපෙන්නේය. "මේසේ ඉදුම් සිටුම් කටයුතුය" යන ආචාර විනය දන්නේය. අවවාදය පිළිගන්නේය. එහෙයින් ඔහුගේ දැක්ම යහපත්යයි වදාළෝ:—

52. වරං වෙ මේ අදෙ සක්ක සබ්බදෙවානමිස්සර,
තතො රත්‍යා විවසානෙ දුරිය්‍යුග්ගමනං පති;
දිබ්බා භක්ඛා පාතුභවෙය්‍යුං සිලවනෙතානුකම්පකා.

53. දදතො මෙ න ඛීයෙථ දජ්ජානාහුතපෙය්‍යහං,
දදං චිත්තං පසාදෙය්‍යං එතං සක්ක වරං වරෙ.

ශක්‍රදෙවෙන්ද්‍රයාණනි, මේ රාත්‍රිය ඉක්ම හෙට දවස්හි හිරු උදාවන වේලෙහිම දිව්‍යභොජන පහළවන්නේනම් ඒ දිව්‍යභොජන පිළිගන්ට සුදුසුවූ ප්‍රතිග්‍රාහකයෝ පැමිණෙන්නාහුනම්, දන් දෙන්නාවූ මාගේ වස්තුව ක්ෂයනොවන්නේනම් දන්දී පසුතැවිලි නොවන්නෙම් දෙමින් සිත පහද වන්නේනම්, එබඳු වරගනිමි.

54. වරං වෙ මෙ අදෙ සක්ක සබ්බභූතානමිස්සර,
න මං පුන උපෙය්‍යාසි එතං සක්ක වරං වරෙ.

සක්දෙවිරජාණනි, නොප මේ සැටියෙන් දෙවුන් දවසක මාළඟට නොඑනු මැනව, මේ වරය ගනිමියි කිහ. එබස් ඇසූ ශක්‍රයෝ එම කාරණය විමසන්නාහු:—

55. බහූහි වත වරියාහි නරා ව අථ නාරියො,
දස්සනං අභිකංඛන්ති කින්නු මෙ දස්සනෙ භයං

අකිත්ති පණ්ඩිතයාණනි; බොහෝ සත්‍රී පුරුෂයෝ දුනාදි නොයෙක් පින්කම්කොට මා දක්නා කැමැති වෙත්. නොහොත් දෙව්ලොව උපදිති. එබඳු මා දැකීමෙහි නොපට භය කවරදැයි විචාළහ. එබසට බෝධිසත්ත්වයෝ කියන්නාහු:—

56. තං නාදිසං දෙවවණ්ණිං සබ්බකාමසමිද්ධිනං,
දිස්වානහං පමජ්ජෙය්‍යං එතං තෙ දස්සනෙ භයං

මෙබඳුවූ දිව්‍යාභරණයන්ගෙන් සැරසුණාවූ සියලු කාමයෙන් සමාඩවූ නොපගේ ශ්‍රී සමෘඩිය දැක නොපගේ ශක්‍ර සම්පත් පැතුවහොත් නිවන් පතා කරන්නාවූ තාපසයෙහි, ප්‍රමාදයට පැමිණියෙම් නම් වෙමි. නොපගේ දැක්මෙහි භය නම් ඒයයි කිහ.

එබස් අසා ශක්‍රදෙවෙන්ද්‍රයාණෝ "යහපත සවාමිනි, මම මෙතැන් පටන් නුඹ වහන්සේ සමීපයට නොඑන්නෙමි"යි කියා බෝසතාණන් වහන්සේ වැඳ දෙව්ලොව බලා ගියාහ. මහසතාණෝ දිවිපමණින් එහිම වැස ආයුකෙළවර බඹලොව උපන්හ.

අනුරුඬ සථවිරයෝ එසමයෙහි සක්දෙව් රජාණෝය. ලොකනාථයන් වහන්සේ අකිර්ති පණ්ඩිතයෝය.

මේම අකිර්ති පණ්ඩිත චරිතයෙන් සාමාන්‍යයෙන් **දානපාරමිතාව** වදුරන ලදුවන් විශෙෂයෙන් බෝසතාණන් වහන්සේගේ මහානිනිෂ්ක්‍රමණය වැනි නිෂ්ක්‍රමණය ඇතිබැවින් **නෙෂ්ක්‍රම්‍යපාරමිද**, සුවිශුඬ ශිලාචාර ඇති බැවින් **ශීලපාරමිද**, කාමවිතර්කාදිය මනාකොට විෂකම්භණය කළ බැවින් **වීයඋපාරමිද**, ක්ෂාන්ති සංවරය පරමොත්කර්ෂයට යාමෙන් **ක්ෂාන්තිපාරමිද**, ප්‍රතිඥානුරූප ප්‍රතිපත්තියෙන් **සත්‍යපාරමිද**, සියලු තන්හි අවලසමාදානයාගේ අධිෂ්ඨානයෙන් **අධිෂ්ඨානපාරමිද**, සකල සත්ත්වයා කෙරෙහි පහළ හිතාඛ්‍යාශය ඇති හෙයින් **මෛත්‍රීපාරමිද**, සත්ත්වසංස්කාරයන් විසින් කළ විප්‍රකාරයන්හි මධ්‍යස්ථභාව ප්‍රාප්තියෙන් **උපෙක්ෂාපාරමිද**, ඔවුන්ට උපකාර අනුපකාර ධර්මයන්දැන අනුපකාර ධර්මයන් හැර උපකාර ධර්මයන් කෙරෙහි පැවති පුරෙචරවූද සහජාතවූද උපාය කෞශල්‍යවූ අතිශය සල්ලෙඛ ප්‍රවෘත්ති සාධකවූද **ප්‍රඥාපාරමිදැයි** මෙතෙක් පාරමීහුද ලැබෙත්. දානාඛ්‍යාශයාගේ වනාහි අධිකවූ උදාරභාවය හෙතුකොටගෙන දාන පාරමී මුඛයෙන් දෙශනා නොමෝ පවත්වන ලද්දීය.

එහෙයින් සම්‍යක්සාධනයට කාරණවූ **මහාකරුණාවය, පුණ්‍යඥානසම්භාරවයය**, කායසුචරිතාදි **ත්‍රිවිධ බොධිසත්ත්වචරිතයෝය**, සත්‍යාධිෂ්ඨානාදි **චතුර්විධඅධිෂ්ඨානවයෝය**, උත්සාහාදිවූ **චතුර්විධබුධභූමිහුය**, ශ්‍රඩ්ධාදිවූ **පඤ්චවිධ මහාබොධි පරිපාචනීය ධර්මයෝය**, අලොභාඛ්‍යාශය ආදිවූ **සවඥඥරූම් බොධිසත්වයන්ගේ අඛ්‍යාශයෝය**, "නිණ්ණාහං තාරෙස්සාමි" යනාදි **සප්තප්‍රතිඥා ධර්මයෝය**, "ඇවුත්තිකස්සායං ධම්මෝ නායං ධම්මෝ මිත්තිඝස්ස" යනාදි **අෂ්ට මහාපුරුෂ චින්තකියෝය, නවවිධ යොනිසොමනසිකාර මූලක ධර්මයෝය**, [illegible] **දශවිධවූ මහාපුරුෂාඛ්‍යාශයෝය**, දාන ශීලාදි **දශවිධ කුශලක්‍රියා වස්තුහුය** යනාදි අනෙක ශතසහස්‍ර ප්‍රභෙදාවබොධිසම්භාරභූත යම් මහාබොධි සත්ත්වගුණයෝවෙත්ද, ඔවුහු [illegible] සුදුසු පරිදිදෙන් මෙහිලා නිර්ධාරණය කටයුත්තාහුය. එබැවින් මෙහි මහත් හොඟසකඹියද

මහත් ඥති වගීයාද හැර මහාභිනිෂ්ක්‍රමණය සේ අභිනිෂ්ක්‍රමණ කොට පැමිදිවූ මහා බොධිසත්ත්වයන් බහුජනසම්මත වත් පරමාලෞඛ්‍ය භාවයෙන් කුලයා කෙරෙහිද ගණයා කෙරෙහිද අලඟනාවය, අත්‍යන්තයෙන්ම ලාභසත්කාර කීර්තිවලට පිළිකුල් කිරීමය, ඒවෙකයෙහි අභිරතිය, කායජීවිත දෙකෙහි අපෙක්ෂා රහිතවූ පරිත්‍යාගය, නිරාහාරව සිටියදීම තුන්දිනක් මුළුල්ලෙහි දැන ප්‍රීතියෙන් පරිභුෂ්ටව නිර්විකාරයෙන් ශරීරයාපනය, මාසාර්ධමාසයක් හෝ දෙමසකුදු යාවකයන් ඇතිකල්හි ආහාර ඔවුන්ටම දී දැන-ගතවූම ප්‍රීතිසැපයෙන් ශරීරයාපනය කරමිසි පරිත්‍යාගයෙහි නොපසුබට පැවැත්ම සිඛිකරන්නාවූ උදාරදෘඪාශය, දන්දී නැවත ආහාර නොසෙවීමට කාරණවූ අනිශය සලෝලඛ ප්‍රවෘත්තිය දැසි, මේ ආදිවූ මහාබොධිසත්ත්ව ගුණයෝද දන යුත්තාහුය. එහෙයින් කියන ලදී:—

57. "එවං අච්ඡරියා හෙතෙ අබ්භූතාව මහෙසිනො,
මහාකාරුණිකා ධීරා සබ්බලොකෙක බන්ධවා.

58. අචින්තෙය්‍යානුභාවාව සදා සබ්බමහොචරා,
බොධිසත්තා මහාසත්තා සුච්සලෙලඛවුත්තිනො.

59. මහාවාතසමුට්ඨාතො ච්චිමාලො මහොදධි,
අපි ලඞ්ඝෙය්‍ය වෙලන්තං බොධිසත්තානා ධම්මතා

60. ලොකෙ සඤ්ඤාත වඩාපි නතෙ භාවිතභාවිනො
ලිම්පන්ති ලොකධම්මෙහි තොයෙන පදුමං යථා.

61. යෙසං වෙ අත්තනි සෙනහො නිහියති යථා යථා
සත්තෙසු කරුණා සෙනහො වඩ්ඪතෙව තථා තථා.

62. යථා චිත්තං වසෙ හොති නව චිත්තවසානුගා,
තථා කම්මං වසෙ හොති නව කම්මවසානුගා.

63. දෙසෙති නාභිභුයන්ති සමූහන්තෙනන්ති වා න නෙ:
චරන්තා බොධිපරියෙඨි පුරිසා ජානියා බුධා.

64. තෙසු චිත්තපසාදෙපි දුක්ඛතො පරිමොචයෙ
පගෙවානුක්‍රියා තෙසං ධම්මස්ස අනුධම්මතො"සි.

යනුවෙන් සියලු ලොකයාගේ අසහාය බන්ධුවූ පණ්ඩිතවූ මහාකාරුණිකවූ මහර්ෂිවූ පිරිසිදු සැහැල්ලු පැවතුම් ඇති හැම කල්හි සදහම් ගොදුරුකොට ඇති මහාසත්ත්වවූ බොධිසත්ත්වචරයෝ

වනාහි මේසේ ආශ්චර්ය අද්භූත ගුණ ඇත්තෝය. නොසිතිය හැකි ආනුභාව ඇත්තෝය. රළ පතර ඇති මහාසාගරය මහාවාතය හටගැන්මෙන් වෙරළ ඉක්මවා පැවැත්තේවී නමුත් බොධිසත්ත්ව වරුන්ගේ ධර්මතා තොමෝ කිසිකලෙකත් ඉක්මවා පැවැත්මෙක් නම් නැත. ලොකයෙහි ඉපිද වැඩිහිය මුත් ඒ බොධිසත්ත්වවරයෝ වඩනාලද සිත් ඇත්තාහු පියුම්පත ජලයෙන් නොගැටී පවත්නා මෙන් ලොක ධර්මයෙන් ලිප්ත නොවෙති. යම් යම් ආකාරයකින් යම් බෝධිසත්ත්ව කෙනෙකුන්ට ආත්මසෙනහය අඩුවේද එපරිද්දෙන්ම සත්ත්වයන් කෙරෙහි බොධිසත්ත්වයන්ගේ කරුණා සෙනහය වැඩෙහි. යම්සේ සිහ නමා වශගයෙහි පවතිද, එසේ චිත්තවශගත්වයට තෙමේ නොපැමිණෙයි. යම්පරිද්දෙන්ම කම්‍ය තමා වශගයෙහි පවතිද එපරිද්දෙන් තොමේ කාම වශගයට නොපමිණෙයි.

පණ්ඩිත වූ පුරුෂොත්තමවූ ඒ මහා බොධිසත්ත්වවරයෝ සම්‍යක්සම්බොධිය සෙවීමෙහි හැසිරෙන්නාහු රාගාදී ද්වේෂයන්ගෙන් නො මඩනු ලබති. නොද සම්බුද්ධඥානය කෙරෙත්. ඒ උත්තම මහාබොධිසත්ත්වයන් කෙරෙහි සිත පැහැදවීම් මාත්‍රයකුදු දුකින් මුදා ලන්නේය. වැළි ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිහිටා උත්වහන්සේලාට අනුගතව පිළිපැදීමෙහි අනුසස් කියනුම කවරේද? මතුයෙහි කියනු ලබන සියලු වෘත්තාන්තය ‘‘එවං අච්ඡරියා හෙතෙ – ධම්මස්ස අනුධම්මතෝ’’ යන මේ ගුණ කීර්තනය යොදාගත යුතු. එහෙයින් සසර දුකින් මිදෙනු කැමැති සියලු සත්පුරුෂයෝම කරුණා නිධානවූ පරදුඃඛ දුඃඛිතවූ අප තථාගතයන් වහන්සේගේ අනිශය ආශ්චර්‍ය ගුණයන් මේ මේයයි මනාව දැන ඉගෙන ඊට අනුව පිළිපැදීමෙහි අභිලාෂ ඇත්තහු වෙත්වා.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවේ
පළමුවන අකිත්ති චරිතය නිමි.

ii සඞ්ඛබ්‍රාහ්මණ චරිතය.

තවද මේ **පරමාඤ්ඤදීපනී** නම් **චරියාපිටක** අටුවාවෙහි දෙවන සඞ්ඛබ්‍රාහ්මණ චරිතය කිසේයැ යත්:—

යටගිය දවසැ **බරණැස්නුවර, මොලි** නමින් ප්‍රසිද්ධ වූයේය. මොලි නුවර බ්‍රහ්මදත්ත **නම් රජ්ජුරු කෙනකුන්** රාජ්‍යයකරවන කල්හි අප මහාබොධිසත්ත්වයන් වහන්සේ සංඛ නම් බ්‍රාහ්මණ යෙහ්ව ආඪ්‍යව මහත්සම්පත් ඇතිව වාසය කරන්නාහු නුවර සතර දෙරටුමේද නුවර මැදද වහසල් දෙරදැසි සයනැනක දන්සැල් **සයක්** කරවා දවස දවස කහවණු සියලක්ෂයක් බැගින් වියදම්කර මින් දුගී මගී යාචකාදීන්ට මහදන් දෙන්නාහුය. ඒ බොධිසත්ත්වයන්වහන්සේ සිතන්නාහු යම් හෙයකින් මාගේ ගෙහි සම්පත් අඩුව ගියේ නම් දන්දෙනු නොහැක. රිට පළමු සවණ්හුමියට ගොස් ධන ගෙන එන්නෙමියි බඩුවලින් නැවක් පුරවාගෙන තමාගේ අඹුදරුවන් කැඳවා "යම්තාක් මම එන්නෙමිද ඒතාක් මාගේ දැනය නොකඩවා දෙව්"යයි කියා දස්කම්කරුවන් විසින් පිරිවරන ලද්දාහු වහන්සඟලක් පයලා පත්කුඩයක් ගෙන පටුනු ගමට අභිමුඛව ගියෝය.

එකෙණෙහි **ගඞ්ගමාදන පව්තයෙහි** වාසය කරන්නාවූ පසේ බුදුරජාණන් වහන්සේ නමක් සතියක් මුළුල්ලෙහි නිරොධසමාපත්තියට සමවැද සමවනින් නැගිසිට ලොව බලා වදාරනසේක් **සඞ්ඛ බ්‍රාහ්මණයාණන්** ධන ගෙනෙනු පිණිස යන නියාව දැක මේ මහා පුරුෂයාණෝ ධන ගෙනසිමට යන්නාහ. උන්ට මහා සමුද්‍රයෙහි අන්තරායයක් වන්නේ දෙහෝ සි බලන්නාහු සමුද්‍ර මධ්‍යයෙහිදී උපද්‍රවයෙක් වන්නේයයි දැන වදාළෝය. එසේහෙයින් මා එතනට ගියකල තමන්වහන්සේ දැක වහන්සඟලද පත්කුඩයද දන්දී එම් දානානිසංසය හෙතුකොට ගෙන සමුද්‍රයෙහිදී නැව කැඩුනු කල පිහිට ලබන්නෝය. එහෙයින් උන්ට අනුග්‍රහ කරන්නෙමැයි අහසින් බැස උන්ට නුදුරු තෙන මධ්‍යාහ්න වේලෙහි වණ්ඩවූ අවුසුලහෙහි අතුරු ඇතිරියක් වැනි උණු වැලි මැඩගෙන උන්ගේ ඉදිරියට වැඩිසේක. බොධිසත්ත්වයෝ පසේබුදුරජාණන් වහන්සේ දැක තුටුපහටු වූවෝ මා විසින් පින් කෙතක් ලබන ලද්දේය, අද මේ පින්කෙතෙහි කුශල නමැති බිජුවටක් රෝපණය කරන්ට වටනේයයි සිතූහ. එහෙයින් කියන ලදී:—

තම්හං පවිපථේ දිස්වා ඉමමත්ථං විචින්තයිං,
ඉමං වෙත්තං අනුප්පත්තං පුඤ්ඤකාමස්ස ජන්තුනෝ-13.

යථාපි කස්සකෝ පුරිසෝ වෙත්තං දිස්වා මහාගමං,
තත්ථ බීජං න රොපෙති න සෝ ඛෙත්තේන අත්ථිකෝ-14.

එවමේවා'හං පුඤ්ඤකාමෝ දිස්වා වෙත්තවරුත්තමං,
යදි තත්ථ කාරං න කරොමි නාහං පුඤ්ඤේන අත්ථිකෝ-15.

යථා අමච්චෝ මුද්ධිකාමෝ රඤ්ඤෝ අන්තෙපුරෙ ජනෙ,
න දෙති තෙසං ධනධඤ්ඤං මුද්ධිතෝ පරිහායති-16.

එවමේවා'හං පුඤ්ඤකාමෝ විපුලං දිස්වාන දක්ඛිණං,
යදි තස්ස දානං න දදම් පරිහායිස්සාමි පුඤ්ඤතෝ-17 සි.

මෙසේ සිතා දුරදිම් වහන් මුදු වෙගයෙන් අවුත් වැද සවාමිනි, මට අනුකම්පා පිණිස මේ වෘක්ෂ මූලයට වඩිනු මැනවැයි කියා ආරාධනා කොළෝය. උන්වහන්සේ වෘක්ෂමූලය කරා වැඩම කරන කාලයෙහි එහි වැලි ඉසුරුවා උතුරුසළුව ඇතිරියක් කොට පැණවූහ. පසේබුදුරජාණන් වහන්සේ එහි වැඩ උන් කල්හි වැඳපියා සුවඳ කවනලද පෙරු ජලයෙන් උන්වහන්සේගේ පා සෝදා ගඳතෙල් ගා තමන්ගේ වහන් සහලද උන්වහන්සේගේ ශ්‍රීපාදයෙහි ලා "සවාමිනි!, මේ වහන්සහල පයලා පත්කුඩය ඉසටකොට වඩනේ මැනව"යි කියා පත්කුඩය හා වහන් සහලද පූජාකොළෝය. උන්වහන්සේ උන්ට අනුග්‍රහ පිණිස ඡත්‍රොපාහනයන් පිළිගෙන වදාරා උන්ගේ ප්‍රසාද සංවර්ධනය පිණිස බලාසිටිද්දීම අහසට නැඟී ගන්ධමාදන පර්වතයට වැඩසේක. එහෙයින් වදාළහ:

එවාහං විනතසිඛාන ඔරොහිත්වා උපාහනා,
තස්ස පාදානි වන්දිත්වා අදාසිං ජන්තුපාහනං (18)සි.

බොධිසත්ත්වයෝ මේ ආශ්චර්‍යය දැක අතිශයින් ප්‍රසන්න සිත් ඇතිව පටුනට ගොස් නැව් නැහුනෝය. ඉක්බිති මහා සමුද්‍ර මධ්‍යයට පැමිණි සත්වන දවස් නැව සිදුරු විය. පැන් ඉස සිස්කළ නොහැකිවිය. මනුෂ්‍යයෝ මරණ බයින් බියපත්වූවාහු තමතමන්ගේ දෙවතාවන් වැඳ මහත් ශබ්දයෙන් හඬන්ට වන් නාහ. බොධිසත්ත්වයෝ එක් අතවැසියකු ලවා සියලු ශරීරයෙහි තෙල්ගල්වා ගිතෙල් සමග සකුරු (කුඩු) යැපෙන පමණ අනුභවකොට දැසයාටද අනුභව කරවා ඔහු සමග නැවේ කුඹය

උඩට නැගී අපගේ නුවර මේ දිශාවෙහි වන්නේයයි දිග් නියම දැන මිනිසුන් කන්ට රැස්වූ මස්කැළඳ ආදීනගෙන් වන උපද්‍රවයන් සහ්‍යාධිෂ්ඨානයෙන් වලකමින් ඔහුසමග (නැවේයිට) ඉස්බක් එනම් රියන් එකසිය හතළිස් අටක් පමණ තැන් පැන සමුද්‍රයෙහි පිහිනන්ට වන්හ. මනුෂ්‍යයෝ එහිම විනාශයට පැමිණියාහුය. සාගර තරණය කරන උන්වහන්සේට සත්දිනක් ඉක්ම ගියේය. එකල්හිද බොධිසත්ත්වයෝ ලවණෝදකයෙන් මූවසෝදා පෙහෙවස් සමාදන් වූවාහුමය. ඉක්බිති මෙබඳු පුරුෂොත්තමයන් රක්ෂා කරනු පිණිස යිවුවරම් දෙවිමහරජාණන් විසින් සමුද්‍රයෙහි සිටුවන ලද **මණිමෙඛලා** නම් දෙවිදූ තමන්ගේ ඓශ්වර්‍යයෙන් සත්-දවසක් ප්‍රමාදව උන්නී සත්වෙනි දවසෙහි උන්වහන්සේ දැක ඉදින් මේ මහාපුරුෂයාණෙනි මහා සමුද්‍රයෙහි මැරුණාහු නම් ඉතා ගැරහුම් කටයුත්තියක් වන්නෙමියි කලකිරුණු යිත් ඇත්තී රත්තළියක් දිව්‍යභොජනයෙන් පුරවා වේගයෙන් අවුත් බ්‍රාහ්මණ-යාණෙනි, මේ දිව්‍යභෝජන අනුභවකළ මැනවයි කිව. බොධි සත්ත්වයාණෙනි මම පේළිම්. වේලාව වරදවා අනුභව නොකරම්සි කියා ප්‍රතික්ෂේප කළහ. බොධිසත්ත්වයෝ දෙවිදුව විචාරන්නෝ මෙසේ කිහ:—

70. යං භවං සුඛෙනාභිසමෙක්ඛසෙ මං
භුඤ්ජාසු භත්තං ඉතිමං වදෙසි,
පුච්ඡාමි තං නාරි මහානුභාවෙ
දෙවිත්‍රුයි භවං උද මානුසිනි.

යනුවෙන් මහත් ආනුභාව ඇති තැනැත්තිය, යම්හෙයකින් නී මා ප්‍රිය ඇසින් බලන්නෙහිද, මේ බත් අනුභව කරවයි මට කියන්නෙහිද, නී වූකලි දිව්‍යස්ත්‍රියක්ද මනුෂ්‍ය ස්ත්‍රියක්දැයි නොදනිමි. එබැවින් නී විචාරමිසි කිහ. ඊට ප්‍රතිවචන දෙන දෙවිදූ මේ ගාථාවන් කිවුයෙ:

71. දෙවී අහං සඞ්ඛ මහානුභාව
ඉධාගතා සාගරවාරිමජ්ඣෙ,
අනුකම්පකානෙව පදුට්ඨචිත්තා
තමෙව අත්ථාය ඉධාගතාසම්.

72. ඉධන්නපානං සයනාසනං ච
යානානි නානා ච විධානි සඞ්ඛ,
සබ්බස්ස ත්‍යාහං පටිපාදකම්හි
යං කිඤ්චි තුයහං මනසාභිපත්ථිතංති.

යනුවෙන් දෙව්දූ තොමෝ "මිහත් ආනුභාව ඇති සඞ්ඛබ්‍රාහ්මණයාණෙනි, මම වනාහි මණිමේඛලා නම් දෙව්දූ වෙමි. තොපට අනුකම්පා පිණිස මෙහි ආමි. සඞ්ඛ බ්‍රාහ්මණයාණෙනි, මෙහි ආහාර පාන සයනාසනද නොයෙක් වැදුරුම් යානයෝද ඇත. ඒ සියල්ල හුඹ වහන්සේට විස්තරෙළ කරදෙන්නෙමි. නවද ඔබගේ සිතින් ප්‍රාර්ථිතවූ යම්කිසිවක් ඇද්ද ඒ සියල්ලත් දෙමි"යි කියා ඒ ගාථාවන් කිව. මහබෝසතාණෝ ඒ දැසා මේ දෙව්දූ තොමෝ සමුදුරදී මට මේ මේ දේ දෙමියි කියයි; යම් දෙයක් ඕ මට දෙන්නී නම් එද මාගේ කුසල බලයෙහි ලැබෙන ධර්මය. එම් පින් මේ දෙව්දූ දන්නිද නොහොත් නොදන්නිදැයි විචාරන්නෙමියි සිතා මේ ගාථාව කිහ.

73. යං කිඤ්චියිට්ඨං ව හුතඤ්ච මියඤ
සබ්බස්ස නො ඉස්සරා තවං සුගතෙන,
සුසෝණී සුබ්භුරූ විලඟමජ්ඣෙ
කිස්ස මේ කම්මස්ස අයං විපාකො සි.

එම්බා සුඳුරාඬගිය, මා විසින් දුන වශයෙන් යාගකරනලද ආහුණන පාහුණන වශයෙන් දෙනලද යම්කිසි දෙයක්වේද, ඒ සියල්ලම දුන ගැනිමට නි සමර්ථ වන්නෙහිය, සොඳුරු උකුල ඇති යහපත් සිනුවලඟ ඇති දෙවිදුනු හා සමාන සොඳුරු බැම් යුවල හා කලවා ඇති දෙව්දුවෙනි, සමුද්‍ර මධ්‍යයෙහි අද පිහිට, ලබමි. ඒ වනාහි මා කළ කුසලයන් අතුරෙන් කවරනම් කුසලයකා විපාකයවේද, ඒ දැසා දෙව්දූ තොමෝ මේ බ්‍රාහ්මණයාණෝ තමන්කළ කුශලකර්ම නොදන්නෝ මා විචාරති, උන්ට කියන්නෙමියි නැවී නැගෙන දවසෙහි පසේ බුදුරජාණන් වහන්ගේට දුන් ඡත්‍රොපාහනදානයාගේ විපාකයම් මේ සම්පතට කාරණයයි කියා මේ ගාථාව කිව:—

74. සමේම පථෙ බ්‍රාහ්මණ එකභික්ඛුං
උඤ්ඡටට පාදං තසිතං කිලන්තං,
පටිපාදයි සඞ්ඝ උපාහණා හි
සා දක්ඛිණා කාමදුඝා තවජ්ජ.

සඞ්ඝ නම් ඔබුණාණෙනි, ත්‍රිෂමපථයෙහි උණුවැලි මැඩිමෙන් පෙළණු ලා ඇතිව කලාන්තවූ පසේබුදුන් දැක විහින් සහල කුඩයත් සමග පූජාකෙළෙනිය. ඒ දක්ෂිණාතොමෝ ඔබ වහන්සේට අද සියලු සම්පත් දෙන්නිය.

ඒ දැසා මහාබෝධිසත්ත්වයෝ මේ ආකාරවූ පිහිට නැත්තාවූ සාගරයෙහිදී පවා මාළුයින් කෑලද උපාහිත් දුනය වනාහි සියලු

කැමති දෑ දෙන්නාවූ හදසැටයක් මෙන් ඒයසි අනේ! දුන්නේ යහපතැයි! සතුටුයින් ඇත්තෝ මෙසේ කිහ:—

75. සා හොතු නාවා ඵලකූපපන්නා
අනවසුතා එරක වාතයුත්තා,
අඤ්ඤස්ස යානස්ස න හෙත්ථ භූමි
අජේජව මං මොලිනං පාපයස්සු.

"අපට අනිත් යානාවකින් යාමට මේ සුදුසු ප්‍රදෙශයක් නොවේය, බොහෝ ප්‍රවරුවෙන් යුක්තවූ දිය නොවදින්නාවූ මිනාකොට ගෙන යන්නාවූ වාතයෙන් යුක්ත වූ මහා නෞකාසංඛ්‍යාත යානාවෙක අපලා අදම මොලි නුවරට පමුණුවා පියව"යි එවිට දෙවදුහිතෘ තොමෝ උන්ගේ වචන අසා තුටු පහටු ඇත් අට ඉස්බක් දිගද සතර ඉස්බක් පළලද යෂ්ටි විස්සක් (එනම් රියන් හතක්) ගැඹුරද ඇති සත්රුවන් නැවක් මවා ඉඳුනිල්මය කුඹයක්ද සවණ්ණමය රූනද රිදීමය හබලද නිර්මිතකොට නැව සත්රුවනින් පුරවා බොධිසත්ත්වයන් වැළඳගෙන නැවට නැංවුවාය. උන්ගේ අතවැසියා නොනැංවූය. බෝධිසත්ත්වයෝ ඌට තමන්කළ කුසල කම්යෙන් පින් දුන්හ. පින් අනුමෝදන්වූ පසු දෙවිදු අතවැසියාද වැළඳගෙන නැවට නංවා මොලි නුවරට ගෙන ගොස් බෝධි සත්ත්වයන්ගේ ගෙය සත්රුවනින් පුරවා තමා වසන තෙනටම ගියාය. එහෙයින් වදාළහ:-

76. සා තුට්ඨචිත්තා සුමනා පතීතා
නාවං සුචිත්තං අභිනිම්මිනිත්වා,
ආදාය සංඛං පුරිසෙන සද්ධිං
උපානයී නගරං සාධු රම්මං සි.

මහාපුරුෂොත්තමයාගේ චිත්තසම්පත්තිය හේතුකොටගෙනද පසේබුදු රජාණන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැඟී සිටි බැවින්ද චේතනා සත අතුරෙන් ආදිචේතනාව **දිට්ඨධම්මවේදනීය** හෙයින්ද ඒ දානය උදුරුඵල ඇත්තේ විය.

මේ ඒ දානයාගේ සවල්පමාත්‍ර විපාකයයි දත යුතුයි. බෝධි සම්භාරභූතවූ ඒ දානය වනාහි අප්‍රමාණ විපාක ඇත්තේ විය. එහෙයින් කියන ලදී:—

තෙනෙවාහං සතගුණතෝ සුබුමාලෝ සුබෙධිතෝ,
අපි ච දානං පරිපූරෙනෙනා එවං තස්ස අදාසහං- (19) සි.

ඒ පසේබුදු රජහට වඩා මම සතගුණයෙන් සියුම්වලිමි. සැපසේ වැඳුනෙමි. එහෙදුවුවන් තමන් වහන්සේගේ ශරීරයට වත දුක අපෙක්ෂා නොකොට දන පාරමිතාව සම්පූර්ණ කරමින් පසේබුදු රජාණන් වහන්සේට කුඩිය සහ වහන් සඟල පූජාකෙළෙමියයි තමන් වහන්සේගේ දානාධ්‍යාශයාගේ උදර භාවය ප්‍රකාශකළසේකි. බොධිසත්ත්වයෝද ජීවිතාන්තය දක්වා අප්‍රමාණ ධනයෙන් යුක්තාව නිතිගෙයි වසන්නෝ බොහෝ සෙයින් දන්දී සිල්රැක ආයු කෙළවර පිරිස් සහිතව දෙව්ලොව ගියෝය.

එකල්හි දෙවිදු තොමෝ උපුල්වන් මහාසථවිරාවය, අහවැසි පුරුෂතෙම ආනන්ද සථවිරයන් වහන්සේය. සඞ්ඛ බ්‍රාහ්මණයෝ වනාහි ලොකනාථයන් වහන්සේය.

මේ සංඛවරියාවෙන් සාමාන්‍යයෙන් **දානපාරමිතාව** ප්‍රකාශ කරන ලද්දේ ඒ තමුන් විශෙෂයෙන් අතිපරිශුඛ නිත්‍ය ශීල උපොසථ ශීලාදින්ගේ වශයෙන් **ශීලපාරමිද,** දන ශීලයන්ට ප්‍රතිපක්ෂවූ කෙලෙශධර්මයන් කෙරෙන් නික්මුණු බැවින් කුශලධර්මයන්ගේ වශයෙන් **නෛෂ්ක්‍රම්‍ය පාරමිද,** දානාදිය නිපදවනු පිණිස උත්සාහ කිරීම් හා මහාසමුද්‍ර තරණය පිණිස කළ ව්‍යායාම වශයෙන් **විර්‍යපාරමිද,** තදර්‍ථය ඉවසීම් වශයෙන් **ක්ෂාන්තිපාරමිද,** ප්‍රතිඥානුරූප ප්‍රතිපත්තියෙන් **සත්‍යපාරමිද,** සකලසත්‍වයන්හි අවල සමාදානයාගේ අධිෂ්ඨානයෙන් **අධිෂ්ඨානපාරමිද,** සියලු සතුන් කෙරෙහි හිත අදහස් වශයෙන් **මෛත්‍රීපාරමිද,** සත්ත්ව සංස්කාරයන් කළ විප්‍රකාරයන්හි මධ්‍යස්ථ භාවප්‍රාප්තියෙන් **උපෙක්ෂා පාරමිද,** සියලු පාරමීන්ට උපකාර අනුපකාර ධර්මයන් දන අනුපකාර ධර්මයන් හැර උපකාර ධර්මයන් කෙරෙහි පැවතියාවූ පුරෙචාරිවූද සහජාතවූද උපාය කෞශල්‍යවූ **ප්‍රඥාපාරමි** දැයි මේ පාරමිතාවෝද ලැබෙන්. දානාධ්‍යාශයාගේ වනාහි අධිකෝදර භාවය හෙතුකොටගෙන දානපාරමිතාවගේ වශයෙන් දෙශනා තොමෝ පවත්වන ලද්දීය.

යම් හෙයකින් මේහි දශපාරමීහු ලැබෙත්ද එහෙයින් යට (අකිත්ති චරිතයෙහි) කියනලද මහාකරුණාදි වූ බොධිසත්ත්ව ගුණයෝ මේහිද සුදුසු පරිද්දෙන් නිඞ්ගරණය කටයුත්තාහුය.

එපරිද්දෙන් තමාගේ භොග සැපය අපෙක්ෂා නොකොට මහා කරුණාවෙන් දානපාරමිතාව පුරන්නෙමියි දානසම්භාර රැස්කර ගෙන රම්‍ය පිණිස මහමුහුදු තරණයද, මුහුදමැද්ද වැටුනාහුගේ උපොසථාධිෂ්ඨානයද, ශීලභෙදන භයින් දෙව්දුව සමීපයට පැමිණි

කල්හිදු ආහාර අනුභව නොකිරීම දැයි මේ ආදි මහාබොසි සත්ත්ව ගුණයෝ දනගුත්තාහුය. දැන් මතු කියන චරිතාවන්හිද මේ ක්‍රම යෙන් ගුණ නිධාරණය කටයුත්තාහ. එහෙයින් විශෙෂයක් දුටු තැන කියන්නෙමු.

පරමාත්‍ථදීපනි නම් චරියාපිටක අට්ඨවාවෙහි දෙවන සඞ්ඛබ්‍රාහ්මණ චරිතය නිමි.

---

iii කුරුධම්ම චරිතය.

තවද මේ පරමාත්‍ථදීපනි නම් චරියාපිටක අට්ඨවාවෙහි තුන්වන කුරුධම්ම චරිතය කිසේය? යත්:

පුනාපරං යදා හොමි ඉන්‍දපත්තෙ පුරුත්තමෙ
රාජා ධනඤ්ජයො නාම කුසලෙ දසකුසාගතො. සි (20)

වදාළ තයින් "නැවත අනිකුදු චරිතයක් කියමි. යම්කලෙක මම කුරුරට **ඉන්‍දපත්තුවර** ආදි දශපුණ්‍යක්‍රියා වසතුවෙන් හෝ නොහොත් දශ කුශල කර්මපථයෙන් යුක්තවූ **'ධනඤ්ජය** නම් රජෙක් වූයෙමිද" යන්නෙහි මේ පිළිවෙළ කථාවයි.

යටගිය දවස කුරුරට **ඉන්‍දපත්තුවර** අප මහබෝසතාණන් වහන්සේ **කුරුරජතුගේ** අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගෙන ක්‍රමයෙන් නුවණැතිබවට පැමිණ **තක්ෂශිලා** නගරයට ගොස් සියලු ශිල්ප හා විද්‍යාවන් ඉගෙන නිමවා නැවත ආගමනය කළසේක් පියරජහු විසින් යුවරජ තනතුරෙහි පිහිටුවන ලද්දේය. බොධිසත්ත්වයන් වහන්සේ කල්යාමෙන් පියමහ රජ්ජුරුවන්ගේ ඇවැමෙන් රජයට පැමිණ දසරජදම් අකුප්වා දැහැමින් රජය කළසේක. සියලු ලෝවැස්සෝ උන්වහන්සේ ධනඤ්ජය යයි දැන ගත්තුය. රජ්ජුරුවෝ නුවර සතර දෙරටු වය නුවර මැදය රජගේ දෙරකඩයයි සදන්හලක් කරවා දවස දවස සය ලක්ෂයක් බැගින් වියදම් කොට මුළු දඹදිව්තලය නගුල් උඩබදවා දන්දෙන්නාහුය. එකල්හි උන්වහන්සේගේ දානඛ්‍යාශයත් දනයෙහි ඇලුමත් මුළු දඹදිව පැතිර ගියේය.

එකල්හි **සාලිකුරට** දුර්භික්ෂභය, ජානකභය, රොගභයයයි තුන් භයක් උපන. සියලු රටවැස්සෝ **දන්තපුරයට** ගොස් රාජභවනචාරයෙහි (රාජාඞ්ගණයෙහි) රැස්ව "දෙවයන්වහන්ස, වැසි වස්වාලුව මැනව"යි කියා ඔල්වරහඬ පැවැත්වූහ. රජ්ජුරුවෝ ඒ ශබ්දය අසා "මෙම්හු කවරහෙයකින් මහත් ශබ්ද කෙරෙත්ද" යි ඇමතියන් විචාළහ. අමාත්‍යයෝ රජහට එපවත් කිවාහුය. (එවිට) රජ්ජුරුවෝ "පුරාතන රජදරුවෝ වැසි නොවැස්ස දුර්භික්ෂය හටගත්කල කුමක් කෙරෙත්ද"යි විචාළහ. ඇමතියෝ "පුරාතනයෙහි රජදරුවෝ වැසි නොවසිනා කල්හි වැසි වසිවසි දන්දී පෙහෙව සිරියහන් ගබඩාවට පිවිස තණඇති රියෙහි සත්දිනක් සැතපෙන්නාහුය"යි කිහ. ඒ අසා රජ්ජුරුවෝද එසේ කළාහුය. නමුත් වැසි නොවැස්සේය. රජ්ජුරුවෝ "මාවිසින් කළමිනා දෙය කොටත් වැසිනොවස්නේය කුමක් කරමෝද"යි කිහ. මහරජ්ජුරුවෙනි! "**ඉදිපත්** නුවර **ඔනඤ්ඤ** නම් කුරු (කොරව්‍ය) රජහුගේ මඞ්ගල හස්තිරාජයා ගෙන්වාගත් වහාම් වැසි වසින්නේය" යි කිහ. රජ්ජුරුවෝ "ඇමතියෙනි, ඒ රජු වනාහි සිවුරඟසෙනගින් හා පඤ්චප්‍රකාර බලයෙන් යුක්තය; පරසතුරන් විසින් මැඩපැවැත්විය නොහැකිය. උන්ගේ ඇතු කෙසේ ගෙන්වමෝද" යි කිහ. "මහරජ්ජුරුවෙනි, උන් හා සමඟ යුදකිරීමෙන් කම් නැත. ඒ රජ්ජුරුවෝ වනාහි දුනාඛ්‍යාශ ඇත්තෝය. දන්දීමෙහි ඇලුම් ඇත්තෝය. ඉදින් යම්කෙනෙකුන් විසින් ඉල්වන ලද්දාහුනම් සරසා පිළියෙළ කරනලද හිස ඒනමුත් කපා දෙන්නාහ. පස්පෑ දිස්නා ඇස් උපුටා දෙන්නාහ. සියලු රජය පවා දෙන්නාහ. ඒ ඇතු දිමෙහි කියනුම කිම්ද" යි අවෂ්‍යයෙන් ඉල්වන ලද්දාහු නම් ඇතුදෙන්නාහ" යි කිවාහුය. එසේවිනම් "ඇතු ඉල්වන්ට සමර්ථ යෝ කවරුද" යි ඇසූහ. මහරජ්ජුරුවෙනි, "ඉල්වන්ට සුරූ වූවෝ නම් බමුණෝය" යි කිවාහුය. රජ්ජුරුවෝ බ්‍රාහමණයන් අටදෙනකුන් කැඳවා උන්ට සත්කාර සම්මාන කොට මඟවිය දම් ද දී ඇතු ඉල්වා ගෙන එන්ට යැවූහ. ඔවිහු තුරිත ගමනින් ගොස් ඉඳිපත් නුවරට පැමිණ වාසල්දොර දන්සැලින් බොජුන්කිස කොට කිපදිනක් ශරීර විඩා සංසිඳුවා ගෙන රජ්ජුරුවන් දන්හලට පැමිණෙන තෙක් නැගෙනහිර වාසල්දොර සිටියාහුය. බොධිසත්ත්වයන් වහන්සේ උදෑසනම පැන් සැනහී සුවඳ විලවුන් ඇඟගල්වා සියලු අලඞ්කාරයෙන් සැරසී සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සරහනලද හස්තිරාජයා පිටට නැඟී මහත්වූ රාජානුභාවයෙන් දන්හලට ගොස් ඇතුපිටින් බැස හත්

අට දෙනකුන්ට පමණ සියනින්ම දන්දී "මේ මාදුන් ලෙසටම දන් දෙවුය"සි කියා ඇතුපිට නැගී දකුණු වාසල් දොරටුවට වැඩිසේක.

බ්‍රාහ්මණයෝ නැගෙනහිර වාසල් දොර රැකවල් බලවත් බැවින් අවකාස නොලැබ හෙවත් රජ්ජුරුවන් දැකගත නොහී දකුණු වාසල් දොරටුවට ගියාහු එන්නාවූ රජ්ජුරුවන් බල බලා වාසල් දොරටුවට ඉනා නුදුරු උස්තැනක සිටියාහු එහි පැමිණි මහ රජාණන්ට අත් ඔසවා ජය වැඩුවාහුය. රජ්ජුරුවෝ වජ්‍රාඞ්කුශයෙන් ඇතු නවත්වා උන් ළහට ගොස් "පින්වත් බමුණෙනි, කුමක් කැමතිවවුදැ"ය විවාළෝය. බ්‍රාහ්මණයෝ කියන්නාහු "කළිහුරට දුර්භික්ෂභයද, ජාතක භයද, රොගභයද යන භයත්‍රයෙන් උපද්‍රවය, ඒ උපද්‍රවය වනාහි නුඹවහන්සේගේ මේ මංගල හස්තිරාජයා ගෙනගිය කල්හි සංසිඳෙන්නේය. ඒ නිසා මේ අඤ්ජනොපමවූ මංගල හස්තිරාජයා අපට දුනමැනව"සි කිවාහුය. ඒ අර්ථය ප්‍රකාශකරන්නාවූ අප ශාස්තෘන් වහන්සේ මෙසේ වදාළසේක:

කාළිඞ්ගරට්ඨවිසයා බ්‍රාහ්මණා උපගඤ්ජුමං
ආයාචුං මං හත්ථිනාගං ඛඤ්ඤං මංගලසම්මතං. (21)

අවුට්ඨිකෝ ජනපදෙ දුබ්භිකෙඛා ජාතකෝ මහා,
දදාහි පවරං නාගං නීලං අඤ්ජනසච්ඡයං. සි. (22)

ඉක්බිති බොධිසත්ත්වවූ කුරුරජ්ජුරුවන් වහන්සේ වනාහි "ඉදින් යාචකයන්ගේ මනදෙළ නැසුනේ නම් එය සුදුසු නොවෙයි. එපමණකුත් නොව දැන පාරමී පරිපූරණය කරන්නෙමි යන මාගේ සමාදානයාගේ භෙදයද වන්නේය"සි සිතා ඇතුපිටින් බැසපියා ඉදින් නොසරහනලද තැනක් ඇත්නම් එය සරසා දෙන්නෙමැයි හාත්පස බලනසේක් නොසරහන ලද තැනක් නොදැක සොඬගෙන බමුණන් අත්පිට තබා රන් කොණ්ඩියෙන් සුවඳ පැන් අතවත් කොට ඇතු දන්දුන් සේක.

එහෙයින් කියනලදී:—

න මෙ යාචඤ්ඤමනුපපන්නෙ පච්ඡෙඛපෝ අනුසාසවෝ,
මා මේ හිජ්ජි සමාදානං දස්සාමි විපුලං ගජං. (23).

නාගං ගහෙත්වා මණ්ඩාය හිඞ්කාරෙ රතනාමයෙ,
ජලං හත්ථෙ ආකිරිත්වා බ්‍රාහ්මණානං අදං හජං. (24)

බම්මණ්ඨට හස්තිරාජයා දන්දුන් කලෙ අමාත්‍යයෝ රජ්ජුරු වන්ට මේසේ කීමානුය. මහරජ්ජුරුවෙනි, කවරහෙයකින් අනික් දෑනත් දන්නොදී මහුලැතු දන් දුන්සේක්ද, රජ්ජුරුවන් වහන්සේ වියින් මේබඳු මහුලැතෙක් ඓශ්වර්‍යය හා අභිවිජයද පතමින් දියයුතු වන්නේය.''යි මහාසත්ත්වවූ කුරුරජ්ජුරුවෝ කියන්නාහු ''යාචකයෝ මාගෙන් යමක් ඉල්වන්නෝද, එයම මාවියින් දියයුතුය. ඉදින් වනාහි යම් කෙනෙක් මාගෙන් රාජ්‍යය ඉල්වන්නානු නම් උන්ට රාජ්‍යයද දෙන්නෙමි. රාජ්‍යයට හා ජීවිතයටද වඩා සර්ව්ව ඥාවය හෙවත් බුදුබවම අතිශයින් ප්‍රිය වන්නේය. එහෙයින් හස්තිරාජයා දන්දුන්නෙමියි'' කිහ. එහෙයින් වදාරන ලදී.

තස්ස නාගෙ පදින්නමහි අමච්චා එතදබ්‍රවුං,
කිංනු තුය්හං වරං නාගං යාචකානං පදස්සසි. (25)

ඔසදසඞ්ගලසම්පන්නා සංගාමං විජයුත්තමං,
තස්මිං නාගෙ පදින්නමහි කිංනෙ රජ්ජං කරිස්සසි, (26)

රජ්ජම්පි මෙ දදෙ සබ්බං සරීරං දජ්ජමත්තනො,
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා නාගං අදාසහන්ති සි (27)

එසේ ඒ හස්තිරාජයා ගෙනා කල්හිත් කළිඟුරට වැසි නොවසිමය. කළිඟු රජාණෝ ''දැනුදු වැසි නොවසියි, කාරණා කිම්දැ''යි විවාළෝ. අමාත්‍යයෝ ''කොරව්‍ය රජ්ජුරුවෝ **කුරුධර්ම** රක්නාසේක. එබැවින් උන්වහන්සේගේ රටෙහි අඩමසක් දස දිනක් පාසා වැසිවස්නේය; ඒ වනාහි රජහුගේ ගුණානුභාවය විනා මේ ඇතුගේ ගුණානුභාවයක් නිසා නොවෙයි'' කිහ. ඒ දැන රජ්ජුරුවෝ ''අපිදු කුරුධර්ම රක්‍ෂාකරම්හ, යවු, ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන් සමීපයෙන් කුරුධර්ම රන්පතෙක ලියවා ගෙන එවුය''යි අමාත්‍යයන් යැවූහ.

පඤ්ච ශීලය කුරුධර්මයයි කියනු ලැබේ. ඒ පඤ්ච ශීලය වනාහි බොධිසත්ත්වයන් වහන්සේ සුපිරිසිදුකොට රක්නාසේක. බොධිසත්ත්වයන්වහන්සේ කුරුධර්ම සංඛ්‍යාත පඤ්චශීලය රක්නා නියායෙන් උන්වහන්සේගේ මැණියෝද, අග බිසවුද, මල්බෑ යුවරජුද, පෙරවිබමුණුද, රජ්ජුග්‍රාහක අමාත්‍යයෝද, රථාචාරි නෙමේද, සිටාණෝද, දෙණමාපක පෙරවිබමුණුද, දෙරටුපල්දෑ, ගණිකා වෙශ්‍යාදුවද, යන මේ සියල්ලෝම් කුරුධර්ම රක්නාහ. එහෙයින් කියන්ලදි:—

77. රාජා මාතා මහෙසීව උපරාජා පුරොහිතො,
රජ්ජුකො සාරථි සෙඨි දෙණෝ දෙවාරිකො තථා;
ගණිකා තෙ එකාදස කුරධම්මෙ පනිඝිහා"සි.

කළිඟුරට ඇමතියෝද බොධිසත්ත්වයන් වහන්සේ කරා එළඹ වැඳ එපවත් කිවාහුය. මහා සත්ත්වයෝ "මට කුරුධර්මයෙහි සැකයෙක් ඇත. මාගේ මැණියෝ වනාහි සුරක්ෂිත කොට රක්ෂා-කරනසේක. ඔබ සමීපයෙන් ලියවා ගෙන යවයි" කීහ. "මහ රජ්ජුරුවෙනි, කුකුස (සැකය) වනාහි ශික්ෂාකාමීවූ සල්ලෙඛ වෘත්ති ඇත්තහුහට වන්නේය. එහෙයින් අපට ලියා දුනමැනවැයි" කියා යාච්ඤාකරන ලද්දේ **"පාණො නහනනබෙබා අදිනනං න ආදාතබබං, කාමෙසු මිචඡාචාරා නවරිතබබා, මුසා න භාසිතබබා, මජජං න පාතබබං"**යි මෙසේ රන්පට ලියවා මා ලියවා දුනත් මැණියන් වහන්සේ සමීපයෙහුත් ලියවා ගනුව'යි කීහ. දූතයෝ රජ්ජුරුවන් වැඳ මවු බිසවුන් වහන්සේ සමීපයට ගොස් දෙඑන් වහන්ස, නුඹවහන්සේ කුරුධර්මය රක්ෂාකරන සේක. ඒ අපට දුනමැනවයි කිවාහුය, බොධිසත්ත්වයන් වහන්සේගේ මවු බිසවුද බොධිසත්ත්වයන් මෙන්ම තමන්ට එහි කුකුසක් ඇති බැව් කියා ඔවුන් විසින් යාච්ඤාකරන ලද්දාහු දුන්හ. රාජ බිසවුන් ආදී සියල්-ලෝත් එලෙසම කුකුස් ඇත්තෝ වූවාහුය. ඇමතියෝ සියල්ලන් සමීපයෙන්ම කුරුධර්මය රන් පත ලියවාගෙන දන්තපුරයට ගොස් කළිඟු රජහටදී එපවත් කිවාහුය. කළිඟු රජාණෝද කුරුධර්මය රක්නාහු පංචශීලය සම්පූර්ණ කළහ. (පන්සිල් පිරුහ) ඉක්බිති සියලු කළිඟුරට වැසිවැසපියා තුන්හය සංසිදුනේය. සියලු කළිඟුරට නිර්භීයව සුභික්ෂසම්පන්නවිය. බොධිසත්ත්වයන් වහන්සේ දිවි පවත්නාතෙක් දානාදි පින්කම්කොට පිරිස් සහිතවැ දෙව්ලොව ගියහ. එකල්හි ගණිකා ආදිහු උත්පලවණ්ණාදිහු වූවාහුය. මෙම කියනලදි:-

78. ගණිකා උපපලවණ්ණාව පුණ්ණෙණා දෙවාරිකො තදා,
රජ්ජුගාහොව කච්චානො මොග්ගල්ලානො දෙණ්ණමාපකො.

79. සාරිපුත්තෙනා තදා සෙඨි අනුරුඛොව සාරථි,
බ්‍රාහ්මණො කස්සපො ථෙරො උපරාජා තණ්ඩුලනාළිතො.

80. මහෙසි රාහුලමාතා මායාදෙවි ජනෙත්තිකා,
කුරුරාජා ලොකනාථො එවං ධාරෙථ ජාතකනති.

එසමයෙහි ගණිකා තොමෝ නම් දැන් උත්පලවණ්ණාය. දෙරටුපල් තෙමේ පූර්ණ සථවිරය. රජ්ජුග්‍රාහක තෙමේ කාත්‍යා-යන සථවිරය, දෙණ්ණමාපක තෙමේ මෞද්ගල්ල්‍යායන සථවිරය,

සිටුතෙමේ සාරිපුත්‍ර සථවිරය. රථාචාර්‍ය තෙමේ නම් අනුරුඬ සථවිරය, පුරොහිත බ්‍රාහ්මණ තෙමේ නම් කාශ්‍යප සථවිරය, යුවරජතෙමේ නන්‍ද සථවිරය, බිසව් නම් රාහුල මාතෘය, රජ්ජුරුවන් මවු බිසවු නම් මහාමායා දෙවිය, කොරව්‍ය රජ්ජුරුවෝ නම් ලොකසවාමීන් වහන්සේයයි ජාතකය මෙපරිද්දෙන් දතයුත්තේය.

මේහිද **නෙක්ඛම්මපාරමී** ආදි සෙසු පාරමී ධර්මයෝ ද කිසියයෙන්ම නිඛ්ඛාරණය කොට දතයුත්තාහුය.

පරමත්‍ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි තුන්වන

කොරව්‍යරාජ චරිතය නිමි.

IV. මහාසුදශීන චරිතය.

තවද මේ පරමත්‍ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි සතර වන **මහාසුදශීන චරිතය** කිසේද? යත්:—

කුසාවතිඤ්ච නගරෙ යදා ආසි මහීපති,
මහාසුදස්සනො නාම චක්කවත්තී මහබ්බලො. (25)

යම්කාලයෙක්හි මම **කුසාවතී** නම් රාජධානියෙහි මහත් සේනාබල කායබල ඇති මහාසුදශීන නම් සක්විති රජෙක් වූයෙම්ද යන්නෙහි පිළිවෙල කථාව මෙසේය:—

අතීතයෙහි වනාහි අප මහාපුරුෂයාණන්ගේ සුදශීන නම් සක්විති රජව උපන් අත් බැවින් නෙවන අත් බැවිහි ගෘහපති කුලයෙක්හි උපන්සේක. දිනක් උන්වහන්සේ තමන් කටයුත්තක් සඳහා වලට ගියසේක් දිවමන් බුදුරජාණන් වහන්සේගේ සස්නෙහි වල සෙනසුන්හි වසන්නාවූ එක් තෙරුන් වහන්සේ නමක් දැක මේහි මා පියන් සවාමීන් වහන්සේට පන්සලක් කරනේ මැනවැ"යි සිතූහ. ඉක්බිති බෝසතාණන්ගේ තමන් කටයුතු හැරපියා දැවදඬු කපා විසීමට සුදුසුවූ පන්සලක් කොට දෙර ආදිය යොදා දඬු ඇතිරියක් කොට පියා වැලි උන්වහන්සේ පන්සල පරිභොග කරත් දෝ හෝ නොකරත් දෝ හෝයි විමසන පිණිස එකත්පසෙක හුන්සේක. තෙරුන් වහන්සේද ඇතුළු ගමින් වැඩ පන්සලට පිවිස ඇතිරියෙහි වැඩහුන්හ. මාහා සත්ත්‍ව යෝද තෙරුන්වහන්සේ කරා පැමිණ "සවාමීනි! පන්සල සුව පහසුදැ"යි විචාළෝය. උන්වහන්සේ "එසේය උපාසකයෙනි, සුවපහසුය, පැවිද්දන්ට සුදුසුය"යි වදාළෝසි. සවාමීනි, ඔබ වහන්සේ එහි වැඩ වසනසේක්ද? "එසේය උපාසකයෙනි," බොහි

සත්ත්වයෝ ඉවසා වදුළ සැටියෙන්ම වාසය කරන්නේයයි දැන නිහොර මාගේ ගෘහයට පිඬු පිණිස වැඩිය මැනවයි ප්‍රාර්ථනා ගෙන තමන්ගේ ගෙයිම දන්දෙනසේක.

බොධිසත්ත්වයෝ පන්සලෙහි කලාලක් අතුට ඇදපුටු ආදිය පැනෙවිවෝය, පොකුණක් කැණුහ, සක්මන් මළුවක් සාදා එහි වැලි ඉසුරුවූහ, පිටාටුව තැබූහ, පාපුටු තැබූහ. උවදුරු දුරු කරනු පිණිස පන්සල කවු වැටකින් වටකළහ. පොකුණ හා සක්මන් මළුවද එසේම වටකළහ. ඒ වැට අසිනෙහි තල් පෙළ රොපණය කළහ. මේ ආදී වශයෙන් ආවාසය නිමිවා තෙරුන්වහන්සේට තුන් සිවුරු ආදී කොට ඇති සියලුම පිරිකර දුන්හ. එකල්හි බොධිසත්ත්වයන් වහන්සේ සිසින් තෙරුන්වහන්සේට තුන් සිවුරුද පිණ්ඩපාතයද පාත්‍රද තලිද පෙරහන්කඩද කෙණ්ඩිද පරිභොග භාණ්ඩද කුඩ වහන්සළඳද (දිය) කළද ඉදිකටුද සැරයටිද විදිනා කටුවද, කතුරද තිය සිඳිනා පිහියද යන ආදී පැවිද්දන්ට අයත් පරිභොග භාණ්ඩ යන්ගෙන් නුදුන්දෙයක් නම් නුවුවේය. බොධිසත්ත්වයෝ පසඳ ගිලය රක්‍ෂාකරන්නෝ පොහොය අටසිල් සමාදන් වන්නෝ දිවි ඇති තෙක් තෙරුන් වහන්සේට උවටැන් කළෝය.

තෙරුන්වහන්සේද එහි වාසය කරමින්ම රහත්බවට පැමිණ පිරිනිවිසේක. බොධිසත්ත්වයන් වහන්සේද ජීවිතාන්තය දක්වා කුසල් කොට දෙව්ලොව උපන්සේක. දෙව්ලොවින් චුතවූ බොධි සත්ත්වයෝ මනුෂ්‍යලෝකයෙහි කුසාවති නම් රාජධානියෙහි ඉපද මහාසුදර්ශන නම් චක්‍රවර්ති වූහ. ඒ වනාහි **"භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනෝ නාම අහොසි, ඛත්තියෝ මුද්ධාභිසිත්තෝ,** යනාදී වශයෙන් මහාසුදර්ශන සූත්‍රයෙහි දැක්වේමය.

ඒ රජහට වනාහි කුසාවතී රාජධානිය ප්‍රමුඛකොට ඇති අසූසාරදහසක් නගරයෝ වූහ. ධර්ම ප්‍රාසාදය ප්‍රමුඛකොට ඇති අසූ සාරදහසක් ප්‍රාසාදයෝ ඇතිවූහ. මහාබ්‍යූහ කූටාගාරය ප්‍රමුඛ කොට ඇති අසූසාරදහසක් කූටාගාරයෝ වූහ. ඒ සියල්ලම පූර්වයෙහි තෙරුන්වහන්සේ උදෙසා කරනලද එකම දන්සලෙහි ආනිසංසය හේතුකොට පහළවූහ. එසේම උන්වහන්සේට දෙන ලද ඇඳපුටුවල ආනිසංසය කරණකොට පඤ්චසත අසූසාර දහ සක්ද, ඇතුන් අසූසාරදහසක්ද අශ්‍රන් අසූසාරදහසක්ද, ඕස් අසූසාර දහසක්ද, පහළවූහ. උන්වහන්සේට දෙනලද ප්‍රදීපයන යෙහි ආනිසංසය හේතුකොට මණි. අසූසාර දහසක්ද, පොකුණේ අනුසසින් අසූසාරදහසක් පොකුණුද, පාත්‍රථාලකාදී පරි

නොගැඹී ප්‍රව්‍රජිත පරිෂ්කාර දානයාගේ ආනිසංස හෙතුකොට අසූසාරදහසක් සත්‍රීහුද, අසූසාරදහසක් පුත්‍රයෝද, අසූසාර දහසක් ගෘහපතිනුද, පහළවූහ. පස්ගෝරස දානයාගේ ආනිසංසය හෙතුකොටගෙන අසූසාරදහසක් දෙන්නුද, හැදීමට පෙර ඉඳීමට සුදුසු දේ දුන් ආනිසංසය හෙතුකොට වසත්‍ර කෙළදහසක්ද, නොජින දානයාගේ ආනිසංසය හෙතුකොටගෙන බත් සැළි අසූසාර දහසක්ද පහළවූහ. උන්වහන්සේ සප්තවිධ රත්න යෙන් හා සතර සාඩියෙන්ද යුක්තවූ රාජාධිරාජව සියලු සාගරය කෙළවරකොට දැනි සියලු පෘථිවිමණ්ඩලය දශරාජ ධර්මයෙන් අනිච්ජය කොටගෙන වාසය කරනසේක් නොයෙක් සියගණන් තන්හි දාන ශාලාවන් කරවා මහදන් පිහිටුවූහ. "යමෙක් ආහාරාදී දෙයධර්මයන් අතුරෙන් යම්ක් කැමැත්තේ නම් හේ දන් සැලට පැමිණ ගන්නේ යහපතැ"යි දවස පුන්වරක් හුවර බෙර හැසිරවූහ. එහෙයින් කියනලදී.

තත්‍රාහං දිවසෙ නික්ඛන්තං ඝොසාපෙමි තහිං තහිං
කො කිං ඉච්ඡති පත්ථෙති කස්ස කිං දියතු ධනං (29)

මේසෙයින් බෝසතුන්ගේ දානපාරමිතාව වනාහි දෙය ධර්ම ප්‍රතිග්‍රාහකයන්ගේ විකල්පයක් නැත්තේයයි දාන පාරමිතාවගේ සවරූප නිරූපනයකොට දැන් දාන ඝොෂණයෙන් ඒ ඒ දාන වස්තුවට අනුරූප පුද්ගලයන්ගේ පරිකීර්තනය දක්වනු පිණිස

කො ඡාතකෙ කො තසිතෙ කො මාලං කො විලෙපනං
නානා රතනානි වත්ථානි කො නගෙහා පරිදහිස්සති (3)

කො පථෙ ජන්තමාදෙති කොපාහණා මුදුසුභා,
ඉති ඝාසං ච පානෙ ච ඝොසාපෙමි තහිං තහිං (31) යි

වදළහ. මේසේවූ මේ දානය වනාහි එකතැනත දෙතැනක කොව නොයෙක් සියගණන් තන්හි පවත්වන ලද්දේ විය.

එහෙයින් වදරනලදී:—

න තං දසසු ඨානෙසු නපි ඨානසතෙසුපි,
අනෙකසතඨානෙසු පවියන්තං යාචකෙ ධනං (32)

කුසාවතී නුවර වනාහි දිගින් දෙළොස් යොදුන් හා පුළුලින් සත් යොදුනක් පමණ විය. මනහර සත් පවුරකින් පරික්ෂිප්ත විය. දසසාර දහසක් පොකුණෙන් හෙබියේය. එක එක පොකුණුතෙර වෙන් වෙන් වූයෙන් මහ දන් පිළියෙළ කරන ලද්දේද විය. වදරන ලද්දේමය, භාග්‍යවතුන් වහන්සේ විසින්:-

පඨමෙපි බෝ ආනන්ද රාජා මහාසුදස්සනෝ තාසං පොක්ඛරණීනං නිච්චෙ ඒව රූපං දානං අනන්තං අනන්තසේඛස්ස පානං පානසේඛස්ස, වත්ථං වත්ථසේඛස්ස, යානං යානසේඛස්ස, සයනං සයනසේඛස්ස, ඉත්ථි ඉත්ථිසේඛස්ස, හිරඤ්ඤං හිරඤ්ඤසේඛස්ස, සුවණ්ණං සුවණ්ණසේඛස්ස''ති. මහ බෝසතාණෝ දන් දුන් අයුරු කියේයයන්? සත්‍රීන්ටද පුරුෂයන්ටද සුදුසු අලංකාර කරවා එහි පරිවාරක වශයෙන් සත්‍රී මාත්‍රයන්ද අවශේෂ සියල්ලම් පරිත්‍යාග වශයෙන්ද තබා දෙනසේක, ඒ යම් කැමති පරිද්දෙන්ම අනුභව කරවයි කියා බෙර හැසිරවූසේක. මහා ජනයෝ පොකුණු ඉවුරට පැමිණ ස්නානය කොට වස්ත්‍රාදිය හැඳ මහත් සම්පත් අනුභව කොට එබඳු සම්පත් ඇත්තෝ ඒ සම්පත් හැර පියා ද එබඳු සම්පත් නැත්තෝ හැරගෙනද යෙති. ඇතැම් කෙනෙක් හස්තියානාදියෙන් කැමති පරිද්දෙන් ගමන් කොටද උතුම් සයනයන්හි සැතපී සම්පත් අනුභව කොටද, මාගමුන් හා සම්පත් අනුභව කොටද, සත්රුවන් ආහරණ පැළඳ සම්පත් අනුභව කොටද, යම් යම් දෙයින් ප්‍රයෝජන ඇත්තාහු. ඒ ඒ දේද හැරගෙනද යෙති. ප්‍රයෝජන නැත්තාහු හැරද යෙත්. ඒ දානයද දවසක් දවසක් වර්ධනය කොට කොට දෙන්නේමය, එකල්හි දඹදිව් වැස්සන්ට දාන පරිභොගයද සම්පත් අනුභවයද හැර අනික් කටයුත්තක් නම් නුවූයේය. ඒ දානයාගේ මෙතෙකැයි කාල පරිච්ඡේදයක්ද නුවූයේය. රාත්‍රිද දහවල්ද යම් යම් විටක යාචක ජනයා එන්නාහුද ඒ ඒ විටම දෙන්නේය. මහා පුරුෂයාණෝ මෙපරිද්දෙන් දිවි ඇතිතෙක් සියලු දඹදිව තහුල් උඩබැද මහදන් පැවැත්වූහ. එහෙයින් වදාළහ.

දිවා වා යදි වා රත්තිං යදි එති වණ්ණබ්බකෙ,
ලද්ධා යදිච්ඡකං දානං පූරහත්ථොව ගච්ඡති. (33)

එවරූපං මහාදානං අදාසිං යාවජීවිකං,
නපාහං දෙස්සං ඛනං දම්මි නපි නත්ථි නිවත්තථ මයි. (34)

මෙසේ තමන්වහන්සේ මහදන් පැවැත්වීමෙහි අදහස ප්‍රකාශකොට වදාරා දුන් ඒ දානය උපමාවකින් විභාවනය කරන්ට:—

යථාපි ආතුරෙ නාම රොගත්තෙ පරිමුත්තියා,
ඛත්තෙන වෙජ්ජං තප්පෙත්වා රොගත්තෙ පරිමුච්චති. (35)

තථෙවාහං ජානමානො පරිපූරෙතු මසෙසතො,
ඌනමනං පූරයතුං දෙම දානං වණ්ණබ්බකෙ,
නිරාලයෙ අපච්චාසෙ සම්බොධිමනුපත්තියා. (36)

යනු විදුළහ. යම්සේ ලෙඩින් පෙළෙන්නාවූ පුරුෂයෙක් රත් අමුරන් දාදිය දීමෙන් වෙදකෙනකු සතුටු කොට පිළිවෙතට අනුව පවතිමින් ඒ රොගයෙන් මිදේද, එපරිදෙන් මමින් අඛවූ සියලු ලෝවැස්සා කෙලෙස් නමැති ලෙඩින්ද, සියලු සසර දුක් නැමැති ලෙඩින්ද, මුදනු කැමැත්තෙමි ඒ පිණිස මේ සියලුම සමපත් පරිත්‍යාග සඞ්ඛ්‍යාත දාන පාරමිතාව උතුම් උපායකැයි දන්නෙමි නිරවශේෂයෙන් සත්වයන්ගේ අධ්‍යාශය සම්පූර්ණකරනු පිණිසද යාචකයන්ට මහ දන් දුනිමි. ඒ ද වනාහි දාන ධර්මයෙහි හා තද්වි පාකයෙහිද නිරපෙක්ෂව සිටියම් ලෞකික සමපත්තියක් ප්‍රාර්ථනා නො කරන්නෙමි හුදෙක් සම්‍යක්සම්බොධියට පැමිණීම පිණිසම දුනිමි.

මේසේ මහබෝසතාණෝ මහදන් පවත්වන්නාහු තමන්ගේ කුසලානුභාවයෙන් පහළවූ ධර්ම ප්‍රාසාදයට නැගී මහාබ්‍යූහ කූටාගාරවාරයෙහිදිමි කාමවිතර්කාදිය වලකා එහි සවණ්ඩිමය රාජ පය්‍යඞ්කයෙහි හුන්සේක් **ධ්‍යාන අභිඥාවන්** උපදවා එයින් නික්ම සවණ්ඩිමය කූටාගාරයට ප්‍රවිෂ්ටව එහි රිදීමය පය්‍යඞ්කයෙහි හුන්සේක් සතර බ්‍රහ්ම විහරණය වඩා අසූසාරදහසක් අවුරුදු ධ්‍යාන සමාපත්තියෙන් කල්යවා කාලක්‍රියා කරන සමයෙහි දශීනය පිණිස පැමිණි **සුභද්දා දේවි** ප්‍රමුඛකොට ඇති අසූසාර දහසක් අන්තඃපුර වාසින්ටද අමාත්‍ය පිරිස ආදීන්ට ද,

81. "අනිච්චා වත සංඛාරා උපපාදවයධම්මිනො,
උපජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමෝ සුඛෝ"

යන මේ ගථාවෙන් බණ කියා ආයු කෙළවර බ්‍රහ්මලොක පරායණ වූසේක.

එකල්හි සුභද්දා ආදිවූ දැන් **රාහුලමාතාදේවිය,** පරිනායක රත්නය නම් **රාහුල සථවිරයෝය,** සෙසු පිරිස්වූකලී **බුදුපිරිස** මය, මහාසුදස්සන නම් සක්විනිරජාණෝ **ලොකසාමී බුදුරජාණන් වහන්සේය.** මේ ජාතකයෙහිද දස පාරමිතා සවරූපයෙන්ම ලැබෙන් ම ය. එහෙත් දානධ්‍යාශයාගේ උදාරතාව හෙතුකොට ගෙන දානපාරමිතාවම ආර්ය්‍යෙහි ආයේය්‍ය, අවශෙෂ පාරමී ධර්මයෝද යටිකියාකලද කුම්යෙන් මිය දානයුත්තාහ.

ඒ එසේමය. මහාසත්වයන්ගේ සිව්සූනූ සතර මහත් දිවසිනට ඉසුරුව සිටද මහත් හොගසැප අත්හැරපියා කාමවිතර්කාදිය විස්කම්භනයෙකොට එකල්හි මහා දානයක් පවත්වමින්

අසූඅටුවාරදහසක් භවුරුදු සම්පත්තියෙන් කල් යවා අනිත්‍ය තාදි ප්‍රතිසංයුක්ත ධර්ම කථාවක් කොට විදර්ශිතාවෙහි නිරූත්සාහ යද සියලු තන්හි කොඇලීමට යාමදැයි මේ ආදී ගුණානුභාවයෝ නිර්ධාරණය කටයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි සිවුවන මහාසුදර්ශන චරිතය නිමි.

V මහාගොවින්ද චරිතය.

තවද මේ පරමාර්ථ දීපනී නම්වූ චරියාපිටක අට්ඨකථාවෙහි පස්වන **මහාගොවින්ද චරිතය** කිසේද? යත්:-

පුනාපරං යදා හොමි සත්තරාජපුරෝහිතෝ,
පූජිතෝ නරදෙවෙහි මහාගොවින්දබ්‍රාහ්මණෝ. (37)

නැවත අනිකුදු චරිතයක් කියමි. හෙද අසව. යම් කලෙක්හි මම සත් රජකෙනකුන්ගේ සම් කෘත්‍යානුශාසක පුරෝහිතවූ දඹදිව සියලු රජුන් විසින් පුදන ලද්දාවූ මහාගොවින්ද නම් බ්‍රාහ්මණ යෙක් වීම්ද මේ එහි පිළිවෙළ කථාවයි.

යටගිය දවස රජගහ නුවර ගොවින්ද නම් පුරෝහිත බ්‍රාහ්මණ කෙනෙක් වූහ. උන්ට දව අප මහ බෝසතාණෝ මනුලොව ඉපද වැළසේක. උන්වහන්සේට නම් තබන්නාවූ දවස් **ජෝති පාල** යයි නම් කළාහුය. ඊට කරුණු කිමයත්? උන්වහන්සේ ලොව පහළවූ දිනයෙහි සියලු ආයුධයෝ දිලිහි ගියහ. එදවස් රජ්ජුරුවෝ අලුයම් වේලෙහි තමන්ගේ මහුල් කඩුව දිලිහී ගිය බව දැක මහත් බියට පැමිණියෝය. රජ්ජුරුවෝ තමහට උපස්ථාන කරනු සඳහා පැමිණි තමාගේ පෙරෙව් බමුණුවූ, බොධිසත්ත්ව යන්වහන්සේගේ පියාණන් අතින් මහුල් කඩුව දිලිහීමට කරුණු විවාලෝ. එබසට බ්‍රාහ්මණයෝ උත්තර දෙන්නාහු "මහ රජ්ජුරුවෙනි, නහමක් බියවනු මැනව, මට පුතණු කෙනෙක් උපන්හ. උන්ගේ ආනුභාවයෙන් හුදෙක් රජගෙයි පමණක්නොවූ මුළු නුවරෙහිම ආයුධයෝ දිලිසුණාහ, උක්ත කරණකොට ගෙන නුබවහන්සේට අන්තරායයෙක් නැත. මුළු දඹදිව ප්‍රඥාවෙන් උන්හා සමාන කෙනෙක් නොවන්නාහ, මේ වනාහි ඊට පූර්ව නිමිත්තයයි ප්‍රකාශ කොට රජ්ජුරුවන් අස්වැසූහ. රජ්ජුරුවෝ සතුටුසිත් ඇත්තාහුකුමාරයන්ට කිරිමිල වේවායි දහසක්

වැඩිවිය පැමිණිකල මට දක්වුව මැනව යි කීහ. බොධිසත්ත්වයන් වහන්සේ වැඩිවියට පැමිණ සුදුසු නුවණ ඇත්තෝ රජදරුවන් සත්දෙනාගේ සර්කාර්‍ය්‍ය අනුශාසකවද, යළි ප්‍රව්‍රජිතවද, උභය ලොකාර්ථයෙන් සත්ත්වයන් පාලනය කළසේක. මේසේ දිළිහිගිය බැවින්ද පාලනයට සමර්ථ බැවින්ද ජෝතිපාල යයි නම් කළාහුය.

මේසේ අප බොධිසත්ත්වයෝ දිසම්පති නම් රජහුගේ පුරොහිත බ්‍රාහ්මණවූ ගොවින්ද බ්‍රාහ්මණයාගේ පුත්‍රවෑ තමන්ගේ (පියාද) ඒ රජ්ජුරුවන් ඇවැමෙන් උන්ගේ පුත්‍රවූ අරණු නම් රජද ඒ රෙණු කුමරුන්ගේ යහළුවූ සහජාතුය, බ්‍රහ්මදත්තය, මේසුජාතුය, හරිතය, ඛිතරට්ඨ රජමරු දෙදෙනය, යන සත් රජදරුවෝ යම්සේ ඔවුනොවුන් විවාද නොකෙරෙද්ද, එපරිද්දෙන් රාජ්‍යයෙහි පිහිටුවා ඔවුන්ට අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනය කරනසේක් දඹදිව් තලයෙහි සියලු රජදරුවන් විසින්ද සෙසු බමුණන් විසින්ද දෙවතාගයන් විසින්ද, මනුෂ්‍යයන් විසින්ද, ගෘහපතිකයන් විසින්ද සත්කාර ගරුකාර මානන පූජා කරන ලද්දහු උතුම් ගෞරවස්ථානයට පැමිණියේක. අථ ධර්මයන්හි කුසලතාව හෙතුකොට ගෙන ඔවුන්ට මහාගොවින්ද යන නාමය ඇතිවූයේය. කියන ලද්දේමය: "ගොවින්දෝ වතගෝ බ්‍රාහ්මණෝ මහාගොවින්දෝ වතගෝ බ්‍රාහ්මණෝ"යි.

"පුකාපරං යදා හොති සත්තරාජපුරොහිතෝ,
පූජිතෝ තරදෙවෙහි මහාගොවින්දබ්‍රාහ්මණෝ"
යන පළමු ගාථාව එහෙයින්ම වදරන ලදී.

ඉක්බිති බොධිසත්ත්වයන් වහන්සේට ප්‍රඥානුභාවයෙන් ඔස වතලද රජවරුය, ඔවුන්ගේ අයකැමි අමාත්‍යය, ක්ෂත්‍රියය, බ්‍රාහ්මණය, ගෘහපතිකය, ගම් නියම්ගම් දනවු වැසිය යන මොවුන් විසින් මතු මත්තෙහි ඵලවත ලද්දාවූ භාත්පසින් මහොඝයක්සේ වතුරු වළින් අප්‍රමේය මහත් ලාභ සත්කාර උපත. යම්සේ අප්‍රමාණ ජාතිවල රැස්කරන ලද මහත් කුශල සමූහ ඇත්තාහට, උසස් කුලයෙහි උපන්නාහට, පිරිසිදු ශීලාචාර ගුණයෙන් හා ප්‍රියශීලිගුණයෙන් යුක්තවූවාහට, පරියොදාත සියලු ශිල්ප ඇත්තාහට, සියලු සත්ත්වයන් කෙරෙහි පුත්‍ර සදෘශ කරුණාවෙන් විෂ්ඵුරිතවූ ස්නිග්ධ මෘදු හෘදය ඇත්තාහට උදුරවූ ලාභ සත්කාර උපදීද, එසේම උපත. බොධිසත්ත්වයෝ "දැන් වතාහි මට මහත් ලාභ සත්කාර උපත. මම වතාහි එසින් සියලු සත්ත්වයන් සන්තර්පණය කොට දැතපාරමිතාව පුරන්නෙමි නම් යෙහෙකැ"යි සිතූහ. මෙසේ සිතා නුවර

මෑදද නුවර සතර දෙරටුවෙහිද තමන් වහසල් දෙරටුවෙහිදැයි මෙසේ දානශාලා සයක් කරවා දවසක් පාසා අප්‍රමාණ ධන පරිත්‍යාගයෙන් මහදන් පැවැත්තුසේක. හුන්තැනට යවන පඹුරු ආදිකොට ඇති යමක් යමක් එළවනු ලැබේද, තමන්ගේ ප්‍රයොජනය පිණිස යමක් රැස්කරනු ලැබේද ඒ සියල්ලම දන් සැලවලට ඇවිටිවාහුය.

මෙපරිද්දෙන් දවස දවස මහා පරිත්‍යාග කරන්නාවූ බොධි සත්ත්වයන් වහන්සේගේ හිතට තෘප්තියක් හෝ සන්තොෂයක් නුවූයේය. හැකිලීමක් නම් කොයින්ද? දන්සැල ලාභසාවෙන් එන්න වුන්ගෙන්ද, දන වසතු ගෙනයන්න වුන්ගෙන්ද, මහ බෝසතාණන්ගේ විශෙෂගුණ කීර්තනය කරන මහාජනයාගෙන්ද ඇතුළු නුවර හා පිටනුවරද හාත්පස එක මහ ගංවතුරක් මෙන්ද, කල්පාරම්භ මහසුලභ ගැටිමෙන් පරිභ්‍රමණයවූ මහාසමුද්‍රය මෙන් මහත් කොලාහල එකනිත්නාද වූයේය.
එහෙයින් කියනලදි:-

තදුහං සත්තරත්තේසු යං මෙ ආසි උපායනං,
තෙන දෙමි මහාදානං අකෙඛාභිං සාගරූපමං (38)

නමෙ දෙය්‍යං ධනං ධඤ්ඤං නපි නාරී නිවෙසනා මයි
සබ්බඤ්ඤුතං පියං මය්‍හං තස්මා දෙමි වරං ධනං. (39)

මෙපරිද්දෙන් මහා බොධිසත්ත්වයෝ ප්‍රථම කල්පික මහා ෂෙයක් මෙන් විහාගයක් නැතිව මහදන් වැසි වස්වමින් දන් දීමෙහි යෙදී ද සත් රජදරුවන්ට අවි ධම්යෙන් අප්‍රමාදව අනුශාසනය කරනසේක. සත්මහ බමුණු මහසල්කුලයන් විද්‍යාශිල්ප යෙහි හික්මවනසේක. (ජලසනානය නිසා ලබන ලද තම් ඇති) නහානක සත්සියයක් බමුණන්ට වෙද මන්ත්‍ර හදරවනසේක. මහා බොධිසත්ත්වයන් වහන්සේට මෑතකාලයෙහි මෙබඳුකල්‍යාණකීර්ති ශබ්දයක් පැතනැංගේය. කෙසේදයත් "අහිසිඤ්චි මහා ගොවින්දෙ බ්‍රාහ්මණෙ බ්‍රාහ්මානං පස්සති තෙන සද්ධිං සල්ලපති සාකච්ඡං සමාපජ්ජති" කියායි. මහා බොධිසත්ත්වයෝ මෙසේ සිතූහ. දැන් වතාහි මට නැත්තාවූ කිත්නිඝොෂයක් පැතනැංගේය. "බ්‍රාහ්මානං පස්සති තෙන සද්ධිං සල්ලපති සාකච්ඡං සමාපජ්ජති" යි මම වතාහි මෙය ඇත්තාවූ කල්‍යාණ කීර්ති ශබ්දයක් කරන්නෙමිනම් යෙහෙකැ'යි. ඉක්බිති බොධිසත්ත්වයෝ සත් රජ දරුවන්ද සත් බමුණු මහසල්කුලයන්ද සත්සියයක් මාණවකයන්ද තම් අඹුදරුවන්ද විචාරා "බ්‍රාහ්මානං පස්සෙයාථ"යි

සිත පිහිටුවා වැසි සාරමස බ්‍රහ්මවිහාර භාවනාවෙහි යෙදුනසේක. උන්වහන්සේගේ සිත පිළිබඳ සියලු අදහස තමන් සිතින් දැන සනත්කුමාර බ්‍රහ්මයාණෝ ඔබ ඉදිරියෙහි පහළවූහ. මහාබ්‍රහ්ම රාජයාණන් දැක මහාපුරුෂයාණෝ මෙසේ විචාළාහ.

82. වණ්ණවා යසවා සිරිමා කොනු සුවිමසි මාරිස,
අජානතෝනතං පුච්ඡාම කථං ජානෙමු තං මයං.

නිදුකාණනි, ඉතාපත් ශරීර ශොභාවෙන් හා යසසින් යුක්තවූ ශ්‍රීමත්වූ ඔබ වනාහි කවරෙක් වෙහිද? ඒ කොදන්කාවූ අපි ඔබ විචාරමු. අපි ඔබ කෙසේ දැනගනිමුද? මෙසේ ඇසූ කල්හි ගොවිඳු බමුණුහට සනත්කුමාර බ්‍රහ්මයාණෝ තමා අදුන්වන්නෝ:—

83. මං වෙ කුමාරං ජානන්ති බ්‍රහ්මලොකෙ සනන්නතො,
සබ්බෙ ජානන්ති මං දෙවා එවං ගොවිඳ ජානාහි.

බඹ ලොව සනත්කුමාර යයි මා එකාන්තයෙන්ම දනිත්. සියලු දෙවියෝ සනත්කුමාර බ්‍රහ්මයයි මා මෙසේ දැනගනිති. ගොවිඳ පණ්ඩිතයාණනි, මෙසේ දැනගනු මැනව යි කිහ. ඉක්බිති බොධිසත්වයෝ,

84. ආසනං උදකං පජ්ජං මධුපාකඤ්ච බ්‍රහ්මන,
අඤ්ඤ භවන්තං පුච්ඡාම අඤ්ඤං කුරුතු නො භවං.

ආසන ද ජලය ද පාදයට හිතවූ තෙල් ද මධු පාකයද (දිය වත්කොට පිසූ පලාද) යන මේ සියල්ල බ්‍රහ්මයාගේ ඉදිරියෙහි තබා පින්වතාණෙනි අපගේ මේ ආගන්තුක සත්කාරය පිළිගන්නාසේක්– වයි කිහ. එළවතලද අවිති සංග්‍රහයෙන් ප්‍රයොජන නැත්තේද සනත් කුමාර බ්‍රහ්මයාණෝ උන්වහන්සේගේ සිත වෙසෙසින් සතුටුකරනු පිණිස හා විශ්වාස කරනු පිණිසත් ඉවසමින් "පටිග්ගණ්හාමි තුවං අඤ්ඤං, යං ත්වං ගොවිඳ භාසසි"යි.

(ගොවිඳ පණ්ඩිතයෙනි, නුඹවහන්සේ අපට යම්ක් පිළිගණිවායයි කියන්නාහුද, ඒ නුඹවහන්සේගේ අවිතිසංග්‍රහය පිළිගණිමුයි කියා) අවකාශ දෙනු පිණිස:—

85. දිට්ඨධම්මිකත්ථාය සම්පරාය සුඛාය ච,
කතාවකාසො පුච්ඡතු යංකිඤ්චි අභිපත්ථිතං, සිරිමා භික්ඛ.

මෙලෝ පරලෝ හිත සැප පිණිස පවත්නාවූ යම් කිසිවක් පතන ලදද, පින්වතුන් වහන්සේ කරතලද අවකාශ ඇත්තාහුය. එහෙයින් ඒ කාරණය විචාරනු මැනවැයි.

ඉක්බිති මහාපුරුෂයාණෝ පරලොව වැඩම විචාරනසේක්:-

86. පුච්ඡාමි බ්‍රහ්මානං සනංකුමාරං
කංඛී අකංඛී පරවෙදියෙසු,
කත්ථ ටඨිතෝ නිම්මිව සික්ඛමානෝ
පපෙපාති මච්චෝ අමතං බ්‍රහ්මලොකං,සි හිහ.

මම වනාහි සැක ඇත්තෙම්වෙමි, පරවෙදී ප්‍රශ්න විෂයෙහි සැක නැත්තාවූ සනත්කුමාර බ්‍රහ්මයා විචාරමි. "කවර ප්‍රතිපදාවෙක්හි සිටියාවූ, කවරතම් ධර්මයෙක්හි හික්මෙන්නාවූ මනුෂ්‍යතෙම උතුම් බඹලොවට පැමිණේද කියා"සි, බ්‍රහ්මයාණෝ උන්වහන්සේට ප්‍රකාශ කරන්නාහු:-

87. "හිත්වා මමත්තානං මනුජෙසු බ්‍රහ්මේ
නිරාමගන්ධෝ විරතෝ මෙථුනස්මා,
එත්ථට්ඨිතෝ එත්ථ සික්ඛමානෝ
පපෙපාති මච්චෝ අමතං බ්‍රහ්මලොකං"සි, හිහ.

ශ්‍රේෂ්ඨවූ බොධිසත්ත්වයෙනි, "මනුෂ්‍යයන් විෂයෙහි යම්කිසි වෙක් මමත්වය හෙවත් තෘෂ්ණාව හැර ගුදකලා වූයේ කරුණාධ්‍යාත්ත උපදවා හෙවත් උපදවනලද ධ්‍යාන ඇත්තේ කෙලෙස සංඛ්‍යාත මිස ගඬ නැත්තේ මෛථුන ධර්මයෙන් වැළැක්කේවේද, ඒ මනුෂ්‍ය තෙම මේ ධර්මයන් කෙරෙහි සිටියේ, මේ ධර්මයන්හි හික්මෙන්නේ උතුම් බ්‍රහ්ම ලොකයට පැමිණේ" යයි මෙලෙස බ්‍රහ්ම ලොකගාමී මාගීය කිහ.

ඉක්බිති මහාපුරුෂයෝ බ්‍රහ්මරාජයාගේ වචනය අසා ආමගන්ධියන් පිළිකුල් කරන්නෝ "මම දැන්ම ම පැළිදිවන්නෙමි"සි කිහ. බ්‍රහ්මයෝද මහා පුරුෂයාණනි, පැළිදිවූව මැනව, පැළිදිවන කල්හි ඔබ සමීපයට මාගේ ඊම සඟාගමනයක්ම (යහපත් ඊමක්) වන්නේය. පුතණුවෙනි, "ඔබ මේ මුළු දඹදිව අග්‍ර පුරුෂයාණෝය, ප්‍රථම වියෙහි පිහිටියෙහිය, මෙසේ මහත් සම්පත් මහත් ඉසුරු හැරපියා පැවිදිවීම වනාහි ගඬ හස්තියකු බැඳුම්සිඳ වනයට යාමෙන් අතිශයින් මහත් වන්නේය. මේ වනාහි බුදුවරයන්ගේ ප්‍රවෙණිය"සි කියා මහබෝසතුන්ගේ සිත දැඩි කොට බඹලොව

ගියහ. බෝධිසත්ත්වයෝ "මට මෙයින්ම නික්ම පැවිදිවීම යුතු නොවන්නේය. මම රජ කුලයන් අග්‍රයෙන් ධර්මයෙන් අනුශාසනය කරමි. එහෙයින් ඔවුන්ට දන්වා ඔවුහුත් පැවිදිවන්නාහු නම් යහපත්මය. ඉදින් ඔවුහු පැවිදි නොවන්නහු නම් පෙරෙවි තතුරු පාවාදී පැවිදි වන්නෙමි"යි සිතා පළමුකොට රේණු රජහට දන්වූහ. උන්වහන්සේ බොහෝ සෙයින් කාම සැපයෙන් නිමන්ත්‍රණය කරනු ලබන්නේද තමාගේ සංවේගයට හේතුව සහ එකාන්තයෙන් පැවිදිවනු කැමති බවත් දන්වූහ. රජ්ජුරුවෝ "එසේනම් මමත් පැවිදි වන්නෙමි" යි කී කල්හි බෝධිසත්ත්වයෝ "යහපතැ"යි පිළිගත්හ. මේ නියාඑයෙන් සත්තාහු ආදිකොට ඇති සත් රජ දරුවන්ද, සත් බමුණු මහසල් කුලයන්ද සත්සියයක් තහාතක බමුණන්ද, බිරින්දද විවාරා සත්දවසක් පමණ ඔවුන්ගේ චිත්තානුරක්ෂණය පිණිස වැසපියා මහබිනික්මන් හා සමාන අබිනික්මන් කොට පැවිදිවූහ. සත්රජදරුවන් ආදිකොට ඇති සියල්ලෝම උන්වහන්සේ අනුව පැවිදිවූහ. ඕ මහත් පිරිසක්වූවා. නොයෙක් යොදුන් පතළාවූ පිරිස විසින් පිරිවරන ලද්දාවූ මහා පුරුෂයාණෝ දහම් දෙසමින් හම් නියම්ගම් දනවු රාජධානිවල චාරිකාවෙහි හැසිරෙති. මහජනයා කුශලයෙහි පිහිටුවති. ගිය ගිය තැන බුඩ කොලාහලයක් මෙන් වෙයි. මනුෂ්‍යයෝ "ගොවිඳු පණ්ඩිතයෝ එන්නාහ"යි අසා පළමුකොටම මණ්ඩපයක් කරවා නොයෙක් ලෙසින් සදනලද එම මණ්ඩපයෙහි උන්වහන්සේ වඩා හිඳුවා නොයෙක් අග්‍රරස භොජනයෙන් පුදත්. මහත් ලාභසත්කාර මහා මෙඝයක් මෙන් වතුරුවම්න් උපන.

මහා පුරුෂයෝ මහාජනයා ශීලයෙහි පිහිටුවූහ. ශීල සම්පදාවෙන් ඉන්ද්‍රිය සංවරයෙහිද, භොජනයෙහි පමණ දැනීමෙහිද, ජාගරියානුයොගයෙහිද, කිසුණු පිරියම්හිද, අභිඥාවන්හිද, අෂ්ට සමාපත්තියෙහිද, බ්‍රහ්ම විහරණයෙහිද පිහිටුවූසේක. බුඩොත්පාද කාලයක්මෙන් වූයේය. බෝධිසත්ත්වයාණෝ ආයු ඇතිතාක් පාරමිතා පුරමින් සමාපත්ති සැපයෙන් කල් යවනසේක් ආයු කෙළවර බඹලොව උපන්හ.

උන්වහන්සේගේ ඒ බ්‍රහ්මවර්‍යා සඞ්ඛ්‍යාත ශාසනය සමෘඩ්ධ වූයේය, ස්ඵීත වූයේය. පැතුරුණේය, විස්තාරයට ගියේය. බොහෝදෙන විසින් දන්නා ලද්දේ පෘථුලවිය, (මහත් වූයේය. දෙවිමිනිසුන් අතර මනාකොට ප්‍රකාශ වූයේය, ඉතා දීඝ කාලයක් පැවතුනේය, යම් කෙනෙක් උන්වහන්සේගේ අනුශාසනය සියල්ලෙන් සියල්ල දැනගත්තාහුද, ඔවුහු කය බිඳීමෙන් මරණින්

මතු සුගති සඞ්ඛ්‍යාත බ්‍රහ්මලොකයෙහි උපත්තාහුය. යම් කෙනෙක් සියල්ලෙන් සියල්ල දැන නො ගත්තාහුද හෙවත් සවලා වශයෙන් දැනගත්තාහුද, ඔවුන් අතුරෙන් ඇතැම් කෙනෙක් කය බිඳීමෙන් මරණින් මතු පරනිර්මිත වශවත්ති දෙවියන්ගේ සහභාවයට ගියාහුය. ඇතැම් කෙනෙක් නිම්මාණරති - පෙ - තුෂිත - පෙ - යාම - පෙ - තාවතිංස - පෙ - චාතුම්මහාරාජික දෙවියන්ගේ සහභාවයට ගියාහුය. යම් කෙනෙක් සියල්ලෙන්ම නිතවුවාහුද (ඉතාම සවලාවක් දැනගත්තාහුද) ඔව්හු ගඤ්ඡිකය පිරෙව්වාහුය. මෙසේ බොහෝ සෙයින්ම මහජනයෝ බ්‍රහ්ම ලොකයෙහි හා සවඟී ලොකයෙහි උපත්හ. එහෙයින් දිව්‍ය බ්‍රහ්ම ලොකයෝ දෙවියන්ගෙන් පිරුණාහුය. සතර අපායයෝ ශූන්‍ය වුවාක් මෙන් වුහ.

මෙහිද අකිත්ති ජාතකයෙහි මෙන් බොධිසම්භාර නිදාරණය දතයුත්තාහුය. එකල්හි සත් රජදරුවෝ මහතෙරවරු වුහ. සෙසු පිරිස බුඩ පිරිසමය, ගොවිඳ පණ්ඩිතයාණෝ ලොකසවාමි බුදුරජාණන් වහන්සේය.

තවද එසේම රේණු ආදි සත් රජවරු ඔවුනොවුන් අවිරුඩ කොට සවකීය රාජ්‍යයන්හි පිහිටුවාලීමද, එසේම මහත්වූ සත් රජයෙහි උන්ට අසී ධම්මානුශාසනය කිරීමෙහි අප්‍රමාදයද. බ්‍රහ්ම රාජයා සමග සාකච්ඡාවට පැමිණෙයයි පැවති සම්භාවනය වුපරිද්දෙන් කිරීමට සාරමසෙක්හි අති උත්කෘෂ්ට භාවයට පැමිණවූ බ්‍රහ්මවරිය වාසයද, ඒ කරණකොට ගෙන බ්‍රහ්මයා තමා සමග සාකච්ඡාවට පැමිණීමද, බ්‍රහ්මරාජයාගේ අවවාද ගෙහි පිහිටා සත්රජදරුවන් ආදිකොට සියලු ලොකයා විසින් පමුණුවනලද ලාභසත්කාරය කෙල පිඩක්මෙන් හැරපියා අප්‍රමාණ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ පිරිසගේ අනුප්‍රව්‍රජ්‍යාවට නිමිත්තනවූ ප්‍රව්‍රජ්‍යාවට පැමිණීමද, බුදුවරයන් වහන්සේලාගේ ශාසනය මෙන් තමන් වහන්සේගේ ශාසනය බොහෝකල් පැවතීමද, යනාදි ගුණානුභාවයෝ විභාවනය කටයුත්තාහ.

පරමාර්ථ දීපනී නම් චරියාපිටක අට්ඨාවෙහි පස්වන
මහාගොවින්ද චරිතය නිමි.

VI නිමිරාජ චරිතය.

තවද මේ චර්යාපිටක අටුවාවෙහි සඳහන නිමිරාජ චරිතය කියේයි යත්:

පුනාපරං යදා හොමි මිථිලායං පුරුත්තමේ,
නිමී නාම මහාරාජා පණ්ඩිතෝ කුසලේඵකෝ. (40)

තැවත ද අනික් චරිතයක් කියන්නෙමි. හෙද අසව. යම් කලෙක්හි මිථිලා නුවර නුවණැත්තාවූ තමන්ගේ හා අනුන්ගේද කුසලාර්ථවූ නිමි නම් මහරජෙක් විමිද මේ එහි පිළිවෙළ කථාවයි

යටගිය දවස විදෙහරට මියුලු නුවර අප මහබෝසතාණෝ මඛාදෙව නම් රජාණ කෙනෙක් වූහ. උන්වහන්සේ සුවාසූදහසක් අවුරුදු කුමාර ක්‍රීඩා කෙළිසේක. සුවාසූදහසක් අවුරුදු යුවරජය කළසේක. අසූසාර දහස්වසක් රජය කරන්නෝ මහුල් කපුවාට මෙසේ කිහ. "යම් දවසක මා හිස තර (කෙස්) දුටුයෙහි වී නම් එදවස මට කියව"යි. ඔහු මැත කාලයෙහි තරකෙස් දැක සැලකළ කල්හි රන් අඹුවෙන් තර (කෙස්) උදුරවා අත තැබූ සේක. එකල්හි රජ්ජුරුවෝ තර කෙස් බලා මට දෙවදූතයෝ පහළවූවාහුය"යි හටගත් සංවෙග ඇත්තෝ දැන් මා විසින් පැවිදි විය යුතුයයි සිතා ලක්ෂයක් උපදනා ගම්වරක් කපුවාහට දී වැඩි මහල් පුතණුවන් කැඳවා උන්ට:-

88 "උත්තමඞ්ගරුහා මය්හං ඉමේ ජාතාවයොහරා,
පාතුභූතා දෙවදූතා පබ්බජ්ජාසමයෝ මම"යි

කියා මනාකොට රාජ්‍යානුශාසනය කොට තමහට තවත් සුවාසූදහසක් අවුරුදු ආයුඃ ශෙෂව තිබියදීත් මාරයා අභිමුඛ යෙහි සිටියක්හුමෙන් තමන් සිතමින් කළකිරුණු සිත්ඇත්තෝ පැවිද්ද කැමැතිවූහ.

89 "සිරසම්ං ඵලිතං දිසවා මඛාදෙවෝ දිසම්පති,
සංවෙගං අලභී ධීරෝ පබ්බජ්ජං සමරොචයි"යි.

යනු එහෙයින් කියනලදී- රජුජුරුවෝ පුත්‍රයාහට "මා පිළිපන් නියායෙන් පවතුව, තෝ අන්තිම පුරුෂ නොවෙව, හෙවත් ඒ පිළිවෙළ කඩනොකරව"යි අවවාදදී නුවරින් නික්මුනාහ. බොධිසත්ත්වයෝ මහණ පැවිද්දෙන් පැවිදිව සුවාසූදහසක්

අවුරුදු ධ්‍යාන සමාපත්තියෙන් දවස් යවා ආයු කෙළවර බ්‍රහ්ම ලොකයෙහි උපන්හ. ඒ රජහුගේ පුත්‍රයාණෝද නොයෙක් දහස් ගණනක් අවුරුදු රාජ්‍යය කොට යට කී නීයාසෙන්ම පැවිදිව බ්‍රහ්මලොක පරායණ වූහ. ඉක්බිති ඒ රජහු පිත්දැ ඒ රජහු පිත්දැයි මෙසේ ක්‍රමයෙන් හිස ඔටුනු පැළඳි දෙදෙනෙක් අඩු දෙදහසක් (මඛා දෙව) රජවරු හිස තරකෙස් දුකම රජය හැර ගොස් පැවිදිවූ වාහුය.

ඉක්බිති බොධිසත්ත්වයෝ බ්‍රහ්ම ලොකයෙහි සිටි තැනැත්තෝම "මා විසින් මනුෂ්‍ය ලොකයෙහි කළාවූ කල්‍යාණ කර්ම්‍ය පවතීද නොපවතීදැයි ආවජ්ජනා කරන්නෝ මෙතෙක්කල් නොතැසී පැවැත්තේය. ඒත් මතු නොපවත්නේය"යි දුටුසේක. උන් වහන්සේ "මගේ ප්‍රවේණිය කඩවෙන්ට නොදෙන්නෙමි"යි තමාගේ වංශජාත මහ රජහුගේ අගමෙහෙසුන් කුසම පිළිසිඳ ගෙන සවකිය වංශයෙහි තෙමිය ගටන්කාක් මෙන් උපන්හ. එහෙයින් කියනලදී:- "නෙමිං සංමෙනෙනා විය උපපනෙනා'නි නිමි'නි ලඛනාමෝ"යි උන්වහන්සේට නම් තබන දිනයෙහි පිය රජ්ජුරුවන් විසින් ගෙන්වනලද ලක්ෂණ පාඨකයෝ ලක්ෂණ පරීක්ෂාකොට කියන්නාහු "මහරජ්ජුරුවෙනි, මේ කුමාරයාණෝ නුබවහන්සේගේ වංශය මතු දියුණු කරන්නෝ වෙති. මේ නුබවහන්සේගේ මුත්තණුවෝය, මහානුභාව සම්පන්නයහ, මහ පිතැන්තාහ"යි ප්‍රකාශකළාහුය. රජ්ජුරුවෝ ඒ අසා ලක්ෂණ පාඨක යන් විසින් කියනලද ලක්ෂණ නිමිත්තකොටගෙන උන්වහන්සේට නිමි යයි නම් කළහ. උන්වහන්සේ ළදරු කාලයෙහි සිටම නිත්‍ය පඤ්චශීලයෙහි හා අෂ්ටාඞ්ග ශීලයෙහිත් පෙදුනසේක. ඉක්බිති උන්වහන්සේගේ පියරජාණෝ පළමුකි පරිදි දෙන්ම පැසුණු හිසකේ දුක මගුල් කපුවාට ගම්වරදී පුතුට රාජ්‍යය භාරකොට නුවරින් නික්ම පැවිදිව ධ්‍යාන උපදවා බ්‍රහ්මලොක පරායණ වූහ.

නිමි රජ්ජුරුවෝ දුනාධ්‍යාශයෙන් නුවර සතර දෙරටුවෙහිද, නුවර මැදදැයි පසක් දන්හල් කරවා මහදන් පැවැත්වූහ. එක එක දුනශාලාවෙහි ලක්ෂය ලක්ෂය බැගින් දවස්පතා පන්ලක්ෂයක් පරිත්‍යාග කළහ. නිත්‍ය පඤ්චශීලය රක්තාහු පක්ෂයකට වරක් පෙහෙවස් විසූහ. මහාජනයාද දුනාදී කුශලකර්ම්‍යන්හි සමාදන් කරවූහ. සඩගී මාගීය ප්‍රකාශ කළහ. මහාජනයා නිරය හයින් භයගන්වා පවින් වැළැක්වූහ. මහාජනතෙම ඒ රාජයන්ගේ අවවාදයෙහි පිහිටා දුනාදි පින්කම් කොට එහින් සැව දිව්‍යලොකයෙහි උපන්නේය. දෙව්ලොව පිරුණේය. නරකය

කිව්වොත් මෙන් විය. එකල්හි තමාගේ දානාධ්‍යාශයාගේ උදර භාවයද සවිශෙෂයෙන් දානපාරමිතාව පිරුබවද ප්‍රකාශකරන්නාවූ ශාස්තෘන් වහන්සේ:

තදහං මාපයිස්සාමි චතුසාලං චතුම්මුඛං,
තත්ථ දානං පවත්තෙහිං මිගපක්ඛිනරාදිනං. (41)

යනාදීන් වදළහ. එහි අනිප්‍රාය නම්:- නිමිරාජ කාලයෙහි මම සතර දිසාවෙහි සතර දොරටුවක් ඇති සතරැස් දාන ශාලාවක් නගර මධ්‍යයෙහි කරවා මෘගපක්ෂි මනුෂ්‍යාදීන්ට මහදන් දුනිමි. දානශාලාවගේ විශාලත්වය කරුණකොට ද දාන වස්තුවල සහ යාචක ජනයාගේ බහුල භාවයෙන්ද දානධර්මය කෙළවරක් කරන්ට හා දෙයධර්මය අවසාන කරන්ටද එකම වාරයකින් නොහැකි බැවින් දානශාලාවගේ සතර දිසාවෙහි මහ දොරටු සතරක් කරවූහ. ඒ දානශාලාවගේ දොරකඩ පටන් කෙළවර දක්වා දානවස්තු රැස්කර තබන ලද්දේවිය. අරුණෝද්ගමන කාලයෙහි පටන් යාචකයන් පැමිණෙන කාලය දක්වා දන් දෙති. සෙසු කාලයෙහි හෙවත් යාචක ජනයා නොපැමිණෙන කාලසමයෙහි (රාත්‍රියෙහිද) තොයෙක් ප්‍රදීපයෝ දිලෙත්. යම් යම් කලක යාචකයෝ එන්නාහු නම් ඒ ඒ කාලයෙහි දෙනු ලබන්නේමය. ඒ දානය දුගීමගී යාචකයන්ට පමණක් දෙනලද්දේ නොවෙයි. වැළි කහට දෙනලද්දේද යත්? මහා ධනවතුන්ට හා මහා භොග ඇත්තවුන්ටද සුදුසු සුදුසු වශයෙන් මහාසුදශීන රජ දුන් දානය මෙන් උළාරතර ප්‍රණීතතර දානවස්තු පරිත්‍යාගය නිසා සියලු දඹදිව්වැසි මනුෂ්‍යයෝ පිළිගෙන පරිභොග කළාහුය. මහාපුරුෂයාණෝ එකල්හි මුළු දඹදිව තහුල් උඩ බඳවා මහදන් පැවැත්වූහ. මනුෂ්‍යයන්ට දන්දුන්නාක් මෙන් මෘගපක්ෂි ආදි තිරිසන්ගත සත්ත්වයන්ටත් දන්දුන්සේක. ඔහු පක්ෂීන්ට සුදුසු වශයෙන් දානශාලාවෙන් පිට එකත් පසෙක දානය පිළිගෙළ කරන ලද්දේවිය. "තත්ථ දානං පවත්තෙහිං මිගපක්ඛිනරාදිනං" යනු එහෙයින් වදරතලදි.

හුදෙක් තිරිසන්ගත සත්ත්වයන්ට පමණක්ම දන් දෙනලද්දේ නොවෙයි. ප්‍රේතයන්ටද දවසක් පාසා ප්‍රාප්ති දානය කරන ලද්දේය. යම්සේ එකදානශාලාවක දන් දේද ඉතිරි දාන ශාලා සතරෙත් එසේම දෙනලද්දේ විය. පෙළෙහි වනාහි "තදහං මාපයිස්සාමි චතුසාලං චතුම්මුඛං"යි එක දානශාලාවක් මෙන් වදරන ලදි. ඒ වනාහි නුවර මැද දානශාලාව සඳහා වදරනලද්දේයයි දතයුතු. දැන් එහි දානවස්තු එක් දෙශයකින් දක්වනු පිණිස

අච්ඡාදනං ච සයනං ච අන්නපානං ච භොජනං,
අබ්භාඵජ්ජනනං කරිත්වාන මහාදානං පවත්තයිං. (42)

යනු වදරන ලදි. කොමු පිළී ආදි තත් වැදුරුම් හඳනා පොරෝනාද පසීඝා හා ගොණකවිත්තකාදි අනෙකවිධ යානාවන්ද ඒ ඒ සත්ත්වයන්ට රිසිවූ කාකාග්‍ර රස ඇති ආහාර පානද තදවශෙෂවූ කාකාවිධ භොජනවගීද ආරම්භ කළතැන් පටන් ආයු කෙළවර දක්වා අහොරාත්‍රියකුදු අවිච්ඡින්නකොට මහදන් දුන්මි. දැන් ඒ දෙතලද දානය සම්‍යක් සම්බොධිය අරබයා දාන පාරමී භාවයෙන් පැවති බව දක්වනු සඳහා,

යථාපි සෙවකො සාමිං ධනහෙතුමුපාගතො,
කායෙන වාචා මනසා ආරාධනිය මෙසති. (43)

යනු වදරන ලදී. යම්සේ සෙවක පුරුෂයෙක් තම ස්වාමියා කරා කලින් කල සෙවය කිරීම පිණිස පැමිණියේ ධන ලාභය පිණිස කායවාඞ්මනො කම්යන් කරණකොටගෙන උන් සතුටු කරන්නේද නොහොත් සතුටු කරවිය යුතු උපායක් සොයා ද,

තඤ්චාහං සබ්බභවෙ පරියෙසිස්සාමි බොධිජං,
දානෙන සත්තෙන තපෙපඤ්ඤා ඉච්ඡාමි බොධිමුත්තමං. (44)

එසේම බොධිසත්ත්වභූතවූ මම දෙවියන් සහිත ලොකයා ගේ සවාමිවූ නිරුත්තරවූ බුදුබව සෙවිතා කැමැත්තෙම් බුදුබව සතුටු කරනු පිණිස සියලු භවයෙහි දාන පාරමිතාව සම්පූර්ණ කිරීම් වශයෙන් ධනයෙන් සියලු සත්ත්වයන් සතප්වා බොධිය (සම්‍යක්ඥානය) සියලු උපායයෙන් සොයන්නෙම් හෙවත් ජීවිත පරිත්‍යාගාදි යම් කිසිවක් කොට ඒ උතුම් බුදුබව කැමැත්තෙමියි.

මෙසේ දානාධ්‍යාශයාගේ උළාරභාවය දක්වන්ට දාන පාරමිතා වශයෙන්ම දෙශනාව පවත්වන ලද්දේය. ජාතක දෙශනාවෙහි වතාහි ශීලපාරමිතාදීන්ගේ පිරිම ද, ප්‍රකාශ කරන ලද්දේමිය ඒ එසේමැයි. යට කියන ලද ක්‍රමයෙන්ම ශීලාදී ගුණයෙන් තමන් අලංකාර කොට මහාජනයාද ශීලාදි ගුණයෙහි පිහිටුවන්නාහු උත්වහත්සේගේ අවවාදයෙහි පිහිටා දෙව්ලොව උපන්නා වූ දෙවතාවෝ සුධර්‍ම නම් දිව්‍ය සභාවෙහි රැස්වූවාහු අහෝ! අපගේ නිමි රජ්ජුරුවන් නිසා අපි මේ සම්පත්තියට පැමිණියෙමු. අබුඩොත්පාද කාලයෙහි පවා බුඩකෘත්‍යය

සිඳිකරන්නාවූ මෙබඳු ආශ්චර්ය මනුෂ්‍යයෝ ලොකයෙහි එහළ වන්නාහුයයි මහ බෝසතාණන් වහන්සේගේ ගුණ වර්ණනා කරමින් සතුති කළාහුය.
එහෙයින් කියන ලදි.

89. "අවෙජ්ජරං වත ලොකසම්ං උපපජ්ජන්ති විචක්ඛණා,
යථා අහු නිම්‍රාජා පණ්ඩිතෝ කුසලව්‍රතෝ"ති.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රයාණන් ආදිකොට ඇති සියලු දෙව සමූහයා බොධිසත්ත්වයන් වහන්සේ දකිනු කැමැත්තී වූවාහුය. ඉක්බිති එක් දිනක් පෙහෙවස් සමාදන්ව මතු මහල් තලයට පැමිණ පශ්චිම යාමයෙහි බඩපයිඟයෙන් වැඩහුන් බොධිසත්ත්වයන් වහන්සේට මෙබඳු විතර්කයක් උපන්නේය. එනම්:— "දන්දීම හෝ උතුම් ද? නොහොත් බ්‍රහ්මචර්‍යාවද"යි කියායි බොධිසත්ත්වයන් වහන්සේ තමන්ගේ සිත හටගත් සැකය ගිදපියන්ට අසමර්ථවූහ. එකෙණෙහි සක්දෙව් රජහුගේ පඬුකම්බල් අස්න හුනුවිය. සක්දෙවිරජාණෝ ඒ කාරණය ආවර්ජනාකරන්නෝ යට කී පරිද්දෙන් විතර්ක කරන්නාවූ බෝසතාණන් දැක "ඒකාන්තයෙන් උන්හේ සංකා විනොදනය කරන්නෙමි"යි එහි ගොස් උන්වහන්සේ ඉදිරිපිට ප්‍රාදුර්භූත වූහ. බොධිසත්ත්වයන් වහන්සේ "තෝ කවරෙකිදැ"යි විචාළසේක, සක්දෙවිරජාණෝ ද තමන් සක්දෙව් රජයයි සැළකොට මහ රජ්ජුරුවෙනි, ඔබ වහන්සේ කුමක් සිතූසේක්ද"යි ඔබ සිත් උපත් කුකුස්වත් විචාළහ. බොධිසත්ත්වයෝද සිතූ කාරණය කීහ. සක්දෙවිරජාණෝ ඒ අසා බ්‍රහ්මචර්‍යාව උතුම්කොට දක්වන්නෝ:—

90. නිනෙන බ්‍රහ්මචරියෙන බහුතයෙ උපපජ්ජති,
මජ්ඣිමෙන ච දෙවහෙන උත්තමෙන විසුජ්ඣති.

91. තහෙතෙ සුලභා කායා යාවයොගෙන කෙනචි,
යෙ කායෙ උපපජ්ජන්ති අනාගාරා තපස්සිනො,යි කීහ.

එහි බොහෝ තිරිසනතනයන්හි මෛත්‍රියෙන් විරතිමාත්‍රයෙක්ම නිනබ්‍රහ්මචරියාව නම්. ඒ කරණකොටගෙන ක්ෂත්‍රියකුල යෙහි උපදී, ධ්‍යානයාගේ උපචාර මාත්‍රය මධ්‍යම නම්වේ. ඒ කරණකොටගෙන දිව්‍ය ලොකයෙහි උපදී අෂ්ට සමාපත්ති ඉපදවීම උත්තම නම්වේ ඒ කරණකොටගෙන බ්‍රහ්ම ලොකයෙහි උපදී. බුඩ ශාසනයෙන් පිටත් බාහිරකයෝ එය නිර්වාණ යයි කියත්. "විසුජ්ඣති" යනු එහෙයින් කියන ලදි.

බුඩසාසනයෙහි වතාහි එක්තරා දෙවනිකායක් ප්‍රාර්ථනාකරන පිරිසිදු සිල් ඇති භික්ෂූහුගේ බ්‍රහ්මචරියාව වතාහි චේතනාවගේ නිසතායෙන් ගිහි නම් වේ. එයින් ප්‍රාර්ථනා තිබූ පරිද්දෙන් දිව්‍යලොකයෙහි උපදී. සම්පූර්ණ සිල්ඇත්තහුගේ වතාහි අෂ්ට සමාපත්ති ඉපදවීම මධ්‍යම නම් වේ. එයින් බ්‍රහ්මලොකයෙහි උපදී. පිරිසිදු සිල් ඇත්තහුගේ විදර්ශනා වඩා අර්හත්ඵලයට පැමිණීම වතාහි උත්තම නම්වේ. එයින් විශුද්ධියට පැමිණේයයි.

මෙසේ ශක්‍රයෝ මහරජ්ජුරුවෙනි, දානයට වඩා බ්‍රහ්මචරිය වාසය සියක් ගුණයෙන් දහස් ගුණයෙන් දසදහස් ගුණයෙන් මහත් ඵලයයි ශ්‍රේෂ්ඨයයි වර්ණනා කළහ. මහාපුරුෂයාණනි, මේ දෙකම කටයුතුය, දන්දීම හා බඹසරවස් විසීමද යන දෙක්හිම අප්‍රමාදව දන් දුන මැනව, සිල් රැක්ක මැනවයි අවවාද කොට දෙව්ලොවටම ගියහ. ඉක්බිති දිව්‍ය සමූහයා "මහරජ්ජුරුවෙනි, කොහි ගියාහුද" යි ඔබ විවාළ හ. සක්දෙවිරජාණෝ කියන්නෝ "මියුළු නුවර නිමි රජ්ජුරුවන්ගේ සැක දුරුකරන්ට ගියෙමි"යි කියා බොධිසත්ත්වයන් වහන්සේගේ ගුණ විස්තර වශයෙන් වර්ණනා කළහ. ඒ අසා දෙව සමූහයා මහරජ්ජුරුවෙනි, අපිදු නිමි රජ්ජුරුවන් දකිනු කැමැත්තම්හ. උන්වහන්සේ මොබ කැඳවාලුව මැනවයි කිහ. ශක්‍රයෝ යහපතැයි ගිවිස මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවා "යව මාතලිය, නිමි රජ්ජුරුවන් වෙජයන්ත රථයට නංවාගෙන එව"යි කිහ. මාතලී රියැදුරු තෙමේ "යහපතැ"යි පිළිගෙන දෙව් රියෙන් ගොස් මහාසත්ත්වයන් එහි නංවාගෙන උන් විසින් යාච්ඤා කරන ලද්දේ පිළිවෙළින් පාපකම් කළවුන් උපදනාවූද පින් කළවුන් උපදනාවූද ස්ථානයන් කියමින් පිළිවෙළින් දෙව්ලොවට ගෙන ගියේය.

දෙවසමූහයාද නිමි රජ්ජුරුවෝ ආහයි අසා දිව්‍යමයවූ ගඳ මල්ගත් අත් ඇත්තාහු චිත්‍රකූට දෙරටුව දක්වා පෙර ගමන් ගොස් මහබෝසතාණන් වහන්සේට ගඳමලින් පුදන්නාහු සුධර්මා නම් දෙව සභාවට වැඩිහ. නිමි රජාණෝ රථයෙන් බැස දෙව සභාවට පිවිසියේක්. සක්දෙවිඳුන් සමග එකාසනයේ හිඳ උන් විසින් දිව්‍ය කාමයෙන් පවරනු ලබන්නෝ මහ රජ්ජුරුවෙනි, යාවිතකුප්මවූ මේ පඤ්චකාමයෙන් අපට කම්නැතැයි ප්‍රතික්ෂේප කොට නොයෙක් අයුරින් ධර්මදේශනා කළහ. බොධිසත්ත්වයෝ මනුෂ්‍ය භාෂාවෙන් සත් දවසක්ම සිට "මනුෂ්‍ය ලොකයට යනු කැමැත්තෙමි; එහි ගොස් දානාදි පින්කම් කරන්නෙමි"යි කිහ. ශක්‍රයෝ නිමි රජ්ජුරුවන් මියුළු නුවරට ගෙනගොස් ඇරලාපිය

වසි කියා මාතලි ඇණවූහ. හෙතෙම රථාරූඪ වූ රථයට නංවා ගෙන ප්‍රාචීන දිශාභාගයෙන් මියුළු කුවරට පැමිණියේය. මහා ජනයෝ දෙව්රිය දැක රජහට පෙරහමන් කළහ. මාතලි තෙම නිමි රජ්ජුරුවන් සීමාදුරු කවුළුවෙහි බස්වා රජ්ජුරුවන් පිළිඹිස දෙව්ලොවටම ගියේය. මහාජනතෙම රජ්ජුරුවන් පිරිවරා දෙව ඝන්වහන්ස, දෙව්ලොව කෙබඳුදැයි විවාළෝය. රජ්ජුරුවෝ දිව්‍ය ලොකයෙහි සම්පත් වණනාකොට තොපිත් දානාදී පින්කම් කරන්නාහු දිව්‍යලොකයෙහි උපදින්නාහුයයි ධර්මදේශනා කළෝය.

උන්වහන්සේ මෑතකාලයෙහි පෙර කියනලද නයින්ම තර කෙසේ දැක ප්‍රත්‍යූෂට රජය දී කාමයන්හැර පැවිදිව සතර බ්‍රහ්ම විහාර භාවනා වඩා බ්‍රහ්මලොකයෙහි උපන්සේක. එකල්හි ශක්‍රයෝ අනුරුඛ ස්ථවිර වූහ. මාතලිතෙම ආනන්ද ස්ථවිර වූයේය. අසූ සාර දහසක් රජපිරිස බුදුපිරිසය. නිමි රජාණෝ ලොකසාමි බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේගේ බොධිසම්භාරගුණයෝ යට කියනලද ක්‍රමයෙන් මෙහිද නිධාරණය කටයුත්තාහුය.

ඒ එසේමැයි. බ්‍රහ්මලොක සම්පත්තිය හැර පෙර තමන් විසින් පැවැත්වූ කල්‍යාණව්‍රතය ලුහුබඳින්නෙමියි මහා කරුණා වෙන් මනුෂ්‍යලොකයෙහි ඉපදීමද, මහත් දානාඛ්‍යාශයද, ඊට සුදුසුවූ දානාදි ප්‍රතිපත්තියද, මහාජනයා එහි පිහිටුවීමද, දෙවි මිනිසුන් කෙරෙහි පතළාවූ යසස් ඇති බවද, ශක්‍රදිව්‍යරාජයන් කරා එළඹීමෙහි ඉතා විස්මය භාවයද, උන් විසින් දිව්‍යසම්පත්ති යෙන් නිමන්ත්‍රණය කරනුලබන්නේද එය අත්හැරම පින් රැස් කරනු පිණිස මනුෂ්‍යලොකයට පැමිණීමද, ලාභ සමපත්තියෙහි සියලු තන්හි අලග්නභාවයදැයි මේ ආදි ගුණානුභාවයෝ නිධාරණය කටයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි
ඝවන නිමිරාජ චරිතය නිමි.

VII චන්දකුමාර චරිතය

තවද මේ පරමාර්ථ දීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි සත්වන චන්දකුමාර චරිතය කියේය? යත්:

පුනාපරං යදා හොමි එකරාජස්ස අත්‍රජෝ,
නගරෙ පුප්ඵවතියා කුමාරෝ චන්දසවහ්වයෝ. (45)

නැවත ද අනික් චරිතයක් කියමි. හෙද අසව මම යම් කලෙක්හි පුප්ඵවතී නුවර එකරාජ නම් කසි රජහුගේ ඖරස පුත්‍රවූ චන්ද නම් කුමාර වීම් ද මේ එහි පිළිවෙළ කථාවයි.

අතීතයෙහි වනාහි බාරාණසි නොමෝ පුප්ඵවතී නම් විය. එහි වශවර්ති නම් රජහුගේ පුත්‍රවූ එකරාජ නම් කසිරජ කෙනෙක් රජය කරවූහ. එකල්හි අප මහා බොධිසත්ත්වයෝ උත්වහන්සේගේ ඝොතමී නම් අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්සේක. උත්වහන්සේට චන්දකුමාර යයි නම් කළාහුය. උත්වහන්සේ පියනහා ඇවිදින අවස්ථාවෙහි තවත් පුතණු කෙනෙක් උපන්හ, උන්ට සූරියකුමාර යයි නම් කළාහුය. ඒ කුමාරයන් පියනහා ඇවිදින සමයෙහි එක් දියණී කෙනෙක් උපන්හ, උන්ට සේලා යයි නමක් කළාහුය. භද්දසෙනය *සූරය කියා ඔවුන්ට වෛමාතෘක සෝවුරන් දෙදෙනෙක්ද වූවාහුය. බොධිසත්ත්වයෝ අනුක්‍රමයෙන් වැඩිවිය පැමිණ සියලු ශිල්පශස්ත්‍රයන්හි හා විද්‍යාස්ථානයන්හිද පරතෙරට ගියාහ. පියරජාණෝ උන්ටම සුදුසුවූ චන්ද නම් රාජ දුහිතෘවක ද ගෙනවුත් දී යුවරජ තනතුරද දුන්හ. කල්යාමකින් බොධිසත්ත්වයන් වහන්සේට පුතණු කෙනෙක් උපන්හ, උන්ට වසුල යයි නමක් කළාහුය. රජහට වනාහි අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනයකරන කණ්ඩහාල නම් පුරොහිතයාණ කෙනෙක්වූහ. වශවර්ති රජ්ජුරුවෝ ඔහු අධිකරණයට නායක කළාහුය. පුරොහිතයෝ වනාහි අත්ලස්ම ධනය කොට ඇත්තෝ සියල්ලන්ගෙන් අත්ලස් ගෙන අහිමියන් හිමියන් කෙරෙති; හිමියන් අහිමියන් කෙරෙති. ඉක්බිති එක් දවසක් යුක්තියෙන් පැරදුනාවූ පුරුෂයෙක් අධිකරණ ශාලාවෙන් උපක්‍රොශ කරමින් (නුගුණ කියමින්) නික්ම, රාජසෙවයට යන්නාවූ බෝසතාණන් දැක උත්වහන්සේගේ පාමුල්හි වැටී "සවාමීනි, ඛණ්ඩහාලයා විනිශ්චය මණ්ඩලයෙහි අත්ලස්කයි. අත්ලස්ගෙන මා පරාජය කෙළේය" යි කියා

*"චන්දසෙන" යයි ජාතක පොත්හි.

බැහැඟඩින් හැඩීම කෙළේය. බොධිසත්ත්වයෝද තොබවයි කියා ඔහු අස්වසා අධිකරණශාලාවට කැඳවාගෙන ගොස් යුක්තියවූ පරිද්දෙන්ම විවාරා තීන්දු තීන්දු කළහ. මහාජනයෝ මහත් හඬින් සාධුනාද පැවැත්තූහ. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේ යුක්තිය විවාළ නියාව ඇසූ උන්වහන්සේ කැඳවා දරුව, මෙතැන් පටන් තෙපිම යුක්ති විවාරවයි විනිශ්චය තනතුර බෝසතාණන් වහන්සේට දුන්සේක. බොධිසත්ත්වයෝ යුක්ති විවාරත්ට වන්පසු බණ්ඩාල බ්‍රාහ්මණයාගේ අය තැතිව ගියේය. ඔහු වතාහි එතැන්සිට බොධිසත්ත්වයන් කෙරෙහි වෛර බැඳපියා උන්වහන්සේගේ සිදුරු සොයමින් ඇවිදිනාහ. එකරුජයෝ වතාහි මූඟධ ප්‍රසන්නයෝය. එක් දිනක් උන් සිතෙන් දෙව්ලොව දැක එහි යනු කැමතිව "බණ්ඩාල බ්‍රාහ්මණයා අතින් දෙව්ලොවට යන මන" විවාළෝය. පෙරවියෝ කියන්නෝ රජ්ජුරුවෙනි, අනිදූතය දෙමින් සම්වතුසක යාගය කරනු මැනවයි කිහ. රජ්ජුරුවන් විසින් අනිදූතය තම් කවරේදැයි විවාරණලද්දේ තමාගේ ප්‍රිය පුත්‍රයෝය, ප්‍රිය භාර්‍යාවය, ප්‍රිය දූ චරුය, මහාවිභව සිටුවරුය, මනුලැතුය, අසුය, යනාදී මොහු සතර සතර දෙනා බැගින් කොට මෙසේ දෙපා සිවුපාවුන් යාග පිණිස පරිත්‍යාග කොට ඔවුන්ගේ ගල ලොහිතයෙන් යාගකිරීම් අනිදූත නමැයි කිහ. මෙසේ ඒ බමුණෝ දෙව්ලෝ මං කියන්නෙමියි නිරයට මග කිවෝය. රජ්ජුරුවෝ ඔහු පණ්ඩිතයයන කල්පනාවෙන් ඔහු කි ආකාරය සවගිමාගීයයි සිතා ඒ පිළිපදිනු කැමැත්තෝ මහත්වූ යාගාවාටයක් (යාගකරතවළක්) කරවා එහි බොධිසත්ත්වයන් ප්‍රධාන රාජකුමාරයන් සතරදෙනා ආදිකොට (බණ්ඩාලයා විසින් කියන ලද) දෙපා සිවුපා සියල්ලන් යාග ප්‍රයුක්ත ස්ථානයට පමුණුවවි යයි කියා නියොග කළෝය. සියලු යාග සම්භාරය පිළියෙළ කරන ලද්දේ විය. මහා ජනයෝ ඒ අසා මහත් කොලාහල කළාහ. රජ්ජුරුවෝ විපිළිසර වූහ. යළිදු බණ්ඩාලයා විසින් උපසම්පාදිතවූවෝ පෙරලේම නියොග කළහ. බොධිසත්ත්වයෝ විනිශ්චය තනතුර කොල බන්නාවූ බණ්ඩාලයා විසින් මා කෙරෙහි වෛර බැඳ මාගේම මරණය කැමතිවෙමින් මහාජනයාට අනයව්‍යසනයක් උපදවන ලද්දේයයි දැන තොයෙක් උපායයෙන් රජ්ජුරුවන් දුගතිගාමී ග්‍රාහදෘෂ්ටින් මුදවන්ට වැයම් කොටත් නොහැකිවූහ. මහාජනයෝ මහත් හඬින් හැඬූහ. මහාජනයා හඬමින් වැලපෙමින් සිටියදීම යාගාවාටයෙහි සියලු කර්මාන්ත නිමාකරවූහ. ඉක්බිති පුත්‍රයන්

(බොධිසත්ත්වයන්) ගෙනගොස් කර තමා මරන්ට භිදවූහ. ඛණ්ඩහාලයා රන් තලිය එළවා කඩුව ගෙන බෝසතුන්ගේ බොටුව කපන්නෙමියි සිටියේය. බෝසතාණන්වහන්සේගේ මෙහෙසීවූ චන්ද්‍රා දේවී බිසවු ඒදැක මට වෙන පිළිසරණක් නැත. මාගේ සත්‍යක්‍රියා බලයෙන් සවාමිපුත්‍රයන් වහන්සේට සවසනියක් කරන්නෙමි යි සිතා ඇඳිලි බැඳගෙන පිරිස අතරෙහි ඇවිදින්නී ඛණ්ඩහාලයා යමක් සවගී මාගියයි කෙරේද, ඒ එකාන්තයෙන්ම පාප කර්මයෙක, මාගේ මේ සත්‍ය වචනයෙන් සවාමියාහට සැපයෙක් වේවා යි කියා:-

"යා දෙවතා ඉධාගතා යානිව භූතභව්‍යානි
සරණෙසිනිං අනාථං තාසථ මං යාචාමහං;
පතිමාහං අජෙයාන්‍යනි"යි සත්‍යක්‍රියා කළාය.

ඉක්බිති සක්දෙව් රජාණෝ ඇගේ පරිදෙවන ශබ්දය අසා එපවත් දැන දිලිහෙන්නාවූ ගකුළක් ගෙන ගොස් රජ්ජුරුවන් නැතිගන්නවා සියල්ලන්ම මරණින් මුදවාලූහ. වැළිදු ශක්‍රයෝ තමාගේ දිව්‍ය සවරූපය දක්වා හාත්පසින් ඇවිලුණාවූ දිලියෙන් නාවූ වජ්‍රායුධය කරකවමින් රජ්ජුරුවන්ට කියන්නාහු "බොල පවිටු රාජ කාලකන්නිය, ප්‍රාණඝාතය කිරීමෙන් දෙව්ලොවට පැමිණීමක් නා විසින් කොයිකලෙක දන්නාලද විරූද? චන්ද්‍ර කුමාරයාද මේ සියලු ජනයාද බන්ධනයෙන් මුදව. ඉදින් නොවුදත් නෙහිතම් මෙහිම නාගේද මේ දුෂ්ටවූ බමුණාගේද හිස පලන්-නෙමි"යි කියා අහසෙහි සිටියෝය. මේ ආශ්චර්‍යයදැක රජ්ජුරුවන් හා බ්‍රාහ්මණයෝද වහාම සියලුදෙනාම බන්ධනයෙන් මිදෙව්වාහුය. ඉක්බිති මහාජනයෝ එකකොළාහලකොට වහාම යාගාවාටය වතුරුවා සිට ඛණ්ඩහාලයාට එකි එකි කැටපහරක් දී එහිම ජීවිතක්ෂයට පමුණුවා රජ්ජුරුවන්ද මරන්ට පටන්ගත්තෝය. බොධිසත්ත්වයෝ පළමුකොටම පියා වැළඳගෙන මැරිය නුදුන්හ. මහාජනයෝ කියන්නාහු "ඒපාපීරජහට ජීවිතයපමණක් දෙම්හ. ඔහට රාජ්‍යය නොදෙම්හ. නුවරත් විසිය නොදෙම්හ. චණ්ඩාල යකු කොට නුවරින් පිට වාසය කරවන්නෙමු"යි රජවෙස් හරවා කසාවතක් හඳවා කහවත් කඩරෙද්දකින් හිසවෙළා චණ්ඩාලයකු කොට සැඩොල්ගමට යැව්වාහුය. යම් කෙනෙක් වනාහි ඒ පසු ඝාත යාගය කළාහුද කැරැවූවාහුද අනුමෝදන්වූවාහුද ඒ සියල්ලෝම නිරය පරායන වූවාහුය. එහෙයින් වදාළසේක:-

93. සබ්බෙ පතිට්ඨා නිරයං යථා තං පාපකම්මං කරිත්වා.
නහි පාපකම්මං කත්වා ලභා සුගතිං ඉතෝ ගන්තුන්නි.

ඉක්බිති සියලු රජ පිරිසඟ, කුවර වැස්සෝගඳ, දනවු වැස්සෝගඳ, යන සියල්ලෝම රැස්ව බෝසතාණන් වහන්සේ රාජ්‍යයෙහි අභිෂෙක කළාහුය. උන්වහන්සේ දැහැමින් රජය කොට තමන්ටද මහාජනයාටද නිකරුණේ උපන්නාවූ ඒ අනය ව්‍යසනය සිහිකොට උපන් සංවේග ඇත්තෝ පින් කිරීමෙහි බොහෝ සෙයින්ම උත්සාහ ඇතිව මහ දන් පැවැත්තුහ, සිල් රක්ෂා කළහ, පෙහෙවස් සමාදන්වූහ. එහෙයින් වදාරන ලදි.

තදහං යජනා මුත්තෝ නික්ඛන්තෝ යඤ්ඤවාටතෝ,
සංවේගං ජනයිත්වාන මහාදානං පවත්තයිනති (46)

මෙයින් අභිෂෙකයෙහි පටන් මහදන් පැවැත්වූ බැව් දක්වයි. ඔවුහු වනාහි දක්ෂිණාහී පුද්ගලයන්ට නොදී පස්හය දවසක් පමණ කල් දු කැමිපිමාදිය නොකොළෝය. එකල්හි බොධිසත්ත්වයෝ වනාහි සියලු දඹදිව එකනින් නා දකොට වස්නාවූ මහා මේඝයක් මෙන් මහදන් පැවැත්තුහ. දන ශාලාවන්හි උදුර උදුරාති-ප්‍රණීත ආහාර පාන ම යාචකයන්ට කැමතිසේ දවසක් දවසක් පාසා දෙනු ලැබේ. එසේද වුවත් තමාට පිළියෙළ කරතලද රාජකී භොජනද යාචකයන්ට නොදී අනුභව නො කරති. ඒ සඳහා වදාරන ලදී:—

නාහං පිවාමි ඛාදුම් නපි භුඤ්ජාමි භොජනං,
දක්ඛිණෙය්‍යෙ අදත්වාන අපි ජීවිතහේතුයා. (47)

දැන් ඒ යාචකයන්ට දන් දෙන්ට හෙතුව දක්වන්ට උපමාවක් ගෙනහැර දක්වයි.

යාථාපි වාණිජෝ නාම කන්තාරෙ භණ්ඩසඤ්චයං,
යඤ්ච ලාභෝ මහා හොති තඤ්ච නං හරති භණ්ඩකං. (48)
තථෙව සඤ්ඤතාපි පරෙදින්නං මහප්ඵලං,
තස්මාපරස්ස දාතබ්බං සතභාගෙ භවිස්සති. (49) යි

එහි අර්ථය නම්: යම්සේ වෙළෙන්දෙක් වෙළඳුම් පොලට ගොස් සුළු ප්‍රාග්භාරයෙන් බොහෝ බඩු විකොට බඩු රැස් කොට ගෙන දෙශකාලය දැන යම්තැනක ලාභය බහුල වේද, ඒ ඒ දෙශ කාලයන්හි ඒ භාණ්ඩ විකුණාද, එසේම තමන් අනුභව කළ දෙයට වඩා අන්‍ය ප්‍රතිග්‍රාහක පුද්ගලයකුහට දෙනලද්ද මහත් විපාක ඇත්තේය. එහෙයින් අන්‍ය ප්‍රතිග්‍රාහකයන්ට දියයුතුය, දන විපාකය වනාහි මතු නොයෙක් සතපරිමාණයෙන් ලැබෙන්-නේය. එහෙයින් අනුභව නොකොටද ප්‍රතිග්‍රාහකයන්ට දියයුතුමය.

බුදුරජාණන් වහන්සේ විසින්ද මේ වදාරන ලද්දේය. **"නිරවජ්ජානඤ්ඤානං දානං දත්වා සතගුණා දක්ඛිණා පාටිඤ්ඤා භිතබ්බා, දුස්සීලස්ස මනුස්සභූතස්ස දානං දත්වා සහස්ස ගුණා"** යි තවද අනික්කුදු වදාරන ලදි. **"සචෙ ගිහිබ්‍රහ්මචෙ සත්තා ජානෙය්‍යුං දාන සංවිභාගස්ස විපාකං යථාහං ජානාමි, න අදත්වා භුඤ්ජෙය්‍යුං නවෙතසං මච්ඡෙරමලං චිත්තං පරියාදාය තිට්ඨෙය්‍ය යොපි නෙසං වණ්ණෝ ආලොපෝ චණ්ඩං කබලං තතොපි අසං විහිංසවා න භුඤ්ජෙය්‍යුං"** ති, යනාදිය වශයෙනි. මේසේ දානයාගේ මහත් ඵල භාව සඤ්ඤාතවූද සම්‍යක් සම්බොධි සම්ධිගමයට ප්‍රත්‍යයභාව සඤ්ඤාතවූද මේ කාරණය දැන භවයක් පාසා දන් දෙමි. සම්‍යක්සම් බොධියට පැමිණීමට දානපාරමිතාව පිරීමෙන් මදකුත් නොනැවතෙමි, නොපසු බසිමියි එහෙයින් වදළහ:—

එතමත්ථවසං ඤත්වා දෙමි දානං භවාභවෙ,
න පටිකඛාමාමි දානෙන සම්බොධිමනුපත්තියා ති (50)

ඉක්බිති බොධිසත්ත්වයෝ මහාජනයා විසින් පියා සැඩොල් ගමට ගැවූ කල්හිදු දියයුතු වැටුප් වියදම් දෙවූහ. හැදුම් පෙරවුම් දෙවූහ. එකරාජ රජ්ජුරුවෝ නුවරට වදිනු නොලැබ බෝස තාණන් උයන් කෙළි ආදිය පිණිස පිටත ගිය කල්හි බොධි සත්ත්වයන් කරා එළඹෙති. පුත්‍ර සංඥවෙන් බෝසතාණන්ට නොවදිති, නොද ඇදිලි කෙරෙති, එසේද වුවත් සවාමීනි, බොහෝ කල් ජීවත්වව මැනවයි කියති. බොධිසත්ත්වයෝද පියාණන් දුටු දවස්හි අධික සම්මාන කරති. මෙසේ අප මහබෝසතාණෝ දශරාජ ධර්මයෙන් රජය කරවා ආයු කෙළවර සහ පිරිවරින් ගොස් දෙව්ලොව උපන්හ.

එකල්හි ඛණ්ඩහාල බ්‍රාහ්මණයෝ දෙවදත්ත ස්ථවිරයෝ වූහ, ගොතම් නම් වූ රාජ මහෙසිකාවෝ මහාමායාවය, චූල නම් රාජ දුහිතෘ රහල් මවය, චුල්ල කුමාරයෝ නම් රාහුල කුමාරයෝය, සෙලා කුමාරිකාවෝ උත්පලවණ්ණාවය, සූරයෝ මහා කාශ්‍යප ස්ථවිරයෝය, භද්දසෙනයෝ මහා මෞද්ගල්‍යායන ස්ථවිරයෝය, සුරිය කුමාරයෝ ශාරීපුත්‍ර ස්ථවිරය, චන්ද රජ්ජුරුවන් වහන්සේ ලොකස්වාමිවූ බුදුරජාණන් වහන්සේය.

මෙහිද ඇට කී ක්‍රමයෙන්ම සුදුසු ලෙස බොධිසත්ත්වයන් වහන්සේගේ අවසෙෂ පාරමිහුද නිඛ්ඛාරණය කටයුත්තාහුය. ඒ එසේමය, එකල ඛණ්ඩහාලයාගේ කාඨින්‍ය පරුෂ භාවය දැනත් මධ්‍යස්ථව දැහැමින් සෙමින් යුතුනි විසදීමද, තමා මරනු කැමැති වූ

බණ්ඩාගාලයාගේ උත්තාප්‍රකාර යාගවිධාන දැනත් ඔහු කෙරෙහි සිත් කොපයකුදු නැති බවද, තමාගේ පිරිස ගෙන පියාට සතුරු වන්ට සම්පිඬුවූයේ තමන් මා වැන්නකුට මව්පියන් කෙරෙහි විරුද්ධීම නුසුදුසුයයි තමන් ප්‍රාණ සිටුපාවකු කොට තසතු කැමති පියාගේ ආඥාවෙහි සිටීමද, කොප්‍රවෙන් කඩුව ගෙන හිස කපන්නට එන්නාවූ බ්‍රාහ්මණයා කෙරෙහිද, තමාගේ පියා කෙරෙහිද, සියලු සත්ත්වයන් කෙරෙහිද මෛත්‍රී පැතිරවීමෙන් සමාන සිත් ඇති බවද, මහාජනයා පියා මැරීමට උපක්‍රම කරන ලද කල්හි තමන් පරිත්‍යාග කොට පියාගේ ජීවිත දානයද, දවසක් දවසක් පාසා වෙස්සන්තර දානය හා සමාන මහදන් දෙන්නාහටද දීමෙහි සැකිමක් නැති බවද, මහාජනයා විසින් සැඩොලුන් කෙරෙහි වාසය කරවන ලද පියාට දියයුතු දේ දී පොෂණය කිරීමද, මහාජනයා පුණ්‍යක්‍රියාවන්හි පිහිටුවීමද යන මේ ආදි ගුණානුභාවයෝ නිර්ධාරණය කටයුත්තාහුය.

පරමාත්‍මදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි සත්වන
චන්දකුමාර චරිතය නිමි.

VIII සිවිරාජ චරිතය

තවද මේ පරමාත්‍මදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි අට වන **සිවිරාජ චරිතය** කිසේද? යත්:-

අරිට්ඨසවිහයෙ නගරෙ සිවි නාමාසිං ඛත්තියො,
නිසජ්ජ පාසාදවරෙ එවං චිනෙනසහං තදා. (51)

යම් කලෙක්හි මම අරිට්ඨපුර නුවර සිවි නම්වූ රජෙක් වූ යෙමිද යන්නෙහි මේ වනාහි පිළිවෙළ කථා වස්තුවයි.

යටනියම දවසැ සිවි රට අරිට්ඨපුර නුවර සිවි රජ්ජුරුවන් රාජ්‍යය කරන කල්හි අප මහා බොධිසත්ත්වයන් වහන්සේ උන්වහන්සේට පුත්‍රව උපන්හ. උන්වහන්සේට සිවි කුමාරයයි නමක් කළාහුය. බොධිසත්ත්වයන් වහන්සේ වැඩිවිය පැමිණ තක්ෂශිලා නුවරට ගොස් ඉගෙන ගන්නාලද සියලු ශිල්ප ඇති සේක් සිය නුවරට පැමිණ පිය රජහට ශිල්ප දැක්වූහ. මහරජාණෙ බොධිසත්ත්වයන් යුවරජ තනතුරෙහි පිහිටුවූහ. බොධිසත්ත්වයන් වහන්සේ පිය රජහුගේ ඇවැමෙන් මැත කාලයෙහි රජ කමට පැමිණ අගනි ගමන් හැර දශරාජධම්යෙන් රාජ්‍යය

කරවනසේක්, භුවර සතර වහසල් දෙරටුවේද, භුවර මැදද, නිවෙසතවාරයෙහි දැයි යන මෙතැන්හිදී දන්හල් සියක් කරවා දවස දවස සය ලක්ෂයක් බැගින් වසතුව පරිත්‍යාග කිරීමෙන් මුහදන් පැවැත්වූසේක. අටවක, තුදුස්වක, පසළොස්වක දින යන්හි තමන්වහන්සේ ම දන්හලට ගොස් දන්දෙති. බොධිසත්ත්ව යන් වහන්සේ එක් දවසක් ප්‍රණු පොහෝදිනයෙහි උදුසනම නගනලද සේසත් ඇති රාජ පර්ය්‍යංකයෙහි හිඳ තමා විසින් දෙන ලද දන් ආවර්ජනා කෙරෙමින් "මා විසින් කොදෙනලද බාහිර දානයක් නම් නැත. එහෙත් ඒ වූකලී ආධ්‍යාත්මික දානය මෙන් මා සිත් සතුටු නොකෙරෙයි. අනේ! මා අද දන්හලට ගිය වේලෙහි කිසි යාචකයෙක් මුතුමැණික් ආදි බාහිර වසතු නොඉල්වා ආධ්‍යාත්මික වසතු ඉල්ලන්නේ නම් ඉතා යහපත, ඉදින් මාගේ ශරීර මාංශය හෝ ලේ හෝ හිස හෝ හෘදය මාංශය හෝ ඇස් හෝ ශරීරාඞ්ගයක් හෝ සියලු ශරීරයම හෝ දැසහාවයෙන් ආතමභාවය හෝ ඉල්ලන්නේ නම් ඒ ඒ දෙයම ඔහුගේ අදහස සම්පූර්ණ කරමින් දෙමි"යි. සිතූහ පාළියෙහි වනාහි හුදෙක් ඇස් දන් දෙන්නට සිතූ බව වදාරන ලදී:-

"නිසජ්ජ පාසාදවරෙ එවං චිනෙනසහං තදා,"
යංකිඤ්චි මානුසං දානං අදිනනං මෙ න විජ්ජති,
යොපි යාචෙය්‍ය මං චක්ඛුං දදෙය්‍යං අච්ඡමාපිතො. (52)" යි

(එකල්හි සිවි රාජවූ මම උතුම් ප්‍රාසාදයෙහි හිඳ මෙසේ සිතූයෙමි. කෙසේද "මා නුදුන්, මිනිසුන් විසින් දියයුතුවූ, යම්කිසි දානයක් නැත. යමෙක් තෙම මාගෙන් ඇස් දෙක ඉල්ලන්නේ නම් කම්පනයක් පැකිලීමක් නැතිව උපුටා දෙමි"යි යනු එහි භාවයි)

මෙසේ වනාහි බොධිසත්ත්වයන් වහන්සේට උළාරවූ දානාධ්‍යාශය පහළවූ කල්හි සක්දෙව් රජහුගේ දිග සැට යොදුන් පුළුල පතස්යොදුන්, බොල පසළොස් යොදුන්, බදුවද පෙන්නක් හා සමාන පැහැ ඇති, ඔහු උන්කල නාහිය දක්වා ගැලී යන්නා වූ හුණු කැමති විට හුණු පවත්නාවූ සිහිල් කැමති කල්හි සිහිල් පවත්නාවූ පඬුඇඹුල් සලස්න හුණුවිය. ශක්‍රදෙවෙන්‍රයෝ ඊට කරුණු කිම්දැයි විමසන්නෝ බෝසත්හුගේ අදහස් දැන සිවි මහ රජාණෙනි අද දවස් යාචකයෝ ඇස් ඉල්ලන්නාහු නම් ඔවුන්ට ඇස් උපුටා දෙන්නෙමි"යි සිතූ සිතිවිල්ල සිය දෙවි පිරිසට ප්‍රකාශ කොට සිවි මහරජාණන් සිතූ පරිද්දෙන් ඇස් දියහැකි

දෙ හෝයි දිය කොහැකි දෙ හෝයි උත් විමසන්තෙමු"යි බොධිසත්ත්වයන් සුවඳ පැන් සොළොස් කළයකින් ඉඳ සෝදා සහා සියලු රාජාභරණයෙන් සැරසී, සරහා පිළියෙළ කරතලද මඟුලැතු පිටට පැන කැඳී දන්හලට යන කල්හි ජරාජීර්ණවූ අන්ධ බ්‍රාහ්මණ වෙශයක් ගෙන දන්හලට යන බොධිසත්ත්වයන් වහන්සේගේ අභිමුඛයෙහි එක් උත්තම සථානයෙක්හි සිටියෝ දෙඅත දිගුකොට "ජයතු භවං මහාරාජ" යි ජයාශීර්වාද කළහ. ඉක්බිති බොධිසත්ත්වයෝ උන්ට අභිමුඛව ඇතු මෙහෙයා බ්‍රාහ්මණයාණෙනි, "තෙපි කුමක් කැමතිවත්තහුද"යි විචාළෝය. බ්‍රාහ්මණයෝ මහරජාණනි, නුඹවහන්සේගේ දානාධ්‍යාශය හෙතුකොට ගෙන පැන කැංගාවූ කීර්තිඝොෂයෙන් මුළුලොව අතුරු සිදුරු කැනිව පැනිර සිටියේය. සෙස්සන් විසින් නොදිය හැකි දන් දෙන්ට හිසිවූවොත් ඔබවහන්සේමය. මම ද වනාහි අන්ධයෙමි. එහෙයින් "ඔබ ඉල්වම්"යි උපචාර වශයෙන් එක් ඇසක් ඉල්වූහ. එහෙයින් වදාරන ලදී:—

මම සඞ්ඛපපමඤ්ඤාය සකෙකා දෙවානමිස්සරෝ,
නිසිතෙනා දෙවපරිසාය ඉදං වචනමබ්‍රවි. (53)

නිසජ්ජ පාසාදවරෙ සිවිරාජා මහිඞ්ඝො,
විතෙනතෙනා විවිධං දානං අදෙයය්‍යං සො න පස්සති. (54)

නථනාහු චිනථං නෙතං හන්ද විමංසයාමි නං,
මුහුත්තං ආගමෙය්‍යාථ යාව ජානාමි තං මනං (55)

පවෙධමානො පලිතසිරො වලිතහනුතෙනා ජරාතුරො,
අන්ධවණ්ණාව හුත්වාන රාජානං උපසංකමි. (56)

සො තදා පඤ්ඣලෙඞ්ගාන වාමං දක්ඛිණබාහුං ච,
සිරස්මිං අඤ්ජලිං කත්වා ඉදං වචනමබ්‍රවි. (57)

යාචාමි තං මහාරාජ! ධම්මික රට්ඨවඩ්ඪන,
තව දානරතා කිතති උග්ගතා දෙවමානුසෙ. (58)

උභොපි නෙත්තා නයනා අන්ධා උපහතා මම,
එකංසෙ නයනං දෙහි තෙනපි එකෙන යාපය. සි (59)

එබස් අසා බොධිසත්ත්වයෝ සතුටු සිත් ඇත්තෝ මම වනාහි දැන් ප්‍රාසාදයෙහි හිඳ මෙසේ සිතා ආමි. මේ තෙමේ මාගේ සිත දැන ගත්තාක්මෙන් ඇස් ඉල්වයි. එකාන්තයෙන් මට වූයේ ලාභයෙක. අද මාගේ මනදෙළ මුදුන් පැමිණෙන්නේය. එකාන්තයෙන් පෙර නුදුන් විරූ දානයක් දෙමියි උපන් උත්සාහ ඇත්තෝ වූහ. ඒ ප්‍රකාශ කර වදාරන්නාවූ බෝසතාණන් වහන්සේ මෙසේ වදළහ.

තස්සාහං වචනං සුත්වා භග්ගෝ සංවිග්ගමානසෝ,
කතඤ්ජලී වෙදජාතෝ ඉදං වචනමබ්‍රවි. (60)

ඉදානාහං විඤ්ඤාතපාසාදතෝ ඉධාගතෝ,
තවං මම චිත්තමඤ්ඤාය නෙත්තං යාචිතුමාගතෝ. (61)

අහෝ මෙ මානසං භිඛං සඛාපෙපා පරිපූරිතෝ,
අදින්නපුබ්බං දානවරං අජ්ජ දස්සාමි යාවකෙ. සී (62)

මේ බ්‍රාහ්මණ තෙම මාගේ චිත්තාචාරය දැනගත මෙන් දිමට උගහටවූ ඇස් ඉල්වයි. මොහු වනාහි කිසියම් දෙවිකෙනකු විසින් අනුශාසනය කරන ලද්දේ වන්නාහුදැයි පළමුකොට විචාරමියි සිතූහ. බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණයා විචාළෝය. එහෙයින් වදාළහ බුදුහු ජාතක දෙශනාවෙහි:—

94. කෙනානුසිට්ඨෝ ඉධමාගතොසි වනිබ්බක චක්ඛු
පථානි යාචිතුං,
සුදුච්චජං ඉච්ඡති උත්තමඞ්ගං යමාහු නෙත්තං
පුරිසෙන දුච්චජනානි.

යාචකයෙනි, යමක් ලොකයෙහි පුරුෂයන්හු විසින් දිමට උගහටයයි පණ්ඩිතයෝ කිවාහුද, ඒ උත්තමාඞ්ගය හා ඇස් තෙපි ඉල්වන්නහුය. කවරෙකු විසින් අනුශාසනය කරනලද්දාහු ඇස් ඉල්වා මා සමීපයට ආවාහුදැයි ඇසූහ. ඒ අසා බ්‍රාහ්මණ වෙශධාරී ශක්‍රයෝ මෙසේ කිහ:—

95. යමාහු දෙවෙසු සුජම්පතීති මඝවාති තං ආහු
මනුස්සලොකෙ,
තෙනානුසිට්ඨෝ ඉධමාගතොසම් වනිබ්බකො
චක්ඛුපථානි යාචිතුං

මහරජ්ජුරුවෙනි, දෙදෙව්ලොව දෙවියන් කෙරෙහි යමක්හු සුජම්පතියයි කියනුලබද්ද මිනිස්ලොව මඝමාතවකයයි කියනු ලබද්ද යාචකතෙම ඔහු විසින් අනුශාසනය කරන ලද්දේ ඇස් ඉල්වා තොප සමීපයට ආයේය

96. වනිබ්බතො මයහං වනිං අනුත්තරං දදාහි මෙ චක්ඛු
පථානි යාචිතො,
දදාහි මෙ චක්ඛුපථං අනුත්තරං යමාහු නෙත්තං
පුරිසෙන දුච්චජානි

රජ්ජුරුවනි, යාචඤ්ඤවක් අතුරෙන් මාගේ යාචඤ්ඤය අනුත් තරවූ යාචඤ්ඤයක. එහෙයින් මට ඇස් දුනමැනව. "සෙසු පුරුෂයකු විසින් දෙන්නට උගහටයැ"යි යමක් සඳහා කියනලද්දේද නිරුත්තරවූ ඒ ඇස් දුන මැනව, ඒ අසා බොධිසත්ත්වයෝ මෙසේ කිහ:—

97. යෙන අත්ථෙන ආගච්ඡි යමහම්හිපත්ථයං,
තෙ තෙ නිජ්ඣාහතු සඞ්කප්පා ලභ චක්ඛුනි බ්‍රාහ්මණ

98. එකනෙත්ත යාචමානස්ස උභයානි දදාමහං,
සචක්ඛූමා ගච්ඡ ජනස්ස පෙක්ඛතො යදිච්ඡසෙ තවං
තං තෙ සම්පජ්ඣතූති.

බ්‍රාහ්මණය, තෝ යම් කාරියක් කියා ආයෙහිද, යම් දෙයක් පතන්නෙහිද, තාගේ ඒ සියලු සංකල්පයෝ සමෘඩ වෙත්වා මත්තෙහිද තෝ මාගේ ඇස් දන් ඇරගනුව. එක ඇසක් ඉල්වා ආවාවූ තට මාගේ ඇස් දෙකම දුන වශයෙන් දෙමි. මහාජනයා බලා සිටිද්දීම ඇස් ඇත්තෙක්ව යව. යමක් තෝ මා සමීපයෙන් කැමැතිවන්නෙහි නම් එය සමෘඩවේවා. යි.

රජ්ජුරුවෝ මෙපමණක් කියා "මේ බමුණු තෙම ශක්‍රයා විසින් අනුශාසනය කරනදද්දේ මෙහි අයේයයි කියයි. ඒකාන්ත යෙන් මොහුට මේ උපායෙන් ඇස ලැබෙන්නේයයි දැන මෙතැන් හිදීම මා විසින් ඇස් උපුටාදීම සාරූප්‍ය (සුදුසු) කොවේයයි සිතා බ්‍රාහ්මණයාත් කැඳවාගෙන අන්තඃපුරයට ගොස් රාජාසන යෙහි හිද සිවසක් තම් වෙදකැදවූහ. ඉක්බිති අපගේ රජ්ජුරුවන් වහන්සේ වතාහි ඇස් උපුටා බ්‍රාහ්මණයකුට දන්දෙනු කැමැත්තා හයි මුළු නුවර එකකොලාහලය වූයේය. ඉක්බිති ඒ රජහුගේ නෑදෑයෝද සෙනෙවිරත් ආදිවූ රාජවල්ලභ අමාත්‍ය පිරිසද නගර වැසියෝද, අන්තඃපුර සත්‍රීහුද යන සියල්ලෝම රැස්ව කොයෙක් උපායයෙන් "ඇස් නොදෙනු මැනව" යි වැළැක්වූහ. නමුත් රජ්ජුරුවෝ ඔවුන් වැළැකූහ. එහෙයින් කියනලදි:—

99. මා නො දෙව අදූ චක්ඛුං මා නො සබ්බෙ පරික්කරි,
ධනං දෙහි මහාරාජ මුත්තා වෙළුරියා බහූ.

100. යුත්තෙන දෙව රථෙ දෙහි ආජානීයෙ අලංකතෙ,
නාගෙ දෙහි මහාරාජ හෙමකප්පනිවාසයෙ.

101. යථාහං සීවයො සබ්බෙ සයොග්ගා සරථාසහ,
සම්පන්නා ප්‍රිකරෙය්‍යුං එවං දෙහි රථෙසභා 'ති,

ඉක්බිති රජ්ජුරුවෝ මතු දක්වන ගාථා තුන කිහ.

102. යො වෙ දසසනානී වඩාන අදතෙ කුරුතෙ මතො,
භුමමං සො පතිතං පාසං ගිවාය පරිවුචචති.

103. යො වෙ දසසනානි වඩාන අදතෙ කුරුතෙ මතො,
පාපා පාපතරො හොති සමපතෙනා යමසාධනං.

104. යං හි යාවෙ තං හි දදෙ යං න යාවෙ න තං දදෙ.
සවාහං තමෙව දසසාමි යං මං යාචති බ්‍රහමණෙ යි.

යමෙක් වනාහි දන් දෙන්නෙමැයි කියා නැවත නොදීම පිණිස සිත් උපදවාද හෙතෙම පෘථිවියෙහි වැටුණු මල පුඩුව ගෙළෙහි ප්‍රවේශ කෙරේ.

යමෙක් දන් දෙමියි කියා නොදීම පිණිස සිත් උපදවාද හේ පාප තරයෙක් වෙයි. යමරජ්ජුරුවන්ගේ ආඥ ප්‍රවර්තනස්ථානවූ උස්සද නරකයට පැමිණෙයි. යම් වස්තුවක් යාචකතෙමේ ඉල්වාද දායකතෙමේ ඒම දෙන්නේය. නොඉල්වූ දෙයක් නොදෙන්නේය. මේ බමුණු මා අතින් ඇස් ඉල්වයි. මුඛතාදි ධන නොයිල්වයි. එහෙයින් මම ඔහුට නෙත්යුවල දන් දෙමි. යනු එහි අර්ථයි.

ඉක්බිති ඒ අමාත්‍යවරු දේවයන් වහන්ස, ආයුෂ වණ් සැප බල ආදීන් අතුරෙහි කුමක් ප්‍රාර්ථනා කොට ඇස් දෙන්නහුදැයි විවාළෝය.

මහාපුරුෂයෝ "මෙලෝ පරලෝ සැපත් පතා නො දෙමි. එතකුදුඋවත් මේ දානපාරමිතාව හෙවත් ඇස් ආදි පඤ්චමහා පරිත්‍යාගය සියලු බොධිසත්ත්වවරයන් විසින් ආචිණ්ණසමාචිණ්ණවූ හෙවත් පුරුදු පුහුණු කරන ලද්දාවූ පෞරාණික මාර්ගය කැයි කිහ.

එහෙයින් කියතලදි:—

105. ආයුං වණණං සුඛං බලං නු කීං පත්ථයානො ජනින්ද දෙසි,
කථං හි රාජා සිවිතං අනුත්තරෝ චකඛුනි දජජා
පරලොකහෙතු.

106. න වාහමෙතං යසසා දදාමි න පුත්තනම්වෙජ්ඣ න ධනං න රට්ඨං
සතංව ධමෙමා චරිතො පුරාණෝ ඉවෙවව දතෙ රමතෙ
මතො මමන්ති.

මේසේ කියා වනාහී රජ්ජුරුවෝ අමාත්‍යයන්ට සංඥදී සිවක තමී වෙද, ඇණවූවෝය. කෙසේදයත්? "සිවකයාණනි, මෙහි එව, මාගේ ඇස්දෙක මේ බ්‍රාහ්මණයාට දත්දීම පිණිස වහා උපුටා අතෙහි තබව යි කියායි.

එහෙයින් වදරන ලදී:-

එහි සිවක උත්‍තෙජේහි මාදිසිකිමා පවෙධයි,
උභොපි නයනා දෙහි උප්පාටෙත්වා වණිබ්බකෙ. (63)

එම්බා සිවකයාණනි, මෙහි එව, උත්සාහවීර්‍ය කරව, හෙවත් මාගේ ඇස් උපුටාදීමෙහි සහාය වෙව, පමා නොකරව, අප මහ රජහුගේ ඇස් කෙසේ උපුටමියි චිත්තෝත්ත්‍රාස වශයෙන් නො වෙවුලව, හෙවත් ශරීර කම්පනයට නොපැමිණෙව. ඇස්දෙකම උපුටා යාචකයාහට දෙවයි මෙසේ කිහ.

තඤ්ච සො චොදිතො මයහං සිවකො වචනං කරො,
උඛණිත්වාන පාදුසි තාලමිඤ්ජං ව යාවකෙ. (64)

ඉක්බිති මා විසින් චොදිතවූ කිකරුවූ සිවකනම් වෙදදුරු තෙම තල්ලොදක් උපුටාගන්නාක්මෙන් ඇස් උපුටා යාචකයාට දුන්නේය.

ඒ වෙදතෙම ඇස් උපුටා රජහුගේ අතට දෙන තැනැත්තේ ශස්ත්‍රයෙන් උපුටා නුදුන්නේය. වැලි කෙසේ උපුටා ගත්තේද යත්? වෛද්‍යතෙම මෙසේ සිතුයේය. "මාවැනි වෙදකමෙහි පළපුරුදුඇති වෛද්‍යයකු විසින් රජහුගේ ඇසෙහි සැතක් හෙල්ම නුසුදුසුය"යි එසේ සිතා බෙහෙත් එකට ගටා කරතලද චූණ්‍යයක් නිලුපුලෙක්හි ගල්වා පරිභාවනයකොට දකුණැසට පොවාලූයේය. එකෙණෙහිම ඇස පෙරලුනේය. දුක් වෙදනා උපන. වෙදතෙම දෙවනුවද බෙහෙත ගල්වා ඇසට පොවාලූයේය. ඇස වළින් මිදුනේය. ඉතාබලවත් වෙදනා උපන්නේය. තුන්වනවර ඉතා දැඩිකොට ගල්වා ඇසෙහි පොවාලූයේය. ඖෂධ බලයෙන් ඇස කරකැවී අක්ෂිකූපයෙන් නික්ම තහරවැලෙහි එල්බ සිටියේය. අධිකතරවූ වෙදනා උපන්නේය. ලේදහර වැගිරෙන්ට පටන්ගත්තේය. හන්සළු, ඇසින් වැහෙන ලේ දහරින් තෙමිගියේය. එකෙණෙහි අමාත්‍යයෝද රජහුගේ අන්තඃපුර සත්‍රීහුද රජ්ජුරුවන් පාමුල වැඳවැටී "දෙවයන් වහන්ස ඇස් නුදුන මැනව, ඇස් නුදුන මැනව"යි මහහඬින් හැඬුවාහුය.

රජ්ජුරුවෝ වෙදනාව ඉවසා "දරුවෙනි, ප්‍රමාද නොකරව"යි කීහ. හෙතෙම "යහපත දේවයන් වහන්සැ"යි කියා වමනින් ඇස් අල්වාගෙන දකුණතින් සැත ගෙන ඇස්හුය කපා දැස අතට ගෙන මහබෝසතාණන්ගේ අතෙහි තිබුයේය. රජ්ජුරුවන් වහන්සේ වමැසින් දකුණැස බලා පරිත්‍යාග ප්‍රීතීන් අභිභවනය (වලකන) කරනු ලබන දුක් වේදනා ඇත්තෝ "බ්‍රාහ්මණය, මෙහි එව"යි කියා බ්‍රාහ්මණයා කැඳවා මට මේ ඇසට වඩා සියක් ගුණයෙන් දහස් ගුණයෙන් සමතැසම ප්‍රියතරය, මේ අක්ෂිදානය තෙම ඒ උතුම් සම්‍යක්සම්බොධි ඤාණ්‍යාත සමතැස්ලැබීමට හේතු වේවායි ප්‍රාර්ථනාකොට බ්‍රාහ්මණයාහට ඇස් දන්දුන්නේය. හෙතෙමේත් ඒ ඇස උඩට නගා තමාගේ ඇස මත්තෙහි තුබුයේය. එය ඔහුගේ ආනුභාවයෙන් පිපියාවූ නිලුපුලක්මෙන් පිහිටියේය. මහාසත්ත්වයෝ වම් ඇසින් ඔහුගේ ඒ ප්‍රකෘතිමත්වූ ඇස බලා "අහෝ මාවිසින් අක්ෂිදානය මොනවට දෙනලද්දේය"යි ඇතුළත උපන් ප්‍රීතියෙන් අතුරු නැතිව පිනාගිය සිරුරු ඇත්තේ අනික් ඇසද දන් දුන්නේය. ශක්‍ර තෙමේත් ඒ ඇසත් ප්‍රකෘතිමත් කොට ගෙන රාජභවනයෙන් නික්ම මහාජනයා බලබලා සිටිද්දීම නුවරින් නික්ම දිව්‍යලෝකයටම ගියේය. රජහුගේ ඇස් වළ නොගැඹි රත්වූ පලස් වටක් මෙන් උඩට නැංගාවූ මස් පිඬෙන් පිරීගොස් සිනියම් රූපයක් මෙන් නැහුනාහුය. වේදනා සංසිඳී ගියේය.

ඉක්බිති මහාසත්ත්වයෝ කීපදිනක් ප්‍රාසාදයෙහි වාසය කොට අඹුවූ මට රාජ්‍යයෙන් කිම්දැයි අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී මඟුල් උයනට හොස් පැවිදිව මහණදම් පුරමිසි සිතා "අමාත්‍යයන්ට ඒ සැටි කියා මුවදෙව්නා පැන් ආදිය දෙන්නාවූ එක් පුරුෂයෙක් තෙම මාගේ සමීපයෙහි වේවා, මාගේ ශරීර කෘත්‍යයට යන්නාවූ ස්ථානයෙහිද රැහැනක් බඳිවුය" යි කියා රත්සිවි ගෙයකින් ගොස් පොකුණුතෙර රාජපර්ය්‍යඞ්කයෙහි උන්සේක. අමාත්‍යයෝද වැඳ සමුගෙන ගියාහුය. බොධිසත්ත්වයන් වහන්සේද තමාගේ දානය ආවර්ජනා කළහ. එකණෙහි සක් දෙව්රජහුගේ පඬුපුල් අස්න හුණුවිය. ශක්‍රයෝ ඒ කාරණය දැක "සිවි මහරජාණන් වහන්සේට වරයක්දී ඇස් ප්‍රකෘතිමත් කරන්නෙමි"යි බෝසතාණන් සමීපයට ගොස් පියවරහඬ කළහ. මහාසත්ත්වයන් විසින් මේ කවුරුදැයි විවාළ කල්හි ශක්‍රයෝ මෙසේ කීහ:-

107. සකෙකාහමස්මි දෙවින්ද, ආගතොසම්ි තව සන්තිකෙ,
වරං වරස්සු රාජිසි යංකිඤ්චි මනසිච්ඡසි තී

රජ්ජුරුවෙනි, මම වතාහි දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රයා වෙමි. මහරජ්ජුරුවෙනි, තොප කැමති වත්තාවූ වරයක් ගනු මැනවයි, ඉක්බිති ඒ අසා බෝසතාණන් වහන්සේ:-

108 පඵුතං මෙ ධනං සක්ක බලං කොසොව තපපකො,
අඤ්ඤස්ස මෙ සතොදනි මරණං වෙව රුච්චති.

යනුවෙන් ශක්‍රයෙනි. මට මුතුමැණික් ආදිවූ සම්පත්ද බොහෝ ඇත්තේය. සෙනා වාහනද අපමණ ඇත්තේය, දැන් වතාහි අඤ්ඤවූ මට මරණයම් රුච්චේ යයි කිහ.

ඉක්බිති ශක්‍රයෝ කියන්නාහු "සිවි මහරජාණනි, කිමෙක්ද, නුඹවහන්සේ හුදෙක් මියයනු කැමතිවදෝහෝ නොහොත් අඩ භාවය කරණකොටගෙන මරණය කැමතිවන්නහුද? මහරජාණනි, දානය නම් හුදකලාවම පරලොව විපාකයම දෙන්නේ නොවෙයි, මෙලොව විපාක පිණිසත් ප්‍රත්‍යය වෙයි. එහෙයින් නුඹවහන්සේගේ දානමය කුශලානුභාවය නිසාම සත්‍යක්‍රියා කළ මැනව, ඒ දානයෙහි ඵලයෙන්ම ඇස් ලබන්නේයයි කිහ. බොධි සත්ත්වයෝ එසේවිනම් මාවිසින් මහාදානයක් මතාකොට දෙන ලද්දේයයි කියා සත්‍යක්‍රියා කරන්නෝ:-

109. යෙපි මෙ යාචිතුමාගතනි නානා ගොත්තා වණ්ණිබ්බකා,
යොපි මං යාචතෙ තත්ථ සොපි මෙ මනසො පියො;
එතෙන සච්චවජ්ජෙන චක්ඛු මෙ උපපජ්ජථ"සි කිහ.

ඉක්බිති උන්වහන්සේගේ සත්‍යක්‍රියාව හා සමග පළමු ඇස පහළවූයේය. නැවත දෙවන ඇස පහළවනු පිණිස:—

110. යං මං සො යාචිතුමාග දෙහි චක්ඛුනති බ්‍රාහමණො,
තස්ස චක්ඛූනි පාදාසිං බ්‍රාහමණස්ස වණ්ණිබ්බතො.

111. භියො මං ආවිසි පිති සොමනස්සං වතපපකං,
එතෙන සච්චවජ්ජෙන දුතියං මෙ උපපජ්ජථ"සිකිහ.

එකෙණෙහිම දෙවන ඇසත් පහළ වූයේය. ඒ ඇස් වතාහි ප්‍රකෘති ඇස්ද නොවෙයි, දිව්‍ය ඇස්ද නොවෙයි, ශක්‍ර බ්‍රාහමණයාට දුන් ඇස් නැවතත් ප්‍රකෘතිමත් කළ නොහැකි වන්නේය. "නැසීගියාවූ චක්ඛුප්‍රසාදය ඇත්තාහට දිවැස පහළ නොවේය"යි

කියතලද ක්‍රමයෙන් ආදී මධ්‍ය පර්‍යවසානයන්හි අවිපරීතවූ තමාගේ දැන ප්‍රීති උදාහරණ ප්‍රීති පැතිරීම් වශයෙන් පහළවූ ඒ ඇස් සත්‍යපාරමිමය ඇස් යයි කියන ලදී.

දදමානස්ස දෙනස්ස දින්නදානස්ස මෙ සතෝ
චිත්තස්ස අනුජානා නත්ථි බොධියායෙව කාරණා, ති (65) සි.

සම්‍යක් සම්බොධියගේ ප්‍රතිලාභය පිණිස යාචකයාහට දෙනු පිණිස වෙදහු ලවා ඇස් උප්පුටවන්කාවූද දෙනලද ඇස් ඇත්තාවූද මාගේ දානාධ්‍යාශයාගේ අත්‍යර්‍ථාභාවයෙක් නුවූයේය. සම්‍යක් සම්බොධිය සුදුලීහ බැවින් මෙබඳු දුෂ්කර දෙයක් මා විසින් කරතලද්දේය. ඇස් හෝ ශරීරය හෝ අප්‍රිය නිසා නොදෙන ලද්දේයයි දක්වන්නෝ:—

න මෙ දෙසස්සා උභො චක්ඛූ අත්තා න මෙ න දෙසස්සියො,
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා චක්ඛූං අදාසහං ති. (66) සි.

මේගය වදාළාහ. මට ඇස් අප්‍රිය නොවෙයි, මට ශරීරයද අප්‍රිය නොවෙයි, මට බුදුබව ආධ්‍යාත්මික වස්තුවලට වඩා ප්‍රියය, එහෙයින් මම ඇස් දුනිමි. යනු එහි අදහසයි.

එකල්හි බෝධිසත්ත්වයන් වහන්සේගේ සත්‍යක්‍රියාවෙන් ඇස් පහළවූ කල්හි ශක්‍රානුභාවයෙන් සියලු රජ පිරිස රැස්වූහ. ඉක්බිති ශක්‍රයෝ අහසෙහි සිට මහාජනයා මධ්‍යයෙහි:—

112. ධම්මෙන භාසිතා ගාථා සිවීනං රට්ඨවඩ්ඪනං,
එතානි තව නෙත්තානි දිබ්බානි පටිලද්ධරෙ.

113. නිරොකුඩ්ඩං නිරොසෙලං සමනීගහයා පබ්බතං,
සමන්තා යොජනසතං දස්සනං අනුභොනතුතෙ, සි.

"සිවි රටවාසීන්ට වැඩම සාදන්කාවූ රජ්ජුරුවෙනි, ඔබවහන්සේ විසින් මේ ගාථාවෝ ධම්යෙන්ම සත්‍යයෙන්ම කියතලද්දහ. තොප විසින් දුන් සාමාන්‍ය ඇස් ප්‍රතිනිධිකොට තොප විසින් දිව ඇස් ලබන ලද්දේය. ඒ ඇස් වතාහි නිත්‍යතයෙන් පිට, පර්‍වතයෙන් පිට, නිබූ වස්තු නොපැකිල දක්නේය. බොහෝ කොට කියනු කිම? හාත්පස යොදුන් සියයක් කුඩා මහත් වස්තු දර්‍ශනය කරන්නේය." යන මේ ලෙසින් සතුතිකොට දිව්‍යලොකයට ගියෝය. බොධිසත්ත්වයන් වහන්සේද මහාජනයා විසින් පිරිවරන ලදසේක් මහත් සත්කාර සම්මානයෙන් නුවරට පිවිස රාජ ගෙහවාරයෙහි මනාකොට සජ්ජිත කරතලද මහාමණ්ඩපයෙහි

තඟක ලද සේසත් ඇති සිංහාසන මසතකයෙහි හුන්සේක් නෙත්‍රප්‍රතිලාභයෙන් තුටුපහටුව උන්වහන්සේ දැකීමට පැමිණි නුවර වැස්සන්ටද දනවු වැසියන්ටද රාජපිරිසටද ධර්මදේශනා කරතසේක්:—

114. කොනීධ විත්තං න දදෙය්‍ය යාචිතෝ
අපිවිසිටයංසු පියම්පි අත්තනෝ,
තදිඛ සබ්බෙ සිවයෝ සමාගතා
දිබ්බානි තෙත්තානි මමජ්ජ පස්සථ.

115. තිරොකුඩ්ඩං තිරොසෙලං සමතිග්ගය්හ පබ්බතං,
සම්පත්තා යොජනසතං දස්සනං අනුභොන්ති මෙ.

116. න චාගමත්තා පරමත්ති කිඤ්චි මච්චානං ඉධ ජීවිතෙ,
දත්වාන මානුසං චක්ඛුං ලද්ධං මෙ චක්ඛු අමානුසං.

117. එතම්පි දිස්වා සිවයෝ දෙථ දානානි භුඤ්ජථ,
දත්වා ච භුත්වා ච යථානුභාවං අනිඤ්ජිතා
සග්ගමුපෙන්ති ඨානඤ්ඤං.

"මේ ලොකයෙහි යාචකයන් විසින් යාච්ඤා කරනලද කවර නම් උත්තමයෙක් තමහට ප්‍රියවූ විශිෂ්ට වස්තුවක් නවුත් නො දෙන්නේද, එහෙයින් මෙතැන්හි රැස්වූ සියලු සිවිරටවැසියනි, ප්‍රියවූ ඇස් දීමෙහි විපාකයෙන් අද දිවනෙත් ඇත්තාවූ මා බලව. මේ ලොකයෙහි උපන් සත්ත්වයන්ට දානයට වඩා පරම ප්‍රතිෂ්ඨාවක් නැත්තේය. අන්‍ධබ්‍රාහ්මණයාට මසැස් දන්දීමෙන් මා විසින් දිවඇස් ලබනලද්දේය. "සිවිරට වැසියෙනි, මේ දෘෂ්ටානුගතය දැක හෙවත් මා ලද දිවැස්දැක පළමුකොට දන්දී පසුව අනුභව කරව. මෙපරිද්දෙන් දානාදී කුසල් කොට සුගතිපදප්‍රාප්ත වවු" යයි යන මේ ලෙසින් වදළසේක. මෙසේ මේ සතර ගයෙන් හුදෙක් ඒ ඇසිල්ලෙහි පමණක් නොව වැළි එතැන්පටත් අඩමසක් අඩමසක් පාසා පසළොස්වක් පොහොයෙහි මහාජනයා රැස්කරවා ධර්මදේශනා කළසේක. මහාජනතෙම දානාදී කුසල්කොට දිව්‍ය ලොකපරායණ වූයේය.

එකල්හි සිවක නම් වෛද්‍යතෙම **ආනන්දස්ථවිර** වූයේය, ශක්‍ර තෙම **අනුරුද්ධස්ථවිර** වූයේය, අවශෙෂ පිරිස බුදුපිරිසමය, **සිවි රජ්ජරුවෝ** නම් ලොකසවාමි **බුදුරජාණන්වහන්සේය.** මේහිද කියනලද ක්‍රමයෙන් උන්වහන්සේගේ පාරමිහු සුදුසු පරිදෙන් නිර්ණය කටයුත්තාහුය.

දවසක් දවසක් පාසා යම්සේ නුදුන්විරූ බාහිර දෙයධර්මයක් නොවේද, එසේ අපරමිත මහාදානය පවත්වන්නේ නමුදු එයින් සතුටු නොවූ ආධ්‍යාත්මික දානයක් කෙසේ දෙන්නෙම්ද, කවර කලෙක වතාහි කිසි යාචකයෙක් මා සමීපයට අවුත් ආධ්‍යාත්මික දෙය ධර්මයක් ඉල්වන්නේද, ඉදින් කිසි යාචකයෙක් මා සමීපයට පැමිණ මාගේ හෘදය මාංශ ඉල්වන්නේනම් කටුවකින් එය ගෙන හැර පහත් ජලයෙන් සහමුලින් තලයත් සමග පියුමක් උදුරා ගන්නා කලක්මෙන් උපුටාගෙන ලේබින්දු වගුරව වගුරවා හෘදය දෙන්නෙමි: ඉදින් ශරීරමාංශ ඉල්ලන්නේ නම් අවලෙඛනියකින් (පන්හිඳෙකින්) තල්ගුළපටලයක් උපුටන්නාක් මෙන් ශරීර මාංශය උපුටාදෙමි; ඉදින් ලේ ඉල්ලන්නේ නම් සැනින්සිඳ යන්ත්‍රමුඛයෙහි පවා නොවැරී එලවන ලද භාජනය පුරා ලේගෙන දන් දෙමි, ඉදින් වතාහි කිසි යාචකයෙක් අවුත් "භවත, මාගේ ගෙයි කම්නැත නොපවති, එහි මට මෙහෙකරව"යි කියන්නේ නම් රජවෙස් හැරපියා ඕහට ගැතිව මෙහෙ කෙරෙමි, ඉදින් කිසිවෙක් ඇස් ඉල්ලන්නේනම් තල්ලොදක් පරිද්දෙන් උපුටා ඇස් දෙමි"යි මෙසේ අනන්‍ය සාධාරණ වසිභාවයට පැමිණි බොධිසත්ත්වයන්ගේම ප්‍රවේණියක්වූ අතිශයින් මහත් පරිවිතර්කෝත්පත්තියද, ඇස් ඉල්ලන්නකු ලැබ අමාත්‍යාදීන් විසින් වලකනු ලබනු කල්හිදු ඔවුන්ගේ වචන නොගෙන තමන්ගේ පරිවිතර්කයට සුදුසු ප්‍රතිපත්තියෙන් පරම ප්‍රීතීන් යුක්තවීමද, පරම ප්‍රීති සිත කරණකොටගෙන අවිතථ භාවය නිසා ශක්‍රයා ඉදිරියේ සත්‍යක්‍රියා කිරීමද, ඒ කරණකොටගෙන තමන්ගේ ඇස් නැවත ප්‍රකෘතිමත්වූ බවද, ඒ නෙත්‍රයන්ගේ දිව්‍යානුභාවයද යන මේ ආදි මහාබොධිසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ දතයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි
අවවන ඕවිරාජ චරිතය නිමි.

IX වෙස්සන්තර චරිතය

තවද මේ පරමාභිදීපනී නම් බුද්ධාපිටක අට්ඨකථාවෙහි තවවන වෙස්සන්තර චරිතය කිසේදැ? යත්:—

යා මේ අතෝසි ජනිකා පුසතිනාම බතනියා,
සා අතිතාසු ජාතිසු සකාසසව මහෙසියා. (67).

වෙස්සන්තර රජවූ මාගේ ක්ෂත්‍රියවංශොද්භූත පුසති නම් යම් මවක්විද, ඔතොමෝ අතීත ජාතියෙහි සක්දෙව්රජහුගේ අගමෙහෙසි විය, නොහොත් මාගේ පශ්චිමාත්මභාවයෙහි මහාමායා නම්වූ යම් මවක්විද, ඔතොමෝ අතීතජාතියෙහි පුසති නම් මෙහෙසිවිය, එකල්හි මම උත්කෘෂ්ට වෙස්සන්තරව උපතිමි. ඕ ඊට අනතුරුව ඉකුත්වූ ජාතියෙහි සක්දෙව්රජහුගේද මෙහෙසිවිය. මේහි පිළිවෙළ කථාව කෙසේදැයත්:—

මීට එකානුවන කල්පයෙහි විපස්සි නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූසේක. උන්වහන්සේ බන්ධුමති නුවර නිසා බෙම නම් මෘගදායයෙහි වැඩවාසය කරන කල්හි බන්ධුමති රජාණෝ කිසිවකු විසින් රජහට එවනලද මහාඛීවූ සඳුන්හරක් තමාගේ වැඩිමහල් දියණියන්ට දුන්හ. ඕතොමෝ ඒ සඳුන්හරින් සියුම්වූ සුණක්කොට කරවූවක් පුරවා (විහාරයට ගොස්) ශාස්තෘන් වහන්සේගේ සවණීවණ්ඨවූ ශරීරයට පුදා සෙසු සඳුන් සුනු ගඳකිළියෙහි විසුරුවා සවාමිනි, මමද අනාගතයෙහි නුබ සේම ලොවුතුරා බුදුකෙනෙකුන්ට මව්වෙම්වයි ප්‍රාර්ථනා කළදැඟ. ඕතොමෝ එයින් සැව ඒ කුසල විපාකයෙන් රත්සඳුන් පැහැයෙන් යුත් සිරුරු ඇතිව දෙවියන් කෙරෙහිද මනුෂ්‍යයන් කෙරෙහිද හැසිරෙන්නී තව්තිසා භවතයෙහි සක්දෙව් රජහුගේ අගමෙහෙසිව උපත්තාඟ. ඉක්බිති ඇගේ ආයු කෙළවර පෙරනිමිති පහළවූකලැ සක්දෙව්රජාණෝ ඇගේ ආයුඃක්ෂය වූබැව් දැන ඇට අනුකම්පා පිණිස සොඳුර පුසතියැ, තිට වර දසයක් දෙමි ඒ "වර ගනුව" යි කිහ. එහෙයින් කියතලදි:—

තසසා ආයුඛබයං ඤත්වා දෙවින්දෙ එතදබ්‍රවි,
දදාමි තෙ දසවරෙ වරහදෙ යදිචජඝි. (68)
එවං වුතතා ච සාදෙවි සකකං පුනිදමබ්‍රවි,
කිනනු මෙ අපරාධනති කිනනු දෙසසා අහං තව,
රමමා වාවෙසි මං ඨානා වාතොව ඛරණීරුහං" සි. (69)

මෙසේ කියනලද ඒ දෙවිතොමෝ තමා දෙව්ලොවින් චුතවන බව තොදැන තැවත සක්දෙව් රජහට මෙසේ කීය, කිම? මාගේ දෙශයෙක් ඇත්තේද, කවර හෙයකින් නුබවහන්සේට මම අප්‍රිය වෙම්ද? රැකක් උපුටා හෙලන්නාවූ ප්‍රචණ්ඩ මාරුතයක් මෙන් සිත්කලු මේ දිව්‍යලොකයෙන් මා චුතකරනු කැමැත්තේදැ?යි,

එවං වුත්තෙනා ච සො සක්කො පුන තඤ්චිදමබ්‍රවි,
නවෙව මෙඤ්ඤතං පාපං න ච මෙඤ්ඤ මයි අප්පියා (70)

එතඤ්ඤං යෙව තෙ ආයු චවනඤ්ඤාලො භවිස්සති,
පටිගහණා මයා දින්නෙන වරෙ දසවරුත්තමෙ. (71) යි

මෙසේ කියනලද්දාවූ සක්දෙව්රජාණෙනි තැවත මෙහෙයියට කියන්නෝ "නි විසින් කිසි අපරාධයෙක් නොකරන ලද්දේය, නි මට අප්‍රියද නො වෙහි; නිගේ ආයු මෙපමණය, චුතවන කාලය එළඹ සිටියේය, මා විසින් දෙනලද්දාවූ වරයන් අතුරෙන් උතුම්වූ වර දසය පිළිගනුවයි කීහ.

ඕ තොමෝ තමාගේ ආයුඃක්ෂයය දැන සක්දෙව්රජ විසින් වරදෙනු සඳහා කරතලද අවකාශ ඇත්ති සියලු දඹදිව්තලය බලන්නී තමහට සුදුසුවූ සිව්රජහුගේ නිවෙසනය දැක මේවර ගත්තීය. එනම්:- සිවිරජහුගේ අගමෙහෙසි බවය, නිල්වන් නෙත් ඇතිබවය, නිල්වන් බැම ඇතිබවය, ඵුසති යන නම ඇති බවය, ගුණ විශෙෂයෙන් යුත් පුත්‍ර ප්‍රතිලාභය, උස්නුවූ කුස ඇති බවය, නොඑල්බෙන පියයුරු ඇතිබවය, නොපැසුණු හිසකේ ඇතිබවය, සියුම් ඡවි වණ්ණ ඇතිබවය, වදයට පැමිණි ජනයන් මුදවාලන්ට සමර්ථබවය, යන මොහුයි.

සක්කෙන සා දින්නවරා තුට්ඨහට්ඨා පමොදිතා,
මමං අබ්භනනරං ඤත්වා පුසති දසවරෙ වරී. (72) සි

එහෙයින් කීහ. සක්දෙව්රජ විසින් දෙනලද වර ඇති, තුටු පහටු සිත් ඇති, ප්‍රමුදිතවූ සිත් ඇති, ඒ ඵුසති දෙවිතොමෝ මා වරයන් කෙරෙහි ඇතුළත් කොට වරදසය ගත්තීය.

මෙසේ ඕතොමෝ වරදසය ගෙන එයින් චුතවූවා මඳුරජ හුගේ අගමෙහෙසිය කුස උපන්නීය. උපදිනු ලබන්නිද සඳුන් සුන්නෙන් තවරතලද ශරීරයකින් උපන්නීය. එහෙයින් ඇට නම්කරන්නාවූ දවසෙහි ඵුසති යයි නමක් කළාහුය, ඕතොමෝ මහත් පිරිවරින් ශුක්ලපක්ෂාභිවර්ධිමාන චන්ද්‍රමණ්ඩලානුකාරයෙන් වැඩී සොළොස් හැවිරිදි කලැ උත්තම රූප ඇත්තිවිය.

ඉක්බිති ඇ ජෙතුත්තර නුවර සිවි මහරජහු පුත් සංජය කුමාරයන් පිණිස කැඳවා ගෙනවුත් සේසත් තංවා සොළොස් දහසක් සත්‍රීන්ට ප්‍රධානකොට අගමෙහෙසි තනතුරෙහි තුබුයේය. එහෙයින් වදුරතලදී. බුදුන් විසින්:-

තතො මුනා සා ථූසති ඛත්තියෙ උපපජ්ජථ,
ජෙතුත්තරඤ්හි නගරෙ සඤ්ජයෙන සමාගමි. (73)

එසේ අගමෙහෙසි තනතුරෙහි තබනලද ඕතොමෝ සදමහ රජහට ප්‍රියමනාප විය. ඉක්බිති ශක්‍රයෝ ආවර්ජනා කරත්තෝ ථූසති දෙවියට දුන් වර අතුරෙන් තවවරයක් සමෘධිය, පුත්‍රවරය අසමෘධිය යි දැක එයද දෙන්නෙමියි සිතූහ. එසද තව්තිසා දෙව් ලොව සිඹිණවූ ආයුෂ ඇති අප මහා බොධිසත්ත්වයන් වහන්සේ සම්පයට ගොස් නිදුකාණෙනි, නුඹවහන්සේ විසින් මනුෂ්‍ය ලොකයෙහි සිවිරජහුගේ අගමෙහෙසුන් කුස පිළිසිඳගන්ට වට නේයයි කියා උන්වහන්සේගෙන්ද දෙව්ලොවින් චුතවන්කා වූ අනිඳුන් සැටදහසක් දිව්‍යපුත්‍රයන්ගෙන්ද ප්‍රතිඥගෙන ශක්‍රභවන- යටම ගියහ. මහා සත්ත්වයෝද එයින් සැව ථූසති නම් අග මෙහෙසුන් කුස පිළිසිඳගත්සේක. සෙසු දිව්‍යපුත්‍රයෝ සැටදහසද ඇමතිවරයන්ගේ ගෙවල පිළිසිඳගත්හ. මහාසත්ත්වයන් මවුකුස වන් කල්හි ථූසති නම් දෙවියට නුවර සිවුදොරද නුවර මැදද වහසල්දොරදූයි යන මෙකී තන්හි දානශාලා සයක් කරවා දවස දවස සයලක්ෂය බැගින් වියදම්කොට දන්දීමට දෙළක් විය. රජ්ජුරුවෝ එපවත් අසා නිමිති දන්නාවූ බ්‍රාහ්මණයන් කැඳවා ඔවුන් අතින් බිසවුන්ට හටගත් දෙළ විචාළසේක. "මහ රජ්ජුරුවෙනි, දේවීන් කුස දන්දීමෙහි ඇලුම් ඇති මහාසත්ත්ව කෙනෙක් පිළිසිඳගත්හ. ඔව්හු දන්දීමෙන් තෘප්තියකට නො පැමිණෙන්නාහ යි කිහ. රජ්ජුරුවෝ ඔවුන් විසින් කියනලද වචනය අසා සතුටු සිත් ඇත්තෝ යටකියනලද පරිදි දානයක් පිහිටුවාළුහ. ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී යාචකාදීන් සන්තර්පණය කළහ. බොධිසත්ත්වයන් වහන්සේ මවුකුස පිළිසිඳ ගැන්මෙහි පටන් රජහුගේ අය මෙතෙකැයි පමණකළ නොහැකි වූයේය. උන්වහන්සේගේ කුසලානුභාවයෙන් සියලු දඹදිව රජදරුවෝ පැවුරු යවත්. එහෙයින් වදුරන ලදි:-

යදහං ථූසතියා කුච්ඡිං ඔක්කන්තො පියමාතුයා,
මම තෙජන මෙ මානා සබ්බ දානරතා අහු. (74) යි

අඩ්ඪෙ ආතුරෙ ජිණ්ණෙ යාවඤ්ච අධිවාසනෙ,
සම්මණ්ඩාහම්මණ බීමණ දෙති දූනා අභිඤ්ඤවනෙ. (75)

බිසවු මහත් පරිහාරයෙන් ගහිය පරිහරණය කරත්නෝ දසමස පිරුණු සඳ නුවර දනිතා කැමතිව එපවත් රජහට සැළකළහ. රජ්ජුරුවෝ දෙව්නුවරක් මෙන් නුවර අලංකාර කරවා උතුම් රථයට දේවිය නංවා නුවර ප්‍රදක්ෂිණා කැරැවූහ. බිසවුන් වෛශ්‍ය යන්ගේ ළිපිය හෙවත් වෙළඳුන්ගේ ළිපිය මැදට පැමිණිකල්හි ඇගේ කම්ජවාතයෝ වලිතවූහ. හෙවත් විදි පහළහ. අමාතෘයෝ එපවත් රජහට සැලකළහ. රජ්ජුරුවෝ බිසවට වෙළඳුන්ගේ ළිපියෙහිම සූතිකා ගෘහයක් කරවා රැකවල් ලැවූහ. දේවි එහිදීම අනුපම රූපලාවණ්‍යයෙන් හා අතුල්‍ය ප්‍රඥාවෙන් යුක්තවූ පුතණු කෙනෙකුන් වැදූහ.

දසමාසෙ ධාරයිත්වාන කාරොහෙන පුරපදක්ඛිණං,
වෙස්සානං විජියා මජ්ඣෙ ජනෙසි පුඤ්ඤවා මමං. (76)

මාගේ නාමය මාතෘ සම්බන්ධ නොවෙයි, පිතෘ සම්බන්ධ කොවෙයි. යම්හෙයකින් වෛශ්‍යයන්ගේ හෝ වෙළඳුන්ගේ ළිපි අනතරයේදී උපන්නෙම්ද, එහෙයින් වෙස්සන්තරයයි නම් විය. එහෙයින් වදළහ.

න මයහං මාතුසන්තකං නාමං න පිතුසන්තකසම්භවං,
ජාතෙඤ්ච වෙස්සවිජියං තස්මා වෙස්සන්තරො අහූ. (77)

මහාසත්ත්වයෝ කිසිද කුණපයකින් නොමුසුව සුපිරිසිදුව විසාරදව ඉදුනිල්මිණියේ ඇස් දල්වා මවුකුසින් බිහිවූසේක. බිහිවූ ඇසිල්ලෙහිම මවුදෙසට අතදිහුකොට මැණියනි, දන්දී පියන්ට කිසිවක් ඇද්දැයි විවාළෝය. ඉක්බිති මැණියෝ පුතණු වෙනි, "තොප අදහස් පරිද්දෙන් දෙව"යි දහසක් බදපියල්ලක් අත තුබූදූය. බොධිසත්ත්වයෝ මහෞෂධ ආත්මභාවයෙහිද, මේ වෙස්සන්තර ආත්මභාවයෙහිද, පශ්චිමාත්මභාවයෙහිදූයි මේ තුන් අත්බැවිහි උපන් ඇසිල්ලෙහි කථාකළසේක රජ්ජුරුවෝ මහාසත්ත්වයන්ට අනිදිඨාදි දෙඅයන්ගෙන් වෙන්වූ මිහිරි කිරි ඇති සිවුසැටක් කිරිමවුවරුන් එළවූහ. උන්වහන්සේ සමග උපන් සෙසු සැටදහසක් දරුවන්ටද කිරිමවුවරුන් දෙවෙච්චෝය. බොධිසත්ත්වයෝ සැටදහසක් ළදරුවන් හා සමග මහත් පිරිවරින් පෙරඩමස සඳසේ වැඩෙනසේක. රජ්ජුරුවෝ බෝසතාණන් වූහන්සේට කුමාර පළඳනාවන් ද කරවූහ.

බොධිසත්ත්වයෝ සතරවස්හි ඇවිරිදි කල ඒ පළඳනාව මුදුපියා කිරිමවුන්ට දී නැවත උන් විසින් දෙනුලබන්නෝද නොගන්නා සේක. රජ්ජුරුවෝ එබස්අසා මිනිසුන් විසින් යහපත් දීමනාවක් දෙන ලද්දේයයි කියා වෙසත් ආභරණයන් කැරැවූහ. බෝසතාණෝ එයද පෙරසේම දුන්සේක. මෙසේ ළදරුකල්හිම නවවරක් කිරිමවුන්ට පළඳනා දුන්හ අටහැවිරිදිකල යහනාවෙහි වැඩහිඳ මේසේ සිතූහ: සර්ව්වඥ්ඥතාදී බාහිර විසතු පරිත්‍යාගය මාගේ සිත නොපිණවන්නේය. එහෙයින් ආධ්‍යාත්මික අඞ්ග ප්‍රත්‍යඞ්ගාදිය දන්දෙනු කැමැත්තෙමි. ඉදින් කිසිවෙක් මාගෙන් හෘදය මාංසය ඉල්වන්නේ නම් ඔහුට හෘදයමාංශය උපුටා දෙමි. ඇස් ඉල්ලන්නේ නම් ඔහුට ඇස් උපුටා දෙමි. මුළු ශිරැරෙහි මස් හෝ ලේ හෝ ඉල්වන්නේ නම් ඔහුට මුළු ශරීර මාංශය කපාද, සැනින් විද ලේ ද දෙන්නෙමි. නැවතද කිසිවෙක් මට දුස වෙවයි දුස මෙහෙවර ඉල්ලුයේනම් "මොහුට මම දුසවෙමි"යි අස්වාලා ඔහුට තමා දුසත්ත්වයට දෙමි"යි මේසේ බෝසතාණන් යථාභූත සවභාවය හා කෘත්‍යය සිතමින් සිටියදී සතර තහුතයක් (දස දහසක්) ඉතිරිකොට දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් බොලඳැනි මේ මහ පොළොව, දිය පොළොව කෙළවර කොට කම්පිතවූයේය. මහාමේරුපර්වතරාජයා තැම් ජෙතුත්තර තගරා නිමුබව සිටියේය. එහෙයින් වදුරත ලදී.

"සදිසං දුරඩෝ හොමි ජාතියා අට්ඨවස්සිකෝ,
තද නිසජ්ජ පාසාදෙ දානං දාතුං විචින්තයිං. (78)

හදයං දදෙය්‍යං චක්ඛුං මංසම්පි රුධිරම්පිච,
දදෙය්‍යං කායං සාවෙඩෝ යදි කොචි යාචයෙ මමං, (79)

සබ්බාවං චින්තයන්තස්ස අකම්පිතමසංසිතං,
අකම්පි තත්ථ පඨවි සිනෙරුවර චතංසකා." (80) යි

මේලෙස පොළොව කම්පිත වන කල්හි මධුර ගම්භීරවූ මෙඝය ගර්ජනා කරමින් ක්ෂණික වැසි වැස්සේය. විදුලිය පැහැර ගියේය. මහා සාගරය කැලඹිණ සක්දෙවිරජාණෝ අත්පොළසන් දුන්හ. මහාබ්‍රහ්මයෝ සාධුකාර දුන්හ. බඹලෝ දක්වා එක කොලාහල වූයේය. මහාසත්ත්වයෝ සොළොස්හැවිරිදි කල්හිම සියලු ශිල්පයන්ගේ පරතෙරට පැමිණියහ. ඉක්බිති සඳමහ රජ්ජුරුවෝ උනවහන්සේට රජය දෙනු කැමැත්තෝ මවු සමග කථා කොට මදුරජ කුලයෙන් මසිලණුවන් දූවූ මද්‍රී නම් දෙවිය කැඳවා ගෙනවුත් සොළොස් දහසක් ස්ත්‍රීන්ට ප්‍රධානවූ

අග මෙහෙයුන් කොට මහසතාණන් රජයෙහි අභිෂෙක කළෝය. මැතකාලයෙහි මදී දෙවිතොමෝ පුතකු වැදුවාය. ඔහු රන්දූලකින් පිළිගත්හ. එහෙයින් උන්ට ශාලියකුමාරයයි නම් කළාහුය. ඔහු පියවර තබා යන අවස්ථාවෙහි කිසවු තොමෝ දුවක වැදුවා ඕ කාෂ්ණවර්ණ අදුන්දිවි සමයින් පිළිගන්නා ලදී. එහෙයින් ඇට කාෂ්ණායයි නම් කළාහුය. මහාසත්ත්වයෝ රජයෙහි පිහිටි තැන් සිට දවසක් පාසා සයලක්ෂයක් බැගින් වියදම් කොට මහදන් පවත්වන්නෝ අඩමසක් පාසා පුතු පොහොයෙහි ප්‍රත්‍යය නම් මහුලැතු පිට කැහි දන්හල බලන්ට වඩකාසේක. හෙවත් දන් දෙනුවට ඵලඹෙනසේක. මේ ඇතු වකාහි බෝසතාණන්වහන්සේ ලොව පහළවූ දිනයෙහි ආකාශචාරි ඇතින්නක ගෙනවුත් මඬගල හස්ති සථානයෙහි තබා ගියාසයි දනයුතු මහාසත්ත්වයන් ප්‍රත්‍යය කොට ලැබුනු බැවින් හස්තියාට පච්චය යි නමක් කළාහුය. එහෙයින් වදරන ලදි:-

"අතවඩ මාසෙ පණ්ණරසෙ පුණ්ණමාසෙ උපොසථෙ,
පච්චයං නාග මාරුය දනං දතුං උපාගමි." (81) සි

එකල්හි කළිඟුරට වැසි බ්‍රාහ්මණයෝ අටදෙනෙක් මා කරා එලඹියාහුය. එළඹ කළිඟුරට වතාහි වැසි තොවැස දුර්භික්ෂභය හා ඥාතකභය උපන එහෙයින් සම්භාවිත ධවලවූ මඬගල හස්තිරාජයා දුන මැනවයි කියා යාච්ඤා කළෝය. එහෙයින් වදළහ.

"කාළිඞරට්ඨවිසයා බ්‍රාහ්මණා උපගඤ්ඡුමං,
ආසාචුං මං හත්ථිනාගං ධඤඤං මඞගලසම්මතං (82)

අවුට්ඨකො ජනපදෙ දුබ්භික්ඛෙඛා ඡාතකෙ මහා,
දදාහි පවරං නාගං සබ්බසෙතං හයුත්තමං"සි (83)

බොධිසත්ත්වයන් වහන්සේ උතුම් ඇත් කදපිට කැහි

දදාමි න විකම්පාමි යං මං යාචන්ති බ්‍රාහ්මණා,
ඤාණං න පරිගුය්හාමි දනෙ මෙ රමතෙ මනො. (84)

යනුවෙන් "බ්‍රාහ්මණයෙනි, තෙපි මගෙන් යමක් ඉල්වත්තාහුද, එය දෙමි. ලොභාදි වශයෙන් කම්පිත නොවෙමි. තමා සතු දෙයධර්මයන් නො සඟවමි. මාගේ සිත දන පාරමිතාවෙහි ඇලේ"යයි තමන්ගේ දානාභිරතිය ප්‍රකාශ කරමින්:-

න මෙ යාචඤඤහෙතුපපත්තෙන පරිකප්පතො අනුව්‍යඤ්ජනො,
මා මෙ භිජ්ජි සම්මදනං දස්සාමි විපුලං ඉදං. (85)

"යාචක ජනයා පැමිණි කල්හි ප්‍රතික්ෂේප කිරීම මට නුසුදුසු වන්නේය. යම් දැන පාරමිතාවක් පුරන්නෙමිසි මා විසින් සම්පාදන්වන ලද්දේද, ඒ දැනපාරමී සම්පාදනය නොබි දේවා. ගුණයෙන් මහත්වූ හස්තිරාජයා දන් දෙන්නෙමි"සි,

මේසේ හස්තිරාජයා දෙන්නෙමියි ප්‍රතිඥාදී ඇතුපිටින් බැස පියා නොසැරහුනාත් බලනු පිණිස පැදකුණුකොට (නොසැරහුනෙනක්) නොදැක සුසුම් මුසු සුවද පැන් පිරුණු රන්කෙණ්ඩිය නෙත පිත්වත්නි, "මෙහි එවු" යයි කියා සරසා පියනලද රිදී දමක් වැනි ඇත්සොඬ ඔවුන් අත තබා පැන් වත්කොට ඇතු දන්දී වදළසේක. එහෙයින් කියන ලදි:-

"නාගං ගහෙත්වා සොණ්ඩාය හිංකාරෙ රතනාමයෙ,
ජලං හත්ථෙ ආකිරිත්වා බ්‍රාහ්මණානං අදං ගජං"සි (86)

ඒ ඇත්රාජයාගේ සතර පයෙහි ලූ ආභරණයෝ අසූහාර දහසක් අගනහ. දෙපාගිවයෙහි පැළන්දුවූ ආභරණයෝ දෙලක්ෂයක්ද, (යට) උදරයෙහි කම්බිලිය ලක්ෂයක්ද. පිටෙහි මුතු දුලය, මිණිදුලය, රත්දුලය, යන දුල්තුන තුන්ලක්ෂයක්ද, උභයකණ්ඨාලංකාරයෝ දෙලක්ෂයෙක්ද. පිටෙහි අතුරතලද කම්බිලිය ලක්ෂයක්ද, කුම්භාලංකාරය ලක්ෂයක්ද, මුදුන් මල්කඩ තුන තුන්ලක්ෂයක්ද, කණ්ඨාවලාලංකාරය ලක්ෂයක්ද, දන්තාලංකාරය දෙලක්ෂයක්ද, සොඬෙහි සොවන්නිකාලංකාරය ලක්ෂයක්ද, තංගුඨ (ලාංගුලා) ලංකාරය ලක්ෂයක්ද වටනේය. පිටෙහි තැගෙන හිණ ලක්ෂයක් වටනේය. අනුභව කරන තලිය ලක්ෂයක්ද වටනේය. මෙපමණක්ම ගණන් වශයෙන් සුවිසි ලක්ෂයක් අගනේය. උරහිස්පිටෙහි සිළුමිණද, මිණිමුතුහරද, මිණිඅංකුසයද, හස්තිහුගේ ගෙලවෙළන මුතුහරද, කුඹුම්ණදැසි යන අනඝී වස්තු සදෙන "හත්ථි අනඝී වත්ථූනි"සි හස්තිරාජයා සමගම සපා අනඝී කෙතෙක් කොට ඒ සියලු වස්තූන් බමුණන්ට දුන්හ. එසේම හස්තිහුගේ පරිවාරකවූ කුල පන්සියයද හස්තිමේණ්ඩක හස්තිගොපකයන්ද සමග දන්දෙන කල්හි යට කියනලද ක්‍රමයෙන් පෘථිවිකම්පනාදිය සිඛ විය. එහෙයින් කියන ලදි:—

"පුනාපරං දදතෝසස සබ්බසෙතං ගජුත්තමං,
තදුපි පඤ්චකම්පි සිනෙරුවනවටංසකා"සි (87)

තැවත සම්‍යඟ ධවලවූ සුවිසිලක්ෂණයක් අඟතා හස්ත්‍යලංකාර භාණ්ඩ සමඟ උතුම්වූ හස්තිරාජයා දෙතකල්හි මහමෙර පිනිටියාවූ නන්දන - චාරුසක - චිත්‍රලතාවනයන් මුදුන් මල්කඩ කොට ඇති තොහොත් මහමෙරද ජම්බුද්වීපයෙහි සිත්කලු වනද මුදුන් මල්කඩක්කොට ඇත්තාවූ පෘථිවීතොමෝ කම්පිත විය. ජාතක යෙහිද මෙමෑ වදුරන ලද්දේය.

118 "තදසි යං හිංසනකං තදසි ලොමහංසනං,
හත්ථිකායෙ පදිස්සන්ති මේදිනී සම්පකම්පථා"යි

බ්‍රාහ්මණයෝ වනාහි හස්තිරාජයා පිට නැඟී මහාවාරයෙන් පිවිස නුවර මැදින් ප්‍රයාණය කළහ. මහාජනයා විසින් පින්වත් බ්‍රාහ්මණයෙනි, කිමෙක්ද අපගේ හස්තිරාජයා කවර තැනකට නෙනයවූදැයි කීකල්හි "තෙපි කවුද වෙස්සන්තර රජ්ජුරුවන් විසින් අපට හස්තිරාජයා දෙතලද්දේය"යි කියා හස්තාමුඛවිකාරාදි කොයෙක් උසුළු පාමින් ගියාහුය. ඉක්බිති අමාත්‍යයන් ආදි කොට ඇති මහජනතෙම රාජවාරයෙහි රැස්ව රජ්ජුරුවන් වහන්සේ විසින් ශ්‍රද්ධා ඇතහොත් බ්‍රාහ්මණයන්ට මුක්තාමාණික්‍යාදි ධනයක් හෝ ශාලිව්‍රීහි ආදි ධාන්‍යයක් හෝ දැසිදස් මෙහෙකරුවෙක් හෝ දියයුතුවන්නේය. කෙසේ වනාහි වෙස්සන්තර රජ්ජුරුවෝ මඟුලැතු දෙනසේක්ද, ඕන් මතු රාජ්‍යය වතසාපියන්ට නොදෙන්නෙමුයයි ගරහා පියා ගොස් සදමඟ රජ්ජුරුවන්ට සැලකළහ. ඔව්හු හුදෙක්,

119 "මා නං දණ්ඩෙන සත්තේන න හි සෝ බන්ධනාරහෝ,
පබ්බාජෙහි ච නං රට්ඨා වංකෙ වසතු පබ්බතෙ."

යයි කීහ.

එහි අර්ථය නම් "දෙවයන්වහන්ස, උන්ට දණ්ඩෙන් සැනින් හෝ තහමක් තැළුව මැනව. බන්ධනයටද සුදුසු නැත, වංකගිරියෙහි වාසය කෙරේවයි කියා උන් රටින් නෙරනු මැනව" යනුයි

"තස්ස නාගස්ස දුන්නෙන සිවයෝ කණ්හා සමාගතා,
පබ්බාජෙසුං සකා රට්ඨා වඞ්කං ගච්ඡතු පබ්බතං," (88)

යනු එහෙයින්ම කියන ලදි.

සංජය රජ්ජුරුවෝද "මේ විරූඩ පිරිස වනාහි මහත්ය, එබැවින් මපුතණුවෝ කිප දිනක් නුවරින්පිට වාසය කෙරෙත්ව"යි සිතා

120 "එසෝ වෙ සිවිනං ඡත්තෙ ඡත්තං තපත නුදමසෙ,
ඉමං සෝ එසතු රත්තිං කාමෙව පරිභුඤ්ජතු.

121 තතෝ රත්‍යා ව්‍යවසාතෙ සුරියුග්ගමනං පති,
සමිග්ගා සිවයෝ හුත්වා රට්ඨා පබ්බාජයන්තු නං" කියා

මෙපරිදි මිපුතණුවන්ට සැලකරවයි උන් සමීපයට කටයුතු කරන්නකු යැවූහ. මහාසත්ත්වයෝද එපවත් අසා,

122 "කිසම්මිං මෙ සිවයෝ කුඩා යෙ න පසසාමි දුඤකටං,
තං මෙ කථෙත වියාවිඤ්ඣ කසමා පබ්බාජයන්ති මං"යි

රවිත් නෙරපිමට කරුණු කිමිදැයි විවාලෝය. ඔහු විසින් ඔබගේ හසති දානයෙනැයි කිකල්හි සොම්නසට පැමිණ:-

123 "හදයං වසුධුමහං දජ්ජං කිං මෙ බාහිරකං ධනං,
හිරඤ්ඤං වා සුවණ්ණං වා මුත්තාවෙළුරියාමණී.

124 දක්ඛිණං වා මහං බාහං දිසවා යාවකමාගතෙ,
දදෙය්‍යං න විකම්පෙය්‍යං දානෙ මෙ රමතෙ මනො,

125 කාමං මං සිවයෝ සබ්බෙ පබ්බාජෙන්තු හනන්තුවා,
නෙව දානං විරම්ඣසං කාමං ඡින්දතු සත්තධා."යි

කියා නුවරවැස්සෝ මට දන් දීපියන්ට එක් දවසක් අවකාස දෙන්වා, සෙට දවස දන්දී තුන්වනදා යන්නෙමියි කියා කටයුතු කරන්නාහු උන්ගේ සමීපයට යැවූසේක. ඉක්බිති බෝසතාණෝ මම හෙට දවස සත්තසතක තම්වූ මහා දානයක් දෙන්නෙමියි ඇතුන් සත්සියයක් හා අසුන් සත්සියයක් හා රිය සත්සියයක් හා සත්‍රීන් සත්සියයක් හා දැසයන් සත්සියයක් හා දැසීන් සත්සියයක් හා දෙනුන් සත්සියයක්ද පිළියෙළ කරව, ආහාර-පානාදි නානාප්‍රකාරවූ සියලු දියයුතුදේ පිළියෙළ කරවයි සචිකර්මික අමාත්‍යකුට නියොග කළසේක. ඉක්බිති මහා පුරුෂයන්වහන්සේ එකලාවම මද්‍රී දේවිය වසන තැනට ගොස් "සොදුර මද්‍රීය, අනුග්‍රාමික නිදන් නිදන්කරනු ලබමින් සිල්වතුන් කෙරෙහි දෙන්නෙහිය"යි ඇ ද දානයෙහි ගොදවා ඇට තමාගේ ගමන කාරණය කියා "මම වලැ වසන්නට යන්නෙමි. තෙපි මෙහිම උකටලී නොව වාසයකරව"යි කීහ. ඕතොමෝ "මහරජ, නුඹවහන්සේගෙන් වෙන්ව මම එකදවසකුදු වාසය නොකරන්නෙමි"යි කිව. දෙවන දවස් සත්තසතක මහාදානය පැවැත්වූහ. දන් දෙදීම එ දවස් සවස් විය.

ඉක්බිති බොධිසත්ත්වයෝ සැරසූ රථයෙන් මවුපියන් වසන තෙනට ගොස් "මම හෙට යන්නෙමි"යි උන් විචාරා ඔවුන් කදුලු වැකි මුහුණෙන් අඬ අඬා සිටියදීම වැඳ පැදකුණු කොට ගොස් දිවස් තමාගේ වාසභවනයෙහිම විසූහ. දෙවන දවස්හි යන්නෙමියි ප්‍රාසාදයෙන් බැස්සේය. මදි දෙවි තැදිමසිලන් විසින් නානාප්‍රකාරයෙන් යාච්ඤාකොට නවත්වනු ලබන්නීද ඔවුන්ගේ වචන නොගෙන උන් වැඳපියා පැදකුණුකොට සෙසු සත්‍රින් විචාරා දරුදෙදෙන ගෙන වෙසසන්තර රජ්ජුරුවන්ට පළමු ගොස් රථයට නැංගාය. මහා සත්ත්වයෝ රථයට නැඟී රථයෙහි සිටි තැනැත්තෝ මහාජනයා විචාරා අප්‍රමාදව දානාදි කුසල් කරවූයයි අවවාද දී නුවරින් නික්මුනාහ. බොධිසත්ත්වයන්ගේ මවුබිසෝ මාගේ පුතණුවෝ දානාධ්‍යාශ ඇතිසේක. දන්දුනමැනවැයි ආභරණ සමග සත්රුවන් පිරූ ගැල් උන්වහන්සේගේ දෙපස යැවූහ. බොධිසත්ත්වයෝ පැළඳි ආභරණම ඉල්ලා ආ යාචකයන්ට අටලොස් වරක් දන්දී සෙසු සියල්ලද දුන්සේක. නුවරින් පිටත්ව නැවත රජගේ දිසාව බලනු කැමතිවූහ. ඉක්බිති උන්වහන්සේගේ කුශලානුභාවයෙන් රථප්‍රමාණ තැන් මහපොළොව පැළී කරකැවී රථය නුවරට අභිමුඛ කෙළේය. බෝසතාණෝ මවුපියන් වසනතැන් බැලූසේක. ඒ කුසල්බෙලෙන් පොළොව කම්පනය විය. එහෙයින් වදුරන ලදි.

"තෙසං නිවිට්ඨමානානං අකම්පිතමයණ්ඩිතං,
මහාදානං පවත්තෙතුං එකං වරමයාචිසුං. (89)

යාචිතා සිවයෝ සබ්බා එකං වරමදංසු මෙ,
ආසාවයිත්වා කණ්හාජිනං මහාදානං දදාමහං. (90)

අථෙත්ථ වත්තති සද්දෙ තුමුලෝ හෙරඤ්ඤෝ මහා,
දානෙන මං නීහරන්ති පුන දානං දදාමහං"ති (91)

දන්දීම හෙතුකොටගෙන කිපුණු නුවරුන් නුවරින් පිටමං කලත් යලිදු දන්දුන් පරිදි දක්වනු පිණිස මේ ගාථා වදළෝ.

හත්ථි අස්සරථෙ දත්වා දාසිදාසං ගවං ධනං,
මහාදානං දදිත්වාන නගරා නික්ඛමිං තදා. (92)

නික්ඛමිත්වාන නගරා නිවත්තිත්වා විලොකිතෙ,
තදාපි පඨවි කම්පි සිනෙරුවනවටංසකං. (93)

මිනිසුන්ගෙන් නික්මෙන්නෝ තමන් සමග උපන් සැරදහස්සක් දැම්මිණියද සෙසු ජනයාද කඳුලු මුසු මුහුණින් ලුහු බඳිනවුන් ප්‍රතිබාහනයකොට තුමූම රථය පදමින් මද්‍රී දෙවියට මෙසේ කීහ. "යාචකයෝ එන්නාහුදැ"යි බලවයි. ඔයින් යාචකයෝ එන්නාහුදැයි බලන්නීය. ඉක්බිති සපත්නා සතක මහාසත්ත්වයන් බොධිසත්ත්වයන් වහන්සේ ගමන කාලයෙහි දුන් දානසේද නොපැමිණියාවූ බ්‍රාහ්මණයෝ සතරදෙනෙක් අවුත් වෙස්සන්තර රජ්ජුරුවන් වහන්සේ කොහිදැ"ස විචාරා දන්දී රථයෙන් වැඩ සේකැයි කිකල්හි අසුන් ඉල්වන්නෙමුයයි ලුහුබැන්දාහුය. මද්‍රී බිසව එන්නාවු ඔවුන්දැක මහරජ! යාචකයෝ එන්නාහුයයි සැළකළාය. මහාසත්ත්වයෝ රථය නැවැත්වූහ. ඔව්හු බෝසතුන්ගෙන් අසුන් ඉල්වූහ. මහා සත්ත්වයෝ මහුලසුන් දන් දුන්සේක. ඔව්හු අසුන් ගෙනගියාහුය. අශ්වයන් දන් දුන් කල්හි රථධුරය ආකාසයෙහිම සිටියේය. ඉක්බිති දිව්‍ය පුත්‍රයෝ සතරදෙනෙක් රොහිත මෘග වෙශයෙන් අවුත් සිට රථධුරය පිළිගන්නාහුය. මහා සත්ත්වයෝ ඔවුන් දිව්‍ය පුත්‍රයන් බැව් දැන

126 "ඉංඝ මද්දි නිසාමෙහි චිත්තරූපංව දිස්සති,
මිගා රොහිත වණ්ණාභ දකඛිණස්සාවහන්ති ම ං"යි

මද්‍රීදේවියටත් ඒ බැව් කීහ.

ඉක්බිති මෙසේ ගමන්කරන්නාවූ උන්වහන්සේ කරා අනික් බ්‍රාහ්මණයෙක් අවුත් රථය ඉල්ලූසේය. මහාසත්ත්වයෝ පුත්‍රදාරාවන් බස්වා රථය දුන්සේක. රථය දන්දුන් කල්හි දිව්‍යපුත්‍රයෝ අන්තර්ධානවූවාහුය, එතැන්සිට ඒ සියල්ලෝම පයින්ම ගියෝය. ඉක්බිති මහා සත්ත්වයෝ මද්‍රීට කථාකොට "මද්‍රිනි තොප කෘෂ්ණජිනාව වඩාගනුව, මම ජාලීය කුමාරයා වඩාගනිමි"යි දෙදෙනම දෙදරුවන් ඇකයෙන් වඩාගෙන ඔවුනොවුන් හා සමග ප්‍රියකථා ඇත්තෝ පෙරමගට එන්නාවූ මිනිසුන් අතින් වඩකපබ්බතයට යන මාර්ගය විචාරන්නාහු තෙමේම තැම්මණාවු වෘක්ෂයන්ගේ ඵල දරුවන්ට දෙන්නාහු ඝිතවැඩ කැමති දෙවතාවන් විසින් හකුළුවනලද මගින් එදවසම වෙනිය නුවරට පැමිණියහ. එහෙයින් වදාළහ:—

චතුවාහිං රථං දත්වා ඨත්වා චාතුම්මහාපථෙ,
එකාකිනියා අදුතියෝ මද්දිදෙවිං ඉදමබ්‍රවිං. (94)

සබ්බං මද්දි කණ්හා ගණ්හාති ලහුකා එසා කණ්හිසිඛා,
අහං ජාලිං ගණ්හිස්සාමි ගරුකෝ භාතිසභා හි සෝ (95)

පදුමං පුණ්ඩරීකං ච මද්දි කණ්හාජිනග්ගහි,
අහං සුවණ්ණබිම්බංච ජාලිං ඛත්තියමග්ගහිං. (96)

අගිජාතා සුබුමාලා ඛත්තියා චතුරෝ ජනා,
විසමං සමං අකාකමන්තා වඩ්ඪං ගච්ඡාම පබ්බතං. (97)

යෙකෙචි මනුජා එත්ථ අනුම්මග්ගෙන පවිප්පථෙ,
මග්ගා තෙ පවිපුච්ඡාම කුහිං ගිඩ්ඪත පබ්බතා, (98)

තෙ තත්ථ අමෙහ පස්සිත්වා කරුණං ගිරමුදිරයුං,
දුක්ඛෙනෙනපි වෙදෙන්ති දූරෙ වඩ්ඪතපබ්බතා. (99)

යදි පස්සන්ති පථිනා දූරතා එලිත්තෙ දුමෙ,
තෙසං ඵලානං හෙතුම්හි උපරොදන්ති දූරතා. (100)

රොදනෙන දූරතෙ දිස්වා උබ්බිග්ගා විපුලා දුමා,
සයමෙවොනමිත්වාන උපගච්ඡන්ති දූරතෙ.[101]

ඉදං අච්ඡරියං දිස්වා අබ්භුතං ලොමහංසනං,
සාධුකාරං පවත්තෙසි මද්දි සබ්බඞ්ගසොභනා. [102].

අවෙජ්ජරං වත ලොකස්මිං අබ්භුතං ලොමහංසනං,
වෙස්සන්තරස්ස තෙජෙන සයමෙවොනතා දුමා. [103] සි.

එහි මාගී දීඝිතාව මෙසේය: ජයතුරා නුවරට සවල්ගිරිකුළු නම් පර්වතය පස්යොදුනෙක, එතැනට කොන්තිමාරා නම් ගංගාව පස් යොදුනෙක, එතැනට අඤ්ජනගිරි නම් පර්වතය පස් යොදුනෙක, එතැනට දණ්ඩ නම් බ්‍රාහ්මණග්‍රාමය පස් යොදුනෙක, එතැනට මඝිලණ්ඩුවන්ගේ නුවර දස යොදුනක්යයි මෙසේ එනුවර ජයතුරා නුවර යොදුන් තිසක්යයි දත්යුතු. දෙවතාවෝ බොධි සත්ත්වයන් වහන්සේගේ පුණ්‍ය තෙජසින් චොදනා කරන ලද්දාහු මග ගෙවාලූහ. උන්වහන්සේලා ඒ සියලු තිස් යොදුන් මග එක් දිනකින්ම ඉක්මවාපිහුය.

සංඛිපිංසු පථං යක්ඛා අනුකම්පාය දාරකෙ,
නික්ඛන්තෙ දිවසෙයෙව චෙතරට්ඨමුපාගමුං [104] යනු

එහෙයින්ම වදරන ලදි. මහාසත්ත්වයන්ගේ පුණ්‍ය තෙජසින් මොදනාකරන ලද්දාවූ දෙවියෝ මාණ්ඩ සංක්ෂෙප කළහ. ඒ වනාහි දරුවන් කෙරෙහි කරුණාවෙන් කරන ලද්දක්මෙන් කොට ගාථාවෙහි කියන ලද්දේය.

මෙලෙස මහාසත්ත්වයෝ එම්දා සවස මෙනිශරට මයිලණුවන්ගේ නුවරට පැමිණ එනුවර වාසල්දොර සමීපයෙහි ශාලාවෙක්හි ලැගුම්ගත් සේක. ඉක්බිති මිදි බිසවු රජහුගේ පාදමූලි පිසලා පා මිරිකා වෙස්සන්තරරජාණන් ආබව දන්වත්තෙමිසි ශාලාවෙන් නික්ම උන්වහන්සේගේ ඇස්හමුවෙහි දොරකඩ සිටියාහ. නුවරට වදකාවූද නික්මෙන්නාවූද සත්‍රිහු මිදිදෙවිය දැක පිරිවැරුහ. මහා ජනතෙමේ වෙස්සන්තර රජ්ජුරුවන් හා දරු දෙදෙනාද දැක රජදරුවන්ට කිවාහුය. සැටදහසක් නුවරවල රජ දරුවෝ හඬමින් විලාප කියමින් උන්වහන්සේ වෙතැ අවුත් ගමන්විඩා සිංසිදුවා ආ කරුණු විචාළාහුය. මහාසත්ත්වයෝ හසති දනය ආදිකොට සියලු පවත් කිහ ඒ අසා ඔව්හු තමන්ගේ රාජ්‍යයෙන් පැවරුහ, මහාසත්ත්වයෝ කියන්නාහු තොපගේ රාජ්‍යය මාවිසින් පිළිගන්නා ලද්දේම වේවා, සද මිහ රජ්ජුරුවෝ වනාහි මා රවින් නෙරපති, එහෙයින් වඩා පව්තයට යන්නෙමිසි කියා, ඔවුන් කොයෙක් ආකාරයෙන් එහි වැඩහිදිනු මැනවැයි යාච්ඤා කරන ලද්දේ තමුන් කොඉවසා, ඔවුන් විසින් ගන්නා ලද රැකවල් ඇත්තෝ එදවස් රැ ශාලාවෙහිම වැස දෙවැනි දවස් උදැසනක්සේම නොයෙක් රස මසවුලෙන් යුත් බොජුන් වළඳ, ඔවුන් විසින් පිරිවරන ලද්දේ එතැනින් නික්ම පසළොස් යොදුන් මග ගොස් වනදෙරකඩ සිට ඔවුන් නවත්වා මත්තෙහි පසළොස් යොදුන් මග ඔවුන් විසින් කියනලද ක්‍රමයෙන්ම ගියාහුය. එහෙයින් වදරන ලදි:-

"සබ්බරාජසහස්සානි තදූ වසනති මාතුලෙ,
සබ්බෙ පඤ්ජලිකා ගුත්වා රොදමානා උපාගමුං. (135)

තඤ්ච තෙතඤ්ච සල්ලාපං චෙතෙති චෙතපුත්තෙහි,
තෙ තතො නික්ඛම්මානා වඞ්කං අගමුං පබ්බතං" ති. (196)

ඉක්බිති මහාසත්ත්වයෝ ඔවුන් කී මඟින්ම වඩනාසේක් රාත්‍රියෙහි ගඤ්ඣමාදනපබ්බතයට වැද එදවස එහි වැස එසින් නික්ම උතුරුදික් බලා වෙපුල්ල පබ්බතපාදයෙන් ගොස් කෙතුමති නම් ගංඉවුරෙහි වැඩහිඳ වැද්දකු දුන් මී හා මස් මේ නිමවා ඔහට රන් ඉද්දදී තහා පැන්සතසා ගමන් විඩාහැර ගඟින් එතරව පබ්බත මස්තකයෙහි සමතලා භූමියෙහි පිහිටි නුගරුකමුල මද වේලාවක් වැඩහිඳ එයින් ගොස් නාලිකා පබ්බතය ගෙවා මුචලින්දවිලට ගොස් විල්තෙරින් ඉසාණකොනට පැමිණ එක්පියවර සටහන් මඟින්ම ගොස් වන දෙසට වැද එය ඉක්මවා ගිරිදුර්ගී නදී ප්‍රභවයන්ගේ ඉදිරියෙහි සතරැස් පොකුණට වැඩිසේක. එකෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාණෝ ආවර්ජිතාකරන්නෝ "මහාසත්ත්වයෝ හිමවතට වැඩිසේක. වාසස්ථානයක් ලදමනායයි සිතා විස්කම් දෙවිපිත් කැඳවා "තොප ගොස් වඩහා පබ්බතකුක්ෂියෙහි සිත්කලු තැනක අසපුවක් මැවුව මැනවැ"යි කියා ඔහු යැවූහ. විශ්වකර්ම දිව්‍යපුත්‍රතෙම එහි පන්සල් දෙකක්ද සක්මන්මළු දෙකක්ද රාත්‍රිස්ථාන දිවාස්ථාන දෙක දෙක බැගින්ද මවා ඒ ඒ තන්හි තොයෙක් මලින් විසිතුරු රුක් හා කෙහෙල් උයන් ආදියද දක්වා සියලු තවුස් පිරිකර පිළියෙළ කොට තබා පැවිදිවනු කැමැත්තෝ ගනිත්වායි අකුරු ඇඳ අමනුෂ්‍යයන්ද හෙරව ශබ්ද ඇති මෘගපක්ෂීන්ද ඉවත්කොට දෙව්ලොවට ම ගියේය. මහාසත්ත්වයෝ එක පදික මානවයක් දැක ප්‍රව්‍රජිතයන්ගේ වාසස්ථානයක් වන්නේයයි සිතා මද්‍රිදෙවීන් හා දරුවන් පොකුණු තෙර හිඳුවා අසපුවට වැද අකුරුබලා සක්දෙව් විසින් දක්නා ලද්දෙමිසි, පන්සල් දෙර හැරපියා කඩුව හා දුන්තද ඉවත්කොට සළුමුදු තවුස්වෙස් දරා සැරයවිය ගෙන නික්ම සංඝමයෙන් පසේ බුදු කෙනෙකුන්සේ දරුවන් සමීපයට ගියහ. මද්‍රිදෙවීන් වහන්සේ මහාසත්ත්වයන් දැක පා මුල වැදවැටී හඬා උන්වහන්සේ සමග ආශ්‍රමයට පැමිණ තමාගේ පන්සලට වැද තවුස් වෙස් ගත්හ. පසුව දරුවන්ද තාපසකුමාරයන් කළාහුය. මහා සත්ත්වයෝ මද්‍රිදෙවීන්ගෙන් වරයක් ඉල්ලූහ. එනම්: අපි මෙවක්පටත් ප්‍රව්‍රජිතයෝ වම්හ, බඹසරට සත්‍රාය කිලිටෙක, එහෙයින් තොකල්හි මාවෙතට ඊම නොකැමැත්තෙමි"යි කිහ, ඕතොමෝ යහපතැයි ගිවිස මහා සත්ත්වයන්ගෙන් වරයක් ඉල්ලූයේය. එනම් "දෙවයන් වහන්ස, ඔබ වහන්සේ දරුවන් ගෙන මෙහිම වසනු මැනව, මම පලවැල ගෙනෙන්නෙමි"යි. ඕ තොමෝ එතැන් පටන් වනයෙන්

පලාපල ගෙනවුත් රජ්ජුරුවන් වහන්සේ හා කුමාරවරුන් පොෂණය කළාය මේසේ ක්ෂත්‍රියයෝ සතරදෙන සත්මාසයක් පමණ පර්ණකුටියෙහි වාසය කළාහුය. එහෙයින් වදරන ලදි:-

ආගතාගතයිඤ්ඤා දෙවියෙ, විසඤ්ඤමමං මහිධිඤ්ඤං,
අසඤ්ඤං සුඤ්ඤතං රමමං පණ්ණසාලා සුමාපය. (107)

සඤ්ඤායය චේතනං සුඤ්ඤා විසඤ්ඤමෙමා මහිධිඤ්ඤා,
අසඤ්ඤං සුඤ්ඤතං රමමං පණ්ණසාලා සුමාපයි. (108)

අපෙක්ඛානහෙට්ඨා පටිහං අපපසද්දං නිරාකුලං,
චතුරෝ ජනා මයං තත්ථ වසාම පබ්බතනනරෙ. (109)

අහං ච මද්දිදෙවී ච ජාලිකණ්හාජිනාවුභො,
අසඤ්ඤමසඤ්ඤං සොඤ්ඤනුදා වසාම අසඤමෙ තදු. (110)

දාරඤ්ඤෙ අනුරඤ්ඤනෙනා අසුඤ්ඤෙඤ්ඤ, හොමි අසඤමෙ,
මද්දි ඵලං ආහරති පොසෙති සා තයො ජනෙ. (111)

බොධිසත්ත්වයන් වහන්සේගේ මෛත්‍රී බෙලෙන් හාත්පස යොදුනක් තැන් මුළුල්ලෙහි සියලු තිරිසන්ගත සත්ත්වයෝද ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රියෙන් ඉපද වූහ.

එසමයෙහි කළිඟුරට ජූජක නම් බමුණෙක් වෙසෙයි. උහුගේ අමිත්තනාප නම් බැමිණි "මම තට නිතොරම වී කොටා දියත් ගෙන කැඳබත් ආදිය පිසන්නට නොහැක්කෙමි. මෙහෙවර දාසයකු හෝ දාසියක ගෙනව"යි කිව. බමුණු "හොඳුර, දිළිඳු මම් දාසදාසීන් කෙසේ ලබම්ද" යි කියේය, ඔයින් එම්බල බමුණු මහල්ල, වෙස්සන්තර රජ්ජුරුවන් වහන්සේ අඹුදරුවන් සහිත වැ වඩාහ පර්ණකුටියෙහි වසනසේක, උන්වහන්සේගේ දරුවන් මට මෙහෙවරට ඉල්ලාගෙන එවයි කිව. බමුණු තෙමේත් කෙලඹ වශයෙන් ඇහා පිළිබඳ සිත් ඇත්තේ ඇගේ වචනය ඉක්මවා පියන්ට නොහැකිව මාගෝපකරණ සාදවා ගෙන පිළිවෙළින් ජයතුරා නුවරට ගොස් වෙස්සන්තර රජ්ජුරුවෝ කොයිදැයි විචාළේය. මහාජන තෙමේ මේ යාචකයන්ට අභිදූතය නිසා අපගේ රජ්ජුරුවන් වහන්සේ නුවරින් නෙරපියන ලදහ. මෙසේ අපගේ රජ්ජුරුවන් නසා නැවතත් මෙහි එන්නේයයි කැටගල් දඩුමුගුරු ආදියගෙන බැණවදිමින් බ්‍රාහ්මණයා ලුහුබැඳ ගත්තේය. හෙතෙම දෙවතාධිගෘහිතව එයින් නික්ම වඩාහ පර්ණකාමී මාගියට

කෑගී පිළිවෙළින් ගොස් වතවාරයට පැමිණ මහාවනයට්වැද මංමුළාව හැසිරෙන්නේ ඒ රජවරු විසින් බොධිසත්ත්වයන්ගේ රැකවලට සිටුවනලද චෙත පුත්‍ර තම් වැද්ද හා එකතු වූයේය. හෙතෙම කොයි යෙහිද බමුණයි විමැළකළ "වෙස්සන්තර රජ්ජුරුවන් සමීපයටය"යි කීය, එකාන්තයෙන් මේ බ්‍රාහ්මණයා උන්වහන්සේගේ දේවිය හෝ දරුවන් හෝ ඉල්ලන්නට යන්නේ යයි සිතා එහිතොයව බමුණ, ඉදින් යන්නෙහි නම් මෙහිම තාගේ හිසකපා මගේ බල්ලන්ට ආහාර කරන්නෙමියි උමතිසින් භය ගන්වනලද්දේ මරණබියෙන් බැගෙන පින්වත, මම වනාහි සඳමහ රජ්ජුරුවන් විසින් එවූ දූතයෙක්මි. වෙස්සන්තර රජ්ජුරුවන් ජයතුරා නුවරට වැඩමවාගෙන යම්යි බොරුගොතා කීය. වෙතපුත්‍රතෙම ඒ අසා තුටුපහටුව බ්‍රාහ්මණයාට සත්කාර සම්මාන කොට වඞ්කගිරියට යන මාගීය කීයේය. හෙතෙම එයින් ඔබ්බට ගොස් අතරමග අවිවූත තම් තාපසයන්වහන්සේ දැක උන්ගෙන්ද මාගීය විචාරාගෙන කි සලකුණෙන් ගොස් පිළිවෙළින් බොධිසත්ත්වයන්ගේ ආශ්‍රමයට පැමිණ මද්‍රිදෙවිය පලවැල පිණිය ගියකල්හි උන්වහන්සේකරා පැමිණ දරුදෙදෙන ඉල්ලුයේය. එහෙයින් වදරන ලදි:—

"පවනෙ වසමානස්ස අඩ්ඪකෝ මං උපාගමි,
ආයාචි පුත්තකෙ මය්‍යං ජාලිකණ්හාජිනාවුතෝ"යි. (112)

මෙසේ බ්‍රාහ්මණයා විසින් දරුවන් ඉල්ලුකල්හි මහාසත්ත්වයෝ සිතන්නාහු බොහෝකාලයකින් මා කරා යාචකයෙක් ආයේය. අද මම නිරවශෙෂ කොට දානපාරමිතාව පුරන්නෙමි" යන අභිප්‍රායයෙන් උපන් සොම්නස් ඇතිසේක් අත් දිගු කොට දහසක් බැඳි පියල්ලක් අතතබන්නාක් මෙන් බ්‍රාහ්මණයාගේ සිත සතුටු කරමින් සියලු පළිතකුක්ෂිය එකනින් නාදකරමින් "බ්‍රාහ්මණය තොපට මාගේ දරුවන් දන්දෙමි; එතකුදුඋවන් උන්ගේ මැණියෝ මද්‍රිදෙවි උදැසනම පලාපල පිණිස වනයට ගොස් සවස එන්නාහ. උන් ආකල්හි පුත්‍රයන් දක්වා තෝද 'පලවැලකා එක්රැයක් වැස විඩා නිමවා උදැසනම යව"යි කිහ. බ්‍රාහ්මණතෙම එකාන්තයෙන් රජ්ජුරුවන් වහන්සේ උදර අදහස් ඇති බැවින් පුතණුවන් දෙනසේක. මවු වනාහි පුත්‍රගෙධයෝය. උන් ආකල්හි දැනයට අන්තරායයක් කරන්ට හැක. එහෙයින් මම එකාන්තයෙන් උන්වහන්සේ පෙළා දරුවන් ගෙන අදම යන්නෙමියි සිතා නුඹවහන්සේගේ පුත්‍රයෝ මට දන්දෙන

ලද්දාහුමය. ඔවුන් දුන් මවුට පෙන්වීමෙන් ප්‍රයෝජන කිමිද? අදම දරුවන් ගෙනයන්නෙමියි කියා. "බ්‍රාහ්මණය, ඉදින් තෝ මවු දුකයන්ට නොකමැති වීනම් දරුවන් ගෙන ජයතුරා නුවරට යව එහිදී සදමහ රජ්ජුරුවෝ දරුවන් ගෙන තට බොහෝ සැපත් දෙන්නාහ. එයින් දුසදසින්ගෙන සැපසේ ජීවත්වෙවයි කිහ. අන්ලෙසකින් මේ සිවුමැලි කුමාරයෝ කෙසේනම් තොපට මෙහෙවර කරන්නෝදැයි කිහ. බ්‍රාහ්මණතෙම මහරජ්ජුරුවෙනි, එසේත් කළ නොහැක, රාජදණ්ඩනයට භයවෙම් කුමාරවරු මාගේ ගමටම ගෙනයන්නෙමියි කියා. කුමාරවරු ඔවුන්ගේ කථාව අසා අපගේ පියාණෝ එනාහි අප බමුණාට දන්දෙනු කැමැත්තාහයි පලාගොස් පොකුණට බැස පියුම්පෙති අතුරෙහි සැනවූහුය, බමුණා කුමාරවරුන් නොදැක මහරජ්ජුරුවන් වහන්ස, ඔබවහන්සේ දරුවන් දන්දෙමියි කියා ඔවුන් පහකරවා දැමූසේක, ඒ නුබවහන්සේගේ සාධුභාවයදැයි කිය. ඉක්බිති මහාසත්ත්වයෝ වහාම නැගිට දරුවන් සොයන්නාහු පියුම්පෙති, අතුරෙහි සැඟවී උන්නවුන් දැක දරුවෙනි, මොබ එන්න, මාගේ දානපාරමිතාවට අන්තරායක නොකරව මාගේ දානාධ්‍යාශය මුදුන් පමුණුවව. මේ බ්‍රාහ්මණයා තොප ගෙන තොපගේ මුත්තනුවූ සදමහ රජ්ජුරුවන් සම්පයට යන්නේය. ජාලිය කුමාරයෙනි, එහිදී තෙපි දැන කමින් මිදෙනු කැමැති නම් බ්‍රාහ්මණයාට රන්දහසක්දීද කෘෂ්ණජිනාවෙනි, තෙපි දැසිකමින් මිදෙනු කැමති නම් දැසිදස්, ඇත්, අස්, වෘෂභ, නිෂ්ක යන සියල්ලෙන් සියයක් බැගින්දීද දැසිකමින් මිදෙවයි කියා දරුවන් ගණන් වශයෙන් වටිනාකම් නියමකොට ඔවුන් සතහා අසපුවට ගෙනගොස් කමණ්ඩලුයෙන් බමුණා අත පැන් වත්කොට බුදුබව පතා අතිශය ප්‍රීති සොම්නස් ඇත්තෝ පොළෝ එකනින් නාද කරවමින් දරුවන් දුන්සේක. මෙහිද ඨට කියතලද ක්‍රමයෙන් පොළෝ කම්පනාදිය වූයේය. එහෙයින් වදරතලදී:—

යාවඤ්ච උපගතං දිස්වා භාසෝ මෙ උපපජ්ජථ,
එනෝ පුත්තෙන ගඟෙසාන අදාසිං බ්‍රාහ්මණෙ තදා. (113)
සඤ්ඤෙ පුත්තෙ වජ්ජනසස ජූජකෙ බ්‍රාහ්මණෙයද,
නදුපි පඨවි කම්පි සිනෙරුවනවටංසකා. (114)

ඉක්බිති බ්‍රාහ්මණතෙම නොයනු කැමැත්තාවූ කුමාරවරුන්ත් වැලින් දෙඅත එක්කොට බැඳ ඇදපීය. වැල බැඳිතැන්හි සමකැපී ලේ හිණ, ජූජකතෙම වැල්පොවින් තළමින් ඇදපියයි. උන් පියාණන්ත් දිහා බලා:

127. "අම්මා ව තාත නික්ඛන්තා තුවං ව නො තාත දස්සසි,
මා ඛො තුවං තාත අදාසි යාව අම්මාපි එති නො;
තදායං බ්‍රාහ්මණො කාමං විකපිණාතු හණාතු වා"සි,

කියා "පියාණන්වහන්ස, අම්මා පලවැලට ගියාය, පියාණනි, ඔබවහන්සේද මැණියන් නොආ කලම අප දන්දෙනසේක. අම්මා එනතුරු බමුණාහට අප දන් නොදුන මැනව, මැණියන් ආකල මේ බමුණු අප කැමති ලෙස විකුණාවා! මරාවා! කැමති යමක් කෙරේවා! සි;

නැවතද කියනුයේ "පියාණනි, සෝරදගින ඇති කකීශ ස්ත්‍රියා ඇති මේතෙම මනුෂ්‍යයෙක්ද නොහොත් මනුෂ්‍ය වෙශයෙන් හැසිරෙන්නාවූ මස් ලේ හොජන කොට ඇන්නාවූ යක්ෂයෙක්ද! ගමින් වලට අවුත් පුත්‍රධන ඉල්වන්නේය, පියාණනි, යකකු විසින් ගෙනයන කල්හි බලාහිඳිනේ ඇයිද"සි කියමින් දඬන්ට වත. එහෙයින් කිහ.

128. "මනුස්සෙසා උදහු යකෙඛා මංසලොහිතහොජනො,
ගාමා අරඤ්ඤං ආගම්ම ධනං තාතඤ්ච යාචති;
නියමානෙ පිසාවෙන කිනන්නු තාත උදක්ඛසි."සි

ජූජකතෙම දරකයන් එසේ හඬද්දීම තලතලා ගෙත ගියේය. දරකයන්ගේ කුළුණු කටයුතු හැඩමෙන්ද ජූජක බමුණාගේ අකාරුණිකභාවය හෙතුකොට ගෙනද මහසතාණන්වහන්සේට බලවත් ශොක උපන්නේය, විපිළිසරෙක් ඇතිවූයේය. උන්වහන්සේ එකෙණෙහිම බොධිසත්ත්වයන්ගේ ප්‍රවෙණිය සිහිකළසේක. "සියලු බොධිසත්ත්වවරයෝම පඤ්චමහා පරිත්‍යාගය කොට බුදුවන්නාහුය. මම්ද උන්වහන්සේලාට ඇතුළත්මි, පුත්‍රදුකයත් පඤ්ච මහා පරිත්‍යාග අතුරෙන් එකකි. වෙසසන්තර රජාණනි, කවරහෙයකින් දන්දී පසුව තැවෙන්නෙහිද, නොපට එය සුදුසු නොවේදැයි තමන්ටම අවමන්කොට දන්දුන් කාලයෙහි පටන් මට ඔවිහු කිසිවෙක් නොවෙත්"යයි තමන් දැඩිකොට පියා දැඩි සමාදානය ඉටාගෙන පන්සල් දොරකඩ ගල් පුවරුවෙක රන් පිළිමියක්සේ වැඩහුන්සේක. ඉන්බිනි මද්‍රිදෙවි නොමෝ වතයෙන් පලාපල ගෙන හැරී එන්නී බොධිසත්ත්වයන් වහන්සේගේ දුකයට අන්තරායක් නොවේවයි සිංහ ව්‍යාඝ්‍රාදි වෙශධරවූ දෙවතාවන් විසින් අවුරනලද මං ඇන්නි ඔවුන් ඉවත්ව

ගිය කල්හි ලස්ව ආශ්‍රමයට පැමිණ අද මාවියන් නපුරු සම්පත-යක් දක්නා ලද්දේය, නපුරු නිමිතිද පහළවිය. කුමක්වන්නේ-දැයි සිතමින් අසපුවට ගොස් පුත්‍රයන් නොදැක බොධිසත්ත්වයන් ළඟට පැමිණ "දෙවඟන්වහන්ස, අපගේ පුතුරුවන් නොදකිමි. ඔව්හු කොයි ගියෝදැ"යි විවාළේය, බෝසතාණෝ මුවෙන් නොබැණ හුන්සේක. කිසිවි දරුවන් සොයා ඒ ඒ තැන ඇවිදින්නී නොදැක තැවතද අවුත් බොධිසත්ත්වයන් විවාළහ. බොධිසත්ත්වයෝ කරුණ කථාවෙත්ම උන්ගේ පුත්‍රශොකය දුරුකරමියි සිතා "මද්‍රිනී, තෙපි උතුම්වූ ආරොහ පරිණාහයෙන් යුක්තාය, වෙතිය මහරජාණන්ගේ දුවණියෝය, අතිශූනවූ යසස් ඇත්තාහ. පලවැල සඳහා උදයම් ගියාහුය. හිමාලය වනයෙහි වනාහි බොහෝ වනචරයෝ හා තාපස සිද්ධිඤ්ඤබරාදීහු හැසිරෙන්නාහ. තොප-විසින් කිසිවක් කරතලදැයි කවුරු දනිද්ද, කිමෙක්ද, මේ රාත්‍රිකාලයෙහි අවුය, ළදරු කුමාරයන් හා වලට ගියාවූ සවාමික සත්‍රිහු මෙබදු නොවන්කාහ. මාගේ දරුවන්ගේ පවත් කෙසේ-දෝහෝ මාගේ සවාමිපුත්‍රයෝ කිසිවක් සිතන සේක්දෝහොයි කියා මේවිවරකුත් නොසිතුද, උදයම ගොස් මේ සවස වන්‍දා ලොකයෙහි එන්නාහුය" කියා

129. "නනු මද්දි වරාරොහා රාජපුත්‍රි යසස්සිනී,
පාතෝ ගතාසි උඤ්ඡාය කිම්දං සායමාගතා"යි,

කිහ. ඉක්බිති බිසව් ලස්මිමට හේතුව කී තමුන් රජ්ජුරුවෝ දරුවන් සඳහා කිසිවක් නොකිහ. දෙවි පුත්‍රශොකයෙන් දරුවන් සොයා ඇවිදිමින් තැවතත් පවතට බදු වේගයෙන් වනයෙහි හැසුරුනාහ, දේවින්වහන්සේ එක්රැයක් හැසුරුණු තැන ගණන් ගත්කල පසළොස් යොදුනක් පමණ තැන්විය. ඉක්බිති අරුණු නැගුණුකල මහාසත්ත්වයන් ළඟට ගොස් පුත්‍රයන් නොදැ-කිමෙන් හටගත් බලවත් ශොකයෙන් අභිභූතව බොධිසත්ත්ව යන්ගේ පාමුල කපාහෙලූ කෙසෙල්ගසක් මෙන් විසංඥව බිම වැටු-ණාහ. බොධිසත්ත්වයන්වහන්සේ මළාය යන සංඥාවෙන් කම්පිත වෙමින් උපන්නාවූ බලවත් ශොක ඇත්තෝ යළි සිහිය එළඹවා ජීවත් වන්නාහුදැයි දැන ගනිමිසි සත්මසක් මුළුල්ලේ කාය සංසර්ගයට නොපැමිණිවිරු නුමුත් අනිකකු නැති බැවින් තුමූම දේවින්ගේ හිස ඔසවා කලවයෙහි තබා දිය ඉස උර හා මුඛය හා ළයද පිරිමැද්දාහ. මද්‍රිදේවි මදක්කල් ගෙවා සිහි ලදින් හිරිඔතප් උපදවා දෙවඟන් වහන්ස, "ඔබගේ දරුවෝ කොහි ගියෝදැ"යි

විචාළාහ බෝධිසත්ත්වයෝ කියන්නාහු "දේවිනි, මා ඉල්වා ආ එක්තරා බ්‍රාහ්මණයෙකුට දැසහාවයට දුනිමි"යි කිහ. ඉක්බිති දේවීන් වහන්සේ "සැමියනි, කවරහෙයකින් බමුණාට දරුවන් දන්දී මා තුන්යම් රෑ විලාප කියකියා හැසිරෙන කල්හිත් මෙපවත් කොවදුරන ලද දැයි පළමුකොට කීකල තොපගේ සිත දුක් බොහෝ වන්නේය. දැන් වූකලී ශාරීරික දුකින් දුක නුනී වන්නේ යයි,

130. "මං පස්ස මද්දි, මා පුත්තෙ මා බාළහං පරිදෙවසි,
ලවිඡාම පුත්තෙ ජීවන්තා ආරොගා ච භවාමසෙ"යි,

කියා මද්‍රිදේවීන් සතුහා නැවතද:-

131. "පුත්තෙ පසුං ච ධඤ්ඤං ච සබ්බ අඤ්ඤං ඝරෙ ධනං,
දජ්ජා සපරිසො දානං දිසවා යාචකමාගතෙ;
අනුමොදාහි මෙ මද්දි පුත්තකෙ දානමුත්තමං"යි,

කියා තමාගේ පුත්‍රදානයෙහි මද්‍රිදේවීන්ද අනුමෝදන් කළහ.

132. "අනුමොදාමි තෙ දෙව, පුත්තකෙ දානමුත්තමං,
දත්වා චිත්තං පසාදෙහි නියෙය්‍යා දානං දදෙ භව"යි

කියා පුත්‍රදානමය පින් අනුමෝදන්වූහ.

මෙසේ ඔවුනොවුන් සමග සතුටු කථාකරන කල්හි සක්දෙව් රජාණෝ මෙසේ සිතූහ. කෙසේදයත්: අපගේ ශ්‍රීමහා බොධිසත්ත්වයෝ ඊයේ දවස් පෘථිවිය කම්පිත කරවමින් දරුවන් දන්දුන්සේක, දැන් වනාහි කිසියම් හීනජාති ඇති පුරුෂයෙක් ඔබකරා අවුත් මද්‍රිදේවිය ඉල්වාගෙන යන්නේ තම් රජ්ජුරුවෝ ප්‍රතිඥා රහිත වන්නෝය, එබැවින් මම බ්‍රාහ්මණ වෙශයෙන් උත්වහන්සේ කරා එළඹ මද්‍රිදේවිය ඉල්වාගෙන පැරැම් කුළුහන්වා කිසිවෙකුට කොදිය හැකි කොට යළි උන් රජ්ජුරුවන්ටම බාරදී එන්නෙමියි කියාසි. මෙසේ සිතා සක්දෙවිරජාණෝ සූයෙඝාඝමන සමයෙහි බ්‍රාහ්මණ වෙශයෙන් බෝසතාණන් ළඟට ගියහ. මහා බොධිසත්ත්වයෝ ඔවුන් දැක යාචකයෙක් ආයේයයි හටගත් ප්‍රීති සොම්නස් ඇත්තෝ ඔවුන් සමග මිහුරු පිළිසඳර කථාකොට "බ්‍රාහ්මණය, කුමක්නිසා මෙහි ආයෙහිදැ"යි විචාළෝය. ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රයෝ මද්‍රිදෙවීන් ඉල්වූහ. එහෙයින් වදාරතලදි:-

"පුනදෙව ඝකෝකා ඔරුයා ගුත්තා බ්‍රාහ්මණ සන්නිඝතා,
ආයාච් මං මද්දිදෙවිං සිලවනගිං පතිබ්බතා"ති (116)

ඉක්බිති මහාසත්ත්වයෝ රජයේ දවස් මාවිසින් බ්‍රාහ්මණයාට දරු දෙදෙනා දෙතලදහ, මම එතැනි වෙතෙහි එකලාව ම ඇ, "නට සිල්වත්වූ පතිව්‍රතාධර්මයෙන් යුක්තාවූ මද්‍රිදෙවිය කෙසේ දෙම්දැ"යි නොසිතා පසුබැසීමක් නැතිව විදහාලූ අතෙහි අතකී රන්තයක් තබන්නාක් මෙන් නො ඇකුළුණු සිත් ඇතිව අද මානේ දානපාරමිතාව මහාකප්‍රාප්ත වන්නේයයි තුටුපහටුව පැතඇ නාද කරමින්,

133. "දදාමි නං විකම්පාමි ඣං මං යාචසි බ්‍රාහ්මණ,
සත්තං නපජහිස්සාමි දානෙ මෙ රමති මනො"යි කියා

වහාම කෙණ්ඩියෙන් පැන් ගෙන බමුණු අත පැන් වත්කොට භාර්‍යාව දන්දුන්සේක, එහෙයින් වදරන ලදි.

"මද්දිං හත්ථෙ ගහෙත්වාන උදකඤ්ච මුඛිය,
පඤ්ඤත්තමාසනං තස්ස මද්දිමදාසහං"ති (116)

එකෙණෙහිම යට කියන ලද ප්‍රකාර සියලු ප්‍රාතිහාර්‍යයෝ පහළ වූවාහුය. එවිට දැන් වූකලි "උත්තමහත්සේගේ සම්‍යක් සම්බොධිය නොදුරෙහිය"යි දිව්‍යබ්‍රහ්ම සමූහයා අතිශය ප්‍රීති සොම්නසට පැමිණියාහුය, එහෙයින් වදරතලදි.

"මද්දියා දියමානාය ගගනෙ දෙවා පමොදිතා,
තදුපි පඨවි කම්පි සිනෙරුවන වටංසකා"ති (117)

ඉක්බිති ශක්‍ර - බ්‍රාහ්මණයාට දෙනු ලබන්නාවූ මද්‍රිදෙවිත්ට නොසතුටක් හෝ බැම නැටවීමක් හෝ නොවිය. උන්ට මෙබඳු අදහසක් විය. "මාහිමියන්වහන්සේගේ අභිප්‍රායයක් කරන සේක්ව"යි කියාසි.

134. "කොමාරියාහං භරියා සාමිකො මම ඉස්සරො,
යඤ්චෙඤ්ච තස්ස මං දජ්ජා විකණෙය්‍ය හණෙය්‍ය වා" යනු

එහෙයින් කියනලදි. මහාපුරුෂයාණෝද පිත්වත් බ්‍රාහ්මණය, මට මද්‍රිදෙවිත්ට වඩා සියගුණයෙන් දහස් ගුණයෙන් සර්ව්ඥතාඥානයම ප්‍රියතරය. එහෙයින් මාගේ මේ දානය ඒ සර්ව්ඥතාඥාන ප්‍රතිවෙධයට ප්‍රත්‍යය වේවයි කියා මද්‍රිදෙවිත් දන් දුන් සේක. එහෙයින් වදරතලදි.

"ජාලිං කණ්හාජිනං චිතං මද්දිදෙවිං පතිබ්බතං,
වජමානො න විඤ්ඤසිං බොධියාඤඤ කාරණා" (118)

"න මෙ ඳදසසා උනෝ පුතතා මද්දිදෙවි න ඳදසසියා,
සබ්බඤඤුතං පියං මයාහං තසමා පියෙ අදූසහං"සි (119)

දූසිදූසයන් දූසකමින් මුදවීම යහපත් ධර්මයක් යයි කියනු ලැබේ. එහෙත් මහාබෝධිසත්ත්වයෝ ජාතිසම්පන්නවූ ක්ෂත්‍රිය වංශොද්භූත තමන්ගේ දරුවන් අනුන්ගේ දස්කමට දීපියන්ට කරුණු කිමයත්: ඒ අනුධර්මතායෙකි, "මමය මාගේය"යි පරිගෘහීත තමාගේ සියලු වස්තූන්ගේ නිරවශෙෂ පරිත්‍යාගය වූකලි බුද්ධකාරක ධර්මයන්ට අනුගතවූ ධර්මතාවෙක. දෙය ධර්ම ප්‍රතිග්‍රාහක විකල්පරහිතව දානපාරමිතාව පුරන්ට උත්සාහයට පැමිණි බෝධිසත්ත්වයන්ට මාගේයයි පරිගෘහීත වස්තුවක් ඉල්ලන යාචකයකුහට පරිත්‍යාග නොකිරීම නොයුතුද, ඒ පුරාතන ධර්මයකුදු වෙයි. සියල්ල පරිත්‍යාගය, විශෙෂයෙන් ප්‍රියතර වස්තු පරිත්‍යාගය වනාහි සියලු බෝධිසත්ත්වයන් වහන්සේලාගේ ආචිණ්ණ සමාචිණ්ණ ධර්මයෙකි. කුලවංශාගත ධර්මයෙක; කුලප්‍රවෙණියක; කිසි බෝධිසත්ත්වයෙකුත් වංශානුගතවූ රජ ඉසුරු ආදි ධනපරිත්‍යාගය තමාගේ ශීර්ෂ නයනාදි අඞ්ගපරිත්‍යාගය, ප්‍රිය ජීවිත පරිත්‍යාගය, කුලවංශ ප්‍රතිෂ්ඨාපකවූ ප්‍රිය පුත්‍ර පරිත්‍යාගය, මනාපචාරිවූ ප්‍රිය භාර්‍යා පරිත්‍යාගය, යන **පඤ්චමහාපරිත්‍යාගය** නොකොට බුදුවූ විරුදැ? ඒ එසේමය, මඬගල තම් බුදුන් බෝසත් දවස බෝධිපරියෙෂණයෙහි හැසිරෙන කල්හි පෙර අත්බවට තුන්වන ආත්ම භාවයෙහි අඹුදරුවන් සමග එක් පර්වතයෙක්හි වැඩවසනකල **බරදූසික** නම් යකෙක් බෝසතාණන් වහන්සේගේ දානාධ්‍යාශය අසා බමුණුවෙසින් අවුත් මහාසත්ත්වයන් වහන්සේගෙන් දරුදෙදෙනා ඉල්ලූයේය, මහාසත්ත්වයෝද බ්‍රාහ්මණයාට පුත්‍රයන් දෙන්නෙමියි තුටුපහටුව දිය කෙළවරකොට ඇති පෘථිවිය කම්පිත කරවමින් දරුවන් දෙදෙනම දන්දුන්සේක. යක්ෂයෙම සක්මන් කෙළවර එල්වෙන ප්‍රවරුව නිසා සිට මහාසත්ත්වයන් බලා සිටිද්දීම මූලපලාම්ටක් සෙයින් කැපිය. ගිනිදැල්මෙන් ලේ දහර වගුරුවන්නාවූ යක්ෂයාගේ මුව බලන්නාවූ මහාපුරුෂයන්ට "එකාන්තයෙන් යක්ෂයා මා වංචා කෙළේය" හි උපදින සිතට ඉඩ නොදෙන්නාහට උපාය කෞශල්‍යය තමන් මතාකොට වැඩූ බැවින් අතීත ධර්මයන් කැවත පිදුසිඳ නොගන්නා බැවින් හා අනිත්‍යාදි වශයෙන් සංස්කාරයන් මොනවට පිරිමැද්ද

බැවින්ද මේසේ ක්ෂණසථායි වූ පහඩුරවූ අසාරවූ සංස්කාර කලාපයකින් එකාන්තයෙන් මා විසින් දානපාරමිතා තෙමෝ පූරන ලද්දීය. එකාන්තයෙන් මාවිසින් මහත් වැඩ වඩා මේ ලබන්නලද්දේයයි සොම්නසම උපන්නේය. උන්වහන්සේ එකෙණෙහිම අසාධාරණවූ තමන්ගේ චිත්තාචාරය දැන මේ හෙතුකොට ගෙන එක දවස සියලඟින් රැස් නික්මෙන්වයි ප්‍රාර්ථනාකළෝය. උන්වහන්සේගේ ඒ පැතුම් බෙලෙන් බුදුවූ කල්හි ශරීරාලොකය දස දහසක් සක්වල හැම්වේලෙහිම පැතිර සිටියේය. මේ ක්‍රමයෙන්ම සෙසු බොධිසත්ත්වවරයෝ ද තම තමන්ගේ ප්‍රියතර පුත්‍රදාරයන් පරිත්‍යාග කොට සම්බුදුකමට පැමිණීමට අවබොධ කළාහුය. වැළි එකකුදු ඇත.

කිසියම් පුරුෂයෙක් කිසිවකු සම්පයෙහි ග්‍රාමයක් හෝ ජනපදයක් හෝ පොරොත්දුවට ගෙන කම්නන කරන තැනැත්තේ තමාගේ හෝ අතවැස්සන්ගේ හෝ ප්‍රමාදයෙන් කුනුවූ (ධනය) නයවශයෙන් දරන්නේ නම් ඔහු අල්වාගෙන බන්ධනාගාරයෙහි ප්‍රවේශ කරන්නේද, ඉක්බිති ඔහුට මෙසේ අදහසක් වන්නේය. මම වනාහි මේ රජහුගේ කම්නන කරන්නෙම් මෙපමණ (ධනය) වශයෙන් දරමි, එහෙයින් රජ්ජුරුවෝ මා බන්ධනාගාර යෙහි ලූහ ඉදින් මම මෙහිම වෙම්නම් මාද නසන්නාහ. මාගේ අඹුදරු කම්කරු පුරුෂයෝද අපාකෘත ජීවිතය ඇත්තාහු මහත් විනාශයට පැමිණෙන්නාහුය. මම රජ්ජුරුවන්ට දැනුම්දී මාගේ පුත්‍රයා හෝ බාල මල් හෝ මෙහි තබාපියා නික්මෙන්නෙම් නම් යෙහෙක, මෙසේ කොට බන්ධනයෙන් මිදුනෙම් නොබෝ කලකින්ම මිත්‍රයන්වූ පරිදි දැස මිත්‍රයන් පරිදි ධනය රැස්කොට රජහටදී ඔහුද බන්ධනයෙන් මුදම්. අප්‍රමාදව උත්ථානවීර්යයෙන් මාගේ සියලු සම්පත් ප්‍රකෘති කරගත්තෙමියි මෙසේ කෙරේද, ඒ කාරණයද මෙබදු නිශ්පත්ති ඇත්තේයයි දතයුතු. එහි මේ උපමා සංසන්දනයයි. එතම් රජ මෙත් කම්යද **බන්ධනාගාරය** මෙන් සසරද, රජුවිසින් බන්ධනාගාරයෙහි ලූ **පුරුෂයා** මෙන් කම්වශයෙන් සසර සැරි සැරිමෙහි සිටි පුරුෂතෙමේද, බන්ධනාගාරයෙහි සිටි පුරුෂයා එහි තමාගේ පුතු හෝ මල්බෑයා හෝ අනුන් අයත් කිරිමෙන් ඔවුන් හා තමාගේ දුකින් මිදීම මෙන් මහා පුරුෂයාණන් තමන්ගේ පුත්‍රාදීන් අනුන්ට දී සම්බුදුකමින ප්‍රතිලාභයෙන් සියලු සත්ත්වයන් සසරදුකින් මුදවාලීමද, පහව ගිය දුක් ඇති ඒ පුරුෂයා අභිප්‍රාය වූ පරිදි සම්පත්නිවෙසෙහි

පිහිටීම මෙන් පහවූ සසරදුක්ඇති මහාපුරුෂයන් වහන්සේ බුදුබැවින් දශබල සච්ඡේදතාඤාණ සංඛ්‍යාත සම්පත්තියෙන් යුක්තවීමද, තමන්ගේ වචකකාරීන්ගේ ත්‍රිවිද්‍යාදි සම්පත්තියෙන් යුක්තවීම දැයි මෙසේ හෙයින් මහාපුරුෂයන්ගේ පුත්‍රදාරා පරිත්‍යාගය නිරවද්‍ය සභාවයෙක් මැයි. උන්වහන්සේලාගේ අඞ්ගජීවිත පරිත්‍යාගයෙහිත් යම් වොදනාවක් වේනම් ඒද මෙයින්ම විශොධනය කරන ලදුයි ද දත යුතුයි.

මෙසේ වනාහි මහාසත්ත්වයන් මද්‍රිදෙවිය දුන්කල්හි ශක්‍රයෝ ආශ්චර්‍යාත්භූත සිත් ඇතිව:-

135. සබ්බෙ ජීතා තෙ පවුත්තා යෙ දිබ්බා යෙ ච මානුසා,
නිබ්බාදිතා තෙ පථවි සදෙවා තෙ තිදිවං ගතො.

136. දුද්දදං දදමානානං දුක්කරං කම්ම කුබ්බතං,
අසන්තො නානු කුබ්බන්ති සතං ධම්මා දුරන්නයො.

137. තස්මා සතං ච අසතං නානා හොති ඉතො ගති,
අසන්තො නිරයං යන්ති සන්තො සග්ග පරායනා, ති" සි

ශක්‍රාදි නයින් මහාපුරුෂයන්ට දානානුමොදනා වශයෙන් සතුති කළෝය. සතුති කොටපියා උන්වහන්සේට මද්‍රිදෙවිය පාවා දෙන තැනැත්තෝ:-

138. දදාම් හො, තෙ භරියං මද්දිං සබ්බඞ්ගසොභනං,
ඔක්කාකුව මද්දියා ජනෙත්තා මද්දි ච පතිනොථවා" සි.

කියා මද්‍රිදෙවිය පාවාදී ළඟිරු මඩල මෙන් දිව්‍ය ආත්මභාවයෙන් දිළිසෙමින් අහස්හි සිට කියන්නාහු:

139. "සකෙක්‍ා හමස්මි දෙවින්ද්‍ර ආගතොස්මිං තව සන්තිකෙ,
වරං වරස්සු රාජීසි වරෙ අඤ්ඤ දදාම් තෙ," සි

කියා වරයෙන් පැවරුහ. මහාසත්ත්වයෝද මාගේ පියාණෙනි තැවත මා රාජ්‍යයෙහි පිහිටුවාවයි ද, වධයට පැමිණියවුන් වධයෙන් මුදවන්නෙමියයිද, සියලු සත්ත්වයන්ට පිහිටවන්නෙයයිද, පර සත්‍රුන් කරා නොයන්නෙමියයිද, සත්‍රුන් වශයට නොයන්නෙමියයිද, මාගේ පුත්‍රතෙම දීඝායු ඇත්තෙක් වේවයිද, ආහාරපානාදි දෙය ධර්‍ම බොහෝ වේවයිද, ඒ ද සෘජවීමක් කැතිව ප්‍රසන්න සිතින් දෙන්නෙමියයිද, මෙසේ මහදන් පවත්වා දිව්‍යලොකයට ගොස් එයින් මෙහි ආයේ සච්ඡේදතාඤාණයට

පැමිණෙන්නෙමියයිද, යන මේ වර අට ඉල්ලූහ. සක්දෙව් රජාණෝද නුබවහන්සේගේ පියාණෝ සංජෙය්‍ය මහරජ්ජුරුවෝ මෙහිම අවුත් නුබවහන්සේ ගෙණගොස් රාජ්‍යයෙහි පිහිටවත්තාහ. නුබවහන්සේගේ සෙසුත් සියලු මනදෙළ මුදුන් පැමිණෙන්නේය. නොකැවෙනු මැනව, අප්‍රමාද වෙවයි, අවවාදකොට දෙවිලොවටම ගියහ. බොධිසත්ත්වයන් වහන්සේද මද්‍රී දෙව්ද ශක්‍රයා විසින් දෙනලද්දාවූ ආශ්‍රමයෙහි වාසය කළාහුය, කුමාරයන් ගෙන යන පූජක තෙමේද දෙවතාවන් විසින් ආරක්‍ෂා කරනලද්දේය. එක්තරා දෙව්දුවක් දවසක් දවසක් පාසා රාත්‍රි භාගයෙහි මද්‍රී දෙවියගේ විලාසයෙන් අවුත් කුමාරයන් පොෂණය කළාය. හෙතෙම දෙවතාධිෂ්ඨිතව කළිඟු රටට යන්තෙමියි අඛම්සකින් දෙව්තුරා නුවරටම ගියේය. රජ්ජුරුවෝ විනිශ්චය සථානයෙහි හුන් තැනැත්තෝ බමුණා සමඟ රාජාඞ්ගනයෙන් යන්නාවූ දරුවන් දැක ඇඳින බ්‍රාහ්මණයා සමඟ ඔවුන් කැඳවා එපවත් අසා බොධිසත්ත්වයන් කියූ නියාවෙන් වසතුවදී කුමාරයන් ගෙන නඟවා වළඳවා සවිලංකාරයෙන් සරසා රජ්ජුරුවෝ කුමාරයන්ද, ඵුසතිදෙවි කුමාරියද, ඇකයෙහි තබාගෙන බොධිසත්ත්වයන් හා මෙහෙසියගේද තොරතුරු ඇසුවාහුය. රජ්ජුරුවෝ ඒ අසා එකාන්තයෙන් මා විසින් තැසුනාවූ වැඩිමක් කරන ලද්දේයයි සංවේගයට පැමිණ එකෙණෙහිම ඵුසති දෙවින් හා දරු දෙදෙනා ඇතුළු දෙළොස් අක්ෂෞහිණියෙක් පමණ සෙනඟ ගෙන වඩා පළිතයට අභිමුඛව ගියෝය. අනුක්‍රමයෙන් ගොසින්ලා පුතණුවන් හා යෙහෙළිණියන් දුටහ. වෙසසන්තර රජ්ජුරුවන් වහන්සේද ප්‍රිය පුත්‍රයන් දැක දරාගත නොහැකි ශොකයෙන් සිහිනැතිව එහිම ඇදවැටුනාහ. මද්‍රීදෙවිද මවුපියෝද එකද උපන් සැටදහසක් ඇමතියෝද එසේම සිහිනැතිව වැටුනාහුය. ඒ කාරුණික භාවය දුටු කිසිකෙනෙක් සවනාවයෙන් ඉවසා දරාගත නො හැක්කෝවූහ. සියලු ආශ්‍රමපදය සෙනඟ නමැති කල්පාන්ත වාතයෙන් මූලින් උපුටගිය සල්වකයක්සේ වූයේය. සක්දෙව් රජ ඔවුන්ගේ විසංඥ භාවය දුරුකරනු පිණිස පොකුරු වැස්සක් වස්වාලූහ. තෙමෙනු කැමැත්තෝ පමණක්ම තෙමෙති. පොකුරුපතෙහි වැසිමෙන් පෙරලී ජලය නික්මෙයි සියල්ලෝම සිහිලැබුවාහුය. එකල්හි ඉට කියනලද ප්‍රකාර පෘථිවිකම්පනාදි ආශ්චය්‍යයෝ පහළවූවාහුය. එහෙයින් වදළහ;

"පුනාපරං බ්‍රහාරඤ්ඤ මාතාපිතූ සමාගමෙම,
කරුණං පරිදෙවනෙන සල්ලපනෙන සුචා දුචං. (120)

ගිරොත්තපෙන ගරුණා උගිනනං උපසඞ්කමි,
තදා පි පඨවී කම්පි ඔනෙරුවනවතංසකා"ති. (121).

ඉක්බිති සංජය මහ රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් සෙවීමා-කරවාගෙන රජය පාවාදී එකෙණෙහිම ඉසරුවුල් බහවා ඉස්සෝදු තහවා සම්භරණ විහූෂිතවූ දිව්‍යරාජයකු සේ බබලමින් සිවියදී මද්‍රී දේවී හා රාජ්‍යයෙහි අභිෂෙක කළහ. ඒ ඇසිල්ලෙහිම එතැන් සිට දෙවළාස් අක්ෂෞහිණියක් පමණ සිවුරහසෙතගින් පුතණුවන් පිරිවරාගෙන වඩා පර්වතයෙහි සිට ජෙතුත්තර නුවර දක්වා සැටයොදුනක් මහ සරසවා දෙමාසයකින් සුවසේ නුවරට පැමිණවූහ. මහාජනයෝ මහත් ප්‍රීති සොම්නස් වින්දහුය. පිළිසිසැරිම් ආදිය කළහ නගරයෙහි නැදිබෙර වැයුු. ඝටත් පිරිසෙසින් බළලුන්ගේ පටන් බඬතවල සිටි සියල්ලෝම බඬතවලින් මිදුනාහුය. බොධිසත්ත්වයෝ නුවරට වන් දවස් උදැසනම මෙසේ සිතුසේක. එනම්: හෙට අලුයම මා දැබැව් අසා යාචකයෝ එන්නාහුය. ඔවුන්ට මම කුමක් දෙන්නෙම්ද කියායි. එකෙණෙහිම සක්දෙව් රජහුගේ පඬුපුල් සලස්ත නුණුවිය. ඔහු ආවජ්ජනා කරන්නාහු ඒ කාරණය දැක රාජනවත-යාගේ පෙරපසු ගෙවතු කවිදෙහ ප්‍රමාණය (තුකවිය පමණ) පුරවමින් මහා මෙඝයක් මෙන් සත්රුවන් වැසි වැස්සූ. සියලු නුවරද දණක් පමණ වැස්සූ. එයින් වදුළහ.

"පුනාපරං බ්‍රහාරඤ්ඤ, නිකඛම්මවා ස ඤාතිහි,
පවිසාම් පුරං රම්මං ජෙතුත්තරපුරුත්තමං. (122)

රතනානි සත්ත වස්සිංසු මහාමෙඝෝ පවස්සථ,
තදා පි පඨවී කම්පි ඔනෙරුවන වතංසකා. (123)

අවෙතනායං පඨවී අවිඤ්ඤාය සුඛං දුඛං,
සා පි දානබලා මය්හං සත්තකඛත්තුං පකම්පථ"ති (124)

මෙසේ සත්රුවන් වැසි නැහිකල්හි දෙවත දවස් මහා සත්ත්වයෝ යම්කුලඇත්ගේ පුළු පශ්චිම වසතුන්හි සත්රුවන් වැස්සේද ඒ ධනය ඔවුන්ටම වේවයි දෙවා යෙසු ධනය ගෙන්වා ගෙන තමන්ගේ ගෘහ වසතුවෙහි ධනය සමග කොටුගුල්ලා මහාදානය පැවැත්වූහ.

මේසේ අප මහබෝසතාණෝ එකම වෙසතුරු ඇත්බැව්හිදී අවඇවිදිදී වයස්හි හෘදයමාංශ යාචකයන්ට දෙන්නෙමියි දානාධ්‍යාශය උපන් කල්හිද මනුලැබූ දන්දෙන කල්හිද, රටින් නෙරතකල පැවැත්වූ මහාදානය සිතන කාලයෙහිද, පුත්‍රදාන-යෙහි හා කලත්‍ර දානයෙහිද, වඩා පව්තයෙහි ඉතිසමාගම යෙහිද, නුවරට ප්‍රවේශදින සත්රුවන් වැසි වටකල්හිද, සි යන මේ සත්තැන්හි සත්වරක් මහා පෘථිවි කම්පනාදි ආශ්චර්‍ය පහළ වීමට හෙතුභූතවූ මහදන් ආයුපමණින් පවත්වා ආයුක්ෂයෙන් තුසිපුරයෙහි උපන්සේක.

එහෙයින් වදාළහ බුදුහු:—

140 "තතෝ වෙස්සන්තරෝ රාජා දානං දත්වාන ඛත්තියෝ.,
කායස්ස භෙදා සප්පඤ්ඤූ සඟහං සෝ උපපජ්ජථ,"යි

එකල්හි **ප්‍රජාපතෙම** දෙවදත්තා වූයේය, **අමිත්‍රතාපනාව** විංචමාණවිකාවය, **චෙතපුත්‍ර** තෙම **ජන්නනම් අමාත්‍යය, අවිවුත නාපසයෝ ශාරිපුත්‍ර** ස්ථවිරයෝය, **ශක්‍රයෝ අනුරුද්ධ** ස්ථවිර-යෝය, **මද්‍රීදේවී** රාහුල මාතෘවූ **යශොධරා** දේවීය, **ජාලියකුමාර-යෝ රාහුල** කුමාරයෝය, **කෘෂ්ණාජිනාවෝ උත්පලවර්ණාවෝය**, මවුපියෝ මහාරජකුලයෝය, සෙසු පිරිස වනාහි බුදුපිරිසමය, **වෙස්සන්තර රජ්ජුරුවෝ** ලොකනාථවූ **සම්මාසම්බුදුරජාණන් වහන්සේ** ම ය.

මෙහි යට කියනලද ක්‍රමයෙන්ම අවශෙෂ පාරමිහු නිර්‍ධාරණය කටයුත්තාහුය. ඒ එසේමය, මහාසත්වයන් කුක්ෂිගතකල්හි දවසක් පාසා සයලක්ෂයක් වියදම්කොට දන්දෙනු කැමති මවුගේ දෙහළුයද, දන්දෙනු ලබන නමුදු ධනයාගේ ක්ෂයභාවයක් නොවීමද, උපන් ඇසිල්ලෙහිම අත විදහා දන්දෙමියි කිසිවක් ඇද්දැයි වවන පහළකිරීමද, සතර පස් ඇවිරිදි වයස්හි කිරිමවුන්ගේ අතට හියාවූ තමන්ගේ ආභරණ කැවත නොගනු කැමතිබවද, අට ඇවිරිදි වයස්හි හෘදයමාංශය ආදිකොට ඇති තමන්ගේ ශරීරාවයව දෙනුකැමති බවදැයි යනමේ ආදි සත්වාරයක් මහාපෘථිවි කම්පනාදි නොයෙක් ආශ්චර්‍ය අද්භූතයන් පහළවීමට හෙතුභූතවූවාහු මෙහි මහාපුරුෂයන්ගේ ගුණානුභාවයෝ යයි දතයුත්තාහුය.

එහෙයින් මෙසේ කියන ලදි:

"එවං අච්ඡරියා වෙව අබ්භූතා ච මහෙසිනෝ,—පෙ—
තෙසු විහඤ්ඤසාදෙපි දුක්ඛතෝ පරිමෝචයෙ,
පගෙවා කුක්‍රියා තෙසං ධම්මස්ස අනුධම්මතෝ"යි

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි
නවවන වෙස්සන්තරරාජ චරිතය නිමි.

X ගඟපණ්ඩිත චරිතය

තවද මේ පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි දසවන ගඟපණ්ඩිත චරිතය කිසේද? යත්:—

පුනා'පරං යදහොමි සඤ්ඤා පවනවාසිකෝ,
තිණපණ්ණඵලාහාරෝ පරහෙඨන විවජ්ජිතෝ (125)

මක්කටෝ ච සිඛාලෝ ච උද්දපොතෝ ච'හං තදා,
වසාම එකසාමඤ්ඤා ඝායං පානෝ ච දිස්සරෙ. (126)

අහං තෙ අනුසාසාමි කිරියෙ කල්‍යාණපාපකෙ,
පාපානි පරිවජ්ජෙථ කල්‍යාණෙහිනිවිස්සථ. (127)

කැවත අනික් චරිතයක් කියමි. හෙද අසව. ශාරිපුත්‍රයෙනි; බොධිපරියෙසනයෙහි හැසිරෙන්නාවූ මම යම් කලෙක්හි මහවෙනෙහි හැසිරෙන්නාවූ තණපත් පලාපල අනුභවකරන්නාවූ පරපීඩා විරහිතවූ ගඟ* පණ්ඩිතවීම්ද එකල්හි **වඳුරෙක්ද, සිවලෙක්ද, මස්කාවෙක්ද** මමද යන අපි සතරදෙන එක්සමිප ප්‍රදෙශයක වාසය කෙළෙමු. එක්ව වසන්නාහු උදැසනද සවසද ඔවුනොවුන් දක්නා ලැබෙත්. ගඟපණ්ඩිවූ මම වනාහි "ප්‍රාණඝාතාදි දශ අකුශලයන් දුරුකරවු, දානාදි කල්‍යාණ ප්‍රතිපත්තියෙහි පිළිපදිවු" යයි ඔවුන්ට කුශලාකුශලකම්යෙන් අනුශාසනය කෙළෙම්.

---

*කම්වශි ප්‍රාප්තවූ බොධිසත්ත්වවරයෝ වනාහි කවරහෙයකින් තිරිසන් යොනියෙහි උපදනාහුදයත්? තිරිසන්ගත සත්ත්වයන්ට අනුකම්පා පිණිසය.

මෙසේ මහා බොධිසත්ත්වයෝ තිරිසන් යොනියෙහි උපන් සේක් වී තමුන් ප්‍රඥාසම්පන්න භාවයෙන් කල්‍යාණ මිත්‍රයෙක්ව කලින්කල ඔබසම්පයට පැමිණි ඒ තුන්දෙනාට අවවාද වශයෙන් ධර්මදේශනා කළහ. ඔහු උන්වහන්සේගේ අවවාද පිළිගෙන තමන් වසන තැනට වැද සුවසේ වෙසෙති. මෙසේ කල් යන අතර බොධිසත්ත්වයෝ ආකාශය බලා පිරුණු සඳ දැක "පෙහෙවස රකිව්" යයි අවවාද කළ සේක. එහෙයින් වදාරතලදි:—

"උපොසථම්හි දිවසෙ චන්දං දිස්වාන පූරිතං,
එතෙසං තයො ආචික්ඛි දිවසා අජ්ජුපොසථෝ (128)

දුනානි පවියාදෙථ දක්ඛිණෙය්‍යස්ස දූතවෙ,
දත්වා දූතං දක්ඛිණෙය්‍යස්ස උපවසථුපොසථං"සි (129)

ශුක්ලපක්ෂ චාතුර්දශියෙහි මදක් නොපිරුණාවූ සඳ දැක ඒරාත්‍රිය පහත්වූකල පසළොස්වක් පොහොදින අරුණෝදගමන සමයෙහිම වඳුරු ආදි තුන්යහළුවන්ට "අද පොහෝදිනය වන්නේය. දන් පිළිගන්නවුන්ට දෙය ධර්මයන් ශකුනි පමණින් පිළියෙලකරවු, පෙහෙවස් වසවු, සිල්වත්ව සිට දුන්දනෙහි විපාක මහත, එසේ හෙයින් තොප සමීපයට පැමිණි දක්ෂිණාර්හයකුහට තොපවිසින් අනුභව කටයුතු ආහාරයෙන් දන්දී ඉක්බිති තෙපි අනුභව කරවු" යයි ප්‍රතිපත්ති විධාන කෙළෙමියි.

ඔහු යහපත්යයි බොධිසත්ත්වයන්ගේ අවවාදය මස්සාකයෙන් පිළිගෙන පොහොය ඉටාගත්තාහුය. ඔවුන් අතුරෙහි මස්කාවා උදැසනම නොදුරු සොයන්නෙමියි ගංඉවුරට ගියේය. ඉක්බිති බිලිවැද්දෙක් රේමසුන් සත්දෙනකු බාගෙන වැලක අවුතා ගංඉවුරෙහි වැලිවලින් වසාපියා මසුන් අල්ලමින් ගංගාවගේ අධඃස්‍රොතසට බැස්සේය. මස්කාවා මස්ගඳ දැනී වැලි පිරාපියා මසුන් දැක මස්වැලින්ම මෑත අරගෙන මේ මසුන් හිමිකෙනෙක් ඇද්දැයි තුන්වරක් අඩනා හිමියකු නොදැක අවුතාවූ වැලින්ම බැහැගෙනවුන් තමාවසන වනලැහැබ තබා සුදුසුවේලා පැමිණි විටම අනුනවකරත්තෙමියි තමාගේ ශීලය ආවජීතා කරමින් උන්නේය, සිවල්තෙමේද ගොදුරු සොයාගොස් එක් ක්ෂේත්‍ර-පාලකයකුගේ රැකවල් පැලෙහි තුබූ පැළහු මස්ද ගොයකුද දීමුලක්ද දැක මේ හැමට හිමියෙක් ඇද්දැයි තුන්වාරයක් අඩහා

භීමියකු නොදැක දිමුල එල්වාතිබූ ලතුව බෙල්ලෙහි ලාගෙන පැලඳූ මස්ද ගොයාද මුඛයෙන් ඔහැගෙන තමා වසන ලැහැබෙහි තබාලා වේලාව පැමිණිකලම අනුභව කරන්නෙමියි තමාගේ ශීලය ආවජ්ජනා කරමින් හොත්තේය. වදුරුතෙමේද වතලැබකට වැද අඹකැනක් ගෙනවුත් තමාවසන ලැහැබ තබාලා වෙලාවෙහිම අනුභවකරන්නෙමියි තමාගේ ශීලය ආවජ්ජන කරමින් හොත්තේය. එකාන්තයෙන් යාචකයෙක් එන්නේ තම ඉතාසහපතැයි යන සිත තුන්දෙනාටම උපන්නේය. එහෙයින් වදළහ:

"තෙ මෙ සාධූනි වචානා යථාසන්ති යථාබලං"
දුනානි පවියාදෙන්ථා දක්ඛිණෙය්‍යං ගවෙසසු"ඉ. (130).

ඔවුන් තුන්දෙන මාගේ අවවාදය මැනවයි කියා ශක්ති පරිදි දෙන් බල පරිදි දෙන් දෙය ධර්මයන් පිළිගෙළකොට දක්ෂිණාර්හයන් සෙවූහ.

බොධිසත්ත්වයෝ වනාහි වේලාව ආ කලම ගොස් තිතණ අනුභව කරන්නෙමියි තමත් වසන පදුරෙහිම උත්සේක් මෙසේ සිතූහ. කෙසේදයත්:—මා සමීපයට ආවාවූ යාචකයන්ට තෘණ අනුභව කරවයි කියනොහැකිය. තලසහල් ආදියද මට නැත ඉදින් මා සමීපයට යාචකයෙක් එන්නේනම් මා තෘණ කා ඔහුට මාගේ ශරීරමාංශය දෙන්නෙමියි කියායි එහෙයින් වදරනලදි:—

"අහං නිසජ්ජ විනෙනඞිං දුනං දක්ඛිණානුවජ්ජවං,
යදිහං ලනෙ දක්ඛිණෙය්‍යං කිං මෙ දුනං භවිස්සති, (131)

න මෙ අස්සි තිලා මුගගා න මාසා තණ්ඩුලා සතං,
අහං තිණෙන යාපෙමි න සක්කා තිණදුතවෙ (132)

යදි කොචි එති දක්ඛිණෙය්‍යො භික්ඛාය මම සන්තිකෙ,
දජ්ජාහං සක්කතත්තානං න සො තුච්ඡා ගමිස්සති"ඉ. (133)

මෙසේ යථාභූත භාවය සලකන්නාවූ බොධිසත්ත්වයන්ගේ පරිවිතර්කානුභාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශිලාසනය උෂ්ණාකාරයක් දැක්වී. ශක්‍රයෝ කිමෙක්දෝහෝයි ආවජ්ජනා කරන්නෝ ඒ කාරණය දැක සසරප්‍රුරුවන් විමසන්නෙමියි පළමුකොට මස්කාවා වසන තැනට ගොස් බමුණුවෙසින් සිටියාහ.

ඔහු විසින් බ්‍රාහ්මණය කුමක් පිණිස සිටියෙහිදැයි කිකල්හි ඉදින් කිසි ආහාරයක් ලබන්නෙම් නම් පේව මහණදම් කරන්නෙමියි කිය. එහෙයින් කියන ලදී.

141. "සන්තාමේ රොහිතා මච්ඡා උදකා ථලමුබ්භතා,
ඉදං බ්‍රාහ්මණ මේ අත්ථි එතං භුඤ්ජා වතෙ වස"යි

බ්‍රාහ්මණය, දියෙන් නොඩට නගන ලද්දාවූ රේමසුන් සත්දෙනෙක් මාවිසින් ලබන ලද්දාහුය. බඹුණ ඒ මට ඇත්තේය. එය අනුභව කොට වෙනෙහි වසවයි කියේය. බ්‍රාහ්මණයෝ එය එසේ වේවා. පසුව දැනගන්නෙමියි කියා සිවලාගේද වානරයාගේද සමීපයට ගොස් ඔවුන් විසිනුදු තමන්ට තිබෙන්නාවූ දෙයධර්මයෙන් පවරනලද්දේ ඒ එසේම වේවා. පසුව දැනගන්නෙමියි කිහ. එහෙයින් කියන ලදී.

142. "ද්‍රුසසමේ ඛෙත්තපාලසස රත්තිභත්තං අපාහතං,
මංසසූලා ච වෙ ගොධා එකං ච දධිථාලකං.
ඉදං බ්‍රාහ්මණ මේ අත්ථි එතං භුඤ්ජා වතෙ වස

143. අම්බපක්කාදකං සීතං සීතච්ඡායං මනොරමං,
ඉදං බ්‍රාහ්මණ මේ අත්ථි එතං භුඤ්ජා වතෙ වස"යි

බ්‍රාහ්මණයෙනි, ක්ෂෙත්‍රපාලයකුගේ මේ රාත්‍රි භොජනයෙන් ගෙනෙතලද අතුරෙහි පැලහු මසුන් දෙදෙනෙකුන්ද ගොයෙකුද දීමුලක් ද මට ඇත්තේය. එය අනුභව කොට වනයෙහි වාසය කරව.

බ්‍රාහ්මණයෙනි, පැසුණු අඹ, සිහිල් ජලය, සින්කලු සිහිල් සෙවනය යනමේ මට ඇත්තේය, එය අනුභවකොට වනයෙහි වාසය කරවයි කියේය.

ඉක්බිති බ්‍රාහ්මණයෝ ශඝපණ්ඩිතයන්ගේ සමීපයට ගියහ. ඔහුවිසින්ද කවරක් නිසා ආයෙහිදැයි කිකල්හි පළමුකී පරිද්දෙන්ම කිහ එහෙයින් වදරණලදී.

"මම සඩ්ඛාපපමඤ්ඤය සකෙකා බ්‍රාහ්මණවණ්ණිතො,
ආසයං මෙ උපාගඤ්ඡි දානං වීමංසනාය මෙ. (134)

තමහං දිඤාන සන්තුඅෙඨා ඉදං වචනබ්‍රැවි,
සාධු බොධි අනුපපතෙතා යාඅහෙතු මම සනතිඅක. (135)

අදිනනපුබබං දුනවරං අජජ දසසාමි තෙ අහං,
තුවං සීලගුණුපෙතෙතා අසුනතං තෙ පරහෙඨනං. (136)

එහි අගගිං පදිපෙහි නානාඛඅෙඨ සමානිය,
අහං පවිසසං අනතානං පඤඤං තවං හඤඤසිසසසි. (137)

සාධුති සො භවිඨමනෙතා නානාඛවිඨෙ සමානයි,
මහනනං අඤාසි විතඤං කඤානඛගාර ගබ්භකං. (138)

අගගිං තසස පදිපෙසි යථා සො බ්‍රපපං මහානඅවේ,
ඔතෙටඨා රජඝතෙ ගනෙන එකමනනං උපාවිසිං (139)

ඝදු මහාඤවිඨපුඤෙඤා ආදිතෙතා ධුමධුමායති,
තදුපපතිඤා පපතිං මඤඤ ජාලසිඛනනරෙ, (140)

යථාසිතොදඤං නාම පවිවිඨං යසස කසසවි.
සමෙති දරථපරිළාහං අසසාදං දෙති පිති ච. (141)

තඤෙව ජලිතං අගගිං පවිවිඨසස මමං තදු,
සබබං සමෙති දරථං යථා සිතොදඤං විය"සි (142)

වුඤාප්‍රකාර මාගේ පරිවිතඤිය දැන සක්දෙවිරජාණෝ බවුණු වෙසින් මාගේ දැනය විමසනු පිණිස මා වසන ලැහැබට එළඹියහ. ඔහු දැක සතුටුවූ මම මේ වචන කීමි. "බවුණ, මා සමීපයට ආහාර සොයා ආ ගමන ඉතා යහපත. අද මම් අබොධිසත්ත්වවූ කිසිවකු විසින් නුදුන්වරු උතුම් දැනයක් දෙන්නෙමි. තෙපි වතාහි ශීලගුණයෙන් යුකතවූයෙහිය. එබැවින් අනුන් පෙළීම හෙවත් ප්‍රාණවධය තොපට නුසුදුසුය. මෙහි එව, තොයෙක් දර රැස්කොට දල්වව, මම වතාහි තාවසින් කළ අහුරු ගැබට පැන තෙමේම පැළඳෙමි. පැළඳි ගියකල්හි තෝ මා අනුභව කරන්නෙහියි. සතුටුසින් ඇත්තාවූ ශක්‍රයෝද "යහපතැ"සි කියා නොයෙක් දර ගෙනෙන්නෙකු මෙන් විය. එකෙණෙහිම පහවූ ගිනිදැල් හා දුම් ඇති අහුරෙන් පිරුණු අභ්‍යන්තර ඇතිකොට සිසාරා දිලිසෙන්නාවූ සැයක් සාඩියෙන් මැවූහ. ඒ ගිනිකඳ යම්සේ මහත්වන්නේද එසේ ගිනිදැල්වූහ. යළි ඉදින් මාගේ ශරීරයෙහි ලොම් අතරෙහි කිනිතුල්ආදි සත්ත්වකෙනෙක්වූනම් ඔවුහු නොමියෙන්වාසි සිතා රජසින් ගැවසීගත්තාවූ ශරීරය තුන්වරක් කිළිපොළාපියා දර ඇවිලෙන තෙක් එකත්පස්ව උනිමි. ඒ දරරැස හාත්පසින් ඇවිල (වාතවෙගයෙන් නගනදැල්සිළු විසින්)

දුම්දමන කල්හි මේ අහුරු රස මාගේ ශරීරය දවන්නාහට හැකියයි සිතා ගිනිසිළු අතුරෙහිවූ අහුරු රස මැදට පියුම් ගැබකට පැනපියා සතුටුව උන් රාජහංසයකු මෙන් සතුටුසින් ඇතිව තමන්ගේ සකල ශරීරය දුන මුඛයෙහි දී පැනපිම්. එකල්හි යම්සේ සෘෂිකාලයෙහි යම්කිසිවෙක් සිහිල් ජලයට පිවිසියේ ඔහුගේ ශරීර පීඩා සංසිඳුවාද ආශ්වාදය හා ප්‍රීතියත් ගෙනදේද එසේම දිලිසුණාවූ ඒ අහුරු රැසට පිවිසියාවූ මාගේ ලොමකූපයකට පමණ විත් උෂ්ණාකාරයක් නුහුනුයේය. වැලි කිමෙක්දයත්? දුකසිතියෙන් සම්දරථ පරිලාහ සංසිඳුනේ මෙසේ අදහස්විය. මාවිසින් බොහෝකාලයකින් ඡවිවම්මාදි සියලු ශරීරාවයව දුන මුඛයෙහි පරිත්‍යාග කටයුතුයයි කළ පැනීම මසාකප්‍රාප්ත වූයේය කියායි. එහෙයින් වදරතලදි:—

ඡවිවම්මං මංසං නහාරුං අට්ඨිං හදයබන්ධනං,
කෙවලං සකලං කායං බ්‍රාහ්මණස්ස අදාසහං"ති (143)

සිවි, සම්, මස්, නහර, ඇට, හදමස්වැදුල්ල නොහොත් හදමස හා එය බැඳගෙන මෙන් සිටියාවූ යකහ මාංසයද නිරවශෙෂ වූ සියලු ශරීරයද බ්‍රාහ්මණයාට දුනිමි යනු එහි අර්ථයි.

ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් මවනලද ඒ ගින්න තමන්වහන්සේගේ ශරීරයේ ලොමකූපයකුදු හුණුකොටපියනු නුහුනුයේය. බොධිසත්ත්වයන් හිමගැබකට පැමිණියකු සේ බ්‍රාහ්මණ වෙශධාරී ශක්‍රයාට ආශ්චර්‍ය්‍ය තෙපුල් කිහ. කෙසේද: බ්‍රාහ්මණයෙනි, ඔබ විසින් දැල්වූ ගිනි ඉතා සිහිල! ඒ කිමෙක්ද! යි. ශක්‍රයෝද පණ්ඩිතයෙනි, මම බ්‍රාහ්මණයෙක් නොවෙමි. මම ශක්‍රදෙවෙන්ද්‍රවෙමි. නුඹවහන්සේ විමසන්නට ආයෙමි මෙසේ කෙළෙමි. **ශක්‍රයෙනි, නෙපි සිටුව, එකලා නොප තබා මේ සියලු ලෝවැසිතෙමේ දැනයෙන් මා විමසන්නේද මාගේ නොදෙනු කැමති බවක් කිසිසේත් උපදවිය හැකිනම් ඒවිමසා බලව"යි** කියා බොධිසත්ත්වයෝ සිංහනාද කළහ.

ඉක්බිති ශක්‍රයෝ **ශශපණ්ඩිතයෙනි,!** නුඹවහන්සේගේ ගුණයෝ මේ මහාභද්‍රකල්පය මුළුල්ලෙහි ප්‍රකටව පෙනෙත්වයි කියා පර්වතය මිරිකාපියා රසය හැරගෙන චන්ද්‍රමණ්ඩලයෙහි ශශරූපය ඇඳ බොධිසත්ත්වයන් ඒ වනලැහැබ අලුත් හිතණ පිට වඩා හිඳුවා තමන්ගේ දිව්‍යලොකයටම ගියහ. ඒ පණ්ඩිතවරු සතර දෙනාත් සමගිව එකසිත්ව පන්සිල්ද අටසිල්ද පුරා සුදුසු පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය.

එකල්හි ඔස්කා පොතකයෝ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෝය, සිගාලයෝ මහාමෞද්ගල්‍යායන ස්ථවිරයෝය, වාකරයෝ ශාරිපුත්‍ර ස්ථවිරයෝය, ශශපණ්ඩිතයෝ නම් ලොකසවාමි වූ බුදුරජාණන් වහන්සේය. මෙහි ද උන්වහන්සේගේ ශීලාදි අවශෙෂ පාරමීන් යථකි ක්‍රමයෙන් නිර්‍ධාරණය කටයුත්තාහුය. ඒ එසේ වුවත් තිරිසන්යොනියෙහි උපන්නේ නමුදු කුශල ධර්මයන්හි කුශල වශයෙන් තතුපරිදි දැනගැන්ම ද, සවලපමාත්‍ර වරදද භය වශයෙන් දැක අකුශලයෙන් මනාව වෙන්වීමද, කුශලධර්මයෙහි මනාව තමන් පිහිටුවීමද, අනුන්ටද "මේ පාපධර්මයෝ ය. ඔහු මෙසේ ගන්නා ලද්දාහු මෙසේ ස්පර්‍ශකරන ලද්දාහු මෙබඳු ගතිකයෝ වෙත්; අනිසමපරාය මෙසේ යයි. දොෂ දක්වා එයින් වෙන්වීමේ යෙදවීමද, දානය නම් මේය. ශීලය නම් මේය, පේවීම නම් මේය, මෙහි පිහිටිය වුන්ට දෙව් මිනිස් දෙගතිය හස්තගත වූවාහුමය, මේ ආදීන් පුණ්‍ය කර්මයෙහි ආනිසංස දක්වා එහි පිහිටුවීමද, තමන්ගේ ශරීර ජීවිත නිරපෙක්ෂකව අන්‍යසත්ත්වයන්ට අනුග්‍රහ කිරීමද, උදාරදානාධ්‍යාශය දැයි යන මේ ආදීහු මෙහි බොධිසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ යයි දතයුත්තාහුය.

"එවං අච්ඡරියාහෙතෙ-පෙ—ධම්මස්ස අනුධම්මතෝ"
යනු එහෙයින් කියනලදී.

පරමාර්‍ථ දීපනී නම් චරියාපිටක අට්ඨාවෙහි
දශවන ශශපණ්ඩිත චරිතය නිමි.

දැන් යථොක්ත අකිත්තී චරිතය ආදි දශවර්‍ගය විශෙෂයෙන් ගෙනහැර දක්වා,

අකිත්තිබ්‍රාහ්මණෝ සඞ්ඛෝ කුරුරාජා ධනඤ්ජයෝ
මහාසුදස්සනෝ රාජා මහාගොවින්දබ්‍රාහ්මණෝ. (144)

නිමි චන්දකුමාරෝ ච සිවි වෙස්සන්තරෝ සසෝ
අහමෙව තදා ආසිං යෝ තෙ දානවරෙ අදා (145) ඉති.

නිගමනය කෙරෙත්.

එහි අර්‍ථය නම්:- යම් කලෙක යමෙක් වනාහි ඒ උතුම් දන් දුන්නේද එකල මම **අකිත්තී බ්‍රාහ්මණද, සඞ්ඛ බ්‍රාහ්මණද, ධනඤ්ජය නම් කුරු රජද, මහාසුදර්ශනනම් චක්‍රවර්ත්තිරජද, සිව්රජද, මහාගොවින්ද නම් බ්‍රාහ්මණද, නිමි රජද, චන්දකුමාරද, වෙසතුරු රජද, ශශපණ්ඩිතද,** විමි. මෙසේ අකිත්තී බ්‍රාහ්මණාදි

ඒ ඒ ආත්මභාවයන්හි ශීලාදි පාරමීන් සුදුසු පරිද්දෙන් පිරූ තමුන් දානාධ්‍යාශයාගේ වනාහි අතිශය උදාරභාවය සඳහා දානපාරමී වශයෙන් ඒ චරිතයන් දෙශනාවට ආරෝපනය කළසේක.

එතෙ දානපරිභාවිතා එතෙ දානසපාරමී,
ජීවිතං යාචකෙ දත්වා ඉමං පාරමී පූරසිං. (146)

අකිත්ති ජාතකාදියෙහි අනෙකාකාර වොහාරයෙන් මා විසින් පවත්වන ලද පරම කොටිප්‍රාප්තවූ සම් මේ දෙයධර්ම පරිත්‍යාගය, ශරීරාවයව පරිත්‍යාගය, පුත්‍රදාර පරිත්‍යාගය, යන පරිත්‍යාග කෙතෙක් වෙද්ද ඔව්හු කිසිසේත් කරුණෝපාය කෞශල්‍ය පරිගෘහිත භාවයෙන් හා සර්ව්ඥතාඥානය උදෙසාම පවත්වන ලද බැවින් ද දානයාගේ පරමුත්කර්ෂ ගමනයෙන් පාරමී නම් වෙති. හෙවත් දානපාරමිතා නම් වෙත්. එසේම ඔහු පරමාර්ථ පාරමීභූත මාගේ දානයට පිරිවරවූ හෙයින්ද, සන්තානයාගේ පරිභාවිත වශයෙන් අභිසංස්කරණය කරන හෙයින්ද, දානපරිෂ්කාරයෝ නම් වෙත්.

යම්කු හට වනාහි මොවුහු පරිෂ්කාර වෙද්ද එය දක්වන්ට යාචකයන්ට ජීවිතය දී මේ දාන පරමාර්ථ පාරමිතාව පිරූයෙමියි **"ජීවිතං යාචකෙ දත්වා"** යනාදි ගාථාඛ්‍යය වදාරන ලදී. මෙහි වනාහි ශෂපණ්ඩිතවයස්හිව හැර අවශෙෂවයස්හි නවයෙහි සුදුසු පරිද්දෙන් දානපාරමී දානඋපපාරමීහු දතයුත්තාහුය, ශෂපණ්ඩිත වයස්හිවෙහි වනාහි දානපරමාර්ථ පාරමී තොමෝ දතයුත්තියය. එහෙයින් වදාරන ලදි.

භික්ඛාය උපගතං දිස්වා සකත්තානං පරිච්චජිං,
දානෙන මෙ සමො නත්ථි එසා මෙ දානපාරමී (147) **සි.**

යථොක්ත අකිත්ති බ්‍රාහ්මණාදි කාලයෙහි මතු නොවෙයි, අනිකුදු **මහාජනක, මහාසුතසොමාදි** කාලයෙහිද මහා පුරුෂයන් විසින් දානපාරමිතාව පුරන ලද ආත්ම භාවයන්ගේ ප්‍රමාණයෙක් නම් නැත. එතකුදු උවත් එකාන්තයෙන්ම ශෂපණ්ඩිත කාලයෙහි දානපාරමිතාවගේ පරමාර්ථ භාවය විභාවනය කටයුතුය.

පරමාර්ථ දීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි චරියාදර්ශයකින් සංගෘහීතවූ විශෙෂයෙන් දානපාරමිතාව විභාවනය කරන්නාවූ ප්‍රථම අකිත්තිවර්ගය නිමි.

(X) 1 මාතුපොසක චරිතය.

තවද මේ **පරමාඤ්ඤදීපනී** නම් චරියාවට්ඨක අටුවාවෙහි දෙවන හයනිතාග වගියෙහි පළමුවන **මාතුපොසක** චරිතය කියේයි? යත්:—

යදා අහොසි පවනෙ කුසඤ්ඤරෝ මාතුපොසකඛා,
න තදා අඤ්ඤා මහියා ගුණෙන මම සාදිසෝ. (148)

යම් කලෙක්හි මම මහවෙනෙහි මාතුපොසක නම් ඇත් රජෙක් විම්ද; එකල්හි පොළෝ තලයෙහි ශීලගුණයෙන් මා හා සමාන එකෙක් නැත්.

එකල්හි අප මහාබොධිසත්ත්වයන් වහන්සේ **හිමාලය** වන ප්‍රදේශයෙහි ඇත්යොනියක උපන්සේක. උන්වහන්සේ වනාහි සම්‍යඞ ධවලයහ, අනිරූපයහ, හසති ලක්ෂණයෙන් යුක්තයහ, නොයෙක් දහස් ගණන් ඇතුන් විසින් පිරිවරන ලදහ. නමුත් උන්වහන්සේගේ මැණියෝ අඬ වූවෝ ය. බොධිසත්ත්වයෝ මියුරු පලාපල ඇතුන් අත යවා මැණියන් පොෂණය කෙරෙති. ඇත්තු, දෙතලද ඒ පලාපල ඇට නොදී තුමූ තුමූම කන්නාහුය. බෝසතාණෝ පරීක්ෂාකොට එ පවත් දැන ඇත් සමූහයා හැරපියා මැණියන්ම පොෂණය කරන්නෙමියි රාත්‍රී භාගයෙහි සෙසු ඇතුන්ට නොහඟවා මැණියන් ගෙන **චණ්ඩොරණ** නම් පර්වතපාදයට ගොස් එහි පියුම්විලක් නිසා පිහිටි ගල්ගුහාවක මැණියන් රඳවා පොෂිත කළහ. එකල වනයෙහි හැසිරෙන්නාවූ පුරුෂයෙක් හෙම ඒ මහවනයෙහිදී මා දැක මහරජ්ජුරුවෙනි, නුඹ වහන්සේට ආරොහණයට නිසි ඇත් රජෙක් මහවනයෙහි වෙසෙයි කියා බරණැස් රජහට සැලකෙළේය. එහෙයින් වදළහ.

"පවනෙ දිස්වා වනචරෝ රණඤ්ඤූ මං පවේදයි,
තවානුච්ඡවෝ මහාරාජ ගජෝ වසති කානනෙ"ති (149)

ඒ කෙසේද යත්:- ඒ පුරුෂතෙමේ වනාහි මං මුළාවූයේ දික් නියමයක් කොට නොහෙන්නේ මහඬින් හඬන්ට වන. බෝස තාණෝ ඔහුගේ ඒ හඬ අසා මේ පුරුෂතෙම අනාථයෙකි, මා සිටියදී මේතෙම මෙහි මියගියේ නම් ඒ මට සුදුසු නොවන්නේ යයි ඔහු කරා ගියහ. ඉක්බිති උන්වහන්සේ කෙරෙහි භයින් පලායන ඔහු දැක "එම්බා පුරුෂය, මා නිසා තට බියෙක් නැත්තේය, පලා

නොයව, කුමක් නිසා තෝ හඬා ඇවිදිද්දැ"යි විචාළහ. සවාමීනි, මම මිං මුළා වූවෙක්මි, මිංමුළාවූ මට අදට සත්දවසක් ගත වූයේයයි කිකල්හි පින්වත් පුරුෂය, නොබව. මම තෝ මිනිස් පියෙහි පිහිටුවාලමියි ඔහු තමන් පිට හිඳුවාගෙන වනයෙන් එතර කොට නැවැත්තාහ.

පාපිවූ ඒ පුද්ගල තෙමේ "නුවරට ගොස් රජහට කියන්නෙමි"යි වාක්‍යයන් හා පත්තයන් සලකුණු කරගෙන එතැනින් නික්ම බරණැස් නුවරට ගියේය. එකල රජහුගේ මහුලෑත් මළේය. ඒ පුරුෂ තෙම රජ්ජුරුවන් කරා එළඹ තමන් මහ වනයෙහි මහාපුරුෂයන් (හස්ති රාජයන්) වහන්සේ දුටු බව සැල කෙළේය.

පවනෙ දිසවා වනචරෝ රක්ඛසූ මං පටිවෙදයි,
තවානුච්ඡවෝ මහාරාජ ගජෝ වසති කානනෙ.

යනු එහෙයින් වදළහ.

න තස්ස පරිභායඤ්ඤා න පි යාළහඤ්ඤාස්සුයා,
සමං ගතිනෙ සොණ්ඩාය සයමෙව ඉධෙහිති. (150)

යනුවෙන් ඒ හස්තිරාජයා අල්වා ගැන්මට හාත්පසැ කැණිය යුතු අගලකින් හෝ ඇතුන් බඳින ටැඹකින් හෝ බොරු වළින් හෝ ප්‍රයෝජන නැත්තේය. සොඬින් අල්වා ගත් කල්හි තෙමේම එන්නේයයි කිය.

රජ්ජුරුවෝ යහපතැයි කියා ඔහු මාගී දෙශකයකු කොට වනයට ගොස් ඇත් රජ්ජුරුවන් ගෙන එවයි කියා ඇතරුවන් සහපිරිවරින් යැවූහ. ඇතරු තෙමේ ඔහු සමග ගොස් පියුම් විලට වැද ගොදුරු ගත්නාවූ බොධිසත්ත්වයන් දිටි. එහෙයින් වදරන ලදි.

"තස්ස තං වචනං සුත්වා රාජාපි තුට්ඨමානසෝ,
පෙසෙසි හත්ථිදමකං ජෙක්කාවරියං සුසික්ඛිතං. (151)

ගන්ත්වා සොහත්ථිදමකෝ අද්දස පදුමස්සරෙ,
හිඝමුළාලං උඛරණං යාපනත්ථාය මාතුයා. (152)

විඤ්ඤුඝ මෙ සිලඝුණං ලක්ඛණ උපධාරයි,
එහි පුත්තාති වත්වාන මම සොණ්ඩාය අගහි"සි (153)

බොධිසත්ත්වයෝද ඇතරුවන් දැක මට මේ භය මා විසින් මිනිස් පියෙහි ලූ මේ පුරුෂයා කෙරෙන් උපන්නේය. මම වනාහි ඇතුන් දහසකුදු නසාපියන තරම් මහා බල ඇත්තෙක්මි. ඉදින්

කිපියෙමි තම් සෙනාවාහන සහිත රට නසාපියන්ට සමඳියෙමි. ඉදින් මම කිපෙන්නෙමි තම් මාගේ ශීලය බිඳෙන්නේය. එසේ හෙයින් අඩයටිවලින් කොටන්නේ නමුත් නො කිපෙන්නෙමි සි සිත අධිෂ්ඨාන කොටගෙන කරඬා නිශ්චලව සිටියාහ. එහෙයින් වදාළහ බුදුහු:—

"යමෙම තදූ පාකතිකං සරීරානුගතං බලං,
අජ්ජනාග සහස්සානං බලෙන සම සාදිසං. (154)

යදිහං තස්ස පකුපෙය්‍යං උපෙතං ඝහණාය මං,
පවිබලෝ හවෙ තෙසං යාව රජ්ජම්පි මානුසා. (155)

අපිචාහං සීලං රක්ඛාය සීල පාරමී පූරිය,
න කරොමි විතෙන අඤ්ඤථත්තං පකිපජනන මමාළහකෙ

යදි තෙ මං තස්ථ කොටෙවය්‍යුං එරසුහි තොමරෙහිව,
නෙව තෙසං පකුපෙය්‍යං සීලඛණ්ඩභයා මම"සි (157)

බොධිසත්ත්වයන් වහන්සේ මෙසේ සිතා නිශ්චලව සිටිකාල යෙහි ඇතරු තෙමේම පියුම් විලට බැස උන්වහන්සේගේ ලක්ෂණ සම්පත්තිය දැක "මෙහි එව දරුව"සි කියා රිදී දමකට බඳුවූ සොඬින් අල්වාගෙන නික්ම සත්වන දවසෙහි බරණැස් නුවරට පැමිණියේය. හෙතෙම් අතර මහදීම් ඇත් රජ්ජුරුවන් ගෙනෙන් නියාව කියා රජ්ජුරුවන්ට හස්තක් යැව්වේය රජ්ජුරුවෝ ඒ හස්ත අසා නුවර සැරසවූහ. ඇතරු තෙමේද කරන ලද සුවඳ පිරිබඬ ඇති සරසා පිළියෙළ කරන ලද ඇත් හලට බෝසතාණන් කැඳවාගෙන ගොස් විසිතුරු තිරයකින් වටකොට රජ්ජුරුවන්ටද සැලකෙළේය, රජ්ජුරවෝ නොයෙක් රසයෙන් අග්‍රවූ බොජුන් ගෙන්වාගෙන ගොස් බෝසතාණන්ට දෙවූහ. බොධිසත්ත්වයෝද මැණියන් නැතිව ගොදුරු නොගන්නෙමියි ලෝපයකුදු නොගත්හ. රජ්ජුරුවන් විසින් යාචඤ්ඤ කරන ලද්දාහු නමුත් නොගෙන

143 සා නූන සා කපණිකා අන්ධා අපරිනායිකා,
ඛාත්‍රුං පාදෙන ඝටෙටති ගිරිවණ්ඩාරණංපති"සි

කිහ එහි අර්ථයනම්:— "මහරජ්ජුරුවන් වහන්ස, පුත්‍ර වියොග දුඃඛයෙන් බැඟෑපත්වූ අන්ධවූ පොෂිත කරන කිසිවෙකු නැත්තාවූ වණ්ඩාරණ නම් පර්වත ප්‍රාන්තයෙහි පරිභ්‍රමණය කරන්නාවූ ඕ තොමෝ නියතින් අඩමින් ඒ ඒ තැන පිහිටි හුල් පහත් පයින්

මඛනීය" යනුයි. රජ්ජුරුවෝ ඒ අසා ඇත් රජ්ජුරුවෙනි, කිමෙක්ද? අඩවූ පොෂණය කරන්නා වූ කිසි කෙනෙකු නැත්නාවූ වණ්ඩාරණ්‍ය පවීන ප්‍රාන්තයෙහි රැක්දඬු පයින් මඩිමින් ඇවිදිනී කවර තැනැත්තියක් දැයි විචාරත්තෝ:—

144 කාහු තෙ සා මහානාග අඩ්ඩා අපරිතායිකා,
බාහුං පාදෙන ඝට්ටෙති ගිරිවණ්ඩාරණ්‍ය පති"සි

කිහ. එවිට බෝසතාණෝ:—

145 මාතා මෙ සා මහාරාජ අඩ්ඩා අපරිතායිකා,
බාහුං පාදෙන ඝට්ටෙති ගිරිවණ්ඩාරණ්‍ය පති

යනුවෙන් "රජ්ජුරුවන් වහන්ස, යට කියන ලද පරිදි ඇති දින්නාවූ තැනැත්තෝ නම් මාගේ මැණියෝයයි කිහ. රජ්ජුරුවෝ ඒ අසා මේ ඇත් රජාණෝ "මාගේ මැණියන් ගොදුරු කොලත් අද සත්වන දවසය"යි කියති. මේ ඇතාණෝ ගොදුරු නොගත්තෝය.

146 මුඤ්ච මෙතං මහානාගං යොයං හරති මාතරං,
සමෙතු මාතරා නාගො සහසබ්බෙහි ඤාතිභි.

යනුවෙන් "යම් ඇතාණ කෙනෙක් මැණියන් පොෂණය කෙරෙද්ද උන් වහා මුදවා ඇරපියව, ඇත් රජ්ජුරුවෝ තමන්ගේ මැණියන් හා අවශෙෂ ඤාතීන් හා ද එක්ව සැපසේ වසත්ව"සි කියා බන්ධනයෙන් මුදපුව.

147 මුත්තො ච බන්ධනා නාගො මුත්තො දමිතකුඤ්ජරො,
මුත්තුත්තං අස්සාසයිත්වාන අගමා සෙතපබ්බතං"සි.

කිහෙයිත් මෙසේ බන්ධනයෙන් මිදුනාවූ හස්ති රාජයෝ මදක් සැතපී ගෙන රජ්ජුරුවන්ට දශරාජධම් ගාථායෙන් දහම් දෙසා "මහරජාණනි, අප්‍රමාදව කුසල් කළ මැනවැයි" අවවාද කොට මහාජනයා විසින් ගඳමල් ආදියෙන් පූජනු ලබන්නාහු නුවරින් නික්ම එදවස්ම මවු සමීපයට එළඹ සියලු පුවත් කිහ. සතුටු සිත් ඇති ඕ තොමෝ:

148 චිරං ජීවතු සො රාජා කාසීනං රට්ඨවඩ්ඪනො,
යො මෙ පුත්තං පමොචෙසි සඳ්ධ වුඩ්ඪාපවායිකංයි.

කසී රටට වැඩ පසස්නා වූ යම් රජ්ජුරු කෙනෙක් හැමකල්හි වැඩිනිවියන් පූජන්නාවූ මාගේ පුතණුවන් මුදවාපුද, ඒ රජ්ජුරුවෝ බොහෝ කලක් ජීවත් වෙත්වායි කියා රජ්ජුරුවන්ට අනුමෙවෙනි කළාය.

රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ගේ ගුණයෙහි පැහැද පියුම් විලට නුදුරු තන්හි ගමක් කරවා බොධිසත්ත්වයන්ට හා මැණියන් ටත් නිරන්තරයෙන් දන වෑත්ති තිබුණහ. මෑත කාලයෙහි බොධි සත්ත්වයෝ මැණියන් මළ කල්හි ඇහේ ශරීරය දවා **කුරණඩක** තම් අසපුවට ගියාහ. ඒ ස්ථානයෙහි වනාහි පන්සියයක් තපස්වී වරයෝ හිමවතින් අවුත් වාසය කළාහුය. රජ්ජුරුවෝ බොධි සත්ත්වයන්ට ලැබූ ඒ වෑත්තියෙ උත්වහන්සේලාට දී බොධිසත්ත්ව යන් හා සමාන රූ ඇති ගල් පිළිමයක් කරවා මහත් සත්කාර පැවැත්වූහ. ජම්බුද්වීපවාසීහු අවුරුදු පතා රුස්ව හසුන්මහ තම් පූජාවක් කළාහුය.

එකල්හි **රජ්ජුරුවෝ ආනන්ද ස්ථවිරයෝය, ඇතිනි මහමායා දෙවිය, හසුනි රාජයාණෝ ලොකඤ්ඤාම්වූ බුදුරජාණන්වහන්සේය.** මෙහිදු දානපාරමිතාදීහු සුදුසු පරිද්දෙන් නිර්ධාරණය කටයුත්තාහුය. සීලපාරමිතා තොමෝ අතිශය වත්නුයි ඕතොමෝම දෙශනාවට ආරොපණය කරන ලද්දීය.

ඒ එසේමය: තිරිසන්යොනියෙහි උපන් තමුත් බ්‍රහ්මදෙව, පූජිදෙව, පූජාවාර්‍ය ආහුණෙය්‍යාදි භාවයෙන් සිටිනේ දත් බුදුන් විසිනුදු ප්‍රශංසනාභාවයටම අනුරූපව මැණියන්කෙරෙහි ගරුසිත උපදවා මැණියෝ වනාහි පුතණුවන්ට බොහෝ උපකාර ඇත්තෝය. එහෙයින් මාතෘපෂ්ඨානය තම් පණ්ඩිතයන් විසින් පනවන ලද්දේයයි මෙතෙහි කොට නොයෙක් දහස් ගණන් හසුනින්ට අධිපතිවූ මහානුභාව සම්පන්න ඇත්සමූහයාට නායකවද ඔවුන් අනුව පවත්නා කල්හිත් හුදකලාව හැසිරීම අතතුරට කාරණයයි නොගෙන ඇත්මුළු හැර එකලාව උපකාරක්ෂෙත්‍රය පුදකරන්නෙමියි මාතෘපොෂ්‍යයද, මං මුළාවූ පුරුෂයා දැක අනුකම්පා වෙන් ඔහුගෙන මනුෂ්‍යපථයට පැමිණවීමද, කරන ලද අපරාධ ඇති හසුන්‍යාවාසීයන් ප්‍රමුඛකොට ඇති තමන් බඳිනට ආවාවූ පුරුෂයන් නසන්නට සමර්ථවූයේදැතිගැණිම් පමණකිනිදු ඔවුන්ට පිඬාවන්නේය; මාගේ ද ශීලයාගේ ඛණ්ඩාදිභාවය වන්නේයයි එසේ නො කොට මතාව දැමියා සුවසේම අල්වාගන්නටවුන් කරා පැමිණීමද, මැණියන් නැතුව කිසිවක් අනුභව නොකරන්නෙමියි සත්දවසක් මුළුල්ලෙහි නිරාහාර භාවයද, මොහු විසින් මා බඳවා පියන ලද්දේයයි සිතුනුපදවා රජ්ජුරුවන් කෙරෙහි මෙත් පැතිර වීමද, රජ්ජුරුවන්ට නා නා තයින් ධර්මදෙශනා කිරීමදැයි යන මේ ආදීහු මෙහි මහාපුරුෂයන්ගේ ගුණානුභාවයෝ යයි දතයුත්තාහුය.

"එවං අජ්ජරියා එතෙ අබ්භුතාව මහෙසිනො,
—පෙ—ධම්මස්ස අනුධම්මතෝ" යි

එහෙයින් කියන ලදි.

පරමාත්‍ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවේහි
දෙවත හසතිනාගවග්ගයෙහි

පළමුවන මාතුපොසක චරිතය නිමි.

(X) 11 භූරිදත්ත චරිතය.

තවද මේ පරමාත්‍ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි දෙවන හසතිනාග වග්ගයෙහි දෙවන භූරිදත්ත චරිතය කිසේය? යත්:

පුනාපරං යදා හොමි භූරිදත්තෝ මහිද්ධිකෝ,
විරූපක්ඛෙන මහාරාජෙන, දෙවලොකමගච්ඡහං. (158)

කැවත අනිකුදු චරිතයක් කියමි. හෙද අසව: යම් කලෙක්හි මම මහත් වූ ඍද්ධියෙන් යුක්තවූ **භූරිදත්ත** නම් නාගරාජයෙක් වීම්ද, එකල්හි **විරූපාක්ෂ** නම් වූ මහරජ්ජුරුවන් සමග නවිනිසා දෙව්ලොවට ගියෙමි. එහි පිළිවෙළකථාව කෙසේදයත් ?

යටගිය දවසැ මේ මහාභද්‍රකල්පයෙහිම බරණැස් රජහුගේ පුත්‍රයෝ සිය පියාණන් විසින් නුවරින් නෙරතලද්දෝ එක්තරා නාගමානවිකාවක් සමග සංවාසය කළහ. සංවාසයට පැමිණ වල්හි වසන්කාවූ ඔවුන්ට පුතෙක් ද දුවක්දැයි දරු දෙදෙනෙක් උපත්තාහුය. පුත්‍රයාහට **සාගර බ්‍රහ්මදත්තය** යි කියාද දුවට **සමුද්‍රජාය** යි කියාද නම්කළාහුය. රාජ කුමාරයෝ මැතකාලයෙහි පිය රජහුගේ ඇවැමෙන් බරණැස්නුවරට ගොස් රාජ්‍යය කරවූහ. එකල්හි ධාතරාෂ්ට්‍ර නම් වූ නා රජ්ජුරුවෝ පන්සියයක් යොදුන් නාගභවනයෙහි නාගරාජ්‍යය කැරැවූහ. එකල්හි අභූතවාදි **විත්තසූල** නම් කැස්බකු විසින් "බරණැස් රජ්ජුරුවෝ තමන්ගේ දුව නුඹ වහන්සේට සරණ දෙනු කැමැත්තෝය. ඕ වනාහි සමුද්‍රජා නම. විශිෂ්ට රූ ඇත්තීය. පැහැදීම් ඵලවන්නීය දැකුම් කට යුත්තී"යයි කියූ බස් අසා ධෘතරාෂ්ට්‍ර නම් වරම් රජ්ජුරුවෝ නොමෙනෙවියන් සතර දෙනෙකු යවා නොදෙනු කැමැත්තවුන් නාගනිංසනයෙන් භයගන්වා "දුවණියන් දෙන්නෙමි" කිසඳ මහත් සත්කාර යවා මහත් නාගඍද්ධියෙන්, මහත් පිරිවරින් ඔහුගේ දුව

නාග භවනයට පවුණුවා අගමෙහෙසුන් තනතුරෙහි තැබූහ. ඒ තොමෝ පසුකාලයෙහි ධාතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් නිසා **සුදර්ශනය, දත්තය, සුභෝගය, අරිෂ්ටය,** යි පුත්‍රයන් සතර දෙනෙකුත් ලැබී. ඔවුන් අතුරෙන් දත්තයෝ අපගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝය. යම්හෙයකින් උන්වහන්සේ නාගභවන යෙහිද සවිතිසා භවනයෙහිද උපන්නාවූ ප්‍රශ්න මතාකොට විසඳන්ද එහෙයින්ම හුරිදත්ත නම් වූයේය. ඒ එසේමය: එක් දවසක් විරූපාක්ෂ නම්වූ නා රජ්ජුරුවන් නා පිරිස හා සමග තිදසපුරයට ගොස් සක් දෙවිරජාණන් පිරිවරා උන් කාලයෙහි දෙවියන් අතරැ ප්‍රශ්නයක් උපන්නේය. ඒ ප්‍රශ්නය විසඳන්ට කිසිවෙක් සමර්ථ නුවූහ. එකල සක්දෙව් රජු විසින් අනුදන්නා ලද්දේ උතුම් පඬිකයට නැගිහිඳ මහාසත්ත්වයෝම ඒ ප්‍රශ්නය විසඳූහ. ඉක්බිති සක්දෙව් රජාණෝ දිවගඳ මලින් පුදා, දත්තයෙනි "තෙපි පොළොව හා සමාන මහත් ප්‍රඥාවෙන් යුක්තය, එහෙයින් මෙතැන් පටන් හුරිදත්ත නම් වේව"යි කිහ.

මෙසේ සතුටු සිත් ඇති ශක්‍රයා විසින් හුරිදත්තයයි කියා ගත්නා ලද නම් ඇති බැවින් හුරිදත්තයයි කියාම ප්‍රසිද්ධවූහ. ඉක්බිති පියරජ්ජුරුවෝ ඔවුන්ට යොදුන් සියයක් සියයක් පමණ කොට රාජ්‍යය බෙදාදුන්හ. මහත් යශස් ඇතිවූයේය. සොළොස් දහසක් සොළොස් දහසක් පමණ නාගකන්‍යාවෝ පිරිවැරුවාහුය. පිය රජ්ජුරුවන්ටද සියක් යොදුනක් පමණ රාජ්‍යය වූයේය. බොධි සත්ත්වයන් හැර සෙසු පුත්‍රයෝ තුන් දෙන මසක් පාසා මව් පියන් දක්නට එන්නාහුය. බොධිසත්ත්වයෝ වූකලි අඩමසක් පාසා මව්පියන් දක්නට එන්නාහ.

බෝසතාණෝ එක් දිනක් විරූපාක්ෂ නම් මහරජ්ජුරුවන් සමග ශක්‍ර දෙවෙන්ද්‍රයාහට උපසථානයට ගියෝ **වෛජයන්ත** ප්‍රාසාදය, **සුධර්මා** නම් දෙවසභාවය, **පරසතු කොබෙලිලය, පාණ්ඩු කම්බල ශිලාසනය,** හා දිව්‍යප්සරාවන් පිරිවැරූ අතිමනොහර **ශක්‍ර සම්පත්තිය** දැක දෙවිලෝසැපත් පමණකුදු නාගාත්මභාවයෙහි සිටියාහුට දුලීභය, සම්‍යක් සම්බොධිය කොයින් දැයි නාගාත්ම භාවය පිළිකුල් කොට පියා "නාගභවනයට ගොස් පෙහෙවස් වැස ශීලයම දැඩිකොට සමාදන්වන්නෙමි. ඒ ශීල සමාදානය බොධිපරි-

පාවන ධර්මයක් වන්නේය, මේ දිව්‍ය ලොකයෙහි ඉපදීමටද කාරණ වන්නේය"යි සිතා නාගභවනයට ගොස් මවුපියන් අතින් විචාරන්නාහු "මැණියෙනි, පියාණනි, මම පෙහෙවස් රකිනු කැමැත්තෙමි. එහෙයින් මට ඊට අවසර දුනමැනවි"යි කීහ. ඔවුහු "මෙහිම පෙහෙවස් රකුව. නාගභවනයෙන් පිටත ගියාවූ තැනින්ට ගරුඩාදීන්ගෙන් මහත් භය උපදනේය"යි කීහ. බොසතාණෝ යහපතැයි පිළිගෙන එසේ කොට නාගකන්‍යාවන් විසින් කරන ලද උපද්‍රව ඇත්තෝ දෙවන වාරයෙහි මවුපියන්ට කොදන්වා තමන්ගේ භාර්‍යාව අමතා "සොඳුර, මම මනුෂ්‍ය ලොකයට ගොස් යමුකා තම් ගංතෙර මහත් නුගගසෙක් ඇත. ඊට නුදුරුතැන තුඹසක් මත්තෙහි දරණවැළ ලාගෙන චතුරඞ්ග සමන්නාගතවූ උපොසථය අධිෂ්ඨාන කොටගෙන වැදහෙව පෙහෙවස් රකිමි"යි නාගභවනයෙන් නික්ම කියනලද ක්‍රමයෙන් පෙහෙවස් රකිති.

පුනාපරං සදහොම් භූරිදත්තා මහිද්ධිකා,
විරූපක්ඛෙන මහාරක්ඛසා, දේවලොකමගච්ඡහං. (158)

තත්‍ථ පස්සිත්‍වා'හං දෙවෙ එකනනං සුඛසම්පත්තෙ,
තං සඟහා ගමනත්‍ථාය සීලබ්බතසමාදිසිං. (159)

සරීරකිච්චං කත්‍වාන භුත්‍වා යාපනමත්තකං,
චතුරෝ අඞ්ගෙ අධිට්ඨාය සෙම් වම්මිකමුධනි. (160)

ජ්‍යියා චමෙමන මංසෙන නහාරුඅට්ඨිකෙහිවා,
යස්ස එතෙන කරණීයං දිනනං සෙව හරතු සෝ. (161)

යනු එහෙයින් වදාරන ලදී.

මෙසේ අඛම්සක් පාසා පෙහෙවස් රකින්නාවූ බොධිසත්ත්වයන්ට බොහෝකලක් ඉක්මගියේය. කල් යත් යත් එක් දවසක් එක්තරා වැදි බමුණෙක් සොමදත්ත නම්වූ තම පුතු සමග එතැනට ගොස් අරුණ නැගෙන වේලෙහි නාගකන්‍යාවන් විසින් පිරිවරනු ලබන්නාවූ මහාබොධිසත්ත්වයන් දැක උත්වහන්සේගේ සමීපයට ගියේය. එකෙණෙහිම නා මෙතවියෝ පොළොව කිමිද නාගභවනයටම ගියාහුය. එකල්හි බමුණු "නිදුකාණනි, නුඹ වහන්සේ කවර කෙනෙක්ද? දෙවි කෙනෙක්ද? යක්‍ෂයෙක්ද? නොහොත්

නාගරාජයෙක් දැයි මහාසත්ත්වයන් විවාළේය. බොධිසත්ත්වයෝ තතුපරිදි තමන් ඔහට ප්‍රකාශ කොට ඉඳින් මේ තෙමේ මෙයින් ඔබ්බට ගියේ නම් මා මෙතැන නිවසන බව මහා ජනයාට ප්‍රකට කරන්නේය. එහෙයින් මාගේ උපොසථ වාසයට අන්තරාය යක්ද වන්නේය.

එසේ හෙයින් මෝහු නාගභවනයට ගෙනගොස් මහත් සම්පත් තියෙහි යොදවන්නේ නම් සෙහෙක; මෙසේ ඇති කල්හි මේ තෙමේ එහිම අභිරමණය කරන්නේය. එහෙයින් මාගේ උපොසථ කර්මය බෙහෝකල් පවත්නේයයි සිතූහ. ඉක්බිති බෝසතාණෝ ඔහට මෙසේ කීහ. කියන්නෝ බ්‍රාහ්මණය, තොපට මහත් යසස් දෙන්නෙමි, නාගභවනය සිත් කලු වන්නේය, එව බමුණ, මා හා සමග එහි යම්හයි කීහ. එබසට බමුණු කියන්නේ සාමිනි, මාගේ පුත්‍රයෙක් ඇත, ඔහු එතොත් යන්නෙමියි කීය. එකල්හි බෝසතාණෝ යව බමුණ, පුත්‍රයා කැඳවාගෙන එවයි කීහ, එවිට බමුණු තෙමේ ගොස් පුත්‍රයාට ඒ කාරණය කියා ඔහු කැඳවාගෙන ආයේය.

මහාසත්ත්වයෝ ඔවුන් දෙදෙනම තමන්ගේ ආනුභාවයෙන් නාගභවනයට ගෙන ගියහ. ඔවුන්ට එහිදී දිව්‍ය ආත්මභාව පහළවූහ. එකල්හි මහාසත්ත්වයෝ ඔවුන් දෙදෙනාට දිව්‍යසම්පත් දී සාරසියයක් සාරසියයක් නාගකන්‍යාවන් පාවා දුන්හ. ඔව්හු එහි මහත් සම්පත් අනුභව කළාහුය. බොධිසත්ත්වයෝ අප්‍රමාදව පෙහෙවස් රකිනසේක. අඩමසක් පාසා මවුපියන්ට උපස්ථානයට ගොස් බණකියා නැවත බ්‍රාහ්මණයාගේ සමීපයට ගොස් සුවදුක් විචාරා "තොපට යමකින් ප්‍රයෝජන වී නම් ඒ කියව; උකටලිතොව සිත් අලවව"යි කියා සොමදත්තයා සමඟත් පිළිසඳර කථාකොට නමන් වසන තැනට යෙති. බමුණු තෙමේ අවුරුද්දක් එහි වැස පින්මද බැවින් කලකිරී මිනිස් ලොවට නොයනු කැමැත්තා වූ පුත්‍රයාත් ගෙන බෝසතාණන් විචාරා උන් විසින් දෙනු ලබන්නා වූ බොහෝ සම්පත්ද සියලු කැමතිදේ දෙන්නාවූ මිණිරුවනද ශ්‍රී තැනි බැවින් කොගෙන මිනිස් ලොවට ගොස් පැවිදි වන්නෙමියි කියේය. මහාසත්ත්වයෝ නාගමාන්විකාවන් අණවා පුත්‍රයා සහිත ඔහු මනුෂ්‍ය ලොකයට පැමිණවූහ. ඔවුහු දෙදෙනම දිව්‍ය වස්ත්‍රාභරණ මුදා නාන්ට පොකුණකට බටහ. එකෙණෙහි ඒ දිව්‍ය වස්ත්‍රාභරණයෝ අන්තර්ධානව නාගභවනයටම ගියාහුය. ඉක්බිති පළමු හැදි කසාකඩ පිළිම ඔවුන්ගේ ශරීරයෙහි වැළඳියේය, ඔව්හු දුනු ඊ හා කෙවිටිගත් අත් ඇතිව වලටගොස් මුවන් මරා යටකි පරිද්දෙන්ම දිවි පැවැත්තූහ.

එසමයෙහි එක්තරා තාපසයෙක් ගරුඩ රාජයකුගෙන් ලබන ලද්දාවූ **ආලම්බායන** නම් මන්ත්‍රයද ඊට සුදුසු ඖෂධද මනෝප්‍රාප්‍ත විද්‍යාද තමන්ට උපස්ථාන කරන්නාවූ එක්තරා බ්‍රාහ්මණයකුට දුන්නේය. හේ තෙමේ මා විසින් ජීවත්වීමට උපායක් ලබන ලද්දේයයි කිපදවසක් එහිම වැස තාපසයා විචාරා නික්ම යන්නේ පිදුවෙළින් **යමුනා** නම් ගංතෙරට පැමිණ ඒ මන්ත්‍රය පිරිවහමින් මාවතකින් යන්නේය. එකල්හි බෝධිසත්ත්වයන්ගේ පරිචාරිකාවූ නාගමාතෘකාවෝ නාගභවනයෙන් සියලු කැමතිදේ දෙන්නාවූ ඒ මණිරත්නය ගෙන යමුනා නම් ගංතෙර වැලිගොඩ මත්තෙහි තබා ඒ මණිරත්නයාගේ ආලෝකයෙන් සප්තරාත්‍රියෙහි ත්‍රිවිධාකොට අරුණෝද්ගමනයෙහි ඒ මන්ත්‍ර ශබ්දය අසා ගරුඩයෙක් යයි සංඥාකොට භයින් තැතිගෙන මණිරුවන නොගෙන පොළොව කිඹිද නාගභවනයට් බියාහුය. බ්‍රාහ්මණතෙම මණිරත්නය ගෙන යියේය. එකෙණෙහි ඒ වැදි බමුණා පුත්‍රයා සමග මුවන් මරනු පිණිස වනයට යන්නේ ඔහු අත තුබූ මණිරුවන දැක මේ වනාහි භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේගේ සියලු කැමතිදේ දෙන මණිරුවන යයි දැන එය ගනු කැමතිව ඔහු හා පෙරපසු කථාකොට මන්ත්‍රවාදී බැව් දැන මෙසේ කීය. ඉදින් තෝ මට මේ මණිරුවන දෙන්නෙහි නම් තොපට මහානුභාව ඇති නාගරාජයකු දක්වන්නෙමි. තෝ ඒ නාගරාජයා ගෙන ගම් නියම්ගම් රාජධානි වලැ හැසිරෙමින් බොහෝ ධනය ලබන්නෙහියයි. එසේවී නම් "දක්වා ගනුව"සි කී කල ඔහු කැඳවා ගෙන තුඹස මත්තෙහි දරණ වැළ ලා පෙහෙවස් රකිනතැන වැදහොත්තාවූබෝධිසත්ත්වයන් නුදුරුතන්හි සිට අත දිනු කොට දැක්වූයේය. මහසත්ත්වයන් ඒ වැදි බමුණා දැක "මේ තෙම මාගේ උපොසථයට අන්තරාය කරන්නේය"සි නාග භවනයට ගෙන ගොස් මහාසම්පත්තියෙහි පිහිටුවන ලද්දේ නමුදු ඒ නොකැමැතිවූයේය; නා ලොවින් නික්ම යන දවස් මණිරුවන දෙනකල්හි ගන්ට නොකැමැතිවූයේය, දැන් වනාහි අභිගුණ්ඩිකයකු ගෙන ආයේය; ඉදින් මම මේ මිත්‍රද්‍රෝහියාට කිපියේ වීම් නම් මාගේ ශීලය බිඳෙන්නේය; මා විසින් පළමු කොටම චතුරඞ්ගසමන්නාගත උපොසථය අධිෂ්ඨාන කරන ලද්දේය; ඒ අධිෂ්ඨානය අධිෂ්ඨාන කළ පරිද්දෙන්ම පවතීවා! ආලම්බායන තෙමේ මා කපනත් නොකපනත් ඕනට නොකිපෙන්නෙමි"සි සිතා ඇස් පියාගෙන අධිෂ්ඨාන පාරමිතාව පෙරදැරිකොට දරණවැළැ අතුරේ හිස තබා

ගෙන නිශ්චලව හොත්තාහ. නොසාද බ්‍රාහ්මණයාද "පින්වත් ආලම්බායනය, මේ නාගරාජයා අල්ලා ගෙන මිණිරුවන මට දී පියව"යි කියේය; ආලම්බායන තෙම නා රජු දැක සතුටුව ගියේ මිණිරුවන කිසිවක් කොටත් නොගෙන "බ්‍රාහ්මණය ඇරගණුව"යි කියා මිණිරුවන බමුණු අතට දැමුයේය. ඒ මිණිරුවන ඔහුගේ අතින් ගිලිහි බිම වැටුණ පමණකින්ම පොළොවට වැද නාගභවනයටම ගියේය. වැදි බමුණු තෙමේ මිණිරුවනින් හා භූරිදත්ත නාගරාජයන් හා මිත්‍රත්වයෙන්ද පිරිහී කිසි පිහිටක් නැතිවම යන්ට ගියේය.

ආලම්බායනයාද මහානුභාව ඇති ඖෂධයෙන් තමන්ගේ ශරීරය ගල්වා මදක් අනුභවකොට (ශරීරයත්) පරිභාවනය කොට දිව්‍ය මන්ත්‍ර පිරුවමින් බොධිසත්ත්වයන් කරාගොස් උන්වහන්සේගේ නහුටින්ගෙන ඇද හිස තරකොට අල්වා ගෙන කටහැර ඖෂධ සපා මුඛයෙහි කෙළ වත්කෙළේය; පවිත්‍රශීලීවූ බෝසතාණෝ ශීලතේජයාගේ හයින් නොකිපී ඇස් දල්වා නොබැලූහ; ඉක්බිති හෙතෙම ඖෂධ හා මන්ත්‍රබලයෙන් බෝසතාණන්ගේ නහුටෙන් ගෙන හිස යටිකුරුකොට සලා, ගන්නාලද ගොදුරු වමාරවා, බිම දිගට වැදහොවා සාල් බිස්සක් මිරිකන්නාක්මෙන් දැතින් පිරිමැද්දේය. ඇට සුණු විසුණුව යන්නාක්මෙන් විය. නැවත නහුටගෙන පිළි අපුල්ලන්නාක්මෙන් පෙළිය. මහසතාණෝ මෙබඳු දුකක් අනුභව කරන්නාහුද ඔහට නොකිපියේය. වැළි කුමක් කළසේක්ද යත්:- තමන්ගේ ශීලයම ආවර්ජනා කළහ; මෙසේ හෙතෙම මහාසත්ත්වයන් දුර්ලකොට වැලින් පේළාවක් වියා මහ බෝසතාණන් එහි බහාලන්ට වන. උන්වහන්සේගේ ශරීරය මහත් බැවින් එහි නොවැදිකල විලුඹින් ඇන එහි ඇතුළු කෙළේය. යළි හෙතෙම පෙළාව ඇර ගෙන එක් ගමකට ගොස් ගම් මැද තබා නාගයාගේ නැටුම් දක්නා කැමැත්තෝ එත්වයි හඬගැසේය. එකල්හි මුළු ගම්වැස්සෝ එතනට රැස්වූහු. එකෙණෙහි ආලම්බායන තෙමේ "මහානාගයෙනි, පෙළාවෙන් නික්මෙව"යි කිය; එකල මහාසත්ත්වයන් වහන්සේ මෙසේ සිතූහ. අද මා පිරිස සතුටුකොට කෙළින්නට වටනේය; එසේ කල ආලම්බායනයා බොහෝ වස්තුව ලැබ මා මුදුහරින්නේය; මේ තෙමේ මා ලවා යමක් යමක් කරවාද, ඒ ඒ දෙය කරන්නෙමියි සිතූහ. ඉක්බිති ආලම්බායනයා පේළාවෙන් නික්මෙන්නාවූ මහාසත්ත්වයන්ට "මහත්වෙව"යි කියේය. එකල්හි

නා රජ්ජුරුවෝ එබසට මහත්වූහ. කුඩාවෙව, වටවෙව, පෙණ එකක් මවා ගනුව, දෙකක්, දහසක් දක්වා මවා ගනුව, උස් වෙව, මිරි වෙව, පෙනෙන්නාවූ ශරීර ඇති වෙව, නොපෙනෙන්නාවූ ශරීර ඇතිවෙව. අඩි ශරීර ඇතිවෙව, නිල්වන්වෙව, රත්වන්, රත්වන්, සුදුවන්, මදටවන් වෙව, දුම්විහිදුවව, ගිනිදැල් විහිදුවව, දිය විහිදුවව සි කිකළුති ඒ ඒ ආකාර මවා නැටුම් දක්වූහ. ඒ දැක ආශ්චර්‍ය අත්භූත සිත් ඇති මනුෂ්‍යයෝ බොහෝ රත් අමුරත් වස්ත්‍රාභරණා දිය දුන්හ. මෙසේ ඒ ගමින් දහසක් ලද්දේය. හෙතෙමේ මහා සත්ත්වයන් අල්වාගන්නේ දහසක් ලැබ "උන්වහන්සේ හැරපියක් නෙමි"සි කී නමුත් ඒ වසතුව ලැබ "මේ කුඩා ගමදි මෙතෙක් වසතුව ලද්දෙමි නුවර දී එකාන්නයෙන් වසතු බොහෝ ලබන්නෙමි"සි වසතු ලොභයෙන් නාගරාජයන් මුදා නොහැරියේය. හෙතෙම ඒ ගම්හි කුටුම්බ සංස්ථාපනය කොට රුවන්මුවා පෙළා වක් කරවා මහාසත්ත්වයන් එහි ලා සැප ඇති යානාවකට නැඟ මහ පෙරහරින් ගම් නියම්ගම් දනවහි කෙළවා බරණැස් නුවරට පැමිණියේය. නා රජ්ජුරුවන් වහන්සේට මී හා විළඳ ද නොබැඳි අග්ගලා ද දෙන නමුත් උන්වහන්සේ "අත් නොහරි"ය යන හසින් ගොදුරු නොගන්නාහ. එකල්හිත් නුවර, වාසල්දොරසතර ආදි කොට ඒ ඒ තැන මිසක් පමණ කෙළවූයේය. එහෙයින් වදුරන ලදි.

සංසිත්තා අකතඤ්ඤුනා ආලම්බායණෝ මමගහෙ,
පෙලාය පක්ඛිපිත්වාන නිලෙති මං තහිං තහිං. (162)

පෙලායපක්ඛි පූරෙනපි සම්මද්දනෙනපි පණ්ඩිතා.
ආලම්බායණෝ න කුප්පාමි සීලඛණ්ඩභයා මම. සි (163)

තමන්ගේ ජීවිත පරිත්‍යාගය වනාහි තණ සුලක් දීමට වඩ සැහැල්ලුව මට වැටහේ. ශීලව්‍යතික්‍රමය හෙවත් සිල්කඩ කිරීම වනාහි දෙළක්ෂ සතළිස් දහසක් බොල් මහ පොළොව පෙරළීමක් මෙන් නොහොත් ඊටත් වඩා බැරෑරුම්ව මට වටහේ.

නොසෙක් සිය ගණන් ජාතිවල නිරන්තරයෙන් ශීලයාගේ අව්‍යතික්‍රමණය හෙතුකොට ගෙන මගේ ජීවිතය පරිත්‍යාග

කරන්ට හැකි වෙමි. චක්‍රවර්ති රාජ්‍යශ්‍රිය කාරණ කොටත් අමාදන්වූ ශීලය එක් ශික්ෂාපදයකුදු නොකඩ කොට රකිමි. එහෙයින් වදරන ලදි;

සකජීවිතපරිච්චාගෝ තිණතෝ ලහුකෝ මම,
සීලවිනිකකමෝ මය්හං පඨව් උපපතනං විය. (164)

නිරනතරං ජාතිසතං චජෙය්‍යං මම ජීවිතං,
නෙවසීලං පහිණෙය්‍යං චතුදීපාන හෙතු පි. (165)

දැන් යමක් පිණිස, තමන්ගේ ජීවිතය පරිත්‍යාග කොටත් එකල සිල් රකින ලද්දේද, ඒ සිල් රකිනු පිණිසම එබඳුවූ අනර්ථකාරකවූ තෙසාද ආලම්බායන බ්‍රාහ්මණයා කෙරෙහි චිත්තයාගේ අන්‍යථාභවයක් නොකරන ලද්දේද, ඒ දක්වනු පිණිස:

"අපි චාහං සීලං රකඛාය සීලපාරමී පූරිය,
නාකඛරාමි චිත්තෙන අඤඤථත්තනං පකඛිපනෙනපි පෙළකෙ"සි

අවසාන ගාථාව වදාළසේක; (166)

මෙසේ මහාබොධිසත්ත්වයන් අභිගුණ්ඩිකයාගේ අතට හිය කල්හි බොධිසත්ත්වයන්ගේ මැණියෝ නපුරු සිතයක් දැක දරාවත් එහි නොදැක ශොකයෙන් මැඩුනාහු වූහ; ඉක්බිති උන්ගේ දෙටුපිත් සුදශීන නා රජ්ජුරුවෝ එපවත් අසා හිමාලය වනයට ගොස් පසුව **මහාගංගාවෙහිද සප්ත මහා නඩාග** යන් හිද භූරිදත්තයන් පරීක්ෂා කොට එවයි කියා සුහොග නා රජ්ජුරුවන් එහි යැවූහ. "ඉදින් දෙවතාවන් විසින් බණ අසනු කැමතිව භූරිදත්ත නාගරාජයා එහි ගෙන යන ලද්දේ නම් උන් කැඳවාගෙන එව" යි කාණාරිට්ඨයන් දෙව්ලොවට යැවූහ. භූමූ වනාහි "බෝසතාණන් මනුෂ්‍ය ලොකයෙහි සොයන්නෙමියි සිතා තවුස්වෙස් ගෙන නාග භවනයෙන් නික්මුණාහ. **අච්චිමුඛී** නම්වූ උන්ගේ වෙන මවුන් දරු නැගණිකෙනෙක් ඇත; ඕ තෙමෝ බෝධි සත්ත්වයන් කෙරෙහි බලවත් ස්නෙහ ඇත්තී සුදශීන නා රජ්ජුරුවන්ට "නුඹවහන්සේ හා එක්ව යමි"යි කිවාය; ඉක්බිති ඈ මැණිපැටියෙකු කොට දළ මඩුල්ල අස්සේ බහා මහාබොධි සත්ත්වයන් පෙහෙවස් රැකි නැන ආදි කොට හැම තන්හි සොයමින් පිළිවෙළින්

බරණැස් නුවරට පැමිණ රජ්ජුරුවන්ගේ මහසල් දෙරට ගියහ. එකල්හි ආලම්බායනයා රාජාඛ්‍යතයෙහි මහජනයා මැද රජ්ජුරුවන්ට භූරිදත්ත භූජගෙන්ද්‍රයන්ගේ ක්‍රීඩා දක්වන්ට පෙළාව හැර මේහි එව මහා නාගයෙහි,"යි කියා සංඥ දුන්නේය.

මහසතාණෝ ඉස මැන් කොට බලන්නාහු දෙටුබැයන් දැක පෙළාවෙන් නික්ම උන්ට අභිමුඛව ගියහ. මහජනයෝ භය පත්ව ඉවත්ව ගියහ. බෝසතාණෝ හොස් උන්වැද හුන් පෙළාවටම වන්හ. ආලම්බායනයාද නාගයාණන් විසින් නාපස තෙමේ දෂ්ට කරන ලද්දේ වනැයි සිතා ඔහුට භය කොවෙයයි කිය. සුදශීන නා රජ්ජුරුවෝ කියන්නාහු මේ නාගයෝ මට කුමක් කරන්නෝද, මා වැනි අභිඥණ්ඩිකයෙක් ලොව නැතැයි කියා ඔහු හා වාද ප්‍රතිවාදයක් උපදවා නෝ මේ නාගයා ගෙන ගජීනා කරන්නෙහිය. මම කැමති වන්නෙම් නම් මේ මැණි පැටවී ලවා නා නසා පියවන්නෙමියි නැගණියන් කැඳවා අත දිහු කළහ. ඕ නොමේද උන්නේ අඩ අසා දළ මඩුලු අස්සේ වැද හොත්තිම තුන් විටක් මැණි හඩ හඩා නික්ම දසරුවෙහි හිද පැන නැගී උන්ගේ අත්ලෙහි විස බින්දු තුණක් හෙලා නැවත උන්ගේ දළ මඩුලු අස්සට වන. සුදශීනයෝ විස බන්දු පෙන්වා ඉඳින් මේ විස බින්දු පොළොවෙහි වැටෙන්නාහු නම් ඖෂධ තෘණවෘක්ෂයෝ සියල්ල නැසෙන්නාහ. ඉඳින් අහසට දමන්නේ නම් සත් අවිරුද්දක් වැසි නොවස්නේය. ඉඳින් දියෙහි වැටෙන්නේ නම් යම් පමණ ජලජ ප්‍රාණීහු ඇද්ද සියල්ලෝම මැරෙන්නාහුයයි කියා ඒ කාරණය රජ්ජුරුවන්ට විශ්වාස කරවන්ට වළවල් තුනක් කණවා පළමු වළ නානාප්‍රකාර බෙහෙතින්ද දෙවෙනි වළ ගොම්ත්ද තුන් වෙනි වළ දිව්‍ය ඖෂධ යෙන්ද පුරවා වළමැද විසබින්දු හෙළුහ. එකෙණෙහිම දුම් නැගී ගිනිදැල් නැංගේය. ගිනිදැල් ගොස් ගොම පිරූ වළ වැද ගත්තේය. එසිනුත් ගිනිදැල් නැග දිව්‍යෞෂධයෙන් පිරූවළ වැද දිව්‍යෞෂධ දවා නිවීගියේය. විෂ උෂ්ණය වැද ඒ වළට නුදුරුතන්හි සිටි ආලම්බායනයාගේ ශරීරයෙහි සිවිය උදුරා ගෙන ගොස් ශ්වෙතකූට ඇත්තෙකු මෙන් වූයේය. හෙතෙම භයින් තැතිගත්තේ නාගරාජයන් මුදුහරින්නෙමියි තුන්වරක් හඬගැසී. බෝසතාණන් වහන්සේ ඒ අසා රුවන් පෙළාවෙන් නික්ම සඟුරණයෙන් සැරසුනාවූ ආත්මභාවයක් මවා දෙව විලාසයෙන් සිටියාහ. සුදශීනයෝත් අවිවිමුඛිත් එසේම සිටියා හුය. නැවත සුදශීනයෝ භූරිදත්ත නා රජු තමන්ගේ බැයන්

බව රජහට දැන්නුවේය. රජ්ජුරුවෝ ඒ බස් අසා ඔවුන් වැළඳ ගෙන ඉස් සිඹ අන්තඃපුරයට ගෙන ගොස් මහත් සත්කාර සම්මාන කොට භූරිදත්ත තාරප්ජුරුවන් සමඟ පිළිසඳර කථාකර මින් දරුව, මෙබඳු මහානුභාව ඇති ඔබ ආලම්බණයා විසින් කෙසේ අල්වාගත්තාලද්දේ දැයි විචාළේය. උන්වහන්සේ සියල්ල විස්තර හෙයින් කියා මහරජාණෙනි, රජදරුවන් විසින් තම් මේ ක්‍රමයෙන් රජය කරන්ට වටනේයයි මසිලණුවන්වූ රජහට ධම් දෙශනා කළහ. ඉක්බිති සුදශීනයෝ මසිලණුවෙනි, මාගේ මැණියෝ භූරිදත්තයන් නොදක්නාහු පිඹිත වන්නාක. එහෙයින් මෙහි පමාවන්ට නොහැකි යයි මසිලණුවන් විචාරා භූරිදත්ත තාරප්ජුරුවන් හා අවිවිමුඛින් සමඟ තාග භවනයටම ගියහ. ඉක්බිති මහාසත්ත්වයන්වහන්සේ එහි ගිලානසෙය්‍යාවෙන් හුන්සේක් ගිලන්බැව් විචාරීමට දා මහත් තාගපිරිසට කාණාරිෂ්ටයන් වෙදයද, යාගයද, බමුණන්ද සම්භාවනය (උතුම්) කොට කියනකල්හි බෝසතාණන් වහන්සේ ඒ මිථ්‍යාවාදය බිඳ පියා නොයෙක් ක්‍රමයෙන් ධම්දෙශනාකොට සිල සම්පදාවෙහිද දෘෂ්ටිසම්පදාවෙහිද පිහිටුවා දිවිපමණින් සිල්රැක පෙහෙවස් වැස ජීවිතාවසානයෙහි සවගිලොකයෙහි උපන්හ.

එකල්හි මවුපියෝ මහාරාජ කුලයෝ වූහ. නොසාදබ්‍රාහ්මණයෝ දෙවදත්තසථවිරයෝය, සෝමදත්තයෝ ආනන්දසථවිරයෝය, අවිවිමුඛි උක්පලවණ්ණාවෝය, සුදශීනයෝ ශාරිපුත්‍රසථවිරයෝය, සුභොගයෝ මහාමෞද්ගල්‍යායන සථවිරයෝය, කාණාරිෂ්ටයෝ සුනකඛත්තයෝය, භූරිදත්ත නා රජාණෝ ලොකසාමිවූ බුදුරජාණන් වහන්සේය.

මෙහිදු අවශෙෂ පාරමීහුද යටකී ක්‍රමයෙන්ම නිඛාරණය කටයුත්තාහුය. ඒ එසේමය. යොදුන් සියයක් පමණ තමන්ගේ නාගභවනයෙහි නාගකන්‍යාවන් සොළොස් දහසක් විසින් විත්‍ර රූපාකෘතියෙන් පරිවාරණය කරන කල්හිද දෙවලොක සම්පත් හා සමාන නාගලොක සම්පත්හි සිටත් ඓශ්වර්‍ය මදයක් නොකොට අඛමසක් පාසා මවුපියන්ට උපසථාන කිරීමය, කුලදෙටුවන් පිදීමය, සියලුනාගපිරිසද චාතුම්මහාරාජික පිරිසද තවුතිසා පිරිසද යන පිරිස් මධ්‍යයෙහි හටගත් පැණ ඒ ඒ පිරිස් මධ්‍යයෙහිම මුවහත් ඇති කඩුවකින් හෙළ උපුල්කළඹක් කපන්නාක් මෙන් තමන්ගේ නුවණ තමැති කඩුවෙන් එකෙණෙහිම පිරිසිද

ඔවුන්ගේ චිත්තානුරූපව ධර්මදේශනා කිරීමය, උක්තප්‍රකාර හොඟසම්පත් හැර තමන්ගේ ශරීරජීවිත නිරපේක්ෂවැ වතුරඔඝ සමන්නාගතවූ පෞෂ්ඨපාදික්ෂීරාතය, එහිදු ප්‍රතිඥාවිරෝධ වේයේ හෝයි යන භයින් අභිගුණ්ඩිකයාගේ හස්සාගතවීමය, ඔහු මුඛයෙහි විෂමිශ්‍ර කෙළ වත්කිරීමය, තගුවින් ගෙන පෙළීමය, තිමගැසීමය, මැඩීමය. පෙළීමය යන මේ ආදී නොයෙක් විප්‍රකාර කරන කල්හිත් මේසා මහත් දුකක් අනුභවකරන කල්හිත් කිපි බැලීම් මාත්‍රයකින් ඔහු හළුකරන්ට සමර්ථවත් ශීල පාරමිතාව ආවර්ජිතා කොට සිලය කඩවේයේ හෝයි භයින් මද කුදු චිත්තයාගේ අවිකාරභාවය, ධනය ලබම්යි ඔහුගේ චිත්තානුරූප හැසිරීමය, සුභොගයන් විසින් පුනානිතවූ ඒ අකෘතඥවූ මිත්‍රද්‍රෝහිවූ නෙසාද බ්‍රාහ්මණයාට සිල් නොඉවාත් නොකිපීමය, කාණාරිෂ්ටයන් විසින් කියූ මිථ්‍යාවාදය බිඳ අනෙකාකාරයෙන් ධර්මදේශනා කොට නාගපිරිස ශීලයෙහිද සම්‍යක් දෘෂ්ටියෙහිද පිහිටුවීමය, යන මේ ආදිවූ මහාබොධිසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ විභාවනය කටයුත්තාහුය. "එවං අරියා එතෙ-පෙ-ධම්මස්ස අනුධම්මතා" නි යනු එහෙයින් කියනලදී. පරමාර්ථදීපනී නම් චරියාපිටක අටුවාවෙහි දෙවන හත්ථිනාගවගී යෙහි දෙවන භූරිදත්ත චරිතය නිමි.

(X) 111 චම්පෙය්‍යනාග චරිතය.

තවද පරමාර්ථදීපනී නම් චරියාපිටක අටුවාවෙහි
දෙවන හත්ථිනාග වගියෙහි තුන්වන
චම්පෙය්‍ය නාග චරිතය කියේය යත්:

පුනාපරං යදා හොමි චම්පෙය්‍යකෝ මහිද්ධිකෝ,
තදාපි ධම්මිකෝ ආසිං සීලබ්බතසමප්පිතෝ. (167)

නැවත අනිකුදු චරිතයක් කියන්නෙමි. හෙද අසව, යම් කලෙක්හි මම මහත් නාග ඍද්ධියක් ඇත්තාවූ චම්පෙය්‍ය නම් නාරජෙක් විමිද, එකල්හිදු ශීලව්‍රතයෙන් යුක්ත වූයෙමි ධර්ම චාරිවිමි. ඒ කෙසේද යත්:

එකල්හි අපගේ ශ්‍රී මහා බොධිසත්ත්වයන් වහන්සේ චම්පා නම් නාග භවනයෙහි උපන්සේක. සියල්ලෝම උන්වහන්සේ චම්පෙය්‍ය නම් නාරජ යයි දැනගත්තාහ. ඔබ මහත් සැප්සෙන් හා මහත් ආනුභාවයෙන් යුක්තව එහි රජය කරවන්නෝ දෙව්රජ සිරිසම්පත් වැනි ඉසුරු සැපවිඳිමින් දවස් යවන සේක. බෝසතාණෙනි පාරමීධර්මයන් පුරන්ට අනවකාශ හෙයින් මිට මේ තිරිසන් යොනියෙන් කවර ප්‍රයෝජනද, පෙහෙවස් වැස මෙයින් මිදී මහාකොටම පාරමීන් පුරන්නෙමියි" සිතා එතැන් පටන් තමන් ප්‍රාසාදයෙහිම හිඳ පෙහෙවස් රක්නාහ. එවිට සම්භාරණයෙන් සැරසුනාවූ නාග කන්‍යාවෝ උන්වහන්සේ සමීපයට එත්. උන්වහන්සේ මෙහි මාගේ ශීලයට අන්තරාය වන්නේයයි ප්‍රාසාදයෙන් නික්ම උයනෙහි හිඳ පෙහෙවස් රක්නාහ. එහිදු නා මෙණෙවියෝ උන්වහන්සේ කරා එන්නාහු මය. එසඳ උන්වහන්සේ මෙසේ සිතූහ. මෙතැන්හි මාගේ ශීලය කෙලෙසෙන්නේය. එබැවින් මේ නාගභවනයෙන් නික්ම මනුෂ්‍යලොකයට ගොසින් පෙහෙවස් රකිම්යි උන්වහන්සේ එතැන් පටන් පොහෝ දවස්වල නාගභවනයෙන් නික්ම එක් පසල්ගමකට තුදුරු මාවතක් සමීපයෙහි තුඔසක්මත්තෙහි දරණ වැල ලාගෙන හිඳ "මාගේ සම් ආදියෙන් ප්‍රයෝජන ඇත්තෝ සම් ආදිය ගනිත්වා! ක්‍රිඹා සතියකු හෝ කරවනු කැමැත්තෝ එසේකරත්වා" යි තමන්ගේ ශරීරය දුනවුඛයෙහි හැර පියා පෙහෙවස් රක්නාහ. තුදුස්වක පසළොස්වක පෙහෙවස් වෙසෙති පාලවිය දිනයෙහි නාගභවනයට යෙති. මෙසේ සිල්රකිත්නාවූ උන්වහන්සේට බොහෝ කාලයක් ඉක්ම ගියේය.

ඉක්බිති සුමනා නම් තමන්ගේ අගමෙහෙසුන් බිසව් බෝසතාණන් වහන්සේට "දේවයන්වහන්ස, ඔබවහන්සේ මිනිස් ලොවට ගොස් පෙහෙවස් රකින්නහු, ඒ වතාහි සැක සහිතය. භයසහිතය" යි කිහ. එකල්හි බෝසතාණන්වහන්සේ මහුල්පොකුණු තෙර සිට "සොඳුර, ඉදින් කිසිවෙක් මට දඬු මුගුරු ආදියකින් පැහැර වෙහස කෙළේවී නම් මේ පොකුණේ දිය කැළඹෙන්නේය. ඉදින් ගුරුළෙකු හසුගෙන යන ලදිම් නම් දිය කැකෑරෙන්නේය. ඉදින් අහිගුණ්ඩිකයෙකු විසින් අල්වා ගනු ලැබිම්නම් දිය ලේවන්වන්නේය"යි ඇට මේ නිමිති තුන කියා තුදුස්වක පේවස් ඉටා නාගභවනයෙන් නික්ම මිනිස්ලොවට

ගොස් ශරීරශොභාවෙන් තුඹස හොබවමින් ඒමතුපිට හොත්තාහ. මුත්වහන්සේගේ ශරීරය වනාහි බබලන රිදීදමක් මෙන් ශුද්‍රවණ්ණ, මස්තකය රත්හු පලස් වටක් වැනිය, ශරීරය තඹ ලිසක් පමණය, කුසිදෘත කාලයෙහි වනාහි මුත්වහන්සේගේ ශරීරය කලවියක් ප්‍රමාණය, සංඛපාල කාලයෙහි එකදෙණිතැවක් පමණය, එකල්හි බරණැස්නුවරවැසි එක්තරා මාණවකයෙක් තක්සලා නුවරට ගොස් ආලම්බායන මන්ත්‍රය ඉගෙන එම මැදිනින් තමන් ගමට යන තැනැත්තේ මහා සත්ත්වයන් දැක "භිස්දෙනින් ගමට යෑමෙන් මට කවර ප්‍රයෝජනදැයි, මේකාගයා දල්වාගෙන ගම් නියම්ගම් රජදනව්හි කෙළවමින් ධනය රැස්කොට ගෙන යන්නෙමි"යි සිතා දිව්‍යෞෂධයක් ගෙන දිව්‍යමන්ත්‍රයක් ජපකොට උන්වහන්සේගේ සම්පයට ගියේය. දිව්‍යමන්ත්‍රය ඇසූ වේලෙහි සිට මහාසත්ත්වයන්ගේ දෙකන් රත්යහුල් ප්‍රවෙශ කරන කලක්මෙන් වූයේය. භිස්මුදුනෙහි යකුලකින් පහරණකලක් මෙන්විය. බෝසතාණෝ මේ කිමෙක්දෝහෝයි දරණවැළ මැද්දෙන් භිස ඔසවා බලන්නෝ, අහිගුණ්ඩිකයා දැක මෙසේ සිතූහ. "මාගේ විෂ උග්‍ර තෙජය, ඉදින් මම කිපී නාසාවාතයක් හළෙම් නම් මොහුගේ ශරීරය දහවී මිටක් මෙන් විහිදෙන්නේය. එවිට මාගේ ගිලය බණ්ඩ වන්නේය. එහෙයින් මොහු නොබලන්නෙමි"යි සිතා ඇස්වසාගෙන භිස දරණවැල අස්සේ තබා ගත්හ. අහිගුණ්ඩික බ්‍රාහ්මණතෙමේද ඔසදක් සපා මන්ත්‍රයක් පිරිවහා මහාසත්ත්වයන්ගේ ශරීරයෙහි කෙළවත් කෙළේය. ඖෂධ හා මන්ත්‍ර බලයෙන් කෙළවැදහත්තැන් පොළතැගෙන කලක් මෙන් වූයේය. නැවත හෙතෙම තගුටෙන් අල්ලා ඇදගෙන දිගහොවා එළුකුරකට බදු සටහන් ඇති කටුකරුවෙන් පෙළා දුබල කොට භිස තරයේ අල්ලා ගෙන පෙළෑයේය. එවිට මහාසත්ත්වයෝ කට දැල්වූහ. ඉක්බිති උන්වහන්සේගේ මුඛයෙහි කෙළ වත්කොට ඖෂධ හා මන්ත්‍රබලයෙන් දළ ඉදුරුයේය. මුඛය ලෙයෙන්පිරුණේය. මහාසත්ත්වයෝ තමන්ගේ ශීලතේජයක්වේද්‍යෝහි භයින් එබඳු දුක් ඉවසමින් ඇස් දල්වා බැලුම්කුදු නොකළාහ. අහිගුණ්ඩික තෙමේද නාගරාජයන් දුර්ලභ කරන්නෙමියි, තගුටෙහි පටන් ඇට බිඳින්නාක්මෙන් සියලු ශරීරය මැඩපියා පිළිවෙළින කලක් මෙන් පෙළෑයේය. දුනුදිය මඬන කලක්මෙන් මැඩපිය. තගුට අල්ලා ගෙන පිළි අපුල්ලන්නාක් මෙන් බිම පෙළෑයේය. මහාසත්ත්වයන්ගේ මුළුශරීරය ලෙහෙයෙන් වැකී ගියේය. බෝසතාණන් වහන්සේ ඒසාමහත් වේදනා ඉවසූ සේක. මෙසේ මහාසත්ත්වයන්

වහන්සේ දුම්ල කොට වැල්වලින් පෙළක් සාදා එහි උන්වහන්සේ ඛහාගෙන පසල්ගමකට ගෙනගොස් මහජනයා මැද කෙළවූ සේය. නිලාදිපැහැයන් අතුරෙන් හෝ වටසිවුරස් ආදි ආකාරයන් අතුරෙන් හෝ කුඩා මහත් ප්‍රමාණයන් අතුරෙන් හෝ යමක් යමක් දක්වනු කැමති වේද, මහාසත්ත්වයන් වහන්සේ ඒ ඒ පරිද්දෙන් නටන්නාහ. පෙණ සියයක්ද, දහසක්ද, මවාගනිත්මය. ඒ දුටු මහජනයා පැහැදී බොහෝ සම්පත් දුන්හ. එකදවස කිත්ම කහවනු දහසක්ද දහසක් වටිනා පරිෂ්කාරද ලද්දේය. බ්‍රාහ්මණතෙම මුලදී දහසක් ලැබ "නාගරාජයා හැරපියන්නෙමි"යි සිතූ තමුත් ඒ සම්පත් ලැබ මා විසින් පසල් ගමකදී මෙතෙක් සම්පත් ලබන ලද්දීය. රාජරාජ මහාමාත්‍යයන්ට දැක්වූ කල "බොහෝ සම්පත් ලබන්නෙමි"යි ගැලක්ද සැප යානා වක්ද ගෙන ගැලෙහි පිරිකර තබා සැපයානාවෙහි හුන්නේ මහපිරිවරින් මහාසත්ත්වයන් ගම් නියම්ගම රජදනව්හි කෙළ වමින් බරණැස් නුවර උගසේන රජුන් අභිමුඛයෙහි කෙළවා "හැරපියන්නෙමි"යි එහි ගියේය. හෙතෙම මැණියන් මරා බොධි සත්ත්වයන්ට දෙයි. කාන රජ්ජුරුවෝ නැවත නැවතත් මා නිසා මොවුන් මරන්නේයයි අනුභව නොකරන්නාහ. ඉක්බිති උන්වහන්සේට විළඳ හා මී පැණි දුන්නේය. උන්වහන්සේ "ඉදින් මම ගොදුරු ගත්තෙම් නම් පෙළාවෙහිම මරණයට පැමිණෙන්නෙමි"යි සිතා එසිදු අනුභව නොකරති, බ්‍රාහ්මණතෙමේ මසකින් පමණ බරණැස් නුවරට පැමිණ දෙර ගම්හි කෙළවා බොහෝ සම්පත් ලද්දේය. රජ්ජුරුවෝ ඔහු කැඳවා "අප ඉදිරියෙන් කෙළවව"යි කීහ. "යහපත දේවයන් වහන්ස, හෙට පසළොස්වක් දා නුඹවහන්සේ ඉදිරියේ ක්‍රීඩාකර වන්නෙමැ"යි කීය. රජ්ජුරුවෝ හෙට කාරජ රාජාඩගතයෙහි හටන්නේය. මහජනයා රැස්ව බලන්වයි බෙර හසුරුවා දෙවන දවස්හි රාජාඩගතය සරහා බ්‍රාහ්මණයා කැඳවූහ. හෙතෙම රුවන් පෙළායෙන් මහාසත්ත්වයන් එතනට ගෙන ගොස් විසිතුරු ඇතිරියෙහි පෙළාව තබා හුන්නේය. රජ්ජුරුවෝ ප්‍රාසාදයෙන් බැස මහජනයා පිරිවරා රජාසනයෙහි හුන්නාහ. බ්‍රාහ්මණතෙම මහාසත්ත්වයන් මැන්සොට් නැටෙව්වේය.

මහාසත්ත්වයෝ ඔහු විසින් සිතන සිතන ලද ආකාර ම දැක්වූහ. මහජනයා ඒ දැක නමතමින් සිටි පරිද්දෙන් සිටින්නට කොහැක්කාහු දහස්ගණත් පිළී ඉස සිසාරන්ට වත. මහාසත්ත්වයන්ගේ මත්තෙහි රුවන්වැසි වස්කාක් මෙන් විය.

එහෙයින් වදළහ:—

තදුපි මං ධම්මවාදිං උපවුත්ථං උපොසථං,
අභිගුණ්ඨිකෝ ගහෙත්වාන රාජමාරම්භි කීළති. (168)

යං සෝ වණ්ණං විනන්ධති නීලංව පිතලොහිතං,
තස්ස චිත්තානුවත්තෙන්තෙනා හොමි විනතිනන්ධනිකෝ.

ථලං කරෙය්‍යං උදකං උදකම්පි ථලං කරෙ,
යදිහං තස්ස පකුප්පෙය්‍යං ඛණෙන ජාතිකං කරෙ. (170)

යදි චිත්තවසි හෙස්සං පරිහාසිස්සාමි සීලතෝ,
සීලෙන පරිහීනස්ස උත්තමත්ථෝ න සිජ්ඣති. (171)

කාමං භිජ්ජතු යං කායෝ ඉධෙව විකිරියතු,
නෙව සීලං පභිඤ්ඤෙය්‍යං විකිරණෙන භූසං වියාති. (172)

ඉක්බිති අභිගුණ්ඨිකයාගේ අතට අසුවූ මහ බෝසතාණන්ට මාසයක් පිරුණේය. මෙදතුරේ බෝසතාණෝ නිරාහාරවම විසූහ. සුමතා බිසව් මාගේ සවාමියාණෝ ඉතා ලස්වෙති. ඒට කාරණ කවරේදැයි පොකුණ බලන්නි ලේවන්වූ ජලය දැක "අභිගුණ්ඨිකයකු විසින් ගත්තාලද්දේ වතැ" යි දැන නාගභවනයෙන් නික්ම තුඹස සමීපයට ගොස් මහාසත්ත්වයන් අල්වාගත් තැනද වෙහෙස දුන් තැනද දැක හඬා වැලපී පසල්ගමකට ගොස් විචාරාම ඒ පුවත් අසා බරණැස් නුවරට ගොස් රජදෙර ආකාශයෙහි හඬමින් සිටියාය. මහා සත්ත්වයෝ නටමින්ම ආකාශය බලා ඇ දැක ලජ්ජාව ගොස් පෙළාවට වැදහොත්තාහ. රජ්ජුරුවන් උත් පෙළාවට වන්කල ඒට කාරණය කිම්දැයි ඔබ්නොබ බලන්නාහු ආකාශයෙහි සිටියාවූ නා මෙණෙවිය දුටහ. රජ්ජුරුවෝත් "නී කවරක්ද"යි විවාළ කල්හි ඕ "නාග කන්‍යාවක්මි"යි කිව. ඉක්බිති රජ්ජුරුවෝ "නිසැකව" මේ නාරජ්ජුරුවෝ මැ දැක ලජ්ජාව ගොස් පෙළා

වට වත්හ. නා රජ්ජුරුවන් විසින් යටිදැක්වූ සෘද්ධානුභාවය එම නාරජ්ජුරුවන්ගේ මය. අභිගුණ්ඩිකයාගේ නොවේය"යි නිමාවටගොස් මේ නා රජ්ජුරුවෝ මෙසේ මහානුභාව ඇත්තෝය, කෙසේ මොහුගේ අතට හියෝදැයි විචාළහ. ඔයින් මේ නාරජ්ජුරුවෝ ධම්මාරීය, සිල්වත්ය, තුදුස්වක පසළොස්වක දිනයන්හි පෙහෙවස් වසන්නෝ තමන්ගේ ශරීරය දැනමුඛ යෙහි දී මහමඟ සම්පයෙහි තුඹස මත්තෙහි හොවිත්. එහිදී මොහු විසින් උන්වහන්සේ ගත්තාලද්දේයැයි කිහ. වැළිදු මේ නා රජ්ජුරුවන්ට දෙවහතත් වැනි නොයෙක් දහස්ගණත් නාමෙණෙවියෝ ඇත්තාහ. දිව්‍යලොක සමපත් වැනි නාගසම් පත් ඇත්තාහ. මහත් සෘඩි ඇත්තාහ, මහානුභාව සම්පන්න යහ. මුළු පොළෝතලය පෙරළන්ට තරම්, හුදෙක් මේ නාග රජ්ජුරුවෝ "මාගේ ශීලය බිඳේය"යි මේබදුවිප්‍රකාරයක් දුකක් අනුභව කළාහ"යි කීබස් අසා සංවෙගයට පැමිණ එකෙණෙහිම ඒ අභිගුණ්ඩිකයාහට මහත් සම්පත්ද, මහත් යස ඉසුරුද දී "භවත, මේ නාගරාජයන් හැරපියව" යි කියා නාගරාජයන් මුදවූහ. මහාසත්ත්වයන්වහන්සේ නාගවෙසය අන්තර්හිත කොට මිණවක වෙසයෙන් දෙව්කුමරකු මෙන් සිටියාහ. සුමනා බිසවුද අහසින් බැස ඔබ සම්පයෙහි සිටියාහ. නාග රජ්ජුරුවෝ රජහට ඇඳිලි බැඳ සිට " මහරජාණෙනි. එව මැනව, මාගේ නිවෙස්හ බලන්ට එව මැනවැ" යි යාච්ඤා කළහ. එහෙයින් වදාළහ, බුදුහු

194 මූතෙනා වමෙපය්‍යකෝ නාගෝ රාජානං එතදබ්‍රවි,
තමෝ තෙ කාසිරාජඤ්ඤ තමෝ තෙ කාසිවඩ්ඪන;
අඤ්ජලිං තෙ පගණ්හෙහය්‍යාම පසෙසය්‍ය මේ නිවෙසනන්ති.

ඉක්බිති රජ්ජුරුවෝ ඔහට " නාගභවනයට යම් " යි අනුඥා දුන්හ. මහාසත්ත්වයෝ සහපිරිවරින් උන්වහන්සේ නගභවන යට කැඳවා ගෙනගොස් තමන්ගේ සිරිසැප දක්වා කිප දිනක් එහි වස්වා සියලු රජපිරිස කැමැති පරිදෙන් රත් රුවන් ආදී සම්පත් ගනිත්ව "යි බෙර හසුරුවා රජහටද නොයෙක් සිය ගණන් ගැල්වලින් ධනය යැවූහ.

මහරජ්ජුරුවෙනි, රජහු විසින් තම් දන් දියයුතුය, සිල්රැක්ක යුතුය, සියලු තන්හි ධාර්මිකවූ රක්ෂාවරණ ගොපනය කටයුතු ය" යි දශරාජධර්ම කථාවෙන් අවවාද කොට පිටත්කළහ.

රජ්ජුරුවෝ මහත් යසසින් කාඟහවනයෙන් නික්ම බරණැස් නුවර රටම හියහ. එතැන්පටන් දඹදිව හිරණ්‍ය සාණියෙන් සම්පූර්ණ වූයේය. මහාසත්ත්වයෝ සිල්රැක අඩමසක් පාසා පෙහෙවස් වැස සහපිරිවරින් සාගල්පුරය පිරුහ.

එකල්හි අහිතුණ්ඩිකතෙම දෙවදහසක්වරවූයේය, සුමනා නොමෝ රාහුලමාතාවය, උග්ගසේන රජ්ජුරුවෝ ශාරීපුත්‍ර සාරවරයෝය, චමේපය්‍යනාග රජ්ජුරුවෝ ලොකසාමිවූ බුදුරජාණන් වහන්සේය.

මෙහිදු උත්තමත්තේගේ අවශේෂ පාරමිහුද සුදුසු සේ නිධිරණය කටයුත්තාහුය. බොධිසත්ත්වයන් වහන්සේගේ අවශේෂ ආශ්චර්‍ය ආනුභාවයෝ කියු ක්‍රම ඇත්තාහුමය.

පරමාර්ථදීපනී නම් චර්යාපිටක අට්ඨකථාවෙහි
දෙවත හසතිනාගවර්ගයෙහි තුන්වත
චමේපය්‍යනාග චරිතය නිමි.

——)o(——

(X) iv චූලබෝධි චරිතය.

තවද මේ පරමාර්ථදීපනී නම් චර්යාපිටක අට්ඨකථාවෙහි
දෙවත හසතිනාග වර්ගයෙහි සිවුවත
චූලබෝධි චරිතය කියේය යත්.

——)o(——

පුනාපරං යදා හොමි චුල්ලබෝධි සුසීලවා,
භවං දිස්වාන භයතෝ නෙක්ඛම්මං අභිනික්ඛමිං. (173)

යනුවෙන්:—

තැවත අනිකුදු චරිතයක් කියන්නෙමි. හෙද අසව, යම් කලෙක්හි මම සීලසම්පන්නවූ චූලබෝධි නම් පරිබ්‍රාජකයෙක් වීමිද, එකල්හි ජාතිදුක, ජරාදුක, ව්‍යාධිදුක, මරණදුක, අපායදුක, අතීතයෙහි වතිමූලක දුක, වර්තමානයෙහි ආහාර පරියෙසන මූලක දුක යන මේ අෂ්ටසංවේගවස්තූන් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් සියලු කාමාදි ප්‍රභේද ඇති භවය සංසාරභය වශයෙන්ද, නිර්වාණය හා ඊට උපායවූ සමථ විදර්ශනාද, ඊට උපායවූ ප්‍රව්‍රජ්‍යාවදැයි මෙසේ ත්‍රිවිධවූ, නෛෂ්ක්‍රම්‍යයද අනුශ්‍රවාදි සිඩවූ ඥාන

වසුසිත් ඊට ප්‍රතිපක්ෂවශයෙන්ද දූක තොයෙක් ආදීනව ඇති කුල ගෘහයෙන් නික්ම තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවිමි. මේ එහි පිළිවෙළ කථාවයි.

අතීතකාලයෙහි මේ මහාභද්‍රකල්පයෙහිම අපගේ ශ්‍රී මහා බොධිසත්ත්වයන් වහන්සේ බ්‍රහ්මලොකයෙන් සැව එක්තරා කසීඝමණ්ඩ මහ සම්පත් ඇති එක් බ්‍රාහ්මණයෙකුට පුත්‍රව උපන් සේක. උන්ට තම් තබන්නාවූ කාලයෙහි බොධිකුමාර යයි නමක් කළාහුය. උන්වහන්සේ වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් සියලු ශිල්ප නිමවා ඉගෙන ගෙන ආකල තොකැමැතිවූම උන්ට මවුපියො සමජාතිකවූ කුල කුමාරියක් ගෙනාවාහුය, ඔයින් බඹලොවින් චුතවූවාහුමය. දෙවනතක් බදු උතුම් රූ ඇත්තාහ. ඔවුන් අකමැතිව සිටියදීම (ඔවුනොවුන්) ආවාහ විවාහකළාහුය්, ඔවුන් දෙදෙනා අතරම ක්ලේශ සම්භෝගසම්බන්ධ නුවූවිරූය, කෙලෙස් වසයෙන් ඔවුනොවුන් මූණ බැලුම් පමණකුදු නුවූයේය. අවශෙෂ සංඝයෙහි කියනුම කවරේද? මෙසේ ඔවුහු පිරිසිදු සිල් ඇත්තෝවූහ. මෑතකාලයෙහි මහ බෝසතාණන් වහන්සේගේ මවුපිය දෙදෙන කාලක්‍රියා කළහ. උන්වහන්සේ ඔවුන්ගේ ශරීරකෘත්‍යයන් කොට නිමවා භාග්‍යව කැඳවා කියන්නාහු "සොදුර, තෙපි මේ අසූ කෙලක් පමණ සම්පත්ගෙන සුවසේ ජීවත්වෙව" යි කිහ. ඕතොමෝ "සවාමිපුත්‍රයෙනි, නුඹවහන්සේ කොයි වඩනා සේක්ද" යි කිව. උන්වහන්සේ "මට සම්පත්තින් ප්‍රයෝජනයක් නැත, පැවිදි වන්නෙමියි" කිහ. "ඇයි සවාමීනි, සත්‍රිත්ට පැවිදිවන්ට නොවටනේද? වටනේය, සොදුර, පිළිවත් විතම් පැවිදි වෙව" යි කිහ. එසේවිනම් "මටත් සම්පත්තින් ප්‍රයොජනයක් නැත. මමත් පැවිදි වන්නෙමි" යි කියා ඔවුන් දෙදෙනම් සියලු සම්පත් හැරපියා මහදන් දී ගිහිගෙන් නික්ම වල් වැද තවුස්පැවිද්දෙන් පැවිදිව පිඬු පිණිස හැසිරීමෙන් හා පලවැලින් ජීවත් වන්නෝ පැවිදි සුවයෙන් දස අවුරුද්දක් වැස ලුණු ඇඹුල් සෙවිනා පිණිස ජනපද චාරිකාවෙහි හැසිරෙන්නාහු පිළිවෙළින් බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ උයනෙහි විසූහ. එහෙයින් වදාළහ.

"යා මෙ දුනිසිකා ආසි බ්‍රාහ්මණී සබ්‍රහ්මචාරිනී,
සාපි වච්චෙ අනපෙක්ඛා නෙක්ඛම්මං අභිනික්ඛමි. (174)

නිරාලයා ජිනභබන්ධු අනපෙක්ඛා කුලෙ ගණෙ,
චරන්තා කාමනිගමං බාරාණසිමුපාගමුං. (176)

තත්ථ වසාම නිපකා අසංසට්ඨා කුලෙ ගණෙ,
නිරාකුලෙ අපපඤ්ඤෙ රාජුය්‍යානෙ වසාමුභො". ති (176)

ඉක්බිති එක් දවසක් රජ්ජුරුවන් වහන්සේ උයන්කෙළියට ගිය සේක් උදුන්යෙහි එක්පසෙකැ පැවිදි සුවයෙන් කල්යවන් කාවූ ඔවුන් සම්පයට හොස් දුටුවත් අතිශයින් පහදවන්කාවූ උතුම් රූ ඇති පරිබ්‍රාජිකාවන් දැක කෙලෙස් වශයෙන් පිළිබඳ සින් දැතිව "මේ පරිබ්‍රාජිකාවන්ද නුඹවහන්සේට කවරක් වනසේක්ද" යි බොධිසත්ත්වයන් විවාළාහ. බොධිසත්ත්වයන් වහන්සේද "උන්ද මට කිසිවක් නොවන්කාහ, හුදෙක් එකට පැවිදිවූ නැනැත්තෝය. එසේද වුවත් ගිහිකල පාදපරිචාරිකා වූහ, යි කීහ. රජ්ජුරුවෝ "මොහු වනාහි උහුගේ කිසිවක් නොවෙති, එසේදවුවත් ගිහිකාලයෙහි මාගේ පාදපරිචාරිකාවූව" යි කියති, මෑ මාගේ අන්තඃපුරයට පමුණුවත්තෙම් නම් යහපත, එහෙයින් ඔහුගේ මේ ප්‍රතිපත්තිය දැන ගන්තෙමියි සිතූහ. අඛ බාල රජ්ජුරුවෝ ඇ කෙරෙහි (තමන්ගේ පිළිබඳ) සිත වළක් වත්ට නොහැකිවූවෝ තෙල පරිබ්‍රාජිකාවන් රජගෙට ගෙන යව" යි කියා එක්තරා පුරුෂයකු නියෝග කෙළේය. ඒ පුරුෂ තෙම උන්වහන්සේට යහපතැයි පිළිවදන්දී අධර්මියක් ලොක යෙහි පවතින නියාවය" යි යනාදීන් කියා අඩ අඩා සිටියදීම ඇ රජගෙට ගෙනගියේය. බොධිසත්ත්වයෝ ඇගේ විලාප හඬ අසා වරක්ම බලා නැවත නොබැලූහ. ඉදින් මම වළක් වත් නෙම් නම් ඔවුන් කෙරෙහි හිත කළඹා මාගේ ශීලයට අන්ත රාය වන්නේයයි ශීලපාරමිතාව ආවර්ජනා කරමින් උන්සේක එහෙයින් වදාරන ලදී.

"උය්‍යානදස්සනං ඥත්වා රාජා අදාසි බ්‍රාහ්මණිං,
උපගම්ම මමං පුච්ඡි තුය්හෙසා කස්ස භාරියා. (177)

එවං වුත්තෙන අහං තස්ස ඉදං වචනමබ්‍රුවිං,
න මය්හං භරියා එසා සහධම්මා එකසාසනී. (178)

තස්සා සාරත්තඥාතිතො ඥාහාපෙන්ති වෙවණෙ,
නිප්පිළයන්තෙනා බලසා අන්තෙනපුරං පවෙසයි. (179)

ඔදපත්තකියා මය්හං සහජා එකඤාඤති,
ආඛඩ්ඩිසිඤා නඛනඛියා කොපො මේ උපපජ්ජථ. (180)

සහ කොපෙ සමුප්පන්නෙන සීලබ්බතමනුස්සරිං,
තඤ්ඤේව කොපං නිගණ්හිං නාදුසිං ඛඩ්ඩිතුපදි. (181)

යදිහං බ්‍රාහ්මණිං කොචි කොච්චෙය්‍ය තිණ්හසත්තියා.
නෙවස්සිලං පගණ්හෙය්‍යං බොධියාඤඤව කාරණා. (182)

න මෙඤා බ්‍රාහ්මණී දෙස්සා න පිමෙ බලං න විජ්ජති,
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා සීලානුරක්ඛිස්සං"ති.

ඉක්බිති රජ්ජුරුවෝ උයනෙහි කල්නොයවා වහාම නුවරට ගොස් ඒ පරිබ්‍රාජිකාවන් කැඳවා මහත් යසසින් පැවරූහ. උසිත් ඒ කාම සම්පත්තියෙහි අගුණ ද ප්‍රව්‍රජ්‍යාවෙහි ගුණ ද තමන් හා බොධිසත්ත්වයන්වහන්සේත් මහත් හොඤ්ඤකඞ්ඛ හැර සංවෙගයෙන් පැවිදිවූ බවද කිහ. රජ්ජුරුවෝ කිසිලෙසකින් ඇගේ සිත ගත නොහැකිව මෙසේ සිතූහ. "මේ පරිබ්‍රාජිකාවන්ද සිල්වත්හ. යහපත් සුහාව ඇත්තාහ ඒ පරිබ්‍රාජිකයෝද මුත් ඇදගෙන යනකල්හිත් කිසි විප්‍රකාරයක් නොදක්වූහ. සියලු තන්හි නිරපෙක්ඛක සිත් ඇත්තාහ. මේබඳු ගුණවතුන් කෙරෙහි විප්‍රකාරය සුදුසු නොවන්නේය. මම මේ පරිබ්‍රාජිකාවන්දුන් රැගෙන උයනට ගොස් උන්හා පරිබ්‍රාජිකයනුත් ඤමා කරගන්නෙම් නම් යහපතැ" යි මෙසේ සිතා පරිබ්‍රාජිකාව උයනට ගෙනඑවයි කියා පුරුෂයන් නියොගකොට තමන් පළමුකොට ගොස් බොධිසත්ත්වයන් වහන්සේ කරා එළඹ මෙසේ විවාළහ. "භවත් ප්‍රව්‍රජිතයන් වහන්ස, මා විසින් ඒ පරිබ්‍රාජිකාවන් ගෙනයන කල්හි ඔබට කොපඉපදුනේද" යි විවාළේය. මහාසත්ත්වයන්වහන්සේ කියන්නාහු:-

160 "උපපජ්ජි මේ තමුඤ්ඤිඤ්ඤ න මේ මුඤ්ඤිඤ්ඤ ජීවතො,
රජංව විපුලා වුට්ඨි ඛිපමෙව නිවාරයිං" යි කියා

මහරජ්ජුරුවෙනි, මට වරක්උපත, නවුත් කායවාග් විකාර ඉපදීම් වශයෙන් ඒ මුදා නොහළෙමි. වැලිත් මාගේ ශරීරයෙන් නොම්දුනේය. ග්‍රීෂ්ම ඍතුහුගේ ජෙෂ්ඨමාසයෙහි උපන් රජස නොකල් මහවැස්සෙන් නිවායන්නා සේ ම වහාම සංසිඳුවා

ලම්පි කිඤ්ඤ. රජ්ජුරුවෝ ඒ අසා "කිමෙක්ද මොහු කොපඨ සදහාම් කියත්ද, නැතහොත් වෙනත් ශිල්පයක් සදහාදැ"යි සිතා නැවත, ච්චාරත්තෝ—

151 "කිනෙත උපපජ්ජී තෙ මුඤ්ච කිනෙත මුඤ්චිතෙ ජීවතෙ
රජංච විපුලා වුඩ්ඪි සතමං තං නිවාරයිති"

යනමේ ගාථාව කියා (ඔබවහන්සේට කුමක් උපතේද, කුමක් තොමුදා හැරිද, ධූලිරැසක් වැසි වැස නිවත්තාක්මෙන් කුමක් සංසිදුවාපිදූයි) ච්චාළහ.

ඉක්බිති නානාප්‍රකාරයෙන් ක්‍රොධයෙහි ආදීනව ප්‍රකාශ කරන්නාවූ මහා බොධිසත්ත්වයෝ—

152 යම්හි ජාතෙ න පසසති අජාතෙ සාධු පසසති,
සො මේ උපපජ්ජී තෙ මුඤ්ච කොධො දුමෙමධ ගොචරො

153 යෙන ජාතෙන නන්දන්ති අමිත්තා දුක්ඛමෙසිතො,
සො මේ උපපජ්ජී තෙ මුඤ්ච කොධො දුමෙමධගොචරො.

154 යස්මිං ච ජායමානස්මිං සදත්ථං නාවබුජ්ඣති,
සො මේ උපපජ්ජී තෙ මුඤ්ච කොධො දුමෙමධගොචරෙ.

155 යෙනාභිභූතො කුසලංජ හාති පරක්කරෙ විපුලංචාපි අත්ථං,
සහිම්සෙතො බලවාපමද්දි කොධො මහාරාජ තමේ අමුඤ්චථ.

156 කට්ඨස්මිං මඤ්ඤමානස්මිං පාවකො නාම ජායති,
තමෙව කට්ඨං දහති යස්මා සො ජායති ගිනි.

157 එවං මන්දස්ස පොසස්ස බාලස්ස අවිජානතො,
සාරම්භා ජායතෙ කොධො සවිත්තෙනෙව ඩය්හති.

158 අග්ගිව තිණකට්ඨස්මිං කොධො යස්ස පවඩ්ඪති,
නිධියති තස්ස යසො කාලපක්ඛව චන්දිමා.

159 අනික්ඛො ධම්මෙනුව කොධො යස්සුපසම්මති,
ආපුරති තස්ස යසො සුක්කපක්ඛව චන්දිමා.

මේ ගථාවන්හි අභිප්‍රාය නම්:—යමක් නමා සතන්හිඋපන්කල්හි අත්වැඩ පවා නොදකිද, පරවැඩ ගැන කියනුම කවරේද, නොඋපන්කල්හි අත්වැඩ පරවැඩ දෙවැඩම මනාකොට

දනීද, එසේම යමක් උපන්නාවූ යමක් කරණකොටගෙන දුක් කැමැත්නාවූ සතුරෝ සතුටුවන්නාහුද, එසේම යමක් උපදනා කල්හි සදඵිය (තමන්ගේ වැඩම) නොහැඟේද, දුමේධගොවරවූ ඒ ක්‍රොධය මා සතන්හි උපන්නේය. නමුත් මුදුනොහැර සංසිදුවීමි.

මහරජ්ජුරුවෙනි, යමකින් මැඩුනාවූ සත්ත්වතෙම කුසල දුරුකෙරේද, බොහෝ අර්ථයන් විනාශ කරන්නේද, භයඋපදවන්නාවූ මහත්වූ කෙලෙස් සෙනගින් යුක්තවූ සත්ත්වයන් මඩින්නාවූ ඒ ක්‍රොධය මා විසින් දමන ලද්දේය, දඩුදෙකක් එකට ගැටුකල ගිනි වැටෙයි, වැටුනු ගින්න නැවත ඒ දඩුදෙකම දවාපියාද, එසේම අඤ්ඤබාලවූ නුවණමද පුරුෂයාහට එකටඑක කිරීම සභාවකොට ඇති සාරම්භයෙන් (දඩුදෙකක් එකට ගැටීම මෙන්) ක්‍රොධය උපදී. ඒ අඤ්ඤතෙම ඒ ක්‍රොධයෙන්ම (දඩුදෙකක ගින්නෙන් දවන්නාක්මෙන්) දවයි. තණ දඩු ආදිය ඇවිලගත් ගින්නක්මෙන් යමක්හුගේ ක්‍රොධය වැඩේද, කෘෂ්ණපක්ෂයෙහි චන්ද්‍රයාමෙන් ඔහුගේ යසස පිරිහෙයි. යමක්හුගේ ක්‍රොධය දරතැන්නාවූ ගින්නක්මෙන් සංසිඳිමට ඇත්තේද, ඔහුගේ යසස ශුක්ල පක්ෂයෙහි චන්ද්‍රයාමෙන් පිරීමට යන්නේයයි, ධම්මදෙශනා කළහ.

රජ්ජුරුවෝ මහාසත්ත්වයන්ගේ ධම්කථාව අසා මහාපුරුෂයන්ද පරිබ්‍රාජිකාවන්ද ක්ෂමා කොට "නුඹවහන්සේලා පැවිදි සුව විඳිමින් මේ උයනෙහිම වසනු මැනව, මම නුඹවහන්සේලාට ධාර්මිකවූ රක්ෂාවරණගොපනය කරන්නෙමි" යි කියා වැඳ ගියහ. ඔවුන් දෙදෙනා එහිම වාසය කළාහුය. මැතදී පරිබ්‍රාජිකාවෝ කාලක්‍රියා කළහ. බොධිසත්ත්වයන් වහන්සේ හිමාලය වනයට වැද ධ්‍යානාභිඥාවන් උපදවා ආයුකෙළවර බ්‍රහ්මලොක පරායණවූහ.

එකල පරිබ්‍රාජිකාවෝ නම් රාහුල මාතාවෝය, රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය, චූල්ලබෝධි පරිබ්‍රාජකයෝනම් ලොකඤ්ඤාම්වූ බුදුරජාණන්වහන්සේය, උන්වහන්සේගේ අවශෙෂ පාරමී ධර්මයෝ මෙහිදු සුදුසු පරිදි නිදහරණය කට යුත්තාහ.

ඒ එසේමය, මහත් ඉසුරු රැසද, මහත් කැපිරිවරිද හැර පියා මහාභිනිෂ්ක්‍රමණයසේ ගෙන් නික්මීමද, එසේ නික්ම පැවිදිවූ බොහෝ ජනයා විසින් සම්මත වූවිහුගේද පරමාලෙඩජනා යෙන් කුලයා කෙරෙහිද, ගණයාකෙරෙහිද නොඇලීමය, අත්‍යන්ත යෙන්ම ලාභ සත්කාරය පිළිකුල් කිරීමෙන් පරම විවෙකාභිරතියෑ, ඉතාබලවත්වූ අභිසල්ලෙඛ වත්තිය, (ඉතාම සැහැල්ලු පැවතීමද) සිල්වත්වූ යහපත් සවභාව ඇත්තාවූ වතයට ගියාවූ පරිබ්‍රාජිකාවන් තමන් අතිමුඛයෙන් බලාත්කාරයෙන් පරාමර්ශිතය කරන කල්හි ශීලපාරමිතාව ආවර්ජනා කොට විකාරයට නොපැමිණීමය, කළාවූ අපරාධ ඇති රජ්ජුරුවන් තමන් සමීපයට පැමිණිකල්හි ඉතසිත් එලවා මෙලෝ පරලෝ වැඩිත් අනුශාසනා කිරීමය, යන මේ ආදී මහාපුරුෂයන්ගේ ගුණානුභාවයෝ මෙහිලා දත යුත්තාහුය.

"එවං අජ්ජරියා එතෙ-පෙ-ධම්මස්ස අනුධම්මතා" යනු එහෙයින් කියනලදි පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි දෙවන කඤ්චිනාග වර්ගයෙහි සිවුවන චූලබෝධි චරිතය නිමි.

(X) V මහිසරාජ චරිතය.

තවද මේ පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි දෙවන කඤ්චිනාග වර්ගයෙහි පස්වන මහිසරාජ චරිතය කිසේය යත්,

පුනාපරං යදා හොමි මහිසෝ පවනාචරිකෝ,
පවඩ්ඪකායෝ බලවා මහන්තෙනා ගිමදස්සනෝ. (184)

යනුවෙන් කැවත අනිකුදු චරිතයක් කියමි. කෙද අසව. යම් කලෙක මම මහවෙතෙහි හැසිරෙන්නාවූ (යොවුන් වියට පැමිණීමෙන් හා අහපසඟ තරසෙයිනුත් අභිශයින්) වැඩුනු ශරීර ඇත්තාවූ, මහත් බලඇති ඇත්කදක් පමණ මහත් ශරීර

ඇති වතමහිස ජාති ඇති බැවින් සවභාවය තොදන්නවුන්ට භය උපදවන්නාවූ දැකුම් ඇත්තාවූ වසම්මෙක් විමිද, එහි මේ පිළිවෙළ කථාවයි.

එකල්හි අප මහා බොධිසත්ත්වයන් වහන්සේ හිමාලය වන ප්‍රදේශයෙහි මහිසයොනියෙහි උපන් සේක. උන්වහන්සේ විශාලත්ව ඇත්පැටවකු පමණ මහත් ශරීරයක් ඇතිව පරිතපාදය පරිත කුක්ෂි ගිරිදුගී වතලැහැබ් ආදියෙහි හැසිරෙන සේක් සුවපහසු ඇති එක් මහත් රුක්මුලක් දැක ගොදුරු ගෙන දහවල් එහි වසනසේක.

ඉක්බිති එක්තරා ලොල් වදුරෙක් ගසින් බැස මහබෝස තාණන් වහන්සේගේ පිටට නැග මල මූ කරන්නේය. අං අල්ලා එල්වෙන්නේය, තගුට අල්වා ගෙන උන්සිල්ලාවක් මෙන් පදිමින් කෙළින්නේය, බොධිසත්ත්වයන් වහන්සේ ක්ෂාන්ති මෛත්‍රී සම්පදාවෙන් ඔහුගේ ඒ අනාචාරය මෙතෙහි නොකළ සේක. වදුරුතෙම නැවත නැවතත් එසේම කෙරෙයි. එහෙයින් වදාරන ලදී:-

"පබ්භාරෙ වනදුග්ගෙ ච රුක්ඛමූලෙ දකාසයෙ,
හොතෙසභ ඨානං මහිසානං කොව් කොව් තඤ් තඤි (185)

විචරනෙනා බ්‍රහාරඤ්ඤ ඨානා අද්දස හද්දකං,
තණ්ඨානං උපගන්ත්වාන තිට්ඨාමි ච සයාමි ච. (186)

අථෙසභ කපිමාගන්ත්වා පාපෙ අනරියෙ ලහු,
බන්ධි නලාටෙ හමුකෙ මුත්තෙති ඔහණෙති තං (187)

සකිම්පි දිවසං දුතියං තතියං චතුත්ථම්පිච,
දූසෙති මං සබ්බකාලං තෙන හොමි උපද්දුතෙ" සි (188)

එකල්හි ඒ වෘක්ෂයෙහි අධිෂ්ඨිතවූ දෙවතාවා වදුරා විසින් බාධිතවූ මෘදුක, කියන්නේ "මහිස රජ්ජුරුවෙනි, මේ දුෂ්ට වදුරා ගේ අවඥ ඉවසා ඉන්නේ ඇයිද, හිතවූ ලාමකවූ මේ වදුරා අහින් ඇත පයින් මිරිකා වනසව" යි කී. ඔහු මෙසේ කී කල්හි මම ඔහුට මතු දක්වන කාරණය කිම්; දෙවතාවාණෙනි, කෙලෙස් අසුචි බැහැරීමෙන් හා ශුචි ජාතිකවූ සත්පුරුෂයන් විසින් අතිශයින්

පිළිකුල් කටයුතු බැවින්ද ඉතා දුගඳ වැහෙන්නෙත් කුණපයක් හා සමානවූ වැද්දන් ආදී නීච පුරුෂයන්ගේ සංහාවයක් හෙයින් අනාඪවූ අකුශලයෙන් ති මා ඇහ තවරන්නේ මක්නිසාදැයි කියායි; එහෙයින් වදළහ:-

"මමං උපද්දුතං දිස්වා යක්ඛෝ මං ඉදමබ්‍රවි,
නාඝහෙතුං ඡවං පාපං ඔඛිගහි ච බුරෙහි ච. (189)

එවං වුත්තෙ තදා යක්ඛෙ අහං තං ඉදමබ්‍රවිං,
කිං නු මක්ඛෙසි කුණපෙන පාපෙන අනරියෙන මං. (190)

දැන් ඒ පාපකර්මයෙහි ආදීනව ප්‍රකාශ කරනසේක් මේ ගාථාවලින් කියත්;

සදිසං තස්ස පකුපෙජ්ඣං තතෝ හීනතරෝ භවෙ,
සීලංච මෙ පහිජ්ජෙය්‍යං විඤ්ඤූනුච ගරහෙය්‍යුමං. (191)

භිළිතා ජීවිතා වාපි පරිසුඛෙන මතං වරං,
ඛ්‍යාහං ජීවිතහෙතූපි කාහාමි පරහෙඨනං. (192)

යනුවෙන් අප මහා බොධිසත්ත්වයෝ "පින්වත් දෙවතා වෙනි, ඉදින් මම ඒ වදුරාට කිපෙන්නෙම් නම් උඉටත් වඩා ඉතා ලාමකයෙක් වන්නෙම්, මාගේ ශීලපාරමිතාවත් බිඳෙන්නේය; පණ්ඩිතවූ දිව්‍යමනුෂ්‍යයෝද "භවත්නි, බැලුවමැනව, තෙල බෝසත් බොධිපර්‍යේෂණයෙහි හැසිරෙමින් මෙබඳු පවක් කෙළේයයි" මට නිඳා කරන්නාහුය, පණ්ඩිතයන් විසින් ගරහිතවූ ජීවිතයට වඩා පිරිසිදු සිලයෙන් යෙදී මියයාම උතුම්; මෙසේ දනිමින් මම මාගේ ජීවිතය හෙතුකොට ගෙන අනුන් පෙළීම කරමට කරන්නෙම්ද, පරපීඩාව කිරීමෙන් කරුණක් නැතැයි කිහ;

නැවතද බොධිසත්ත්වයන් වහන්සේ මේ වදුරුතෙමේ වනාහි අනික් මහිෂයන්ද මා මෙන් සිතා ඔවුන් කෙරෙහිත් මෙසේ අනාචාර කරන්නේය, එවිට ඔහු මූ නසන්නාහ; මොහුගේ ඒ මරණය මගේ දුකින් මිදීමත් ප්‍රාණවධයෙන් මිදීමත් වන්නේයයි කිහ; එහෙයින් වදුරුතෙදී:-

මමෙවායං මඤ්ඤමානෝ අඤ්ඤඤ්ඤපෙවං කරිසසති,
තෙව තජ්ජ වධිසසනති සා මෙ ඉතනි භවිසසති. (193)

ගිනමජඣිමඋකකටෙඨ සහනෙනා අවමානිතං,
එවං ලහති සපඤ්ඤඤ්ඤ, මනසා යථාපඤ්ඤිතං. (194)

යනුවෙනුදු පණ්ඩිතතෙම හීන මධ්‍යමොත්කෘෂ්ට ජනයන් විසින් කරන ලද අවමානය විහාගයක් නොකොට සෘත්ති මෛත්‍රීකරුණා එළඹවා ඉවසමින් සිලාදී පාරමීන් වඩා සිතින් කැමතිවූ පරිදි බුදුබව ලබයි. මෙසේ අප මහසත්ත්‍ව තමන් අද හස දක්වමින් දෙවතාවාට දහම් දෙසූසේක.

ඉක්බිති බොධිසත්ත්වයන්වහන්සේ කිප දිනකින් ඔබ්බට ගියහ. එකල අනික් සැඩම්මෙක් එහි ගොස් විසූසේය. දුෂ්ට වඳුරුතෙම මේත් ඒ මිමාමයයි සිතා ඔහු පිටට පැන කීසෙයින්ම අනාචාර කෙළේය. ඉක්බිති ඒ සැඩ මහිසතෙම හටගත් ක්‍රොධ ඇත්තේ ඒ වඳුරා බිමහෙලාගෙන අගින් ඇන ළය පලා පයින් මිරිකා සුනු විසුනු කෙළේය.

එකල්හි සිල්වත් මිරජ්ජුරුවෝ තම් ලොකඤ්ඤාමින්වහන්සේය. මෙහිද උත්වහන්සේගේ අවශෙෂ පාරමීහු යටකියන ලද ක්‍රමයෙන්ම සුදුසු පරිදිදෙන් නිධාරණය කටයුත්තාහුය. ඒ එසේමය. හසනිනාග, කුරිදත්ත, චමෙපය්‍යනාගරාජාදීන්ගේ චරිතයන්හි මෙන් මෙහි මහාසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ නිධාරණය කටයුත්තාහුය.

පරමාඤ්ඤදීපනීතම් චරියාපිටක අටුවාවෙහි
දෙවන හසනිනාග වගීයෙහි පස්වන මහිසරාජචරිතය නිමි.

———×———

(X) VI රුරුමිගරාජ චරිතය

———×———

තවද මේ පරමාඤ්ඤදීපනී නම් චරියාපිටක අටුවාවෙහි දෙවන හසනිනාග වගීයෙහි සවන රුරුමිගරාජ චරිතය කිසේය යත්:-

පුනා'පරං යදා හොමි සුතත්තකනකසන්නිභො,
මිගරාජා රුරුනාම පරමසීලසමාහිතො. (195)

යනුවෙන් නැවත අනික් චරිතයක් කියන්නෙමි. හෙද අසව. යම්කලෙක්හි මම මතාව තවා ඔප්නැගූ රත්පටකට බඳු

පැහැ ඇති පිරිසිදු සිලයෙන් හා මහාකොට පිහිටුවූ සිතින් යුක්තවූ රුරු නම් මිගරාජයෙක් වීමිද, එහි පිළිවෙළ කථාව කෙසේදයත්:

එකල්හි අප මහා බොධිසත්ත්වයන් වහන්සේ රුරු මෘග යෝනියෙහි උපත්සේක. උන්වහන්සේගේ ඇඟ පැහැ මහා කොට තවා ඔප්නැගූ රත්පටක් බඳුවිය, අත්පා ලාරසයෙන් පිරි කම් කළාක් වැනිය. වල්ගය සෙමර මූවකුගේ වල්ගයක් වැනිය, අං රිදී දමක් වැනිය, ඇස් සහල මහාකොට මදිකලද මිණි ගුළි දෙකක් වැනිය, මුඛය එල්වා තබතලද රත්පලස් වටක් වැනිය. උන්වහන්සේ ජන සංසර්ගය හැර විවෙක වාසයෙන් වසනු කැමතිව පිරිවර හැරපියා සුපිහිරි සල්ගසින් මුසුවූ සිත් කලු මහවනයක හුදකලාවම වෙසෙති. එකෙසින් වදාරතලදි.

"රමණීයෙ පදෙසෙ රමණීයෙ විවිත්තෙ අමනුස්සකෙ,
තත්ථ වාසං උපගච්ඡිං හඬ්ඩාකුලෙ මනොරමෙ" (196)

එකල්හි බරණැස් නුවරවාසි එක්තරා සිටුකෙනෙක් වතාහි තමන්ගේ පුත්‍රයාහට "මාගේ පුතණුවෝ ශිල්ප ඉගෙන ගන්නාහු නම් වෙහෙසට පැමිණෙන්නාහ"යි කියි ශිල්පයක් නූගැන්නූහ. සිටුපුත් නැටුම් ගැයුම් වැයුම් කැම් බීම් ආදියට වැඩි යමක් දැන නොගත්තේමය; මවුපියෝ වැඩිවිය පැමිණි ඔහුට සුදුසු දැරියක් ගෙනවුත් ධනය පාවාදී කලක්‍රියා කළාහුය, හෙතෙම මවුපියන්ගේ අවැමෙන් සත්‍රිධූනී සුරාධූනීන්දින් විසින් පිරිවරතලද්දේ තත්වැදූරුම් ව්‍යසන මුඛයෙන් සියලු වසනු විනාශකොටපියා ඒ ඒ තැනින් ණයගෙන ඒ දීගතකොගි ණය හිමියන් විසින් චෝදනා කරනුලබන්නේ "මාගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනද මම මේ ආත්මභාවයෙන් අනිකකුමෙන් වීමි. එහෙයින් මට මියැදීම යහපතැයි සිතා ණය හිමියන්ට මෙසේ කිය, "තොපගේ ණයපත් අරගන එව්, ගං ඉවුරෙහි නිධාන කරතලද මාගේ කුලසන්තක වසතුඇත, ඒවා තොපට දෙන්නෙමි"යි. ඒ අසා ඔවුහු උහු සමග ගියාහුය. හෙතෙම "මේ ධනය මෙතැන ධනය"යි නිධාන තුබූ තැන දක්වන්නාක්හු මෙන් "මෙසේ මෙයින් මොවුන්ගේ ණයින් නිදහස් වන්නෙමි"යි පලාගොස් වණ්ඩස්‍රොතස් ඇති ගඩගාවෙහි හුනුයේය. හෙතෙම ප්‍රතිස්‍රොතයෙන් ඇදගත යනකල බැගැහඩින් හැඩුයේය; එහෙයින් වදාරතලදී.

අථ උපරිගඞ්ගාය ඔනිඤ්ඤගි පරිපිළිතා,
පුරිසා ගඞ්ගාය පපති ජීවාමි වා මරාමි වා (197)

රතනිඤ්ඤිවං සෝ ගඞ්ගාය වුය්හමානා මහාදඤ්ඤ,
රවඤ්ඤනා කරුණං රාවං මඤ්ඤාගඞ්ගාය ගච්ඡති"සි. (198)

හෙතෙම රෑදුවල් දෙක්හි සැඩපහරින් ඇදගෙන යන තැතැත්තේ මරුමුවට නොපැමිණ මරණ භයින් භයපත්ව බැඟෑ ඝඬින් ඝඩමින් ගහමැද මහාජලස්කන්ධයෙන් යන්නේය.

ඉක්බිති අපගේ මහාපුරුෂයාණෝ අඩරාත්‍රි සමයෙහි ඔහුගේ බැඟෑ අඩ අසා මනුෂ්‍යයකුගේ ශබ්දයෙක් ඇසෙයි; මා මෙහි ජීවත්ව සිටියදී හෙතෙම දියෙහි නොමියේවා, ඔහුට ජීවිත දානය දෙන්නෙමියි සිතා වසන වනලැහැබින් නැගිට ගංඉවුරට ගොස් එම්බා පුරුෂය, නොබව, නොපට දිවිදෙමි" යි අස්වසා සැඩපහර සිඳිමින් ගොස් ඔහු පිට හිඳුවාගෙන ගං තෙරට පමුණුවා තමන් වසන තැනට නෙත ගොස් විඩා දුරුකරවා පලාවැල දී දෙතුන් දිනක් ගියකල ඔහුට මෙසේ කිහ. එම්බාපුරුෂය, මම නොප බරණැස් නුවරට යන්නාවූ මාගියට පවුණුවන්නෙමි. නොප ගොස් අසවල්තැන රන්මුවෙක් වසන්නේයයි කිසිවකුහටත් නොකියව" යි. හෙතෙම "යහපත සවාමිනි" යි කියා පිළිනන්නේය. උන්වහන්සේ ඔහු පිටහිඳුවා ගෙන බරණැස් නුවරට යන මහ තබා නැවැත්තේය. එහෙයින් වදුරතලදී.

තස්සාහං සද්දං සුත්වාන කාරුඤ්ඤං පටිලද්ධතා,
ගඞ්ගාය තිත්‍රෙ ඨත්වාන අපුච්ඡිං කොසි භවං නරෝ. (199)

සෝ මෙ පුට්ඨෝ ව්‍යාකාසි අත්තානෙනා කාරණං තදා,
ඔනිඤ්ඤගි ගිතෝ තස්මිතා පඤ්ඤෙනාහං මහානදිං (200)

තස්ස ඤත්වාන කාරුඤ්ඤං වජිත්වා මම ජීවිතං,
පවිසිත්වා නිහරිං තස්ස අඞ්ගාරම්හි රතතියා (201)

අස්සත්තනඤ්ඤාලමඤ්ඤස්ස තස්සාහං ඉදමබ්‍රුවිං,
එකං තං වරං යාචාමි මා මං ඤඤ්ඤෙ පා වද" සි (202)

ඉක්බිති ඒ පුරුෂයා බරණැස් නුවරට වත් දවස්ම රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව "දෙවඟන් වහන්ස, රත්මුවෙකු මට බණ කියන්නහු සිහිනෙන් දිටිමි. මේ වනාහි සැබෑ සිතයක, ඒකාන්තයෙන් හේ ඇත්තේය. එහෙයින් රත්මුවා හෙත් බණක් අසනු කැමැත්තෙමි. ඉදින් හේ ලදමෝතම් මා දිවි ඇත. නැතිනම් මා දිවි නැතැ" යි කිවුය. රජ්ජුරුවෝ උන් අස්වසා "ඉදින් මිනිස්ලොව ඇත්නම් ලබන්නෙහිය" යි කියා බ්‍රාහ්මණයන් කැඳවා "මනුලොව රත්මුවෝ උපදිද්දැ"යි විචාළහ. ඔව්හු "එසේය දෙවඟන්වහන්ස, උපදිති" යි කිවාහුය. රජ්ජුරුවෝ ඒ අසා දහසක් බැඳි පියල්ලක් රත්කරඬුවෙක දමා ඒ ඇත්කඳ පිට තංවා" යමෙක් රත්මුවකු එසත තැනක් කියන්නේනම් ඕහට ඇතු සමඟ මේ වස්තුව දෙන්නෙමි, මන්තෙහිද යමෙක් සියලු මුවන්ට උතුම්වූ රත්වන් මුවන් වසනතැන් මට කියන්නේනම් ගම්වරයක් හා සවිහරණයෙන් සැරසුනාවූ සත්‍රින්ද ඕහට දෙමි"යි,

156 තස්ස ගාමවරං දම්මි භාරියං සමලඞ්කතා,
කෝ මේ තං මිගමක්ඛාමි මිගානං මිගමුත්තමං.

යන මේ ගාථාව රන්පට ලියවා මුළුනුවර කියවූහ. ඉක්බිති සිවුපුත්තෙම ඔවුන් විසින් කියනු ලබන්නාවූ ඒ ගාථාව අසා රාජපුරුෂයන් සම්පයට ගොස් "මම රජ්ජුරුවන්ට එබඳු මුවකු වසතතැන් කියන්නෙමි. මා රජ්ජුරුවන්ට දක්වනු මැනව"යි කියේය. රාජපුරුෂයෝ ඔහු රජ්ජුරුවන් සම්පයට කැඳවා ගෙන ගොස් ඒ කාරණය කිවාහුය. රජ්ජුරුවෝ ද "භවත, දුටුයේ සැබෑද" යි විචාළෝය. සැබව දෙවඟන් වහන්ස, මා සමඟ එතසේක්වා, මම ඔහු දක්වන්නෙමි" යි කියේය. රජ්ජුරුවෝ ඔහු මාගී දෙශකයකොට ගෙන මහත් පිරිවරින් එතැනට ගොස් මිත්‍රද්‍රොහී ඒ පුරුෂයා විසින් දක්වන ලද ඒ වනලැහැබ සියාරා ආවුධ ගත් අත් ඇති පුරුෂයන් ලවා පිරිවරවා "ඔල්වරහැර ගනත්ව" යි කිහ. කියා තුමූ කිපදෙනෙකුත් සමඟ එකත් පසක සිටියාහ. ඒ මිත්‍රද්‍රොහී පුරුෂතෙම නුදුරු තැනක සිටියේය. මහාසත්ත්වඟන්වහන්සේ ඒ හඬ අසා මහත් බලසෙනඟක ශබ්දයක; ඒකාන්තයෙන් මට මේ භය මා විසින් ගැලවූ පුරුෂයා නිසා උපන්නේයහි දැන තැගිට සියලු පිරිස බලා "රජ්ජුරුවන් සිටි තැනින්ම මට වැඩක් වන්නේය"යි රජ්ජුරුවන්ට අභිවුඩව ගියහ. රජ්ජුරුවෝ තමන්කරා මුවරදුන් එන්නා දැක "මේ මුවරදහු බල ඇතියහ. මහාවෙගයෙන්

මැඩගෙන මාඝරා එන්නේය"යි දුන්න හයා හය ගන්වා" ඉදිත් පලාගේ තම් විද දුම්ලකොව අල්වාගන්නෙමි"යි බොධි සත්ත්වයන්ට අභිමුඛ වූයේය. එවිට මහාසත්ත්වයන්වහන්සේ:—

162 ආගමෙහි මහාරාජ මා මේ විජ්ඣි රථෙසභ,
කොඤ්ච තෙ ඉධ මක්ඛාසි එතෙසො තිට්ඨති මිගොති"

යනුවෙන් "මහරජ්ජුරුවෙනි, මෙසේ එනු මැනව. තරොත් තමයෙනි, මා කොවිද මැනව; මෙතැන මේ මුවා සිටී" යයි නුබවහන්සේට කියේ කවරෙක්ද"යි කිහ. රජ්ජුරුවෝ උත් වහන්සේගේ තෙපුළෙහි බැඳී දුන්න අකුලා පියා ගෞරවයෙන් සිටියාහ. මහා සත්ත්වයන්වහන්සේද රජ්ජුරුවන් කරා එළඹ මියුරු පිළිසඳර කළහ. මහජනයාද සිය අවි දමා අවුත් රජ්ජුරුවන් පිරිවරා ගත්හ එහෙයින් වදුරන ලදි:—

"නගරං ගන්ධාන ආවිකඛි පුවජිතො බනඅහතුකො,
රාජානං සො අඅහඛාන උපඅංජි මමනතිකං යි" (203)

නැවත මහා සත්ත්වයන්වහන්සේ රන්කිකිණි දැලක් සලන් නාක් වැනි මිහිරි හඬින් රජ්ජුරුවන්ගෙන් මෙහි "මේ මුවා සිටින්නේයයි නුබවහන්සේට කීවෝ කවුරුදු"යි විවාළහ. එකෙණෙහි ඒ පවිටු පුරුෂතෙම මදක් ඉවත්වැ ඇසෙන පමණ තන්හි සිටියේය. රජ්ජුරුවෝ "මොහු විසින් මට තොප දක්වන ලද්දේයයි ඒ පුහුලහු දෙසට අත දිගු කළහ. ඉක්බිති බොධි සත්ත්වයන්වහන්සේ:—

163 "සචවං කිරෙව මාඝංසු තරා එකච්චියා ඉධ,
කටඨං විප්ලා විතං සෙයේ‍යා තඤ්ඤෙවෙකච්චියො තරො

යනුවෙන් "පුරාතනයෙහි නුවණැත්තෝ සැබවසක් (ප්‍රවාද වාක්‍යයක්) මෙසේ කිහ. කෙසේදයත්:-මේ ලොකයෙහි මිත්‍ර ද්‍රොහී පුද්ගලයා දිගයහි හිලී මිනමින් සිටියදීත් ගොඩතැගීම යහපත් නොවන්නේය. දියෙහි යන දඬු ගොඩ තැගීම යහපත් වන්නේය, මක්නිසාදයත්:-මිත්‍ර ද්‍රොහියෝ වනාහි සත්ත්වයන් විනාශයට පමුණුවන්නෝය. එසේ හෙයින් ඔහුට වඩා දියෙහි යන දඬුකඩ යහපත්ය"යි කිහ.

ඒ අසා උපත් සංවේග ඇති රජ්ජුරුවෝ කිමෙක්ද රුරුමිග රජ්ජුරුවෙනි, තෙපි මූවන්ට හෝ පක්ෂින්ට හෝ මිනිසුන්ට හිතු කරහුද, මනුෂ්‍ය වචනයෙන් කියන්නාවූ ඔබ බස අසා මට මහත්ඛය උපදියි, යන අර්ථය දක්වන්නාහු

164 කිඤ්හු රුරු ගරහසි මිගානං
කිං පක්ඛිනං කිං පන මනුස්සානං,
භයං හි මං විඳති තප්පරූපං
සුත්වාන තං මානුසිං භාසමානං.

යන ගාථාව කිහ.

ඉක්බිති මහා පුරුෂයන්වහන්සේ "මහ රජ්ජුරුවෙනි, මම මූවන්ට හෝ පක්ෂින්ට හිතු නො කරමි. මනුෂ්‍යයන්ට ම ගරහමි"යි දක්වන්නාහු

165 සමූඛරිං වහතෙ වුයහමානං
මහොදකෙ සලිලෙ සීඝසොතෙ,
තතො නිදානං භයමාගතං මම
දුක්ඛා හවෙ රාජ අසබ්භිසඞ්ගමෝ, යි

යනුවෙන් මහරජ්ජුරුවෙනි, මේ පුරුෂයා හුනු හුනුවන් ඇදගත්ට සමර්ථවූ මහා ජලස්කන්ධයක් ඇති ගඞ්ගාවගේ වණ්ඩවූ ජලප්‍රවාහයෙන් ඇදගෙන යන්නහු ගොඩලිමි. එහෙයින් මට මේ භය උපත. අසත්පුරුෂයන් හා විසීම දුක්වන්නේයයි කිහ. රජ්ජුරුවෝ ඒ අසා ඔහට කිපී මේතෙම එසේ තමහට බොහෝ උපකාර ඇත්තවුන්ගේ ගුණ නොදනියි (ඔවුන්ට) දුක් උපදවයි. විද මොහුගේ දිවි තොරකරමි"යි දුනු දියෙහි සැරය හිදවූහ. එහෙයින් වදරතලදි:—

"යාචිතා කාරණං සබ්බං රඤ්ඤා ආරොචිතං මයා,
රාජා සුත්වාන වචනං උසුං තස්ස පකඩපයි;
ඉදඤව ඝාතයිස්සාමි ඉතෙනදුගිංඅනාගියං" යි (204)

ඉක්බිති මහාසත්ත්වයන් වහන්සේ "මේ බාලතෙමේ මා නිසා නොකැසේව"යි සිතා "මහරජ්ජුරුවෙනි, වධකිරීම තම් බාලයන්ට හෝ පණ්ඩිතයන්ටවේවා, පණ්ඩිතයන් විසින් මැනව"යි ප්‍රශංසා නොකරතලද්දේය. එකාන්තයෙන් ගරහනලද්දේමය එහෙයින් මොහු නොකැසුව මැනව. හේ රිසිසේ නැගියේවා, නුබබහත්සේ විසින් ඔහුට "යමක්දෙමි"යි කියා ප්‍රතිඥවක්

කරන ලද්දේ විසම් එයද නොතසා දුන මැනව"යි කිහ. මේද ඔබ කැමති දෑ කරම්. සෙසු වස්තූන් තබා ආත්මයද දුබවහන්සේට දෙමියි කිහ. එතෙයින් වදරතලදි:-

"තමහං අනුරකඛනෙනා නිම්මිනිං මම අත්තනො,
නිට්ඨතෙසො මහාරාජ කාමකාරො භවාම් තෙ,සි (205)

දැන් බොධිසත්ත්වයන් වහන්සේ ආත්ම පරිත්‍යාග කළ කාරණය දක්වනු සඳහා

අනුරකඛිං මම සීලං නාරකඛිං මම ජීවිතං,
සීලවාහි තදා ආසිං බොධියාසෙව කාරණා. (206)

යනු කිහ. එහි අඹිය තම්" එකල්හි මා නිසා ඒ මිත්‍ර ද්‍රෝහී පුරුෂයා ජීවිතයෙන් තොරකරනු කැමතිවූ කල්හි මම මගේ ආත්මය රජ්ජුරුවන්ට පරිත්‍යාග කරමින් ශීලපාරමිතාවම පිරුයෙමි. මාගේ ජීවිතය තොරුකිමි. මෙසේ තමන්ගේ ජීවිතයෙහි ආලය කැර සිල්වත්ව විසීම සම්‍යක් සම්බොධියගේ ප්‍රතිලාභය පිණිස ම ය යනුයි.

ඉක්බිති රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් විසින් තමන්ගේ ජීවිත පරිත්‍යාග කොට ඒ පාප පුරුෂයා මරණින් නිදහස් කළ කල්හි සතුටුයින් ඇතිව "භවත, තෝ ය්ව, මුවරදුන්ගේ අනුග්‍රහයෙන් මරණයෙන් මිදුනෙහිය"ය යි කියා ප්‍රතිඥවූ පරිද්දෙන් ඕහට වස්තුව දෙවූහ. මහා සත්ත්වයන් වහන්සේටද කැමැති කැමැති පරිද්දෙන් වරදුන්හ. ඉක්බිති උත්වහන්සේ නුවරට ගෙනගොස් නුවරත් බෝසතාණන් වහන්සේත් සරහා බිසවුන්ට බණ කිය වූහ. උත්වහන්සේ බිසවුන් ආදිකොටඇති රජ්ජුරුවන්ට හා රාජ පරිෂදටද මධුරවූ මනුෂ්‍යභාෂාවෙන් ධම්දෙශනාකොට රජ්ජුරුවන්ට දශරාජ ධම්යෙන් අවවාද දී මහජනයාටද අනුශාසනය කළසේක. යළි උත්වහන්සේ වනයට වැද මෘග සමූහයා විසින් පිරිවරන ලද්දේ වාසය කළහ. රජ්ජුරුවෝ මහා සත්ත්වයන්ගේ අවවාදයෙහි සිට සියළු සත්ත්වයන්ට අභය දී දානාදී පින්කම් කොට සුගති පරායණ වූහ.

එකල්හි රජ්ජුරුවෝ තම් ආනන්ද ස්ථවිරයෝය. රුරුමෘග රාජයාණෝ තම් ලෝකඥාම්වූ බුදුරජාණන් වහන්සේය. එකල්හි සිටුපුත්‍රයානම් දෙවදත්තස්ථවිරයෝය. මෙහිද යට කියන ලදක්‍රමයෙන්ම උත්වහන්සේගේ අවශෙෂ පාරමිහුද සුදුසු පරිද්දෙන් නිධාරණය කටයුත්තාහුය.

ඒ එසේමය: විවේකය කැමැති බැවින් ජනසංසර්ගය නොක මැතිව මුවපොල්ලන් හැර ක්ෂුද්‍රසත්ත්වයා විසීමද; අර්ධරාත්‍රි සමයෙහි ගඩියා ස්‍රෝතසෙන් ගෙනයන්නාවූ බැගෑ ඇඩින් ඇඬන්නාවූ ඒ පුරුෂයාගේ ආර්තනාද අසා සැතපුන තැනින් නැගිට ගංතෙරට ගොස් මහා ගංගාවෙහි මහත් ජලප්‍රවාහය පවත්නා කල්හි තමන් දිවිපුදා ගැනට බැස ස්‍රෝතස් සිඳපියා ඒ පුරුෂයා තමන්ගේ පිට හිඳුවාගෙන ඉවුරට පමුණුවා අස්වසා එලාඑලදී විඩා සංසිඳුවීමද, නැවතත් ඔහු තමන්ගේ පිට හිඳුවාගෙන වනයෙන් ගෙනවුත් මහා මාර්ගයෙහි බැස්වීමද, දුන්න හයා විදින්නෙමියි අභිමුඛයෙහි සිටියාවූ රජ්ජුරුවන්ට භයක් නැතිව අභිමුඛයට ගොස් පළමුකොට මනුෂ්‍ය භාෂාවෙන් කථාකොට මියුරු පිළිසඳර කිරීමද, මිත්‍ර ද්‍රෝහී පුරුෂයා තසතු කැමැත්තාවූ රජ්ජුරුවන්ට බණ කියා නැවතත් තමන්ගේ දිවිපුදා මරණින් මිදවීමද, රජහු ලවා ප්‍රතිඥා පරිදි ඔහුට වස්තුව දෙවීමද, රජ තමන්ගේ වර ඉල්ලා දෙන කල්හි උන්වහන්සේ විසින් සියලු සත්ත්වයන්ට අභය දෙවීමද, රජ්ජුරුවන් හා බිසවුන් ප්‍රමුඛ කොට මහජනයාට ධර්මදේශනා කොට ඔවුන් දානාදී පුණ්‍යකර්මයන්හි පිහිටුවීමද, ලබනලද අභය ඇති මුවන්ට අවවාද කොට මනුෂ්‍යයන්ගේ සත්‍ය කෑමෙන් වැලැක්වීමද, ඒ කරතලද පත්‍ර සංඥාව අද දක්වාත් ස්ථිර කිරීමද යනමේ ආදීවූ මහාසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ දත යුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි දෙවන හස්ති නාග වර්ගයෙහි සත්වන රුරුමිගරාජ චරිතය නිමි.

(X) VII මාතාඩ්ගපණ්ඩිත චරිතය

තවද මේ පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි දෙවන හස්ති නාග වර්ගයෙහි සත්වන මාතඞ්ගපණ්ඩිත චරිතය කියේය යත්:

පුනා'පරං යදා හොමි ජටිලා උග්ගතාපනෝ,
මාතඞ්ගෝ නාම නාමේන සීලවා සුසමාහිතෝ. (207)

යනුවෙන් නැවත අනික් චරිතයක් කියන්නෙමි. යම් කලෙක්හි මම ජටාධරවූ උග්‍රවූ තපස් ඇත්තාවූ පිරිසිදු සිල් ඇති උපචාර සමාධි අර්පණා සමාධීන් මොනවට සමාහිතවූ හෙවත් ධ්‍යාන ලාභිවූ නමින් මාතඞ්ගතාපසවූ තාපසයෙක්වීමද, එහි මේ පිළිවෙළ කථාවයි:-

එක් කලෙක්හි අප බෝසතාණන්වහන්සේ සැඩොල් කුලෙහි ඉපිද රුවිනුදු දක්නාහට නොහැකිව පිටතුවර සැඩොල් ගමක වසනසේක. උන්වහන්සේට මාතඞගපණ්ඩිතයයි පවසන නමෙක් විය. ඉක්බිති එක් දවසක් ඒ නුවර නැකත් කෙළි සොඳය කළ කල්හි නුවර වැස්සෝ බොහෝ සෙයින් නැකත්කෙළි කෙළනාහ. සොළොස් හැවිරිදි පසළොස් හැවිරිදි පමණ වයසැති දෙවඟනක් මෙන් දැකුම් කටයුතු රූ ඇති පැහැඇති එක්තරා කුලකුමරියක් තමන්ගේ සම්පත් පරිදි නැකැත් කෙළි කෙළිමැයි බොහෝ කත බොතදෑ ගැල්වල පුරවාගෙන හෙළලු වෙළඹකයෙදු රියකට නැඟී මහත්පිරිවර ජනයා ගෙන උයනට යන්නිය. හෝ වනාහි විරූප රූ අවමඟුලැයි දකින්ට නොකැමැති වන්නිය. එසින් ඇට දිවුමඟුල් යයි නම්විය. එදවස බොධිසත්ත්වයෝ කිසිකටයුත්තක් සඳහා උදැසනම නැඟී සිට පිළියක්හැඳ දිරාගිය මුවහැඩ ඇත්තෝ එක් අතකින් හුණදණ්ඩක් ද අනික් අතින් කබලක් ද ගෙන නුවරට වන්සේක. උන්වහන්සේ මිනිසුන් දැක ඔවුන් දුරදීම දුරු කරනුවට හුණදණ්ඩෙන් සංඥා කරන්නාහ. ඉක්බිති දිවුමඟුල් තොමෝ "උස්සරථ, උස්සරථ"යි උස්සාරණය කරන්නාවූ තමන්ගේ මිනිසුන් විසින් ගෙනයනු ලබන්නී නුවරදොර මැදදී මාතඞග පණ්ඩිතයන් දැක "මේ කවරෙක්ද"යි විචාළාය. "ආර්‍යාවෙනි, ඒ මාතඞගවණ්ඩාලයා"යි කීහ. මෙබන්දන් දැක ගියවුන්ට "වැඩක් නම් කොයිතිද"යි. ඕ යානය නැවැත්වූවාය.

ඇගේ පිරිවර මිනිස්සු වනාහි "අපි උයනට ගොස් බොහෝ කත බොතදෑය ලබන්නෙමු, ඊට මොහු විසින් අතතුරු කරත ලද්දේය"යි කිපියාහු "මේ සැඩොලා ගනුව ගනුව"යි ගල්මුගුරු ආදියෙන් තලා සිහිනැති කොට හෙලාපියා පලාගියාහුය. උන්වහන්සේත් මදවේලාවකින් සන්ලදින් නැගිට "කිමෙක්ද සවාමි වරුනි, දෙරටුව නම් සියලු දෙනාටම සාධාරණද, නැතහොත් බමුණන්ටමද"යි මිනිසුන් විවාළහ. ඔව්හු "සියලු දෙනාටම සාධාරණය"යි කීහ. එසේ සාධාරණ දෙරටුවෙහි එක් දෙසක සත්නාවූ මා දෘෂ්ටමඞගලිකාවගේ පරිජනයෝ අතයව්‍යසනයට පැමිණෙව්වාහුයයි ජීවියෙහි මනුෂ්‍යයන්ට දැන්වූහ. එබැවින් "මැගේ මාතය බිඳුවාපියම්"යි ඇගේ ගෙදොරට ගොස් "දෘෂ්ට මඞගලිකාව නොලැබ නොනැගිටිමි"යි වැදහොත්තේ ය. දෘෂ්ට මඞගලිකාවගේ පියාණෝ "මාතඞගයා දොරකඩ හුන්නේය"යි අසා ඕහට තුවිටුවක් දෙවා ශරීරයෙහි තෙල් ගල්වාගෙන යව"යි

කිහ. උත්වහත්සේ "මම දිවුම්හුල් නොලැබ නොනැගිටිමි"යි කිහ. ඉක්බිති බ්‍රාහ්මණයා විසින් "තුවිටු දෙකක් දෙව, මස්සක් දෙව, පාදයක් දෙව, පාදතුනක් දෙව, කහවණු දහසක් දක්වා දෙව"යි කිකල්හිද, නොපිළිගත්තාහුමය. මේසේ ඔවුන් කථාකර ඔත් සිටියදීම හිරු අවරපත් විය. ඉක්බිති දෘෂ්ටමඞ්ගලිකාවගේ මැණියෝ පහයෙන් බැස තිරයක් වටිකරවාගෙන උත්වහත්සේ ගේ සමීපයට ගොස් "පුත මාතඹඝයෙනි, දෘෂ්ටමඞ්ගලිකාවගේ දෙස් කම් කළ මැනව. කහවණු දෙදහසක් ගනුව, කහවණු ලක්ෂය දක්වා ගනුව"යි කිකල්හිද නොපිළිගෙන වැදහොත්තාහුමය. මේ නියායෙන් සදවසක් වැදහෙව සත්වන දවස පැමිණි විට හාත්පස (අසල්වැසි) ගේවල මිනිස්සු රැස්ව "තෙපිම මාතඹඝ පණ්ඩිතයන් තඟාසිටුවව. නැතහොත් දෘෂ්ටමඞ්ගලිකාව ඔහට දෙව, එසේ නොකොට අප නොසසව"යි කිවාහුය.

එසමයෙහි වතාහි "යම්ක්හුගේ හෙදෙර වැද හෙව සැඩොලෙක් මළේතම් ඒ ගෙය සමඟ දෙපසින් සත් සත් ගේ බැගින් තුදුස්ගෙයක මිනිස්සු සැඩොල්වෙතිය"යි ඒ පෙදෙස ව්‍යවස්ථාවක් පවති. ඉක්බිති දෘෂ්ටමඞ්ගලිකාවගේ මව්පියෝ දෘෂ්ටමඞ්ගලිකාවට පටිපිළියක් හන්දවා සැඩොලුන්ට නිසිපිරිකරදී හඬා, ඇ අඬා සිටිද්දීම උත්සම්පයට ගෙනවුත් "බොල නැගිට ළඳුරිය ගනුව"යි දුන්නාහුය ඕද පසෙකසිට "නැගිටිනු හිමියෙනි."යි කීවාය. උත්වහත්සේ "මම ඉතා ක්ලාන්තවීමි, දෙඅත අත්කරගෙන නඟා ගනුව"යි කිහ. ඕ කී නියායෙන්ම කළාය. මාතඹඝපණ්ඩිතයාණෝ අපි ඇතුළුනුවර වසන්නට නොලබම්හ. එව, නුවරින් පිට සැඩොල් ගමට යම්හයි කියා ඇගේ ශරීරයට හාන්සිවී තමන්ගේ ගෙට ගියහ "(ඇගේ පිටට නැගී හියේය"යි ජාතකභාණකයෝ කියති.) මේසේ ගෙටගොස් ජාතිසම්භෙදයක් නොකොටම කීප දවසක් ගෙයි වැස ශරීරයට බල උපදවා ගෙන මේසේ සිතුහ. "මම මේ බඹුණු මහසල් කුමරිය මාගේ සැඩොල් ගෙයි වසවාපිමි. එබැවින් දැන් ඇ ලාභයෙන් හා යසසින් අගතැන්පත් කරන්නෙමි"යි කියාය. ඉක්බිති උත්වහත්සේ මෙසේ සිතා වලට වැද සත්දිනක් ඇතුළතදීම අෂ්ටසමාපත්තීන් හා පඤ්ඤාභිඥාවන් උපදවාගෙන සෘද්ධියෙන් සැඩොල් ගම් දොරෙහි බැස ගෘහචාරයෙහි සිට දෘෂ්ටමඞ්ගලිකාවත් කැඳවූහ. ඕතොමෝ "සැමි, කුමට මා අතාථකොට පැවිදිවූයේක්ද"යි කියා හඬන්ට වන. බෝසතාණෝ "සොඳුර, නො නැවෙව, තිගේ පෙරතුබූ යසසට වඩා මහත් යස

සක් කරමි. නී වතාහි මහාබ්‍රහ්මයාණෝ මාගේ සවාමි පුත්‍රයාණෝය මාතඹග පණ්ඩිතයා තොවේය, ඔබ වතාහි බ්‍රහ්මලොකයට නියහ. මෙයින් සත්වන දවස පසළොස්වක් දිනයෙහි සඳමඬල පලා ගෙන එන සේකැ"යි පිරිස් මැද කියව"යි කීහ. මෙසේ කියා බෝසතාණෝ හිමාලය වනයට ගියහ. දෘෂ්ටමඞ්ගලිකාවද බරණැස් නුවර මහජනයා මැද තත්හි තත්හි එසේ කීවාය. ඉක්බිති බෝසතාණෝ පසළොස්වක් දිනයෙහි සඳමඬල අහසමැද සිටිකල්හි බ්‍රහ්මතේජාවය මවාගෙන සඳමඬල පලාපියා දෙළොස් යොදුන් බරණැස්නුවරද සියලු කසිරටද එකාලෝක කොට අහසින්බැස බරණැස තුන්වරක් පැදකුණු කොට මහජනයා විසින් ගඳමල් ආදියෙන් පූජාකරනු ලබමින් සැඩොල් ගමට අභිමුඛවූ සේක. බ්‍රහ්ම භකනිකයෝ රැස්ව ඒ සැඩොල් ගමට ගොස් දෘෂ්ටමඞ්ගලිකාවගේ ගෙය සුදුපිළි ගඳමල් ආදියෙන් දෙව්විමනක්මෙන් අලංකාර කළාහුය. එකල්හි දෘෂ්ටමඞ්ගලිකාව මල්වර වූවාය මහාසත්ත්වයන් වහන්සේ එහි ගොස් දෘෂ්ටමඞ්ගලිකාවගේ කාහිය ඇඟිල්ලෙන් පිරිමැද "සොඳුර තොපගේ ගැබ පිහිටියේය, තොප පුතකු වදන්නහු. තොපද තොපගේ පුත්‍රයාද ලාභයෙන් හා යසසින් කෙළවරට පැමිණෙන්නාහු. තොපගේ භිස් දෙවි දිය මුළු දඹදිව රජුන්ට අභිෂේකොදකයක් වන්නේය. තොප තහතදිය අමාදියක් වන්නේය. ඒ දිය යම්කෙනකුගේ හිසවත්කළේ නම් ඔවුහු සියලු රොගයෙන් මිදෙන්නාහුය. කාළකණ්ණිය පහව යන්නීය. තොපගේ පාපිට හිස තබා වඳින්නාහු දහසක් දෙන්නාහුය. එසේම වසන තැන සිට වඳින්නාහු සියයක් දෙන්නාහුය. ඇස් හමුවෙහි සිට වඳින්නාහු එකඵක කහවණුව දී වඳින්නාහුය. අප්‍රමාදවෙව"යි ඇට අවවාද කොට ගෙයින් නික්ම මහජනයා බලාසිටියදීම සඳමඬලට ගොස්වනි. බ්‍රහ්මභකනිකයෝ රැස්ව දෘෂ්ටමඞ්ගලිකාව මහත් සත්කාරයෙන් නුවරට ගෙනවිත් එහි මහත් ශ්‍රී විභූතින් වාසය කරවූවාහුය. ඇට දෙව්විමනක් සේ නිවෙස්තක්ද කොට එහි ගෙනගොස් මහත් ලාභසත්කාර ලබවූහ. පුත්‍ර ලාභාදි සියල්ලම බොධිසත්ත්වයන් විසින් කිලෙසම වූයේය. සොළොස් දහසක් බ්‍රාහ්මණයෝ දෘෂ්ටමඞ්ගලිකාවගේ පුත්‍රයා සමඟ නිතර අනුභව කෙරෙත්. දහසක්පමණ බමුණෝ උන් පිරිවරති. තොයෙක් දහස් ගණත් බමුණන්ට දන් දෙති. ඉක්බිති මහාසත්ත්වයෝ "මේ කුමාරයාණෝ තොතැන්හි පැහැදුනාහ. එහෙයින් ඕහට දක්ෂිණාගීයන් අඳුන්වා දෙන්නෙමි"යි භික්ෂාවෙහි හැසිරෙන්නාක් මෙන් ඔහුගේ ගෙට ගොස් ඔහු හා සල්ලාප කොට ගියහ. ඉක්බිති කුමාරතෙම:-

166 කුතෝ නු තවං ආගච්ඡසි දුම්මවාසී
ඔතල්ලකෝ පංසුපිසාචකෝව,
සංකාර වොලං පරිමුසඳව කණ්ඨේ
කෝරෙ තුවං හොසි අදක්ඛිණෙය්‍යෝ,සි.

යන මේ ගාථාව කියේය. එහි අර්ථයනම් "අතංජිත අමණ්ඩිත ඇවිටිත සංඝාටිත සඩරූප ඇති එල්ලෙන රෙදි ඇති පාංශුපිසාචකයකු මෙන් ලාමකවූ තෙපි කොහි සිට එන්නහුද, කසල ගොඩින් හැරගත් පිළී කර බහා සිටිනාවූ දක්ෂිණාවට නොනිසිවූ තොප කවරෙක් වෙහිද" යනුයි.

මෝහු විසින් කරනලද ඒ අනාචාරය නොඉවසන්නාවූ දෙවියෝ ඔහුගේද ඒ සොළොස්දහසක් බමුණන්ගේද මුහුණු පෙර ලූහ. දිවුමහල් තොමෝ ඒ දැක මහාසත්ත්වයන් කරා එළඹ උත්වහන්සේට ඒ කාරණය කිවාය. මහා සත්ත්වයෝ "ඔහුගේ අනාචාරය නොඉවසන්නාවූ දෙවතාවන් විසින් ඒ විප්‍රකාරය කරනලද්දේය, එසකුදු උවත් මේ ඉදුල්බත් (පැහෙහිලා කලතා) ඔවුන්ගේ මුඛයන්හි වන්කොට ඒ විප්‍රකාරය සංසිඳුවව"සි කීහ. ඕතොමෝද එසේ කොට එය සංසිඳෙව්වාය. ඉක්බිති දිවුමහල් තොමෝ පුත්‍රයාහට මෙසේ කිවාය. මේ ලොකයෙහි නම් මාතඞග පණ්ඩිතයන් සමාන දක්ෂිණාගීන්යෝ නොවන්නාහුය, ඔබ වනාහි මේ බ්‍රාහ්මණයන් මෙන් ජාති මාත්‍රයෙන් හෝ මන්ත්‍රාධ්‍යායන මාත්‍රයෙන්හෝ මානයෙන් තද නොවෙන්යයි. එකලවැඩසිටි ශීලාදි ගුණ විශෙෂයෙන් යුක්තවූවන්ද ධ්‍යානසමාපත්තිලාභීන්ද පසේ බුදුවරයන්ද විෂයෙහිම ඔහුගේ ප්‍රසාදය ඇතිකළාය.

එකල්හි වෙත්‍රවතී නුවර ජාතිමන්ත නම් එක් බ්‍රාහ්මණයෙක් පැවිදිව ජාතිය නිසා මහත් මානය කෙළේය. මහාසත්ත්වයෝ ඔහුගේ මත් බිඳිමිසි එතැනට ගොස් ඊට නුදුරුතැන උඩුගං හොයෙහි විසූහ. එහෙයින් වදුළහ.

"අහං ච බ්‍රාහ්මණා එකෝ ගංගාකූලෙ වසාමුහං,
අහං වසාමි උපරි හෙට්ඨා වසති බ්‍රාහ්මණා"සි. (208)

ඉක්බිති මහාසත්ත්වයෝ එක් දවසක් දැහැටි කා මේ ජාතිමන්ත නම් තවුසාගේ ජටායෙහි එල්ලෙව"සි ඉටා කොය දියෙහි බහාපිහ. ඒ දුවිටි ගොස් හාන්නාවූ ඒ බ්‍රාහ්මණයාගේ ජටායෙහි රැඳුනේය. හෙතෙම ඒ දැක නැහෙව, වසලැ" කියා

"මේ කාලකණ්ණියා කොයි සිට ආවේදැ"යි පරීක්ෂා කරන්නෙමියි උඩුහොඅට ගොස් මහා සත්ත්වයන් දැක තාගේ ජාතිය කවරදැයි විමසූයේය. උන්වහන්සේත් "මම වණ්ඩාලයෙමි" යි කී සේක්ය. තවුසාණෝ "තෝ හඟ දැහැටි බහාලූයෙහිදැ" යි කීහ. බොධිසත්ත්වයෝ "එසේය, මම බහාලීමි" යි. "තැසියා වසල වණ්ඩාල කාලකණ්ණිය; මෙහි කොඉඳ ඇටහොඅ ඉදුව"යි කියා ඇටහොඅ වසන්තහු විසින් බහාලූ දැවිටි උඩුහොඅට ගොස් ජටාගෙහි එල්ලුනුකල "ඉදින් තෝ මෙහි වෙසේ නම් සත් වන දවස් හිසපැලේව" යි කීහ. එහෙයින් වදළහ:-

"විචරනෙනා අනුකූලමිහි උඛං මෙ අසසමද්දස,
තසසා මං පරිභාසිසසා අහිසසපි මුඛඵාලනං" යි (209)

කිමෙක්ද? ඔහුගේ ශාපයෙන් බෝසතාණන් වහන්සේගේ මස්තකය පැලෙන්නේද? නොපැලෙන්නේය; එතකුදුරුවත් හේ කුහකසිත් ඇත්තේය. මෙසේ මා විසින් මරණ භයින් භය ගැන්වූකල්හි මෙතනින් ඉවත්ව දුරට යන්නේ යයි සිතා (භය ගත්වනු සඳහා) මෙසේකීය.

යදිහං තසස පකුපෙපයසසං යදි සිලං නාරොපයෙ,
ඔලොකෙසසාමහං තසස කරෙයසසං ජාලිකං විය. (210)

ඉදින් මම ඕහට කිපියෙම් විතම්, ඉදින් සිල් නොරැකිම් නම් ඔහු දෙස බලා අලුයේ කරම් යනු ශක්තිකාවීයි. ඉදින් මම ඕහට තොසතුටු වීම් නම් දෙවියෝ මාසිත් හසරදැන ඔහු සැණෙකින් හළුම්ටක් මෙන් වතසන්තෝය යනු අභිප්‍රායවීයයි *

---

* ශාසනාරූඪවහන්සේ එදා තමන් වහන්සේගේ අසනෙනාෂ භාවය ඇති කල දෙවියන් විසින් සිඹ කටයුතු අතපිය "කරෙයසසං ජාරිකං විය" යන්නෙන් තමාවිසින් කටයුත්තක් මෙන් කොට දක්වා වදළසේක,

විතණ්ඩවාදීතෙම් කියයි:— "බොධිසත්ත්වයෝ කැමැති වන්නාහු නම් ජටිලයා ශක්තියෙන් හළුකරන්නාහ"යයි මෙසේ ගත්කල්හි මේ පෙළෙහි අරුත් ශක්ත්ව ගෙතැර. දක්වනලද්දේ

එසේ උත් ඒසින් සාපකළකල්හි මහාසත්ත්වයෝ "ඉදින් මම මොහුට දැනැවියෙම් නම් මාගේ සිල් නොරැක්නේය, එබැවින් උපායෙන්ම මොහුගේ මත් බිඳපියම්. ඒම මොහුට රැකවලක් වන්නේයයි සත්වන දවස් හිරුනොබැහි දින හිරුනොබැහිමෙන් පිබාවූ මනුෂ්‍යයෝ ජාතිමන්ත්‍ර තාපසයන් කරා

වත්නේය. හෙතෙම මෙසේ විචාළයුතු. යුෂ්මත්තෙම ඍද්ධියෙන් පරූපඝාතය කියන්නේද, ඍද්ධිය වනාහි අධිෂ්ඨාන, විකුර්ණ, මනොමය, ඥානවිෂ්ඵාර, සමාධිවිෂ්ඵාර, ආර්ය, කර්මවිපාකජ, පුණ්‍යවතෝ, විද්‍යාමය, ප්‍රයොගමය; කියා දශවිධවේ. ඔවුන් අතුරෙන් කවර ඍද්ධියක් කියන්නෙහිදැයි. භාවනාමය ඍද්ධියෙ නැයි හේ කියන්නේය. කිම, භාවනාමය ඍද්ධියෙන් පරූපඝාතය වන්නේදැයි. එසේය; සමහර ආචාර්යයෝ එකවරක් පරූපඝාත කර්මය වේයයි කියති.

යම්සේ අනුත් පහරනු කැමැත්තහු විසින් පැන් පිරූ කලයක් දිගාඇසූකල මෙරමාත් පහරන ලද්දේත්වේද, කලයත් බිඳේද, එසේම භාවනාමය ඍද්ධියෙන් එක්වරක් පරූපඝාත කර්මය සිද්ධවේ. එවක් පටන් එය නස්නේය.

ඉක්බිති හෙතෙම භාවනාමය ඍද්ධියෙන් එක්වරකුදු දෙවරකුදු පරූපඝාතකර්මය නොවේයයි කියා විචාළයුතු කිමෙක්ද භාවනාමය ඍද්ධිතොමෝ කුසල් හෝ අකුසල් හෝ අව්‍යාකෘත හෝ වන්නිද; සුඛවේදනා හා දුඃඛවේදනාව හා උපෙක්ෂාවේදනාව හා සම්ප්‍රයුක්තද; සවිතර්කසවිචාරද; අවිතර්කවිචාරමාත්‍රද; අවිතර්ක අවිචාරද, කාමාවචරද රූපාවචරද, අරූපාවචරදැයි විචාළයුතු හෙතෙම දන්නේ නම් භාවනාමය ඍද්ධිතොමෝ කුශලව්‍යාකෘතය, අදුඃඛාසුඛවේදනා සම්ප්‍රයුක්තය, අවිතර්ක අවිචාරය; රූපාවචරයයි කියයි.

ඉක්බිති ප්‍රාණඝාත චෙතනාව කුශලාදීන් අතුරෙහි කවර කොටසක් භජනය කරන්නේදැයි ඇසියයුතු. හෙතෙම දන්නේ නම් ප්‍රාණඝාත චෙතනාව අකුසල්ද දුඃඛවේදනාද සවිතර්කසවිචාරද කාමාවචරද වන්නේයයි කියයි. එසේ නිතම් තොපගේ පැන කුශලේන්ද්‍රියය හාද වේදනේන්ද්‍රියය හාද චිත්තේන්ද්‍රියය හාද භූම්‍යන්තරය හාද සමානවන්නේම යයි කියා පෙළට විරුද්ධ බව දක්වා හැහවිය යුතු.

එළඹ "ස්වාමිනි, හිරුතොතැහ දෙන්ට කරුණු කිමදැයි පුළුවුත්හ. තවුසාණෝ හේ මා කළ දෙයෙක් නොවෙයි. හෝතෙර වතාහි එක් සැඩොල් තවුසෙක් වෙසෙයි, ඔහු කළ දෙයක්ව තැ"යි කීහ. මිනිස්සු මහසත්හු කරා එළඹ "ස්වාමිනි, තුඹ වහන්සේ හිරු නොතැංග දෙන්නෙහිදැ"යි පුළුවුත්හ. "ඇවැත්නි, එසේය"යි කීහ. "ස්වාමිනි, ඊට කරුණු කිමිදැ"යි නොපගේ කුලයට එළඹෙන තවුස් මා නිවැරදි තැනැත්තහුට සාප කෙළේය; ඔහු අවුදු මා කමවා මා පාපිට හොත් කල හිරු විහිදුවමියි කීහ. ඔහු ගොස් කමාකරගනු නොකමැති ඒ තවුසා ඇදගෙනවුත් මහාසත්ත්වයන් වහන්සේගේ පා මූල හොවා කමා කරවා හිරුවිහිදුව වහන්සේ ය"යි කිවාහුය. එසේත් හිරු විහිද නොහැක; ඉදින් මා හිරු විහිදුව හොත් මොහුගේ හිස සත්කඩක්ව පැලෙන්නේය. "ස්වාමිනි, එසේ කල කළ මනාකිමිදැ"යි මහාසත්ත්වයෝ "මැටිපිඩක් ගෙනව"යි හෙන්වා ගෙන "මේ මැටිපිඩ තවුසාගේ හිසතබා ඔහු දියට බහා දියෙහි සිටුවව, හිරු දකිනවිට ඔහුට දියෙහි ගැලේව"යි කියා හිරු වුහුටහ. හිරුරැස් පහළ විගස මැටිපිඩ සත්කඩකට පැළී ගියේය. තවුස්තෙම දියෙහි ගැලී කිමිත්දේය. එහෙයින් වදාළහ.

ඉදින් වතාහි ඒ තෙමේ පුනවපරං භික්ඛවෙ ඉඞ්ඝකචිඤ්චෙවා සමණෙ වා බ්‍රාහ්මණෙ වා ඉඞ්ඛිමා චෙතොවසිප්පත්තෙනා අඤ්ඤදත්ථු කුවම්හතං ගබ්භං පාපකෙන මනසානුපෙක්ඛිතා හොති, අහො වත ඝනනං කුවම්හතං ගබ්භං න සොළසිතා අහිනික්ඛමෙය්‍යාති. එවමපි භික්ඛවෙ කුසලස්ස උපඝාති යි. සංහිතියට ආරූඪ නොකළාවූ කුළුම්බ සූත්‍රය ගෙතහැර පාන්නේතම් තෙපි එහි අරුත් නොදන්නෙහිය; "ඉඞ්ඛිමා චෙතොවසිප්පත්තෙනා" යනමෙහි භාවනාමය ඍද්ධිතොමෝ අනභිප්‍රේතයැ; ආථබ්බනික ඍද්ධි තොමෝ අභිප්‍රේතයැ. ඕ තොමෝම මෙහි ලබා. භාවනාමය ඍද්ධියෙන් පරුපඝාතය සිඹ නොවන්නේමයයි හැඟවියයුතු.

එසේත් නොහැඟි නම් කම්ඝොට යෙදිය යුතුයි. එහෙයින් යථොක්ත ක්‍රමයෙන්ම මේ ගාථාවෙහි අර්ථදතයුතු.

"යං හෝ තදූ මං අහිසපි කුපිතෝ දුට්ඨමානසෝ,
තසෙසව මත්ථකෙ නිපති යොඝෙන තං පමොව"ඉති. (211)

---

* කිපියාවූ දූෂිතවූ සිත් ඇති ඒ ජාතිමත්ත තම් ජටිලයා එකල්හි මස්තකය පැළෙනු සඳහා යම් සාපයක් කළේද (එසාපය) ඔහුගේම මස්තකයෙහි හෙළෙනුවට සිටිගත. ඒ එසේමය. දූෂිත නුවූවන්හට දූෂණ කරන්නාහට වතදෙය යමක්ද එයම වූයේය; වදුරතලදී, භාග්‍යවතුන් වහන්සේ විසින්:-

"යෝ අපපදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගනස්ස,
තමෙව බාලං පචෙචති පාපං
සුඛුමෝ රජෝ පටිවාතංව ඛිත්තො"යි

ඔහු විසින් කියනලද ඒ හිස පැළෙම නොහොත් ඒ ජටිලයා උපායෙන් මුදලීම්; යම් උපායකින් හිස නොපැළේද, එසේ කෙළෙමි යන අදහසියි. පාරමිතා පරිභාවනයෙන් සමෘඩ්ධවූ තාතා සමපත්ති විහරණයෙන් පරිපූරිත ශීලදෘෂ්ටි සම්පදාවෙන් සුසංඛත සත්තාන ඇති මහාකරුණාධිවාස ඇති මහාසත්ත්වයන් කෙරෙහි ඔහු විසින් යම් ආඝෝපවාද කම්යක් අභිසාපයයි කියන ලද පරුෂ වචනයක් යොදන ලද්දේද එය මහාසත්ත්වයන්ගේ ක්ෂේත්‍රයාගේ අවිශෙෂ භාවයෙන්ද ඔහුගේ අධ්‍යාශය පරුෂ බැවින්ද දෘෂ්ටධම්මවෙදනීය කම්යක්ව ඉදින් හෙතෙම මහාසත්ත්වයන් ක්ෂමා නොකළේ නම් සත්වන දවස විපාක දෙනබවට පැමිණියේය; මහාසත්ත්වයන් ක්ෂමාකරගත් කල්හි ප්‍රයොග සම්පත්තියෙන් විපාකය වළකන ලද බැවින් අහොසිකම් භාවයෙන් අවිපාක සභාවයට පැමිණියේය; මේ දෘෂ්ටධම්මවෙදනීය ආඝෝපවාද පාපකම්යාගේ සභාවෙක.

එහි බොධිසත්ත්වයන් විසින් සත්වන දිනයෙහි කළ සූයෝදය ගමනය වැළැක්වීමයයි කියූ උපාය යොගය හෙතුකොටගෙන පීඩාවට පැමිණි මනුෂ්‍යයෝ උන්වහන්සේ සමීපයට තාපසයන් ගෙන වුත් උන්ලවා බෝසතාණන් වහන්සේ ක්ෂමාකරවූහ. තාපස තෙමේත් බෝසතාණන්ගේ ගුණදැන උන්වහන්සේ කෙරෙහි පැහැදුනේයයිදතයුතු. ඔහුගේ හිසෙහි මැවිපිඬක්තැබීමය, එය සත්කඩකට පැළීමය; යතයම්ක් කරතලද්දේද, ඒ වතාහි මිනිසුන්ගේ සිත් රක්නා පිණිසය; "මොව්හු පැවිදි වරයෝවීත් පවතින්. සිත තමන් වශයෙහි නොපවත්වන්නාහුය"යි කියා මහසතුන්ද ඒ තවුසාමෙන් ගණන් ගත්නාහුය, ඒ ඔවුන්ට බොහෝකල් අහිත පිණිසද දුක් පිණිසද වන්නේය"යි සිතා ඒ වළකනු පිණිස කරන ලද්දේයයි දතයුතු.

දැන් යම්ක් සඳහා එකල ඒ තාපසයා කෙරෙහි සිත දූෂණය නොකොට සුපිරිසිදු සීලයම පිරුයේක්ද, ඒ දක්වනු සඳහා

අනුරක්ඛිං මම සීලං නාරක්ඛිං මම ජීවිතං,
සීලවා හි තදා ආසිං බොධියාඥෙව කාරණා. (212)

යන අවසාන ගාථාව වදළසේක. එහි අර්ථය යට කියන ලද රුරුචරිතයෙහි කී නියාඥෙන් දත්නේය.

එකල මණ්ඩබ්‍ය තාපසයෝ තම් උදේනි රජ්ජුරුවෝ ය. මාතඬ පණ්ඩිතයෝ වනාහි ලොකසවාමීන් වහන්සේය. මේ හිද අවශෙෂ පාරමීහු කියනලද ක්‍රමයෙන් නිධාරණය කට යුත්තාහුය. ඒ එසේමය. ගිනජාති ඇත්තෙක් වූසේක් අභිප්‍රාය වූසේම දූෂකමංගලිකාවගේ මානනිග්‍රහය, පැවිදිව "දූෂකමඬගලිකාවට පිහිට වන්නෙමි" යි උපන් සිත් ඇතිව වනයට ගොස් (පැවිදිව) සත්දිනක් ඇතුළතම අභිප්‍රාය පරිදි ධ්‍යානාභිඥ ඉපිද වීමය, එයින් අවුත් දූෂකමඬගලිකාව ලාභයෙන් හා යසයින් අගතැන් පැමිණවීමට උපාය යෙදීමය, මණ්ඩබ්‍ය කුමාරයාගේ මානනිග්‍රහය, ජාතිමත් තාපසයාගේ මානනිග්‍රහය, ජීවිතානතරාය නොදන්නාවූම ඔහුගේ දිවිහැළවීමය, මහාපරාධ කළවුන් ඔහුට නොකිපි තමන්ගේ ශීලානුරක්ෂණය, ආශ්චර්‍ය අද්භූත ප්‍රාතිහාර්‍යකරණය, යන මේ ආදීවූ මහාසත්වයන්ගේ ගුණානුභාවයෝ දතයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටකඅට්ඨාඥෙහි දෙවන හස්තිනාග වගීඥෙහි සත්වන මාතඬ පණ්ඩිත චරිතය නිමි.

(X)VIII ධම්මදෙවපුත්‍ර චරිතය

තවද මේ පරමාර්ථදීපනීතම් චරියාපිටක අට්ඨාඥෙහි දෙවන හස්තිනාග වගීඥෙහි අටවන ධම්මදෙවපුත්‍ර චරිතය කිසේය යත්:

පුනාපරං යදා හොමි මහාපඨෙවා මහිඩ්ඨිකෝ,
ධම්මෙමා නාම මහායඨෙවා සබ්බලොකානුකම්පකෝ. (213)

තැවත අතිකුදු චරිතයක් කියත්තෙමි. යම්කලෙක්හි මම මහත් පිරිවර ඇති මහත් දිව්‍යඍධියෙන් යුක්තවූ සියලු ලෝ වැස්සන්ට අනුග්‍රහකරත්තාවූ ධම්ම නම් දිව්‍යපුත්‍රයෙක් විමේද යන්තෙහි පිළිවෙළ කථාව මෙසේය:

එකල්හි අප මහාසත්ත්වයන් වහන්සේ කාමාවචර දිව්‍ය ලොකයෙහි ධම්ම නම් දෙවපුත්‍රව උපන්සේක. එකල්හි උන් වහන්සේ පුනුපොහෝ දවස මිනිසුන් සවස බත් කාපියා සැප තෙපුල් තෙපලමින් තමන් වසන හෙදෙරවල හුන්කල්හි දිව්‍යාභරණයෙන සැරසි දිව්‍යරථයකට නැගී දිවසරන් විසින් පිරිවරනලද්දහු ගම් නියම්ගම් දනවුහි අහස සිට "ප්‍රාණඝාතාදි දශ අකුශලින් දුරුවව්, ත්‍රිවිධ සුචරිතය පුරව්, මවුපිය මහණ බමුණන් කෙරෙහි මනාව හැසිරෙන්තාහු කුලදෙටුවන් පුදන්තාහු වව්, සවගී පරාඅණව මහත් සම්පත් අනුභව කරව්" යයි කියා මිනිසුන් දස කුසල්හි සමාදන් කරවමින් දඹදිව සිසාරා හැසිරෙතසේක. එහෙයින් වදළහ:-

"දසකුසලකම්මපථේ සමාදපෙනෙනා මහාජනං,
චරාමි ගාමනිගමං සම්බෙනෙනා සපරිජ්ජනොඃ"සි. (214)

එසමයෙහි වනාහි අධම්ම නම් එක් දිව්‍යපුත්‍රයෙක් කාමාවචර දිව්‍යලොකයෙහි උපන්තේය. හෙතෙම "ප්‍රාණඝාත කරවූ නුදුන්දේ ගනිව්ය"යි නොයෙක් ලෙසින් සත්ත්වයන් දශඅකුශල කම්පථයෙහි සමාදන් කරවමින් මහත් පිරිවරින් දඹදිව වඩා ගමන් කෙරෙයි, එහෙයින් වදළහ:-

"පාණෙපා කදරියෙ ඝකෙබා දිපෙනෙනා දසපාපකෙ,
සොවෙකා මහියා චරති සම්බෙනෙනා සපරිජ්ජනොඃ"සි. (215)

එකල ධාර්මිකවූ ධම්ගරුකවූ සත්ත්වයෝ ධම්වාදි දිව්‍යපුත්‍රයන් එන්තා දැක හුනස්නෙන් නැගපියා ගඳින් මලින් පුදා ඇස් හවුව ඉක්මෙන තෙක් සතුති කෙරෙත්, දෙහොත් මුදුන්දී නමස්කාර කරමින් සිටිත්. ඔහුගේ බස් අසා අප්‍රමාදව සකස්ව පින්කෙරෙත්.

පාපාචාර ඇත්තාවූ කුරිරුකම් කරන්තාවූ සත්ත්වයෝ අධම්ම දිව්‍යපුත්‍රයාගේ බස් අසා අනුමෝදන් වෙති. බොහෝසේ පාපයෙහි හැසිරෙති. මෙසේ ඔහු දෙදෙන එකල ඔවුනොවුන්ට ඉදුරාම විරුඬ වාද හා ක්‍රියා ඇත්තාහු (ලොව) හැසිරෙත්. එහෙයින් වදළහ බුදුහු:-

"ධම්මවාදී අධම්මාව උභො පච්චනිකා මයං" යි

මෙසේ කල් යත් යත් එක්දවසක් ඔවුන් දෙදෙනාගේ රථයෝ අහස්හි මුහුණැසුනාහ. ඉක්බිති ඔවුන් දෙදෙනාගේ පිරිස ඔවු නොවුන් තෙපි කාගේ පිරිසදැයි විචාරා අපි ධම්ම දිව්‍ය පුත්‍රයාගේය, අපි අධම්ම දිව්‍ය පුත්‍රයාගේ යයි කියා මං ඇර දෙකට බෙදී හියහ. ධම්ම දිව්‍ය පුත්‍රයාගේ හා අධම්ම දිව්‍ය පුත්‍රයාගේත් රථ යෝ ඔවුනොවුන් අභිමුඛව හිසෙන් හිස හැපී සිටියාහුය. තාගේ රිය මගින් ඉවත්කොටපියා මට මං දෙව, තාගේ රිය ඉවත් කොට මට මං දෙව" යි ඔවුනොවුන් මං අරහු පිණිස විවාද කළාහුය. ඔවුනොවුන්ගේ පිරිස ද අවිහෙත යුදයට සැරසුනාහ එහෙයින් වදාළහ;—

"ධම්මවාදී අධම්මෝ ච උභො පච්චනිකා මයං'
ධුරෙ ධුරං සම්පයහන්තා සම්මුහා පටිපථෙ උභො. (216)

කලභො වත්තති හෙස්මා කල්‍යාණපාපකස්ස ච,
මගහා ඔක්කමනප්පත්ත මහායුඩ්ඩො උපට්ඨිතො" යි. (217)

එකල ධම් දිව්‍ය පුත්‍රයෝ අධම් දිව්‍ය පුත්‍රයාට මෙසේ කිහ. "යහලුව, තෙපි අධම්යෙහි, මම වූකලී ධම් තම් වෙමි. එහෙයින් මට මං අරහට සුදුසුය, තාගේ රථය ඉවත් කොට මට මං ඇර පියව" යි.

අධම් දිව්‍ය පුත්‍රයෝ "මම දැස අධම් යානාවට නැගී ඇත්තෙමි වෙමි, බල ඇත්තේ වෙමි. සත්පුරුෂ ධම්යකුදු මගේ නැත. එහෙයින් මං නොදෙමි. යුද කරන්නෙමි. යමෙක් යුදයෙන් දිනී තම් ඔහට මං වේවයි කිහ. එහෙයින් කිහ:—

167 යසොකරො පුඤ්ඤකරො හමස්මි
සදත්‍රුකො සමණබ්‍රාහමණානං,
මගහාරහො දෙවමනුස්ස පූජිතො;
ධම්මෙමා අහං දෙහි අධම්ම මගහං.

168 අධම්මයානං දළහමාරුහිත්වා
අසන්තසන්තෙනා බලවාහමස්මි,
සකිස්ස හෙතුම්හි තවජ්ජ දජ්ජං
මගහං අහං ධම්ම අදින්නපුබ්බං.

169 ධම්මෙමා හවෙ පාතුරහොසි පුබ්බෙ
පචජා අධම්මෙමා උදපාදි ලොකෙ,
ජෙට්ඨෝ ච සෙට්ඨෝ ච සනන්තනෝ ච
උභ්‍යාහ ජෙට්ඨස්ස කනිට්ඨ මගහං.

170 න යාචකාය තපි පාතිරූපා
න අරහති වොහං දදෙය්‍ය මඟ්ගං,
යුධඤ්ඤ තො හොතු උභින්නමජ්ජ
යුධිඨ්ඨිං යො ජෙඝති තස්ස මඟ්ගා.

171 සබ්බාසා අත්‍රුවිසතොහමස්මී
මහබ්බලො අමිතයසො අතුලෙය්‍ය,
ගුණෙහි සබ්බෙහි උපෙතරූපො
ධම්මෙ අධම්ම තිං කථං විජෙඝති.

172 ලොහෙන වෙ හඤ්ඤති ජාතරූපං
න ජාතරූපෙන හනන්ති ලොහං,
සවෙ අධම්මෙ හඤ්ඤති ධම්මජජ්ජ
අයො සුවණ්ණං විය දඝසතෙය්‍යං.

173 සවෙ තුවං යුධිඨ්ඨලො අධම්ම
න තුයහං වුඩ්ඪා ච ගුරූ ච අඤ්ඤි,
මඟ්ගම්පි තෙ දම්මි පියා පියෙන
වාචාදුරුත්තානිපි තෙ ඛමාමි" යි.

මේ ගාථාවන්ගේ අර්ථ කම්:

167 ධම් දිව්‍ය පුත්‍රයෝ, "අධම් දිව්‍යපුත්‍රයෙනි, මම වනාහි ධම් නම් වෙමි, මක්නිසාද යත්: දෙව් මිනිසුන් ධම්යෙහි හසුරුවීම් වශයෙන් ඔවුන්ට යසස දෙමි, එසේම පින් දෙමි, සැම කල්හිම සත්පුරුෂයන් විසින් පසස්තා ලද්දේ වෙමි, මම වනාහි දෙව් මිනිසුන් විසින් පුදන ලද්දෙමියි, එහෙයින් මට මං අරතට, සුදුසුය" යි කිහ.

168 එකල්හි අධම් දිව්‍ය පුත්‍රයෝ "එම්බා ධම් දෙව පුත්‍රයෙනි, මම වනාහි අධම් නම්, අධම් යාතයට තැගී ආයෙමි, සත්පුරුෂ ධම්යක් මාගේ නැත, එසේ හෙයින් සත්පුරුෂයාට වඩා බල ඇත්තෙමි, එසේවූ මම කවර කාරණයකින් මිට පළමු කිසිවෙකුට නොඇල විරූ මං තොපට අද අරිම්ද? මඟ නොහරිම්" යි කිහ.

169 ඉක්බිති ධම් දිව්‍ය පුත්‍රයෝ "එම්බා අධම්යෙනි, මේ ලොකයෙහි දශකුශල කම්පථය" යි කියූ ධම්ය පූර්වයෙහි ම හෙවත් ප්‍රථම කල්පයෙහිම පහළවිය, ඒ ධම්ය පසුව උපත. එසේ හෙයින් (ධම්ය පළමු පහළවූ බැවින්) මම වනාහි ජ්‍යෙෂ්ඨ යෙමි. ශ්‍රෙෂ්ඨයෙමි, සනාතන ද වෙමි, තෝ වනාහි කනිෂ්ඨ වෙහි එහෙයින් ජ්‍යෙෂ්ඨයාට මං අරුවයි කිහ.

170 එකල අධම්ම දිවය පුත්‍රයෝ "භවත් ධම්මසෙනි, මම වූකලී භවත්හට යාවඤ්ඤවෙන්ද, ප්‍රතිරූප වචනයෙන්ද, මාගීසිනාව යෙන්ද, මං තොදෙමි. වැලි එකෙක් ඇත. අද අප දෙදෙනා අතර යුධයක් වේවා යුධයෙන් යමෙක් ජය ගත්තේ ඒතම් මන ඕහට වන්නේය" යි කීහ.

171 එබසට ධම්මසෝ "එම්බා අධම්මසෙනි, මම වනාහි සතර දිග් සතර අනුදික්හි තමන්ගේ ගුණයෙන් පතළ වෙමි, මහත් බල ඇත්තෙමි. අපමණ යසස් ඇත්තෙමි. කිසිවෙකු හා සම තොවෙමි. සියලු ගුණයෙන් යුක්ත වෙමි, ධම්මයා තෝ කෙසේ ජයගනිහිදැ" යි කීහ.

172 ඉක්බිති අධම්මසෝ "එකාන්තයෙන් ලොහයෙන් රන් රුවන් නසීද, රන්රුවනින් ලොහය තොනසිද, දැකුම්කටයුතු රත්රන් යකඩින් නසීද, එසේම අද අධම්මතෙම ධම්මයා නසා පියන්නේය" යි කීහ.

173 එබසට ධම්මසෝ "එම්බා අධම්මසෙනි, ඉදින් තෝ යුධබල ඇත්තේ වෙහි. තොට "මොහු වැඩි සිටියේය, මොහු ගරු කටයුත්තේය" යි ගිණුමක් නැද්ද, එසේවූ තට මම ප්‍රියයෙන් අප්‍රියයකු මෙන් මං දෙමි. තාගේ දුරුකත බසටත් ක්ෂමා කෙරෙමි" යි කීහ, යනුයි.

එකල්හි බෝධිසත්ත්වයන් වහන්සේ මෙසේ සිතූහ: "ඉදින් මම මෙසේ සියලු ලෝකයාහට අහිත පිණිස පිළිපන්නාවූද මෙසේ මා හා විරුඩග්‍රාහ ගෙන සිටිනාවූද, මේ පවිටු පුහුලා හට අසුරුසත් කොට "ආචාර විරහිතය; මෙහි තොසිට වහා ඉවත්වෙව' යි කීම් තම් හේ එකෙණෙහිම මාගේ ධම් තෙජස යෙන් බොල් මිටක් මෙන් විසිර යන්නේය, එහෙත් එය මට සුදුසු නොවන්නේය. මම වනාහි සියලු ලොකයාහට අනුකම්පා කරමින් මේ ලොකාර්ථචර්යාව මසාකප්‍රාප්ත කරන්නෙමි"යි පිළිප දිමි. ඒ මේ පවිටු මතු මිහාදුකට කොටස්කාරයෙක් වන්නේය. මා විසින් ඕහට විශේෂයෙන් අනුකම්පා කටයුතු වනනේය. එහෙයින් ඕහට මං හරිමි. මෙසේ මාගේ ශීලය ඉතා පිරිසිදුත් තොකඩත් වන්නේය" යි සිතා බොධිසත්ත්වයන් විසින් "සවෙතුවං යුධබලෝ" යන ගාථාව කියා මාර්ගයෙන් ඉවත්වූ ඇසිල් ලෙහිම අධම්මයෝ රථයෙහි සිටිය තොහැකි වන්නෝ හිස යටි කුරුව බිම හි පොළොව විවරවූ කල්හි නොස් අවීචියෙහි උපන්හ. එහෙයින් වදුරන ලදි.

"යදිහං තස්ස පකුප්පෙය්‍යං යදි හිංසෙ තපොගුණං,
සහපරිජනං තස්ස රජ්ජතං කරෙය්‍යහං. (218)

අපිචාහං සිලං රක්ඛාය නිබ්බාපෙක්ඛාන මානසං,
සහජනෙ නොක්කමිත්වා පථං පාපස්ස දූසහං. (219)

සහ පථෙතා ඔක්කාතෙන කත්වා චිත්තස්ස නිබ්බුතිං,
විවරං අදූසි පඨවි පාපස්ස තාවදෙ" ති. (220)

ජාතකට්ඨකථාවෙහි "මිගහං දම්මි" යි කී ඇසිල්ලෙහිම පොළොව පැළෙන්නේයයි කියන ලදි. මෙසේ ඔහු බිම හුනු කල්හි සිවුනහුතයක් අධික කොට ඇති යොදුන් දෙලක්ෂයක් ඝන සියලු වරාවරයන් ධාරණය කරන්නාවූ මහපොළොව "මම මේ පාප පුරුෂයා නොදරමි" යි කියන්නාක් මෙන් ඔහු සිටිය තැන දෙකට බිඳී හියේය. මහාසත්ත්වයෝ වනාහි ඔහු අවීචියෙහි උපන් කාලයෙහි රිය හිසෙහි සිටි පරිද්දෙන්ම සිට පිරිස සහිතව මහත් දෙවානුභාවයෙන් (යන මහිත්ම) ගොස් තමන්ගේ භවනට පිවිසියහ. එහෙයින් වදළහ, භාග්‍යවතුන් වහන්සේ:

171 ඛන්තිබලෝ යුධබලං විජෙත්වා
හන්ත්වා අධම්මං නිහතෙත්ව භුම්‍යා,
පාඤාසි විත්තෝ අනිරුද්ධ සන්ථතං
මගෙහතෙව අතිබලෝ සච්චනික්කමෝ" යි

"ක්ෂාන්තිබලයතෙම යුධබලය ජයගෙන අධර්මයා තමා පොළොවෙහි හසා හියේය. සත්‍යයම වීරි කොට ඇති මහත් බල ඇති බොධිසත්ත්වයෝ පතළව හෙවත් විශාරදව රථයට නැගී සෘජු මාගියෙන්ම වැඩි සේක" යනු එහි අර්ථයි.

එකල අධර්ම දිව්‍යපුත්‍රයා නම් දෙවදත්ත ස්ථවිරයෝය, ඔහුගේ පිරිස නම් දැනුදු දෙවදත්ත ස්ථවිරයන්ගේම පිරිසය, ධර්ම දිව්‍ය පුත්‍රයෝ නම් ලොකස්වාමි බුදුරජාණන් වහන්සේය. උන් වහන්සේගේ පිරිස බුදුපිරිස මය. මෙහිද යට කියන ලද ක්‍රම යෙන්ම අවශෙෂ පාරමිහු සුදුසු ලෙස නිධාරණය කට්යුත්තාහුය. ඒ එසේමය, දිව්‍ය ආයු - වර්ණ - යස - සුඛ - ආධිපත්‍යයෙන්ද දිව්‍යමය උළාර පඤ්චකාම ගුණයෙන්ද යුක්තව හැමකල්හි නොයෙක් දහස් ගණන් දෙවහතන් විසින් මෙහෙ කරන්නාවූ මහත් ප්‍රමාදස්ථාන යෙහි සිටියාවුම බෝසතුන් මදකුත් ප්‍රමාදයට නොපැමිණ ලොකාර්ථවය්‍යාව මසතකප්‍රාපතකරම්"හි මසක්පාසා පසළොස් වක් දිනයෙහි ඛණකිය්මින් පිරිවරජනයා සමග මනුෂ්‍යපථයෙහි හැසිර

මහා කරුණාවෙන් සියලු සත්ත්වයන් අධර්මයෙන් දුරුකරවා ධර්මයෙහි යෙදවීමය, අධර්ම දිව්‍යපුත්‍රයා සමඟ එක්වූයේද ඔහු විසින් කරනලද අනාචාරය කොගෙන උන් කෙරෙහි සිත් අකුප්වා ක්ෂාන්ති මෛත්‍රී එළවා තමන්ගේ ශීලය අඛණ්ඩ කොට පිරිසිදුකොට රැකීමය, යන මේ ආදීහු මෙහි මහාසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ යයි දත යුත්තාහු ය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨාවෙහි
දෙවන හත්ථිනාග වංශයෙහි අටවන ධර්මදිව්‍යපුත්‍ර චරිතය නිමි.

—÷—

(X)IX අලීන සත්තු චරිතය

—+—

තවද මේ පරමාර්ථ දීපනී නම් චරියාපිටක අට්ඨාවෙහි දෙවන හත්ථිනාග වංශයෙහි තවවන අලීනසත්තු චරිතය කියේය යත්:

"පඤ්චාලරට්ඨෙ නගරවරෙ කම්පිලායං පුරුත්තමෙ,
රාජා ජයද්දිසො නාම සීලගුණමුපාගතො, (221)

තස්ස රඤ්ඤො අහං පුත්තෙනා සුතධම්මා සුසීලවා,
අලීනසත්තෙනා ගුණවා අනුරක්ඛ පරිජනෙ සදා" (222)
යි"වදාළ හෙයින්

පඤ්චාල රට පුරොත්තමවූ කම්පිල්ල නම් පුරවරයෙහි සීල ගුණයෙන් යුක්තවූ ජයද්දිස නම්වූ රජෙක් විය. බහුශ්‍රුතවූ මහා සිල් ඇති උදාර මහාපුරුෂගුණ ඇති හැමකල්හි ශ්‍රද්ධාදී ගුණ විශෙෂ යොගයෙන් හා සිව්සඟරාවතින් පිරිවර ජනයන් මහා කොට සංග්‍රහකරන්නාවූ අලීනසත්තු නම්වූ මම උන්වහන්සේගේ පුත්‍ර විමි. ඒ කෙසේද යත්:–

ජයද්දිස රජ්ජුරුවෝ එක්දවසක් "මුවදඬ යන්නෙමි"යි ඊට සුදුසු මහත් පිරිවරින් යුක්තව කම්පිල්ල නුවරින් නික්මුණාහ. ඔහු නික්මෙන ඇසිල්ලෙහිම තක්සිලා වැසි නාඳ නම් බ්‍රාහ්මණයෙක් සතාරහ නම්වූ ශාස්ත්‍රසතරක් උන්ට අස්වනු පිණිස ගෙනවුත් තමන් ආ කාරණය රජහට සැලකළේය.

රජ්ජුරුවෝත් "නැවත දන්තෙමි"යි ඔහුට තවාතැන් වැටුප් වියදම් දෙවා තුමූ වනයට පිවිස යමකු සිටිකඩින් මූවෙක් පලා යේනම් ඔහුම දඩයයි කියා මූවන් සොයමින් හැසිරෙති. ඉක් බිති එක්පසද මූවෙක් ජනයාගේ පාහඩින් උන්නැනින් නික්ම රජහට ඉදිරිව ගොස් රජ සිටි කඩින් පලාගියේය. ඇමතියෝ රජ්ජුරුවන්හට පරිහාස කළෝය. රජ්ජුරුවෝ ඌ ලුහුබැඳ ගොස් තුන්යොදනකින් මත්තෙහි ක්ෂීණජව ඇතිව සිටිකල්හි ඌව්ද හෙළුහ. ඉක්බිති කඩුවෙන් දෙකඩකොටපියා මාංශයෙන් ප්‍රයෝජන නැත්තෝ ද "මූවා අල්වා ගනු නොහැකි වූයේය"යි යන වචනයෙන් මිදෙනු පිණිස කද බැඳගෙන එන්නාහු එක් නුහරුකක් සම්පයෙහි බබුස්තණ මත්තෙහි හිඳ මඳක් සැතපී යන්ට ආරම්භ කළහ. එසමයෙහි වනාහි එක්යකින්නක් රජ හුගේ දෙටුබෑයන් උපන් දවස්ම මස් කනු පිණිස අල්වාගත්තාය. ඉක්බිති රුකවලසිටි මිනිස්සු ඇය එහුබැඳ ගත්හ. ඇ දියසොරොව්ව කින් පලායන කල්හි ඇගේ ළයෙහි හුන් ළදරුතෙම මැණියෝ යයි යන සංඥාවෙන් ඇගේ තනය මුවෙන් ගත්තේය. ඉක්බිති ඕ කුමරුන් කෙරෙහි පුත්‍ර ස්නේහ උපදවා වඩිනය කරන්නීය. හෙතෙම මිනිමස් කමින් ක්‍රමයෙන් වැඩිවිය පැමිණියේය. යකින්න විසින් අනනඩාතව මිනි මස් කනුපිණිස ඔහුට බෙහෙත් මූලක් දෙන ලද්දේය. හෙතෙම ඖෂධ මූලානුභාවයෙන් අනනඩාතව මිනිමස් කෑ ජීවත් වන්නේය. ඉක්බිති ඇ මළකලැ ඒ බෙහෙත් මූල තමාගේ ප්‍රමාදයෙන් නැතිකොට පෙනෙන ශරීරඇතිවැ මිනිමස් කන්නේය. රාජපුරුෂයෝ නගින උද්විග්න විරූපදර්ශන ඇති ඔහු දැක ලුහුබැන්දහ. හෙතෙම පලාගොස් වනයට වැද ඒ නිග්‍රොධ මූල සමීපයෙහි වාසය කරන්නේ රජ්ජුරුවන් දැක "මට ගොදුරු වූයෙහිය"යි කියා අතින් අල්වා ගත්තේය.

"පිතා මෙ මිගවං ගන්ත්වා පොසිසාදං උපාගමි,
සො මෙ පිතු අගාරසමිං භක්ඛොසි මම මා චලි"යි (223)

එහෙයින් කියන ලදී.

"තස්ස තං වචනං සුත්වා ගිනෝ තසිතවෙධිතෝ,
ඌරුකම්මහා අහු තස්ස දිස්වාන පොසිසාදකං." (224)

රජ්ජුරුවෝ ඒ යකිනි පුත් දැක බියපත් වූයේ ඌරුකම් හයට පැමිණ (හෙවත් දෙකලව තදව කනුවක් මෙන්) සිටි යහ. එවිට ඒ යක්ෂතෙම වේගයෙන් අවුත් "භක්ඛොසි මේ

ආගතොසි''යි කියේය. ඉක්බිති රජ්ජුරුවෝ සිහිඑළවා ඉදින් ආහාරයෙන් ප්‍රයෝජන ඇත්නම් නම් තට මේ මාංස දෙන්නෙමි, ඒ මාංසගෙන අනුභව කරව, මා මුදව''යි කිහ, ඒඅසා පොරිසාද තෙම මේ කිමද! මා සතුදේ මට ව්‍යවහාර (වෙණදම්) කරන්නෙහිද? මේ මාංසයද තොපද මා අතට ආ කාලයෙහි සිට මා සතු නොවේද! එහෙයින් පළමුකොට තොප අනුභව කොට පසුව මාංස අනුභව කරන්නෙමියි කියේය. ඉක්බිති රජ්ජුරුවෝ මේතෙම මස් විකිණීමෙන් මා නුමුදයි. මුව දඩයමට එන්නාවූ මාවිසින් කඳ බ්‍රාහ්මණයාගේ මුව දඩගොස් ආ කල ධනය දෙන්නෙමිය කියා ප්‍රතිඥාවක්ද කරන ලද්දේය. ඉදින් යක්ෂතෙම අවසර දෙන්නේනම් සත්ත්‍වයා රැක ගෙට ගොස්ඒ ප්‍රතිඥාව මුදා නැවත ඔහුගේ අතට පැමිණෙන්නෙමියි සිතා ඕහට ඒ කාරණය කිහ. එබස් අසා පොරිසාද තෙම ඉදින් ඔබ සබවස රකිමින් යනු කැමැත්තෙහි නම් ගොස් ඒ බ්‍රාහ්මණයාට දියයුතු ධනය දී නැවත මෙහි වහා එවයි කියා රජ්ජුරුවන්ට යන්ට ඇරියේය. එකල්හි රජ්ජුරුවෝ තෝ සැක නොකරව. මම උදැසනක්සේම එන්නෙමියි කියා මඟ ලකුණු සලකමින් තමන්ගේ සේනාව කඳවුරු බැඳ උන් තැනට ගොස් ඔවුන් විසින් පිරිවරන ලද්දහු නුවරට පිවිසියහ. ඉක්බිති රජ්ජුරුවෝ තෘදබ්‍රහ්මණයා කැඳවා මාහැඟි ආසනයක හිඳුවා ඔවුන් විසින් කියූ ඒ ගාථා අසා සාරදහසක් දී යානයක නංවා ''මොහු තක්සලා නුවරට ඇරලව''යි මිනිසුන්ට බාරදී බ්‍රාහ්මණයා පිටත් කර යවා දෙවන දවස් පොරිසාදයා වෙතට යනු කැමැත්තෝ පුත්‍රයා රාජ්‍යයෙහි පිහිටුවනු පිණිස අනුශාසනය කරමින් මෙසේ කිහ.

''පුතණුවෙනි, කුලසන්තක රාජ්‍යය පිළිපදුව යම්සේ මම ධර්මයෙන් රාජ්‍යය කෙළෙම්ද, එසේම තොපද සේසත නහා රාජ්‍යය කරව, වැලි මෙනුවර රකිමින් රජයද කරවමින් ප්‍රමාද නොවෙව, අසෝතැන නුගමූල පොරිසාද නම් යකෙක් ඇත. ඒ යක්ෂයා විසින් මම අල්වාගන්නා ලද්දෙමි. ඉක්බිති කඳ බ්‍රාහ්මණයාට ධනය දෙනු පිණිස මෙහි ආමි. එන්නාවූද මම ඔහුවෙතට නැවත යනු පිණිස ප්‍රතිඥා දුනිමි. එහෙයින් සබවස රකිමින් එහි යායුතුය යි කිහ. ඒ අසා අප මහා බොධිසත්වයෝ ''පියා මහරජාණෙනි, ඔබවහන්සේ එහි නොගිය මැනව; මම එහි යන්නෙමි''යි කිහ, ''පියාණෙනි ඉදින් තොපි එහි යන්නෙහි නම් මමත් ඔබ සමඟ යන්නෙමි''යි ද කිහ.

"එසේ ඇතිකල්හි අපි දෙදෙනම් නැතිවන්නමිහ. එහෙයින් මම් එහි යන්නෙමි" සිතා තාතාප්‍රකාරයෙන් වළක්වන්නාවූ රජ්ජුරුවන් නිවිස්වා මවුපියන් වැඳ පියාණන් සඳහා ආත්ම පරිත්‍යාගය කොට සවඤ්ඤුභාවය සඳහා උන් ආශීර්වාද කරද්දී මවු, තැගණී, බිරිඳ, යන තිදෙන සත්‍යක්‍රියා කරද්දී කුමාරයාණෝ අවිගෙන තුවරින් නික්ම කඳුළු පිරුණු ඇස් ඇතිව ලුහු බඳනා මහජනයන් විවාරා පියාණන් විසින් කියන ලද ක්‍රමයෙන් යක්ෂයා වසන මඟට පිළිපන්හ. යකින්නගේ පුතුද "රජදරුවෝ තම් බොහෝ මායා දන්නාහ. කුමකින් කුමක් වත ඔවත් නොදනෙ"යි ගසට තැගි රජහුගේ ඊම බලමින් හුන්නේය. එසඳ කුමාරයන් එන්නා දැක පියාණන් තවතා පුත්‍රයා ආයේ වන්නේයයි මට දැන් භයෙක් නැතැයි ගසින් බැස ඔහුට පිටපා හුන්නේය. මහාසත්ත්වයෝ අවුත් ඔහු ඉදිරියෙහි සිටියහ. එහෙයින් වදාළහ.

"මිගවං භයෙනා මුඤ්චසඤ්ඤං කත්වා ආගමනං පුන,
බ්‍රාහ්මණස්ස ධනං දත්වා පිතා ආමන්තයි මම. (225)

රජ්ජං පුත්ත පවිජ්ජාහි මා පමජ්ජි පුරං ඉදං,
කතං මේ පොරිසාදෙන මම ආගමනං පුන. (226)

මාතාපිතූ ච වන්දිත්වා නිම්මිනිත්වාන අත්තානං,
නික්ඛිපිත්වා ධනුං බග්ගං පොරිසාදමුපාගමිං"යි. (227

ඒ පොරිසාද තෙම අවිගත් අත්ඇතිව එළඹියාවූ මා දැක සමහරවිට තැති ගන්නේය. ඒ ත්‍රාසොත්පාදනය කරණකොට ගෙන මාගේ ශීලය බිඳෙන්නේය, මාගේ ශීල භෙදයෙන් වන භයින් ඒ පොරිසාදයාට අනිෂ්ටවූ ආයුධාදියක් ව්‍යවහාර නොකළෙමි. හුදෙක් මෙත් සිතින් හිතවාදීව මේ වක්‍ෂ්‍යමාණ වචනය කීමිහ. දක්වන්නට මෙසේ වදාළහ.

"සසප්පහට්ඨපගතං කදාචි සො තසිස්සති,
තෙන ගිජ්ඣිස්සති සීලං පරිත්තාසං කතෙ මයි (228)

සීලඛණ්ඩභයා මය්හං තස්ස දෙස්සං න බ්‍යාහරිං,
මෙත්තචිත්තෙනා හිතවාදි ඉදං වචන මබ්‍රවිං"යි. (229)

මහාසත්ත්වයෝද ගොස් ඉදිරියෙහි සිටියහ. යකිනිපුත් ඔහු විමසනු කැමැත්තේ තෙපි කවුරුදැ? කොයි සිට අවුදැ?

කිමද මා රැවුරු (එකෙක) මිනීමස් කන්නෙකැයි නොදන්නහුද? මෙහි එන්ට කරුණ කවරේද යි විචාළේය. කුමාරයෝ කියන්නාහු මම ජයද්දිස රජහුගේ පුත්‍ර වෙමි. නෝ පොරිසාදයයි කියා මම දනිමි. පියාණන් දිවි ගළවනු පිණිස ආමි. එහෙයින් උන්වහන්සේගේ දිවිමුදා මා අනුභව කරවයි කිහ. නැවත යකිනි පුත් "තොපගේ මුහුණුවරින්ම තොප රජහුගේ පුතණුවන් නියාව දනිමි. එතකුදු උවත් එසේ එන්නාවූ තොප විසින් කරතලද්දේ දුෂ්කරයකැ"යි කීයේය. කුමාරයෝ "පියාණන් සඳහා ජීවිත පරිත්‍යාගය දුෂ්කර නොවන්නේය. මවුපියන් හෙතු කොටගෙන එබඳු පුණ්‍යකර්මයකට එකාන්තයෙන් සවිඥයෙහි සැපවිඳින්නේය. තොමෝ රෙන්නාවූ කිසිම සත්ත්වයකු නැති බව මම දනිමි. මා විසින් ද කළ පවකුත් සිහිනොකරමි. එහෙයින් මට මරණයෙන්ද භයක්නැත මා විසින් මේ ශරීරය තට දෙනලද්දේය. ගිනිදල්වා අනුභව කරව"යි කිහ. එහෙයින් වදළහ.

"උජ්ජාලෙහි මහාඅග්ගිං පපතිස්සාමි රුක්ඛතෝ,
එවං පකතකාලම්හි යඤ්ඤය භක්ඛය මං පිතාමහා"යි (230)

මහපියාණනි, මහත් ගිනිමැලයක් දල්වව, මම රුකින් ගිත් තට පැන පියම්. පැලහු කල්හි මා අනුභව කරව, යනු එහි අර්ථයි.

යක්ෂපුත්‍රතෙම ඒ අසා මොහුගේ මස් කනු නොහැක. උපායකින් මොහු පලායවන්නෙමියි සිතා එසේ වී තම් වතයට වැද හර ඇති දර එකතුකොට දුම්කැති අහුරු බස්වා පියව. එහි තොපගේ මස් පලහා කන්නෙමියි කියේය. මහාසත්ත්වයෝ එසේකොට ඔහුට දන්වූහ. හෙතෙම ඒ බලා මේ තෙම පුරුෂ සිංහයෙකැ, මරණයෙන්ද භයට නො පැමිණෙන්නේය. මෙතෙක්කල් මෙබඳු නිර්භය තැනැත්තෙක් මා විසින් නුදුටු විරුයයි ලොමු දැහැගත් ශරීර ඇත්තේ කුමාරයා දිනාව බැලුයේය. කුමාරයෝ කුමක් සඳහා මා දිහා බලන්නේද? කියන ලද පරිදි නොකරන්නෙහිදැයි ඇසූහ. යක්ෂපුත්‍රතෙම මහාසත්ත්වයන්ට කියන්නේ යමෙක් ඔබගේ මස්කන්නේ නම් ඔහුගේ හිස සත්කඩකට පැලෙන්නේයයි කියේය. ඉදින් මා නොකනු කැමැත්තෙහි නම් ගිනිදල්වාපියේ කුමටදැයි ඇසූහ. තොප

පරීක්ෂා කරනු පිණිස යයි කිය. දැන් තෝ කෙසේ මා පරීක්ෂා කරත්තේද, මම තිරිසන් යොනියෙහි උපන්කාලයෙහිදු ශක්‍ර දිව්‍යරාජයා හට පවා පරීක්ෂාකරත්ට නුදුන්නෙමියි කියා ඒ කාරණය දක්වන්ට කුමාරයෝ:

175 "ඉදානි සෝ බ්‍රාහ්මණං මඤ්ඤමානෝ
සසෝ අවාසෙසි සකෙ සරීරෙ,
තෙතෙව සෝ වන්දිමා දෙවපුත්තෝ
සසප්‍රිතෝ කාම දුහජ්ජ යක්ඛා."

යන ගාථාව කිහ. එහි අර්ථය නම් සසපණ්ඩිතයෝ ශක්‍රයා වූකලී බ්‍රාහ්මණයෙකැයි සිතා තමන්ගේ ශරීරය ආහාර පිණිස දුන්හ. ශක්‍රයෝ පව්තරාසය පෙළාගෙන සඳමඩලෙහි සසලකුණක් කළෝය. එතැන් පටන් ඒ සසලකුණෙන් චන්ද්‍රදෙව පුත්‍රයෝ "ශශී" "ශශී" යයි ශශ ශබ්දයෙන් කියනලද්දාහුය. ලොවට කැමැති දෑ දෙන්නාවූ ප්‍රේමවඩිතය කරන්නාවූ චන්ද්‍රදෙවරාජයා අද විරොචමාන වන්නේය යනුයි.

මෙසේ මහාසත්ත්වයෝ කල්පසථායී ප්‍රාතිහාර්යයක්වූ ශශ ලාඤ්ඡන ප්‍රාතිහාර්යය ශාක්‍ෂ්‍යයකොට තමන් ශක්‍රයාටත් පරීක්ෂා කරන්ට නොහැකිවූබැව් කිහ. පොරිසාද තෙම ඒ අසා ආශ්චර්‍ය්‍ය අද්භූත සිත්ඇත්තේ

176 "වඤ්ඤ යථා රාහුමුඛා පමුත්තෝ
විරොචතෙ පණ්ණරසෙව භානුමා,
එවං තුවං පොරිසාද, පමුත්තෝ
විරොච කම්පිල්ල මහානුභාව;
පමොදයං පිතරං මාතරංච
සබ්බෙසාව තෙ නන්දතු ඤාතිප කෙඛා."

යන මේ ගාථාව කීයේය. එහි අර්ථය නම්: කුමාරයෙනි, රාහු මුඛයෙන් ගැලවුණු පසළොස්වක් සඳ මඩල යම්සේ බබලාද, මහානුභාව ඇති කම්පිල්ල දෙශිය කුමාරයෙනි, එසේම පොරිසාදයාගෙන් ගැලවූ තෙපි, ප්‍රමුදිත වෙමින් බබලව, මවු පියන් හා තොපගේ සියලු ඤාතිවර්ගයාත් සතුටු කෙරේවායි යනුයි. මෙසේ මේ ගාථාව කියා මහාවීරය යවයි කුමාරයන් හැරියේය. උන්වහන්සේද ඔහු පාපාධ්‍යාශ තමැති විසයෙන් පහකොට පඤ්චශීලයෙහි සිටවූහ. යළි මේතෙම යක්‍ෂයෙක් දෝ හෝ නෙවේදෝහෝයි විමසන්නෝ යක්‍ෂයන්ගේ ඇස් රතු වන්නේය ඇසිපිය නොමරන්නේය. නෙවතැල්ල ද නොපැනෙන්නේය

භයකැන්තේය. මොහුගේ එසේ බවක්කැත. එහෙයින් මේතෙම යක්ෂයෙක් නොවේ; මනුෂ්‍යයෙක්මය, මාගේ පියාණන්ගේ තුන්බැකෙතෙක් යක්ෂණියක විසින් ගන්නාලද්දහ; ඔවුන් හෙන් දෙදෙනක් ඇ විසින් කනලද්දෝවත; එකෙක් ඇ විසින් පුත්‍රස්නෙහයෙන් පොෂණය කරන ලද්දේවත; ඒ මොහු විය යුතුයයි තයග්‍රාහ වශයෙන් විපරීත කොට සඤ්ඤානුභයෙන් මෙන් නිමවාට ගොස් මාගේ පියාණන්ට කියා රාජ්‍යයෙහි පිහිටුවන්නෙමියි සිතා මෙසේ කිහ. "භවත, තෝ යක්ෂයෙක් නොවෙහි, මාගේ පියාණන්ගේ දෙවු බැයෙනි මා කැටිව ගොස් කුලසතු රජය පිළිගනුව" යි කිහ. යක්ෂතෙම "මම මනුෂ්‍යයෙක් නොවෙමි" යි කියා. එකල්හි ඔහු ඇදහිය යුතු වචන ඇති දිවැස ඇති තාපසයකු ළඟට පැමිණෙව්වාහ; ඔහු විසින් පිය පුතු දෙදෙන මේ වෙනෙහි කුමක් කරමින් ඇවිදිනාහු දැයි කියා පිතෘභාවය කිකල්හි පොරිසාදතෙම එබස් අදහා "පුත තොප ඇව මව්රජයෙන් කම්නැත; මම පැවිදිවෙමි"යි කියා තාපසයන් සමීපයෙහි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවිය; එහෙයින් වදරන ලදි.

"ඉති සීලවතං හෙතූ න රකඛිං මම ජීවිතං,
පබ්බාජෙසිං වනන්නස්ස ඝද පාණාතිපාතිකං"යි (231)

ඉක්බිති මහසත්හු පැවිදිවූ තමන්ගේ මහපියාණන් වැඳ නුවර සමීපයට ගොස් "කුමාරයෝ ආහ"යි අසා තුටුපහටුවූ රජු විසින් ද නුවර වැස්සන් හා දනවු වැස්සන් විසින් ද පෙර ගමන් කරන ලද්දහු රජ්ජුරුවන් වැඳ සියලු පවත් කිහ. එබස් අසා රජ්ජුරුවෝ එකෙණෙහිම බෙර හසුරුවා මහත් පිරිවරින් ඔහු සමීපයට ගොස් "බැණනුවෙනි, එනුමැනව, රජය කළමැනවැ" යි කිහ. මහරජ, මට රජයෙන් කම් නැතැයි කොගිවිස්සේය. එසේවී නම් අපගේ උයනෙහි විසුව මැනව, එසේත් කොළුන්නෙමියි කිහ. රජ්ජුරුවෝ ආශ්‍රමයට නුදුරු තැනෙක්හි ගමක් කොට භික්ෂාව පිහිට වූසේය. ඒ වනාහි චූල කම්මාසසදම්මනිගම නම් විය.

එකල මවුපියෝ නම් මහාරාජකුලයෝ වූහ, තාපසයෝ නම් ශාරීපුත්‍ර ස්ථවිරයෝය. පොරිසාදතෙම නම් අඞ්ගුලිමාල ස්ථවිරයෝය, නැඟණිය නම් උත්පලවණ්ණාවෝය, අග මෙහෙසිය නම් රාහුල මාතාවෝය, අලීනසත්තු කුමාරයෝ නම් ලොකඤ්ඤාම්වූ බුදුරජාණන්වහන්සේ ය.

මෙහිද උන්වහන්සේගේ සෙසු පාරමිහු ඇට කියනලද පරිදි-දෙන් නිධිරණය කටයුත්තාහුය. ඒ එසේමය, පියරජු විසින් වලඤනු ලබන්නෝද තමන්ගේ දිවිපුද, උන්ගේ දිවි රක්නා පිණිස පොරිසාදයාගේ සමීපයට ගන්නෙමියි නියෝග කිරීමද, ඔහුගේ සත්ත්‍රාස දුරුකරනු පිණිස බහා තබනලද අවි ඇතිව යාමද, "තමන්ගේ ශීලය තහවුරු කළවේ ව"සි. ඔහු හා ප්‍රිය වචනයෙන් සාකච්ඡා කිරීමද, ඔහු තොගෙක් ක්‍රමයෙන් පරීක්ෂා කරන කල්හිද මරණ බියෙන් බිය නොවීමද, පියාණන් සඳහා මාගේ ශරීරය ප්‍රයෝජන කෙරෙමැයි තුටුපහටු බවද, ශක්‍රයා විසිනුත් පරීක්ෂාකිරීමට අපොහොසත්වූ සස ජාතියෙහි පවා පරිත්‍යාග පිණිස තමන්ගේ ජීවිතයාගේ නිරපෙක්ෂක භාවයාගේ දැනුම්ද, ඔහු හා එක්වීමෙහිද, වෙන්වීමෙහිද සිතෙහි විකාරයක් නොමැතිවීමද උහුගේ මහ පිය බව හා මනුෂ්‍යබව අවිපරිතාකාරයෙන් දැනගැනීමද, එහෙයින් ඔහු කුලසතු රජ-යෙහි පිහිටුවනු කැමතිබවද දහම් දෙසීමෙන් සංවේග උපදවා ශීලයෙහි පිහිටුවීමදැයි මේ ආදීහු මෙහි බෝසතාණන්ගේ ගුණානුභාවයෝ යයි විස්තර කළ යුත්තාහුය.

පරමාර්ථදීපනී නම් වර්යාපිටක අටුවාවෙහි
දෙවන හස්තිනාග වර්ගයෙහි නවවන අලීනසත්තු වර්ණනය නිමි.

(X) X සඞ්ඛපාල චරිතය

තවද මේ **පරමාර්ථදීපනී නම් වර්යාපිටක අටුවාවෙහි දෙවන හස්තිනාග වර්ගයෙහි දසවන සඞ්ඛපාල** චරිතය කියේය යත්;

නැවත අනික් චරිතයක් කියන්නෙමි. යම්කලෙක්හි මම මහත් ඍද්ධියක් ඇති දළ ම අවිකොට ඇති උග්‍රවිෂ ඇති දිවි දෙකක් ඇති නාගයන්ට අධිපතිවූ **සඞ්ඛපාල** නම් නාරජෙක් විම්ද, යන්නෙහි මේ පිළිවෙළ කථාවයි.

අපගේ ශ්‍රී මහාබොධිසත්ත්වයෝ දැන ශීලාදී කුසල්හි යෙදී බොධිපසේඡණ (සම්‍යක් සම්බොධිය පෙළීම්) වශයෙන් බඹු තොබ දෙවිමිනිස් දෙගතියෙහි සැරිසරන්නාහු එක්කලෙකැ

දෙව්සැපත් වැනි සැපත් ඇති කාඟහවතයෙහි ඉපද මහත් සෘද්ධි ඇති මහත් ආනුභාව ඇති සඞ්ඛපාල නම් කාරජාණ කෙනෙක් වූහ. උන්වහන්සේ කාල්යාමකින් ඒ සම්පත්තියෙහි විපිළිසරවෑ මනුෂ්‍යත්වමහාවය ප්‍රාර්ථනා කරමින් පෙහෙවස් විසූහ. කාඟහවතයෙහි වසතකලෑ උන්වහන්සේගේ පෙහෙවස සිඳ කොවන්නේය, සිල් කෙලසෙන්නේය, එහෙයින් උන්වහන්සේ කාඟහවතයෙන් නික්ම කණ්හවණ්ණ නම්වූ නදියට නුදුරු තන්හි මහවතකට හා පියවතකට අතර පිහිටි එක්තුඹක් දරණවැලින් වෙලා පෙහෙවස් ඉටාගෙන තුදුස්වක් පසළොස්වක් දිනයන්හි සමාදන්වූ සිල් ඇත්තෝ ප්‍රයොජන ඇති අය මාගේ සම්ආදී ගනිත්ව"යි තමන්ගේ ශරීරය දැනමුඛයෙහි පරිත්‍යාග කොට වැදහෙව සිල්රැක පැලවිය දිනයෙහි කාඟහවතයට යන්හ. එහෙයින් වදළහ:-

පුනාපරං යදා හොමි සඞ්ඛපාලෝ මහිද්ධිකෝ,
දඤ්ඤවුඩෝ කොරව්‍යෝ විජිච්‍යහෝ උරඟාගිහූ"සි (232)

මේසේ පෙහෙවස් වසන්හුවූ අපගේ මහබෝසතාණන් වහන්සේට බොහෝකාලයක් ඉක්ම ගියේය. ඉක්බිති එක්දව සක් මස්ගෙන එන්නෙමැ"යි වැදිකුලපුත්‍රයෝ සොළොස් දෙනෙක් අවිඟත් අත්ඇතිව වතයෙහි හැසිරෙන්හු කිසි වක් නොලැබ ආපසු එන්හාහ. එසල ඔව්හු සිල්සමාදන්ව ගෙන තුඹස මතු වැදහොත්හුවූ උන්වහන්සේ දැක අපි අද ගොග්පැටවකු විවරත් නොලදුම්හ. මේ කාරජ්ජුරුවන් මරා පියාකමු"යයි සිතූහ. සිතා ද වතාහි මොහු ඉතා මහත. අල්වා ගන්හාකල පලාඇන්හාහයි වැදහොත් පරිද්දෙන්ම ඔහුගේ දරණ හුලින් විදපියා දුබල කොට අල්වාගණිමැ" යි හුල්ගෙන එළඹියාහුය. බෝසත්හුගේද ශරීරය එක්දෙණි ඔරුවක් සා මහත, වටකොට තඹතලද සමන්මල්දමක් වැනිය. ඔලිඳ ඇට වැනි ඇසිත්ද දැසමන්මල් වැනි හිසිත්ද ඉතා හොඹන්ය. උන්වහන්සේ ඒ සොළොස්දෙනාගේ පියවරහඩ අසා දරණවැල අතරෙන් හිසමැත්කොට රතු ඇස් හැරපියා හුල්ඟත් අත්ඇතිව එන්හාවූ ඔවුන් දැක "අදමාගේ මතදෙළ මුදුන් පැමිණෙන්නේය" යි තමන් දැනමුඛයෙහි පරිත්‍යාගකොට "මොදුන් මාගේ ශරීරය අඞ්ගවියෙන් ඇණ සිදුරු සිදුරු කරත කල්හිද කොබලන්නෙමි" යි තමන්ගේ සිල් කඩවේ භේහෝයි බියෙන් තරව ඉටාගත් අධිෂ්ඨාන ඇතිව හිස දරණවැල අතරෙහි තබා

හොත්තාහ. ඉක්බිති ඔව්හු උන්වහන්සේ වෙතට ගොස් තෑගිවත් අල්වාගෙන අදින්නාහු බිම්හෙලා තියුණුවූ හුලින් අටතැන කින් විදපියා විදපි පහර මුවෙහි කටු ඇති කළු වේවැල් යටි බහා අටිතැනකින් කදින්ගෙන ඔහුවතට බටහ. මහසතාණෝ හුලින් විදිතැන් පටින් මේ දක්වා එකතැනකත් ඇස්හැර පියා ඔවුන් නොබැලූහ. අටකදකින් ගෙනයනු ලබන්නාවූ උන්වහන් සේගේ හිස එල්ලී බිම් වැදපියන්ට වත. ඉක්බිති ඔව්හු උන් වහන්සේගේ හිස එල්ලෙන්නේ යයි කියා මහමඟ වැදහොවා තියුණු හුලකින් තහඩ විද ලණුවක් දමා හිස ඔසවා කද කෙළ වර බැඳපියා යළිත් ඔසවාගෙන මගට පිළිපන්නාහුය.

"අදූසංසු හොජපුත්තා බරා එද්ද, අඞ්කාරුණා,
උපනච්ඡුං මමං තත්ථ දණ්ඩමුග්ගරපාණිනෝ. (235)

නාසාය විනිවිජ්ඣිත්වා නඩුතෙය පිවිත්ථණ්ඨකෙ,
කාජේ ආරොපයිත්වාන හොජපුත්තා හරිංසු මං, (236)

යනු එහෙයින් වදරනලදී.

ඉදින් උන්වහන්සේ කිපි නාසා වාතයක් හැරියාහු නම් මුහුදු කෙළවර කොට ඇති පෘථිවි වත සහිතවූ මේ මහපොළොව දවන් නේය. හළුකරන්නේය, එසඳ උන්වහන්සේ එසේ ආනුභාව සම්පන්නවුවද හුල්වලින් විදින කල ද සැතින් අනින කල ද ඒ වැදිපුත්‍රයන් කෙරෙහි කිපීම් පමණකුදු නොකළහ. මෙසේ උන් වහන්සේ සිලභෙදය වේදෙහෝසි බියෙන් වැදිපුත්‍රයන් කෙරෙහි නොකිපීම (ඒකාන්තයෙන් ජීවිතනිරපෙක්ෂභාව වශ යෙන් පැවැත්තේනුසි) ශීලපරමාර්ථ පාරමී නම් විය, එහෙයින් වදළහ.

"සසාගරනනං පඨවිං සඛානං සපබ්බතං,
ඉච්ඡමානෝ මහං තත්ථ නාසාවාතෙන ඛාපයෙ. (237)

සූලෙහි විජ්ඣයනෙනපි කොට්ටයනෙනපි සතහි,
හොජපුත්තෙ න කුපාමි එසා මෙ සීලපාරමී"ති. (238)

බෝසතාණන් වහන්සේ ඔවුන් විසින් මෙසේ ගෙනයන කල්හි මියුළුනුවරවාසිවූ ආලාර නම් කෙළෙඹියෙක් ගැල් පන්සියයක්ගෙන සැපයාතක භිඳ යන්නේ මහාසත්ත්වයන් ගෙන යන්නාවූ ඒ වැදිපුත්‍රයන් දැක කුළුණුසින් උපදවා මෙනාගයා කුමට ගෙනයවුද? ගෙනගොස් කුමක් කරවුදැ?සි විවාළේය.

ඔව්හු "මේ නාගයාගේ මස් වතාහි රස ඇත්තේය. මෝලොක්ය, ස්ථූලය, එහෙයින් පිස අනුභව කරන්නෙමු"යි කිවාහුය. ඉක්බිති හෙතෙම ඔවුන්ට ගැල් ඇදවූ ගොන් සොළොස් වාහයක්ද, එකී එකී මස්සක් බැගින්ද, හැඳීමට පෙරවීමට රෙදිපිළිද, ඔවුන්ගේ භාර්‍යාවන්ට වස්ත්‍රාභරණද දී "යහළුවෙනි, මේ මහානුභාව ඇති නාරජ්ජුරුවෝ තමන්ගේ ශීල ගුණයෙන් තොපට තෝ කිපියා හුය. මොහු වෙහෙසට පමුණුවන්නාවූ තොප විසින් බොහෝ පව් රැස්කරන ලද්දේය. ඔහු හැරපියව"යි කීවේය.

එවිට ඔව්හු කියන්නාහු "මේ වතාහි අපට මහාප ආහාරයෙක, අපි බොහෝ තයින් කෑ විරුම්හ, එසේද වුවත් තොපගේ වචනය අප විසින් පිදිය යුතුය, එබැවින් උත් හරිමුය"යි කියා මහා සත්ත්වයන් බිමතබා (තමන් දරුණු බැවින්) අවුණන ලද කටුසඟිත කළු වේවැල් කෙළවර ගෙන ගසා අදින්ට පටන් ගත්තාහුය, ඉක්බිති හෙතෙම නාගරාජයා වෙහෙසෙන්නහු දැක නොවෙහෙසාම කඩුවෙන් වේවැල් කපා ළදරුවන්ගේ කණීාභරණයන් ඉවත් කරන නියායෙන් දුක් නොකොට සෙමෙන් සෙමෙන් ඉවත් කෙළේය. එවිට වැදිපුත්‍රයෝ යම් වැලක් නාගයාගේ නාසයෙහි බහා ගැටගැසුවාහුද ඒවැල තිබියදීම නාරජ්ජුරුවන් හැරපිහ. මහාසත්ත්වයෝ මදක්තැන් පෙරදිග බලා ගොස් සඳුළු පිරුණු ඇසින් ආළාරයන් දිසාව බැලූහ. වැද්දෝ මදක් තැන් ගොස් නාරජහු දැන් දුබලයහ, ඔහු මළවිට හැරගෙනම යමුයයි සැහවුනෝය. ආළාරතෙම මහාසත්ත්වයන්හට ඇදිලි බැඳ "නාරජ්ජුරුවෙනි, වඩිනු මැනව. තැවත වැද්දෝ ඔබ නහමක් අල්වා ගනිත් වාහි කියමින් මදක් තැන් දුර නාගයා අනුව ගොස් නැවතුනේය. බොධිසත්ත්වයෝ නාගභවනයට ගොස් එහි ප්‍රමාද නොකොට මහත් පිරිවරින් නික්ම ආළාරයන් කරා එළඹ නාලොව වරුණ. පාපියා ඔහු එහි ගෙනගොස් නාගකන්‍යාවන් තුන්සියයක් සමඟ මහත් සම්පත්දී දිව්‍යකාමයෙන් සන්තර්පණය කළහ. ආළාරතෙම නාගභවනයෙහි අවුරුද්දක් වැස දිව්‍යකාම යත් අනුභවකොට පියා පැවිදිවනු කැමතිව ඒබව බෝසතාණන්ට කීය. ඉක්බිති හෙතෙම පැවිදි පිරිකර ගෙන එයින් නික්ම හිමවතට ගොස් පැවිදිව එහි බොහෝ කලක් වැස මැත කාලයෙහි චාරිකාවෙහි හැසිරෙමින් බරණැසට පැමිණ බරණැස්රජු සමඟ එක්වූයේය. රජ්ජුරුවෝ ඔහුගේ ආචාර සම්පත්තියෙහි පැහැද "ඔබ මහත්සම්පත් ඇති කුලයකින් අවුත් පැවිදි-

වූයෙහියයි සිතම්හ, කවර කාරණ කින් පැවිදි වූයෙහිදැ"යි විචාළහ. භෙතෙම තමන් පැවිදිවූ කාරණය කියන්නේ වැදිදන් අතින් මහා සත්ත්වයන් මිදවීම ආදිකොට සියලු ප්‍රවෘත්තිය රජ්ජුවට කියා මේ මතු දක්වන ගථාවන්ගෙන් දහම් දෙසූයේය.

175. දිට්ඨා මයෘ මානුසකා ව කාමා අත්‍යසතා විපරිණාමධම්මා,
ආදීනවං කාමගුණෙසු දිස්වා සද්ධායාහං පබ්බජිතොම්හි රාජ.

176 දුම්පඵලානෙව පතන්ති මාතවා
දහරා ව වුඩ්ඪා ව සරීරභෙදා,
එතම්පි දිස්වා පබ්බජිතොම්හි රාජ
අපණ්ණකං සාමඤ්ඤමේව සෙය්‍යො.

එහි අර්ථ:— "මහ රජ්ජුරුවෙනි, මානුෂිකවූද දිව්‍යමයවූද පඤ්චකාමයෝ දක්නාලදහ "ඔව්හු අනාසවාදයහ. පෙරලෙත සවහාව ඇත්තාහ" යි මෙසේ කාමගුණයෙහි ආදීනව දැන මම සැදුහැයෙන් පැවිදිවීමි. තවද යම්සේ ගසින් පැසී තොපැසී ඉඹි බිම හෙද්ද, එසේම ළදරුවූද මහලුවූද සත්ත්වයෝ මරණින් බිම හෙත්තාහ මිහරජාණනි. එහෙයින් නෛෂ්ක්‍රාමිකවූ ප්‍රව්‍රජ්‍යාවම උතුම්යි ප්‍රව්‍රජ්‍යාවෙහි ගුණ දැක පැවිදිවීමි"යනුයි. ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු.

177. අද්ධා හවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඤාත විඤ්ඤිනො,
තාගඤ්ච සුත්වාන තුවං වළාර
කාරොම් පුඤ්ඤානි අනප්පකානි,

යනුවෙන් බහුශ්‍රැතවූ බොහෝ කරුණු දන්නාවූ පණ්ඩිතයෝ එකාන්තයෙන්ම සේවනය කටයුත්තාහ. එහෙයින්, ආළාරයෙනි, එසේ අප්‍රමාද විහරණ ඇති තාපසරාජයාගේද තොපගේද වචන අසා බොහෝ කුසල් කෙරෙමියි කීහ. ඉක්බිති තාපස තෙම:—

178. අද්ධාහවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඤාත විඤ්ඤිනො,
තාගඤ්ච සුත්වාන මමඤ්ච රාජ
කරොහි පුඤ්ඤානි අනප්පකානි,

යනුවෙන් බහුශ්‍රැතවූ බොහෝ කාරණා දන්නාවූ පණ්ඩිතයෝ එකාන්තයෙන් සෙවනය කටයුත්තාහ. මහරජ්ජුරුවෙනි, මාගේද තාගරාජයාගේද වචන අසා අප්‍රමාදව බොහෝ කුසල් කරව"හි කීය

මෙසේ ධර්මදෙශනා කොට වස් සාරම්භ එහිම වැසැ තැවත නිම්වතට හොස් දිවි ඇති තෙක් සතර බ්‍රහ්ම විහාර භාවනා වඩා බඹලොව උපන්නේය. බොධිසත්ත්වයෝද දිවි ඇතිතෙක් පෙහෙවස් වැස දෙව්ලොව වැඩසේක. රජ්ජුරුවෝත් දානාදි පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

එකල ආලාර තාපසයෝ තම ශාරිපුත්‍රස්ථවිරයෝය, බරණැස රජ්ජුරුවෝ තම ආනන්දස්ථවිරයෝය, ඝණ්ඨපාලනාගරාජයෝ තම ලොකඤ්ඤාමින් වහන්සේය.

උත්වහන්සේගේ ශරීර පරිත්‍යාගය වනාහි දානපාරමී තම විශ තෙජසින් යුක්තවූ බොධිසත්ත්වයන්ගේ ඇටකී පරිදි පිඬා ඇති කල්හිද ශීල හෙද නොකිරීම ශීල පාරමී තම, දෙව්ලෝ සැප හා සමාන සම්පත් හැරපියා නාගභවනයෙන් නික්ම ශ්‍රමණ ධර්මය රැකීම නෛෂ්ක්‍රම්‍ය පාරමී තම, දානාදි පින්කම් සඳහා මේ මේ දේ කළයුතුය කියා විධාන කිරීම ප්‍රඥා පාරමී තම, කාමවිතර්කය විනොදනයද අධිවාසන වීර්යයද වීර්‍යපාරමී තම, අධිවාසනක්ෂාන්ති නොමෝ ක්ෂාන්ති පාරමී තම, සත්‍ය සමාදානය සත්‍යපාරමී තම, අවල සමාදානාධිෂ්ඨානය අධිෂ්ඨාන පාරමී තම, වැදිපුත්‍රයන් පටන් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී කරුණා ඇති බව මෛත්‍රී පාරමී තම, වෙදනාවෙහිද සත්ත්වයන් කළ විප්‍රකාරයෙහිද මධ්‍යස්ථතාව උපෙක්ෂා පාරමී තමැයි මෙසේ මේ චරියාවෙහි දස පාරමීහුම ලැබෙත්, ශීල ආරම්භතාව වනාහි බලවත් නුයි එයම දෙශනාවට ආරුඪ කරන ලදී.

එසේම මේ කථාවෙහිද බොධිසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ "යොජන සතිකෙ නාගභවනට්ඨානෙ" යනාදීන් හුරිදත්ත චරිතයෙහි කියන ලද පරිද්දෙන් සුදුසු පරිදි විස්තර කළ යුත්තාහ.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි
දෙවන හඤ්ඡිනාගවගියෙහි දසවන ඝණ්ඨපාලචරිතය නිමි,

දැන් යථොක්ත හස්තිනාගාදි දශචරිතයන් හෙතෙහැර දක්වන්
වර්ය නිගමනය කරත්:—

"හත්ථිනාගෙ භූරිදත්තෙ චම්පෙය්‍යෙ බොධි මාහිසෙ,
රුරු මාතඞ්ගෙ ධම්මෙ ච අනුජෙ ච ජයද්දිසෙ. (239)

එතෙ සබ්බෙ සීලබලා පරික්ඛාරා පදෙඛිකා,
ජීවිතං පරිච්චජ්ජිත්වා සීලානි අනුරක්ඛිසං. (240)

සඞ්ඛපාලස්ස මෙ සතො සබ්බඤ්ඤුත්තමම්පි ජීවිතං
යස්ස කස්සචි නියනතං තස්මා සා සීලපාරමී"සි (241).

මාතුපොසක හස්තිනාගයන්ද, භූරිදත්ත නම් නාගරාජයන්ද,
චම්පෙය්‍ය නම් නාගරාජයන්ද, චුළ්ලබොධි නම් පරිබ්‍රාජකයන්ද, මහිස
රාජයන්ද, රුරුනම් මෘගරාජයන්ද, මාතඞ්ග නම් පණ්ඩිතයන්ද,
ධම්මනම් දිව්‍යපුත්‍රයන්ද, ජයද්දිස රජහුගේ පුත්‍රවූ අලීන සත්තු
කුමාරයන්ද, යන මොඛ හැමදෙන ශීලයම බල කොට ඇත්තාහ.
(හෙවත් විශෙෂයෙන් සීලපාරමිතාව පිරූහ) සීලයම උපකරණ
හෝ පිරිවරකොට ඇත්තාහු වූහ. (හෙවත් පරමාර්ථ පාරමිභූත
ශීලයට පිරිවරකොටද සන්තානයාගේ පරිභාවනා වශයෙන්
සකස්කොටද ඇත්තෝ) වූහ. එහෙයින් ප්‍රදෙශ ශීලයෙන්
යුක්තවූහ. හෙවත් උත්කෘෂ්ටභාවයට ගියාවූ ශීලපරමාර්ථ
පාරමිතාවෙන් යුක්ත නො වූහ.

මේ හස්තිනාග වර්ය්‍යාදියෙහි "මම මාගේ ජීවිතය එකදෙශය
කින් රැක සිල් රක්කෙමි. එකාන්තයෙන් වනාහි මා සඞ්ඛපාල
ව සිටියදී හැම වේලේම ජීවිතය යම්කිසිවකුට පරිත්‍යාග කරන
ලද්දේද, එහෙයින් පරමත් බවට පැමිණි ඕතොමෝ මාගේ ශීල
පරමාර්ථ පාරමිය"යි දක්වයි.

පරමාර්ථදීපනී නම් චර්යාපිටක අට්ඨාවෙහි
චර්යා දශයකින් සංගෘහීතවූ විශෙෂයෙන් ශීලපාරමී
විභාවනය කරන්නාවූ
ඡිනිය හස්තිනාග වර්ණනය නිමි.

(XX) 1 යුධඤ්ජය චරිතය.

තවද මේ පරමාර්ථදීපනී නම් වර්ගයාපිටින අටුවාවෙහි තුන්වන යුධඤ්ජය වගියෙහි ප්‍රථම යුධඤ්ජය චරිතය කියෙයි යත්?

"යදා අහං අම්හාකං සත්ථා රාජපුත්තෝ යුධඤ්ජයෝ" යි.

වදාළ කයින් යම් කෙලෙක්හි මම රම්ම නගරයෙහි සබ්බදත්ත රජහුගේ පුත්‍රවූ අප්‍රමාණ කීර්ති ඇති යුධඤ්ජය නම්වූ රාජ පුත්‍රයෙක් වීම්ද, යන මෙහි මේ පිළිවෙළ කථාව වන්නේය.

අවබිය දවස රම්ම නගරයෙහි සබ්බදත්ත නම් රජ්ජුරු කෙනෙක් රජය කළහ. උන්ට දහසක් පමණ පුත්‍රයෝ වූහ. වැඩි මාලු පුතණුවෝ අපගේ ශ්‍රී මහා බොධිසත්ත්වයන් වහන්සේය. මහ රජ්ජුරුවෝ උන්ට යුවරජය දුන්හ. උන්වහන්සේ දවස්පතා මහදන් පැවැත්වූහ. මෙසේ කල් යන්යන් අපගේ බොධිසත්ත්වයන් වහන්සේ එක් දවසක් උදැසනක් සේම උතුම් රථයට නැගී මහත්වූ ශ්‍රී සම්පත්තියෙන් යුක්තව උයන් කෙළියට යන්නෝ ගස් අග, නඟ අග, අතු අග, මකුළුදැල් ආදියෙහි මුතුදැල් සේ එල්ලුනාවූ පිනිබිඳු දැක රියදුරු අමතා මේ කුමක්දැයි විවාළහ. "දෙවයන් වහන්ස, මේ හිමපාත සමයෙහි වැටෙන්නාවූ පිනිබිඳුය"යි හෙතෙම කිය. උන්වහන්සේ දිවාභාගයෙහි උයන් කෙළිකෙළ සවස් වේලෙහි ප්‍රත්‍යාගමනයෑ කරන්නෝ ඒ පිනිබිඳු නොදැක "යහළු, සාරථියෙනි, ඒ පිනිබිඳු කොහිද? දැන් ඒවා නොදකිමි"යි කිහ. "දෙවයන්වහන්ස, ඒ පිනිබිඳු හිරු නගින කලැ වියලී යන්නේය." යි කිහ, යම්සේ මේ පිනිබිඳු ඉපද නැතිවේද, එසේම මේ සත්ත්වයන්ගේ ජීවිත සංඛ්‍යාරයෝද තණ අග පිණිබිඳු වැනියහ. එහෙයින් ව්‍යාධි ජරාමරණාදි පීඩාවන්ට පෙරම මවුපියන් විචාරා මා විසින් පැවිදිවන්ට වටියයි පිනිබිඳුම අරමුණු කොට භවත්‍රය හිතිගෙන දිලිසෙන්නාක් මෙන් දැකැ තමන්ගේ ගෙට ගොස් සරසා පිළියෙළ කරනලද විනිශ්චය ශාලාවෙහි උන්නාවූ පියාණන් සමීපයට ගොස් වැඳ එකත්පසෙක සිටැ පැවිදිවන්ට අනුමති ඉල්ලූහ. එහෙයින් වදාළහ.

"උසසාව භික්ඛුං සුදිසාතාපෙ පතිතං දිසවාන සංවිජිං (242)

තසසසුවාධිපතිං කතවා සංවෙග මනු බ්‍රූහයිං,
මාතාපිතුව වන්දිතවා පබ්බජ්ජමනුසාවහං" යි (243)

මෙසේ ඒ මහාසත්ත්වයන් පැවිද්දට අනුමති ඉල්ලූ කල්හි "යුව රජ්ජුරුවෝ සුධසඳුරුවන කුමාරයෝ පැවිදිවනු කැමැත්තාහ" යි නුවර මහත් කොලාහලයක් විය.

එසමයෙහි කසිරට වාසිහු රජ්ජුරුවන් දැකීමට අවුත් රමණීය නගරයෙහි වෙසෙත්. ඔව්හු හැමදෙනම (එහි) රැස්වූවාහුය. මෙසේ පිරිවර සහිත රජ්ජුරුවෝද නියම්ගම් වැස්සෝද, ජනපද වැස්සෝද, බොධිසත්ත්වයන් වහන්සේගේ මැණියන් වහන්සේද, සියලු අන්තඃපුර සත්‍රිහුද "පුත කුමාරයෙනි, පැවිදි නොවව" සි වැලැකුවාහුය. එසල්හි පියරජ්ජුරුවෝ "ඉදින් තොපට පඤ්ච කාමයෙන් අඩුවක් වී නම් මම ඒ සම්පූර්ණ කරම්. අදම රජය පිළිගනුව" සි කිහ. එවිට මහා සත්ත්වයෝ තමන් පැවිද්දට කැමති බව පිය මහරජාණන්වහට කිහ.

එහෙයින් කීහ:—

179. මා මං දෙව නිවාරෙහි පබ්බජ්ජනනා රථෙසහ,
මා මං කාමෙහි සම්මත්තෙනා ජරාය වසමන්වගූ, ති" යි.

එහි අර්ථ නම්:—"රථෙෂ්ඨතමයෙනි, මා කාමයෙන් මත්ව ජරාවගේ වශගයට නොයන්නෙමි වෙමිද, එහෙයින් පැවිදිවන්නාවූ මා නොවලකනු මැනවි" යනුයි. ඒ කරුණ අසා අන්තඃපුර සත්‍රින් සමග ඇසු දුටු සියල්ලන්ට කරුණා උපදවන අයුරු අඬන්නාවූ මැණියන්ට තමන්ගේ පැවිදිවීමට කාරණය කිහ.

180. උසසාවොව තිණගහණිහි සුරියසසුගතාවිතං පති,
එවම්පාසු මනුසසාතං මාමං අමම නිවාරය" යි.

එහි අර්ථනම්:—"මැණියනි, තණ අග පිනිබිඳු යම්සේ හිරු නගින කල්හි විනාශයට පැමිණේද, එපරිද්දෙන්ම මේ මනුෂ්‍ය

යන්ගේ ආයුෂ ද සවල්ප වේ. මේබඳුවූ ලොකයෙහි ඔබ මෑ බොහෝ කලක් කෙසේ දක්නහුද (තොදැක්ක හැකිමැයි) එහෙයින් මැණියන් වහන්ස, මෑ තොවලකනු මැනව" යනුයි.

මෙසේ මවුපියාදීන් විසින් තොසෙක් පරිදෙන් යාච්ඤා කරනු ලබන කල්හිත් වැඩී ගිය සංවෙග ඇති බැවින් තොපසු බස්නා සිත් ඇත්තෝ ඉතා ප්‍රියවූ මහා ඥතිවගීයා කෙරෙහිත් මහත් රාජ ඓශ්වර්‍යයෙහිත් අපෙක්ෂා රහිත සිත් ඇතිවෑ හිහිගෙන් නික්ම පැවිදිවූහ.

එහෙයින් වදාළහ.

"යාචනති මං පඤ්ජලිකා සහනෙගමා සරටඨකා,
අජජාව පුත්ත පවිපජ්ජ ඉද්ධං ඵීතං මහාමකිං. (244)

සරාජකෙ සඛරොධෙ සහනගමෙ සරටඨකෙ,
කරුණං පරිදෙවනෙන අනපෙකෙඛා පරිවජීං"ඩි. (245).

දැන් යමක් සඳහා චක්‍රවර්තිශ්‍රියක් බදුවූ රාජශ්‍රියද ප්‍රියතර ඥතිබාන්ධවයන්ද හැර ස්තිග්ධවූ පරිග්‍රහ පරිජනයාද ලොකාභිමත මහත් යසසද නිරපෙක්ෂවැ පරිත්‍යාග කෙළේද, ඒ දක්වනු සඳහා:—

"කෙවලං පඨවිං රජජං ඤාතී පරිජනං යසං,
චජමානො න විනෙනසිං බොධියාඅෙව කාරණා. (246.)

මාතාපිතා නමෙ දෙසුා න පි මෙ දදසුං මහායසං,
සබ්බඤ්ඤුතං පියං මයහා තසමා රජජං පරිවජීනහි (247)ඩි

එහි අර්ථය නම්:—සාගරපරියන්තවූ සියලු පොළොවද, රාජ්‍ය ශ්‍රියද ඥතිවගීයාද පරිවාර ජනයාද සයසද පැවිදිවෙමියි සිතා පරිත්‍යාග කරමින් සම්‍යක් සම්බොධිය කාරණකොට ඒ පරිත්‍යාග යෙහි මදකුත් ලග්න නොවීම්.

මට මවුපියෝ අප්‍රියයෝ නොවෙති. ඒසා මහත් ඓශ්වර්‍යයද, අප්‍රිය නොවෙයි, එසේ වුවත් යම්හෙයකින් මට සම්බුදභාවයම මවුපියාදීන්ට වඩා ශතගුණයෙන් සහස්‍ර ගුණයෙන් ප්‍රියවේද, එහෙයින් මවුපියාදීන් සහිතවූ රාජ්‍යය පරිත්‍යාග කෙළෙමි" යනුයි.

මහාසත්ත්වයන් වහන්සේ ඒ සියලු දේ පරිත්‍යාග කොට ප්‍රව්‍රජ්‍යාවට නික්මෙන කල්හි උන්වහන්සේගේ බාල මල්වූ සුබ්‍රහ්මරාජ කුමාරයෝ පියාණන් වැද ප්‍රව්‍රජ්‍යාව අනුදන්වාගෙන බොධිසත්ත්වයන් ලුහුබැන්දාහ. ඒ දෙබෑයෝම මහජනයා නවත්වා හිමාලය වනයට පැමිණ සිත්කලු තැනෙකැ අසපුවක් කොට ගෙන සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානාභිඥ උපදවා වනමූල් ඵලාදියෙන් දිවි පවත්වා බඹලොව හිඟෝය, එහෙයින් වදුළහ, භාග්‍ය වතුන් වහන්සේ:—

181. උභෝ කුමාරා පබ්බජිතා සුධසත්තෝ සුබ්‍රහ්මරාජා
පහාය මාතාපිතරෝ සඞ්ගං ඡෙත්වාන මච්චුනෝ"ති,

එකල මව්පියෝ නම් මහා රාජකුලයෝ වූවාහුය. සුබ්‍රහ්මරාජ කුමාරයෝ නම් ආනන්දසාරිපුත්‍රයෝය, සුධසත්ත්ව කුමාරයෝ නම් ලොකස්වාමි බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ ගේ පැවිදිවීමට පෙර පවත්වනලද මහාදානයෝද රාජ්‍යාදි පරිත්‍යාගයෝද දානපාරමිතාය. කායවාක් සංවරය සීලපාරමී නම. ප්‍රව්‍රජ්‍යාදි ධ්‍යානාභිඥාසමාපත්තිය නෙක්ඛම්ම පාරමී නම. අනිත්‍යාදි ලක්ෂණ මෙනෙහි කිරීම පටන් අභිඥාභිඥාසමාපත්තිය අවසන්කොට ප්‍රඥාව ද, දානාදීන්ට උපකාරානුපකාර ධර්මයන් පරිග්‍රහණය කරන ප්‍රඥාවද ප්‍රඥාපාරමී නම, සියලු තත්හි තදර්ථ සාධන වීර්‍යය වීර්‍ය්‍ය පාරමී නම, ඥානක්ෂාන්ති හා අධිවාසන ක්ෂාන්තිය ක්ෂාන්තිපාරමී නම. ප්‍රතිඥාවගේ අවිසංවාදනය සත්‍යපාරමී නම, සියලු තත්හි අචල සමාදානයාගේ අධිෂ්ඨානය අධිෂ්ඨානපාරමී නම, සියලු සත්ත්වයන් කෙරෙහි හිත සිත් ඇති බවද, මෛත්‍රී බ්‍රහ්මවිහාර ඇතිබවද, මෙත්තාපාරමී නම, සත්ත්වසංස්කාරයන් විසින් කරතලද විප්‍රකාරයන් කෙරෙහි උදාසීන භාවයද, බ්‍රහ්ම විහාර වශයෙන් උපෙක්ෂාවද. උපෙක්ෂාපාරමී නමැති මේසේ මෙම වර්ත්තියෙහි දශපාරමිතාම ලැබෙන්. විශෙෂයෙන් වනාහි නෙක්ඛම්ම පාරමිතාව දනයුත්තේය. අකිර්ති වර්ත්තියෙහි මෙන් මේහිද මහා පුරුෂයන්ගේ ආශ්චර්‍ය්‍ය ගුණානුභාවයෝ සුදුසු පරිදිදෙන් නිඛාරණය කටයුත්තාහුය.

"එවං අච්ඡරියා එතෙ-පෙ-අනුධම්මතෝ"ති සී.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි තුන්වන සුධසත්ත්ව වර්ණනයෙහි ප්‍රථම සුධසත්ත්වචරිතය නිමි.

(XX) II සොමනස්ස චරිතය

තවද මේ පරමාර්ථ දීපනී නම් වර්යාපිටක අට්ඨාවෙහි තුන්වන බුඛසැප්ත වර්ණයෙහි දෙවන සොමනස්ස චරිතය කියේය යත්:-

පුනා'පරං යදා හොමි ඉඤ්ජනේන පුරෙනෙ,
කාමිතෝ දයිතෝ පුනේනා සොමනස්සා'ති විස්සුතෝ. (248)

සීලවා ගුණසම්පන්නෝ කල්‍යාණපටිභානවා,
වුඩ්ඪා'පචායි ගිරිමා සඩ්ඝහෙතු ච කොවිදෝ. (249)

තස්ස රඤ්ඤෝ පතිඛ්ඛරෝ අහොසි කුහඛ්ඛනපාසෝ,
ආරාමං මාලාවච්ඡඤ්ච රොපයිත්වාන ජීවති. (250)

යනුවෙන් "නැවත අනිකුදු චරිතයක් කියන්නෙමි. යම් කලෙක මම ඉඳිපන්නුවර මවු පියාදීන් විසින් පතන ලද්දාවූ ප්‍රියකරන ලද්දාවූ සිල් ඇත්තාවූ ගුණ ඇත්තාවූ යහපත් ප්‍රතිභාන ඇති ජාතිවාඩ තපොවාඩයන් පුදතසුලුවූ පාපයට පිළිකුල් කරන්නාවූ දැතය, ප්‍රිය වචනය; අර්ථවාග්මී, සම්මාත්ම තායයි කියන ලද සිවුසඟරාවෙහි සුදුසු පරිදි සත්ත්වයන් සංග්‍රහ කිරීමෙහි දක්ෂවූ සොමනස්ස යයි ප්‍රසිද්ධවූ රේණු නම් කුරුරජහුගේ පුත්‍රයෙක් වීමිද, එකල්හි ඒ රජු විසින් සත්කාර කරනු ලබන්නාවූ කුහක කමින් දිවි රක්නාවූ එක් තවුසෙක් විය. හෙතෙම ඵලෝද්‍යාන හා මාලෝද්‍යාන රොපණය කොට එයින් ජීවත් වන්නේය යන්නෙහි. මේ පිළිවෙළ කතාවයි:-

එකල මහාරක්ඛිත නම්වූ තාපස කෙනෙක් පන්සියයක් පමණ තවුසන් පිරිවැරුවාහු හිමාලයෙහි වැස ලුණු ඇඹුල් සෙවනා පිණිස ජාහපද වාරිකාවෙහි හැසිරෙමින් ඉඳිපන් නුවරට පැමිණ රාජෝද්‍යානයෙහි සැතපී පිරිස සහිතවැ හැසිරෙන්නාහු රාජචාරයට පැමිණියහ. රජ්ජුරුවෝ තවුසන් දැක ඔවුන්ගේ ඊර්ෂ්‍යා පථයෙහි පැහැද සරසා පිළියෙළ කළාවූ උඩු මහල් තලයෙහි ඔවුන් වැඩ හිඳුවා මධ්‍යාහ්න භෝජනය වැළඳවූහ. ඉක්බිති රජ්ජුරුවෝ "ස්වාමීනි, මේ වස්සානකාලය මාගේ උයනෙහිම විසුවමැනවැ"යි කියා උන්වහන්සේලා සමඟ උයනට ගොස්

වාසස්ථාන කරවාපියා ශ්‍රමණ පරිෂ්කාර දී උඇතින් නික්ම ගියහ. එතැන්පටන් ඒ සියල්ලෝම රජ ගෙදර වළඳත්. ඒ රජ්ජුරුවන්ට වතාහි දරුවෝ නැත්තාහ. ප්‍රාර්ථනා කොටත් දරුවන් නොලබත්තාහ. වස්සාන කාලයෙන් පසු මහාරක්ඛිත තාපසයෝ "හිමවතට යමිහ"යි රජ්ජුරුවන් විචාළහ. රජ්ජුරුවෝ උන්වහන්සේලාට සත්කාර සම්මාන කළහ. ඉක්බිත මහා රක්ඛිත තාපසයෝ උඇතින් නික්ම අතර මගදී මද්දහන වේලෙහි මයින් ඉවත්ව ගත සෙවන ඇති රුකක් මූල පිරිස් සහිතව හුන්හ. එකල්හි තාපසවරු මෙබඳු කතාවක් ඉපද වූවාහුය. කෙබඳුද යත්:- "රජ්ජුරුවන්ට වතාහි දරුවෝ නැත්තාහ. ඉදින් රජහට පුතෙක් ලැබෙත්නේ නම් යහපතැ"යි. මහාරක්ඛිත තාපසයෝ එබස් අසා රජහට පුතෙක් ලැබෙත්නේ දෙහෝයි නොලැබේ දෙහෝයි පරීක්ෂා කරත්තාහු ලැබෙත්නේ යයි දැන ඔවුන්ට මෙසේ කීහ. "තපස්වරුනි, තෝප ඒ හැන කතස්සලු නොවෙනු මැනව, අද අලුයම් වේලෙහි එක් දිව්‍ය පුත්‍රයෙක් දෙව්ලොවින් චුතව රජහුගේ අග මෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්තේය"යි.

ඒ අසා එක් සොර තවුසෙක් "මේ හේතුවෙන් රජ්ජුරුවන්ගේ කුලූපඝයෙක් වත්තෙමැ"යි සිතා තවුසන් යනකල සොර ලෙඩ ගෙන වැදහොත්තේය. තවුසන් විසින් එහු මැනව, යම්හයි කී කල "නොහැක්කේය"යි කීය. මහා රක්ඛිතයෝ ඔහු වැදහොත් කාරණය දැන "යම් කලෙක හැකි නම් එකල එව"යි කියා තවුසන් ගෙන හිමවතටම ගියහ. කොහොන් තවුස් යළි වෙහයෙන් හොස් වහසල් දෙර සිට මහා රක්ඛිත තාපසයන්ගේ සෙවක තාපසයෙක් ආයේ යයි, රජහට දන්වා යැවුයේය. හෙතෙම රජ්ජුරුවන් විසින් කැඳවන ලද්දේ පහෑට නැගී පැනවූ අස්තෙහි හුන්නේය. රජ්ජුරුවෝ තවුසාණන්වැඳ එකත් පසෙක හිඳ තවුසුන්ගේ සුවදුක් විචාරා "වහන්ස. යුහුව හැරී ආයේ කවර හෙයින්ද"යි ඇසූහ. මහරජාණනි, තවුස් ගණයා සැපසේ හුන්නාහු "රජහට වංශානු රක්ෂක කුමාරයෙක් උපන්නේ නම් යෙහෙකැ"යි කතාවක් ඉපදෙව්වාහුය. මම ඒ කතාව අසා රජහට කුමාර කෙනෙක් උපදින්නාහු දෙහෝයි නැද්දෙහෝයි දිවැසින් බලන්නෙම් මහත් යෑඩි ඇති දිව්‍ය පුත්‍රයෙක් දෙව්ලොවින් සැව අගමෙහෙසුන් සුබමී නම් බිසවුන් කුස උපදින්නේ

යයි දැක එපවත් නොදන්නාහු ඒ දරුණුබ සසාපු තම් තපු රයි සිතා ඒ බව ඔබට කියන්නට ආමි. මම ඔබට ඒ තතු කීමි, දැන් මම යමියි කීයේය. රජ්ජුරුවෝ තුටු පහටු සිත් ඇත්තෝ පහන් සිත් ඇත්තෝ "සවාමීනි, නොවැඩිය මැනවැ"යි ඔහු උයනට කැඳවාගෙන ගොස් වසඳතැන් සලසා දුන්හ. එතැන් පටන් හෙතෙම රජකුලෙහි අනුභව කෙරෙමින් වෙසෙයි. ඕහට දීඛ්ඛවක්ඛු කියා නම් වූයේය.

එකල අප මහා බොධිසත්ත්වයන් වහන්සේ තවුතිසා දෙව්ලොවින් චුතව එතුවර රජමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්හ. උපන්නාවූ උන්වහන්සේට නම් තබන දවස් සොම් නසස කියා නමක් කළාහුය. උන්වහන්සේ කුමර පෙරහරින් වැඩෙන සේක. කුහක තාපස තෙමේ උයනෙහි එකත් පසෙකැ තොයෙක් ආකාර මිළුවට නිසි තම්පලා ආදියද, පලවැල් ආදියද වවා වෙළඳුන් අතටදී විකුණමින් ධන රැස් කෙරෙයි. ඉක්බිති බොධිසත්ත්වයන් සත්හැවිරිදි කල රජ්ජුරුවන්ගේ පසල්දතව්වක් කිපුනේය. රජ්ජුරුවෝ කුමරුන් අමතා කියන්නාහු "පුතණුවෙනි, දිබ්බවක්ඛු තාපසයන් කෙරෙහි නහමක් ප්‍රමාද වෙව"යි කුමාරයන්ව පාවාදී පසල්දතව්ව සංසිඳවීමට හිඟේය. ඉක්බිති එක්දවසක් කුමාරයෝ සොරතවුසා බලන්නෙමැයි උයනට ගොස් ගැට ඇති එක් සසාවතක් හැඳගෙන එක සසාවතක් පොරවාගෙන දෙයතින් කල දෙකක් ගෙන එලවලු වත්තෙහි වතුර වත්කරන්නාවූ සොරතවුසා දැක මෙසේ සිතූහ. "මේ සොරතවුස් තමාගේ මහණදම් නොසොටි වෙළඳුම් කෙරේය"යි. ඉක්බිති 'පලාකොළ ගොවියාණෙනි, කුමක් කරන්නෙහිදැ"යි කියා ඔහු ලජ්ජා කරවා නොවැදම උයනින් නික්මුණාහ. එවිට සොර තවුස්තෙම සිතනුයේ "මේ කුමාරතෙම මේ අවසථාවෙහිම මෙබඳු සවභාව ඇත්තේය, පසුව කුමක් කරන්නේදැයි කවරෙක් දනිද, දැන්ම ඔහු තසා පියන්නට වටනේය"යි සිතා රජ්ජුරුවන් එන්නාවූ කාලයේදී ගල්පුවරුම එකත්පසෙක දමා පැන්කලය බිඳ පන්සලෙහි තණකොළ විසුරුවා ඇතෙල් ගල්වාගෙන පන්සලට වැද හිසවසා පොරවාගෙන මහත් දුකට පැමිණියකු මෙන් ඇදෙහි වැදහොත්තේය. රජ්ජුරුවෝ අවුත් නුවර පැදකුණු කොට රජවාසලට නොවැදම මාගේ සවාමිවූ දිබ්බවක්ඛු තාපසයන් දකිමියි පන්සල දොරකඩට ගොස් ඒ විප්‍රකාරය දැක

ය'මේ කිතම් කාරණයක්ද"සි ඇතුළට වැද වැද හොත්තාවූ ඔහු දැක පා පිරිමදිමින් මේසේ විවාලේය. "සැමිනි, කව රකු විසින් කුඩවහන්සේට මේසේ පීඩාකරන ලද්දේද? මම ඔහු අද යමලොවට පවුණුවම්; ඔහු මට වහා කියනු මැනවැ"සි. ඒ අසා සොර තවුස්තෙම කෙදිරිගාමින් නැගිට "මහ රජ්ජුරුවන් වහන්ස, ඔබවහන්සේගේ පුතණුවන් විසින් මම මේසේ වෙහෙසට පමුණුවන ලද්දෙමි"සි කීය. රජ්ජුරුවෝ ඒ අසා චොරඝාතකයන් අණකළහ. "යව, හොස් කුමාරයන් ගේ හිස කපා ශරීරයත් කඩකඩකොට කපා විපියක් විපියක් පාසා දමව්ය"සි. ඔව්හු මැණියන් විසින් සරසා තමන්ගේ ඇක යෙහි හොවනලද කුමාරයන් ඇදිදහුය. ඔබට රජ්ජුරුවන් විසින් වධාඥ කරන ලද්දේයයි කියයි. කුමාරයෝ මරණ බයින් බියපත්වූවෝ මැණියන්ගේ ඇකයෙන් නැගිට මට රජ් ජුරුවන් දක්වාලව්, රාජකෘත්‍ය ඇත්තාහයි කිහ. ඔව්හු කුමා රයන්ගේ වචනය අසා මරන්ට නොහැක්කාහු ගොනකු මෙන් රැහැනින් ඇදගෙන ගොස් රජහට දැක්වූවාහුය. එහෙ යින් වදළහ:

"නමහං දිස්වාන කුහකං ථූසරාසිංව තණ්ඩුලං,
දුමං අනෙනා ච සුසිරං කදලිංව අසාරකං. (251)

නත්ථිමස්ස සතං ධම්මෝ සාමඤඤා'පගතෝ අයං,
හිංසුකාඛම්ම ජානිතෝ ජීවිතවුත්තිකාරණා. (252)

කුපිතෝ අහොසි පච්චනෙනා අවචි පරනතිගි,
තං නිසෙධෙතුං නච්ඡනෙනා අනුසාසි පිතා මමං. (253)

මා පමජ්ජි තුවං තාත ජටිලං උගගතාපනං,
යදිච්ඡකං පවතෙතාහි සබ්බකාම දදෙ හි සෝ. (254)

තමහං ඉන්ඩා'නුපථ්‍යානං ඉදං වචන මබ්‍රැවිං,
කච්චි තෙ ගහපති කුසලං කිං වා තෙ ආහරියතු (255)

තෙන සෝ කුපිතෝ ආසි කුහකෝ මානනිසසිතෝ,
ඝාතාපෙමි තුවං අජ්ජ රථා පබ්බජ්ජයාමි වා. (256)

නිසෙධෙත්වා පච්චනතං රාජා කුහකමබ්‍රැවි,
කච්චිතෙ හනෙන බ්‍රහ්මනියං සම්මානෙ තෙ පවතතිතෝ.

තස්ස ආචික්ඛති පාපපා කුමාරෝ යථානාසියෝ, (257)
තස්ස තං වචනං සුත්වා ආණාපෙසි මහීපති.
ඝිඤං තඤ්ඤව ජිඝඤ්ඤා කඤ්ඤාන චතුබණ්ඩිකං,
රථියා රථියං දයෙථ සා ගති ජවිල ගිලිතෝ. (258)

තඤ්ච කාරණිකා ගන්ත්වා චණ්ඩා ලුද්ද අකාරුණා,
මාතු අඞ්කෙ නිසිනස්ස ආකඩ්ඪිත්වා නයන්ති මං. (259)

තෙසාහං එවමවචං ඔඛිතං ගාල්හබන්ධිනං,
රඤ්ඤෝ දයෙථ මං ඛිපං රාජකිච්චානි අත්ථි මෙ. (260)

තෙමං රඤ්ඤෝ දස්සයිංසු පාපස්ස පාපසෙවිනෝ,
දිස්වාන තං සඤ්ඤාපෙසිං මමඤ්ච වසමානයිං.''යි (261)

මෙසේ කුමාරයන් ගෙනයන කල්හි දැසිගණයන් විසින් පිරිවරතලද අන්තඃපුරවාසින් සහිතවූ සුධම්මතම් බිසෝද නුවර වැස්සෝද ''අපි නිරපරාධවූ කුමාරයන් මරන්ට නොදෙමුය''යි කියමින් කුමාරයන් සමඟම ගියාහුය. චෝරඝාතකයෝ රජහට උත්වහන්සේ දැක්වූහ. උත්වහන්සේ පියාණන් දැක ''දෙවයන්වහන්ස, කවරහෙයින් මා මරවන්නහුදැ''යි ඇසූහ, රජ්ජුරුවෝ ''කුමක් නිසා මාගේ සවාමිවූ දිබ්බචක්ඛු තාපසයන්ට ගහපතිවාදයෙන් කතාකෙළෙහිද, මේ මේ විප්‍රකාර කුමට කෙළෙහිදැ''යි විවාළහ. ''දෙවයන් වහන්ස, ගහපතියෙක් සමානවූවහුට ගහපතියෙකැයි කිවාවූ මගේ කවර වරදෙක්දැ''යි කියා උන්ට මල් පලවැල වෙළඳම් කරන්නවුන් අතින්ද, දවස් පාසා විකුණවනු ලබන්නාවූ මල්කරු වෙළඳුන්ලවාද ඒ බව අදහවා මල්සොළ වතු බලනු මැනවැයි කිහ. ඔළි ඔහුගේ පන්සලට වැද මල්විකොට ලද්දාවූ කඹවණු පොදිය තමන්ගේ පුරුෂයන් ලවා ගෙන්වා දැක්වූහ. මෙසේ ඔහුගේ කුටිතාපස භාවය රජහට දැන්වූහ. ඉක්බිති රජ්ජුරුවෝ ''කුමාරයෙනි, තෙපි සැබවක් කියන්නහුය, මේ තාපසතෙම පෙර අල්පෙච්ඡයක්හු මෙන් වැස දැන් බහුභණ්ඩික වූයේයයි කිහ. මෙසේ කුමාරයෝ රජ්ජුරුවෝ යම්සේ ඔවුකෙරෙහි කළකිරී තමාගේ වසඟයෙහි පවතින්ද, එසේ කළසේක.

නැවත මහා සත්ත්වයෝ මෙබඳු නුවණැති රජක්හුගේ සමීපයෙහි විසීමට වඩා හිමවතට පැමිණ මහණවීම සුදුසුයයි සිතා ''දෙවයන් වහන්ස, මට මෙහි විසීමෙන් ප්‍රයෝජනයක්

කැත. මට පැවිදි වන්ට අවසර දුනමැනව"යි රජ්ජුරුවන් විචාළහ. රජ්ජුරුවෝ "දරුව, මා විසින් නොසලකා තොපට වධනියම කරන ලද්දේය, එහෙයින් මාගේ අපරාධයට සමා වුවමැනවැ"යි බොධිසත්ත්වයන් කම්කරවාගෙන අදම රාජ්‍යය පිළිගනුවයි කිහ. කුමාරයෝ කියන්නාහු "දෙවියන්වහන්ස, මට මේ මානුසික සම්පත්තියෙන් ප්‍රයෝජනයක් නැත, මම මීට පූර්ව ජාතියෙහි බොහෝ කාලයක් දිව්‍යභොග සම්පත්තීන් අනුභව කෙළෙමි. එහිද මාගේ ඇල්මක් නුවූයේය. මම පැවිදි වන්නෙම්මය, ඔබ වැනි අඥානවූ පරතෙය බුද්ධියෙහි පිහිටි යකුවෙත තොවසන්නෙමියි කියා උන්ට අවවාද කරන්නෝ මේ මිතු දක්වන ගාථාවන්ගෙන් ධර්මදේශනා කළසේක.

182 අනිසම්ම කතං කම්මං අතවඩ්ඪාය චින්තිතං,
හෙඨජ්ඣසෙව වෙහඬ්ගා විපාකෝ හොති පාපකෝ

183 නිසම්ම ච කතං කම්මං සම්මාවඩ්ඪාය චින්තිතං,
හෙසජ්ජසෙව සම්පත්ති විපාකෝ හොති භද්දකෝ

184 අලසෝ ගිහි කාමභෝගී න සාධු
අසඤ්ඤතෝ පබ්බජිතෝ න සාධු,
රාජා න සාධු අනිසම්මකාරී
යෝ පණ්ඩිතෝ කොධතෝ තං න සාධු

185 නිසම්ම ඛත්තියා කසිරා තා නිසම්ම දිසම්පති
නිසම්මකාරිනෝ රාජ යසෝ කිත්තිංව වඩ්ඪති.

186 නිසම්ම දණ්ඩං පතයෙය්‍ය ඉස්සරෝ
වෙගාකතං තපති භූමිපාල,
සම්මා පණිධි ච තංසස අත්ථා
අතානුතපපා තෙ භවන්ති පච්ඡා.

187 අතානු තප්පානි හි යෙ කරොන්ති
විභජ්ජ කම්මානතානි ලොකෙ,
විඤ්ඤූපපසත්ථානි සුඛින්ද්‍රියානි
භවන්ත් ඉධානුමතානි තානි

188 ආගච්ඡුං දෙවරිසා ඛිගණතථා
කාසාවියා භනතු මම්ං ජනින්ද
මාතුච්ච අඛාත්ම්ං අහං නීසින්නෝ
ආඝාඩිසිහෝ සහසා තෙහි දෙවි.

189 කටුකම්හි සම්බාධං සුඤ්ඤ පත්තෙන
මධුරං පියං ජීවිතං ලද්ධරාජ,
කිච්චෙජ්ජතාහං අජ්ජ වධාපමුත්තෙන
පඛබජ්ජමේව හි මතොහමස්මි.

"රජ්ජුරුවන් වහන්ස, අපරීක්ෂා කොට කරන ලද, ව්‍යවස්ථා
ක් නොකොට සිතූ, යම් කටයුත්තක් වේද, ඒ වතාහි වරදවා
දෙන ලද බෙහෙතක්මෙන් පාපකවූ විපාක දෙන්නේය.

පරීක්ෂා කොට කරන ලද, මතාසේ ව්‍යවස්ථාකොට සිතූ, යම්
කටයුත්තක්වේද, ඒ වතාහි වීධි නොවරදවා කන බෙහෙතක්
මෙන් යහපත් විපාක දෙන්නේය.

පස්කම් සැප විඳින්නාවූ ගිහියෙක් ඉදින් අලසවන්නේ
නම් ඒ යහපත් නොවන්නේය. කායවාක් මනෝ චාරයෙන් අහ
යතවූ ප්‍රව්‍රජිත තෙමේද යහපත් නොවන්නේය. අපරීක්ෂ්‍යකාරිව
කටයුතු කරන රජ තෙමේද යහපත් නොවෙයි, පණ්ඩිත තෙමේත්
ඉදින් කිපෙන සුලු වී නම් නො හොඬන්නේය.

එබැවින් දිශාතායකයෙනි, රජදරුවෝ නම් මූලදීම විමසා
කරන්නාහුය. නොවිමසා නොකරන්නාහුය. රජ්ජුරුවෙනි,
පරීක්ෂාකාරිවූ රජගේ යශසද කීර්තියද වඩන්නේය.

රජ්ජුරුවන් වහන්ස, තරෙඤ්චරයෝ පරීක්ෂාකොට දණ්ඩ
විධානය කරන්නෝය, මක්නිසාදයත්? යුහුව කරන ලද්දේ පසු
තැවිල්ලෙන් තැවෙන බැවිනි.

මතාකොට පිහිටුවන ලද සිතින් කරන ලද කටයුතු පසු තැවිලි
පිණිස නොවන්නේය. මේ ලොකයෙහි යම් සත්ත්ව කෙනෙක් පසු
තැවිලි නොවන්නාවූ මේ දෑ කළයුතුය, මේ දෑ නොකළ යුතුයයි
මෙසේ නුවණින් විභාග කොට කටයුතු කෙරෙද්ද, පණ්ඩිතයන්
විසින් මැනවැයි පසස්නා ලද්දාවූ අනුමත කරන ලද්දාවූ ඒ කර්මයෝ
දෙලොවම හිත සැප ඵළවන්නාහුය.

රජ්ජුරුවන් වහන්ස, කඩුගත් අත් ඇත්තාවූ චොරඝාතක
දෙරටු පල්ලෝ මා තසනු පිණිස ආවාහුය. ඔවුන් විසින් මවගේ
ඇකයෙහි උන්නාවූ මම සාහසිකව අදින ලද්දෙමි.

රජ්ජුරුවෙනි, කවුකවූ සම්බාධවූ ඉතා තපුරුවූ මරණ දුකට පැමිණ අද මම දුකයේ මරණින් මිදුනෙමි. මගේ ඥාත බලයෙන් මිහිරිවූ ප්‍රියවූ ජීවිතය ලැබ ප්‍රව්‍රජ්‍යානිවූබවූ සිත් ඇත්තේවෙමි'' යනු එහි අභිප්‍රායයි.

මෙසේ මහා සත්ත්වයන් ධර්මදේශනා කළ කල්හි රජ්ජුරුවෝ දෙදින් අමතා තොපගේ පුතණුවන් යාතොදී තවත්වා ලවයි කිහ. කිසවුද පුත්‍රයාගේ අදහසට කැමතිවූහ. මහා සත්ත්වයෝ රජ්ජුරුවන් වහන්ස, ඉදින් මා කළ දෙයෙක් ඇත්නම් කමාකළ මැනවැයි රජ්ජුරුවන් ක්ෂමා කරවා ගෙන මහජනයා විතාරා හිමවතට අභිවූබව හිස සේක.

මහාසත්ත්වයන් හිය කල මහජනයා සොර තවුසාට තලා ඔහු ජීවිතක්ෂයට පැමිණ වූහ. බෝධි සත්ත්වයෝද නුවරින් සහිත ඇමති පිරිස් ආදිවූ රජ පිරිස් විසින් කඳුළු පිරුණු මුහුණින් යුක්තව ලුහුබඳින ලද්දාහ. උත්වහන්සේ ඔවුන් නවතාලූහ. මිනිසුන් නැවතුන කල මිනිස් වෙස් ගෙන පැමිණියාවූ දෙවියන් විසින් නිතර ගල් වළලුසතක් ඉක්මවා හිමාලය වනයෙහි විස් කම් දෙවියන් විසින් මවනලද පන්සලෙහි තවුස් පැවිද්දෙන් පැවිදිවූහ. එහෙයින් වදළහ.

"සො මං තතො ධමාපෙසි මහා රජ්ජං අදූසි මෙ,
සො හං තමං දලසිත්වා පබ්බජිං අනගාරියං. (262)

න මෙ දෙස්සං මහාරජ්ජං කාමහොගා න දෙස්සියො,
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා රජ්ජං පරිච්චජිං" සි (263)

මෙසේ මහාසත්ත්වයන් හිමාලයෙහි පැවිදිවූ කාලයෙහි පටන් සොළොස් හැවිරිදි වන තෙක් දක්වා දෙවියෝම රාජකුලයේ උපස්ථානයන්ගේ වෙශයෙන් අවුත් උත්වහන්සේට උපස්ථාන කළාහුය. උත්වහන්සේ එහිදී ධ්‍යානාභිඥ උපදවා බඹලොව වැනිසේක.

එකල කොහොත් තවුස් දෙව් දත්තෙර වූහ. මවුබිසෝ මහා මායා දෙවි වූහ. මහාරක්ඛිත තාපසයෝ ශාරිපුත්‍රස්ථවිරයෝය, සොමනස්ස කුමාරයෝ ලෝහිමි බුදුරජාණන් වහන්සේය.

මෙහිදු යුධඤ්ජය චරිතයෙහි කී නයින්ම දශපාරමිහු නිඹිරණය කටයුත්තාහුය. නෙෂ්කාම්‍ය පාරමිතාව අතිශය වන්නේයයි ඒම දෙශනාවට ආරුඪ කරන ලද්දේය. ඒ එසේමැයි. පස්හවුරුදු කාලයෙහිම රාජකෘත්‍යයන්හි සමර්ථභාවය, තවු සාගේ සොරතවුස්බව පරීක්ෂාකිරීමය, රජු විසින් වධාඥ කළ

කල්හි තැති ගැනීමක් තැති බවය, රජ්ජුරුවන් වෙත පැමිණ කොයෙක් ලෙසින් ඔහු සදෙස් බවද තමන් නිරපරාධ බවද, මහජනයා මැද ප්‍රකාශ කොට රජු විසින් පරතෙය්‍යය බුදිය හා බාල භාවයද දන්වා උන් විසින් කමා කරන ලද්දේද උන්වහන්සේ වෙත විසීමෙන් හා රජ ඉසුරෙන් සංවෙගයට පැමිණ රජ්ජුරුවන් විසින් නානා ප්‍රකාරයෙන් යාචිඤ්ඤ කරනු ලබන කල්හිද හස්තා ප්‍රාප්ත රාජශ්‍රිය කෙළ පිඬක්මෙන් හැර දමා කිසි තැනෙක ලග්නවූ සිත් තැනිව පැවිදි වීමය, පැවිදිව විවෙකයෙහි ඇලී කොඛෝ කලකින් නිදුකින් ධ්‍යානා හිඳ ඉපද වීමය, යන මේ ආදීහු මෙහි මහාසත්ත්වයන්ගේ ගුණානුභාවයෝයයි දත යුත්තාහුය.

පරමාර්ථ දීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි
තුන් වන සුඛසූදය වර්ණනෙහි දෙවන සොමනස්සචරිතය නිමි.

(XX) III අයොඝර චරිතය

තවද මේ පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි තුන්වන සුඛසූදය වර්ණනෙහි තුන්වන අයොඝර චරිතය කියේය යත්:-

පුනා'පරං යදා හොමි කාසිරාජස්ස අත්‍රජෝ,
අයොඝරම්හි සංවඩ්ඪෝ නාමේ'නාසි අයොඝරෝ. (264)

යනුවෙන් තැවත අනික් චරිතයක් කියන්නෙමි. යම් කලෙක්හි මම කාසි නම් රජහුගේ පුත්‍ර වීමිද, එකල්හි යහෙයි වැඩුණෙමි, එහෙයින් නමින් අයොඝර කුමාර යයි පහළ වීය.

එකල කාසී රජුගේ අගමෙහෙසුන් බිසවගේ පූර්ව ජන්මයෙහි සපත්නියක් "නී වැදූ වැදූ දරුවන් කන්නෙමැ"යි ප්‍රාර්ථනා කොට යකින්නක්ව උපන්නී අවසරක් ලැබ ඇ වැදූ දරුවන් දෙවැරයෙක් හිම කැවාය. තුන් වන වාරයෙහි වනාහි අපගේ බොධිසත්ත්වයෝ ඇගේ කුස පිළිසිඳ ගත්හ. රජ්ජුරුවෝ බිසවුන් වැදූ මැදූ දරුවන් යකින්නක් කන්නීය. කුමක් කටයුතුදැයි මිනිසුන් සමඟ කතා කොට අමනුෂ්‍යයෝ නම් යකඩගෙට හයවෙත්. එහෙයින් යගෙයක් කරවන්ට වටනේ යයි කියල කම්කරුවන්ට නියොග කොට ටැම් ආදි කොට යම්බවා වූ සියලු ගෘහ සම්භාරයෙන් සිවු රැස්

මහත් යසඛ ගෙයක් කරවා මූ කරන ලද ගැබ් ඇති බිහිව් එහි වාසය කැරවූහ. ඕ තොමෝ එහිදී ධන්‍ය පුණ්‍ය ලක්ෂණයෙන් යුක්තවූ පුත්‍රයකු වැදුවාය. ඒ කුමාරයන්ට අශොකර කුමාර යයි කියාම නම් කළාහුය. උන්වහන්සේ කිරිමවුන්ට භාරදී මහත්වූ රුකවල් ඇති කොට රජ්ජුරුවෝ මෙහෙසිය අන්තඃ පුරයට පැමිණ වූහ. යකින්න දියවාරයට ගොස් වෙසමුනි රජුට පැන් ගෙන යන්නී ජීවිතක්ෂයට පැමිණියාය. මහා සත්ත්වයෝ යහෙතිම වැඩී නුවණැති බවට පැමිණ එහිදීම ශිල්ප ඉගෙන ගත්හ. රජ්ජුරුවෝ පුත්‍රයා සොළොස් හැවිරිදි නියාව දැන උන්ට රාජ්‍යය දෙන්නෙමි, "මාගේ පුත්‍රයාණන් කැඳවවු ය"යි අමාත්‍යයන්ට නියොග කළහ. ඔව්හුද "යහපත දෙවයන් වහන්ස"යි කියා නුවර සරසා සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සැරසූ මඞ්ගල හස්ති රාජයා ඇරගෙන එහි ගොස් කුමාරයන් සරහා ඇන් සඳ පිට වඩා හිඳුවා නුවර පැදකුණු කරවා රජ ගට දැක්වූවාහුය. බොධි සත්ත්වයෝ රජ්ජුරුවන් වැඳ සිටියාහ. රජ්ජුරුවෝ උන්ගේ ශරීර ශොභාව බලා බලවත් ස්නේහයෙන් උන් වැළඳ ගෙන "අදම් මාගේ පුතණුවන් අභිෂෙක කරවූය"යි අමාත්‍යයන්ට නියොග කළහ. මහා සත්ත්වයෝ පියාණන් වැඳ "මට රාජ්‍යයෙන් ප්‍රයෝජනයෙක් නැත. මම පැවිදි වන්නෙමි; මට ප්‍රව්‍රජ්‍යාවට අවසර දුන මැනව"යි කිහ. එහෙයින් වදාළහ:—

"දුක්ඛෙන ජීවිතෝ ලද්ධෝ සම්පිළෙ පතිපොසිතෝ,
අජ්ජව පුත්ත පව්පජ්ජ කෙවලං වසුධං ඉමං. (255)

සරථඤ්ඤං සනිගමං සජනං වඤ්චිත්වා ඛත්තියං,
අඤ්ජලිං පග්ගහෙත්වාන ඉදං වචනමබ්‍රවිං. (256)

යෙ කෙචි මඤ්ඤා සත්තා හීනමුක්කට්ඨමජ්ඣිමා,
නිරාරක්ඛා සකෙ ගෙහෙ වඩ්ඪන්ති සහ ඤාතිහි. (257)

ඉදං ලොකෙ උත්තරියං සම්පිළෙ මම පොසනං,
අශෝකරම්හි සංවඩ්ඪෝ අපපඤ්ඤෙ වඤ්චසුම්භියෙ. (258)

පූතිකුණප සම්පුණ්ණෙ මුච්චිත්වා මාතුකුච්ඡිතෝ,
තතෝ සංසාරතරෙ දුක්ඛෙ පුන පක්ඛිතෝ අශෝකරෙ. (259)

ඉදිහං තාදිසං පත්වා දුක්ඛං පරමදාරුණං,
රජ්ජස්සු ඉදි රක්ඛාමි පාපානං උත්තමෝ සියා. (270)

උක්කණ්ඨිතොම්හි කාමෙන රජ්ජනම්හි අනාදරෝ,
නිබ්බුතිං පරියෙසිස්සං යථා මං මච්චු න මද්දියෙ. (271)

එවාහං විනතසිත්වාන විරවනතං මහාජනං,
නාගොව බන්ධනං ඡේත්වා පාවිසිං කානනං වනං (272)

මාතා පිතා නමෙ දෙය්‍යා නපි මෙ දෙස්සං මහායසං,
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා රජ්ජං පරිච්චජිං. (273)

මෙසේ මහාසත්ත්වයන්ගේ ප්‍රව්‍රජ්‍යාභිප්‍රාය දැන ගත් පිය රජ්ජුරුවන් විසින් "පුත, කවර කාරණයකින් පැවිදි වවුදැ" යි විවාළ කල්හි "දෙවයන්වහන්ස, මම මිවුකුස ගැථතරකයෙහි මෙත් දසමසක් වැස මව්කුසින් නික්මෙත්තෙම් යකින්තක ගෙත් වන්නාවූ හයින් සොළොස් අවුරුද්දක් සිරගෙයි වසන්නෙම් පිටත බලාපියන පමණකුත් නොලදිමි. ඔසුපත් නිරයෙහි දමනලද්දකු මෙත් වූයෙමි. යකින්නියගෙන් මිදුනේ වි නමුත් ජරාමරණ දෙකින් නොමිදුනෙමි. මේ මරුවා කිසිවක්හු විසින් ජයගත නොහැක්කේය. සසර කලකිරුණෙමි. යම් තාක් ව්‍යාධි ජරා මරණයෝ නොපැමිණෙත්ද, ඒතාක් පැවිදිව ධර්මයෙහි හැසිරෙන්නෙමි, මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. මට පැවිදිවීමට අවසර දුනමැනව" යි කීයා.

යමෙක රත්තිං පඨමං ගබ්භෙ වසති මාතවෝ,
අබ්භුට්ඨිතෝ ව සයති සගවජ්ං න නිවත්තති.

යනාදි ගාථා විස්සකින් පියාණන්ට ධර්මදෙශනා කළසේක, ඉක්බිති බොධිසත්ත්වයෝ මහරජාණෙනි, නුඹවහන්සේගේ රාජ්‍යය නුඹවහන්සේටම වේවා, මට එයින් කම්නැත, නුඹ වහන්සේ සමග කතා කරන කල්හිම ව්‍යාධි ජරා මරණයෝ එන්නාහුය. එහෙයින් නුඹවහන්සේ වැඩසිටිය මැනවයි කියා යම් සිදගෙන යන මතැනකු මෙන්ද, රත්මැදිරියක් සිදගෙන යන සිංහපොතකයකු මෙන්ද, කාමයන් හැර මව්පියන් වැද නික්මුණාහ. ඉක්බිති රජ්ජුරුවෝද "කුමාරයාණෙනි පැවිදිවනු කැමත්තාහ. මටද රාජ්‍යයෙන් වැඩක් නැතැ"යි රාජ්‍යය හැරදමා උන් සමග නික්මුණාහ. උන්වහන්සේ නික්මුණු කාලයෙහි

කිසම්ද, අමාත්‍යයෝද, බ්‍රාහ්මණ ගෘහපති ආදීහු දැයි සියලු නුවර වැස්සෝ සම්පත් හැර නික්මුණාහුය. මහාසමාගමයෙක් වූයේය. පිරිස දෙලොස් යොදුනක් පමණවිය. මහාසත්ත්වයෝ ඔවුන් ගෙන හිමවතට පැමිණියාහ. සක්දෙව්රජාණෝ උත්වහන්සේ නික්මුණු බැව් දැන විශ්වකර්ම දිව්‍යපුත්‍රයා යවා දෙලොස් යොදුනක් දිග ඇති සත්යොදුනක් පුළුල් ඇති අසපුවක් කැරැවූහ. පැවිදි පිරිකර සියල්ලක්ම පිළියෙළ කැරැවූහ. මෙහි මහාසත්ත්වයන්ගේ ප්‍රව්‍රජ්‍යාවද අවවාද දීමද, බ්‍රහ්මලොක ගමනයද, පිරිසගේ මනා ප්‍රතිපත්තියද යන සියලු ගුණයෝම මහාගොවිඳ වර්‍යාවෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුත්තාහ.

එකල මිවුපියෝ මහාරාජකුලයෝ වූවාහුය. පිරිස බුඩපිරිස මය, අශොකර පණ්ඩිතයෝ ලොකසාමි බුදුරජාණන් වහන්සේය. මෙහිදු උත්වහන්සේගේ ශෙෂ පාරමිතාවන්ගේ නිධිරණානුභාවවිභාවනාදීහු යටකියනලද ක්‍රමයෙන්ම දතයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි තුන්වන සුඛස්ස්‍රයවගීයෙහි තුන්වන අශොකරචරිතය නිමි.

———— × ————

(XX) IV මහාකඤ්චන චරිතය

තවද මේ පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි තුන්වන සුඛස්ස්‍රය වගීයෙහි සිවුවන මහාකඤ්චන චරිතය කියේය යත්:-

පුනා'පරං යදා හොමි කාසිනං පුරවරුත්තමෙ,
භගිනීභාතරෝ සත්ත නිබ්බත්තා සොත්ථියෙකුලෙ. (274)

යනුවෙන් කැවත අනික් චරිතයක් කියන්නෙමි: යම් කලෙක්හි මම කසිරට, බරණැස් නුවර මහාකඤ්චන නම් කුමාරයෙක් වීමිද, එකල්හි උපකඤ්චනාදි සදෙනාය. මමය, යන සහෝදරයන් සත්දෙනා හා හැමට බාලවූ කඤ්චනදෙවි නම් භැගණියෝ දැයි අපි අටදෙන ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණ කුලයෙක්හි උපන්නෙමු. එහි පිළිවෙල කථාව කෙසේද යත්:-

එකල අපගේ බොධිසත්ත්වයෝ වනාහි බරණැස් නුවර අසූකෙළක් පමණ ධන ඇති බඹුණුමහසල්කුලගේ පුතෙක්ව උපත්හ. උන්ට ඛණ්ඩවණ කුමාරයයි නම් කළාහුය. උන්වහන්සේ පියවර තබායන කල්හි තවත් පුතෙක් උපන්නේය. උන්ට උපඛණ්ඩවණ කුමාරයයි නමක් කළාහුය. එවක් පටන් මහා සත්ත්වයන්ට මහාඛණ්ඩවණ කුමාරයයි ව්‍යවහාර කෙරෙත් මෙසේ පිළිවෙළින් පුතුන් සත්දෙනෙක් වූවාහුය. හැමට බාල දුවණි කෙනෙකි. උන්ට ඛණ්ඩවණදෙවි යයි නම්කළාහුය. මහාසත්ත්වයෝ වැඩිවිය පැමිණියෝ තක්සලා නුවරට ගොස් සියලු ශිල්ප ඉගෙන ගෙන ආහ. ඉක්බිති මවුපියෝ උන් ගිහිබැඳුමෙන් බඳිනු කැමැත්තාහු "තමහට සමාන ජාතිඇති කුලයකින් තොපට දූරියක් ගෙන එන්නෙමු"යි කීවාහුය. උන්වහන්සේ කියන්නාහු "මැණියනි, පියාණනි, මට ගිහිගෙයි විසීමෙන් කම්නැත. මට වනාහි මේ සියලු ලොකසන්නිවාසය ගිනිගෙන ඇවිලගත්තාක්මෙන් ප්‍රතිභය සහිතවද සිරගෙයක්මෙන් පලිරොධවද, කසල ගොඩක්මෙන් පිළිකුල්වද වැටහෙයි, මාගේ සිත පඤ්චකාමයෙහි නො ඇලෙන්නේය. තොපට තවත් පුත්‍රයෝ ඇත, ඔවුන් ඝරාවාසයෙන් නිමන්ත්‍රණය කරනු මැනවැ"යි කියා කැවත කැවතත් යාචඤ්ඤ කරන ලද්දාහුද මිතුරන් ලවා යාචඤ්ඤ කරවන ලද්දාහුද, නොකමැති වූහ. ඉක්බිති උන්ට මිත්‍රයෝ "සබඳ තෝ කුමක් පතමින් පැවිදිවුව නොවලදනු කැමැත්තෙහිදැ"යි විවාළාහුය. උන්වහන්සේ ඔවුන්ට තමන්ගේ නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශය (ගිහිගෙන් නික්ම යන අදහස) ප්‍රකාශ කළහ. එහෙයින් වදාරන ලදී:-

"එතෙසං පුබ්බජෝ ආසිං ගිරිඤ්ජකමුපාගතෝ,
භවං දිස්වාන භණතෝ නෙක්ඛම්මා'භිරතෝ අහං. (275)

මාතාපිතූහි පහිතෝ සහායා එකමානසා,
කාමෙහි මං නිමන්තෙන්ති කුලවංසං ඨපෙහිති. (276)

සා තෙසං වචනං වුත්තං ගිහිබන්ධෙම සුඛාවහං,
තදෙම අහොසි කඨිනං තණ්හාපාල සමං විය. (277)

තෝ'මං තදා උක්කිපනතා පුච්ඡිංසු පඤ්හං මම,
කිං තවං පත්ථයසි සම්ම! සද්ධාකාමෙන භුඤ්ජසි. (278)

තෙසා'හං එවමවචං අත්ථකාමගි තෙසිනං,
නාහං පත්ථෙමි ගිහිභාවං නෙක්ඛම්මාභිරතො අහං"සී. (279)

ඒ මාගේ මිත්‍රයෝ කොතැවැත්වීය හැකිවූ මාගේ ප්‍රව්‍රජ්‍යාවෙහි සඳහ දැක පැවිදිවනු කැමති බව අහවත්තාවූ මාගේ දවස මවුපියන්ට කිවැහුය, එකල මගේ මවුපියෝ මාගේ මිත්‍රයන් විසින් කියන ලද වචන අසා මෙසේ කිහ. "ඉදින් මහාකඤ්චන කුමාරයන්ට පැවිද්ද කැමැති නම් අපටත් ඒම රුචිය. එහෙයින් අපි හැම දෙනම පැවිදි වෙමුය"යි මහාසත්ත්වයන්ගේ ප්‍රව්‍රජ්‍යාධ්‍යාශය දැන උපකඤ්චනාදි බැයන් සදෙනද කඤ්චනදෙවී නම් නැගණියන්ද යන සියලු දෙන පැවිදිවනු කැමැතිවූහ. ඒ කරණ කොට ගෙන ඔහු සියල්ලෝද මවුපියන් විසින් ගෘහ වාසයෙන් නිමන්ත්‍රණය කරනු ලබන්නාහු නොකැමති වූවාහුමය. එහෙයින් කියන ලදි.

"නෙ මය්හං වචනං සුත්වා පිතුමාතුච සාවයුං,
මාතා පිතා එවමාහු සබ්බෙව පබ්බජ්ජාමහො"සී (280)

මෙසේ කියා වතාහි මවුපියෝ මහාසත්ත්වයන් කැඳවා තමන්ගේ අභිප්‍රායද උන්ට කියා "දරුව, ඉදින් පැවිදිවනු කැමැත්තෙහි නම් ඉතා සත්තකවූ අසූකෙළක් ධනය කැමති පරිදි දෙන් වියදම් කරව"යි කිවැහුය. ඉක්බිති මහාපුරුෂයෝ ඒ ධනය දුගී මගී යාචකාදීන්ට පරිත්‍යාග කොට මහ බිනික්මත් නික්ම හිමාලය වනයට වන්හ. උන් සමග මවුපියෝද සහෝදරයෝ සදෙනද කැඟණියෝද දාසයෙක්ද දාසියක්ද යහළුවෙක්ද ගිහිගේ හැර ගියාහුය. එහෙයින් වදාරන ලදී:-

"උභොමාතා පිතා මය්හං භගිනී සත්තභාතරො,
අමිතධනං පරිච්චජ්ජ පවිසිමහා මහාවනං"සී. (281)

ජාතක අට්ඨවණ්ණනාවෙහි "මවුපියන් කළුරිය කළකල්හි ඔවුන්ට කළමනා කටයුතු කොට මහාසත්ත්වයෝ මහබිනික්මත් කළහ"යි කියන ලදී. මෙසේ බෝධිසත්ත්වයන් ප්‍රමුඛ කොට ඇති ඔවුහු හිමාලයට වැද පියුම් විලක් ආශ්‍රය කොට සිත්කළු බිම් පෙදෙසක අනපුවක් කොට පැවිදිව වනමුල් පලාපලයෙන් යැපුනාහුය, ඔවුන් අතුරෙහි උපඤ්චනාදි අට දෙන වරින්වර එලඵල ගෙනවුත් එක් ගල්පෝරුවෙක්හි තම තමන්ට හා සෙස්සන්ටත් කොටස් කොට් පියා ගෙඹිය ගනා තමන්ගේ කොටස් ගෙන

වසන තැනට පිවිසෙත්. සෙස්සෝද ගෙඩිය ගැසූ සනිත් පත් සලෙත් නික්ම තම තමන්ට පැමිණි කොටස් ගෙන වසන තැනට ගොස් වළඳා මහණදම් පුරත්තාහුය. මෑත කාලයෙහි සෙලුවිල ගෙනවුත් එසේම අනුභව කෙරෙත්. ඔව්හු එහි එසේ සොරවූ තපස් ඇත්තාහු පරමොත්කෘෂ්ට ඉන්ද්‍රියයන් දමිතය කළාහු කිසුණු පිරියම් එඛමින් වාසය කළාහුය. ඉක්බිති ඔවුන්ගේ සිල් තෙදින් ශක්‍රභවනය කම්පිත වූයේය. ශක්‍රයෝ ඒ කාරණය දැන "මේ තපස්වීන් විමසන්නෙමි"යි තමන්ගේ ආනුභාවයෙන් මහා සත්ත්වයන්ගේ තෙළඹල කොටස තුන් දවසක් අතුරුදන් කළහ. මහා සත්ත්වයෝ පළවූ දවස් තමන්ගේ කොටස නොදැක "මාගේ කොටස මතක නැතිව ගියේ වනැ"යි සිතූහ. දෙ වන දවස් "මාගේ දෙඟයක් කරණ කොට ගෙන විය යුතුය. තෙරපිම් වශයෙන් මාගේ කොටස නොතිබුයේ යයි සිතිමි"යි සිතූහ. තුන් වන දවස් ඒ කාරණය අසා "සම්මා කරවා ගන්නෙමැ"යි සවස් වේලෙහි ගෙඩි සං දී ඒ සංඥාවෙන් සියල්ලන් රැස්වූ කල ඒ කාරණය දන්වා තුන් දවස්හිම ඔවුන් විසින් වැඩි මහලු කොටස තැබූ බව අසා "නොප විසින් මාගේ කොටස තබන ලද්දේය. මාවිසින් වනාහි නොලද්දේය, කාරණය කිම්ද"යි කිහ. ඒ අසා සියල්ලෝම සංවෙගයට පැමිණියාහුය. ඒ ආශ්‍රමයෙහි වසන වෘක්ෂ දෙවතාවාද තමන්ගේ විමනින් බැස ඔවුන් සමීප යෙහිම සිටියේය, මිනිසුන් අතින් පලා ගොස් වල් වැදුනාවූ එක් ඇතෙක්ද, අභිගුණ්ඩිකයකු අතින් ගැලවුනාවූ එක් සඳී යෙක්ද ක්‍රීඩාපරවශවූ එක් වඳුරෙක්ද යන මොහු ඒ සෑමින් විසින් කරන ලද පුරුදු ඇත්තාහු එකල ඔවුන් සමීපයට ගොස් එකත් පසෙක උන්නාහුය. ශක්‍රයෝද තවුස් ගණයා පරීක්ෂා කරන්නෙමියි අදෘශ්‍යමාන ශරීර ඇතිව එහිම සිටියහ. එකෙණෙහි බොධිසත්ත්වයන්ගේ මලණුවූ උපසඤ්ඣත තාපසයෝ තැගී සිට බෝසතාණන් වැඳ සෙස්සන්ට ආදර දක්වා "මම සෙස්සන් ඉන්ද දීම තමන්ම පිරිසිදු වන්ට ලබන්නෙමිද"යි විචාරා "එසේය, ලබන්නෙහි ය"යි කියල්හි තවුස් ගණයා මැද සිට ගෙන දිවුරන්නාහු:—

191. අස්සං ගවං රජතං ජාතරූපං
භරියඤ්ච යෝ ඉධ ලභතං මනාපං,
පුත්තෙනහි දූරෙහි සමඞ්ගි හොතු
හිංසානි තෙ බ්‍රාහ්මණ යෝ අහාසි

යන මේ ගාථාව කිහ. එහි අර්ථය "ආචාර්යයන් වහන්ස, යමෙක් තොප සතු සෙළඹිල පැහැර ගත්තේ විතම් හෙතෙම ලොවෙහි ඇත් අශ් රත් රිදී ආදී සැපතද සිත් කළුවූ බිරින්දෑකද ලබත්වා අඹු දරුවන් හා සිත් අලවවා" යනුයි.

මේ ගාථාව වතාහි ඔව්හු යම්තාක් ප්‍රිය වස්තූහු වෙත්ද ඒ වස්තූන්ගෙන් වෙන් වීමෙන් ඒතාක් සොක දුක් උපදිනියි වස්තු කාමයට ගරහනු පිණිස කිහ. ඒ අසා තවුස් ගණයා "නිදුකාණනි, තොකියව, තොපගේ දිවුරුම් ඉතා බැරුරුම්ය"යි කියා කත් වසා ගත්තාහුය. බොධි සත්වයෝද "තොපගේ දිවුරුම් ඉතා බැරුරුම්"ය. දරුව තෙපි තොගත්තහුය. තොපට පැමිණි අස්තෙහි හිදුව"යි කිහ. සෙසු තාපසවරුද දිවුරන් හාහු පිළිවෙළින් මෙසේ කිවාහුය.

192

මාලඤ්ච සෝ කාසිකචන්දනඤ්ච ධාරෙතු පුත්තාසස බහූ භවන්තු,
කාමෙසු නිබ්බං කුරුතං අපෙක්ඛං නිසානි තෙ බ්‍රාහමණ යෝ අහාසි

163

පහූතධඤ්ඤඤ්ච කසිමා යසස්සි පුත්තෙන ගිහි ධනිමා සබ්බකාමෙ,
වධං අපස්සං සරමා වසාතු නිසානි තෙ බ්‍රාහමණ යෝ අහාසි.

194

සෝ ඛත්තියෝ හොතු පසය්හකාරී රාජාධිරාජා බලවා යසස්සි,
සවාතුරන්තං මහිමා වසාතු නිසානි තෙ බ්‍රාහමණ යෝ අහාසි.

195

සෝ බ්‍රාහමණෝ හොතු අවිතරාගෝ මුහුත්තානකඛත්ත
පථෙසු යුත්තෝ,
පූජෙතු තං රට්ඨපති යසස්සි නිසානි තෙ බ්‍රාහමණ යෝ අහාසි.

196

අජ්ඣායකං සබ්බසමත්තවෙදං තපස්සිනි මං මඤ්ඤතු
සබ්බලොකෝ,
පූජෙතු තං ජාත පදා සමෙච්ච නිසානි තෙ බ්‍රාහමණ යෝ අහාසි.

197

චතුද්දසං හාමවරං සම්බං දිස්වාංහි සෝ භුඤ්ජතු වාසවෙන,
අවිතරාගෝ මරණං උපෙතු නිසානි තෙ බ්‍රාහමණ යෝ අහාසි.

198

සෝ ගාමණී හොතු සහාය මජ්ඣෙ තවේවහි ගීතෙහි
පමෝදමානෝ,
මා රාජතෝ බ්‍යසනමලත්ථ කිඤ්චි හිංසානි තෙ බ්‍රාහ්මණ යෝ අහාසි.

199

තං එකරාජා පඨවිං විජෙත්වා ඉත්ථිසහස්සස්ස ඨපෙතු අග්ගෙ,
සිමන්තිනීනං පවරා භවාතු හිංසානි තෙ බ්‍රහ්මණ යෝ අහාසි.

200

ඉච්ඡිතං සා සබ්බසමාගතානං භූසෙත්වා සාදුං අවිකම්පමානා,
වරාතු ලාභෙන විකත්ථමානා හිංසානි තෙ බ්‍රාහ්මණ යෝ අහාසි.

221

ආවාසිකෝ හොතු මහාවිහාරෙ තවකම්මිකෝ හොතු
කප්පඩ්ඩලාඣං,
ආලොකසන්ධි දිවසං කරොතු හිංසානි තෙ බ්‍රාහ්මණ යෝ අහාසි.

202

සෝ ඛත්තියං පාසසතෙහි ඡබ්භි රම්මාවතා නීයතු රාජධානි,
ගුත්තෙනහි සොහඤ්ඤතු පාවතෙහි හිංසානි තෙ බ්‍රාහ්මණ යෝ අහාසි.

203

අලඤ්ඤකම්මාලි නිපුණකණ්ණ පිට්ඨෝ ලවිඞ්ඝතෝ සප්පමුඛං උපෙතු,
සකවඡ්ඣබෙධා විසිඛං වරාතු හිංසානි තෙ බ්‍රාහ්මණ යෝ අහාසි

ආචාර්‍යයන් වහන්ස, යමෙක් තොප සතු තෙලුඹල පැහැර ගත්තේද, හේ මල් ගඳ විලවුන් දරාවා, ඔහුට බොහෝ දරුවෝ ඇති වෙත්වා, පස්කම් සැපයෙහි බහුලවූ අපෙක්ෂාව කෙරේවා

ආචාර්‍යයන් වහන්ස, යමෙක් නුඹ සතු තෙලුඹල පැහැර ගත්තේද, හෙතෙම ප්‍රවෘද්ධාත්‍ය ඇත්තෙක්ද, සමෘඩ්ධවූ කෘෂිකර්ම ඇත්තෙක්ද, යශස් ඇත්තෙක්ද වේවා, පුත්‍රයන් ලබාවා, ගිහි ගෙයි වෙසේවා, සත් වැදෑරුම් ධනයෙන් ධන ඇත්තෙක් වේවා. රූප ශබ්දාදී සියලු පස් කම් සැප ලබාවා. මහලු කලද පැවිදි නොව තමන්ගේ වයස තොදුක පස් කම් ගුණයෙන් සමෘද්ධව ගිහි ගෙයිම වසාවා.

ආචාර්‍ය්‍ය-පෙ-පැහැර ගත්තේද, හෙතෙම රාජාධි රාජවූ අනුත් කළ වරද ගත්තාවූ බලවත්වූ යශස් ඇත්තාවූ ක්‍ෂත්‍රිය වංශයෙහි උපන්නෙක් වේවා. එසේම සාගරය කෙළවර කොට ඇති සතර මහා ද්වීපයට නායකව මහිමයෙන් වසාවා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තේද, හෙතෙම පහ නොකළාවූ රාගය ඇත්තාවූ නොහොත් තැකත් බැලීමෙහි යුක්තවූ බ්‍රාහ්මණ යෙක් වේවා. කීර්ති ඇත්තාවූ රජ දරුවෝ ඔහු ප්‍රදත්වා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තේද, ඒ මා වේද හදාරන්නාවූ එහෙයින්ම ප්‍රහ්‍රුණු කළාවූ වෙද ඇති තපස් ඇත්තෙකැයි මුළුලෝ වැසි තෙමේ දනිවා; ගම් වැස්සෝ රැස්ව පුදනවා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තේද, හෙතෙම සක්දෙව් රජු විසින් දෙන ලද්දක්මෙන් අවලවූ මිනිසුන් ගෙන්ද බොහෝ ධන ධාන්‍යයෙන්ද දඩුවලින්ද ජලයෙන්ද යන මේ සතරින්ද උත්සන්නවූ සමෘද්ධවූ ගම්වරයන් අනුභව කෙරේවා. කෙළෙස් නොසිඳම මරණයට පැමිණෙවා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තේද, තෙහෙම යහළුවන් මැද නැටීම් ගිකීම් ආදියෙන් සතුටු වන්නාවූ ගම්නායකයෙක්ව රජු කෙරෙන් කිසි ව්‍යසනයක් නොලබාවා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තාද, ඇ අග්‍ර රජෙක් මුළුලොව ජය ගෙන දසක් බිසෝ වරුන්ට නායක තනතුරෙහි තබාවා සත්‍රින්ට උත්තම වේවා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තාද, ඕ නොමෝ රැස්වූ සියලු තවසුන් ඉදිරියෙහිද කම්පිත නොවන්නී යහපත් රස බොජුන් අනුභව කෙරේවා, ලාභ හෙතුවෙන් කොහොත්කම් කරන්නී ලාභ සත්කාර උපදවමින් හැසිරේවා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තේද, හෙතෙම මහා විහාරයෙහි නෙවාසිකයෙක් වේවා. කජඟල නම් නගරයෙහි නවකම් කරන්නෙක් වේවා. එක දවසක එක එක කවුලුව බැගින් කෙරේවා.

ආචාර්‍ය්‍ය – පෙ – පැහැර ගත්තේද, හෙතෙම බොහෝ මලපුඩු වලින් සිවුපා ගෙල කවිප්‍රදේශය යන සතැනින්බැඳ රම්‍යවූ මේවන යෙන් රාජධානියට ගෙන යේවා. දිග සැමිටිවලින් හා අකුසු වලින්ද අනීවා.

ආචාර්‍ය-පෙ-පැහැරගත්තේද, හෙතෙම අභිඤ්ඤාකයා විසින් බොටුවෙහි වටකොට තුබූ දෙවදරු මලා ඇතිව සප්තෙළි-යෙහි භික්ම්වම්න් සැමිරියෙන් තළතලා සප්හුගේ කටට පෑමිණේවා. කසපට බැඳගෙන වීථියක හැසිරේවා.

ඉක්බිති බොධිසත්ත්වයෝ මේ හැමදෙන විසින් දිවුරන ලද්දේය. මා විසිනුදු සපථය කළයුතුය යි සිතා එසේ කරන්නෝ,

204 යෝ වෙ අනථ්ථංනථ්ථන්ති වා හු
කාමෙ ව නො ලභතං භුඤ්ජ තං ව,
අහාරමජ්ඣෙ මරණං උපෙතු
යොවා හොනෙතා සුසංකතිකිඤ්ච දෙවා.

යනමේ ගාථාව කිහ. එහි අර්‍ථ තම් යමෙක් නොතැසුවසතුවක් නැසීගියේයයි කියේද, නොහොත් තොප කෙරෙහි කිසිවෙක් සැකකෙළේද, හේතෙමේ පස්කම්සැප ලබාවා. අනුභව කෙරේවා; සිත්කළු පැවිද්ද නොලැබ ගිහිගේ වැදම මැරේවා යනුයි.

ඉක්බිති සක්දෙව් රජාණෝ මේ හැමදෙන පස්කම් සැප යෙහි නිරපෙක්ෂකවූවෝයයි දැන සංවෙගයට පැමිණි සිත් ඇත්තෝ මොවුන් අතුරෙන් කිසිවකුත් විසින් තෙලුඔල නොසියක ලද්දේත් නොවෙනි. තොප විසින්ද නොනටු දෙයක් නටුවූ යේයයි කියනලද්දේත් නොවෙයි. එතකුදු උවත් මම වහාහි තොප විමසනු කැමතිව තෙලුඔල අතුරුදන් කෙළෙමියි දක්වත්නෝ

205 "විමංසමානො ඉසිනො භිසානි
භියේ‍යා ගහෙත්වාන ථලෙ නිඛෙසිං,
සුඛා අපාපා ඉසයො සපන්ති
එතානි තෙ බ්‍රහ්මචාරි භිසානි" යි.

අවසාන ගාථාව කිහ. එහි අර්‍ථය තම් සවාමිනි, මම මේ තාපසයෝ පස්කම්ගුණෙහි ඇලී වෙසෙද්දෝ නොඇලී වෙසෙද්දෝ හෝයි විමසන්නෙම් නුඹවහන්සේ සතු ගල්පොහොරුවෙහි තබනලද තෙලුඔල හෙන එකත්පසෙක තැබීමි. දැන් මම නුඹ වහන්සේලාගේ සපථක්‍රියාවෙන් "මේ තපස්විවරයෝ පිරිසිදුවූ නිෂ්පාපිවූවෝ ව වසත්ය" යි දනිමි යනුයි. බෝසත්හු ඒ අසා

206 "න තෙ නටා තෙ පත කිළතෙඅය්‍ය,
න බන්ධිවා තෙ පත තෙ සහායා,
කිස්මිං පරත්ථම්හි සහස්සතෙහන
ඉසිහි පථං කිළසි දෙවරාජ" සි.

ශක්‍රයාණන්ට තර්ජනය කළහ. එහි අර්ථය:—දෙව්රජුනි අපි වසාහි තොපගේ නළුවෝ හෝ කෙළියට සුදුසුවූවෝ හෝ අය නොවෙමු. තොපගේ නැයෝ හෝ යහළුවෝ හෝ නොවෙමු. එසේ ඇතිකල්හි තෙපි කුමක් නිසා තාපසයන් වෙහෙසා ඔවුන් සමඟ කෙළින්නාහුද සි යනුයි.

ඉක්බිති ශක්‍රයෝ කියන්නාහු:—

207 "ආචරියො මෙසි පිතාව මජ්ඣං
එසා පතිට්ඨා ඛලිතස්ස බ්‍රහ්මෙ,
එකාපරාධං ඛම භූරිපඤ්ඤ
න පණ්ඩිතා කොධබලා භවන්ති"සි

කියා ක්ෂමා කරවූහ. එහි අර්ථය:—ආචාර්‍යයන් වහන්ස නුඹවහන්සේ මා පුළුවුත් සැකෙවිසදු හෙයින් මාගේ ආචාර්‍යද සසරට පිටුවහල්වූ බැවින් පියතැන්පත්ද වූසේක. පණ්ඩිතයෝ ක්‍රෝධය බලකොට ඇත්තාහු නොවෙත්. එහෙයින් භූරි ප්‍රාඥයෙනි, නුඹවහන්සේගේ ප්‍රතිඥාවෙන් අද ඒ මාගේ අපරාධයට පිහිට වේවා යනුයි.

මහසත්හු සක්දෙව් රජහට ක්ෂමාව දී තුමූ ඍෂිගණයා ක්ෂමාකරවන්නෝ

208 "සුවාසිතං ඉසිනං එකරත්තං
යං වාසවං භූතපතිද්දසාම,
සබ්බෙව හොං නෙතා සුමනා භවන්තු
යං බ්‍රාහ්මණෙ සච්චවාදිහිසානි"සි කිහ.

එහි අර්ථය:—ආයුෂ්මත්වූ තපස්වීවරයෙනි, එක රැයකුදු මේ වෙනෙහි විසූබව ඉතා මනාවූ විසුමෙක, සවර කාරණය කින්ද යත්:—ඉදින් අපි නුවර විසුවමෝ නම් සක්දෙව්රජ නොදක්නෙමු. එහෙයින් භවත්හු හැමදෙනම සතුටුසින් ඇත්තාහු වෙත්වා, යම්හෙයකින් තොපගේ ආචාර්‍යයෝ තෙලුඔල ලැබුවාහුද, එහෙයින් සක්දෙව්රජු කෙරෙහි ක්ෂමාකරවන්න" යනුයි.

ශක්‍රයෝද ඍෂිගණයා වැඳ දෙව් ලොවටම ගියෝය. ඍෂි සමූහයාද ධ්‍යානාභිඥ උපදවා බඹලොව ගියෝය.

එකල උපකඤ්චනාදී මල් බැයෝ සදෙන තම් ශාරිපුත්‍ර, මෞද්ගල්‍යායන, මහා කාශ්‍යප, අනුරුද්ධ, පුණ්ණ, ආනන්ද, යන තෙරණුවෝය, බුහුණනිතුමූ උත්පලවර්ණාවෝය. දැසි, බුජිස්සත් තරුවය, දැසයෝ චිත්‍ර තම් ගෘහ පතියෝය, රුක්දෙවියෝ සාතාගිර තම් යක් සෙනෙවියෝය. ඇත් රජු තම් පාරලෙය්‍යක ඇතාණෝය. වදුරා තම් මධු වාසිඅඨයෝය. ශක්‍රයෝ තම් කාළ දැසි සඨවිරයෝය, මහා කඤ්චන තාපසයෝ තම් ලොකසවාමීන් වහන්සේය.

මෙහිද උත්වහන්සේගේ දස පාරමිහු ඇට කියන ලද ක්‍රම යෙන් නිර්ධාරණය කට යුත්තාහුය. ඒ එසේමය. කාමයෙහි අති ශයින් නිරපෙක්ෂතාව ආදිවූ ගුණානුභාවයෝ විභාවනය කට යුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අටුවාවෙහි තුන් වන යුධඤ්ජය වර්ගයෙහි ඔවුවන මහාකඤ්චන චරිතය නිමි.

(XX) V සොණපණ්ඩිත චරිතය

තවද මේ පරමාර්ථදීපනී නම් චරියාපිටක අටුවාවෙහි තුන් වන යුධඤ්ජයවර්ගයෙහි පස්වන සොණපණ්ඩිත චරිතය කියේයැත්.

පුනාපරං යදා හොමි නගරෙ බ්‍රහ්ම වඩ්ඪනෙ,
තත්‍ථ කුලවරෙ සෙට්ඨෙ මහාසාලෙ අජායහං. (281)

නැවත අනික් චරිතයක් කියන්නෙමි. යම් කලෙක්හි මම බ්‍රහ්මවඩ්ඪ නම් නුවර මිසුයෙම්ද, එකල අග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ බ්‍රාහ්මණ මහාසාරකුලයෙක උපනිම් යන එහි පිළිවෙළ කථාව කෙසේදැයත්:

එකල වනාහි මහා සත්ත්වයෝ බඹ ලොවින් චුතව බ්‍රහ්ම වඩ්ඪ නම් නුවර අසූකෙළක් ධන ඇති එක්තරා බමුණු මහස ලක්හුගේ පුත්‍රයෙක්ව උපන්හ. උත්වහන්සේට නම් තබන

දවස් සොණකුමාර යයි නම් කළාහුය. උන් පිය වර තෙගියන කල්හි අනිකුත් සත්ත්වයෙක් බඹලොවින් චුතව බොධිසත්ත්ව යන්ගේ මැණියන් කුස පිළිසිඳ ගත්තේය. උන්ට නන්ද කුමාර යයි නම් කළාහුය. උහත් වේද ඇති, සියලු ශිල්පයෙහි පරතෙ රට පැමිණ වැඩි වියටපත් ඔවුන්ගේ රූප ශ්‍රී දැක තුටු පහවුවු මිවුපියෝ අපි ඔවුන් ගෙහ බන්ධනයෙන් බඳින්නෙමු යයි පළමු කොට සොණ කුමාරයන්ට "දරුව තොපට සුදුසු කුලයකින් දැරියක් ගෙන එන්නෙමු නෝ කුටුම්බය පිහිටුව"යි කිවාහුය. මහා සත්ත්වයෝ මට ගෙහ වාසයෙන් කම් නැත, මම යව්දිවි නුඹ වහන්සේලා පිළිදගුම් කොට නුඹ වහන්සේලාගේ ඇවැමෙන් පැවිදි වන්නෙමියි කිහ. එකල්හි මහාසත්ත්වයන්හට භවත්‍රය හිනි ගත් ගෙයක්මෙන්ද, අහුරු වළක්මෙන්ද වැටහුනේය. විෂෙ ශයෙන් වෙනෙහි බොධිසත්ත්වයෝ නෛෂ්කාම්‍යා ධ්‍යාශය ඇතිව එහිම ඇලුනාහු වූහ. උන්වහන්සේගේ අදහස් නොදන්නා මවුපියෝ නැවත නැවතත් කියන්නාහුද උන්වහන්සේගේ සිත නොලදින් නන්ද කුමාරයන්ට ආමන්ත්‍රණය කොට "දරුව, එසේවී නම් තොප කුටුම්බය පිළිපදුව"යි කිහ. උන් විසින්ද "මම මගේ සොහොයුරාණන් විසින් දමන ලද කෙළ පිඬ හිසෙන් නොඹ සවමි, මිමත් තොපගේ ඇවැමෙන් බැහැන් සමඟ පැවිදි වන්නෙමි"යි කිකල්හි මවුපියෝ මෙව්හු මෙසේ තරුණ වියෙහි සිටියාහුම පස් කම් සැප හරණාහුය. මහලු වියට පැමිණියාවූ අප ගැන කියනුම කිමදැයි සිතා "දරුවෙනි තොපට අපගේ අවැමෙන් පැවිදි වනු කිම, අපි හැම දෙන එක් ඔම පැවිදි වන්නෙමුය" යි කියා නැගන්ට දුනමතා දේ දී දැයි දසුන් මුදා රජ හට දන්වා සියලු ධනය පරිත්‍යාග කොට මහදන් පවත්වා සිවු දෙනාම බ්‍රහ්මවර්ධන නගරයෙන් නික්ම හිමවත් පෙදෙස්හි පියුමෙන් හා හෙළ පියුමෙන් සැදුම් ලද මහවිලක් ආශ්‍රය කොට සිත්කලු වන ලැහැබෙක පන්සලක් මවා පැවිදිව එහි විසූහ.

එහෙයින් වදාරණ ලදී:—

"තදුපි ලොකං දිස්වාන අබ්භුතං තමොනුදං,
චිත්තං භවතො පතිකුටති තුත්තවෙගහතං විය. (283)

දිස්වාන විවිධං පාපං එවං විත්තෙන සහං තදා,
කදහං ගෙහා නික්ඛම්ම පවිසිස්සාමි කානනං. (284)

තදුපි මං නිමන්තනට්ඨං කාමභොගෙහි ඤාතයෝ,
තෙසම්පි ජන්ද මාචික්ඛිං මා නිමන්තනථ තෙනිමං. (285)

යෝ මෙ කනිට්ඨභ්‍රාතා භාතා නන්දෝනාමාසි පණ්ඩිතෝ,
සොපිමං අනුසික්ඛනෙනා පබ්බජ්ජං සමරොචයි. (286)

අහං සොණොව නන්දෙව උභොමාතා පිතා මව,
තදුපි භොගෙ ජඞ්ඝස්ථා පාවිසිම්හ මහාවනං.''යි (287)

එකල ඔහු දෙදෙනම් මවුපියන් පොෂණය කෙරෙති. ඔවුන් අතුරෙන් නන්දපණ්ඩිතයෝ මා විසින් ගෙනෙන ලද පලාපලම් මවුපියන්ට අනුභව කරවත්තෙමි. ඒ හේද පළමු ගොදුරුගත් තැනිත්ද යම්කිසි පලවැලක් උදැම ගෙනවුත් මවුපියන් අනුභව කරවති. ඔව්හුද ඒ අනුභව කොට මුවසෝදා පෙනෙවස් සමාදන් වත්හාඛ. සොණපණ්ඩිතයෝ වනාහි දුරට ගොස් මියුරු මියුරුවූ මහාව පැසිගිය පලවැල ගෙනවුත් එළවති. ඉක්බිති උන්ට මවුපියෝ ''දරුව, අපි මලණුවන් විසින් ගෙන එන ලද පලවැල අනුභව කොට පෙනෙවස් සමාදන්වූම්හ. දැන් අපට පලවැලින් වැඩක් නැතැ''යි කියති. මෙසේ උන්ගේ පලවැල අනුභව නොකොට නැතිව යෙත්. දෙවන තෙවන දවස්හිද එසේමය, මෙසේ ඒ සොණපණ්ඩිතයෝ පඤ්චාභිඥාලාභී හෙයින් දුරටද ගොස් එලාඵල ගෙන එති, එහෙත් ඔව්හු අනුභව නොකරති. ඉක්බිති මහාසත්ත්වයෝ මෙසේ සිතූහ. ''මවුපියෝ වනාහි සිවුමැලිහ. නන්දයෝද නොවිලිකුත් නෝ දුකින් විලිකුත් නෝ කිසියම් පල වැලක් ගෙනවුත් අනුභව කරවති. මෙසේ ඇති කල්හි මුන්වහන්සේලා බොහෝ කල් ජීවත් නොවන්නාහුය, එබැවින් ඒ වලක්වන්නෙමි''යි ඉක්තිබි ඔහුට අමතා ''නන්දයෙනි, මෙවක් පටන් පලවැල ගෙනවුත් මා එනතෙක් බලව, අපි දෙදෙනම් එකතුව අනුභව කරවමු''යයි කීහ. එසේ කී කල්හිද තමන්ටම කුසල් කැළැතිව උන්ගේ වචනය නොකළෝය. මහා සත්ත්වයෝ උපස්ථානයට ආවාවූ උන්ට ''තෙපි නුවණැත්තන් කිබස් නොකරන්නාහුය. මම වනාහි වැඩිමල්ය. මවුපියෝත් මට භාරය, මම ම ඔවුන් පොෂණය කරන්තෙමි, නෝ මෙයින් අන්තැනකට යවයි අසුරගැසුවේය. නන්දයෝ උන් විසින් තෙරන ලද්දේ එහි සිටින්ට නොහැකිවන්නෝ උන්වහන්සේ වැද මවුපියන්ට එපවත් දන්වා

තමන්ගේ පන්සලට වැද සසිණහාවකාකොට එදවස්ම පකුවා හිඳ අවසමඃපත්තින් උපදවා මෙසේ සිතූහ. "කිමෙක්ද, මම මහමෙර පල්ලෙන් රුවන්වැලි ගෙනවුත් මාගේ බැඟණන් වහන්සේගේ පන්සල් මලුවෙහි විසුරුවා කමාකරවන්නෙම් දෝ හෝ කොහොත් අනවතපාන විලින් දිය ගෙනදී කමාකරවන්නෙම් දෝ හෝ කොහොත් මාගේ බැඟන් වහන්සේ දෙවතා වශයෙන් කමාකරවන්නෙම් තම් සිවුවරත් මහරජුත් හෝ, සක්දෙව් රජාණත් හෝ ගෙනවුත් කමාකරවන්නෙමිද, එසේ නොහොබනේය. මේ මනෝජ්ඤ බ්‍රහ්මවඩිත රජ්ජුරුවෝ සියලු දඹදිවට අග රජ්ජුරුවෝය. උන් ආදි කොට සියලු රජ දරුවන් ගෙනවුත් කමාකරවන්නෙම්, එසේ ඇති කල්හි මාගේ බැඟන් වහන්සේගේ ගුණය මුළු දඹදිව පැතිර යන්නේය. සඳහිරුමෙන් ප්‍රකාශ වන්නේය"යි. ඉක්බිති උන්වහන්සේ එකෙණෙහිම සෘද්ධියෙන් ගොස් බ්‍රහ්මවඩිත නුවර රජ්ජුරුවන්ගේ වහසල් දෙරෙහි බැස "එක්තරා තවුස් කෙනෙක් තොප දක්නා කැමැත්තෝය"යි රජහට දන්වා ඒ රජු විසින් කරන ලද අවකාශ ඇත්තෝ උන් සමීපයට ගොස් "මම මගේ බලයෙන් සියලු දඹදිව රජය ගෙන නුඹ වහන්සේට දෙමි"යි කීහ. "ස්වාමීනි, නුඹ වහන්සේ සියලු දඹදිව රජය කෙසේ ගෙන දෙන්නාහුදැ"යි "මහ රජාණනි, කිසිවෙකුට වධ නොකොට තමන්ගේ සෘද්ධිබලයෙන් ගෙන දෙන්නෙමි"යි මහත් සේනාව සමග උන්ගෙන කොසොල් රටට ගොස් නුවරට නුදුරුතන්හි කඳවුරු බැඳ "අප හා යුධ හෝ කෙරේවා නැතහොත් අපගේ වශයෙහි හෝ පවතින්වයි කොසොල් රජහට දූතයකු යැවූහ. කිපී යුධයට සැරසී නික්මියාවූ ඔහු හා යුධ ඇරඹිකල්හි තමන්ගේ සෘද්ධානුභාවයෙන් යම්සේ දෙසෙනහට කිසියම් පිඛාවක් නොවේද, එසේ කොට යම්සේ කොසොල් රජ උන්ගේ වශයෙහි පවතීද, එසේ වචන ප්‍රතිවචන ගෙන යන්නවුන් කොට විධාන කෙළේය, මේ ක්‍රමයෙන් මුළු දඹදිව රජ දරුවන් උන්ගේ වශයෙහි පවත්වා ලූසේක. එයින් සතුටට පැමිණි රජ්ජුරුවෝ තන්ද පණ්ඩිතයන්ට මෙසේ කීහ. "ස්වාමීනි, නුඹ වහන්සේ විසින් ප්‍රතිඥා පරිදි සියල්ලම කරන ලද්දේය. නුඹ වහන්සේ මට බොහෝ උපකාරසේක. මම නුඹ වහන්සේට කුමක් කරම්ද, මම නුඹ වහන්සේට සියලු දඹදිව රජයෙන් බාගයක් පුද දෙනු කැමැත්තෙම්, ඇත්, අස්, රිය, මිණි, මුතු, පබළු, රන්, රිදී, දූසි, දස්, පිරිවර

පිරිවර ජනයාගේ පරිවෙණදයක් කියනුම කිමිදැ"යි තණ්ඩුලනාලිත යෝ ඒ අසා "මහරජ්ජුරුවෙනි, මට තොපගේ රාජ්‍යයෙන් කම්නැත, හයනි යානාදියෙන්ද කම්නැත. එතකුදු උවත් තොපගේ රාජ්‍යයෙහි අසුවල් අසපුවෙහි මාගේ මවුපියෝ පැවිදිව වෙසෙත්. මම ඔවුන්ට උවටැන් කරන්නෙමි එක් අපරාධයක් නිසා මාගේ වැඩිමහල් බැයන්වූ මහාතපස්විවූ සොණ පණ්ඩිතයන් විසින් බැහැර කරන ලද්දෙමි වෙමි, ඒ මම තොප ගෙන උන් සමීපයට ගොස් කළ වරදට කමාකරවා ගන්නෙමි ඊට තෙපි සහාය වෙව"යි කීහ. රජ්ජුරුවෝ යහපතැයි පිළිගෙන සුවිසි අක්ෂෞහිණියක් පමණ සෙනඟින් පිරිවරණ ලද්දේ එක් සියයක් රජුන් සමඟ තණ්ඩුලනාලිතයන් පෙරදැරි කොට ගෙන ඒ අසපුවට පැමිණ සතර ගව් පමණ තැන ඉඩ තබා අහසෙහි පිහිටියාවූ කදින් අනවතප්ත විලින් පැන් ගෙන පැන් පෙර හා තබා පිරිවෙණ හැමද මවුපියන් සමීපයෙහි හුන් ධ්‍යාන භාවනාවෙහි ඇලුනාවූ මහා සත්ත්වයන් කරා එළඹ තණ්ඩුලනාලිතයෝ උන්වහන්සේ කමාකරවූහ. මහා සත්ත්වයෝ තණ්ඩුලනාලියන්ට මවු බාරදී තුමූ දිව් ඇතිතෙක් පියාණන් පිළිදැගුම් කළහ. ඒ රජුන්ට වනාහි:-

209 ආනන්දෙ ච පමෝදෙ ච සදා හසිත කිළිතං,
මාතරං පරිවාරෙන්තා ලභමෙතං විජානතො.

210 ආනන්දෙ ච පමෝදෙ ච සදා හසිත කිළිතං,
පිතරං පරිවාරෙන්තා ලභමෙතං විජානතො.

211 දානං ච පියවජ්ජං ච අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු තත්ථ තත්ථ යථාරහං.

212 එතෙඛො සංගහා ලොකෙ රථස්සාණීව යායතො,
එතෙව සංගහා නාසුං න මාතා පුත්තකාරණා;
ලභෙත මානං පූජං වා පිතාවා පුත්තකාරණා.

213 යසමාව සංගහා එතෙ සම්මෙක්ඛන්ති පණ්ඩිතා,
තසමා මහත්තං පපොත්තෙති පාසංසාව භවන්ති තෙ.

214 බ්‍රහමාති මාතා පිතරෝ පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුණෙය්‍යාව පුත්තානං පජාය අනුකම්පකා.
තසමාහිනෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍ය ච පණ්ඩිතො.

215 අන්නාන අථොපානෙන වත්ථෙන සයනෙනව,
උච්ඡාදනෙනන්හාපනෙන පාදානං ධොවනෙනව.

216 තායනං පාරිවරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙව මොදති.

යන ගාථාවලින් බුඩලිලාවෙන් දහම් දෙසූසේක, එහි අර්තය,

මේ ලොකයෙහිද, දෙවලොකයෙහිද, නුවනැත්තන් විසින් ආනසංසයද. ප්‍රමොදයද, හැම කල්හි සිතාද, ක්‍රීඩාද මවට පරිවරියා කොට ලබන්ට හැකි වන්නේය එසේම පියාට පරිවරියා කොටද ලබන්ට හැකි වන්නේය. මේ ලොකයෙහි මවුපියන්ට දන්දීමද, ප්‍රිය වචන කිමද, අර්ථචර්‍යාවද, ඒ ඒ කාලයන්හි සමානාත්මතාවද යන මේ චතුස්සංග්‍රහ වස්තූහු යන්තාවූ රථයාගේ ඇණය ඊට උපකාර වන්නාක්මෙන් ලොවට උපකාර වන්නාහුය.

මේ සංග්‍රහයෝ ලොව නුවූවාහු නම් මවුවරුද පුත්‍රයා හේතු කොට ගෙන මානසයක් හෝ පූජාවක් හෝ නොලබන්නාහ. පියාණෝ හෝ පුත්‍රයා හෙතු කොට ගෙන නොලබන්නාහ. යම්හෙයකින් පණ්ඩිතයෝ මේ සංග්‍රහ විස්තූන් මනාකොට කටයුතුයයි දනිද්ද, එහෙයින් ඔව්හු මහත් බවට පැමිණෙත්. ඔව්හු පැසසිය යුත්තාහුද වෙත්.

මවුපිය දෙදෙන බ්‍රහ්මයාසයිද පූජ්‍යාචර්‍යා යයිද කියත්. ඔව්හු පුත්‍රයන්ගේ සත්කාරයට සුදුස්සෝ වෙත්. එහෙයින් පණ්ඩිත තෙම ඔවුන්ට නමස්කාරද සත්කාරද කරන්නේය. ආහාරයෙන්ද, පානයෙන්ද, සයනයෙන්ද, ඇඟ ඉලීමෙන්ද, නැවීමෙන්ද, පා සේදීමෙන්ද, මවුපියන් කෙරෙහි කරන ලද පාරිවර්‍යාවෙන් පණ්ඩිතයෝ මෙලොවෙහිද ඔවුන්ට පසසත්. පරලොවද සුගතීලොකයෙහි සතුටු වෙති යනුයි.

ඒ දහම් අසා සේනාව සහිතවූ ඒ සියලු රජ දරුවෝ පැහැදුනාහුය. ඉක්බිති ඔවුන් පන්සිල්හි පිහිටුවා "දානාදි පිංකම්හි පමානොවව්ය"යි කියා අවවාද දී හැරියේය. ඔහු හැම දෙන දැහැමින් රජය කොට ආයු කෙළවර දෙව්ලොව ඉපදුනාහුය. ඒ දෙබෑයෝත් ආයු කෙළවර බඹලොව උපන්හ.

එකල මවුපිය දෙදෙන නම් මහාරාජ කුලයෝය, නන්ද පණ්ඩිතයෝ නම් ආනන්ද ස්ථවිරයෝය, මනොජ රජ්ජුරුවෝ

තම් ශාරිපුත්‍ර සථවිරයෝය, එක් සියයක් රජ වරු අසූ මහසව්වන් හා අවශෙෂ සව්වෝද වූහ. සුවිසි අසෙඛභික්ෂුණියක් පමණ සෙසු තම් බුදු පිරිසමය, සොණ පණ්ඩිතයෝ තම් ලොකසව්වන් වහන්සේය.

මේ චරියාවෙහිදු උත්වහන්සේගේ නෙෂ්ක්‍රම්‍ය පාරමිතා තොමෝ බලවත් වුවත් යට කියන ලද ක්‍රමයෙන් සෙසු පාරමී හුද නිඛ්ඛාරණය කළ යුත්තාහ ඒ එසේමය, පස් කම් සැපයෙහි බලවත් අනපෙක්ෂක භාවය, මවුපියන් කෙරෙහි තිපුණුවූ ගෞරවය හා සප්‍රතිඝ්‍ය භාවය මවුවීය උපසථානයෙන් අතෘප්ති බවය, උත්ව උවටැන් කිරීමක් ඇතත් හැම කලම සමවත් සුව යෙන් කල් යැවීමය, යන මේ ආදි මහා සත්ත්වයන්ගේ ගුණානුභාවයෝ විභාවනය කළ යුත්තා හුය.

පරමාර්ථදීපනී නම් චරියා පිටක අට්ඨකථාවෙහි
තුන්වන බුඛසූජයවතු යෙහි පස්වන සොණපණ්ඩිතචරිතයනිමි.

නෙෂ්ක්‍රම්ම පාරමිතාමෝ කියා නිමවනලදී.

(XX) VI තෙමිය පණ්ඩිත චරිතය.

තවද මේ පරමාර්ථදීපනී නම් චරියා පිටක අට්ඨකථාවෙහි තුන් වන බුඛසූජ වර්ගයෙහි සවන තෙමිය පණ්ඩිත චරිතය කිසේයයත්:—

පුනාපරං යදා හොමි කාසිරාජස්ස අත්‍රජෝ,
මූඝපක්ඛොති නාමෙන තෙමියොති වදන්තිමං. (288)

සොළසිත්ථී සහස්සානං න විජ්ඣති පුමෝ සදා,
අභිරත්තානං අච්චයෙන නිබ්බත්තතා අහ
මෙකකෝ. (289)

තැවත අනික් චරිතයක් කියන්නෙමි, යම් කලෙක්හි මම කාසිරජහුගේ පුත්‍රවීමිද, එකල්හි මට නමින් තෙමිය යයිද මූඝපක්ඛ යයිද මවුපියාදි සියල්ලෝ කියත්. එකල්හි කසි රජ

හුගේ සොළොස් දහසක් අන්තඃපුරස්ත්‍රීන්ට පුත්‍රයෙක් නැත්තේය. තොයෙක් අහෝරත්‍රීන්ගේ ඇවෑමෙන් මම හුද කලාව උන්ගේ පුත්‍රව උපනිමි, එහි මේ පිළිවෙළ කථාවයි.

ඇටකිය දවස බරණැස් නුවර කසි නම් රජෙක් රජය කරවූයේය. ඒ රජහට සොළොස් දහසක් බිසෝ වරු වූහ. ඔවුන් අතුරෙන් එකම බිසවකටත් පුතෙක් හෝ දුවක් නොලැබෙන්නේය. නුවර වැස්සෝ අපගේ රජහුගේ වංශය රක්නාවූ පුත්‍රයෙක් නැත්තේ යයි විපිළිසරවූවාහු රැස්ව 'පුතෙකු පැතුව මැනව''යි රජහට කිවාහුය. රජ්ජුරුවෝ ''පුත්‍රයකු ප්‍රාර්ථනා කෙරෙත්ව''යි සොළොස් දහසක් සත්‍රීන්ට නියොග කළහ. ඔව්හු තුමූ චන්ද්‍රාදීන්ට උපසථානාදිය කොට ප්‍රාර්ථනා කරත්නෝද දරුවන් නොලද්දාහුය. ඒ රජහුගේ සිලසමපන්නවූ මඳුරජහුගේ දූ වූ චන්ද්‍රා නම් අගමෙහෙසුන් බිසවක් වූවාය. රජ්ජුරුවෝ උන්ටත් දරුවකු පැතුව මැනවයි කිහ. එකල්හි චන්ද්‍රාවෝ පුර පසළොස්වක්දා පෙහෙවස් සමාදන්ව තමන්ගේ ශීලය ආවර්ජනා කොට ඉදිත් මම කඩ නොකල සිල් ඇත්තෙමි නම් මාගේ ඒ සත්‍යය කරණකොටගෙන පුත්‍රයෙක් ලැබේව'' යි සත්‍යක්‍රියා කළාය, ඇගේ ශීලානුභාවයෙන් ශක්‍රයාගේ පඬුපුල් සලස්න හුනු විය. ශක්‍රයෝ පරීක්ෂා කොට ඒ කාරණය දැන චන්ද්‍රා දෙවියට පුතකු ලැබෙනු සඳහා උපායක් කරන්නෙමියි ඇට සුදුසු පුත්‍රයකු සොයන්නෝ තවුතිසා භවනයෙහි ඉපද එහි ආයු ඇතිතෙක් සිට එයින් චුතව මතු දිව්‍ය ලොකයෙහි උපදිනු කැමති බොධි සත්ත්වයන් දැක උන් සම්පයට ගොස් යහළුව ඔබ මිනිස් ලොව උපන් කල ඔබගේ පාරමීහු පිරෙන්නාහ. මහා ජනයාහට මහත් වැඩක්ද වන්නේය, කසී රජහුගේ චන්ද්‍රා නම් බිසව් පුත්‍රයකු ප්‍රාර්ථනා කරන්නීය, ඔවුන් කුස පිළි සිද ගනුවයි කිහ. උන්වහන්සේ මැනවයි පිළිගෙන උන්ගේ කුස පිළිසිද ගත්හ. උන්වහන්සේගේ යහළු පන්සියයක් දෙවපුත්‍රයෝද ඉක්මුණු ආයු ඇත්තාහු දෙව් ලොවින් චුතව ඒ රජහුගේම අමාත්‍යයන්ගේ භාර්‍යාවන් කුස පිළිසිද ගත්තා හුය, බිසව් ගැප් පිණිවි බැව් රජහට දැන්වූවාය. රජ්ජුරුවෝ ගැප් පෙරහර දෙවූය. පිරුණු ගැප් ඇති බිසව් ධන්‍ය ප්‍රණ්‍ය ලක්ෂණයෙන් යුක්තාවූ පුතකු වැදුවා. එදවස්හිම ඇමතියන්ගේ ගෙවලද පන්සියයක් කුමරුවෝ උපන්නාහුය. රජ්ජුරුවෝ මේ කරුණු

දෙකම අසා "මේ කුමරුවෝ මාගේ පුත්‍රයාගේ පිරිවරය"යි කුමරුන් පන්සියයට පන්සියයක් කිරිමවුවරුන් යවා කුමාරා හරණද යැවූහ. මහා සත්ත්වයන්හට වනාහි අතිදීඝාදි දෙෂ යන්ගෙන් තොරවූ කොළුලෙන්නාවූ තත ඇති මිහිරි කිරි ඇති සිවුසැටක් කිරිමවුන් දී මහත් සත්කාර කොට චන්ද්‍රා දෙවිත්ටද වරයක් දුන්හ. බිසව් එම වරය ගන්නා ලද්දක් කොට තැබිය. කුමාරයෝ මහත් පිරිවරින් වැඩෙත්. ඉක්බිති උපන් එක්මස් ඇති කුමාරයන් ආහරණයෙන් සරසා රජහුගේ සමීපයට ගෙන ගියාහුය. රජ්ජුරෝ පිය පුතණුවන් බලා වඩා ගෙන ඇකයෙහි හිඳුවා සිත් පිත වමින් හුන්හ. එකෙනෙහි සොරුන් සතර දෙනකු රජු සමීපයට ගෙනාවාහුය. රජ්ජුරුවෝ ඔවුන් අතුරෙන් එකකුට කටුසැම්බියෙන් පහර දහසක් දෙවයි අණ කළහ. එකකු හැකිල්ලෙන් බැඳ බඹුනාගාරයේ ලවයිද එකකු ශරීරයෙහි අඩයටි පහර දෙවයිද එකකු හුල තබවයිද නියොග කළහ. මහා සත්ත්වයෝ පියාණන්ගේ කතාව අසා සංවෙගයට පැමිණ "අනේ මපියාණෙනි රජය නිසා නිරය ගාම්භූ බැරෑරුම් කමීයක් කෙරෙන්ය"යි සිතූහ. දෙවන දවස් ඒ කුමාරයා සේසතයට සරසන ලද ශ්‍රී යහනෙහි වැද හෙව්වාහුය. උන්වහන්සේ මදක් සැතපී පිබිදී සිටියෝ ඇස් හැර බලා ශෙවතච්ඡත්‍රය බලන්නාහු මහත් ශ්‍රී සම්පත් දුටහ. ඉක්බිති ප්‍රකෘති යෙන්ම සංවෙගයට පැමිණි උන්වහන්සේට අධිකතර භයක් උපන්නේය. උන්වහන්සේ "මම මේ රජගෙට කොසින් ආයෙම් දැ"යි බලන්නෝ ජාතිසමරණ ඥානයෙන් දෙව් ලොවින් ආ බැව් දූන ඉන් ඇත බලන්නෝ ඒ නගරයෙහිම රජය කළ බැව් දුටහ. ඉක්බිති උන්වහන්සේ "මම විසි අවුරුද්දක් රජය කොට අසූ දහසක් අවුරුදු ඔසුපත් නිරයෙහි පැසුණෙමි, දැන් නැවතත් මේ සිරගෙහි උපන්නෙමි, මාගේ පිය රජ්ජුරුවෝද ඊයේ සොරු සතර දෙනෙකුන් සමීපයට ගෙනා කල්හි එයාකාර පරුෂවූ නරකයෙහි ඉපදීමට සුදුසුවූ බස් කිහ, මට මේ නිරතුරු මහත් අනර්ථ ගෙන දෙන්නාවූ රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. මේ සොරාගෙන් කෙසේ නම් මිදෙන්නෙමි ද"යි සිතමින් හොත්තාහ. ඉක්බිති උන්වහන්සේට එක් දෙව් දුවක් "පුත තෙමිය කුමාරයෙනි, භය නොවෙව, අඹ තුනක් අධිෂ්ඨාන කොට තොපට වැඩ වන්නේය"යි අස්වැසුවාය. මහා සත්ත්වයෝ ඒ අසා රාජ්‍ය සංඛ්‍යාත අනර්ථයෙන් මිදෙනු කැමැත්තෝ

(සොළොස් අවුරුද්දක්) තුන් අඟක් නිශ්චල අධිෂ්ඨාන වශයෙන් ඉටා ගත්හ. එහෙයින් වදුරණ ලදහ.

"කිමජාලද්ඛං පියං පුත්තා අජිජාතං ජුතිංධරං,
සෙතවජ්ජතා ධාරයිඤ්ඤානඤඤතෙ පොසෙතිමං පිතා. (290)

නිද්දාඝමාතෙ සඝතවරෙ පබුජ්ඣන්ධානහං තදා,
අදඤං පණ්ඩරං ජත්තං සෙනාහං නිරඝං භතෙ. (291)

සහදිට්ඨස්ස මෙ ජත්තං තාදෙසා උපපජ්ජතෙරවෙ,
විනිවජ්ජයං සමාපතෙතා ඤඨාහං ඉමං මුඤ්චිස්සං. (292)

පුබ්බඤාලොහිතා මය්හං දෙවතා අත්ථකාමිනි,
සා මං දිඤ්ඤාන දුක්ඛිතං තිසු ඨානෙසු යොජයි. (293)

මාපණ්ඩිච්චයං විනාවඝ බාලමතෙනව සබ්බපාණිනං,
සබ්බාජතෙනා ඔජිනාඝතු එවං තව අත්ථානවිස්සති. (294)

එවං වුත්තා ඝහං තස්සා ඉදං වචන මබ්‍රවිං,
කරොමි තෙ තං වචනං ඝං තවං භණසිදෙවතෙ,
අත්ථකාමාසි මෙ අම්ම හිතකාමාසි දෙවතෙ. (295)

තස්සාහං වචනං සුත්වා ඝාඝරෙව ඵලං ලභිං,
භතඨාඝංවිඝාමානඝසා තඝො අඛඝ අධිට්ඨහිං. (296)

මූඝතා අහොසිං බ්‍රහ්මරො පඝකාඝති විවජ්ජිතෙ,
එතෙ අඝඛ අධිට්ඨාය වස්සානි සොළසිං වසිං.,,සී (297)

මෙසේ මහා සත්ත්වයන් දෙව් දූ විසින් දෙන ලද ක්‍රමයෙහි සිට උපන් අවුරුද්දෙහි පටන් මූනාදි සවභාවයෙන් තමන් දක්වන කල්හි මවුපිය කිරිමවු ආදීහු ගොළුවන්ගේ හනු කෙළවර මෙබදු නොවෙයි, බිහිරන්ගේ කන් සිදුරු මෙසේ නොවෙති, පිළුන්ගේ අත්පා මෙසේ නොවෙත්. මෙහි කිසියම් කරුණක් විය යුතුය. ඒ පරීක්ෂා කෙරෙමුයි සිතා පළමු කොට කිරෙන් පරීක්ෂා කරම්හ"යි මුළු දවසම් කිරි නොදෙත්. උන්වහන්සේ වියලෙන්නෝද කිරට නොඇඩති. එකල උන්වහන්සේගේ මැණියෝ මාගේ පුත්‍රයෝ බඹගිනි ඇත්තෝය, උන්ට කිරි දෙවයි කියා කිරි දෙවවති. මෙසේ අතර තුර කිරි නොදී අවුරුද්දක් මුළුල්ලේ විමසන්නාහුද අතුරක් නුදුටුවාහුය. ඉක්බිති

කුමාරවරු වතාහි කැවුම් ආදී කැයුතුදු කැමතිවෙත්, එලාඵල කැමතිවෙත්, කෙළිබඩුවලට ප්‍රියවෙත්. ආහාරයට ප්‍රියවෙත් යයි කියා ලෝභ උපදවන්නාවූ ඒ ඒ භාණ්ඩ ආහාරාදිය එලඹවා විමසිම් වශයෙන් පොළඹවන්නාහු පස්හැවිරිදි කාලය දක්වා සිදුරක් නොදක්කාහුය. ඉක්බිති ළදරුවෝ නම් ගින්නෙන්ද, මතැතුන් ගෙන්ද, සර්පයන්ගෙන්ද, ඔසවාගත් කඩු ඇති පුරුෂයන් ගෙන්ද භයවෙත්යයි ඔවුන්ගෙන්ද විමසන්නෙමුයයි කියා ඔවුන්ගෙන් යම්සේ අනර්ථයෙක් නොවන්නේද, පළමුකොට විධානය කොට ඉතා බියසුණු වෙසින් වෙනට එන්නවුන් කාළහුය මහාසත්ත්ව නිරය භය සලකා මෙයින් සියක් ගුණයෙන්ද දහස් ගුණයෙන්ද දහදහස් ගුණ යෙන්ද නරකය භයානකයයි සිතා නිශ්චල වන්නාහ. එසේත් විමසා සිදුරක් නොදක්නාහු නැවත ළදරුවෝනම් නැවුම් කැමති වන්නා හුයයි නැවුම් පවත්වාද, මහා සත්ත්වයන් නිරයකින් වටකොට නොදනිද්දීම සතරපස සක්හඬින්ද, බෙර හඬින්ද, වහා එකනින් නාදකරවාද, කළුවරෙහි කළවලින් පහන් එලවා වහා එකවර එලිය දක්වාද, මුළු ශරීරය පැණිගල්වා බොහෝ මැස්සන් ඇති නැන වැද හොවාද, නැවිම් ආදිය නොකොට මලමූ මත්තෙහිම වැදහොත්සහුට මධ්‍යස්ථව සිටද, එහි ගැලුනාවූ නැනැත්තහුට නීරූ ආක්‍රෝශ වචනයෙන් ගවාද, ඇඳයට ගිනි කබල් තබා උෂ්ණ සන්තාපයෙන් පීඩා කොටද, නොයෙක් වැදැරුම් උපායයෙන් විමසන්නාහු ඉඩක් නම් නුදුටු වාහුය. මහාසත්ත්ව මේ සියලු තන්හිම නරකභය සලකා අධිෂ්ඨානය කඩ නොකොට නිශ්චලම වූහ. මෙසේ පසළොස් අවුරුද්දක් පරීක්ෂාකොට ඉක්බිති සොළොස් හැවිරිදි කාලයෙහි පිහුලෙක් හෝ වේවා, නොඑ බිහිරෙක් හෝ වේවා, ඇලුම් කටයුතු දෙයෙහි නැලෙන්නෙක්ද, අප්‍රිය වසතු වෙහි ප්‍රියවන්නෙක්ද නැතැයි උන්කරා කාටක සත්‍රින් එළඹවා පරීක්ෂා කර බලමුයයි කුමාරයන් සුවඳ පැනින් නහවා දෙව් කුමරකුමෙන් සරසා මල්දම් සුවඳ ආදියෙන් එකට ආමෝද ප්‍රමෝද ඇති දෙව් විමනක් බඳු පහයට නංවා උතුම් රූ ඇති භාව විලාස යෙන් යුත් දෙවඟනන් වැනි සත්‍රින් එලඹෙව්වාහුය. යව්, නැටීමාදියෙන් කුමාරයන් සිත් අලවව්" යයි. ඔව්හු හොස් එසේ කරනට උන්සාහ කළාහුය. උන්වහන්සේ තමන් නුවණැති නිසා "මොව්හු මාගේ ශරීරයෙහි පහස නොවිඳින්ව"යි හුසුම් වැලකූහ. ඔව්හු උන්ගේ ශරීර පහස නොලබන්නෝ

මේ තෙම දැඩිවූ සිරුර ඇත්තෙක, "මනුෂ්‍යයෙක් නොවන්නේය, යක්ෂයෙක් වන්නේය"යි හැරහියාහුය. මෙසේ සොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි සොළොස් විධ හා පරීක්ෂණයකින් හා තොයෙක් කුඩා පරීක්ෂණවලින්ද පිරිසිදහන්ට නොහැකිව මවුපිය දෙදෙන පුත තෙමිය කුමාරයෙනි, අපි තොප බිහිරෙකු කොරකු නොවන බැව් දනිමු, බිහිරන් ආදීන්ගේ මුව කන් සිදුරු ආදිය මෙසේ නොවෙත්. නෙපි එතෙහි අප විසින් ප්‍රාර්ථනාකොට ලැබූ දරුවෙක. අප නොනසව සියලු දඹදිව රජුන්ගේ සමීපයෙන් වන ඔහොවෙන් අප මුදව"යි යාචඤ්ඤකළහ. පිරිස් සහිතවද නොයෙක් වර යාචඤ්ඤ කළාහුය. උත්වහන්සේ ඔවුන් විසින් මෙසේ යාචඤ්ඤ කරන ලද්දේ නො ඇසුනාක් මෙන් හොත්හ. ඉක්බිති රජ්ජුරුවෝ මහා සත්ත්වයන්ගේ පාදෙකද, කන් සිදුරද, දිවද, අත් දෙකද, දක්ෂ පුරුෂයන් ලවා පරීක්ෂා කරවා ඉදින් මොහුගේ පාදාදිය පියාලන්ගේ මෙන් නුවූයේවි නමුත් මොහු පිහුලෙක, බිහිරෙකැයි සිතමිහ, මෙබඳු කාලකණ්ණි පුරුෂයකු මේ ගෙයි වසන කල්ලහි ඔබ වහන්සේගේ ජීවිතයට හෝ රාජ්‍යට හෝ මෙහොසියට හෝ අන්තරායයෙක් වන්නේයයි නිමිති කියන්නන් විසින් දැන් කියන ලද්දේය, එපන්දා වානාහි නුඹ වහන්සේගේ දෙමිනිය දුරුකරනු පිණිස ධන්‍ය පුණ්‍ය ලක්ෂණයෙන් යුක්තය කියා ප්‍රකාශ කළාහුයයි අමාත්‍යයන් කියූ බස් අසා අන්තරායයට බියපත්ව"යව, ඔහු අවමඟුල් රථයෙහි හොවා පැසුලු දෙරින් ගෙන හොස් අමු සොහොනෙහි වළලව"යි අණකළහ. ඒ අසා මහා සත්ත්වයෝ බොහෝ කලකින් මාගේ මනදෙල පිරෙන්නේයයි තුටු පහටු වූවාහු ඔදවැහි සින් ඇත්තාහු වූහ. එහෙයින් වදාරණ ලදි.

"තතෝ මේ හට්ඨ පාදෙව ජීවිතං සොතංච මද්දිය,
අනුනතං මේ පස්සිත්වා කාලකණ්ණී ති නිදදිසුං (298)

තතෝ ජානපදා සබ්බේ සෙනාපති පුරොහිතා,
සබ්බේ එකමතා ත්වා ඡඩ්ඩනං අනුමොදිසුං. (299)

සොහං තෙසං මතිං සුත්වා හට්ඨෝ සංවිගහමානසෝ,
යසසත්ථාය තපොවිත්තෙණා සෝ මේ අත්ථෝ
සමිජ්ඣථ"සි. (800)

මෙයේ කුමාරයන් වැළලීමට රජු අනුදන්නා ලද්දේය. වඳුරා බිසව් එපවත් අසා රජ්ජුරුවන් වහන්සේ කරා එළඹ "දෙවයන් වහන්ස, නුඹ වහන්සේ විසින් මට වරයක් දෙන ලද්දේය, මාද එය ගත්නා ලද්දක් කොට තබන ලදී. මට දැන් ඒ වරය දුන මැනව"යි කීහ. "දෙවිනි, ඒ වරය ගනුවයි" කිහ. "දෙවයන් වහන්ස, මාගේ පුතණුවන්ට රජය දුන මැනව" "දෙවිනි, තොපගේ පුතණුවෝ කාලකණ්ණියෙක, එහෙයින් රජයදෙන්ට නොහැක්කේය." "දෙවයන්වහන්ස, දිවිහිමියෙන් තොදෙනසේක් වීනම් සත් අවුරුද්දක් දුන මැනව, එද නොහැකියයි කිසඳ සෘඅවුරුද්දක්, පස් අවුරුද්දක්, සතර අවුරුද්දක්, තුන් අවුරුද්දක්, දෑ අවුරුද්දක්, එක් අවුරුද්දක්, සත් මසක්, සමසක්, පස් මසක්, සාර මසක්, තුන් මසක්, දෙමසක්, එක් මසක්, අඩ මසක්, සත් දවසක්, දුනමැනව"යි කීකල්හි "යහපත ගනුව"යි කිහ. බිසව් පුතණුවන් කුමාරු හරණයෙන් සරසා "මේ තෙමිය කුමාරයන්ගේ රාජ්‍යය"යි නුවර බෙර හසුරුවා නුවර සරසවා පුතණුවන් ඇන්කද පිට වඩා හිඳුවා සේසත් මත්තෙහිතඟා නුවර පැදකුණු කොට ආවාහු සිරිසයතෙහි සතප්පවා රාත්‍රිය මුළුල්ලෙහිම යාචඤ්ඤ කළාහ. පුත තෙමිය කුමාරයෙනි, තොපනිසා සොළොස් අවුරුද්දක් නිදි නොලැබ අඩන්නාවූ මාගේ ඇස් බමන්නාහුය. සොකයෙන් ළය පැලියන්නාක් මෙන් විය. තොප ගොළුබිහිරි ආදි කෙතෙකු නොවන බව දනිමි, මා අනාථ නොකරව"යි යාචඤ්ඤකළාහ. මේ ක්‍රමයෙන් දවස් හයක්ම යාචඤ්ඤකළහ. සවැනි දවස් රජ්ජුරුවෝ සුතසඳ තම් රථාවාර්‍යයා කැඳවා "හෙට උදයම අවමඟුල් රථයෙන් කුමාරයා ගෙන ගොස් අමුසොහොන් බිම වළලා බිම වඩනා කිස කොට එව"යි කිහ. ඒ අසා බිසව් "පුත, කසී රජ්ජුරුවෝ හෙට තොප අමුසොහොනෙහි වළලවයි නියොග කළහ, හෙට තොපට මරණය පැමිණෙන්නේය"යි කීහ. ඒ අසා මහාසත්ත්වයෝ "තෙමිය කුමාරයෙනි, තා විසින් සොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි කළ ව්‍යායාමය මුදුන් පැමිණියේය"යි තුටුපහටු වූහ, ඔදවැඩි සිත් ඇත්තෝ වූහ. මවුගේ ළය පැලෙන්නාක් මෙන් වූයේය. ඉක්බිති එදා පාන්වූකල උදැසනම රථාවාර්‍යයා අවමඟුල් රථය ගෙනවුත් දොරකඩ තබා සිරියහන් ගබඩාවට වැද "දෙවිනි' මට නොකිපුණු මැනව, රජහුගේ නියෝගයයි කියා පුතණුවන් වැළඳ ගෙන

සොන් බිසවුන් පිටිඅතින් ඉවත්කොට කුමාරයන් වඩාගෙන මාලිගයෙන් බැස්සේය. බිසවු ළෙඟි අත් හපා මහ හඬින් හඬා මතුමහළෙඟි හුන්හ. ඉක්බිති මහා සත්ත්වයෝ එසේඋන් මැණියන් බලාපියා මා කොබැණ සිවිකල මවුගේ සෝකය බලවත් වන්නේ යයි බැණනබිනු කැමතිවත් "ඉදින් මම බැණ නැගෙම් නම් සොළොස් අවුරුද්දක් කළ උත්සාහය සිස්වන්නේය, මම කතා නොකළෙම් නම් තමහටත් මවුපියන්ටත් පිහිට ඇත්තෙක් වෙම්" යයි ඉවසූහ. රථාචාර්යයා මහාසත්වයන් රියෙඟි නංවාගෙන "බස්නාඟිර දිශාවට අභිමුඛව රථය පැදගෙන යන්නෙම්"යි සිතා නැගෙනඟිර දිශාවට අභිමුඛව රථය ගෙන ගියේය. රථය නුවරින් නික්ම දෙවියන්ගේ ආනුභාවයෙන් තුන්යොදුනක් තැන් ගියේය. මහාසත්ත්වයෝ ඉතා මැනවින් සතුටට පැමිණියහ. එතැන්හිවූ ලැහැබ රියදුරුහට අමුසොහෙ, නක්මෙන් වැටගිණ. හෙතෙම "එතැන යහපතැ"යි රථය නවත්වා මග පසක තබා රථයෙන් බැස මහාසත්ත්වයන්ගේ ආභරණ භාණ්ඩ මුදා පොදියක් කොට බැඳ තබා උදැල්ල ගෙන නුදුරුතැනක් කපන්ට පටන් ගත්තේය. එහෙයින් වදුරණ ලදී.

"නහාපෙත්වා අනුලිම්පිත්වා වෙඨෙත්වා රාජවෙඨනං
ජනෙත්තන අභිසිඤ්චිත්වා කාරෙසුං පුර පදක්ඛිණං. (301)

සත්තාහං ධාරයිත්වාන උගහන්තෙ රවිම්හි ඛලෙ,
රථෙන මං නිහරිත්වා සාරථි වන මුපාගමි. (302)

එකොඤ්ඤාසෙ රථංකත්වා සජ්ජයිත්වා හයෙ මුඤ්චතෙ,
සාරථි ඛණති කාසු නිඛාතුං පඨවියං මමං. (303)

අඩිච්ඡිතමඩිඨානං තජෙජනෙනා විච්ඡ කාරණා,
නඟිඤ්ඤං වත මඩිඨානං ඛොඩියා යෙව කාරණා. (304)

මාතා පිතා නමෙ දෙසුං අත්තානමෙ න ච දෙසයිසො,
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා වත මඩිඨකිං. (305)

එතෙ අඤ්ඤෙ අඩිඨාය වයසානි සොළසිං වසිං,
අඩිඨානෙන සමොනන්හි එසාමෙ අඩිඨාන පරමි"සි (306)

ඉක්බිති මහාසත්ත්වයෝ සුනඤ්ඤ නම් රියැදුරු වළ කණින කල්හි "දැන් මට මේ උත්සාහ වඩන්ට කලෑ"සි තැගී සිට තමන්ගේ අත්පා පිරිමැද රියෙන් බැසීමට සිතූහ. එසෙණෙහිම උත්වහන්සේගේ පාද ප්‍රතිඝාතය වාතයෙන් පිරුණු සම් පයියක්මෙන් උඩට තැගී රියෙහි පස්සෙළවර පැහැර සිටියේය. උත්වහන්සේ රථයෙන් බැස කිපවරක් ඔබිමොබ ඇවිද හවු සියයක් නමුදු යන්ට ශක්ති ඇත්තේයයි දැත රිය පස්සු කෙළ-වරින්ගෙන කුමරුන් කෙළින යානයක්මෙන් ඔසවා ඉදින් රථාචාර්‍යයා මට විරුඬවන්නේ නම් මට ඔහු හා ප්‍රතිවිරුඬවන්ට ශක්ති ඇත්තේයයි සලකා අබරණින් සැරසෙනු පිණිස සිතක් උපන. එකෙණෙහිම සක්දෙවිදුගේ පඬුපුල් සලස්න හුනුවිය සක්දෙව් රජාණෝ ඒ කාරණය දැන විස්කම් ඇතවූහ. "යම, ගොස් කසී රජ්ජුරුවන්ගේ පුත්‍රයන් සරසව"සි, හෙතෙම මැනවයි පිළිගෙන උත්වහන්සේ දෙවිමිනිස් අබරණින් සක්දෙව් රජුමෙන් සැරසූයේය. බොධිසත්ත්වයෝ දිව්‍ය රාජ විලාසයෙන් රථාචාර්‍යයා වළකණින තැනට නොස් සම්පයෙහි සිට

217. කින්නු සන්තරමානොව කාසුං ඛණසි සාරථි,
පුථෙථා මෙ සම්ම අක්ඛාහි කිං කාසුයා කරිස්සති

යන ගාථාව කීහ එහි අර්ථ නම්:- "රථාචාර්‍යයෙනි, සුහුව කුමක් නිසා වළක්කණින්නෙහිද, මා විසින් විචාරණලද සඬ, වළින් කුමක් කරන්නෙහිදැයි කියව" යනුයි. ඔහු විසින් උඬ නොබලාම

218. රඤ්ඤමූහො ව පක්ඛා ච පුත්තෙනා ජාතො අවෙතසෝ
සොම්හිරඤ්ඤ සම්ජක්ඛිථෙථා පුත්තං මෙ නිඛණං
වතෙති.

යනුවෙන්කසිරජුහට ගොළු පිළු බිහිරි පුතෙක් උපන්නේය. ඒ රජු විසින් මාගේ පුත්‍රයා වෙතෙහි වළලවයි නියෝග කරන ලද්දෙමි. එහෙයින් වළක් කණිමියි කිකල්හි මහාසත්ත්වයෝ:-

219. න බධිරෝ න මූහොසම් නපක්ඛා තව පඬිතෝ,
අඛමමං සාරථි කසිරා මඤ්ඤ ත්වං නිඛණං වතෙ.

223 උත්තරං බාහුංච මේ පස්ස භාසිතස්සච සුණෝහිමේ,
අධම්මං සාරථි කාසිරා මඤ්ඤස්ස එවං නිබ්බණංවතෙ.

යනුයෙන් මම බිහිරිවූවෙක් නොවෙමි, ගොළුවෙක් නොවෙමි, කොරෙක්නොවෙමි, පිළෙකුත් නොවෙමි, රථාවාසියෙහි, එබඳුවූ මා වෙතෙහි වළලන්නාවූ නෝ අධර්මයක්කරන්නෙහිය, (ඒ අසාත් උඹ නොබලා වළකණන්නාවූ සාරථියා දැක) කෙසෙල් කඳන් බඳුවූ මාගේ කලවාද, රත්වත් සිවි පැහැ ඇති අත්යුවලද බල, මාගේ මියුරු තෙපුල්ද අස, එසේවූ මා වෙතෙහි වළලන්නාවූ නෝ අධර්මයක් කරන්නෙහි යයි කීහ. එකළ වළ කැණීම හැර උඹ බලා උත්වහන්සේගේ රූපසම්පත්තිය දැක මනුෂ්යයෙක්ද, දෙවියෙක්දැයි නොදන්නා වූ ඔහු විසින්

221 දෙවතානුසි ගන්ධබ්බෝ ආදුස්සකෝ පුරිසුදෙ,
කෝ වා තුවං කස්සවා පුත්තෝ කථං ජානෙමු තං මයං.

යනුවෙන් ස්වාමිනි, නුඹවහන්සේ ගන්ධර්ව දෙව පුත්රයාණ කෙනෙක් වෙත්ද, නොහොත් පුරින්දද නම්වූ ශක්රදෙවෙන්ද්රයෝ වෙද්ද, කවරෙක්ද, කවරක්හුගේ පුත්රයාණ කෙනෙක් හෝ වෙද්ද, අපි ඒ කෙසේ දැනගනුමුදැයි කිකල්හි බොධි සත්වයෝ

222. නම්හිදෙවෝ නගන්ධබ්බෝ නම්හිසක්කෝ පුරින්දදෙ,
කාසිරඤ්ඤස්ස අහං පුත්තෝ යං කාසුයා නිබ්බඤ්ඤසි

223. තස්සරඤ්ඤස්ස අහංපුත්තෝ යං තුවං සම්පජීවසි,
අධම්මං සාරථි කාසිරා මඤ්ඤස්ස තුවං නිබ්බණංවතෙ

224. යස්සරුක්ඛස්සඡායාය නිසීදෙය්ය සයෙය්යවා,
න තස්ස සාඛං භිඤ්දෙය්ය මිත්තදුබ්භොහි පාපකෝ

225. යථාරුක්ඛෝ තථාරාජා යථාසාඛා තථා අහං,
යථා ඡායූපගෝ පොසෝ එවං තුම්හි සාරථි;
අධම්මං සාරථි කාසිරා මඤ්ඤස්ස තුවං නිබ්බණං වතෙ.

යන මේ ආදි ගාථාවෙන් දහම් දෙසූසේක. එහි අර්ථ නම්:- මම වූකලි දෙවියෙක් නොවෙමි, ගන්ධර්ව දිව්ය පුත්රයෙකුත් නොවෙමි, පුරින්දද නම්වූ සක්දෙවිරජුද නොවෙමි, යමකු තෙල වළෙහි ලන්නෙහි නුඹ මම ඒ කාසිරජහුගේ පුත්රවෙමි. එබඳුවූ

මා වෙතෙහි වළලන්නාවූ තෝ අධර්මයක් කරන්නෙහියයි සිතමි යම් වෘක්ෂයක්හුගේ සෙවණෙහි හිඳින්නේ හෝ සැතපෙන්නේද, ඒ වෘක්ෂයාගේ අතු නොකඩන්නේය. මක්නිසාද යත්? ලාමකවූ මිත්‍රද්‍රෝහියකු වනබැවිනි. රජ්ජුරුවෝ රුකමේන්ද, ඒ රුක අතුමෙන් මමද, සාරථියෙනි, නෝ වනාහි ඒ රුක්සෙවණෙහි සැතපුනු එකකුමේන්ද වන්නෙහිය. එබඳු මා වෙතෙහි වළලන්නාවූ තෝ අධර්මයක් කරන්නේයයි සිතමි යනුයි.

එසේ ධර්මදේශනාකොට රථාචාර්‍යයා විසින් හැරි එනු පිණිස යාචඤ්ඤාකරනලද්දේ තොහැරි එන කාරණයද, ප්‍රව්‍රජ්‍යාධ්‍යාශයද, ඊටහෙතුවද නාගරය ආදිකොට ඇති අතීතභවයෙහි තමන්ගේ ප්‍රවෘත්තද විස්තර වශයෙන් කීහ. ඒ ධර්මකථාව හා ඒ ප්‍රතිපත්තිය නිසා ඔහුත් පැවිදිවනු කැමතිවූකල්හි රජහට

226. රථං නීයාදයිත්වාන අණෙනං එහි සාරථි,
අණත්ථඤ්ච පබ්බජ්ජා එතං ඉසිහි වණ්ණිතං

යනුවෙන් සාරථියෙනි, මේ රථය ගෙන ගොස් දී ණයෙන් නිදහස්ව එව, ණය නැත්තහුගේ පැවිද්ද බුද්ධාදි ඍෂීන් විසින් පසස්නාලද්දේයයි කියා ඔහු හැරියහ. රියැදුරුතෙම රථයද ආහරණද ගෙන රජු සමීපයට ගොස් ඒ කාරණය කිවය්ය. රජ්ජුරුවෝ එකෙණෙහිම මහාසත්ත්වයන්ගේ සමීපයට යන්නෙමි"යි නුවරින් නික්ම සිවුරහ සෙතඟ අන්තඃපුර වාසින්ද විශ්වාස අමාත්‍යයන්ද නුවරුන් හා දනව් වාසින්ද ඇතුළුව ගියහ. මහාසත්ත්වයෝ රථාචාර්‍යයා යවා තුමූ පැවිදිවනු කැමතවූහ ශක්‍රයෝ උන්වහන්සේගේ සිත දැන තෙමියපණ්ඩියෝ පැවිදිවනු කැමැත්තෝය. ඔවුන්ට පන්සලක්හා පැවිදි පිරිකරත් මවාලවයි විශ්වකර්මී දිව්‍යපුත්‍රයා යැවූහ. හෙතෙම ගොස් තුන් යොදුන් පමණ වණලැහැබෙහි ආශ්‍රමයක් මවා රාත්‍රිස්ථාන දිවාස්ථාන චඞ්ක්‍රමණී පුෂ්කරිණී ඵලවෘක්ෂයන්ගෙන් සම්පූර්ණී කොට සියලු පැවිදි පිරිකරද මවා දෙව්ලොවටම ගියේය. බොධිසත්ත්වයෝ ඒ පන්සල දැක ශක්‍රයා විසින් දුන්බැව් දැන පන්සලට වැද වසනු ඉවත්කොට තවුස් වෙස්ගෙන දඹුඇතිරි යෙක්හි උන්නෝ පංචාභිඥ අෂ්ටසමාපත්තීන් උපදවා ප්‍රව්‍රජ්‍යා සැපයෙන් ආශ්‍රමපදයෙහි උන්හ. කසිරජ්ජුරුවෝ රියැදුරු

විසින් දක්වනලද මාර්ගයෙන් ගොස් පන්සලට පැමිණ මහා සත්ත්වයන් හා එක්වගෙන කරනලද පිළිසඳර ඇත්තාහු රාජ්‍ය යෙන් ආරාධනා කළහ. තෙමිය පණ්ඩිතයෝ ඒ ප්‍රතික්ෂේප කොට නොයෙක් ආකාරයෙන් විස්තරවූ අනිත්‍යතාව හා කාම්දිනව ප්‍රතිසංයුක්ත ධර්ම කථාවෙන් සංවේග උපදවාලූහ. රජ්ජුරුවෝ සංවේග සින් ඇත්තාහු ගිහිගෙයි කලකිරුණාහු පැවිදිවනු කැමතිව අමාත්‍යයන් හා අන්තඃපුර වාසීන් අතින් විවාළහ. ඔව්හුද පැවිදිවනු කැමතිවූහ. ඉක්බිති චන්ද්‍රා දෙවි ආදි කොට ඇති සොළොස් දහසක් අන්තඃපුර ස්ත්‍රීන් ඇතුළු අමාත්‍යාදීන් පැවිදිවනු කැමතිබව දැන යම් කෙණෙක් මාගේ ප්‍රතිඥාවන් ලබා පැවිදිවනු කැමතිවන්නාහුනම් ඔව්හු පැවිදි වෙත්වයි නුවර බෙරහැසිරවූහ. රත්රුවන් ගබඩාදිය විවෘතකොට හළහ. නුවර වැස්සෝද ප්‍රඥාරිතපරිද්දෙන්ම සල්පිල්ද දෙරහැරි ගෙවල්ද හැරදමා රජ්ජුරුවන්ගේ සමීපයට ගියාහුය. රජ්ජුරුවෝ මහජනයා සමඟ මහාසත්ත්වයන් සමීපයෙහි පැවිදිවූහ ශක්‍රයා විසින් දෙනලද තුන්යොදුන් පමණ අසපුව පිරිහියේය. සමීප නුවරවැසි රජවරු කසිරජු පැවිදිවූහයි අසා "බරණැස් රජය ගන්නෙමුය"යි නුවරට වැද දෙවිනුවරක් වැනි නුවරද, සත්රුවන් පිරුණු දෙව්විමනක් බඳු රාජභවනයද දැක මේ වසනුව නිසා වත භයකින් ගියේ වනැයිසිතා එකෙණෙහිම නික්මගියාහුය. ඔවුන්ගේ ඒම දැක මහා සත්ත්වයෝ වත කෙළවරට ගොස් අහසෙහි හිඳ ධර්මදේශනාකළහ. ඔවුහු සියල්ලෝම පිරිස් සහිතව උත්වහන්සේගේ සමීපයෙහි පැවිදි වූවාහුය. මේ ක්‍රමයෙන් අනිකෙක් අනිකෙක් යයි මහා සමාගමක් වූයේය. සියලුදෙනාම පලවැල අනුභව කොට ශ්‍රමණ ධර්මය කෙරෙත්, යමෙක් කාමාදි චිතර්කයන් සිතාද, මහාසත්ත්වයෝ ඔහුගේ සිතදැන එහි ගොස් අහසෙහි හිඳ ධර්ම දෙශනා කරතසේක. හෙතෙම ධර්මශ්‍රවණ සත්ප්‍රාය ලැබ සමාපත්තීන් හා අභිඥාවන්ද උපදවයි. මේ ක්‍රමයෙන් අනිකෙක අනිකෙකැයි සියලුදෙනාම දිවි කෙළවර බඹලොව උපන්නාහුය. තිරිසනුන්ද මහාසත්ත්වයන් හා තාපසවරු කෙරෙහි සිත්පහදවා සක්දෙව් ලොවෙහි උපන්නාහුය. මහාසත්ත්වයන්ගේ ඒ බ්‍රහ්මවර්යාව ඉතා බොහෝ කාලයක් පැවතිණ.

එකල සේසතෙහි වාසයකළ වූ දෙවිදු උත්පලවර්ණාවෝ වූහ. පියදුරු ශාරිපුත්‍රස්ථවිරයෝය, මවුපියෝ මහා රාජ කුලයෝය. පිරිස බුදුපිරිසමය, තෙමය පණ්ඩිතයෝ ලොක ස්වාමිවූ බුදුරජාණන්වහන්සේය.

උන්වහන්සේගේ අධිෂ්ඨාන පාරමිතාව මෙහිදී මහත්ත ප්‍රාප්තවූයේය. සෙසු පාරමිහුද සුදුසු පරිද්දෙන් නිර්ධාරණය කටයුත්තාහුය. ඒ එසේමය. උපත් එක්මස් කල් පටන් නිරය භයද පාපයට භයද, රාජ්‍යය පිළිකුල් කිරීමද, තෙත්‍රිමය නිමිත්තකොට මූගාදි සවභාවය ඉටාගැන්මද එහි විරෝධ හෙතු ඇති කල්හිත් නිශ්චලභාවයද යන මේ ආදී ගුණානුභාවයෝ විභාවනය කටයුත්තාහුය.

පරමාර්ථ දීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි තුන්වන සුධාභූජය වර්ගයෙහි සවන තෙමය පණ්ඩිත චරිතය නිමි.

අධිෂ්ඨාන පාරමිතාව කියා නිමවනලදී.

(XX) VII කපිරාජ චරිතය.

——o——

තවද මේ පරමාර්ථ දීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි තුන්වන සුධාභූජය වර්ගයෙහි සත්වන කපි රාජ චරිතය කියේය යත්:-

යදා අහං කපි ආසිං නදිකූලෙ දරීසයෙ,
පිළිතෝ සුංසුමාරෙන ගමනං න ලභාම්හං. (307)

යම්බවෙත් යම්කලෙක්හි මම වදුරෙක් වූයෙම්ද, එකල එක් ගංඉවුරක් සමීපයෙහි වූ ගල්ගුහාවක වාසය කෙළෙම් එකල්හි මම කිඹුලකු විසින් පීඩාකරන ලද්දෙම් ගමනක් නොලබම්. මේ එහි පිළිවෙළ කතාවයි.

එකල අප මහා බොධිසත්ත්වයෝ වඳුරුමුල පරිහරණය කොඅකොට හුදකලාව විසූහ. ඒ ගහ මැද අඹකොස් ආදි නත් වැදුරුම් නෙඑහටගන්නා ගස්වලින් හෙබියාවූ දිවයිතක් විය. බෝසත්හු කායශක්තියෙන් හා ජවයෙන් යුකත බැවින් ගංගා වගේ මෙතරින් පැන දිවයිතට එතරින් ගහමැද පිහිටි ගලෙක හෙන්නාහ. එතනින් පැනතැගී දිවයිතෙහි හෙන්නාහ. උන් වහන්සේ එහිදී නත්වැදුරුම් පලවැල අනුභව කොට සවස ඒ ක්‍රමයෙන් නැවත අවුත් තමන් වසන තැන වැස දෙවස දවසත් එසේම කරන්නාහ. උන්වහන්සේ මේ ක්‍රමයෙන් වාසයකළහ. එකල එක් කිඹුලෙක් බිරිඳ සමග ඒ ගහෙහි වෙසෙයි. උගේ ඒ බිරිඳ ඔබිනොබ ඇත්තාවූ බෝසතාණන් දැක උන්වහන්සේගේ හදමසෙහි දෙළක් උපදවා කිඹුලාට කියන්නී 'සවාමි පුත්‍රයාණෙනි, මට වතාහි තෙල වඳුරාණන්ගේ හදමසෙහි දෙළක් උපන්නේය"යි කිවාය. හෙතෙම "ඇහපත නොඳුර, ලබන්නෙහිය"යි කියා "අද සවස දිවයිතෙන් එන්නාවූ උන් අල්වා ගන්නෙමි"යි ගොස් අතළ ගලෙහි හොත්තේය. බෝසත්හු දහවල් දවස ගොදුරු පිණිස හැසිර සවස්වේලෙහි දිවයිතෙහි සිටියාහුම ගලදෙස බලා "මේ ගල දැන් ඉතා උස්ව පෙනෙන්නේය. ඊට කරුණු කිම්දැ"යි සිතූහ. මහ බෝසතාණන්ට ගඟ දිය පමණද ගලෙහි පමණද මතාකොට ව්‍යාවසථා පිතව (වැටහි) තිබුණේය. එහෙයින් උන්වහන්සේට මෙසේ අදහස් විය. "අද මේ ගඩගාවගේ ජලය තොඅඩු වන්නේය, එතකුදු උවත් මේ ගල මහත්ව පෙනෙන්නේය, කිමෙක්ද, මෙහි මා අල්වා ගනු පිණිස කිඹුලෙක් හොත්තේදෝ හෝයි "පළමුකොටම ඒ පරීක්ෂාකරන්නෙමි"යි බෝසත්හු එහි සිට පහණ සමග කතාකරන්නාක්මෙන් "හවත් පහණෙ"යි කියා පිළිවදන් නොලබන්නෝ තුන්වැනිවර දක්වා "පහණ පහණෙ" යි කිහ. එකල්හි "පහණ තෙම කවරහෙයකින් පිළිවදන් නොදේදැයි යළිත් බෝසත්හු භවත් පහණ, අද මට කුමක් නිසා පිළිවදන් නොදෙන්නෙහිදැ" යි කිහ. කිඹුල්තෙම එකානනයෙන් අනික් දවස්වල මේ පහණ වඳුරිදුන්ට ප්‍රතිවචන දෙන්නේය. අද වතාහි මා පහණ උඩ හොත් හෙයින් නොදේයයි සිතම්, එබැවින් මම උන්ට පිළිවදන් දෙමි"යි සිතා "කිමෙක වඳුරිදුනි"යි කියා "තෝ කවරෙක්ද? "මම කිඹුලෙක්මි" කුමක් පිණිස මෙහි හොත්තේදැ"යි "තොපගේ ලෙහි මස්පතමි"යි එවිට බෝසත්හු මෙසේ සිතූහ. "මට යායුතු අනික් මගෙක් නැත්තේය. එකානනයෙන් මාගේ ගමන වැළක්කේය"යි

පිළිසතා සුංසුමාරෙන ගමනං න ලභාමහං,
යමෙමහාභායසෙ අහං ඨපෙතා බරපාරං පතාමිහං,
තස්සවජ්ජ සතතුවධඤ්ඤා කුම්භිලෙ වුද්ද දසසනෙ (305)

යනු එහෙයින් වදාරණලදී.

ඉක්බිති බෝසත්හු මෙසේ සිතූහ. "අද මා විසින් කිඹුලා වංචා කටයුතුය. එසේ ඇතිකල්හි හෙතෙම මා විසින් මහත් පවකින් වලකන ලද්දේය. මාගේ ජීවිතයත් ලබන්නලද්දේය"යි සිතා උත්වහන්සේ කිඹුලාට මෙසේ කීහ. "යහළු කිඹුල, මම තොප මත්තෙහි හෙන්නෙම්"යි කිඹුල්තෙම කියනුයේ "වදාරාණනි, පමාතොකොට මෙහි එව"යි කීයේය. මහසත් "මම එන්නෙම්, තෝ වතාහි තමාගේ කට හැරපියා මා තාගේ සමීපයට ආකල ගණුව"යි කීහ. කිඹුලුත්ගේ වතාහි කට දැල්වූකල ඇස් පියවෙත්. ඌ ඒ කාරණය නොසලකා කටහැරියේය. ඉක්බිති උගේ ඇස් පියවූහ. ඌ කටහැර හැමලෙසින්ම පියවිහිය ඇස් ඇතිව වැද හොත්තේය. මහාසත්වයෝ ඌ එසේ හුන්බව දැන දිවයිතෙන් පැන තැහි කිඹුලාගේ මස්සාකය මැඩ නෙත ඉත් තැගී විදුලියක් මෙන් දිලිසෙමින් පරතෙර සිටියහ. එහෙයින් වදාරණ ලදී.

"සො මං ආසිංසි එහිනි අහඤ්ඤිනි තං වදිං,
තස්ස මජ්ඣකමඤ්ඤාමම පරකූලෙ පතිට්ඨහිං. (304)

න තස්ස අලිකං භණිතං යථා වාචං අභාසහං,
සචෙවන මෙ සමෝ නත්ථි එසා මෙ සච්චපාරමී"යි (309)

කිඹුල් තෙම ඒ ආශ්චර්යය දැක "මේ වදුරා විසින් ඉතා ආශ්චර්යයක් කරන ලද්දේය"යි සිතා "හඳින් වදුරාණනි, මේ ලොකයෙහි ධර්ම සතරකින් යුක්තවූ පුද්ගලතෙම සතුරන් මැඩ පවත්නේය. ඒ සියලු ධර්මයෝ තොපගේ අබ්භන්තරයෙහි ඇතැයි" සිතමියි කීහ. එහෙයින් වදාළහ.

227. "යසෙස තෙ චතුරෝ ධම්මා වාතරිංසු යථා තව,
සච්චං ධම්මෝ ධිති චාගෝ දිට්ඨං සෝ අතිවත්තති"යි

එහි අර්ථ:—"වානරෙන්ද්‍රය, වාක්සත්‍යයද මේසේ කළකල මෙතම් දෙයක් වත්තේය යම විවාරණ ඥානයද, තොසිද

පවත්නාවූ වියහිද, නත්‍යාගයද යහ මේ සතර ධර්මයෝ බුඩ වහන්සේට මෙත් යමක් හට ඇද්ද, හෙතෙම සතුරා මැඩ පවත්නේය" යනුයි.

මෙසේ කුමිගිල තෙම බොධිසත්ත්වයන්ට ප්‍රශංසාකොට තමන්ගේ වාසස්ථානයටම ගියේය. එකල්හි කුමිගිල තෙම දෙවදහනවූයේය. ඔහුගේ භාර්‍යා තොමෝ චිංචමානවික්‍රාවය, වානරෙන්ද්‍රයෝ වනාහි ලොකයාබිවූ බුදුරජාණන් වහන්සේය. මේකිද උත්වහන්සේගේ අවශේෂ පාරමිහු විසාර කටයුත්තාහුය, ඒ එසේමය. ගංගාජලය හා පාෂාණයාගේත් ප්‍රමාණය පරීක්ෂා කිරීමෙන් දැන් පාෂාණය වඩා උස්ව පෙනෙන්නේයයි පරීක්ෂා කිරීම වශයෙන් පාෂාණයාගේ මත්තෙහි කිඹුලාහොත්බව දැන්මද, පහණ හා සමග කථාකිරීම වශයෙන් ඒ කාරණය, දැනගැනිමද, කිඹුලාගේ මිසනාකය පාහා වහා එතර පිහිටීම වශයෙන් ශීඝ්‍රකාරිතාවෙත් ඌ මහත් පාපයෙන් මිදවීමද. තමන්ගේ දිවි රැකිමද, සබවස රැකිමද යන මේ ආදි ගුණානුභාවයෝ විභාවනය කටයුත්තාහුය.

පරමාර්ථ දීපනී නම් චර්යාපිටක අට්ඨවාවෙහි තුන්වන යුඛඤ්ජය වග්ගයෙහි සත්වන කපිරාජ චරිතය නිමි.

(XX) VIII. සච්ච තාපස චරිතය.

තවද මේ පරමාර්ථදීපනී නම් චර්යාපිටක අට්ඨවාවෙහි තුන්වන යුඛඤ්ජය වග්ගයෙහි අටවන සච්ච තාපස චරිතය කියේය යන්:—

පුනා'පරං යදා හොමි තාපසෝ සච්ච නාමයෝ,
සච්චේන ලොකං පාලෙමි සමගහා ජනමක්ඛාසහං. (310)

යනුවෙන් තැවත අනික් චරිතයක් කියන්නෙමි. යම් කලෙක්හි මම සච්චනම්වූ තාපසයෙක් වීමිද, එකල්හි සත්‍ය වචනය කරණ කොටගෙන සත්ත්වලොකය හෙවත් දඹදිව ඒ ඒ

සත්ත්වනිකායයන් පාපයෙන් හා නානාවිධ අනර්ථයෙන් රක්ෂා කෙළෙමි. මම ඒ ඒ තැන කලහ විග්‍රහ විවාදදියට පැමිණි මහා ජනයා කලහයෙහි ආදීනව හා සාමග්‍රියෙහි ආනිසංස කියමින් සමගි කෙළෙමි. එහි මේ පිළිවෙළ කථාවයි.

එකල්හි අප මහා බොධිසත්ත්වයන් වහන්සේ බරණැස් නුවර එක්තරා බ්‍රාහ්මණ මහාසාර කුලයෙක්හි උපන්හ. උන්ට සත්‍ය යයි නම් කළාහුය. උන්වහන්සේ වැඩිවිය පැමිණ තක්ෂලා නුවරට ගොස් දිසාපාමොක් ආචාර්යයන් ළඟ ශිල්ප ඉගෙන කොබෝ කලකින් සියලු ශිල්පයාගේ පරතෙරට පැමිණියහ. එකල ආචාර්යයන් විසින් අනු දන්නා ලද්දාහු බරණැසට අවුත් මවුපියන් වැඳ ඔවුන් විසින් සතුටුකරනු ලබන්නාහු ඔවුන්ගේ සිත් රක්නා පිණිස කිපදිනක් ඔවුන්ගේ සමීපයෙහි වාසය කළහ. ඉක්බිති මවුපියෝ උන්වහන්සේ සුදුසු කුමරියක් සමග යොදවනු කැමැත්තාහු සියලු සම්පත් කියාදී ගෘහවාසයෙන් නිමන්ත්‍රණය කළාහුය. මහාසත්ත්වයෝ නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශය ඇත්තාහු තමන්ගේ නෛෂ්ක්‍රම්‍යපාරමිතාව වඩනු කැමැත්තෝ ගෘහවාසයෙහි ආදීනව හා පැවිදිවීමෙහි අනුසස් කොයෙක් පරිදීදෙන් කියා මවුපියන් කදුළුවැකි මුහුණෙන් යුක්තව අඩාසිටියදී අප්‍රමාණ භොගස්කන්ධයද, අතන්ත යසසද, මහත් ඥති සමූහයාද හැරපියා යදමක් සිදගෙන යන්නාවූ මහ ඇතකු මෙන් ගෘහබන්ධනය සිදපියා නිෂ්ක්‍රම ණිමවත් පෙදෙසට පැමිණ තවුස් පැවිද්දෙන් පැවිදිව වනමුල් ඵලාඵලයෙන් යැපෙමින් නොබෝ කලකින් පංචාභිඥ අෂ්ටසමාපත්තීන් උපදවා ධ්‍යාන ක්‍රීඩා කරන්නාහු සමාපත්ති විහරණයෙන් වෙසෙත්. ඉක්බිති උන්වහන්සේ එක්දිනක් දිවැසින් ලොවබලන්නාහු බොහෝසෙයින් ප්‍රාණාතිපාතාදි දශඅකුශල කර්මයෙහි යෙදුනාවූ කාමය හේතු කොටගෙන කාමය කාරණ කොටගෙන ඔවුනොවුන් විවාදයට බැසගත්තාවූ මුළුදඹදිව මිනිසුන් දැක මෙසේ සිතූහ. පවෙහි යෙදුනාවූ විවාදයට පැමිණියාවූ මේ සත්ත්වයන් දැක ඉවසිම්මට සුදුසු නොවන්නේය "මම වනාහි සත්ත්වයන් සංසාරතමැති මඩෙන් සගාපියා නිර්වාණස්ථලයෙහි පිහිටුවන්නෙමි"යි මහා සම්බොධියාතයට පිළිපන්නෙමි. එහෙයින් ඒ ප්‍රතිඥාව නොවරදවන්නෙමි. "මම මනුෂ්‍ය පථයට ගොස් ඒ ඒ සත්ත්වයන් පවින්

වලඤ්ඤ විවාදයෙහුත් දුරුකරන්නෙමි කම් යයි කියපතැ"යි. මහසත්ත්ව යෝ එසේ සිතා මහා කරුණාවෙන් සහා සිටුවසලද සිත්ඇත්තෝ ශාන්තවූ සමවත් සුවයහැර යාඩියෙන් ඒ ඒ තැනට ගොස් ඔවුනොවුන්ගේ චිත්තානුකූල පරිදි ධර්මදේශනා කරන්නෝ කලහ විග්‍රහ විවාදපන්නා සත්ත්වයන්ට මෙලොවින් හා පරලොවින් වන්නාවූ විරෝධයෙහි ආදීනව දක්වා ඔවුනොවුන් සමගි කළහ. තවද අනෙකප්‍රකාරයෙන් විසාරවූ පාපාදී තවද විභාවනය කරන්නෝ එයින් සත්ත්වයන් මුදවා ඇතැම් කෙනෙක් දශකුශලකර්මපථධර්මයෙහි පිහිටුවූහ. ඇතැම් කෙනෙක් පැවිදිකරවා ශීලසංවරයෙහිද, ඉන්ද්‍රිය ගොපනයෙහිද, සති සම්පජඤ්ඤයෙහිද, විවේක වාසයෙහිද, ධ්‍යානාභිඥාවන්හිද, සුදුසු පරිදිදෙන් පිහිටවූහ. එනෙයින් වදළහ.

"පුනාපරං යදා හොමි-පෙ-සම්ගහං ජනමකාසහං"යි

මේහිද යටකී ක්‍රමයෙන් මහා සත්ත්වයන්ගේ අවශෙෂ පාරමිහුද, එසේම ගුණානු භාවයෝද විභාවනය කටයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි තුන්වන යුගඤ්ජය වර්ණනයෙහි අවවන සච්චකාපස චරිතය නිමි.

(XX) IX වටටක රාජචරිතය.

තවද මේ පරමාර්ථදීපනී නම් චරියා පිටක අට්ඨකථාවෙහි තුන්වන යුගඤ්ජය වර්ණනයෙහි නවවන වටටක රාජචරිතය කිසේය යත්:—

පුනා'පරං යදාහොමි මහාඩෙ වටටපොතකා,
අජාතපක්ඛා තරුණා මංසපෙසි කුලාවකා. (312)

බුබාකුණ්ඩනාහරිත්වා මාතා පොසයති මම,
තස්සා එසෙසන ජීවාමි නත්ථි මෙ කාමිකං බලං. (313)

සංවච්ඡරෙ ගිම්හ සමයෙ දවඩාහෙ පදිපජ්ජි,
උපගච්ඡි අම්හාකං පාවිසෙ කණ්හ වත්තනි. (314)

ධූමධූමං ජනිසඩ්ඩිවං සද්දයෙනෙනා මහාසිඛී,
අනුපුබ්බෙන ඡාරපෙනෙනා අගමි මම මුපාගමි. (315)

අහහි වෙන භයාගිනා නසිතා මාතා පිතා මම,
කුලාවසෙ මං ජඩ්ඩඩ්ඩා අත්තානං පරිමොචයුං (316)

පාදෙ පහෙව පජහාමි නත්ථි මෙ කායිකං බලං,
සො හං අනතිසො තත්ථ එවං විඤ්ඤාහං තදා (317)

සෙසාහං උපධාවයං ගිතො නසින වෙධිතො,
තෙමං බහාය පකඤ්ඤනා කථං මෙ අජ්ජ ඛානවෙ. (318)

ඔනුවෙන් කැවත අනික් චරිතයක් කියන්නෙමි. යම් කලෙක්හි මම මගධරට එක්තරා වනප්‍රදෙශයක වටුපැටවෙක් වීමිද, එකල්හි බිජුවට බිදගෙන නික්ම නොබෝ කල් වූ බැවින් ළදරුවූයෙමි මස් වැදුල්ලක් වූයෙමි එහෙයින්ම නොහටගත් පියාපත් ඇත්තෙමි වටුපැටවෙක්ව කැදුල්ලෙක්හි විසූයෙමි; මැණියෝ තමන්ගේ මුවතුඩින් හොදුරු නෙතවුත් මා පොෂණය කරත් කලින්කල මාගේ සමීපයෙහි විසිම් වශයෙන් ස්පර්ශ කරන්නාවූ ඔවුන්ගේ (ශරීර) ස්පර්ශයෙන් ජීවත්වෙමි. ඉතා ළදරු බැවින් කාය නිද්‍රිතවූ බලයක් මට නැත.

අවුරුද්දක් පාසා ග්‍රීෂ්මකාලයෙහි ඒ ප්‍රදෙශයෙහි ලැව්හිනි හත්තේය. පාවක නම්වූද කණ්හාවත්තනී නම්වූද ගින්න අපගේ වාසස්ථානයවූ වනප්‍රදෙශයට වතුරුක් දවමින් කලින් කල පැමිණේ. මෙසේ පැමිණෙන්නාවූ ඒ ගින්න එකල්හිද එසේ දුම්න් දුම් උපදවා ධම් ධම් යන අනුකරණය කරමින් මහත් ගිනිසිළු තගමින් පිළිවෙළින් ඒ වනප්‍රදෙශය දවමින් මා ළඟට පැමිණියේය.

වේගයෙන් එන්නාවූ ඒ ගින්නට භයින් භයපත්වූ ත්‍රාසාවූ මාගේ මවුපියෝ මා කැදුල්ලෙහි හුදකලාව හැරපියා තමන් ගින්නෙන් උපද්‍රව නැති තැනකට ගියාහුය. මහා සත්ත්වයෝ එකල මහපත්දුවක් වැනි මහසිරුරු ඇත්තෝවූහ. මවුපියෝ වනාහි

කියියම් උපායකින් උත්වහන්සේ හෙතයන්ට නොහැකි වන්නාහු දානසෙනහයෙන් මඬිනාලද සිත් ඇත්තාහු පුත්‍රසෙනහස හැර කියාහුය. ඉක්බිති තමන්ගේ පාදෙක හා පියාපත් දෙකද පෙළොවෙහි හා අහසෙහිද හමකට සැරසෙමින් දිගුකරම්. හමකට වැයම් කරන පමණ මුත් ඒසේ කිරීමට තරම් මට කායික ශක්තියක් නැත්තේය. අනික් තැනකට යහු නොහැක්කාවූ ඒ මම් ඒ කාදැල්ලෙහිම හිඳ මේසේ සිතුයෙමි 'මරණභයින් භයපත්වූ ත්‍රාසාවූ ශරීර කම්පනයෙන් වෙවුලන්නාවූ මම් යම් මවුපිය දෙදෙනකුන්ගේ සමීපයට දිවන්නෙම්ද, ඒ මාගේ මවුපියෝත් මා හුදකලාව හැරපියා පලා ගියෝය, මවිසින් අද කෙසේ කටයුතු දෙනෝ"යි.

මේසේ අපගේ මහාසත්ත්වයන් වහන්සේ ඉතිකරණීයමුසු වූවාහු යළි මේසේ සිතූහ. "මේ ලොකයෙහි ගිලගුණ තම් දෙයක් ඇත්තේය, එසේම සත්‍යගුණ තම් දෙයක් ඇත, ගිය දවස පැරැම් පුරා බෝමැඩ හිද සම්‍යක් සම්බොධි සම්පිගමය කළාවූ ශීලසමාධිප්‍රඥාවිමුක්තිඥානදර්ශනයෙන් යුක්තවූ සියලු සතුන් කෙරෙහි සමව පැවති මෛත්‍රීභාවනා ඇති සවුතේ දත් බුදුවරයෝ තම් කොටසක් ඇත, උත්වහන්සේලා විසින් ප්‍රතිවෙධකළාවූ එකාන්ත නෛර්‍යාණිකවූ ගුණධර්ම තම් දෙයකුදු ඇත, මාකෙරෙහිද එක් සත්‍යයෙක් ඇත, විද්‍යමානවූ එක් සද්භාව ධර්මයක් පෙනේ. එහෙයින් ඉකුත් බුදුවරයන්ද, උත්වහන්සේලා විසින් අවබොධකළාවූ ගුණයන්ද ආවර්ජනාකොට මාකෙරෙහි විද්‍යමානවූ සත්‍යවූ සද්භාව ධර්ම හෙත සත්‍යක්‍රියා කොට ගිනි වලක්වා අද මා විසින් තම හදින් මෙහි වසන්නාවූ සෙසු ප්‍රාණීන්ටත් සවසනසක් කරන්ට වටනේයැයි මේසේ සිතා මහසත්හු තමන්ගේ ආනුභාවයෙහි සිට සිතූ පරිදි පිළිපන්හ. එහෙයින් වදළහ.

"අත්ථි ලොකෙ සීලගුණෝ සච්චං සොවෙය්‍යසුද්දයා,
තෙන සච්චේන භාහාමි සච්චකිරිය මුත්තමං. (319)

ආවජ්ජෙත්වා ධම්මබලං සරිත්වා පුබ්බකෙ ජිනෙ,
සච්චබලමවස්සාය සච්චකිරිය මකාසහං"යි (320)

එසැල මහසත්හු අතීතයෙහි පිරිනිවියාවූ බුදුවරයන්ගේ ගුණ සලකා තමන් කෙරෙහි විද්‍යමානවූ සත්‍ය සද්භාව අරබයා සත්‍යක්‍රියාකළ හැඩ දක්වන්නාහු:—

සන්තිපක්ඛා අපතනා සන්තිපාදා අවඤ්චනා,
මාතාපිතා ච නික්ඛන්තා ජාතවේදා පටික්කමු. (321)

යනුකිහ. එහි අර්ථය:— "මාගේ පියාපත් ඇත. ඔවුන් කරණ කොටගෙන අහසින් යන්ට නොහැක්කේය. පා ඇත්තාහ. ඔවුන් කරණ කොටගෙන පියවර ගමනින් යනු නොහැක. මවුපිය දෙදෙන මා හැර ගියහ. ජාතවේදය තෝ පහවෙව" යනුයි.

මෙසේ මහසත්හු ඉදින් මාගේ පියාපත් ඇතිබවද, ඒ පියාපත් විදහා අහසෙහි නොයා හැකිබවද, පා ඇති බවද ඕහු නොයා නොහැකි බවද, මවුපියන් මා කැදැල්ලෙහි දමා ගිය බවද, යන මේ හැම සත්‍ය බවට පැමිණියේය. ජාතවේදය, ඒ සත්‍යය කරණ කොටගෙන තෙපි මෙයින් ඉවත්වෙවයි කැදැල්ලෙහි හුන්සේක්ම සත්‍යක්‍රියා කළහ. උන්වහන්සේගේ සත්‍යක්‍රියාව හා සමග සොළොස් කිරියක් පමණ තැන ගිනි ඉවත්ව ගියේය. ගිනි පසුබස්නේද දවාගෙන වනයට නොගියේය. දිගෙහි ගැලූ තණ සුලක් මෙන් එහිම නිවිගියේය එහෙයින් වදුරණලදි.

"සහ සච්චේ කතෙ මය්හං මහා පජ්ජලිතෝ සිඛි,
වජ්ජිස්සි සොළස කරීසානි උදකමපත්වා යථා සිඛි;
සච්චේන මෙ සමෝ නත්ථි එසා මේ සච්චපාරමී"සි (322)

එසමයෙහි වටු යොනියෙහි උපන්නාවූ බෝසත්හුගේ බුදුගුණ ඇවිදුම් පෙරදැරිකොට ඇති ඒ මේ සත්‍යක්‍රියා නොමේ අසත්‍ය සාධාරණයයි "සච්චෙන මේ සමෝ නත්ථි එසා මේ සච්ච පාරමී" යනුවෙන් කිහ. එහෙයින්ම ඒ සථානය මේ කප මුළුදුම ගින්නෙන් දැවිය නොහැකි බැවින් කල්පස්ථායි වූ පෙළහරක් නම්විය. මෙසේ මහා සත්ත්වයෝ සත්‍යක්‍රියා වශයෙන් තමහටද එහි වැසි සතුන්ටද සවසනියක් කොට දිවි කෙළවර කම්වූ පරිදි දෙන් මිය පරලොව ගියෝය.

එකල ඔවුපියෝ තම් දැන් මවුපියෝමය. චතුරමහාරාජවෝ තම් ලොකඵාමින් වහන්සේය. උන්වහන්සේගේ සෙසු පැරැමුත් යටකී කයින්ම නිඩාරණය කටයුත්තාහ. ඒ එසේමය. එබදුම ලැව්ගින්නක් එසේ භයානක පරිදි වතුරුවාගෙන එක කල්හි ඒ වියෙහි හුදකලාවම සිට කැගැසීමට නොපැමිණ

සත්‍යාදි ගුණයන්ද බුදුගුණද සිහිකොට තමන්ගේ ආනුභාවය නිසා කරනලද සත්‍යක්‍රියාව කරණකොටගෙන එහි විසූ සෙසු සත්තවිද සොඳින්හාවය පැමිණවීමද යන මේ ආදී ගුණානුභාවයෝ විභාවනය කට යුත්තාහුය.

පරමාර්ථදීපනිනම් චරියාපිටක අටුවාවෙහි තුන්වන යුධඤ්ඤය වගිනයෙහි නවවන වටවක රාජචරිතය නිමි.

(XX) X මඝ රාජ චරිතය.

තවද මේ පරමාර්ථදීපනි නම් චරියාපිටක අටුවාවෙහි තුන්වන යුධඤ්ඤය වගිනයහි දසවන මඝරාජ චරිතය කියේය යත්:—

පුනා'පරං යදා හොමි මඝරාජා මහාසරෝ,
ඵණ්ඩෙන සුරිය සන්තාපෙ සරෙ උදකං බියෙථ. (323)

යනුවෙන් තැවත අනික් චරිතයක් කියන්නෙමි. යම් කලෙක්හි මම කොසොල් රට සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවන පුෘෂ්කරිණී සථානයෙහි වැල්කැලයෙන් වටකරන ලද්දාවූ එක් මහ පොකුණෙක්හි ඉපද මත්ස්‍ය රාජයෙක් වූයෙම්ද, එකල උෂ්ණ කාලයෙහි සූර්‍යරශ්මිය කරණකොටගෙන ජේතවන පොකුණේ පැන් සිදිගියේය. එසමයෙහි එරට වැසි නොවැස්සේය. ගොයම් මැලවුණාහුය. වැව් පොකුණු ආදියෙහි ජලය සිදිගියේය. මත් කැස්බෝ මඩ ඇතුළට වන්නාහුය. ඉක්බිති කවුඩුවෝද ගිජුලිහිණිහුද උකුස්සෝද මඩ මත්තෙහි ඒ ඒ තැනහිද කළල්ලට වැදහොත්තාවූ මත්ස්‍යයන් දවස දෙවේලේ ශරතුඛ වැනිවූ තුඩින් ඇන සැලෙමින් සිටියදී අනුභව කරත්තාහ. එහෙයින් වදාළහ.

"තතො කාකාව ගිජ්ඣාව බකාකුලලසෙනකා,
භක්ඛයන්ති දිවාරත්තිං මඝස්ස උපනිස්සිදිය" සී (324)

ඉක්බිති මහා සත්ත්වයෝ මත්ස්‍යයන්ගේ ව්‍යසනය දැක මහා කරුණාවෙන් මෙහයතලද සිත් ඇතිව "මාගේ මේ කැයෝ මේ දුකින් මුදවන්ට මා හැර සමර්ථ එකෙක් නැත; කවර උපායකින් මම ඔවුන් මේ දුකින් මුදන්නෙමිද"යි සිතන්නෝ මම පෙර මහර්ෂීන් විසින් ආචිණ්ණ සමාචිණ්ණවූ මා කෙරෙහි විද්‍යමානවූ සත්‍ය ධර්මය නිසා සත්‍යක්‍රියා කොට වැසි වස්වා මාගේ කැයන්ට දිවිදෙන්නෙමි තම් යෙහෙක; ඒ කරණකොට ගත මාවිසින් ආහාරයෙන් ජීවත්වන්නාවූ සියලු සත්ත්ව ලොකයාහට ද මහත් උපකාරයක් කරන ලද්දේ වන්නේයයි නිශ්චයකොට වැසි වස්වන්නට සත්‍යක්‍රියා කළහ. එහෙයින් වදාළහ.

"එවං විනෙනඝහං නත්ථං සහඤාතිහි පීළිතො,
කෙන නු ඛෙඩා උපායෙන ඤාති දුක්ඛා පමොචයෙ. (325)

විචිනනඝිත්වා ධම්මත්ථං සච්චං අද්දඝපඤඤකං,
සවේව ඨත්වා පමොචෙසිං ඤාතිනං තං අනික්කසං. (326)

අනුසාසිත්වා සද්ධම්මං පරමත්ථං විචිනනඝං,
අකාසිං සච්ච කිරියං යං ලොකෙ ධුව සස්සතං"යි (327)

දැන් මහා සත්ත්වයෝ තමා කෙරෙහි විද්‍යමානවූ ඒ ධර්මය ගෙන සත්‍ය වචන ප්‍රයොග කරනු කැමැත්තෝ කාලවණ්ණ වූ මඩ දෙබෙල්කොට කළුහැර ගැටක් බඳු පැහැඇති මහසිරුර ඇත්තෝ මතා කොට සුදු කරතලද පියුම් රාමිණ වැනි ඇස් හැරපියා අහස බලන්නෝ

ඝතා සරාමි අත්තානං ඝතො පත්තොඝමි විඤ්ඤුතං,
නාභිජානාමි සඤ්චිච්ච එකපාණම්පි හිංසිතං;
එතෙන සච්ච වජ්ජෙන පජ්ජුණෙනා අභිවස්සතු. (328)

යන ගාථාවකිය. යම් කලෙක පටන් මම තමන් සිහි කෙරෙම්ද, යම් තැනක පටන් මම ඒ ඒ ඉතිකර්ත්තව්‍යයන්හි විඥ කවට පැමිණියෙම්ද, මේ අතුරෙහි සමාන ජාති ඇත්තවුන් හෙවත් මිසුන් අනුභව කරන්නාවූ තැනෙක්හි උපන්නෙමිද සාලටක් පමණවුත් මත්ස්‍යයෙක් මාවිසින් හොකාවිරුය සිතා පෙළෙනලද්දාවූ අනික් සත්ත්ව අනික් ප්‍රාණියකුදු නොද නිමි. දිවි තොර කළ එකකු පිළිබඳව කියනුම කවරේද?

"මාගේ ඒ සත්‍යය කරණකොට ගෙන වැසි වසිවා. මාගේ ඥති සමූහයා දුකින් මුදව"යි කියා තැවත තමන්ගේ මෙහෙකරු ගැත්තකුට (කොල්ලකුට) විධාන කරන්නක්හු මෙන් වස්ස වලාහක දිව්‍ය පුත්‍රයාට ආලපනය කොට කියන්නාහු.)

අතිඝනඝ පජ්ජුනඝ නිධිං ඛාණඛඝ නාඝය,
ඛාණං ඝොණාඝ රුක්ඛිති මඝෙඝ ඝොණා පමොචය. (329)

යන මේ ගාථාව කිහ. භවත් වස්සවලාහක දෙව පුත්‍රය, තෝ ගර්ජනාකොට විදුලි ගසා වැසි වස්වව. කවුඩෝ මිඩැට වැද සිටියාවූ ළඳුන් තුඩින් ඇනකත් (එහෙයින් කළල තුළ කවුඩන්ගේ නිධියයි කියනු ලැබේ.) ඒ කපුටන්ගේ මත්ස්‍ය නිධානය වැසි වස්වා නසා පියව, කවුඩුමුල මේ මහවිල දියෙන් පිරුණු කල ළඳුන් නොලැබ ශොක කරන්නේය. ඒ කවුඩු සමූහයා තෝ මේ මිඩ ප්‍රවම්න් ශොකයට පමුණුව. මාගේ ඥතිකවූ සියලු ළඳුන් මේ මරණ ශොකයෙන් ගලවාපියව.

මෙසේ බෝසතාණෝ තමාගේ මෙහෙකරු කොල්ලකුට අමතන්නාක්මෙන් වස්සවලාහක දෙවපුත්‍රයන් අමතා සියලු කොසොල්රට වැසි වැස්වූහ. මහාසත්ත්වයන්ගේ සිල් තෙදින් සත්‍යක්‍රියාව හා සම්ගම සක්දෙව් රජහුගේ පඬුපුල් සලස්ත හුණ්ඩවිය. හෙතෙම කිමෙක්දෝහෝයි ආවර්ජිතා කරන්නෝ ඒ කාරණය දැන වස්ස වලාහක දෙවපුත්‍රයන් කැඳවා දරුව, මත්ස්‍යරාජන්වූ මහා පුරුෂයාණෝ තැන්හේගේ මරණ ශොකයෙන් වැසි වස්වනු කැමතිවෙත්. සියලු කොසොල් රට එකට වලාකොට වැසි වස්වයි විධාන කළහ. හෙතෙම "මැනැවැ"යි පිළිගෙන එක් වැසි පටලයක් තමන්ගේ ආනුභාවයෙන් ප්‍රකෘති වස්ත්‍රයක් මෙන් හැඳගෙන එක් වැසිපටලයක් පොරවා ගෙන මේ ගී ගයමින් නැගෙනහිර සක්වලට අභිමුඛව නික්මුණේය. එකෙණෙහි නැගෙනහිර දිසාභාගයෙහි කලවිටි මඬලක් පමණ එක් වලාපටලක් නැගී සියක් පටල දහස් පටලව ගර්ජනාකර මින් විදුලි ගසමින් යටිකුරු කොට තබනලද පැන් කලයක් මෙන් ගලමින් සියලු කොසොල් රට මහවතුරෙන් වැතිරිගියේය. වැසි වැල නොකඩ වැස ඇසිල්ලකින්ම ඒ මහ පොකුණ පිර වූයේය. මත්ස්‍යයෝ මරණභයෙන් මිදුනාහුය. කාකාදීහු

කොසතුටු වූහ. මත්ස්‍යයෝම පමණක් සතුටුවූවාහු කොවෙත්. වැළි කවුරු මරණ භයින් මිදුනාහුද යනහොත් කොයෙක් වැද රුම් සි සැම් කරන්නාවූ මනුෂ්‍යයෝද සිවුපා ආදීහුදූයි වැස්සෙන් ජීවත්වන්නාවූ හැමදෙනද කායික චෛතසික දුකින් මිදුනාහුය. එහෙයින් වදාළහ.

සහකතෙ සච්චවරෙ පජ්ජුන්නො අගිනජ්ජිය,
ථලං නිහනඤ්ච සුරෙනෙනා ඛණෙන අගිවඤ්ඣථ. (330)

එවරූපං සච්චවරං කත්වා විජිය මුනිගණං,
වස්සාපෙසි මහාමෙඝං සච්චතෙජ බලදස්සිනො,
සච්චෙන මෙ සමො නත්ථි එසා මෙ සච්චපාරමී "ති (331)

මෙසේ වැසි කොවස්කාකල කුමක් කටයුතුදූයි කුසිත බවට කොපැමිණ සුනක්ඛවරියාව සම්පාදන මුඛයෙන් මහාසත්ත්ව සමූහයාගේ හිත සැප නිපදවන්නාවූ උත්තම වීර්‍යයකුත් කොට මාගේ සත්‍යක්‍රියාව හා උන්වහන්සේගේ බලය ඇසුරුකොට එකල වැසි වස්වාලූහ. එහෙයින් මහසතාණන් මත්ස්‍ය රාජකාලයෙහි තමන් සත්‍යපාරමිතාවෙන් අනුත් හා අසාධාරණ බැව් දක් වන්නෝ "සච්චෙන මෙ සමොනත්ථි එසා මෙ සච්චපාරමී" යනු කිහ. මෙසේ මහා කරුණාවෙන් මෙහෙයන ලද සිත් ඇති මහ සත්හු සියලු කොසොල්රට මහ වැසි වැස්වීම් වශයෙන් මහා ජනයා මරණ දුකින් මුදා දිවි කෙළවර කම්වූ පරිදිදෙන් මිය පරලොව ගියහ.

එකල වස්සවලාහකයෝ ආනන්ද සථවිරයෝවූහ. මත්ස්‍ය ගණයා බුදුපිරිසමය, මත්ස්‍යරාජයෝ ලොකසාමිවූ බුදු රජාණන් වහන්සේය. උන්වහන්සේගේ සෙසු පාරමීහුද යටිකි කයින් නිඛාරණය කටයුතු. ඒ එසේමය, තමන් හා සමාන ජාති ඇත්තවුත් අනුභවකරන්නාවූ මත්ස්‍ය යොනියෙහි ඉපද සහල්කණක් පමණකුදු මසුන් ආදිකොට ඇති කිසි ප්‍රාණියකු අනුභව නොකිරීමය, කෑමක් නබා එසඳ සත්ත්වයකු වෙහසට නොපැමිණවීමය, එබදු සත්‍යක්‍රියාවෙන් වැසි වැස්වීමය, දිය සිදී ගිය කල මඩ අතුරෙහි ගිලීම් වශයෙන් තමන් අනුභව කරන දුක විරහාවයෙන් නොගෙන සුනිසමූහයාගේ

ඒ දුකත් තමත්ලෙහි කොට තොං ඉවසන්නාහුගේ සත්‍ය සටහාව සෙත් කරුණාව පිහිට කොට ඇති බවය, එසේවූ ප්‍රතිපත්තිය දැයි මේ ආදි ගුණානුභාවයෝ විභාවනය කරවුත්තාහුය.

පරමාර්ථදීපනී නම් වියාසිටක අට්ඨවාහවහි තුන්වන යුඛඤ්ඣ වර්ණනයෙහි දහවන මහාජාල චරිතය නිමි.

—(o)—

(XX) XI කණ්හ දීපායන චරිතය.

—(o)—

තවද මේ පරමාර්ථදීපනී නම් වියාසිටක අට්ඨවාහවහි තුන්වන යුඛඤ්ඣ වර්ණනයෙහි එකොළොස්වන කණ්හදීපායන චරිතය කියේය යත්:-

පුනා'පරං යදඤ්ඤාමි කණ්හ දීපායනෝ ඉසි,
පරොපඤ්ඤායවසානි අනගාරතා චරිං අහං. (301)

තවත අනික් චරිතයක් කියන්නෙමි. භෙද අහව, යම් කලෙක්හි මම කණ්හ දීපායන නම් තාපසයෙක් විම්ද එකල්හි මම පසස් අවුරුද්දකට වැඩි කලක් අනගාරතාව වසන්නෙමි බඹසර විසීමි.

එකල බොධිසත්ත්වයෝ පැවිදිව සත්දවසක් අගාරතාව බඹ සර විසූහ. ඉත් ඔබ්බෙහි අනගාරතාව විසූහ. තොයෙක් දහස් ගණන් අත් බැවිහි අනිනිෂ්ක්‍රමණ ධ්‍යානය ඇති මහා පුරුෂයා ණෝ බඹසර ඇලී කවර හෙයකින් එහි මේ අත් බැවිහි තොඇලුනු සේක්ද? පුහුදුන් බැවිහි චංචලභාවයෙනි. කවර හෙයකින් තැවත ගිහිගෙයි විසූසේක්ද යත්? පළමුකොට නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශ යෙන් කාමයෙහි දෙස් දැක පැවිදිවූහ. ඉක්බිති අනුවණින් මෙනෙහි කිරීමෙන් තො ඇලීමක් උපන්නේය, උන්වහන්සේ ඒ අනගාරතාව දුරුකරන්නට අපොහොසත්ව කම්පල අදහා ඒසා මහත් සම්පත් හැරපියා ගිහිගෙයින් නික්මෙන්නෝ යමක් දුරුකළාහුද, තැවත ඉදින් ඒ පිණිස ඇලෙන්නාහු තම් "මේ කණ්හ දීපායනයෝ එකාන්තයෙන් බාලයෙක, කෙළ

නොල්ලෙක" යි යන මේ අපවාදය පිළිකුල් කෙරෙමින් තමින්ගේ හිරිඔතප් තැසේය යන බියෙන් ද වැළඳූ "පැවිදි කුසලයකම් නුවණැත්තාවූ බුබාදීන් විසින් පසස්නා ලද්දේය, උත්වහන්සේලා විසින් පිඟිටුවන ලද්දේය" යි එබැවින් දුක් දෙමින්ස් සහිතව කඳුලුවැකි මුහුණු ඇතිව හඬමින් බඹසර විසූසේක. ඒ බඹසර හැරනොපිහ. එහෙයින් කියන ලදි:—

228. "සඛාය නිකඛමථම පුත නිවත්තෝ
සොළ්ල මිගෝ ව බාලෝ වතාසං
එතස්ස වාදස්ස ජිගුච්ඡමානෝ අකාමකෝ
චරාමි බ්‍රහ්ම චරියං;
විඤ්ඤූපප සත්ථුසඛ සතං ච ඨානං එව මඛං
පුඤ්ඤඤ කරොහවාමි" යි.

මෙසේ බෝසතාණෝ අනගිරති වාසයෙන් යුක්තව විසූ නමුත් ඒ බව තමන්ගේ යහළුවූ සබ්‍රහ්මචාරිවූ මණ්ඩබ්‍ය තාපසයන් හැර මනුෂ්‍යවූ අන් කිසිවෙක් නොදන්නේය. උත්වහන්සේ ඒ බැව් කිසිවකුටත් නොකිම ඊට කාරණ විය. එහෙයින් වදාරණ ලදී.

"න කොචි එතං ජානාති අනගිරති මනං මම,
අහං හි කස්සචි නාචික්ඛිං අරති මෙ චරති මානසෙ" යි (133)

මේ එහි පිළිවෙළ කථාවයි.

ඇටගිය දවස වංසරට කොසඹෑ නුවර කොසඹෑ නම් රජ්ජුරු කෙනෙක් රජය කරවූහ. එකල අප බෝසතාණෝ එක්තරා නියම් ගමක අසූ කෙළක් සම්පත් ඇති බමුණු මහ සලක්හුගේ පුත්‍රව උපන්හ. උත්වහන්සේ තමින් දිපායන නම් විය. ඒ නියාම බමුණු මහසලක්හුගේ පුත්‍රවූ බමුණු කුමරෙක් උත්වහන්සේගේ යහළුවෙක් විය. හෙතෙම තමින් මණ්ඩව්‍ය නම්විය. ඔහු දෙදෙන මෑත කලක මවුපියන්ගේ ඇවෑමෙන් කාමයෙහි දෙස් දැක මහදන් පවත්වා පස්කම් සැප හැරපියා ඤාති මිත්‍රයන් හා පරිජනයන් හඬමින් වැලපෙමින් සිටියදී නික්ම හිමවත් පෙදෙසෙහි පත්සලක් කොට පැවිදිව සිහිමෙන් හා වනමුල් ඵලාඵලයෙන් යැපෙන්නාහු වැනි පහස් වසක් විසූ

වාහුය. කාම්වේදනුය විඳවාගෙණය කරන්ට අපොහොසත්වූහ. ඔව්හු ධ්‍යානසමාහිතයකුදු නො ඉපදූහ. ඔව්හු ලුහු ඇඟුල් සෙවිණා පිණිස දහවී සැරිසරන්නාහු කසිරටට පැමිණියාහුය. එහි එක් නියම් ගමක දීපායනයන්ගේ මණ්ඩව්‍ය නම්වූ ගිහි යහළුවෙක් වෙසෙයි. ඔව්හු දෙදෙනම ඔහු කරා එලඹියාහ. හෙතෙම ඔවුන් දැක සතුටුයින් ඇතිව පන්සලක් කොට සිවු පසයෙන්ම ඔවුන්ට උවටැන් කෙළේය. ඔව්හු එහි තුන්හතර අවුරුද්දක් වැස ඔහුගෙන් විචාරා සැරිසරන්නාහු බරණැස සමීප යෙහිවූ අනිමුහාහා නම් සොහොතෙහි විසූහ. දීපායනයෝ එහි කැමතිනාක් වාසය කොට නැවත ඒ නියම් ගමේහි තමන්ගේ යහළුවූ මණ්ඩව්‍යයන් වෙතට ගියහ. මණ්ඩව්‍ය තාපස තෙම එහිම විසූයේය. ඉක්බිති එක් දවසක් සොරෙක් ඇතුළු නුවරදී සොරකමක් කොට ධනසාරය ගෙන නික්මෙන්නේ පිබිදියාවූ හේ හිමියන් විසින්ද නුවර රකින මිනිසුන් විසින්ද ලුහු බඳිනා ලද්දේ දිය සොරොව්වකින් නික්මගෙන යුහුව සොහොතට වැද තවුසාගේ පන්සිල් දෙරකඹ පොදිය දමා දිවූයේය. මිනිස්සු පොදිය දැක "බොල සොර තවුස, රෑ සොරකම් කොට දහවල් තවුස් වෙසින් හැසිරෙහිදැ"යි තැතිගත්වා තලා ඔහු අල්වා ගෙන ගොස් රජහට දැක්වූහ. රජ්ජුරුවෝ කොවිමසා පියාම හුල හිදුව"වසි, නියොග කළහ ඔව්හු තාපසයන් සොහොතට ගෙනගොස් කිහිරි හුලක හිඳවූහ. තාපසයන්ගේ සිරුරෙහි ඒ හුල නොපිවිසෙයි. ඉක්බිති කොසඹ හුලක් ගෙනාවාහුය. ඒද නොපිවිසෙයි. තවුස්තෙම මාගේ පූර්වකර්මය කුමක්දැයි සිතුයේය. උත්වහත්සේට ජාතිසම්මරණඥානය පහළවිය. ඒ කරණ කොට පූර්වකර්මය දුටුයේය. හෙතෙම පෙරදවස වඩුවකුගේ පුත්‍රයෙක්ව පියා රැක සසින තැනට ගොස් එක් මැස්සෙකු ගෙන කොබෝලිල කුරක හුලක මෙත් සිවිවූයේය. ඔහුගේ ඒ පාපය මේතන (විපාකය පිණිස) අවකාස ලද්දේය. හෙතෙම මේ පවින් මිදෙන්ට නොහැක්කේයයි දැක "ඉදින් මා හුලහිදුවනු කැමතිවහු නම් කොබෝලිල හුලක් ගෙන එව්ය"යි රාජ පුරුෂ යන්ට කීය. ඔව්හු එසේ කොට ඔහු හුලහිදුවා රැකවල්කොට ගියාහුය. එකල කණ්හ දීපායනයෝ "මාගේ යහළුතෙම දුටුවිරූ

බොහෝ කල් ඇත්තේය"යි මණ්ඩව්‍ය තාපසයන් සමීපයට එත්තාහු එපවත් අසා එතනට ගොස් එකත් පසෙක සිට "කිමේකාගමනය, කාරක වෙහිද?" යි විචාරා "ආකාරක වේමි"යි කියල තමන්ගේ සිතෙහි කැළඹීම රක්නට නොහැකිද?" යි විචාළෝය. "ගහළුවෙනි, යමකු විසින් මම අල්වා ගත්තාලද්දෙමි වේදැ, ඔවුන් කෙරෙහිවත් රජුකෙරෙහිවත් මාගේ සිතෙහි අසතුටක් නැතැ"යි කියල එසේවිනම් "ඉබෑස්වූ සිල්වතකුගේ සෙවනද මට සැපය"යි කියා කණ්හ දීපායනයෝ හුල නිසා හුන්හ. රැකවල සිටි පුරුෂයෝ එපවත් රජුට සැලකළෝය. රජ්ජුරුවෝ මා විසින් "නොවිමසා කරතලද්දේය"යි වෙලෙව්ව එයි ගොස් "සවාමිනි, නුඹ වහන්සේ කවරහෙයකින් හුල නිසා හුන්තාහු ද?" යි දීපායනයන් විචාළෝය. "මහරජ්ජුරුවෙනි, මේ තවුසන් රකිමින් හුන්නෙමි"යි කිමෙක්ද, නුඹවහන්සේ මොහු මෙවැන්නක් නොකළ බැව් දැන මෙසේ කරත්තාහුද?යි රජ්ජුරුවෝ කමිය තමා පරීක්ෂානොකළ බැව් කිහ. ඉක්බිති දීපායනයෝ "රජු විසින් තම් පරීක්ෂාකොට කරත්තාහු විසින් විය යුතුයයි.

229 අලසෝ ගිහි කාමභොගී න සාධු
අසඤ්ඤතෝ පබ්බජිතෝ න සාධු;
රාජා න සාධු අනිසම්මකාරී
යෝ පණ්ඩිතෝ කොධනෝ තං න සාධු.

යනාදීන් කියා දම්දෙසූහ. එහි අර්ථ සොමනස්සවර්ධනයෙහි කී නයින් දතයුතු.

රජ්ජුරුවෝ මණ්ඩව්‍ය තාපසයන්ගේ නිර්දෝෂ භාවය දැන හුලපහකරව්"යයි ඇණවූහ. හුලමැත්කරත්තාහු එසේ කරන්ට නොහැකිවූහ. මණ්ඩව්‍ය තෙම කියනුයේ "මහරජ්ජුරුවෙනි මම පෙර කළ කම් දෙසින් මෙබඳු ආයාසයකට පැමිණියෙමි' මාගේ ශරීරයෙන් හුල හරිනු නොහැක. ඉදින් මට දිවිදෙනු කැමැත්තෝ නම් කියනින් මේ හුල හම් හා සමකොට කපනු මැනව"යි කියේය. රජ්ජුරුවෝ එසේ කරවූයේය. හුල ශරීරය තුළම වූයේය. එද සියුම් ලිපතුරක් ගෙන මැස්සකුගේ වසමග ප්‍රවිශ කරවූයේය. ඒ වනාහි උන්ගේ බඩතුලම වූයේය

ඌ ඒ හෙතුකොටගෙන මිය නොගොස් තමාගේ ආයුෂයාගේ ක්ෂය වීමෙන් මිය ගියේය. එහෙයින් මේ තවුස් නොමේද මිය නොගියේය. රජ්ජුරුවෝ තවුසන් වැඳ කමා කරවා ගෙන ඌය නෙතිම වස්වා පිළිදගුම් කළහ. එතැන් පටන් මණ්ඩව්‍ය තාපස තෙම ආණිමණ්ඩව්‍ය නම් වූයේය. හෙතෙම රජ්ජුරුවෝ ඇසුරු කොට එහිම විසූයේය. දීපායනයෝ ඔහුගේ වණය සුවකොට පියා තමන්ගේ ගිහි යහළුවූ මණ්ඩව්‍යයන් විසින් කරන ලද පන්සලට ගියහ. එහෙයින් වදරන ලදී.

සඬ්ගාමවාරී මණ්ඩව්‍යබබ්‍යා සහායෝ මේ මහාඉසි,
පුබ්බකම්මේ සමාසුත්තා සූලමාරාපනං ලභි. (334)

තමිහා උපධිහිඩ්ඩාන ආරොග්‍ය මනුපාපයිං,
ආපුච්ඡිඩ්ඩාන ආඝඤ්ඡිං යං මය්හං සඛා මසඃමං"සි (335)

දීපායන තාපසයන් වහන්සේ එම පන්සලට වඩිනු දැක යහළුවාහට දැන්වූහ. හෙතෙම ඒ අසා තුටුපහටු වූයේ අඹු දරුවන් සහිතව ගදමල් උක් සකුරු ආදිය ගෙන පන්සලට ගොස් දීපායනයන් වහන්සේ වැඳ පා දෙව පැතක් වළඳවා ආණිමණ්ඩව්‍යයන්ගේ ප්‍රවත අසමින් හුන්නේය. ඔහුගේ පුත්‍රවූ යඤ්ඤදත්තයා නම් කුමාරයෙක් ඇත. ඉඟ බඹරක්ගෙන සක්මන් කෙළවර කෙළමින් සිටියේය. එහි එක් තුඹසක තයෙක් වෙසේ. කුමරකු විසින් ගැසූ බඹරය ගොස් බිලෙහිවූ තයකු මත්තෙහි හිණ. කුමර තෙම නොදන්නේ තුඹස සිදුරෙහි අත දැමුයේය. ඉක්බිති කිපියාවූ නාගයා කුමරහුගේ අත දෂට කෙළේය. හෙතෙම විෂ වෙගයෙන් මූර්ඡාවූයේ එහිම වැටුනේය. ඉක්බිති ඔහුගේ මවුපියෝ නාගයා විසින් දෂටකළ බැව් දැන කුමරා ඔසවා තවුසන්ගේ පාමුල හොවා "ස්වාමීනි, ඖෂධයකින් හෝ මන්ත්‍රයකින් හෝ අපගේ පුත්‍රයන් නිරොග කළ මැනවැ"සි කිවාහුය. උන්වහන්සේ කියන්නාහු "මම බෙහෙත් නොදනිමි, මම වෙදකම් නොකරමි. පැවිද්දෙක් වෙමි" යි කිහ. "ස්වාමීනි, එසේවි නම් මේ කුමරහු කෙරෙහි මේත් කොට සත්‍යක්‍රියා කරනු මැනව. තාපසයෝ "මැනව, සත්‍ය ක්‍රියාව කරන්නෙමි"සි කියා යඤ්ඤදත්තයාගේ හිසෙහි අතතබා සත්‍යක්‍රියාව කළහ. එහෙයින් වදරණ ලදී.

සභායයා බ්‍රාහ්මණා මයහං හදිසං ආදය පුත්තකං,
තයෝ ජනා සමාගන්ත්වා ආහඤ්ඡුං පාග්‍රනාගතං (336)

සමෙමාදමාණෝ තෙහි සහ නිසිතෙහා සකම්මසමෙ,
දූරඤ්ඤා වටටමනුඛ්ඛිපං ආසිවිසමකොපයි. (337)

තතො සෝ වටටඝතං මඝහං අතෙවසතෙහා කුමාරකෝ,
ආසිවිසස්ස හත්ථෙන උත්තමඞ්ගං පරාමසි. (338)

තස්ස ආමසතෙ කුද්ධා සපෙපා විසබලසසිතෙතා,
කුපිතෙතා පරමඤ්ඤාපෙන අඩංසි දූරකං බහෙණ. (339)

සහදථෙඨා ආසි විසෙන දූරතෙතා පපති භූමියං,
තෙනාහං දුක්ඛිතෙතා ආසිං මම වාහසි තං දුකතං. (340)

තස්‍යාහං අස්සාසයිත්වාන දුක්ඛිතෙ සොකසලලිතෙ,
පඨමං අඤ්ඤාසිං කිරියං අගහං සච්චං වරුත්තමං"සි (341)

දැන් ඒ සත්‍යක්‍රියාව සවරූපයෙන් දක්වන්නෝ:-

සන්තාහමෙවාහං පසන්නවිත්තෙතා
පුඤ්ඤඤ්ඤා අවසිං බ්‍රහ්මචරියං,
අඤ්ඤාපරං යං චරිතං මවයිදං
වස්සානි පඤ්ඤාස සමාධිකානි. (342)

අත්ථාමත්ථෙ චාහි අහං චරාමි
එතෙන සච්චෙන සුවත්ථි හොතු,
හතං විසං ජීවතු යඤ්ඤදත්තෙතා. (343) යි වදළෝ.

"ඉදින් අධිකවූ පනස්වසක් අතහිරතිවාසයෙන් වසන්නාවූ මාවිසින් ඒ කිසිවෙකුට නොදුන්වූ බව සත්‍ය ද, ඒ සත්‍යය කරණ කොටගෙන යඤ්ඤදත්ත කුමාරයාහට සුවයක්වේවා. දිවිලැබේවා"යි මෙසේ මහසතාණන් විසින් සත්‍යක්‍රියා කළකල්හි යඤ්ඤදත්තයාගේ ශරීරයෙන් විසබැස පොළොවට වැදගත, කුමාර තෙම ඇස්හැර මවුපියන් බලා "මැණියනි, පියාණනි," කියා හැඬී සිටගේය. එහෙයින් වදරනලදි.

සන සවෙව කතෙ මය්හං විසවෙතෙන වෙධිතො,
අබුජ්ඣිත්වාන මුත්තාසි ආතුරොතො වාසි මාණවො සි (315)

දැන් ශාස්තෘන් වහන්සේ තමන්වහන්සේගේ සත්‍යක්‍රියාවගේ පරමාර්ථපාරමිතාවය දක්වන්නාහු "සවෙවන මේ සමා නත්ථි එසා මෙ සච්චපාරමී"සි වදළෝ.

ජානඤ අත්‍රවාවෙති මිහා සත්ත්වයන්ගේ සත්‍යක්‍රියාව කරණ කොටගෙන කුමාරයාගේ තනිත් උඩ විසබැස නිවේයයිද, ළදරුවාගේ පියාණන්ගේ සත්‍යක්‍රියාව කරණකොටගෙන කටියෙන් උඩද, මවුගේ සත්‍යක්‍රියාව කරණකොටගෙන අවශෙෂ ශරීරයෙහි විස බැස නිවේයයිද කියනලදි. එහෙයින් කියනලදි.

230. "යසමාදහං තාතිතඤ්ඣා කදාචි දිසවානාහං
අපිනිං වාසකාලෙ,
න වාපි මේ අප්පියතං අවෙදුං බහුස්සුතා
සමණබ්‍රාහ්මණා ච;
අකාමකො වාහි අහං දදාමි එතෙන සවෙවන
සුවත්ථි හොතු
හතං විසං ජීවතු ඝඤ්ඤදතෙනා.

231. ආසිවිසො තාත පසූත තෙජෝ යො තං
අඩංසි පතරා උදිවව,
තස්මිං ච මේ අපපියතාය අජ්ජ පිතරී ච තෙ නත්ථි
කොචි විසෙසෝ
එතෙන සවිවෙන සුවත්ථි හොතු හතා විසං ජීවතු
ඝඤ්ඤදතෙනා."සි

එහි අර්ථ:—මම ගිහිගේ වසනසඳ ආගන්තුකයකු දැක දීම කිසිකලක අනිතඤ්ඤනය (ප්‍රිය) නොකළෙම්ද, බොහෝ ඇසූ පිරුණාවූ මහණ බමුණොත් "මේ තෙම දැනය අනිතඤ්ඤනය කොකෙරේයයි මාගේ අප්‍රිය භාවය නොදැන ගත්තා හුය. මම දෙමින්ම විපාක නොඅදහා තමා නොකැමැත්තෙන්ම දෙමියි මාගේ දෙනු නොකමැති බව අන්හු නොදනිත්ද ඒ සත්‍යය කරණකොටගෙන ඝඤ්ඤදතෙනායාගේ විස බසීවා.

දරුම් යසුසුදුබ්‍යානය, බොහෝ විසඇති යම් සපෙක් තුඹසින් එඩට තැගී නුඹ දෂකෙළේද, ඒ සප්හු කෙරෙහිත් තොපගේ පියා කෙරෙහිත් මාගේ අප්‍රිය භාවයෙහි අද කිසි වෙනසෙක් තැතිය, ඒ අප්‍රිය භාවය මා හැර කිසිකෙනෙක් නොදන්නාය. ඒ සැබෑ වීනම් යසුසුදුබ්‍යන කුමාරයාගේ විස බසිවා" යනුයි.

මෙසේ බෝසතාණෝ කුමාරයන් නිරොගිවූ කල ඔහුගේ පියාණන්ට "දන්දෙන්නහු විසින් වනාහි කම්පල අදහා දිය යුතුය"යි කම්පල ඇදහිමෙහි යොදවා තුබූද නොඇලීම් දුරු කොට පියා ධ්‍යානාභිඥාවන් උපදවා ආයු කෙළවර බඹලොව ගියහ. එකල මණඩව්‍යෂවෝ ආනන්ද ස්ථවිරයෝ වූහ. ඔහුගේ බිරිඳ විසාඛාවෝය. පුත්‍රයෝ රාහුල ස්ථවිරයෝය. ආඤ්ඤ මණ්ඩව්‍යයෝ ශාරිපුත්‍රස්ථවිරයෝය. කණ්හ දීපායනයෝ ලොකසඞ්ගාහින් වහන්සේය.

මෙහි උත්වහන්සේගේ සත්‍යපාරමිතාවම පෙළෙහි ආරොපණය කරන ලද්දීය. සෙසුපාරමිහු ඇටකි නයින් නිදහරණය කටයුත්තාහ. එසේම නිරවශෙෂ මහාභොග පරිත්‍යාගාදි ගුණානුභාවයෝ විභාවනය කටයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අටුවාවෙහි තුන්වන සුධාභෝජන වර්ණනයෙහි එකාදශවන කණ්හදීපායන චරිතය නිමි.

——(o)——

(XX) XII සුතසොම චරිතය

තවද මේ පරමාර්ථදීපනී නම් චරියාපිටක අටුවාවෙහි තුන්වන සුධාභෝජන වර්ණනයෙහි දෙළොස්වන සුතසෝම චරිතය කියේය යත්:—

පුනා'පරං යදා හොමි සුතසොමෝ මහීපති,
ගහිතෝ පොරිසාදෙන බ්‍රහ්මදත්තේ සංහරං සතිං (315)

යනුවෙන් තැවත අනික් චරිතයක් කියත්නෙමි. යම් කලෙක්හි මම සුතසෝම නම් රජෙක් වීමිද, එකල්හි

පොටිසාදයන් විසින් අල්වා ගත්තා ලද්දෙම් නෑදෑ තම් බමුණු සමඟ තමා විසින් කරනලද ප්‍රතිඥව සිහිකෙළෙම් යන එහි මේ පිළිවෙළ කථාවයි:—

එකල අප මහාසත්ත්වයන් වහන්සේ කුරුරට ඉදිපන් නුවර කොරව්‍ය රජහුගේ දහමේහෙයුත් බිසවුන් කුස පිළිසිඳගත්හ. ඇසිමෙහි සතුටු සිත් ඇති බැවින්ද, සඳවැනි සොම්ගුණ ඇති බැවින්ද, මවුපියෝ ඔහු සුතසෝමයයි දැනගත්තාහුය. වැඩිවියට හා සියලු ශිල්පයන්ගේ පරතෙරට පැමිණි උත්වහන්සේ රජ යෙහි අභිෂෙක ලැබූහ. බරණැස් රජ්ජුරුවෝ වනාහි එකල මිස්කැතිව අනුභව කොකරත්තාහු, අනික් මසක් කොලබන්නාවූ මේකරු විසින් මිනිමස් අනුභව කරවන ලද්දේ, රස තාෂ්ණාවෙන් බැඳී මිනිසුන් මරා මිනිමස් කන්නාහු, ඇමති පිරිස් ආදි නුවර වැසියන් විසින්ද, නියම්ගම් දනවු වැසියන් විසින්ද උත්සාහ කරවන ලද කාලහත්ථි නම් තමන්ගේ සෙනෙ වියන් විසින් "දෙවයන් වහන්ස, ඉදින් රජය කැමැත්තෙහි නිතම් මිනිමස් කෑමෙන් වෙන්වූව මැනවැ"යි කියන ලද්දේ; "රජය හැරපියන්නට නමුදු මිනිමස් කෑමෙන් වෙන් කොවන්නෙමි"යි කියා ඔවුන් විසින් රටින් කෙරපන ලද්දේ, වනයට වැද එක් නුග රුකක් මූල වසහුවෝ, කණුවක හැපීමෙන් පය හට ගත් වණය සුවකිරීම සඳහා මුළු දඹදිව එක්සියයක් රජුන්ගේ ගළ ලෙයින් බිලියම් කෙරෙමිසි දෙවියාට යැද සත්දවසක් නිරා හාර භාවයෙන් වණය සුවවූ කල්හි "දෙවියන්ගේ ආනුභාව යෙන් මට සුවවූයේය"යි යන සිනින් "දෙවියන්ට බිලි පිණිස රජදරුවන් ගෙන එන්නෙමි"යි යන්නාහු, ඉකුත් ජන්මයෙහි යහළුවූ යක්ෂයකු සමඟ එක්ව ගෙන ඔහු විසින් දෙනලද මන්ත්‍ර බලයෙන් ඉතා ශක්තිජවපරාක්‍රමයෙන් යුක්තව සත් දවසක් තුළදීම රජවරුන් සත්දෙනකු ගෙන ගොස් තමන් වසන නුග රුක එල්වා බිලියම් කරනුවට සැරසුණාහ. ඉක්බිති ඒ රුක අරගත්තාවූ දෙවියෝ ඒ බිලියම් නොඉවසන්නාහු "උපායකින් එය වළකමි"යි පැවිදි වෙෂයෙන් තමන් ඕහට දක්වා ඔහු විසින් ලුහුබදින ලද්දේ තුන් යොදුනක් ගොස් නැවත තමන්ගේ දිව්‍ය රූපය දක්වා "තෝ බොරු කියන්නෙහ, තා විසින් මූළු දඹදිව රජදරුවන් ගෙනවුත් බිලියම් කරන්නෙමි"යි ප්‍රතිඥ කරන ලද්දේය, දැන් යම් ඒ තැනකින් දුබල රජදරුවන් ගෙන

ආසෙතීය, දඹදිවට අග්‍රවූ සුතසෝම රජ්ජුරුවන් ඉදින්නෙත නොඑන්නෙහි නම් මට තොපගේ බිලියම්න් කම්නැතැ"යි කීහ. හෙතෙම මා විසින් නිජදෙවතා තොමෝ සියැසින් දක්නා ලද්දී ය"යි සතුටුවූව "සවාමිනී, තොසිතුව මැනව, මම අදම සුතසෝම යන් ගෙන එන්නෙමි"යි කියා, වහාම මිනාවිණා උයනට ගොස් රුකවලක් නැතිව තුබූ පොකුණට බැස, පියුම් පතකින් හිසවසා ගෙන සිටියේය. ඔහු ඇතුළු උයනට ගියකල්හිම ඉතා අලුයම් හුන් යොදුනක් අවට රුකවල් ගත්තානුය. මහා සත්ත්වයෝ අලුයම සරසන ලද ඇතුපිට නැඟි සිවුරඟ සෙනග පිරිවරාගෙන නුවරින් පිටත්වූහ.

එකල තක්ෂලා නුවරින් ඈඳුනම් බමුණෙක් සතාරඟ නම් ගාථා සතරක් ගෙන එක්සිය විසියොදුන් මග ගෙවා එනුවරට පැමිණියේ පැළඳෙරින් පිටත්වූ රජ්ජුරුවන් දැක අත ඔසවා "ජයතු භවං මහාරාජ"යි ජයාශීර්වාද කෙළේය. රජ්ජුරුවෝ මගුලැතු එළවා "බමුණ, තෝ කොයිසිට එන්නෙහිද? කුමක් කැමති වෙහිද? තොපට කුමක් දියයුතුදැ?"යි කීහ. බමුණු තෙම කියනුයේ "නුඹ වහන්සේ වනාහී ශ්‍රුතවිත්තාකයයි අසා සතාරඟ නම් ගාථා සතරක් ගෙන තොපට දෙශනා කිරීමට ආමි"යි කියේය. මහාසත්ත්වයන් තුටුසිත් ඇතිව "මම උයනට ගොස් නහා ආකල අසම්, තෝ නොකළකිරෙව"යි කියා "යම් නොස් බ්‍රාහ්මණයාට අසුවල්ගෙහි නවාතැන්ද, කැම ඇදිමිද ඕධාන කරව්"යයි අණවා උයනට පිවිස මහත් රුකවල් ලවා මහහු අබරණ මුදා රැවුල කප්වා සඳුන් සුනු ආදියෙන් ඵලකලද සිරුරු ඇත්තාහු රාජෛශ්වර්‍යයෙන් පොකුණෙන් නහා ගොඩ නැඟි දියසළුවෙන් සිටියාහ. ඉක්බිති ඕහට සුවදමල් එළවූවාහුය. පොරිසාද තෙම "සැරසුණු කළ රජ්ජුරුවෝ බරවත්තෝය, උන්වහන්සේ සැහැල්ලු විටම අල්වා ගන්නෙමි"යි හඬහසමින් කඩුව කරකවමින් "පොරිසාද නම් මමය"යි තම අස්වා දියෙන් ගොඩ නැගුණේය. ඔහුගේ හඬ අසා ඇතරු ආදීහු ඇතුන් ආදින්නෙන් බැස්සාහුය. බළසෙනඟ දුරසිටියාහුම පලාගියහ. අනිකෙක් තමන්ගේ අවි දමා ළඟින් හොත්තේය. පොරිසාද තෙම රජු ඔසවා කරගිදුවා ගෙන ඉදිරියට පැමිණි තැනින්ම අටළොස් රියන් පවුර පැනපියා ඉදිරියෙන් වැහෙන්නාවූ මද ඇති මතෑතුන්ගේ කුඹුපාඟා පවුකුළුමෙන් හෙළමින්, පවනට

බදු ජවඇති අසරුමන්ද පිට පාගා හෙළුමින් රියහිස් පාහා හෙළුමින්, බම්රයක් කරකවන්නාක් මෙන් නිල්වූ නිග්‍රොධ පත්‍රයන් මඩින්නාක්මෙන් එකම වේගයෙන් තුන් යොදුන් පමණ මහගෙවා ගොස් ලුහු බඳිනා කිසිවෙක් නොදැක සෙමින් යන්නේ සුතසොමයන්ගේ හිසකේවලින් තමන් සිරුරෙහි වැටෙන්නාවූ දිය බිදු කඳුලු බිදුයයි සතා "මේ කිමෙක්ද? සුතසොමයෝත් මරණය අනුව ශොක කරමින් හඬද්දැ"යි කියේය, ඔහා සත්ත්වයෝ "මම වනාහි මරණයට ශොක නොකරම්, හැඩිමක් නම් කොයිත්ද, එතකුදු උවත් ප්‍රතිඥකොට සම්පූතය කිරීම වනාහි පණ්ඩිතයන්ගේ ප්‍රුරුද්දක, ඒ මාගේ සත්‍යය නොනිපැද්දේයයි ශොකකරම්, කාශ්‍යප බුදුන් විසින් දෙසනා කරන ලද ඝතාරඝ නම් ගාථා සතරක් ගෙන තක්සලා නුවරින් ආවාවූ බමුණාට, ආගන්තුකවත් කරවා "නහා අවුත් අසම්, මා එතකල් නැවති, සිටුව"යි ප්‍රතිඥ දී උයනට පැමිණියෙම්, නෝද ඒ ගාථාවන් ඇසිය නොදී මා අල්වා ගත්තෙහිය. ඒ බ්‍රාහ්මණයාහට "මා විසින් කරනලද ප්‍රතිඥව නොමුදන ලදැ"යි ශොක කරම්. ඉදින් මා හරින්නෙහි නම් 'ඒ බණත් අහා ඔහුටත් සත්කාර සම්මානකොට නැවත එන්නෙම්"යි කිහ. "නුඹ වහන්සේ මාවිසින් හැරපියන ලද්දේ නුවරට ගොස් නැවත මා අතට එන්නාහුය"යි යන මේ වචනය මම නො අදහම්. යහළු පොරිසාදයෙනි, මා හා එක්ව එකැදුරු කුලයෙහි භික්ෂූනාවූ යහළුවෙක්වද මේතෙම දිවි සඳහාවත් බොරු නොකියා කුමට නොඅදහන්නෙහිදැයි මාගේ මේ වචන මාත්‍රයෙන් කිමිදු ! යි.

232 අසිඤ්ච සත්තිඤ්ච පරාමසාමි
සපථම්පි තෙ සම්ම අහං කරොමි,
නයා පවුත්තෙතා අණතො භවිතා
සව්වානුරක්ඛිං පුතරාවජීඝසං

(යනුවෙත් යහළුව, කඩුවද, සැතද, අල්ලම්. මම නට අන් කැමැති සපථයකුත් කරම්. තා විසින් මුදතලද්දෙමි ගොස් බ්‍රාහ්මණයාට ණය නැතිව සබවස රකිමින් නැවත තොපකරා එම්.) යි මහා සත්ත්වයන් විසින් මේ ගාථාව කීකල්හි පොරිසාද තෙම "මේ සුතසොමයෝ රජුන් විසින් නොකටයුතු සපථයක් කෙරෙති.

නොස් කැවත නොඑන්නාහුද මාගේ අනින් සොඹදෙත්-කාඤ්ඨි සිතා:-

233. යො තෙ කතෝ සඞ්ගාරෝ බ්‍රාහ්මණේන
රට්ඨේ සකෙ ඉස්සරියෙ ඨිතෙන,
තං සඞ්ගරං බ්‍රාහ්මණස්සප්පදාය
සච්චානුරක්ඛී ප්‍රතරාවජස්සු'ති

කියා මුදා හැරියේය. එහි අර්ථය:- 'සිය රටෙහි රජයෙහි සිටියාවූ නුබ වහන්සේ විසින් යම් ප්‍රතිඥාවක් බ්‍රාහ්මණයා සමඟ කරනලද්දීද, ඒ ප්‍රතිඥාව සිඹකොට සබවසරුක නැවත එනු මැනව''යනුයි.

මහාසත්ත්වයෝ රාහුමුඛයෙන් මිදුනු චන්ද්‍රයාමෙන් හසතියකු සමාන බලඇත්තෝ සත්‍යයෙන් යුක්තවූවෝ වහාම එනුවරට පැමිණියහ. උන්වහන්සේගේ සෙනඟද "සුතසෝම රජ්ජුරු වෝ කම් ඉතා පණ්ඩිතයෝය, පොරිසාදයා දමනය කොට සිංහ මුඛයෙන් මිදුනාවූ උතුම් ඇතකු මෙන් එන්නාහුයයි සිතාද, රජ්ජුරුවන් පොරිසාදයාට දීපියා ආවාහුයයි යන නිසුභයින්ද, පිටනුවරම නැවතී කඳවුරු බැඳ සිටියාහු එන්නාවූ උන්වහන්සේ දුරදීම දැක පෙරගමන් කොට වැද "කිමේක්ද! මහරජාණනි, පොරිසාදයා විසින් වෙහෙසට පමුණුවන ලද්දේදැ"යි පිළිසඳර කොට "පොරිසාදයා විසින් මාගේ මවුපියන් විසින් කරන ලද්දට වඩා දුෂ්කරයක් කරන්ලද්දේය, එබඳුවූ වණසිවූ සාහසිකවූ පොරිසාද තෙම මාගේ වචනය අදහා මා මුදාහැරියේය"යි කිකල්හි රජු සම්භාරණයෙන් සරහා ඇතුපිට නංවා පිරවර ගෙන නුවරට පිවිසියාහුය. ඒ දැක සියලු නුවර වාසිහු සතුටුවූහ. උන්වහන්සේද තමා දහම්සොඬ බැවින් මවු පියන් කරාන් නොපැමිණ වහසලට ගොස් බමුණා කැඳවා ඕහට මහත් සත්කාර සම්මාන කොට තමන් ධම්මගරුක බැවින් මිටි අස්තක භිඳ "ආචාර්‍යයෙනි, නොපවසින් මට ගෙනෙනලද සතාරහ ගාථා අසමි"යි කිහ. බ්‍රාහ්මණ තෙම මහාසත්ත්වයන් විසින් යාචිතු කළකල්හි සුවඳින් අත උලා පසිඳුවෙන් සිත්කළු පොතක් මැත්කොට දුනින් අල්වා ගෙන "මහරජ එසේවිනම් අසනු මැනවැ"යි පොත කියවන්නේ ගාථාවන් කියේය.

231. "සකිදෙව සුතසෝම සබ්බි හොති සමාගමෝ,
සාතං සංගති පාලෙති තා සබ්බි බහු සඞ්ගමෝ.

235. සබ්බිරෙව සමාසෙථ සබ්බි කුබ්බථ සන්ථවං,
සතං සඞ්ගම්මසුඛුඝ සෙය්‍යා හොති න පාපියෝ

236 ජීරන්ති වෙ රාජ රථා සුචිත්තා අථෝ සරීරම්පි ජරං උපෙති,
සතං ච ධම්මෝ න ජරං උපෙති සන්තෝ හවෙ
සබ්බි පවෙදයන්ති;

237 තහා ච දූරෙ පථවී ච දූරෙ පාරං සමුද්දස්ස තදුහු දූරෙ,
තතෝ හවෙ දූරතරං වදන්ති සතංව ධම්මං
අසතං ච රාජ"යි.

එහි අර්ථ කම්:- සුතසෝමයෙනි, සත්පුරුෂයන් හා වරකුදු එක්ව විසිමක් වේද, ඒ සමාගමය ඒ සත්පුරුෂ පුද්ගලයා රකියි. අසත් පුරුෂයන් හා බොහෝ කලක් මුළුල්ලෙහිදු කරතලද සමාගමය ඔහු රැකලන්න කොහැක.

සත්පුරුෂයන් හා සමඟ එක්ව වසන්නේය. සත්පුරුෂයන් හා සමඟ මිත්‍ර සන්ථවය කරන්නේය. බුඩාදි සත්පුරුෂයන්ගේ සීලාදි සඞ්ගම්ය දැන එසේ පිළිපදිනවුන්ට වැඩක් වෙයි. අවැඩක් කොවන්නේය.

මනාව විසිතුරු කරතලද්දවූ රජුන්ගේ මංගල රථයෝ නියත වශයෙන් දිරත්. නැවත ශරීරයන් වයස් මේරීමෙන් දිරිමට පැමිණෙයි. බුඩාදි සත්පුරුෂයන්ගේ නවලොකොත්තර ධම්ම වනාහි දිරිමට නොපැමිණෙයි. බුඩාදි සත්පුරුෂයෝ සත්පුරුෂයන් හා සමඟ එකානනයෙන් බණ්ඩනාහුය.

මහරජාණනි, අහසට පොළව දුරවෙයි. මුහුදු එතරට මෙතර දුරෙහියයි කියත්. බුඩාදි සත්පුරුෂයන්ගේ සතර සතිපට්ඨානාදි ප්‍රභෙද ඇති සප්තත්‍රිංශත් බොධි පාක්ෂික ධම්මයද දෙසැට දෘෂ්ටිගත ප්‍රභෙද ඇති, අසද්ධම්මයද යන දෙක ඊටවඩා අතිශයින් දුරයයි පණ්ඩිතයෝ කියත්."

ගාථාවන් අසා මහා සත්ත්වයෝ" මාගේ ඊම සඵලවූයේයයි සතුටු සිත් ඇත්තාහු" මේ ගාථාවෝ වනාහි ශ්‍රාවකයන් විසින් කියතලද්දාහුත් නොවෙති. සෘෂීන් විසින් කියතලද්දාහුත්

නොවෙති. දෙමියන් විසින් කියනලද්දාහුත් නොවෙති. සමීඳු බුදු කෙතෙකුන් විසින්ම වදරනලද්දාහුය, මේ ගාථා කෙතෙක් අගනේද"යි සිතා මේ සියලු සක්වල බඹලොව දක්වා සත් රුවනින් පුරා දුන් තමුත් සුදුස්සක් කරනලද්දේ නම් නොවන්නේය. මම වනාහි මොහුට තුන්සියයක් යොදුන් කුරුරටෙහිද, සත් යොදුන් පමණවූ ඉදිපත් භූවරෙහිද රාජ්‍යය දීපියන්ට සමඵවෙමි. මොහුට රජය කරවන්ට තරම්වූ භාග්‍ය යක් නැත්තේය. ඒ එසේමය. මොහුගේ ශරීර ලක්ෂණානුසාර යෙන් මද ආනුභාව ඇති බව පෙනේ. එබැවින් මෝ හට රජය දුන්නත් ඔහු කෙරෙහි නොපිහිටාමියය"යි සිතා ආචාර්‍ය්‍ය යන්වහන්ස, නුඹවහන්සේ සෙසු රජදරුවන්ට මේ ගාථාවන් දෙශනා කොට කුමක් ලබ්වීද"යි විචාළාහ. 'මහරජාණනි, මේ එක එක ගාථාවට සියය සියය බැගින් ලබමි, එහෙයින් මේ ගාථාවෝ සතාරහ නම්වූහ"යි කියේය. ඉක්බිති මහා සත්ත්වයෝ "ආචාර්‍ය්‍යයෙනි, මොඹ තමන් ගෙන ඇවිදින බඳුවෙහි අගය නොදන්නාහුය.

238. සහස්සියො ඉමා ගාථා න ඉමා ගාථා සතාරහා,
චත්තාරි තේ සහස්සානි විපදං ගණ්හාහි බ්‍රාහ්මණ.

යයි කියා "මේ ගාථාවෝ සාහස්සිය නම් වෙති. (දහසක් අගනාහුය) මේ ගාථා සතාරහ (සියයකට සුදුසු) නම් නොවෙයි බමුණ, තෝ වහාම සාරදහසක් ගණුව"යි කියා සහවණු සාර දහසක් දෙවා සැප යානාවක්ද දී මහත් සත්කාර සම්මාන යෙන්ම ඔහු පිටත්කර යවා මවුපියන් වාද "මම බ්‍රාහ්මණයා විසින් ගෙන එන ලද සඩමී රත්තය පුදා ඔහුටද සත්කාර සම් මාන කොට එත්තෙමි"යි පෝරිසාදයාට ප්‍රතිඥා දී ආවෙමි. එහි මාවිසින් බ්‍රාහ්මණයාට කටයුතු පිළිපැදිය යුතු යමක් විනම් ඒ කරනලද්දේය, දැන් පෝරිසාදයාගේ සමීපයට යන්නෙමි"යි කිහ. "පුත, සුතසෝමයෙනි, මේ කුමක් කියව්ද! අපි සිවුරන සෙනඟින් සොරහු අල්වා ගනිමු. සොරහු කරා නොයව"යි කිහ. සොළොස් දහසක් නාටක සත්‍රිහුද සෙසු පිරිවර ජන යෝද "දෙවියන්වහන්ස, අප අනාථකොට කොහි යහුද්ද"යි ඇඬු වාහුය. නැවතත් "රජ්ජුරුවෝ සොරු කරා යෙති"යි එක කොලාහලයක් වූයේය. මහසත්හු "ප්‍රතිඥව පිණිස නැවත

යාම් නම් සාධූන් හා සත්පුරුෂයන් විසින් ආචිණ්ණ ගුණයක නෙතෙම් මා අදහා හැරපීය, එහෙයින් ඔහුගේ සමීපයට යන් නෙමෙමිය"යි මිවුපියන් වැද සෙසු පිරිවර ජනයාට අනුශාසනා කොට කඳුළු වැකි මුහුණින් යුක්තව නොයෙක් ප්‍රකාරයෙන් විලාප කියා හඬන්නාවූ අන්තඃපුර සහ ආදීවූ ජනයා විසින් අනු ගතව නුවරින් නික්ම ඒ ජනයා වලක්වන්ට මග හරහා දණ්ඩ කින් ඉරක් ඇද මාගේ මේ ඉර නොඉක්මවවුයි කියා ගියහ. මිහ දෙතේ තෙජවන්තවූ මහා සත්ත්වයන්ගේ අණ ඉක්මවා පිය නොහී මිහ හඬින් හඬා වැලපී නැවතුනාහ. බොධි සත්ත්වයෝ ආවාවූ මාර්ගයෙන්ම ඔහුගේ සමීපයට ගියහ. එහෙයින් වදුරුකලදි.

"ආපුච්ඡි මං පොරිසාදෙ කිංචං ඉච්ඡසි නිස්සජ්ජං,
ඝාතෙමනි නෙ කාහාමි යදි මෙ තවං පුනෙහිසි. (347)

තස්ස පවිසනුණ්ඩාන පණෙතා ආගමනං මම,
උපගන්ත්වා පුරං රම්මං රජ්ජං නියාදසිං තදා (348)

අනුසාසිත්වා සඛමමං පුබ්බකං ජිනසෙවිතං,
බ්‍රාහ්මණස්ස ධනං දත්වා පොරිසාදං උපාගමිං. (349)

නත්ථි මෙ සංසයො තත්ථ ඝාතයිස්සති වා නවා,
සච්චවාචාහු රක්ඛනෙනා ජීවිතං චජිතුමුපාගමිං;
සච්චෙන මෙ සමො නත්ථි එසා මෙ සච්ච පාරමී."සි (350)

ඒ පොරිසාදයා ළඟට එළඹිමෙහිලා කිමෙක්ද! මේ තෙම මා මිරාදේහෝ නොමිරාදේහෝයි මට සැකයෙක් නැත්තේය. චණ්ඩවූ සාහසිකවූ මේ තෙම මා සමඟ එක්සියයක් රජවරුන් දෙවියන්ට බිලියම් කරනුවට සූදානම්ය, එහෙයින් මේ තෙම එකානානයෙන්ම මා නසන්නේයයි දැනම හුදෙක් සත්‍ය වචනය රක්ෂාකරන්නෙම් මාගේ ජීවිතය පරිත්‍යාග කරන්ට එළඹියෙමි. "සත්‍යයෙන් මා හා තුල්‍යයෙක් නැත. මෝ නොමෝ මාගේ සත්‍ය පාරමිතාව වන්නීය" යි එහෙයින් වදාළහ.

මහා සත්ත්වයන් පොරිසාදයා කරා එළඹිකල පිපියාවූ හෙළ පියුමක්සේ සොභාවත් මුහුණ දැක "මේ තෙම පහව ගිය මරණ භය ඇතිව මා සමීපයට පැමිණියේය, මේ ආනුභාවය කවරක්,

හුනේද"යි සිතන්නේ "දහම් ඇසූ බැවින් මෙසේ තෙද ඇත්තේද නිහීයවූයේද වීය"යි සිතමි. "මිමත් ඒ ධර්මය අසා තෙද ඇත්තෙක් නිහීයවූවෙක් වෙමි"යි සතිවූහත් කොට පොරිසාද තෙම මහා සත්ත්වයන්ට කියනුයේ "තෙපි යමක් ඇසීමට තමන්ගේ නුවරට ගියහුද, ඒ සතාරහ ගාථා අසමු"යයි කීයේය. මහා සත්ත්වයෝ ඒ අසා මේ පොරිසාද තෙම පාප සහිතාව ඇත්තේය. මොහු මදක් නිග්‍රහකොට ලජ්ජා කොට පියන්නෙමියි සිතා

239. අධම්මිකස්ස ලුද්දස්ස නිච්චං ලොහිතපාණිනෝ,
නත්ථි සච්චං කුතෝ ධම්මෝ කිංසූ තෙන කරිස්සති.

(කියා අධාර්මිකවූ දරුණුවූ නිතොර ලේ වැකුණු අත් ඇත්තාවූ තා කෙරෙහි සත්‍යවාදි ගුණයෙක් නැත. ධර්මයෙක් නම් කොයින්ද? නව ලොවූතුරා දහම් ඇසීමෙන් කවර ප්‍රයොජනද)යි කියා නැවත ඔහු විසින් ඉතා යහපත්ව හටගත් ශ්‍රවණාදරයෙන්,

240. සුත්වා ධම්මං විජානාති තථා කල්‍යාණපාපකං,
අපි ගාථා සුණිත්වාන ධම්මෙ මෙ රමතෙ මනෝ.

(සත්ත්වයෝ බණ අසා යහපත අයහපත දනගනිත්. එබැවින් නුඹ වහන්සේ හෙන් ගාථා අසනු කැමැත්තෙමි. මා සිත දහමට ඇලෙයි.) යි කිකල්හි "මේ තෙම අතිශයින් හටගත් ආදර ඇත්තේය, අසනු කැමැත්තේය, එහෙයින් ඕහට කියන්නෙමි"යි සිතා "යහළුව එසේ වී නම් අසව, මතා කොට මෙතෙහිකරව"යි කියා නන්ද නම් බ්‍රාහ්මණයා විසින් හි නියායෙන් ගාථාවන්ට සඤ්ඤා සතුති කොට, කාමාවචර සදෙව් ලොව එකකොලාහළයක් කොට දෙවතාවන් සාධුකාර දෙන කල්හි පොරිසාදයා හට:—

241 සකිදෙව මහාරාජ සබ්බා හොති සමාගමෝ,
සාතං සංගති පාලෙති නාසබ්බා බ්‍රහ්මචරියමෝ.

242 සබ්භිරෙව සමාසෙථ සබ්බා කුබ්බථ සන්ථවං,
සතං සධම්ම මඤ්ඤාය සෙය්‍යා හෝති න පාපියෝ.

243. ජීරන්ති මේ රාජ රථා සුචිත්තා අථෝ සරීරම්පි
ජරං උපෙති,
සතං ච ධම්මෝ න ජරං උපෙති සන්තෝ හවේ
සබ්භි පවේදයන්ති.

244. න හා ච දූරෙ පථවී ච දූරෙ පාරං සමුද්දස්ස
තදුහු දූරෙ,
තතෝ හවේ දූරතරං වදන්ති සතං ච ධම්මං
අසතං ච රාජ" සි

දහම් දෙසූසේක. එහි අර්ථ යථා කී නියාමයෙන් දන්නේය. උන් වහන්සේ විසින් මතාකොට කී හෙයිනුත් තමන්ගේ පුණ්‍යානුභාවයෙනුත් ඒ ගාථා අසද්දීම ඔහුගේ සියලු ශරීරය පස් වනක් ප්‍රීතියෙන් පිරිහියේය. හෙතෙම බොධිසත්ත්වයන් කෙරෙහි මොළොක් සිත් ඇතිව "යහළු සුත සොමයෙනි, ඔබට දියයුතු හිරණ්‍ය සුවණ්ණාදී යමක් නොදකිමි. එක එක ගාථාවට එක එක වරය බැගින් දෙන්නෙමි"යි කීයේය. ඉක්බිති ඕහට මහා සත්ත්වයෝ "නෝ වතාහි තමාගේ හිතානිවෘඩිය නොදන් නෙහි, අනුත්හට කිතම් වරයෙක් දෙන්නෙහිදැ"යි ගහිංකොට නැවතත් ඔහු විසින් වරගනුව"යි සංඥකරන ලද්දේ හැමට පළ මුව "බොහෝ කල් නිරොග වූ තා දකිනු කැමැත්තෙමි"යි වරයක් ඉල්ලූහ. හෙතෙම "දැන් මේ රජ්ජුරුවෝ මරා මස්කනු කැමති මහානර්ථකාරිවූ මාගේ ජීවත්වීම කැමති වන්නාහ"යි සතුටු සිත් ඇතිව වරය ගත්තාව නොදැන දුන්නේමය. මහා සත්ත්වයෝ තමන් උපායෙහි දක්ෂභාවයෙන් "ඔහු බොහෝකල් ජීවත්වනු කැමති බව" යන ව්‍යාජයෙන් තමන්ගේ ජීවිතය ඉල්ලූහ. නැවත "අධික සියයක් රජුන්ගේ ජීවිතය දෙව"යි දෙවන වරය ඉල්ලූහ. ඔවුන් සියරටෙහි පිහිටුවීම තම්වූ තුන්වන වරයද ඉල්ලූහ. මනුෂ්‍ය මාංස අනුභවයෙන් වැළකීම තම්වූ සිවුවෙනි වරයද ඉල්ලූහ. හෙතෙම පළමු වරතුන දී සිව්වනවරය නොදෙනු කැමැත්තේ අනික් වරයක් ගනුවයි කියාත් මහාසත්ත්වයන් විසින් පීඩා කරනු ලබත්තේද ඒද දුන්නේමය. ඉක්බිති මහාසත්ත්වයෝ පොරිසාදයා නිබ්බිසෙවනය (දමනය) කොට ඔහු ලවාම රජ දරුවන් මුදවා බිම්හොවා ළදරුවන්ගේ කන්වලින් නූල් වැටි ඉවත් කරන්නාක් මෙන් සෙමින් රැහැන් ඉවත්කොට එක්

පොතුවඤියක් ගෙන්වා ගලගා සත්‍යක්‍රියාකොට ඒ රජදරුවන්ගේ අත්තලවල ගැල්වූහ. එකෙණෙහිම සුවවූයේය. දෙතුන් දිනක් එහිම වැස ඔවුන් නිරොගි කරවා ඔවුන් සමඟ කොඹදෙන සවිහාවයෙන් මිත්‍ර සඵවඤ කරවා ඔවුන් සමඟ ඔහු බරණැස් නුවරට ගෙනගොස් රාජ්‍යයෙහි පිහිටුවා "අප්‍රමාද වෙව" යි අවවාදකොට ඒ රජදරුවන් තම තමන්ගේ නුවරටයවා ඉඳිපත් නුවරින් පැමිණි තමන්ගේ සිවුරන සෙතග විසින් පිරිවරන ලද්දේ තමන්ගේ නුවරට ගොස් තුටුපහටුවූ නගර වාසින් විසින් පිරිවරනු ලබන්නෝ අන්තඃපුරයට පැමිණ මවුපියන් වැද මතු මහල්තලයට නැංගාහ. ඉක්බිති මහාසත්ත්වයෝ දන්සැල් සඤක් කරවා දවසක් පාසා මහදන් පවත් වන්නෝ සිල් පුරන්නෝ පෙහෙවස් වසන්නෝ පාරමීන් පිරූහ. ඒ රජදරුවෝද මහා සත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදි පින්කම් කොට දිවි කෙළවර දෙව්ලොව ගියාහුය.

එකල පොසිසාදයෝ අහුල්මල් තෙරණුවෝය. කාල හස්ති තම් අමාත්‍යයෝ ශාරිපුත්‍ර සථවිරයෝය. හඤ හම් බ්‍රාහ්මණයෝ ආනන්ද සථවිරයෝය. වඤ්ඣ දෙවතාවෝ මහාකාශ්‍යප සථවිරයෝය. රජදරුවෝ නම් බුදු පිරිසමය. මවුපියෝ මහා රාජ කුලයෝය. සුතසෝම මහරජ්ජුරුවෝ ලොකඤ්ඤාම්වූ බුදුරජාණන් වහන්සේය. ඝටකියතලද පරිදි දෙන් උත්වහන්සේගේ සෙසු පාරමිහුද නිඛ්ඛාරණය කටයුත්තාහුය. ඒ එසේමය, අලීනසත්තු චරිතයෙහි මෙන් මහාසත්ත්වයන්ගේ ගුණානුභාවයෝ විභාවනය කටයුත්තාහුය.

පරමාත්ථදීපනීනම් චරියාපිටක අට්ඨකථාවෙහි තුන්වන සුඛසඤ්ඤ වගියෙහි දෙලොස්වන සුතසෝම චරිතය නිමි.

සතෑපාරමිතාව කියා නිමවන ලදී.

(XX) XIII සාමපණ්ඩිත චරිතය.

—:—

තවද මේ පරමාභිධානී නම් වියඹාපිටක අටුවාවෙහි තුන්වන යුධිෂ්ඨිර වග්ගයෙහි තෙළෙස්වන සාමපණ්ඩිත චරිතය කියේය යත්:—

සාමෝ යදූ වනෙ ආසිං සඋයාන අගිනිම්මිහෝ,
පවනෙ සිහබ්‍යඝ්ඝෙ ච සම්භතාය මුපනාමයිං. (551)

යම් කලෙක්හි මහ වෙනෙහි සක්දෙව්රජු විසින් මවතලද **සුවණ්ණසාම** නම් තාපස කුමාරයෙක් විමිද, එකල මම මහ වෙනෙහි සිංහ ව්‍යාඝ්‍රයන්ද මෛත්‍රියෙහි යෙදවීමි. **යත්තෙහි** මේ පිළිවෙළ කථාවයි.

යටකියන දවස බරණැසට නුදුරු තන්හි ගං ඉවුරෙක එක් වැදිගමෙක් විය. එහි දෙවු වැදිහට පුතෙක් උපත. ඔහට **දුකූලයයි** නම් කළාහුය. ඒ ගහ පරතෙරත් වැදි ගමෙක් විය. එහි දෙවු වැදිහට දුවක් උපත. ඇට **පාඨිකායයි** නමක් කළාහුය. ඔව්හු දෙදෙනම බඹලොවින් ආවාවූ පිරිසුදු සත්ත්වයෝ වූහ. වය පැමිණි ඔවුන් නොකැමතිසේම ආවාහ විවාහ කළාහුය. ඔව්හු දෙදෙනම කෙලෙස් මුහුදට නොබැස මහා බ්‍රහ්මයන් දෙදෙනකු මෙන් එකතුවම විසූහ. කිසියම් වැදියමක් නොකෙරෙති. ඉක්බිති දුකූලයන්හට මවුපියෝ කියන්නාහු "පුත තෙපි වැදියම් නොකරන්නාහු ගෘහවාසයත් නොකමැත්තාහු කුමක් නම් කරවිද" යි විචාළාහුය. ඔහු තුමූ කියන්නාහු "නුඹවහන්සේලා අනුදන්නා කල්හි පැවිදි වන්නෙමු" යි කීහ. එසේ විතම් පැවිදිවව්" යයි කීහ. ඔව්හු දෙදෙනම හිමවතට වැද යම් තැනකින් **මිගසම්මත** නම් නදී තොමෝ හිමවතින් බැස ගංගාවට පැමිණියාද, එතනට ගොස් ගහ හැර මිගසම්මත නම් නදියට අභිමුඛව කැනි ගියාහුය. එකල සක්විමන උණුවිය. සක්දෙව් රජාණෝ ඒ කාරණය දැන විස්කම් දෙව්පුත් ලවා එතන පන්සලක් මවාලූහ. ඔව්හු එතනට ගොස් පැවිදිව සක්දෙව් රජු විසින් දෙනලද අසපුවෙහි කාමාවචර මෙත් බවමින් විසූහ. ශක්‍රයෝත් ඔවුන්ට උවටැන් කරනු පිණිස එති. ශක්‍රයෝ එක්

දවසක් ඔවුන්ගේ ඇස් අහිමවන්නාහයි දැන දුකුල පණ්ඩිතයන් කරා එළඹ "ස්වාමීනි, නුඹවහන්සේලාගේ ඒකපුරුෂාධිපත්‍යයෙක් පෙනේ, පිළිදැගුම් කරන්නාවූ පුතෙක් ලබන්නට වටිය, නුඹ වහන්සේලාගේ ශුඹවූ චිත්තය දනිම්හ. එබැවින් පාරිකාවන් මල්වරවූකල අහින් නැඹය පිරිමදිනු මැනව, මේසේ නොපට පුතෙක් උපදින්නේය. හෙතෙම නොපට උවටැන් කරන්නේය"යි කියා ගියහ. දුකුල පණ්ඩිතයෝ ඒ කාරණය පාරිකාවට කියා ඇ මල්වරවූකල නැඹ පිරිමැන්දහ. එකල අපගේ බොධිසත්ත්වයෝ දෙව්ලොවින් චුතව ඇගේ කුස පිළිසිඳ ගත්හ. ඕ නොමෝ දසමාසක්හුගේ ඇවැමෙන් රන්වන් පුතකු වැදුවාය. එහෙයින්ම උන්වහන්සේට සුවණ්ණසාම යයි නමක් කළාහුය. මවුපිය දෙදෙන, මැත කාලයෙහි වැඩිවිය පැමිණ සොළොස් හැවිරිදි පමණවූ උන්වහන්සේ රක්නාහු අසපුවෙහි හිඳුවා තුමූම වතමුල් පලවැල පිණිස යෙත්. ඉක්බිති එක් දවසක් වලින් පලවැල ගෙන කැවති අසපුවට නුදුරු තන්හි වැසි නැති කල්හි රුක්මූලකට වැද තුඹසක් මත්තෙහි සිටියාවූ ඔවුන්ගේ ශරීර යෙන් දඹිය ගඳින් මුසුවූ දිය ඒ තුඹස් බිල හොත් නාගයාගේ නාසාපුටයට වන්කල නාගතෙමේ කිපී නාසාවාතයක් හැරී යේය. දෙදෙනම අඹව හඬමින් ඇවිදිනාහුය. ඉක්බිති මහා සත්ත්වයෝ "මාගේ මවුපියෝ ඉතා ලස්වෙති, ඔවුන්ගේ පුවත් කවරේදැ"යි පෙරමනට ගොස් හඬනැසූහ. ඔව්හු කුමාරයාගේ හඬදැන පිළිඹඩනසා පුත්‍ර ස්නෙහයෙන් කියන්නාහු "පුත සාමයෙනි, මෙහි උවදුරෙක් ඇත, නො එව"යි කියා හඬ අනුව තුමූම අවුත් එකතුවූහ. උන්වහන්සේ කවර කාරණයකින් නුඹවහන්සේලාගේ ඇස් නටුවාහුදැ"යි විචාරා දරුව, අපිතොදනිමු, වැසි වසින කල්හි රුක්මූල තුඹස මත්තෙහි සිටියාවූ අපි තොදකිමු"යි කී ඇසිල්ලෙහිම "එහි සර්පයෙක් ඇත, කිපියාවූ ඌ විසින් නාසාවාතයෙක් හළේවතැ"යි කියාම දත්හ. එසේවී නම් "තොසිතා වදාළමැනව, මම නුඹවහන්සේලා පිළිදැගුම් කරන්නෙමි"යි මවුපියන් දෙදෙන අසපුවට කැඳවා ගෙනගොස් උන්වහන්සේලාට රාත්‍රිසථාන දිවාසථානාදි හැසිරෙන තන්හි රැහැන් බැන්දහ. එවක් පටන් ඔවුන් ආශ්‍රමයෙහි සිටුවා වතමුල් ඵලාඵල ගෙන එත්. අලුයම වසනතැන අමදිති, පැන්ගෙන එති, බොන පැන් ඵලවති, දූහැටි දවු මුව දෙකා පැන් ආදියදී

මිහිරි පලවැල දෙති. ඔවුන් මුවදෙවුකල තුමූ අනුභවකොට මවු පියන් වැද "මොවුහු තුමූ කුමක් කථාකෙරෙත්ද"යි ඔවුන්ට හුදුරු තන්හිම හිඳින්. වෙසෙසින්ම මෙත් වැඩුහ. ඒ කරණ කොටගෙන උන්වහන්සේට සත්ත්වයෝ පිළිකුල් නොකළාහුය. බොධිසත්ත්වයන් වහන්සේද සත්ත්වයන්ට පිළිකුල් නොකළාහ. මේසේ උන්වහන්සේ දවසක් පාසා පලවැල සඳහා වලට යන් නාහුද එන්නාහු ද මුව මුළුල්ල විසින් පිරිවරන ලද්දේවූහ. සිංහ ව්‍යාඝ්‍ර දිවි යන මොවුන්ගේ පක්ෂයෙහි වූ සත්ත්වයෝද උන් වහන්සේ හා විස්වාස වූහ. මෙතනානුභාවය කරණකොට ගෙන උන්වහන්සේ වසන තැන තිරිසන් ගත සත්ත්වයෝද ඔවු හොවුන් මොළොක් සිත් පිළිලාබූහ. මෙසේ බොධිසත්ත්වයෝ සැමතන්හි මෙතනානුභාවයෙන් භය රහිත වූවාහු තැති ගැන්මක් නැත්තාහු බඹහු මෙන් වෛර නැත්තාහු වූහ. එහෙයින් වදාරන ලදී.

"සීහව්‍යග්ඝහත්ථි දිපිහි අළෙජහි මහිංසෙහි ච,
පඤ්ඤවන්වරාහෙහි පරිවාරෙසා වනෙ වසිං"සි (353)

දැන් තමන්ගේ මෛත්‍රීභාවනාවෙන් ලබනලද ආනිසංසය මෙසාකප්‍රාප්තයයි දක්වන්ට:—

න මං කොචි උත්තසති නපිහං භායාමි කස්සචි,
මෙත්තාබ්‍රහ්මනුපජ්ඣායා රමාමි පවනෙ තදා. (353)

යන අවසාන ගාථාව වදාළහ. "සස බිළාලාදි බානා සුළු කිසි සත්ත්වයෙක් මා දැක භය නොවෙයි. මමද සිංහ ව්‍යාඝ්‍රාදී තිරිසනුන් කෙරෙන්ද යක්ෂාදි අමනුෂ්‍යයන් කෙරෙන්ද රෞද්‍රවූ ලේවැකුණු අත්ඇති මනුෂ්‍යයන් කෙරෙන්ද බිය නො වෙමි. (කවර හෙයින යත්?) බොහෝ කලක් මුළුල්ලෙහි වඩනලද මෛත්‍රී පාරමිතානුභාවයෙන් උපසනාම්හිත වූයෙමි (වහල් ලද්දෙමි), මහවෙනෙහි අභිරමනය කෙළෙමි" යනු එහි අර්ථයි.

මෙසේ මහාසත්ත්වයෝ සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී වඩන්නාහු මවුපියන් මොහවට රකින්නාහු එක් දවසක් මහා වනයෙන් මිහිරි පලවැල ගෙනවුත් ආශ්‍රමයෙහි තබා මවුපියන් වැද "පැන් ගෙන එන්නෙමියි"යි මුවමුළුල්ල විසින් පිරිවරන

ලද්දේ මුවන් දෙදෙනකු එකතු කොට ඔවුන් පිට කළය තබා අතින් අල්වාගෙන ගංතොටට ගියහ. එසමයෙහි බරණැස් නුවර පිළිගක් නම් රජ්ජුරු කෙනෙකුන් රජය කරවූහ. ඒ රජ්ජුරුවෝ මුව මස් ලොබින් මිටුට රජය පාවාදී පසඳාවුධ සන්නාඩව හිමාලයට වැද මුවන් මරා මස් අනුභව කොට හැසිරෙන්නෝ මිග සම්මත නදියට පැමිණ පිළිවෙළින් නොස් සාම කුමාරයන් පැන්හන්නා තොටට පැමිණියහු මුවන්ගේ පා ලකුණු දැක හැරී එන්නාහු එසේ යන්නාවූ බෝසතුන් දැක "මෙපමණ කල් මුළුල්ලෙහි මෙහි හැසිරෙන්නාවූ මා විසින් මනුෂ්‍යයෙක් නුදුටු විරුය, මේ තෙම දෙවියෙක් දෝ හෝ නොකොත් නාගයෙක් දෝ හෝ යි මොහු ලඟට ගොස් පරීක්ෂා කරන්නෙම් නම් වහාම පලා යන්නේය. මම මොහු විද දුබලකොට විචාරන්නෙම් නම් මැනව"යි සිතා මහාසත්ත්වයන් නහා වැහිරි සිවුරු ඇඳ අදුන් දිවි සම එකස්කොට බහා පැන්කළය පුරවා ඔසවාගෙන වම්කර තබන කල දැන් මොහු විදන්ට වේලාව යයි සලකා විසපොවන ලද හියෙන් උන්වහන්සේගේ දකුණු පස විද්ධෝය හිය වම්පසින් නික්මිණ. බෝසතාණන්ට විදිනලද බැව් දැන මුව මුළුල්ල බියපත්ව පලාගියහ සාමපණ්ඩිතයෝ වනාහි විදින ලද්දාහු නමුත් පැන්කළය යම් ඒ තැනක තොදමා සිහි එළවා වහා කරින් බහා වැලි පිරා තබා දිග නියම දැන මවුපියන් වසන දෙසට හිසලා වැදහෙව මුවෙන් ලේ දමා මට සතුරුවූ කිසිවෙක් නම් නැත. කිසිවකු කෙරෙහි මාගේත් වෛරයක් නැතැයි කියා මේ ගාථාව කිහ.

245. "කොනු මං උසුනා විජ්ඣි පමත්තං උදක හාරකං,
ඛත්තියෝ බ්‍රාහ්මණෝ වෙස්සෝ කොමං විද්ධානිලීයති'යි

එහි අර්ථ:— පැන්ගෙනයන්නාවූ ඒ පිණිස පමාවූ මා කවරෙක් ඒයෙන් විද්දේද, ක්ෂත්‍රියවූ හෝ බ්‍රාහ්මණවූ හෝ වෛශ්‍යවූ හෝ කවරෙක් මා විද සැඟ වේද යනුයි. රජ්ජුරුවෝ ඒ අසා "මේ තෙම මා විසින් විද හෙලන ලද්දේ නමුදු මට ආක්‍රෝශ නොකරෙයි, නොදැ පරිහව බණෙයි පපුමස් අල්ලන්නාක් මෙන් ප්‍රිය වචනයෙන් කථා කෙරෙයි, මොහුගේ සමීපයට යන්නෙම්"යි සිතා එළඹ තුමූම තමා විසින් විදිනලද බව ප්‍රකාශ කොට "නුඹ කවරෙක් වෙහිද කවරක්හුගේ පුත්‍ර හෝ වෙහිද?"යි මහ සතා

ණත් විචාළහ. බෝසතාණන් වහන්සේ "මම සාම නම් වෙමි, දුඃඛුල පණිබිත නම්වූ වැදි තවුසාණන්ගේ පුත්‍ර වෙමි, මා කුමකට විද්දෙහිදැ?"යි විචාළහ. රජ්ජුරුවෝ පළමුකොට "මුවෙක ඝන සංඝයෙන් විද්දේය"යි බොරු කියා මම නිරපරාධවූ මොහු නිකරුණේ විද්දෙමි"යි ශොක කොට තතුවූ පරිදි දැන් කියා උන්වහන්සේගේ මව්පියන් වසන තැන විචාරා එහි ගොස් ඔවුන්ට තමන් හඟවාපියා ඔවුන් සමග කරන ලද පිළිසඳර කථා ඇත්තෝ "මා විසින් සාමතෙම විදින ලදැ"යි කීහ. එකල විළාප කියා හඬන්නාවූ ශොකයට පැමිණියාවූ ඔවුන් "සාමයන් විසින් කට්යුතු යම් අන්පා මෙහෙයක් වනම් ඒ සියල්ල කොට මම තොපට උවටැන් කරන්නෙමි"යි අස්වසා සාමයන් ගේ සමීපයට පැමිණවූහ. ඔවුහු එහි ගොස් නොයෙක් ලෙසින් හඬා ඔහුගේ ළෙහි අත්තබා "මාගේ පුතණුවන්ගේ ශරීරයෙහි උසුම් පවතිමය. විෂ වේගයෙන් විසංඥ බවට පැමිණියේ වකැයි විෂ නැතිවනු පිණිස සත්‍යක්‍රියා කරමුය"යි සිතා:-

246. යං කිඤ්චිදඛ්ඨිකතං පුඤ්ඤං මයහං වෙව පිතුවතෙ,
සබ්බෙන තෙන කුසලෙන විසං සාමස්ස හඤ්ඤතු

යනුවෙන් "මා විසිනුදු තොපගේ පියාණන් විසිනුදු කරන ලද යම් පිනක්වේද, ඒ පින් කරනකොට ගෙන සාමයාගේ විෂ නසිව"යි කියා මවු විසින්ද:—

247. යං කිඤ්චිදඛ්ඨි කතං පුඤ්ඤං මයහං වෙව මාතුව තෙ
සබ්බෙන තෙන කුසලෙන විසං සාමස්ස හඤ්ඤතු යී

මා විසිනුදු තොපගේ මැණියන් විසිනුදු කරන ලද යම් පිනක් වේද, ඒපින් කරණ කොටගෙන සාමයාගේ විෂ නසීව යි කිය පියා විසින්ද

248. පබ්බත්‍යාහං ගන්ධමාදනෙ විරරත්‍යා නිවාසිනි,
න මෙ පියතරො කොචි අඤ්ඤ සාමා හි විජ්ජති;
එතෙන සච්ච වජ්ජෙන විසං සාමස්ස හඤ්ඤතු.

යනුවෙන් "බොහෝ කල් ගන්ධමාදන පර්වතයෙහි වසන්නාවූ මට සාම කුමාරයන් විනා ප්‍රියතරවූ කිසිවෙක් නැද්ද, - ඒ සත්‍යයෙ

කරණ කොටගෙන සාම කුමාරයන්ගේ පිය බසිව"සි කියා දෙවු දුව පිහින්ද සත්‍යක්‍රියා කළ කල්හි මහසත්ත්‍ව විහා. තැබි සිටියහ. පියුම්පත දියබිඳුමෙන් පෙරළී ආබාධය පහව ගියේය. විදිතෑත නිරොගිව ප්‍රකෘතිමත් වූයේය. මව්පියන්ගේ අස්ද පහළවූවාහුය මෙසේ මහසත්ත්වයන්ගේ නිරොගි බවද මව්පියන්ගේ ඇස් ලැබීමද අරුණ තැබීමද ඒ සිවුදෙන අසපුවෙහි සිටීමදැයි යන මේ සියල්ල එකවිටම වූයේය. ඉක්බිති මහාසත්ත්වයෝ රජු සමඟ පිළිසඳර කොට "ධම්මංචර මහාරාජ" (මහ රජ්ජුරුවෙනි, දහම්හි හැසිරෙව)සි යනාදි-ගාථායෙන් ධර්මදේශනා කොට මත්තෙහිද අවවාද දී පන්සිල් දුන්හ. රජ්ජුරුවෝ උන්වහන්සේගේ අවවාදය මුදුනෙන් පිළිගෙන වැඳ බරණැසට නොස් දැනාදි පින්කම් කොට දෙවුලොව ගියහ. බෝසත්හුද මව්පියන් සමඟ පසුබැනි ඥාතීන් හා අෂ්ට සමාපත්තීන් උපදවා ආයු කෙළවර බඹලොව ගියහ. එකල රජ්ජුරුවෝ ආනන්ද ස්ථවිරයෝවූහ. දෙව්දූ උත්පලවණ්ණාවෝය. ශක්‍රයෝ අනුරුද්ධ ස්ථවිරයෝය. පියාණෝ මහා කාශ්‍යප ස්ථවිරයෝය. මැණියෝ භද්දකපිලානීවෝය. සාමපණ්ඩිතයෝ ලොකස්වාමීන් වහන්සේය. උන් වහන්සේගේ සෙසු පාරමීහුද යටකියතලද ක්‍රමයෙන් නිදහන්නය කට යුත්තාහ. ඒ එසේමය. දකුණුපසින් වැද වම්පසින් වැනී විදීම් වශයෙන් විෂපොවතලද හියෙන් විදින ලද්දේ නමුදු කිසියම් විකාරයක් නොකොට දිය කළය බිම තැබීමද, වධකළවුන් නොදන්නා නමුදු දන්නාක්මෙන් සිත්හුගේ විකාරයක් නැති බවද, ප්‍රිය වචනයෙන් කථා කිරීමද, මව්පියන්ට උපස්ථාන කිරීමද, පිනෙන් මාගේ පිරිහීමයයි ශොක කිරීම් මාත්‍රයද, නිරොගිවූ කාලයෙහි රජුකෙරෙහි කරුණා මෛත්‍රී උපදවා ධර්මදේශනා කිරීමද, අවවාද දීමදැයි මේ ආදි ගුණානුභාවයෝ විභාවනය කට යුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියාපිටක අට්ඨකථාවෙහි තුන්වන යුධිෂ්ඨිර වර්ගයෙහි තෙළෙස්වන සාමජාතක චරිතය නිමි.

(XX) XIV එකරාජ චරිතය.

තවද මේ පඨමාභිදිපනි නම් වංශකථාව අටුවාවෙහි තුන්වන බුඩසද්දස වගියෙහි තුදුස්වන එකරාජ චරිතය ක්‍රමයෙ යත්.

පුනා'පරං යදා හොමි එකරාජාති විස්සුතෝ,
පරම සිලං අධිට්ඨාය පසාසාමි මහා මහිං. (351)

දස කුසල කම්මපථේ වත්තාමි අනවසෙසතෝ,
චතුහි සංගහ වත්ථූහි සඩගණ්හාමි මහාජනං. (352)

තැවත අනික් චරිතයක් කියන්නෙමි. යම් කලෙක්හි මම එකරාජ යයි ප්‍රසිද්ධවිමිද, එකල උතුම්වූ දශකුශල කම් පථශීලය සමාදන වශයෙන් හා අව්‍යතික්‍රමණ වශයෙන් ඉටාගෙන යොදුන් තුන්සියයක් පමණවූ ක්‍රමයට අනුශාසනා කරමි. දශකුශලකම් පථයන් සමාදන්ව පවතිමි. මහජනයා සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කරමි. එහි පිළිවෙළ කථාව මෙසේදයත්:-

යටගිය දවස අපගේ මහාසත්ත්වයන් වහන්සේ බරණැස් රජුගේ පුත්‍රව උපන්හ. උන්වහන්සේ වැඩිවිය පැමිණ සියලු ශිල්පයෙහි පරතෙරට ගොස් පියාණන්ගේ ඇවැමෙන් රජය කරවන්නෝ කුශල ශීලාචාර ශ්‍රද්ධා ශ්‍රැතාදි අනන්‍ය සාධාරණ ගුණ විශෙෂ යොගයෙන් හා පාරමී පරිභාවනයෙන්ද දඹදිව් තලයෙහි උන්වහන්සේට දෙවැන්නෙක් නැති හෙයිනුදු ප්‍රධාන හෙයිනුදු අන්වර්ථ නාමයෙන් එකරාජ යයි ප්‍රසිද්ධවූහ. උන් වහන්සේ එකල නුවර සතර දෙරටුවෙහි සතරක්ද, මැද එකක්ද, වාසල් දෙරටුවෙහි එකක් දැයි දානශාලා සයක් කරවා දුගීමගී යාචකාදීන්ට දන්දෙන්, සිල්රකින්, පෙහෙවස් සමාදන් වෙන්. ක්ෂාන්තිය, මෛත්‍රිය, දයාවය, යන මෙකී ගුණයෙන් යුක්ත වූවාහු ඇකයෙහි හුන් පුතකු සතුටු කරන්නාක් මෙන් සියලු සත්ත්වයන් සතුටු කරමින් දැහැමින් රජය කරවති. උන් වහන්සේගේ එක් ඇමතියෙක් අන්තඃපුරය දූෂණය කොට මැන කාලයෙහි ප්‍රකටව ගියහ. අමාත්‍යයෝ ඒ බව රජුට දන්වූහ. රජ්ජුරුවෝ ඒ පරීක්ෂා කරන්නාහු තමන්ද ඒ ප්‍රත්‍යක්ෂ වශයෙන්

දැන ඒ අමාත්‍යයා කැඳවා "අද බල, තා විසින් අයුත්තක් කරන ලද්දේය, නෝ මාගේ නුවර විසීමට සුදුසු නොවන්නෙහි, තමන්ගේ ධනයත් අඹුදරුවනුත් රැගෙන අන්තැනකට යව"යි රවින් කෙරපූහ. හෙතෙම කොසොල් දනව්වට ගොස් දබ්බසෙන කුමාර කොසොල් රජහට උවටැන් කරන්නේ ක්‍රමයෙන් ඔහුගේ විශ්වාසයෙක්ව එක්දවසක් රජහට කියනුයේ "දෙවයන් වහන්ස, බරණැස් රජය වනාහි මැස්සන් තැනි මීවදයක් වැන්න රජ්ජුරුවෝ ඉතා මොළොක, සුවෙන්ම ඒ රජය ගත හැකිය"යි කීයේය. දබ්බසෙන රජ්ජුරුවෝ බරණැස් රජුගේ මහානුභාවය කරණකොටගෙන ඔහුගේ වචනය නො අදහන්නාහු මිනුජ්‍යයන් යවා කසිරට ගම් පැහැරවීම් ආදිය කරවා, ඒ නොරුස්ට බොධිසත්ත්වයන් විසින් දසතුව දී හරිතලද බව අසා රජ්ජුරුවෝ ඉතා දැහැමියයි දැන බරණැස් රජය ගන්නෙමියි සෙනා වාහන ගෙන නික්මුණාහ. ඉක්බිති බරණැස් රජහුගේ මහා යොධයෝ "කොසොල් රජ්ජුරුවෝ එන්නාහ"යි අසා 'ඔහු අපගේ රාජ්‍ය ශිමාව නො අක්මත් කළාහුම තළා අල්වා ගන්නෙමු"යි තමන්ගේ රජ්ජුරුවන්ට කීවාහුය. බොධි සත්ත්වයෝ "දරුවෙනි, මා නිසා අනික් සත්ත්වයකුට වෙහෙස කිරීමක් නැත, රාජ්‍යයෙන් ප්‍රයෝජන ඇත්නාහු රාජ්‍යය ගනිත්වා, එහි නොඇවිය"යි කියා වැළැක්වූහ. කොසොල් රජ්ජුරුවෝ ජනපදය මැදට පැමිණියහ. මහා යොධයෝ නැවතත් රජහට එසේ කීවාහුය. රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම වැළක්වූහ. දබ්බසෙනයෝ පිටනුවර සිට "රාජ්‍යය හෝ දෙත්වා යුධය හෝ කෙරෙත්වා"යි ඒක රජ්ජුරුවන්ට හසුනක් යැවූහ. ඒක රජ්ජුරුවෝ "මා හා යුධයෙක් නැත, රජය ගනුව"යි පිළිතුරු හසුනක් යැවූහ. නැවතත් මහා යොධයෝ "දෙවයන් වහන්ස, අපි කොසොල් රජහට ඇතුල් නුවරට වදිනු නොදෙමිහ, පිට නුවරෙහිදීම ඔහු නළා අල්වා ගන්නෙමු"යි කීවාහුය. රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම වළක්වා නුවර දොරටු වස්වා මතු මහල් තලයෙහි උන්හ. දබ්බසෙනයෝ මහත් සෙනා වාහනයෙන් නුවරට වැද සතුරු එකකුත් නොදක්නාහු මුළු රජය අත්පත් කොටගෙන රජවාසලට ගොස් මතු මහල් තලයට නැගී නිරපරාධ වූ බොධි සත්ත්වයන් අල්වා නෙත වළෙක වැළලූහ එතෙකින් වදුරණ ලදී.

"එවං මේ අපමත්තස්ස ඉධලෝකෙ පරත්ථව,
දබ්බසෙනෝ උපාභනතා අච්ඡුනෙනා පුරං මම, (356)

රාජ්ජපීවෙ නිහතමේ සබලවාහෙ සරථෙකෙ,
සබ්බං හත්ථගතං කත්වා කාසුයා නිබ්බි මම."සි (357)

ජාතක දෙශනා වෙයිදු:—

219. "අඤ්ඤතරෙ කාමගුණෙ සමිද්ධෙ
භුඤ්ජාත පුබ්බෙ වසි එකරාජා,
සෝ දානි දුග්ගෙ නරකම්හි ඛිත්තෝ
තපපජ්ජහෙ වණ්ණ බලං පුරාණං"සි

වළෙහි දැමූ බව ආඛ්‍යේය. ජාතක අට්ඨවාවෙහි වනාහි සහල්ලකා දමා උතුරු එලිපතෙහි ගවිකුරු කොට එල්වූයේ යයි කියන ලදි. මහා සත්ත්වයෝ වනාහි සොර රජු අරබයා මෙත්වඩා කිසිණු පිරියම්කොට ධ්‍යානාභිඥාවන් උපදවා වළින් ගොඩනැගී අහසෙහි පළඟින් හුන්හ. එහෙයින් වදුරණ ලදි.

"අමච්ච මණ්ඩලං රජ්ජං ච්චිනං අණෙන පුරං මම,
අච්ඡිඤ්ඣානා භහිනං පියපුත්තනංච පඤ්ඤහං;
මෙත්තායස මෙ සමෝ නත්ථි එසා මේ මෙත්තා පාරමි"සි.(358)

එහි අර්ථ:- "මම අමාත්‍ය මණ්ඩලයෙනුදු බලවාහන යෙනුදු නගර ජනපදාදි යෙනුදු සමෘද්ධවූ මාගේ රාජ්‍යයද, ඉස්ගාර දැසි දැස පරිජනයාගෙනුදු වස්ත්‍රාභරණාදි උපකරණයන්ගෙනුදු සමෘද්ධවූ මාගේ අන්තඃපුරයද, සිඳපියා ගන්නා ලද සතුරු රජහු තමන්ගේ ප්‍රිය පුත්‍රයකුමෙන් දිවිමි. මෛත්‍රියයෙන් මා හා සදිසිවූ කිසිවෙක් ලොවනැත්තේය"යනුයි.

මෙසේ බොධි සත්ත්වයන් ඒ සොර රජු අරබයා මෙත් පතුරුවා අහසෙහි පළඟ් බැඳහුන් කල්හි දබ්බසෙනයන්ගේ ශරීරයෙහි දැහැකක් හටගත්තේය. ඔහු "දැවෙමි, දැවෙමි"සි බිම ඔබ මොබ පෙරළෙනි. "මේ කිමෙක්ද"සි විචාළ කල්හි "මහ රජාණනි, තෙපි නිරපරාධවූ ධාර්මික රජහු වළලාවූහුය"සි කී කල්හි එසේනම් මහාඝොස් "ඒ රජ්ජුරුවන් ගොඩතගවීය"සි කිහ. පුරුෂයෝ ඝොස් අහසෙහි පළක් බැඳහුන් රජ්ජුරුවන්

දැක අවුත් දබ්බසෙන රජහට දන්වූහ. ඔහු වෙගයෙන් ගොස් වැද කමාකරවා ගෙන "නුඹවහන්සේගේ රජය නුඹවහන්සේ සිත්සේ කරනු මැනව, මම නුඹවහන්සේගේ සතුරන් වළක්වන්නෙමි"යි කියා ඒ දුෂ්ට අමාත්‍යයාහට රාජාඥාකොට ගියහ. බෝධිසත්ත්වයෝද අමාත්‍යයන්ට රජය පාවාදී තවුස් පැවිද්දෙන් පැවිදිව මහජනයා ගිලාදී ගුණයන්හි පිහිටුවා ආයු කෙළවර බ්‍රහ්මලොක පරායණ වූහ.

එකල දබ්බසෙන රජ්ජුරුවෝ ආනන්ද ස්ථවිරයෝවූහ. ඒකරජ්ජුරුවෝ ලොකනාථයන් වහන්සේය. දවස දවස දන්සැල් සයෙහි සයදහසක් වියදම් කිරීමෙන් හා සතුරු රජහට මුළු රාජ්‍යය පරිත්‍යාග කිරීමෙන්ද උන්වහන්සේගේ දානපාරමිතා වය, නිත්‍යශීලය, උපොසථ කම් වශයෙන් හා ප්‍රව්‍රජිතවූවහුගේ නිරවශෙෂ ශීලසංවර වශයෙන්ද ශීලපාරමිතාවය, පැවිදිවීම් වශයෙන් හා ධ්‍යානාධිගම වශයෙනුත් නෛෂ්ක්‍රම්‍ය පාරමිතා වය, සත්ත්වයන්ගේ හිතාහිත විචාරීම් වශයෙන් හා දාන ශීලාදිය විධානකිරීම් වශයෙන්ද ප්‍රඥාපාරමිතාවය, දානාදිපුණ්‍ය සම්භාරය මහාකොට උත්සන්න වශයෙන් හා කාමවිතර්කාදිය දුරු කිරීම් වශයෙන්ද වීර්‍යපාරමිතාවය, දුෂ්ටාමාත්‍යයාගේද දබ්බසෙන රජහුගේද අපරාධ ඉවසීම් වශයෙන් ක්ෂාන්ති පාරමිතාවය, ප්‍රතිඥා පරිදි දානාදිය නොවළහා දීම් වශයෙන් සත්‍ය පාරමිතාවය, දානාදීන්ගේ අවල සමාදානාධිෂ්ඨාන වශයෙන් අධිෂ්ඨාන පාරමිතාවය, සතුරන් කෙරෙහිදු එකාන්ත හිත එළවීම් වශයෙන් හා මෛත්‍රීධ්‍යාන ඉපදවීම් වශයෙන් මෛත්‍රී පාරමිතාවය, දුෂ්ටාමාත්‍යයා හා දබ්බසෙනයන් විසින් කරතලද අපරාධය කරුණාකොට ගෙන හිතෙසිවූ තමන්ගේ අමාත්‍යාදීන් විසින් ඇතිකරන ලද උපකාරයෙහිදු මධ්‍යස්ථවීමෙන්ද රජසුවය පැමිණි කල්හිද සතුරු රජු හා මිතුරු කල්හි සමාන සිත් ඇති බැවින් උපෙක්ෂා පාරමිතාවදැයි මෙසේ දසපාරමිහුම දතයුත්තාහුය. මෙබඳු කියන ලදී:-

250. "පනුජ්ජ දුක්ඛෙන සුඛං ජනින්ද
සුඛෙනවා දුක්ඛ මසයහසාහි,
උභයත්ථ සන්තා අභිනිබ්බුතත්තා
සුඛෙව දුක්ඛ ච භවන්ති තුල්‍යා"යි

එහි අර්ථ කම්:— "ඉවසිය නොහැකි දැ සහනය කරන ජන ශ්‍රෙෂ්ඨයන් වහන්ස, දුකින් සැපය හෝ සැපයෙන් දුක හෝ දුරලා

සත්පුරුෂයෝ දෙතැන්හිම නිවියෙන් ඇතිව සැපදුක් දෙක්හිම සමාන වූවාහු වෙත්" යනුයි.

මේහි මෛත්‍රී පාරමිතාව බලවත් හෙයින් ඒ දක්වනු පිණිස මෛත්‍රී පාරමිතාවම දෙශනා පාලියට ආරූඪ කරන ලදු. එසේම මෙහි මහා සත්වයන්ගේ සියලු සත්වයන් කෙරෙහි ඖරස පුත්‍රයන් මෙන් සමාන අනුකම්පා ආදි ගුණ විශෙෂයෝද නිර්‍ණය කට්යුත්තාහුය.

පරමාර්‍ථදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි තුන්වන යුඛඤ්ජය වගියෙහි තුදුස්වන එකරාජ චරිතය නිමි.

මෛත්‍රීපාරමිතාව කියා නිමවන ලදු.



(XX) XV මහා ලොමහංස චරිතය

—(o)—

තවද මේ **පරමාර්‍ථදීපනී නම් චරියාපිටක අට්ඨවාවෙහි තුන් වන යුඛඤ්ජය වගියෙහි පසළොස්වන මහා ලොමහංසචරිතය** කිසේය යත්:—

"මම අමු ඝොෂාණෙහි ඝයනය කෙළෙමි." එහි මේ පිළිවෙළ කථාවයි. එකල අප මහ බෝසතාණන් වහන්සේ මහත්වූ උදුරහොඟ ඇත්තාවූ කුලයෙක ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාර්‍යයන් වෙත ගරුවාසයෙහි වසන්තාහු සියලු ශිල්පයෙහි කෙළ පැමිණ කුල ගෘහයට අවුත් මවුපියන් ඇවැමෙන් තැයන් විසින් කුටුම්බසංස්ථාපනය කරනු මැනවයි! ඉල්වනු ලබන්නේද අනිත්‍ය බව මෙනෙහි කිරීම්වශයෙන් සියලු භවයෙහි වැඩෙන සංවෙග ඇත්තෝ ශරීරයෙහිද අගුහ සංඥාව ලැබ ගෘහවාසයෙහිවූ පළිඝෝධාදිවූ කෙලෙස් ගහණයට නොවැද බොහෝ කල් මුළුල්ලෙහි පුරුදු කරනලද නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශය වඩන්තාහු මහත් භොගසකඩය හැරපියා පැවිදි වනු කැමතිව කැවත මෙසේ සිතූහ. "ඉදින් මම පැවිදි වන්නෙම් නම් ගුණ සම්භාවනාවෙන් ප්‍රකට වන්නෙම්"යි

උන්වහන්සේ ලාභ සත්කාර පිළිකුල් කරන්නෝ "නො පැවිදි වම මම වනාහි ලාභලාභයන්හි නිර්විකාරවන්ට පොහොසත්මි"යි තමන් සලකමින් විශෙෂයෙන්ම පරිහව සහනාදි ප්‍රතිපදාව පුරමින් උපෙක්ෂා පාරමිතාව මුදුන් පමුණුවමි"යි හැදිවතින්ම ගෙයින් නික්ම ඉතා සැහැල්ලු පැවතුම් ඇත්තාවූද විශෙෂයෙන්ම මද බොලඳ ඇත්තාවූද විශෙෂයෙන්ම මදලැසි ඇත්තාවූ ද කෙනකුමෙන් අනුන් විසින් සිත් තැත්තාවූ රූවක් මෙන් පිඬා කරකලද්දේ නිදුකරන ලද්දේ ගම් නියම් ගම් රජදනව්හි එක් රැක් විසිම් පමණින් හැසිරෙති. යම් තැනක බොහෝ නිත්දා ලැබේද, එතැන බොහෝ කලකුත් වෙසෙති. උන්වහන්සේ හැදිවත දිරුකල රෙදි කඩකිත්ද, එද දිරුකල කිසිවකු විසින් දෙනලද්දක් නොගන්නාහු විළිවසන පමණින්ම හැසිරෙති. මෙසේ කල් යත් යත් එක් නියම් ගමකට ගියහ. එහි විධවා සත්‍රින්ගේ පුත්‍රවූ ධූනී‍ඝෂාව ඇත්තාවූ ගම් දරුවෝද රාජවල්ලභයන්ගේ කිසි දරු මුණුපුරු දස ආදිහුද උඩඟුවූවාහු උස්වූ මාතනල ඇත්තාහු වපලවූවාහු රළුවවත ඇත්තාහු කලින් කල ක්‍රීඩා බහුලව හැසිරෙති යන්නාවූ දුසී මහලු සත්‍රී පුරුෂයන් දැක අලු මිටින් ගෙන පිටෙහි විසුරුවති. වැටකෝපත් කිසිල්ල අතුරෙහි එල්වති. ඒ විප්‍රකාරයෙන් ආපසු හැරී බලනකල වරදට අනුරූපව කවටකම් දක්වා සිතහෙසති. මහා සත්ත්වයෝ ඒ නියම් ගම්හි එසේ ක්‍රීඩාකරන්නාවූ ධූනී දරකයන් දැක නිසැකයෙන් මා විසින් උපෙක්ෂා පාරමිතාව පිරීමට උපායයෙක් ලබන ලද්දේයයි සිතා එහි විසූහ. ඒ ධූනී දරකයෝ උන්වහන්සේ දැක විසුළුකරන්ට පටන් ගනිත්. මහාසත්ත්වයෝ ඒ ඉවසිය නොහෙත්නාක්මෙන් මෙන්ද ඔවුන්ට බියෙන් මෙන්ද නැගීසිට යෙති. ඔව්හු උන්වහන්සේ ලුහු බඳිත්. උන්වහන්සේ ඔවුන් විසින් ලුහුබඳින ලද්දාහු "මෙහි නවතින්නාවූ කිසිමෙක් නැතැ"යි සොහොනට ගොස් මිනී ඇටයක් හිස්වයින් කොට සැතපෙති. ඒ ධූනී දරකයෝද එහි ගොස් වෙර කෙළ හැසිමාදිවූ කොයෙක් වැදූරුම් විහිළු කොටයෙති මෙසේ ඔව්හු දවසක් දවසක් පාසා කෙරෙත්මය. කිසියම් නුවණැති කෙනෙක්

මෙසේ කරන්නාවූ ඔවුන් දකින්ද, ඔව්හු ඔවුන් වළකා "මොහු තුමූ මහත් ආනුභාව ඇති තාපස කෙනෙක, මහා යොගී කෙනෙකැ"යි දැන මහත් සත්කාර සම්මාන කෙරෙත්. මහා සත්ත්වයෝ වනාහි මේ හැමතන්හි මධ්‍යස්ථව එකසේම වෙත්. එහෙයින් වදුරණ ලදී.

"සුසාණෙ සෙය්‍යංකරපපමි ඡවඩ්ඩිකං උපනිධායහං,
නොමණ්ඩලා උපාගන්ත්වා රූපං දසෙසනති නපපකං. (359)

අපරෙ භක්ඛයුං මාලඤ්ච භොජනං විවිධං බහුං,
උපායනානුපනෙනති භය්‍යා සංවිග්ගමානසා. (360)

යෙ මෙ දුක්ඛං උපදහනති යෙ ච දෙනති සුඛං මම,
සබ්බසං සමකොහොමි දයාකොපො නවිජ්ජති."සි (361)

ඒ ගම් දරුවන් අතුරෙන් සමහර කෙනෙක් මොහු වනාහි පරිභව වශයෙන් මෙසේවූ විහිලු කරන කල්හිදු කිසි විකාරයක් නොදක්වති. ගෞරව කිරීමෙහි මොහුගේ පැවැත්ම කෙසේ දැයි පරීක්ෂාකරන්නාහු නොයෙක් වැදුරුම්වූ බොහෝ ගඳ මල්ද බොජුන්ද තවත් පුද පඬුරුද එළවත්.

දැන් භාග්‍යවතුන්වහන්සේ එකල උපකාරක අපකාරක සත්ත්වයන් කෙරෙහි රැස්කරනලද සුණ්‍යසම්භාර ඇති තමන් වහන්සේගේ සමසිත් ඇති බවක් විකාරයක් නැති බවක් ලොක ධර්මයන් කෙරෙහි යම් නොහැලුනු බවක්විද, ඒ දක්වනු පිණිස:-

"සුඛදුක්ඛෙ තුලා භූතො යසෙසු අයසෙසු ච,
සබ්බත්ථ සමකොහොමි එසා මෙ උපෙක්ඛාපාරමී"සි (362)

අවසාන ගාථාව වදුළසේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ එකල සියලු සත්ත්වයන් කෙරෙහිද, සියලු ලොක ධර්මයන් කෙරෙහිද, අනුනය හා අසාධාරණවූ තමන්ගේ මධ්‍යස්ථ භාවය ප්‍රකාශකොට ඒ කරණකොට ගෙන ඒ අත්බැව්හි තමන්ගේ උපෙක්ෂා පාරමිතාව මිසනකප්‍රාප්තවූ බව දක්වන්නෝ "එසා මෙ උපෙක්ඛාපාරමී"හි දෙශනාව නිමිවෑ වදුළසේක.

මෙහි මහා සත්ත්වයන්ගේ ප්‍රථමකොට විශේෂයෙන් සියලු වස්තුපරිත්‍යාගයද, "යම් කිසිවෙක් මේ ශරීරය හෙත තමන් කැමති යමක් කෙරේවා"යි අනපෙක්ෂක භාවයෙන් තමන්ගේ ආත්මභාව පරිත්‍යාගයද දානපාරමිතාව, ලාමකවූ සියලු සොකටයුතු දෙය නොකිරීම සීලපාරමිතාව, කාමා සාදයෙන් වෙන්ව ගිහිගෙයින් නික්මුණාහුගේ ශරීරයෙහි අශුභ සංඥාව වැඩීම නෛෂ්ක්‍රම්‍යපාරමිතාව, සම්බොධි සම්භාරයන්ට උපකාර ධර්මයන් පරිග්‍රහණයෙහි හා ඊට ප්‍රතිපක්ෂ ධර්මයන් දුරුකිරීමෙහි කුශලභාවයද, යථාසභාවයෙන් ධර්මස්වභාවය සිතීමද ප්‍රඥාපාරමිතාව, කාම විතර්කාදිය දුරු කිරීම හා දුක් ඉවසීම වීර්‍යපාරමිතාව, සියලුම අධිවාසනක්ෂාන්තිය ක්ෂාන්ති පාරමිතාව, වාක් සත්‍යයද සමාදානය විසංවාදනය නොකිරීමෙන් විරති සත්‍යයද සත්‍යපාරමිතාව, නිරවද්‍ය ධර්මයෙහි අවලම සමාදානයාගේ අධිෂ්ඨානය අධිෂ්ඨානපාරමිතාව, හිමි නොතබා සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී වැඩීම මෛත්‍රී පාරමිතාව, ඔට කියනලද ක්‍රම වශයෙන් උපෙක්ෂාපාරමිතාවදැයි මේ දසපාරමිතාවෝ මෙහිලා ලැබෙත්. මෙහි උපෙක්ෂාපාරමිතාව බලවත්නුයි එයම දෙශනාවට නහනලදී.

එසේම මෙහි මහත් හොගසහාඛයද, මහත් සුතසමූහයාද හැර මහ බිනික්මන් සඳිසිවූ හෙයින් නික්මීමද, එසේ නික්ම ලාභ සත්කාර පිළිකුල් කිරීමෙන් අනුන්ගේ සම්භාවනය හැර පියනු කැමැත්තහුගේ ප්‍රව්‍රජ්‍යා ලිංගය නොගෙන නිරවශේෂ ප්‍රව්‍රජ්‍යා ගුණය සිතින්ම අධිෂ්ඨාන කොට ගෙන පරම සුඛ විහරණයද, පරමාලෙපච්ඡ භාවයෙන් උතුම් විවෙකයෙහි ඇලීමද, ඉවසීමෙහි අභිප්‍රායයෙන් තමන්ගේ කායජීවිත දෙක්හි නිරපෙක්ෂක භාවයද, අනුන් විසින් තමන් කෙරෙහි කරනලද විහිළු ඉවසීමද, උත්කාෂ්ඨ බවට ගිය සැහැල්ලු පැවතුම් ඇති බවද, බොධි සම්භාර ධර්මයන්ට ප්‍රතිපක්ෂවූ ක්ලෙශ ධර්මයන්ගේ තුනීභාවයෙන් රහතුන්ගේ මෙන් මෙර මාගේ උපකාරාපකාර යන්හි නිර්විකාර භාවයට හෙතුවූ හැමතන්හි මැදහත් බැවින්

මිනිසකොට පිහිටුවනලද අෂ්ටලෝක ධර්මයන්හෙන් නොගැලී ම්ද, සියලුපාරමීන්ට මූදුන්වූ උපෙක්ෂා පාරමිතාවගේ මහානු ප්‍රාප්තියදැයි මේ ආදිගුණානු භාවයෝ විභාවනය කටයුත්තාහුය.

පරමාර්ථදීපනී නම් චරියා පිටක අට්ඨකථාවෙහි තුන්වන බුද්ධවංශ වර්ණනයෙහි පහළොස්වන මහාලොමහංස චරිතය නිමි.

උපෙක්ෂාපාරමිතාව කියා නිමවනලදි.



උද්දානගාථා

බුද්ධවංශෝ සොමනස්සා අයොඝර හිමෙන ච,
සොණනන්දෝ මූනපඤ්ඤා කපිරාජා සචව සවහනෝ. (363)

වට්ටකා මච්ඡරාජා ච කණ්හදීපායනෝ ඉසි,
සුතසෝමෝ පුන ආසිං සාමෝ ච එකරාජකා.
උපෙක්ඛාපාරමී ආසි ඉතිවුත්තං මහෙසිනා. (364)

යනුවෙන් මේ යම් කාලයන්හි බුද්ධවංශය, සොමනස්ස, අයොඝර පණ්ඩිත, මහාසත්ත්වය, සෝණ පණ්ඩිත, තෙමිය පණ්ඩිත, කපිරාජ, සච්චතාපස, වට්ටපොතක, මච්ඡරාජ, කණ්හදීපායන, සුතසොම, සාමකුමාර, එකරාජ, මහා ලොමහංස වූයෙමිද ඒ කාලවල කි නසින් මහත්වූ දානාදී බොධි සම්භාර ධර්මයන් සොයන්නාවූ බොධිසත්ත්වවූ මා විසින් පුරුදු කරනලද්දාවූ හැසිරෙන ලද්දාවූ පිළිපදින ලද්දාවූ යම් චරිතයක් විද, ඒ නිමාවිය. දැන් පෙරුම් පිරීම් වශයෙන් බොහෝ කල් පැවැත්තාවූ මෙහි වියුදු නොවියුදු තමන් වහන්සේගේ දුෂ්කරක්‍රියාව සංක්ෂේප යෙන් එක්කොට යමක් පිණිස ඕ තොමෝ පවත්වන ලද්දීද ඒ සංක්ෂේපයෙන් දක්වන්ට:-

"එවං බහුවිධං දුක්ඛං සම්පත්තෝ ච බහුවිධං,
භවාභවෙ අනුභවිත්වා පත්තෝ සම්බොධි මුත්තමං" යි (365)

වදළසේකි. එහි අර්ථ ඛාරි ප්‍රත්‍යයෙනි, ඝටකිරනලද නසින් කුදු මහත් භවයන්හි හෙවත් අකිත්තිනි පණ්ඩිතාදි කාලයෙහි ආහාර

පිණිස තැනූ කාරපත්‍ර තුන්වතවර දක්වා සක්බවුණාට දී ආභාරූපවෙජ්දාදි නානාප්‍රකාරවූ දුක්ද, කුරු රාජාදි කාලයෙහි ශක්‍ර සම්පත් වැනිවූ සොයෙක් වැදූරම් සැපත්ද අනුභවකොට පියා දුකින් තොපෙළමින් සැපතින් තොඅදිමින් පෙරුම් පුරාම උත්තමවූ නිරුත්තරවූ සම්‍යක් සම්බොධියට පැමිණියෙමි.

දැන් ඇම් පාරමිතා ධර්‍ම කෙතෙකුත් පුරනු පිණිස මේ දුෂ්කරවර්‍යා චිරකාලයක් මුළුල්ලෙහි පවත්වන ලද්දීද, ඒ පාරමිත් නිරවශෙෂයෙන් පිරිපුත් බවද, ඒ කරණ කොට ගෙන පැමිණිය යුතු ඵලයට තමන් පැමිණි බවද දක්වන්ට:—

"දත්වා දුතබ්බකං දුනං සීලං පූරෙත්වා අකිලසතෙතා,
නෙක්ඛම්මෙම පාරමිංගතත්තාපතෙතා සම්බොධි මුත්තමං (366)

පණ්ඩිතෙ පරිපුච්ඡිත්වා විරියං කත්වාන උත්තමං,
ඛන්තියා පාරමිංගතත්වා පතෙතා සම්බොධි මුත්තමං. (367)

කත්වා දළහ මධිට්ඨානං සච්චවාචානුරක්ඛිය,
මෙත්තායඇ පාරමිංගතත්වා පතෙතා සම්බොධි මුත්තමං. (368)

ලාභාලාභෙ යසායඇසෙ සම්මානනාවමානතෙ,
සබ්බත්ථසමඇකාග්‍රත්වා පතෙතා සම්බොධි මුත්තමං."සි (369)

වදරණලදි. එහි ප්‍රථම ගාථාවෙහි "දත්වා දුතබ්බකං දුනං" යන මෙහි එකල නිරුත්තරවූ සම්‍යක් සම්බොධි සමධිගමඇ පිණිස අග්‍රයාන ප්‍රතිපදාවට පිළිපන්නාවූ මහබෝසතාණන් වහන්සේ විසින් දියයුතු රාජ්‍යාදිවූ බාහිර වස්තුහුද අඩිය තයතාදිවූ අබ්භන්තර වස්තුහුද යන දෙය ධර්‍ම දී; එහෙයින්ම රාජ්‍ය පරිත්‍යාගඇ අඩිය පරිත්‍යාගඇ, තයත පරිත්‍යාගඇ, පුත්‍රදර පරිත්‍යාගඇ, ජීවිත පරිත්‍යාගඇ, යන පසුව මහාපරිත්‍යගඇ කෙළවර කොට දුතපාරමිඇ, දුතඋපපාරමිඇ, දුතපරමාර්‍ථ පාරමිඇයි ප්‍රභෙද ඇති දුතපාරමිතාව නිරවශෙෂයෙන්ම සම්පාදනඇ කොටඇ යනු අර්‍ථයි.

එහි අකිත්තී බ්‍රාහමණ කාලයෙහිද, සංඛබ්‍රාහමණ කාලයෙහි දූයි යනාදි මේහි ප්‍රකාශව ආවාවූද මෙහි ප්‍රකාශ තොවූ විසඇය සිවුකාලයෙහිද වෙලාම කාලයෙහි දූයි මේ ආදිවූ මහාපුරුෂයන්

දානපාරමිතාව පිරූ අත්බැව්හි පමණක් නම් නැත. නියත වශයෙන් වනාහි මුත් වහන්සේ සසපණ්ඩිතව උපන් කල්හි:—

251. "නිබ්බාය උපගතං දිසවා සකඤ්ඤානං පරිච්චජිං,
දානෙන මෙ සමොතරති එසා මෙ දානපාරමී"

(යනුවෙන් තමන් ලබන භික්ෂාව පිණිස එළඹි සක්බමුණාට සුඛිත ආත්මය පරිත්‍යාග කෙළෙම් දීම කරණ කොටගෙන මා හා තුල්‍යවූවෙක් නැත. මෝ තොමෝ මාගේ දානපාරමිතාව නම්)යි, මෙසේ ආත්ම පරිත්‍යාග කරන්නාවූ බෝසතුන්ගේ දාන පාරමිතා නොමෝ පරමාර්ථ පාරමිතාවූ, සෙසු අත්බැව්හි දාන පාරමිතාවෝද උපපාරමිතාවෝද සුදුසු පරිද්දෙන් දතයුත්තාහ.

"සීලං පූරෙන්තා අඤ්ඤතරෝ" යනුවෙන් නිරවශෙෂ වශයෙන් කායික සංවරය, වාචසික සංවරය, කායවාක් සංවරය, ඉන්ද්‍රිය සංවරය, නොජතයෙහි පමණ දැන්මය, විසුබා ජීවයයි මේ ආදිකොට ඇති බොධිසත්ත්ව සිලය සපයන්නාවූ මා විසින් සිලපාරමිය, සිල උපපාරමිය, සිල පරමාර්ථ පාරමියයි ප්‍රභෙද ඇති පිරිය යුතු හැමදිල් පුරාසනු දක්වයි මෙහිදු සීලවනාග රාජව උපන් කල්හි ද, වමෙපය්‍ය නාගරාජව උපන්කල්හිදැයි මේ ආදි මෙහි ප්‍රකාශව ආවාවූද මෙහි ප්‍රකාශව නොආවාවූද මහා කපි කාලයෙහිද, ඡද්දන්ත කාලයෙහිදැයි මේ ආදි මහ බෝසතාණන් ශීලපාරමිතාව පිරූ අත්බැව්හි පමණෙක් නම් නැත. නියත වශයෙන් වනාහි උත්වහන්සේ සංඛපාලව උපන්කල:—

252. "සූලෙහි විජ්ඣ්‍යන්තොපි කොට්ටයන්තොපි සත්තිහි,
හොජ පුත්තෙන න කුපාමි එසා මෙ සීලපාරමී

(යනුවෙන් හුල් වලින් විදින කල්හිද අඩයට්ටවලින් අනින කල්හිද වැදි පුත්‍රයන් කෙරෙහි නොකිපෙමි. මෝ තොමෝ මාගේ සීලපාරමිතා නම්)යි.

මෙසේ ආත්ම පරිත්‍යාග කරන්නාවූ බෝ සතාණන්ගේ සීලපාරමිතා තොමෝ පරමාර්ථ පාරමී නමිවූ. සෙසු ජාතිවල වනාහි පාරමිතාවෝද උපපාරමිතාවෝද සුදුසු පරිද්දෙන් දතයුත්තාහ.

"නෙක්ඛම්මෙ පාරමිං ගතෙඛා" යනුවෙන් ත්‍රිවිධවූ මහා නිෂ්ක්‍රමණයෙහි පාරප්‍රාප්තව යනු දක්වයි. එහි සුධාභෝජන කාලයෙහිද සොමනස්ස කුමාර කාලයෙහිදැයි මේහි ප්‍රකාශව ආ තන්හිද මෙහි ප්‍රකාශව නො ආ භයනිපාල කුමාර කාලයෙහිද මඛාදෙව කාලයෙහිදැයි මේ ආදිවූ මහරජය අත්හැර නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පූරනලද අත්බැව්හි ප්‍රමාණයක් නම් නැත. නියත වශයෙන් වනාහි චූලසුතසෝම කාලයෙහි:-

253. "මහාරජ්ජං හත්ථගතං ඛෙළපිණ්ඩංව ඡඩ්ඩියිං
චජතො න හොති ලගඝං එසා මෙ නෙක්ඛම්මපාරමී"යි

(අතට පත් මහරජය කෙළ පිඬක්මෙන් දුරු කෙළෙමි. පරිත්‍යාග කරන්නාවූ මට එහි ඇල්මෙක් නම් නොවීය. මෝ නොමෝ මාගේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතා නමි)යි.

මෙසේ ඇලුම් නැති බැවින් රජය හැර නික්මෙන්නාවූ බෝ සතුන්ගේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතා නොමෝ පරමාර්ථ පාරමී නමිවූ සෙසු ජාතිවල පාරමිතාවෝද උපපාරමිතාවෝද සුදුසු පරිදෙන් දතයුත්තාහුය.

"පණ්ඩිතෙන පරිපුච්ඡිතබ්බා" යන්නෙහි 'කිං කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං" යනාදීන් කුශලකර්ම විභාගයද, කර්ම, කර්මඵල විභාගයද, සත්ත්වයන්ට උපකාර ඵළවන්නාවූ නිර්දෝෂවූ කර්මායතන, ශිල්පායතන විද්‍යාස්ථානාදියද, පණ්ඩිත යන් (නුවණැත්තන්) විචාරා යනු අර්ථයි. මෙයින් ප්‍රඥාපාරමිතාව දක්වයි. එහි විධුර පණ්ඩිත කාලයෙහිය, මහා ගොවින්ද පණ්ඩිත කාලයෙහිය, කුද්දාල පණ්ඩිත කාලයෙහිය, අරක පණ්ඩිත කාලයෙහිය, බෝධි පරිබ්‍රාජක කාලයෙහිය, මහෞෂධ පණ්ඩිත කාලයෙහියයි මේ ආදිවූ ප්‍රඥාපාරමිතාව පිරූ අත්බැව්හි ප්‍රමාණයක් නම් නැත. එකාන්තයෙන් වනාහි සෙතක පණ්ඩිත කාලයෙහි:-

254. "පඤ්ඤාය විචිනනෙනාහං බ්‍රාහ්මණං මොචයිං දුඛා,
පඤ්ඤාය මෙ සමොහත්ථි එසා මෙ පඤ්ඤාපාරමී"

ප්‍රඥාවෙන් පරීක්ෂාකර බලන්නාවූ මම බඹුණා දුකින් මිදුවෙමි. ප්‍රඥාවෙන් මා හා තුල්‍යවූවෙක් නැත. මෝ නොමෝ මාගේ ප්‍රඥා

පාරමිතානම්. මෙසේ පසුම්බිය තුළටවත් නාගයා දක්වන්නාවූ බෝසතුන්ගේ ප්‍රඥාපාරමී තොමෝ පරමාර්ථ පාරමී නම්වූ.

"විරියං කත්වාන උත්තමං" යනු සම්‍යක් සම්බොධියට පමුණුවන්ට සමර්ථ බැවින් උත්තමවූ (ප්‍රධානවූ) විවිධවූ වීර්‍යපාරමිතාව ගත අර්ථයි. එහි මහාසිලව රාජකාලයෙහිද, පඤ්චාවුධ කුමාර කාලයෙහිද, මහා වානරෙන්ද්‍ර කාලයෙහිදැයි මේ ආදිවූ වීර්‍ය පාරමිතාව පිරූ අත්බැව්හි ප්‍රමාණයක් නම් නැත. එකානන්‍ය යෙන් වනාහි උත්වහන්සේ මහාජනක කාලයෙහි:—

255. "අතිරදයසි ජලමජ්ඣෙ හතා සබ්බෙව මානුසා,
චිත්තස්ස අඤ්ඤථා නත්ථි එසා මෙ විරියපාරමී"සි

තෙර නොදක්නාවූ සයුර මැද මා හා කැටිව මුහුදට පැමිණි සියලු මිනිස්සු නටහ. මාගේ චිත්තයෙහි අන්‍යප්‍රකාරයක් හෙවත් නොපිහිනිය හෙමියි සිතෙක් මට නුවූයේය. මෝ තොමෝ මාගේ වීර්‍යපාරමිතා නම්.

මෙසේ මහා සමුද්‍රය තරණය කරන්නාවූ බෝසතාණන් වහන්සේගේ වීර්‍ය පාරමිතා තොමෝ පරමාර්ථ පාරමී නම්වූ.

"ඛන්තියා පාරමිං ගන්ත්වා" යන්නෙහි අධිවාසනක්ෂාන්ති ආදී ක්ෂාන්තියෙහි පාරප්‍රාප්තව ගත අර්ථයි එහි මහා කපි කාල යෙහිද, මිඤ්ඡරාජ කාලයෙහිද, රුරුමිග රාජකාලයෙහිද, ධම්ම දිව්‍යපුත්‍ර කාලයෙහිදැයි මේ ආදී ක්ෂාන්ති පාරමිතාව පිරූ ආත්ම භාවයන්ගේ ප්‍රමාණයක් නම් නැත. නියත වශයෙන් වනාහි උත්වහන්සේ ක්ෂාන්තිවාදී කාලයෙහි:-

256. "අවෙතනං ව කොට්ටෙන්තෙ තික්ඛෙන එරයුතා මමං
කාසිරාජෙ න කුපයාමි එසා මෙ ඛන්ති පාරමී"

මෙසේ අවෙතන භාවයෙන් මහත් දුක් අනුභව කරන්නහුගේ ක්ෂාන්තිපාරමිතා තොමෝ පරමාර්ථ පාරමී නම්වූ.

'කත්වාදළ්හ මධිට්ඨානං" යන්නෙහි කුශල ධර්ම සමාදානාධිෂ්ඨානය (ඒ ඒ පාරමිතා සමාදානයාගේ හා ඊට උපකාර ධර්ම යන්ගේ සමාදානයාගේද අධිෂ්ඨානය) ඉතා දැඩිකොට, ලිහිල් නොකොට අනිවර්තනාභාවයෙන් ඉටා ගත අර්ථයි. එහි ජෝති පාල කාලයෙහිද, සරභංග කාලයෙහිද, නිමිරාජකාල යෙහිදැයි

මේ ආදි අධිෂ්ඨාන පාරමිතාව පිරූ අත්බැවිනි ප්‍රමාණයක් නම් නැත. එකානන්නයෙන් වනාහි උන්වහන්සේ තෙමිය කුමාර කාලයෙහි:-

257. "මාතාපිතා නමේදෙසුඃ න පිමේදෙසුං මහායසං,
සබ්බඤ්ඤුතං පියං මයාං තසමා වතමධිට්ඨහිං".

මෙසේ දිවිපුදා ව්‍රතාධිෂ්ඨාන කරන්නාවූ බෝසතුන්ගේ අධිෂ්ඨාන පාරමිතා තොමෝ පරමාර්ථ පාරමිතාවූවා.

"සච්චවාචානුරක්ඛිය" යනු සැබවස රැක ජීවිතාන්තරාය යක් ඇතිකල්හිදු අනායර්‍ය්‍ය ව්‍යවහාරය දශුවියක් මෙන් පිළිකුල් කෙරෙමින් දුරුකොට සම්ප්‍රකාරයෙන්ම අවිසංවාදි බව රැක යන අර්ථයි. එහි ඤපිරාජ කාලයෙහිද, සච්චතාපස කාලයෙහිද, මතස්‍ය රාජ කාලයෙහිදැයි මේ ආදි සත්‍යපාරමිතාව පිරූ අත් බැවිහි ප්‍රමාණයක් නම් නැත. එකානන්නයෙන් වනාහි උන්වහන්සේ මහා සුතසෝම කාලයෙහි:-

258. "සච්චවාචාවං අනුරක්ඛන්තෙනා වජිතා මම ජීවිතං,
මොචෙසිං එකං සතං ඛත්තෙ පරමිම්ථ සච්චපාරමී"සි

(සත්‍ය වචනය රක්නෙමි මාගේ දිවිපුදා එක්සියයක් රජවරු මිදුවෙමි. මේ මාගේ පරමාර්ථ සත්‍ය පාරමිතා නම්.) මෙසේ දිවිපුදා සැබවස රක්නාහුගේ සත්‍ය පාරමිතා තොමෝ පරමාර්ථ පාරමී නම්වූවා.

"මෙත්තායය පාරමිං ගතඤා" යනු සියලු සත්ත්වයන් කෙරෙහි හිමි නැතිව හිත වැඩ එළවීම ලක්ෂණ කොට ඇති මෛත්‍රියගේ පරතෙරට පැමිණ යන අර්ථයි. එහි චූල ධම්පාල කාලයෙහිද, මහා සීලව රාජකාලයෙහිද, සාම පණ්ඩිත කාල යෙහිදැයි මේ ආදි මෛත්‍රී පාරමිතාව පිරූ අත්බැවිහි ප්‍රමාණයක් නම් නැත. නියත වශයෙන් වනාහි උන්වහන්සේ එක රාජ කාලයෙහි:-

259. "න මං කොචි උත්තසති නපිහං භායාමි කස්සචි,
මේත්තා බලෙනුපත්ථඩෝ රමාමි පවතෙ තදා."සි

මෙසේ ජීවිතය නොබලා මෛත්‍රී වඩන්නහුගේ මෛත්‍රී පාරමිතා තොමෝ පරමාර්ථ පාරමී නම්වූවා.

"සම්මානනාව මානනෙ" යනු සකස්කොට පූජා සත්කාරාදියෙන් බුහුමන් කිරීමෙහිද, වෙර කෙළ ගැසීම්ආදියෙන් අවමන් කිරීමෙහිද, හැම ලොදහමෙහිද, සම්ව සමසිත් ඇතිව නිර්කාරව උපතම්වූ නිරුත්තාරවූ බුදුබවට පැමිණියෙමි යන අර්ථයි. එහි වානරින්ද කාලයෙහිද, කාසිරාජ කාලයෙහිද, ක්ෂේම බ්‍රාහ්මණ කාලයෙහිද, අවිඩිසෙත තම් පරිබ්‍රාජක කාලයෙහිදැයි මේ ආදි උපෙක්ෂා පාරමිතාව පිරූ ආත්මභාවයන්ගේ ප්‍රමාණයක් නම් නැත. එකානානාසයන් වසාහි උන් එහත්සේ මහා ලොමහංස කාලයෙහි:-

260. "සුත්තෙ සෙය්‍යං කපෙමි ඡවච්ඡිං උපධායහං,
ගොමණ්ඩලා උපාගතන්වා රූපං දස්සෙසන්ති නපජකං"යි

මම මිනි ඇට භිස්කන්වයින් කොට සොහොතෙහි සයනය කරමි. ගොපල්ලු දරුවෝ අවුත් සන්වැදුරුම් විසුළු රූ දක්වති. මෙසේ ගම්දරුවන් ඇහ කෙළ ගැසීම ආදියෙන් හා මල්ගඳ විලවුන් එළවීම වශයෙන් සුවදුක් උපදවන කල්හිදු උපෙක්ෂාව (සම්ප්‍රවෘත්තිය) නො ඉක්මවන්නාවූ බොසතුන්ගේ උපෙක්ෂා පාරමිතා තොමෝ පරමාර්ථ පාරමී නම්වූ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සන්වැදුරුම්වූ දුක් හා සන්වැදුරුම්වූ සුවද කුදු මහත් භවයන්හි අනුභවකොට සම්‍යක් සම්බොධි සමධිගමය පිණිස මේ මහා භද්‍රකල්පයෙහි තමන් වහන්සේ විසින් කරතලද දුෂ්කරවර්‍යාව සංක්ෂෙපයෙන් වදාරා නැවත,

"දත්වා දුතපබ්බකං දුතං - පෙ - පත්තෙනා සම්බොධි මුත්තමං"යි

තමන් වහන්සේ විසින් මනාකොට පුරතලද දසපාරමීන් දක්වත්. මෙතැන්සිට මහා බොධියාන ප්‍රතිපත්තියෙහිලා ජාත උත්සාහ ඇති කුලපුත්‍රයන්ට බොධිසම්භාර ධර්මයන්හි හා හා ප්‍රකාර කෞශල්‍යය පිණිස පාරමී ධර්මයන්හි ප්‍රකීර්ණක කථා තොමෝ කිය යුත්තිය.

එහි මේ ප්‍රශ්න කථිතයි:—

(1) ඒ පාරමිතාවෝ නම් කවරහුද?

(2) කවර අර්ථයකින් පාරමිහු නම් වේද්ද?

(3) බුදුහු කෙතෙක් වැදෑරුම් වේද්ද?

(4) බුදුන්ගේ ක්‍රමය කවරේද?

(5) ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථානයෝ කවරහුද?

(6) බුදුන්ගේ ප්‍රත්‍යය කවරේද?

(7) බුදුන්ගේ සංකෙලෙසය කවරේද?

(8) බුදුන්ගේ ව්‍යවදානය (පිරිසිදුවීම) කවරේද?

(9) බුදුන්ට ප්‍රතිපක්ෂ ධර්මය කවරේද?

(10) බුදුන්ගේ ප්‍රතිපදාව කවරේද?

(11) බුදුන්ගේ විභාගය කවරේද?

(12) බුදුන්ගේ සංග්‍රහය කවරේද?

(13) බුදුන්ගේ සම්පාදනොපාය කවරේද?

(14) කෙතෙක් කලකින් බුදුන්ගේ සම්පාදනය වේද?

(15) බුදුන්ගේ ආනිසංසය කවරේද?

(16) බුදුන්ගේ ඵලය කවරේද?

ඒ ප්‍රශ්න කථායෙහි මේ මතු පහළ වන්නේ විසර්ජිතයයි. (1) "පාරමිතාවෝ නම් කවරහුද" යන ප්‍රශ්නයෙහි තෘෂ්ණාය, මානය, දෘෂ්ටිය, යන කෙලෙසුන්ගෙන් තොමැඩුනාවූ සර්වඥතුඥාණ කෙරෙහි පතළාවූ කරුණාවෙන් හා උපාය කෞශල්‍යයයි කියනලද දානාදීන්ගේ බෝධි සම්භාර භාවයට නිමිත්ත භූතවූ ඥානයෙන් පරිශෝධිතවූ (භාග්‍යයෙන් රක්නාලද) දානාදි ගුණයෝ පාරමිහු නම් වෙති.

(2) "කවර අර්ථයකින් පාරමිහු නම් වෙද්ද?" (I.) යන ප්‍රශ්නයෙහි දානශීලාදි ගුණ විශෙෂ යොගය හෙතු කොටගෙන සත්ත්වොත්තමත්වය බැවින් මහා සත්ත්ව නම්වූ බොධිසත්ත්වයෝ පරමයහ. උන් වහන්සේලාගේ භාව හෝ උත්වහන්සේලාගේ කම් පාරමිතම් වේ. දානාදි ක්‍රියාවෝය. (උතුමාඨ වාචක

පරම ශබ්දයා කෙරෙත් තද්ධිතයෙහි "ණ" ප්‍රත්‍යයව සිඹ පාරම ශබ්දය කෙරෙත් සත්‍රී අර්ථයෙහි "ඊ" ප්‍රත්‍යයවූ තැනි.) (II.) නොහොත් පුරානුයි පරම නම්. දානාදි ගුණ විශෙෂයන් පුරත් තේනුයි රකින්තේනුයි බෝසත්හු පරම නම්හ. පරමයාගේ ගුණය හෝ සවභාවය හෝ කම්ය පාරමී නම්වේ. දානාදි ක්‍රියාවෝ මැයි. (පුර-පාලන පූරණෙසු යන ධාතුහු කෙරෙත් කතෘකාරකයෙහි "ම්" ප්‍රත්‍යයව සිඹවූතැනි) (නොහොත් ගුණ විශෙෂ යොගය කරණකොටගෙන සෙසු සත්ත්වයන් තමන් කෙරෙහි බැඳගනිනුයි මහා සත්ත්වයෝ "පරම" නම්හ. (පර ශබ්දෙප පද "මථ-මථෙතෙ" යන ධාතුවෙන් සිඹවූ තැනි) සංකෙලශ මලයෙන් අත්‍යන්තයෙන්, ඉතා අධිකව පිරිසිදුවේනුයි හෝ මහා සත්ත්වයෝ "පරම" නම්හ. (පරං යනු උපපදකොට ඇති "මජ්ජ-සුද්ධියං" යන ධාතුවෙන් සිඹවූ තැනි.) උත්තමවූ නිර්මාණයට විශෙෂයෙන් පැමිණේනුයි හෝ මහසත්හු "පරම" නම්හ. (පාරං ශබ්දෙප පද මග-ගතියං යන ධාතුවෙන් සිඹවූ තැනි) පරලොව මෙලොව මෙන් ප්‍රමාණවූ ගුණ විශෙෂයෙන් පිරිසිද දනිනුයි හෝ මහ බෝසත්හු පරමනම්හ. (පරං ශබ්දෙප පද මුණ-ඤාණෙ යන ධාතුවෙන් සිඹවූ තැනි.) ප්‍රමාණාතික්‍රාන්තවූ හෝ ඉතා බොහෝවූ ශීලාදී ගුණ සමූහය තමා සතන්හි බහාතුයි හෝ මහ බෝසත්හු පරම නම්හ. (පරං ශබ්දෙප පද මි-පක්ඛිපෙ යන ධාතුවෙන් සිඹවූ තැනි.) ආත්මියයි කියතලද ධර්මකාය යෙන් අන්‍යවූ නොහොත් ඊට ප්‍රතිපක්ෂවූ ඊට අතර්කරවූ කෙලෙස් නමැති සොරුමුල පෙලාතුයි හෝ මහ බෝසත්හු පරම නම්හ. (පර ශබ්දෙප පද මි-හිංසයෝ යන ධාතුවෙන් සිඹවූ තැනි) "උත්තමස්ස අත්ථං" යනාදි තද්ධිතය යට කී නසින් ගෙදිය යුතු:* (III.) පාරයති කියතලද නිවන් අරමුණු කොටගෙන පිරිසිදුවෙයි සත්ත්වයන්ද

---

* "පරධාතු වසා වාපි පරූප පදතෝ පිවා,
මුතෝ තථා මජතොව මයතෝ මුණතොම්තෝ
පුනම්තෝ'ති එතෙහි ධාතූහි බලු සත්තහි,
වදෙ පරම සද්දස්ස නිපථන්තිං ජින සාසතෙ,
උත්තම වාචිපරම සද්දෙන සහඅථෙහි,
පදෙහි පාරමී සද්දං වදෙ තද්ධිත පවවයි." සද්දනීතියි.

පිරි සිදු කෙරෙයි පාරම් නම්වෙයි, එනම් මහාපුරුෂයෝය (ශුද්ධකර්‍ෂා වශයෙන් හා හෙතු කර්‍ෂා වශයෙන් පාර ශබ්දෙප පද මජ්ජ-සුද්ධියං යන ධාතුවෙන් සිද්ධවූ දෙතැනි.) ඒ නිර්‍වාණයෙහි සත්ත්වයන් බදී, යොදයි හෝ පාරම් නම්වේ, පාර ශබ්දෙප පද මථ-මන්ථනෙ යන ධාතුවෙන් සිද්ධවූ තැනි) පාරයයි කියන ලද නිවණට යෙයි පැමිණේනුයි හෝ පාරම් නම්වේ. පාර ශබ්දෙප පද මග-ගතියං යන ධාතුවෙන් සිද්ධවූ තැනි. නිවණට පවුණුවානුයි හෝ පාරම්නම්වේ. (හෙතු කර්ත්‍රර්‍ථයෙහි පාර ශබ්දෙප පද මග-ගතියං යන ධාතුවෙන් සිද්ධවූ තැනි) තතුවූ පරිද්දෙන් නිවන් අවබෝධ කෙරේනුයි හෝ පාරම්නම්වේ. (පාරං පූර්‍ණං කරොති යන ධාතුවෙන් සිද්ධවූ තැනි.) නිර්‍වාණයෙහි සත්ත්වයන් බහාතුයි හෝ පාරම්නම්වේ. (පාර ශබ්දෙප පද මි-පකඛිපෙ යන ධාතුවෙන් සිද්ධවූ තැනි) නිවන් හෙතුවෙන් කෙලෙස් සතුරන් වෙහෙසට පමුණුවානුයි හෝ පාරම්නම්වේ. (පාර ශබ්දෙප පද මි-හිංසනෙ යන ධාතුවෙන් සිද්ධවූ තැනි) එනම් මහා පුරුෂයෝය. උත්වහන්සේලාගේ සවභාවය හෝ කර්‍මය පාරම්නම්. එනම් දානාදි ක්‍රියාවෝය. මේ ක්‍රමයෙන් පාරම්න්ගේ ශබ්දාර්ථ දතයුතු. *

(3) "බ්‍රහ්ම කොතෙක් වැදුරුම් වේද" යන ප්‍රශ්නයෙහි සංඛ්‍යාපයෙන් දශ වැදුරුම් වෙති. බ්‍රහ්ම වනාහි සවරූපයෙන් උපලෙහිම ආවාහුමය. එහෙයින් කිහ.

"විවිතනෙනා තදා දකඛිං පඨමං දානපාරමිං
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං"

"එකල සුමෙධ පණ්ඩිතයෝ බුඩකාරක ධර්‍මයන් සොයන්නෝ පෙර බුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ පළමුවන දානපාරමිතාව දුටහ" යනාදියයි අනික කුදු වදරණලදි. එනම්:-

---

* "පාර සද්දුප පදතො මජතොපි මුතොථව"
මයතොවා මුණතොවා මිතොවා පුතපිමිතො;
එතෙහි ඡහි ධාතුහි මහා පුරිසවාචකං,
පාරම් සද්දම්රෙනති තතො පාරමිතාරවං." සද්දනීති

"කති නු ඛෝ භන්තෙ බුද්ධකාරකා ධම්මා? දස ඛෝ සාරිපුත්ත බුද්ධකාරකා ධම්මා, කත මේ දස? දානං ඛෝ සාරිපුත්ත බුද්ධකාරකෝ ධම්මෝ, සීලං, නෙක්ඛම්මං, පඤ්ඤා, විරියං, ඛන්ති, සච්චං, අධිට්ඨානං, මෙත්තා, උපෙක්ඛා, බුද්ධකාරකෝ ධම්මෝ, ති. ඉමේ ඛෝ සාරිපුත්ත දස බුද්ධකාරකා ධම්මා'ති" (සවාමිනි, භාග්‍යවතුන්වහන්ස, බුදුකාරක ධර්මයෝ කෙතෙක් වේද? ශාරිපුත්‍රයෙනි, බුදුකාරක ධර්මයෝ වනාහි දසදෙනෙක් වෙති, ඔහු දසදෙන කවරහුදැයි:—දානය, ශීලය, නෛෂ්ක්‍රම්‍යය, ප්‍රඥාවය, වීර්‍යය, ක්ෂාන්තිය, සත්‍යය, අධිෂ්ඨානය, මෛත්‍රිය, උපේක්ෂාවය, යන මොහුයි. (බුදුකාරක ධර්මයෝ නම් පාරමිතාවෝමැයි) අනික කුදු වදරණලදි:-

"දානං සීලාව නෙක්ඛම්මං පඤ්ඤා විරියෙන පඤ්චමං
ඛන්ති සච්ච මධිට්ඨානං මෙත්තුපෙක්ඛාති මා දස"

යනුවෙන් (1) දානපාරමිතාවය, (2) සීලපාරමිතාවය, (3) නෙක්ඛම්මපාරමිතාවය, (4) පඤ්ඤාපාරමිතාවය, (5) විරියපාරමිතාවය, (6) ඛන්තිපාරමිතාවය, (7) සච්චපාරමිතාවය, (8) අධිට්ඨානපාරමිතාවය, (9) මෛත්‍රීපාරමිතාවය, (10) උපෙක්ඛාපාරමිතාවය යන මොහු දසපාරමිහු නම් වෙති"යි.

සමහර කෙනෙක් පාරමිහු සවැදුරුම් යයිද කියත්. ඒ වනාහි දස පාරමිතාවන්ගේ සංග්‍රහ වශයෙන් කියනලදි. ඒ සංග්‍රහය මිතු පහළ වන්නේය.

(4) "ඔවුන්ගේ ක්‍රමය කවරේද" යන ප්‍රශ්නයෙහි ක්‍රමය නම් දෙශනා ක්‍රමයයි. හෙවත් "පඨමං දානපාරමිං, දුතියං සීලපාරමිං, යනාදීන් ආ බුදුන්වදුළ නියාවයි, හේ වනාහි පඨම සමාදාන හෙතුකොට සමාදානං පච්චය හෙතුකං"යි ආදීන්ගේ මූලදී (දීපංකරාබුදුන් පා මූලදී) සොයා ගත්තාලද්දේද, සමාදන්වත ලද්දේද, එසේම දෙසත ලද්දේය. එහි දානපාරමිතාව වනාහි සීලපාරමිතාවට බොහෝ උපකාර ඇත්තේයයිද සුවසේ පිරිය හැක්කේයයිද පළමුව වදරණලදි. තවද දානපාරමිතාව ශීලයෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ මහත් ඵලවන්තේය. මහානිසංස වන්තේයයි දානයට අනතුරුව ශීලය වදරණලදි.

ශීලපාරමිතාව නෛෂ්ක්‍රම්‍යයෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ, නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව ප්‍රඥාවෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ, ප්‍රඥාපාරමිතාව වීර්‍යයෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ, වීර්‍යපාරමිතාව ක්ෂාන්තියෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ, ක්ෂාන්තිපාරමිතාව සත්‍යයෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ, සත්‍යපාරමිතාව අධිෂ්ඨානයෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ, අධිෂ්ඨාන පාරමිතාව මෛත්‍රියෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ, මෛත්‍රීපාරමිතාව උපෙක්ෂාවෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේ මහත් ඵලවත්තේය, මහානිසංස වන්නේයයි මෛත්‍රී පාරමිතාවට අනතුරුව උපෙක්ෂා පාරමිතාව වදාරණ ලද්දේය. උපෙක්ෂා පාරමිතාව වනාහි කරුණාවෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේයයිද, කරුණාව උපෙක්ෂාවෙන් හාත්පසින් අල්වාගත්තා ලද්දේයයි දතයුතු. මහා කාරුණිකවූ බොධිසත්ත්වයෝ වනාහි කෙසේ නම් සත්ත්වයන් කෙරෙහි උපෙක්ෂා වත්තෝද? උපෙක්ෂා කළයුත්තන් කෙරෙහි මදකලක් උපෙක්ෂක වූවාහුවෙත්, සියලුතන්හිම සියලු කල්හිම උපෙක්ෂක වූවාහු නොවෙත්යයි සමහර කෙනෙක් කියත්. අන්‍යයෝ වනාහි සත්ත්වයන් කෙරෙහි උපෙක්ෂා කරන්නාහු සත්ත්වයන් විසින් කළ විප්‍රකාරයන්හි උපෙක්ෂක වන්නාහුයයි කියත්.

එහි තවත් ක්‍රමයක් නම්, බොහෝ දෙනා අතර පැවතිම හෙතුකොට ගෙනද සියලු සත්ත්වයන්ට සාධාරණ (පොදු) හෙයින්ද අල්පවූ විපාක ඇති බැවින්ද සුවසේ කටහැකි බැවින්ද පළමුකොට දානපාරමිතාව වදාරණ ලදී.

ශීලපාරමිතාව කරණ කොට ගෙන දායක ප්‍රතිග්‍රාහක දෙපක්ෂයගේ ශුද්ධිය වන හෙයින් පරානුග්‍රහය කියා පරපීඩා වැළැක්ම කි හෙයින්ද, ක්‍රිරියා ධර්මය කියා අක්‍රිරියා ධර්මය කි හෙයින්ද හොඟ සම්පත්ති හෙතුව කියා භවසම්පත්ති හෙතුව කිහෙයින්ද දානයට අනතුරුව ශීලය වදාරණ ලදී.

නෛෂ්ක්‍රම්‍යයෙන් ශීලසම්පත්තිය සිඛවන හෙයින්ද කාය වාක් සුචරිතය කියා මනස්සුචරිතය කි හෙයින්ද, පිරිසිදු සිල් ඇත්තාහට සුවෙන්ම ධ්‍යානය සමාධිවන හෙයින් කර්මාපරාධ ප්‍රහාණයෙන් ප්‍රයොග ශුද්ධියද කියා ක්ලේශාපරාධ ප්‍රහාණයෙන් ආශය ශුද්ධිය කි හෙයින්ද, ව්‍යතික්‍රමණ ප්‍රහාණයෙන් චිත්තයාගේ

පස්සුපසථාන ප්‍රභාණය කි හෙයින්ද, ශීලයට අනතුරුව නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව වදරණ ලදී.

ප්‍රඥාවෙන් නෛෂ්ක්‍රම්‍යයාගේ සිඹීය පරිශුඛවත හෙයින් ධ්‍යානයක් නැති කල්හි ප්‍රඥාවක් නැතැයි කි හෙයින්ද, ප්‍රඥාව සම්‍යිය වැටහීම් කොට ඇත්තේය, ප්‍රඥාව සම්‍යිය පදසථාන කොට ඇත්තේය, ප්‍රඥාව සම්‍යිය ප්‍රත්‍යුපසථාන කොට ඇත්තේ යයි සම්‍යි නිමිත්ත කියා උපෙක්ෂාවට නිමිත්ත කි හෙයින්ද පරවැඩ පිණිස පැවති කරුණෝපාය කෞශල්‍යය කි හෙයින්ද, නෛෂ්ක්‍රම්‍යයට අනතුරුව ප්‍රඥාව වදරණ ලදී.

වීර්‍යාරම්භයෙන් ප්‍රඥාවගේ කෘතය සිඹවත හෙයින්ද, සත්ව ශූන්‍යතා ධර්‍ම නිඛ්‍යාන ඥානනිය කියා සත්වයන්ට හිත පිණිස ආරම්භයාගේ සත්‍යක්‍රියා භාවය කිහෙයින්ද, උපෙක්ෂාවට නිමිත්ත කියා ප්‍රග්‍රහ නිමිත්ත කි හෙයින්ද පරීක්ෂාකොට කරන සුළුබව කියා උථථාන වීර්‍යය කි හෙයින්ද, පරීක්ෂාකොට කරන සුළු තැතැත්තාගේ තැති සිටි වීර්‍යය ඵල විශෙෂ ඵළවානුයි ප්‍රඥාවට අනතුරුව වීර්‍යය වදරණ ලදී.

වීර්‍යයෙන් පරාපකාර සහනය සිඛ වන හෙයින්ද, වීර්‍යය ඇත්තේ වනාහි පටන්ගත් වීර්‍යය නිසා සත්ව සංස්කාරයන් විසින් ඵළවන ලද දුක මැඩපවත්වා වාසය කෙරෙයි, වීර්‍යය ඉවසිම අලංකාරකොට ඇති බැවින් වීර්‍යය ඇත්තාහුගේ ඉවසිම හොඛනේයයි ප්‍රග්‍රහ නිමිත්ත කියා සමථ නිමිත්ත කි හෙයින්ද, අත්‍යාරම්භයෙන් ඖධත්‍යයාගේ දෙෂප්‍රහාණය කි හෙයින්ද, ධර්මනිඛ්‍යාන ඥානනියෙන් වනාහි ඖධත්‍ය දෙෂය ප්‍රහීණ වෙයි, වීර්‍යය ඇත්තහුට සාක්ෂාත් කිරීම කි හෙයින්ද, ඥානනිය බහුල කොට ඇත්තේ ඖධත්‍යයට කොපැමිණ සාක්ෂාත් කරන්නේ වෙයි, අප්‍රමාද වූවහුට අනුන්ට වැඛකිරීමෙහි ප්‍රත්‍යුපකාර තෘෂ්ණාව නැති බව කි හෙයින්ද, ඇතිසැටියෙන් ධර්‍ම නිඛ්‍යානය ඇතිකල තෘෂ්ණාවක් නොවෙයි, අනුන්ට හිතවැඩ කිරීමට පටන් ගැණීම වෙයි. පරමයන් විසින් මෙරමා විසින් කරණලද දුක් ඉවසිම කෙරෙනු ලැබේයයි කි හෙයින් වීර්‍යයට අනතුරුව ඥානනිය වදරණ ලදී.

සත්‍යය කරණකොටගෙන ක්ෂාන්තියගේ බොහෝකල් පැවැත්ම වත හෙයින්ද, අපකාරකාරීහුගේ අපකාරී ක්ෂාන්තිය කියා ඔහුට උපකාර කිරීමෙහි විසංකෙත නොවීම කිහෙයින්ද, ක්ෂාන්තියෙන් අපවාද වචන ක්‍රමපතය කොට සත්‍යවාදී භාවය අත්හෙළාහැරීම කිහෙයින් ද, සත්‍ය ශූන්‍යතා ධර්මනිධ්‍යාන ක්ෂාන්තිය වදරා ඔහු විසින් වඩනලද ඥානසත්‍යය වදළහෙයින්ද, ක්ෂාන්තියට අනතුරුව සත්‍යය වදරණලදී.

අධිෂ්ඨානය කරණකොටගෙන සත්‍යය සිඩවන හෙයින්ද, නිශ්චල අධිෂ්ඨානයෙන් යුක්තවූවහුටම විරතිය සිඩවේයයි අවිසංවාදිභාවය වදරා එහි නිශ්චල භාවය කිහෙයින්ද, සත්‍යයෙන් සත්‍යය ගළපන තැනැත්තේම දානාදියෙහි ප්‍රතිඥානුරූපව නිශ්චලවම පවතීයයි ඥාන සත්‍ය දෙදෙන වදරා බෝධි සම්භාර ධර්මයන්හි ප්‍රවෘත්ති නිෂ්ඨානය කිහෙයින්ද, යථාභූත ඥානයෙන් යුක්තාවූවෝම බෝධි සම්භාර ධර්මයන් අධිෂ්ඨාන කෙරෙති. ඒ ධර්මයන්ද ප්‍රතිපක්ෂයන් කෙරෙන් ක්‍රමපතය විමක් නැති බැවින් කොට නිමවයි සත්‍යයට අනතුරුව අධිෂ්ඨානය වදරණලදී.

මෛත්‍රිය කරණ කොටගෙන අනුන්ට වැඩ කිරීමෙහි සමාදානා තිෂ්ඨානය සිඩවන හෙයින් අධිෂ්ඨානය වදරා බෝධි සම්භාරයන් හේතුකොට ගෙන හිත එළවීම කිහෙයින් එහි සිවින්නේ මෛත්‍රී විහරණ ඇත්තේවේ නිශ්චල අධිෂ්ඨානයෙන් යුක්තවූ වහුගේ සමාදානයාගේ කොපනය නොකිරී මෙන් සමාදානය සිඩවන හෙයින් අධිෂ්ඨානයට අනතුරුව මෛත්‍රිය වදරණලදී.

උපෙක්ෂාව හෙතුකොටගෙන මෛත්‍රිය විශුඩවන හෙයින්ද සත්ත්වයන් කෙරෙහි හිතෝප සංහාරය වදරා ඔවුන් විසින් කරන ලද අපරාධයෙහි උදාසීන භාවය වදළ හෙයින්ද මෛත්‍රී භාවනාව වදරා තන්නිඃශ්‍යන්ද භාවනාව වදළහෙයින්ද, හිත කැමැත්තාවූ සත්ත්වයන් කෙරෙහිද උපෙක්ෂා ඇත්තේයයි ආශ්චර්‍ය්‍ය ගුණ ඇති බව වදළ හෙයින්ද මෛත්‍රියට අනතුරුව උපෙක්ෂාව වදරණලදී. මෙසේ මේ පාරමී ධර්මයන්ගේ දෙශනා·ක්‍රමය දත යුතු

5. "ලක්ඛණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථානතෝ කථරහුද" යන ප්‍රශ්නයෙහි සාමාන්‍යයෙන් පාරමිතා මෙරමාහට අනුග්‍රහ කිරීම ලක්ෂණ (සාමාන්‍ය සුභාව) කොට ඇත්තාහ. අනුන්ගේ උපකාර කිරීම හෝ කම්පිත නොවීම රස (හෙවත් කෘත්‍යය හෝ සම්පත්) කොට ඇත්තාහ. හිතෛෂි භාවය හෝ බුඩත්වය ප්‍රත්‍යුපස්ථාන (වැටහෙන ආකාරය හෝ ඵලය) කොට ඇත්තාහ. මහා කරුණාව හෝ කරුණාව හා උපාය කෞශල්‍ය ඥානය පදස්ථාන (ආසන්න කාරණය) කොට ඇත්තාහ. විශෙෂයෙන් වනාහි යම් හෙයකින් කරුණාව හා උපාය කෞශල්‍යයෙන් පිරිසිදහත්තාලද ආත්මෝපකරණ (තමාගේ ජීවිතය හා උප කරණයන්) පරිත්‍යාග වෙතනාව දානපාරමිතා නම්වේද, කරුණාව හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිද හත්තාලද කායවාක් සුචරිතය අවිවශයෙන් අකර්තව්‍ය (නොකටයුතු) ප්‍රාණවධාදි දුශ්චරිත) යෙන් වැළකීම හා කතීව්‍ය කරණ වෙත නාදිහු ශීලපාරමිතා නම්වෙද්ද, කරුණාව හා උපාය කෞශල්‍ය යෙන් පිරිසිද හත්තාලද ආදීනව දැක්ම පෙරදැරිව කාමයෙන් හා භවයෙන් නික්මෙන්නාවූ චිත්තෝත්පාදය නෛෂ්ක්‍රම්‍ය පාර මිතා නම්වේද, කරුණාව හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරි සිද හත්තාලද නාම රූප ධර්මයන්ගේ සාමාන්‍ය ලක්ෂණාව බොධ්‍ය හෙවත් (අනිත්‍ය දුඃඛ අනාත්මතාව) හා විශෙෂ ලක්ෂ ණාව බොධය ප්‍රඥාපාරමිතා නම්වේද, කරුණාව හා උපාය කෞ ශල්‍ය ඥානයෙන් පිරිසිද හත්තාලද්දාවූ කයින් හා සිතින් පර හට වැඩ කිරීමෙහි පැවැත්තාවූ උත්සාහය වීර්‍යපාරමිතා නම් වේද, කරුණාව හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිද හත්තා ලද සත්ත්වයන් හා සංස්කාරයන් විසින් කරනලද අපරාධයන් ඉවසිම හෙවත් එසේ ඉවසිම් වශයෙන් පැවැත්තාවූ අවෙෂය ප්‍රධානකොට ඇති චිත්තෝත්පාදය ක්ෂාන්තිපාරමිතා නම්වේද, කරුණාව හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිද හත්තාලද විරති වෙතනාදී ප්‍රභෙද ඇති අවිසංවාදනය (සියලු අනාර්‍ය ව්‍යවහාරයන්ගේ අකරණය) සත්‍යපාරමිතා නම්වේද, කරු ණාව හා උපාය කෞශල්‍ය යෙන් පිරිසිද හත්තාලද අචල සමාදානාධිෂ්ඨානය (සමාදන්වනලද දානාදි ධර්මයන් කෙරෙහි නිශ්චල පිහිටීම) හා තදාකාර ප්‍රවෘත්ත චිත්තෝත්පාදය අධිෂ්ඨාන පාරමිතා නම්වේද, කරුණාව හා උපාය කෞශල්‍ය ඥානයෙන්

පිරිසිඳ ගන්නා ලද ලොවට හිතසැප එළවීම පරමාර්ථ වශයෙන් අව්‍යාපාදය (වෙහෙසොකිරීම) මෛත්‍රීපාරමිතා නම්වේද, කරුණාව හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද (සුවපත්‍ විපත්‍තියන් විෂයෙහි) ආලය හා ක්‍රෝධය යන දෙකම නසන්නාවූ තමහට ප්‍රියවූද, අප්‍රියවූද සත්ත්ව සංස්කාරයන් කෙරෙහි සම පැවැත්ම උපෙක්ෂා පාරමිතා නම්වේද, එහෙයින් දානපාරමිතාව පරිත්‍යාග කිරීම ලක්ෂණකොට ඇත්තේය, දෙය ධර්මයෙහි ලොභය දුරුකිරීම රසකොට ඇත්තේය. වස්තුවෙහි නොඇල්ම හෝ භව විභව සම්පත් ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය. පරිත්‍යාග කටයුතු වස්තුව පදස්ථානකොට ඇත්තේය.

ශීල පාරමිතාව සීලනය (කය වචන දෙක සුරැකිව තබා ගැන්ම) ලක්ෂණ කොට ඇත්තේය. සමාධානය හෙවත් මනා කොට පිහිටුවීම (එනම් කාය කර්මාදීන් නොවිසිර පවත්වන බවයි, ශීල-සමාධිමහි යන ධාතුයි.) හෝ ප්‍රතිෂ්ඨානය හෙවත් කුශල ධර්මයන්ට ආධාරබව (ශීල-උපධාරණෙ යන ධාතුයි) ලක්ෂණ යයි කියන ලද්දේ වෙහි, දුස්සීල බව නැසීම හෝ නිරවද්‍ය බව රසකොට ඇත්තේය. කායාදීන්ගේ පරිසිදු බව හෝ හිරි ඔතප් දෙක පදස්ථානකොට ඇත්තේය.

නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව කාමයෙන් හා භවයෙන්ද නික්මීම ලක්ෂණකොට ඇත්තේය, ඒ කාමයෙහි හා භවයෙහි ආදීනව දැක්ම රසකොට ඇත්තේය. ඒ කාමයන්ට හා භවයන්ට විමුඛබව (පිටුපාන බව) ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය. සංවේගය පදස්ථාන කොට ඇත්තේය.

ප්‍රඥාපාරමිතාව යථාසභාව ප්‍රතිවේධය හෝ දක්‍ෂවූ දුනු වායක්හු විසින් විදින ලද ශරවේධයක් මෙන් අස්ඛලිත (නොපැකිළ) ප්‍රතිවේධය ලක්ෂණකොට ඇත්තේය. ප්‍රදීපයක් මෙන් ගොවරවූ ධර්මයන්ගේ බැබලීම (ප්‍රකට කිරීම) රසකොට ඇත්තේය. වතුරට ගිය සුවදෙශිකයකු මෙන් මුළා නොවීම පත්‍යුපස්ථානකොට ඇත්තේය. සමාධිය (සිතේ එකඟකම) හෝ චතුස්සත්‍යය පද ස්ථානකොට ඇත්තේය.

වීර්‍යපාරමිතාව උත්සාහය ලක්ෂණකොට ඇත්තේය. උපස්තම්භනය (සිතට අනුබලදීම) රසකොට ඇත්තේය. නොපසුබැස්ම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. වීර්‍යාරම්භවස්තු හෝ සංවේගය පදස්ථානකොට ඇත්තේය.

ක්ෂාන්තිපාරමිතාව ඉවසීම ලක්ෂණකොට ඇත්තේය ඉෂ්ට, නිෂ්ට ධර්මයන් සහනය කිරීම රසකොට ඇත්තේය. ඉවසීම හෝ අවිරෝධය ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය. යථාභූත ඥාන දර්ශනය (තතුවූ පරිද්දෙන් දැක්ම) පදස්ථානකොට ඇත්තේය.

සත්‍ය පාරමිතාව අවිසංවාදනය (ප්‍රතිඥ විරෝධය) ලක්ෂණ කොට ඇත්තේය. යථාසභාව විභාවනය (පහළ කිරීම) හෝ සාධුභාවය (වාක්‍රසයෙන් යුක්තබව) රසකොට ඇත්තේය. සුරතභාවය (විනීතබව) පදස්ථානකොට ඇත්තේය.

අධිෂ්ඨාන පාරමිතාව බොධි සම්භාර ධර්මයන්හි පිහිටීම ලක්ෂණ කොට ඇත්තේය. බොධිසම්භාර ධර්මයන්හි ප්‍රතිපක්ෂ ධර්මයන්මැඩ පැවැත්ම රසකොට ඇත්තේය. ඒ බොධි සම්භාරයෙහි නිශ්චල භාවය ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. බොධි සම්භාර ධර්මයන්ම පදස්ථානකොට ඇත්තේය.

මෛත්‍රී පාරමිතාව සත්ත්වයන් කෙරෙහි හිතෑ කාරයෙන් පැවැත්ම ලක්ෂණ කොට ඇත්තේය. සත්ත්වයන් කෙරෙහි හිත එළඹීම හෝ ක්‍රෝධය දුරුකිරීම රසකොට ඇත්තේය. සෞම්‍ය භාවය ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. සත්ත්වයන්ට මනාප බව දැක්ම පදස්ථාන කොට ඇත්තේය.

උපෙක්ෂා පාරමිතාව (පැසසුම් හැරහුම් දෙක්හි) මධ්‍යස්ථා කාරයෙන් පැවැත්ම ලක්ෂණකොට ඇත්තේය සාධාරණ භාවය දැක්ම රසකොට ඇත්තේය. ක්‍රෝධාලය දෙදෙනාගේ සංසිදීම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය කිසිවකු කෙරෙහි ගුණ දෙස් නොතබා කුශලාකුශල කර්මය සවකිය කොට ඇති බව සැලකීම පදස්ථාන කොට ඇත්තේය.

මෙහි වත්තෘ කරුණෝපාය කෞශල්‍යයෙන් පරිගෘහීත බව දානාදීන්ගේ පරිත්‍යාගාදි ලක්ෂණයට විශෙෂණ භාවයෙන් කිය යුතු ඒ එසේමැයි. කරුණෝපාය කෞශල්‍යයෙන් පරිගෘ

කිසාවු දානාදීනු බොධිසත්ත්ව සන්තානයෙහි පැවතියානු දානාදි පාරමීනු නම් වෙති. (සෙසු දානාදි ගුණයෝ පාරමීනු නම් නොවෙති.)

6. "ඔවුන්ගේ ප්‍රත්‍යයකවරේද" යන ප්‍රශ්නයෙහි ප්‍රථම කොටම අනිනිහාරය හෙවත් මූළප්‍රාථිනාව පැරැණි පිරී මෙහි ප්‍රත්‍යය (හෙතුව) වේ. ඒ වනාහි

263 "මනුස්සත්තං ලිඞ්ග සම්පත්ති හෙතුසම්භාර දස්සනං,
පබ්බජ්ජා ගුණ සම්පත්ති අධිකාරෝ ච ඡන්දතා;
අට්ඨ ධම්ම සමොධානා අභිනිහාරෝ සමිජ්ඣති"යි

මෙසේ කියනලද මනුෂ්‍යත්වය භාවය පුරුෂලිඞ්ග සම්පත්තිය, හෙතුසම්පත්තිය, ශාස්තෘන් වහන්සේගේ දැක්මය, ප්‍රව්‍රජ්‍යාවෙහි පිහිටීමය, ගුණසම්පත්තිය, අධිකක්‍රියාව, ඡන්දතාව යන මේ අෂ්ට ධර්මයන්ගේ සම්වධානයෙන් සම්පාදිතව "නිණ්ණාහං තාරෙය්‍යං මුත්තානාහං මොචෙය්‍යං දන්තෙනා දමය්‍යං සන්තෙනා සමය්‍යං අස්සත්ථෝ අස්සාසෙය්‍යං පරිනිබ්බුතෝ පරිනිබ්බාපෙය්‍යං සුද්ධෝ සොධෙය්‍යං බුද්ධෝ බොධෙය්‍යං" (මම සසරින් එතරව සංසතුන්ද එතර කරවම්. මම කෙලෙසුන් කෙරෙන් මිදී සියලු සතුන් මුදවම්. මම දැමී ලොකයාත් දනමය කරම්. මම සැනසී ලොවැස්සන්ද සනසම්. කෙලඹපරි නිර්‍වාණයෙන් පිරිනිවියෙමි සෙසු සත්ත්වයන්ද කෙලෙස් පිරිනිවනින් පිරිනිවම්. මම කෙලෙසුන් කෙරෙන් පිරිසිදුවූයෙමි සෙසු සත්ත්වයන්ද පිරිසිදු කරවම්. මම බුදුව සත්ත්වයන්ට අවබෝධ කරවම්.) යි මෙසේ පැවැත්තාවූ අභිනීහාරයයි හෙවත් මූල ප්‍රණිධියයි. ඒ වනාහි අවිශෙෂයෙන් සියලුම පාරමිතාවන්ට ප්‍රත්‍යය වේ. ඒ අභිනීහාර ප්‍රවෘත්තියෙන් මත්තෙහි පාරමිතාවන්ගේ සෙවීමය, වැටහීමය, සම්දෘෂය, අධිෂ්ඨානය, නිෂ්පත්තිය යන මේ සියල්ල මහා පුරුෂවූ බොධි සත්ත්වයන්ට සම්භවෙත්. එහි "මනුස්සත්තං" යනු මිනිසත් බවයි. මිනිසත් බැව්හිම සිට බුදු බව පතත්නා හුගේ ප්‍රාර්ථනාව සම්භව වත්තේය. නාග සුපර්ණාදි ජාතියෙහි සිටිය හුගේ ප්‍රාර්ථනාව සම්භව නොවත්තේය. කවර හෙයිනයත්? බුදු බවට නුසුදුස්සා බැවිනි.

"ලිඞ්ගසම්පත්තියා" යනුවෙහි මිනිසත් බැවින් සිටියත් පරිමි යක් හුගේම ප්‍රාර්ථනාව සමෘද්ධවෙයි. සත්‍රීලිඞ්ගයේ හෝ පණ්ඩක නපුංසක උභතෝබ්‍යඤ්ජනක යන්ගේ හෝ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවෙයි කවර හෙයිනැත්, ලක්ෂණ යන්ගේ පිරිපුන් බවක් නැති බැවිනි. මේමෑ වදරණලදි:- "අධ්‍යාන මෙතං හිකඛවෙ අනවකාසෝ යං ඉත්ථි අරහං අස්ස සම්මා සම්බුද්ධෝ"යි විස්තර යයි. එහෙයින් සත්‍රීලිඞ්ග යෙහි සිටියාවූ මිනිස්සු ඇත්තක් හුගේ හෝ පණ්ඩකාදීන්ගේ හෝ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවෙයි.

"හෙතු" යන මෙහි උපනිශ්‍රය සම්පත්තියෙහි (ඒ ජාතියෙහි රහත් වන්නට හිසිපින් ඇති බවයි) හිස් පිරිමියන්හු වුවද උපනිශ්‍රය සම්පන්න වූවහුගේම ප්‍රාර්ථනාව සිඛවෙයි නෙස්සන්ගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවෙයි

"සත්ථාරදස්සනං" යන මෙහි බුදුසෙනෙකුන්ගේ හමුවීමයි. දිවමන් බුදු සෙනෙකුන් වහන්සේගේ හමුවෙහි දීම බුදු බව පතන්නාහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වෙයි. බුදුන පිරිනිවි කල්හි සැයක් හෝ බෝ මුල හෝ පිළිමයක් හෝ පෑස් බුදු බුදුසව්වන් හෝ ලඟදී පතන්නාහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවෙයි. කවර හෙයින්ද යත්? අධිකාරයාගේ බලවත් බවක් නැති හෙයිනි. බුදු වරයන්ගේ හමුවෙහි කළ පැතීමම සමෘද්ධ වෙයි මක්නිසාදයත්? අධ්‍යාශයාගේ උදාර භාවයෙනි. ඒ පිණිස කරන්නාවූ ප්‍රාර්ථනාව බලවත් බවට පැමිණේමෙනි.

"පබ්බජ්ජා" යන මෙහි භගවත්වූ බුදුන්ගේ සමීපයෙහි ප්‍රාර්ථනාකරතත් කම්වාදි ක්‍රියාවාදි තාපසයන් හෝ භික්ෂූන්ගේ සමීපයෙහි පැවිදිවූ වහුගේම පැතුම් සමෘද්ධ වෙයි. ගිහි වේසයෙහි සිටියන්හුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවෙයි. කවර හෙයිනැත්, බුදු බවට සුදුසු නොවන හෙයිනි. මහා බොධි සත්ත්වයෝ වනාහි පැවිදිවූවාහුම සම්‍යක් සම් බොධියට පැමිණෙති. ගිහි වූවාහු නොපැමිණෙති. එහෙයින් ප්‍රණිධාන කාලයෙහිද පැවිදි වෙශයම සුදුසු වෙයි. ඒ වනාහි කිසිම ගුණ සම්පත්තියක් ඉටාගන්නා බැවිනි.

"ගුණසම්පත්ති" යන මෙහි අභිඥාදි ගුණ සම්පත්ති යයි. පැවිදිවූවත් පඤ්චාභිඥ අෂ්ට සමාපත්තිලාභීහුගේම ප්‍රාර්ථනාව

සම්බන්ධ වෙයි. කියතලද ගුණ සම්පත්තියෙන් වෙන්වූවහුගේ ප්‍රාර්ථනාව සම්බන්ධ නොවෙයි, කවර හෙයිනයත්? පෙරුම් පුරාදුකිරීමෙහි අපොහොසත් බැවිනි. උපනිශ්‍රය සම්පත්තියෙන්ද අනිඥ සම්පත්තියෙන්ද යුක්තවූ මහාපුරුෂයෝ කරතලද අනිනීකාර ඇත්තාහු තුමූම පාරමීන් සොයනට සමර්ථයෝ වෙත්.

"අධිඨාරෝ" යන මෙහි විශෙෂ ක්‍රියාවයි. කියතලද ගුණයෙන් යුතුනාවූයේද යමෙක් වනාහි තමනගේ ජීවිතයත් බුදුන්ට පූදා, එකල බුදුන්ට විශෙෂ ක්‍රියා කෙරේද, ඔහුගේම ප්‍රාර්ථනාව සම්බන්ධ වෙයි. අනිකක්හුගේ ප්‍රාර්ථනාව සම්බන්ධ නොවෙයි.

"ඡන්දතා" යන මෙහි කත්තුකම්‍යතා කුශලච්ඡන්දයයි යටි කී ගුණයන් ගෙන් යුක්තවූ යමක්හුගේ බුදුකුරු දම් පිණිස මහත් කැමැත්තක් මහත් උත්සාහයක් මහත් ප්‍රාර්ථනාවක් මහත් කත්තුකාමතාවක් ඇත්තේද, ඔහුගේම ප්‍රාර්ථනාව සම්බන්ධවෙයි, අනිකක්හුගේ ප්‍රාර්ථනාව සම්බන්ධ නොවෙයි. මේහි ඡන්දමහත්ත්වය පිළිබඳ මේ උපමාවක්වෙයි:- යමෙක් වනාහි එකම ජලස්කන්ධයක් වූ සියලු සක්වළ ගැබ තමාගේ බාහු බලයෙන්ම පීනා එතරට යන්ට සමර්ථවේද, හෙතෙම බුදුබවට පැමිණෙයයි අනා ඒ නොකට හැක්කක්සේ නොඅදහන්නේ මම එය පීනා එතරට යන්නෙමියි හටගත් ඡන්දය ඇත්තේවේද. එහි සැකයට නොපැමිණේ ද, එසේම යමෙක් පහවූ දැල් ඇති පහවූ දුම් ඇති අඟුරෙන් පිරුණු මුළුසක්වළ පයින් මිඩිමින් ඉක්ම එතරට යන්ට සමර්ථවේද-පෙ-එහි සැකයට නොපැමිණේද, එසේම යමෙක් සැත්වලින්ද හුල්වලින්ද, මිනාකොට මූවහත් තබනලද තල යන් ගෙන්ද එකවර ගැවසී ගත්තාවූ මුළු සක්වළ පයින් ඇක්මක්ම-පෙ-එහි සැකයට නොපැමිණේද, එසේම යමෙක් තෙම සත හුන පදුරෙන් එකවර ගැවසීගත් කටුවැල් වතයෙන් ගහන වූ මුළු සක්වළ විනිවිද එතරට යන්ට සමර්ථවේද, -පෙ- එහි සැකයට නොපැමිණේද, එසේම යමෙක් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී බුදු බවට පැමිණිය යුතුයයි අනා එය දුෂ්කරයක්සේ නොඅදහන්නේ මම එහි පැසී බුදු බවට පැමිණෙන්නෙමියි හටගත් ඡන්දය ඇත්තේ වේද, එහි සැකයට නොපැමිණේද මේ ආදී ක්‍රමයෙන් ඡන්දයාගේ මහත්ත්වය දත යුතුයි.

මේසේ අටහින් යුක්තවූ මේ අභිනීහාරය තෘෂ්ණා පරමාර්ථ විෂයෙන් ඒ අට වැදූරුම් අඩියත්ගේ සම්බ ධානයෙන් තථා ප්‍රවාහනා චිත්තොත්පාදයැයි දතයුතු. ඒ අභිනීහාරය තෘෂ්ණා මහාකොටම සම්‍යක් සම්බොධිය පිණිස සිත පිහිටුවීම ලක්ෂණකොට ඇත්තේය. මම නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කරන්නෙමි නම් යෙහෙකැයි සියලු සත්ත්වයන්ට හිතසැප එළවන්නෙමි නම් යෙහෙකැයි මේ ආදී ප්‍රාර්ථනාව රසකොට ඇත්තේය. බොධිසම්භාරයට හෙතුබව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. මහා කරුණාව හෝ උපනිශ්‍රය සම්පත් පදස්ථාන කොට ඇත්තේය. අවිත්‍රත්‍යවූ (සිතිය නොහැක්කාවූ) බුබහුම් යද අප්‍රමාණවූ සත්ත්වලෝක හිතයද (සත්ලොවට වැඩද) අරබයා පැවැත්මෙන් සියලු බුධකාරක ධර්මයන්ට මුල්වූ පරම භද්‍රවූ (ඉතා යහපත්වූ) පරම කල්‍යාණවූ අපරිමේය ප්‍රභාව ඇති කුශල විශෙ-ෂයකැයි දතයුතු යම් අභිනීහාර ධර්මයක්හුගේ ඉපැද්දීම හා සම්භ මහා පුරුෂයාණෝ මහා බොධියානයට පිළිපන්නාහු නම්වෙද්ද නියත භාවයට පැමිණීමෙන් එයින් නොනැවැත්ම සවභාව කොට ඇති බැවින් බොධිසත්ත්වය යන නාමය ලබති. සම්ප්‍රකාරයෙන් සම්‍යක් සම්බොධියෙහි මොනවට ඇලුණු සිතැති බවද බොධි සම්භාර ශික්ෂාවන්හි සම්‍යක් බවද උත්වහන්සේලා කෙරෙහි ඇතිවේ. යට කී අභිනීහාරයන්ගේ සමෘඩ විමෙන් මහාපුරුෂයෝ සම්‍යක්ත්වඥානාභිගමයට පූර්වනිමිත්තක්වූ සවයම්භූඥානයෙන් මහාකොටම සියලු පාරමීන් සොයා දැන සමාදන්ව පිළිවෙළින් පුරත්. අපගේ මේ සුමේධ පණ්ඩිතයෝද එසේ කරනලද අභිනීහාර ඇත්තෝය. එහෙයින් වදාරණ ලදී.

264. "හන්දබ්බඛරෙ ධමෙම විචිනාමි ඉතෝ විතෝ.
උඩ්ඩං අධෝ දසදිසා යාවතා ධම්මධාතුයා;
විචිනනෙතා තදා දක්ඛිං පඨමං දානපාරමිං "යී

(එබැවින් බුධකාරක ධර්මයන් දෙව්ලොව හා මිනිස් ලොවද ඒ ඇතුළු කොට දසදිගද සියලු ධර්මධාතුවෙහිද යන ඔබ්නොබ සොයමි. එසේ සොයන්නෙමි එකල පළමුවන දානපාරමිතාව දිවිමිහි) විස්තරයවෙහි.

ඒ අභිනීහාරයාගේ ප්‍රත්‍යයෝ සතරදෙනෙක්ද, හෙතු සතර දෙනෙක්ද, බලයෝ සතර දෙනෙක්ද, දතයුත්තැතුය. එහි සතර ප්‍රත්‍යයෝ කවර හුදැ:- මේ ලොකයෙහි මහා ප්‍රාඥයාණ කෙනෙක් මහත් බුඩානු භාවයෙන් ආශ්චය්‍යීවූ අද්භූතවූ ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නාවූ තථාගතයන් වහන්සේ තමක් දනිත්ද, ඔහු ඒ නිසා ඒ අරමුණු කොටගෙන මේ ධර්මධාතුව හෙවත් කාමරූපාරූප ධර්මයන්ගේ ප්‍රභාතනිසථානය මහත් ආනුභාව ඇත්තේය. යම් ධර්මධාතුවක් අවබොධ කළ බැවින් භාග්‍යවතුන් වහන්සේ මෙබඳු ආශ්චය්‍යාද්භූත සවභාව ඇතිසේක්, අචින්තාවූ ආනුභාව ඇතිසේ කැයි මහා බොධියෙහි සිත පිහිටුවති. උන්වහන්සේ ඒ මහානු භාවයම දශීනය නිසා එයම ප්‍රත්‍යය කොටගෙන සම්‍යක් සම්බොධියෙහි ඇලෙමින් එහි සිත පිහිටුවති, මේ වනාහි මහාභිනීහාරය පිණිස වන්නාවූ ප්‍රථම ප්‍රත්‍යයවෙයි. තථාගතයන් වහන්සේගේ එසේ කියනලද මහානුභාවය නොදකිත්ද, එසේත් භාග්‍යවත්හු මෙබඳු ගුණඇත්තාහයි කියා අසත්ද, උන්වහන්සේ ඒ (ශ්‍රවණය) නිසා ඒ ශ්‍රවණය ප්‍රත්‍යය කොටගෙන සම්‍යක් සම්බොධියෙහි ඇලෙමින් එහිම සිත පිහිටුවති, මේ වනාහි මහාභිනීහාරය පිණිස වන්නාවූ දෙවන ප්‍රත්‍යයවෙයි. තථාගතයන් වහන්සේගේ යට කියනලද ප්‍රකාර මහානුභාවය නොදකිත්ද, අනුන්ගෙන් නොඅසත්ද, එසේද වුවත් ධර්මදෙශනා කරන්නාවූ තථාගතයන් වෙතින් "දසබල සමන්නාගතො භික්ඛවෙ තථාගතො" (මහණෙනි තථාගතයෝ දශබලයෙකින් යුක්ත සේකැයි යනාදින් බුඩානුභාව ප්‍රතිසංයුක්තවූ බණ අසත්ද, උන්වහන්සේ ඒ නිසා ඒ ප්‍රත්‍යය කොටගෙන සම්‍යක් සම්බොධියෙහි ඇලෙමින් එහි සිත පිහිටුවති. මේ මහාභිනීහාරය පිණිස පවත්නාවූ තුන්වන ප්‍රත්‍යයවෙයි. යට කියනලද ප්‍රකාර තථාගතයන් වහන්සේගේ ආනුභාවය නොදකිත්ද අනුන්ගෙන් නොඅසත්ද බුදුන්ගේ බණ නොඅසත්ද; එතකුදුවුවත් උදාරාධ්‍යාශය ඇත්තෝ කල්‍යාණාධි මුක්තකවූවෝ මම මේ බුඩවංශය බුඩ තුනනිය බුඩ ප්‍රවෙණිය බුඩ ධර්මතාවය රක්නෙමියි හැම වේලෙහිම ධර්මයටම සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානනය කරන්නාහු පූජා කරන්නාහු, අපචායනය කරන්නාහු ඒ ධර්මය නිසා ඒ ප්‍රත්‍යය කොටගෙන සම්‍යක් සම්බොධියෙහි ඇලෙන්නාහු එහි සිත පිහිටුවත්, මේ වනාහි මහාභිනීහාරය පිණිස පවත්නාවූ තිවුවෙනි ප්‍රත්‍යයවෙයි.

එහි මහානිනීහාරය පිණිස පවත්නාවූ හෙතු සතර කවරේද යත්:— මෙහි මහාපුරුෂ තෙම පළමු බුදුවරයන් කෙරෙහි කරන ලද ප්‍රාර්ථනා ඇත්තේ සවභාවයෙන්ම උපනිඃශ්‍රය සම්පන්නවූයේද, මේ වනාහි මහානිනීහාරය පිණිස පළමුවන හෙතුව වෙයි. නැවතද මහා කරුණාධි මුක්තාවූයේ ප්‍රකෘතියෙන් කරුණාධ්‍යාශ ඇත්තේ තමන්ගේ දිවිපුදා තමුන් සත්ත්වයන් දුකින් මුදවනු කැමැත්තේ වේද, මේ වනාහි මහානිනීහාරය පිණිස දෙවන හෙතුව වෙයි. නැවතද මහා පුරුෂතෙම සත්ව හිත පිණිස සියලු සසර දුකින්ද දුස්සර චරියාවෙන්ද බොහෝ කාලයක් ගැටෙන්නේ ව්‍යායාම කරන්නේ කැමතිවනලද අර්ථ සිද්ධවනතෙක් කල් නොකිරුණේ නැතිගත් බවක් නැත්තේවේද මේ වනාහි මහානිනීහාරය පිණිස තුන්වන හෙතුව වෙයි. නැවතද මහා පුරුෂතෙම යමෙක් අහිතයෙන් වළක්වා හිතෙහි යොදවාද, එබදු කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නේ වේද මේ වනාහි මහානිනීහාරය පිණිස සිවුවෙනි හෙතුව වෙයි.

එහි මෝනොමෝ මහා පුරුෂයන්ගේ උපනිඃශ්‍රය සම්පත්තිය යයි යමක් කරණ කොටගෙන එකාන්තයෙන් උන්වහන්සේ අධ්‍යාශය තෙම යම්සේ සම්‍යක් සම්බොධියට නැමුණේවේද, ඊට විශෙෂයෙන් නැමුණේවේද, ඊට ප්‍රාග්භාර වූයේවේද, එසේම සත්ත්වයන්ට හිත වරණයද නැමුණේ වේද (එයයි) ඒ කරණ කොට ගෙන බොධි සත්ත්වයෝ වනාහි පළමු බුදුවරයන් සමීපයෙහි සම්බොධිය පිණිස සිතිනුදු කයිනුදු මමද මෙසේවූ සම්‍යක් සම්බුද්ධ මහා කොටම සත්ත්වයන්ගේ හිත සුව සිඛකරන්නෙමියි ප්‍රාර්ථනා කරණ ලද්දේවෙයි. මේසේ සම්පූර්ණවූ උපනිඃශ්‍රය සම්පත් ඇති බොධිසත්ත්වයන්ට මෙවිහු උපනිඃශ්‍රය සම්පත් පිණිස ලිඛිත (කාරණ) යෝ වෙති. යම් කාරණයන් ගෙන් යුක්තවූ මහා බෝධිසත්ත්වයන්හට ශ්‍රාවක බොධිසත්ත්වයන් ගෙන් හා ප්‍රත්‍යෙක බොධිසත්ත්වයන් ගෙනුදු මහත් විශෙෂයක් මහත් තෘෂ්ණා ඔයක් ඉන්ද්‍රිය වශයෙන්ද ප්‍රතිපත්ති වශයෙන්ද කුශලතා වශයෙන්ද යන තුන් පරිද්දෙන් පෙනේද (මෙවිහු වනාහි ඒ උපනිඃශ්‍රය සම්පත්තියට කාරණ වෙත්.) මෙහි උපනිඃශ්‍රය සම්පන්නවූ මහා පුරුෂයෝ වනාහි යම්සේ විශදවූ ඉන්ද්‍රිය ඇත්තෝ වෙත්ද විශදවූ ඥානය ඇත්තෝ වෙත්ද, සෙසු පසේබුදු බුදුසව්වෝ එසේ නොවෙති. මහා පුරුෂයෝ වනාහි මෙරමණට හිතපිණිස පිළිපන්නෝ වෙති.

තමහට හිත පිණිස නොවෙති ඒ එසේමය. උත්වහන්සේ යම්සේ බොහෝ දෙනාට හිතපිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට හිත සැප පිණිස පිළිපන්නාහු වේද්ද, සෙස්සෝ එසේ පිළිපන්නාහු නොවෙති. සථානොත්පත්ති ප්‍රතිභානයෙන්ද සථානාසථාන කුශලතාවෙන්ද එහිදු දක්ෂභාවය එළවති. එහි මහාපුරුෂයෝ සවභාවයෙන්ම දානාධ්‍යාශය ඇත්තෝ වෙති. දානයෙහි ඇලුනාහුවෙති. දෙය ධර්ම විද්‍යමාන කල්හිද දෙන්මය. දීමෙන් කැළඹිමකට නොපැමිණෙති සංවිභාග සීලී (තමා වැළඳිය යුතු දෙයින් බෙදා දෙන සුළු) වෙති. උපන් ආදර ඇත්තෝ ප්‍රමුදිතවම දෙති. උදාසීන සිතින් නොදෙති. මහදන්දී නමුත් දීමෙන් සතුටු නොවෙති. මදක් දීම ගැන කියනුම කිම! අනුන්ට දන් දීමෙහි උත්සාහ ඉපදවීම පිණිස දානයෙහි ගුණ වණති. දානය පිළිබඳවූ දහම් කථා කියති. අනුන්ට දන් දෙන්නාවූ සෙස්සන් දැකද සතුටුසිත් ඇත්තාහුවෙති. භය තැන්හිදු අනුන්ට අභය දෙනියි මේ ආදිහු දානාධ්‍යාශය ඇති මහා පුරුෂයන්ගේ දාන පාරමිතාව පිළිබඳ ලිඛග (කාරණ) යෝ වෙත්.

එසේම ප්‍රාණඝාතාදි පාපධර්මයන්ගෙන් ලජ්ජාවෙති. භය වෙති. සත්ත්වයන් නොවෙහෙසන්නාවූ සවභාවය ඇත්තාහු වෙති. උත් වහන්සේ එතෙහිත් සැප සවභාවයෙන් යුක්ත වූවාහු අහුතගුණ පහළ නොකරන්නාහු මායා රහිත වූවාහු ඍජු සවභාව ඇත්තාහු සුවව වූවාහු සුවව බව කරන්නාවූ ධර්මයන් ගෙන් යුක්තවූවාහු මෘදු සවභාව ඇත්තාහු දැඩි නුවූවාහු නිහතමානි වූවාහු ඇටත් පිරිසෙයින් තණ සුලක් පමණ කුදු අනුන් සත්තක දෙයක් නොගනිත්. තමා අතෙහි තබන ලද ණයක් හෝ නෙත අනිකකු විසංවාදනය නොකෙරෙති. තමාවෙත තබන ලද අනිකකුන් සතුදැ මූළාකල හෝ සිහි නැතිකල ඔහුට ඒ නැවත භාභවා ගම්සේ අනුන් අයත් නොවේද එසේ පාවාදෙති. අනුන් අයත් දෙයෙහි ලොභොබිවූවෝ නොවෙති. ලාමක හිත කුදු නුපදවති සත්‍රී ව්‍යසනාදිය දුරින්ම දුරු කෙරෙති. සත්‍යවාදී වූවාහු සත්‍යයෙන් සත්‍යය ඉලපන්නාහු බිදුනන් ඉලපන්නාහු සමගි වූවන්ට ධර්මකථාදියෙන් අනුබල දෙන්නාහු ප්‍රියවචන කියන්නාහු සිතෙහ පෙරටු වචන ඇත්තාහු පටිසන්ථාර වශයෙන් පළමු

කොට බණත්තාහු අවවාදී වූවාහු ධර්මවාදී වූවාහු දැඩි ලොභෙකි කොවූවාහු ව්‍යාපාදයෙන් වෙන්වූ සිත් ඇත්තාහු සත්‍යාහු ලොම්කඳුකයෙන් හා සමග සවකියකොට ඇති ඥන යෙහුදු යුක්ත හෙයින් වරදවා නොදක්නාහු කළගුණු ඇත්තාහු කළ දෙය පහළකොට දන්නාහු වැඩසිටියත් පුදන්නාහු පිරිසිදු ජීවය ඇත්තාහු ධර්මය කැමැත්තාහු සෙස්සන්ද ධර්මයෙහි යොදන්නාහු සම්ප්‍රකාරයෙන් අවැඩින් වළක් වත්නාහු කටයුත්තෙහි යොදවන්නාහු තමහුදු වැඩෙහි යෙදුනාහු තමා විසින් නොකට යුත්තක් කොට හෝ වහාම එයින් වැළෙක්කේයයි මේ ආදි ගුණයෝ වනාහි ශීලාධ්‍යාශයෙන් යුක්තවූ මහා බෝසතාණන්ගේ ශීලපාරමිතාව පිළිබඳ ලිඛිත (කාරණ) යෝ වෙති.

එසේම මදවූ කෙලෙස් හා මදවූ නිවරණ ඇත්තාහු වෙති. පවිවෙකාධ්‍යාශය ඇත්තාහු අවික්ෂේපය බහුලකොට ඇත්තාහු වෙති. පාපවිතර්කියෝ උත්වහන්සේලාගේ සිතට නොපිවිසෙත් විවෙකයට පැමිණියාවූ උත්වහන්සේගේ සිත නිදුකින්ම සමාහිත වෙයි. අමිත්‍ර පක්ෂය කෙරෙහිදු වහාම මෙත් සිත පිහිටති. සෙස්සන් කෙරෙහි කියනු කිම? සිහි ඇත්තාහු වෙති. බොහෝ කල් කළ කිදේ සිහි කරන්නාහු වෙති. නුවණැත්තාහු වෙති. ධර්මාර්ජ ප්‍රඥාවයකි කියකලද විදර්ශනා ඥානයෙන් යුක්තවූවාහු වෙති. නිපක හෙවත් සමීක්ෂා පරිහරණයෙහි නියුක්ත ප්‍රඥාවෙන් යුක්ත වූවාහු වෙති. ඒ ඒ ඉන්ද්‍රියවල්හි පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තාහු වෙති. සත්ත්වයන්ගේ හිත ක්‍රියාවන්හි සමානි ඛලයෙන් යුක්ත වූවාහු වෙති. සියල්ල ඉවසන්නාහු නිශ්චලවූ අධිෂ්ඨානයෙන් යුක්ත වූවාහුද වෙති. දැඩිවූ සමාදානය ඇත්තාහු වෙති. උපෙක්ෂාවට කාරණවූ ධර්මයන්හි උපෙක්ෂා සිත් ඇත්තාහුද වෙති. නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශාදීන්ගේ වශයෙන් මහා පුරුෂයන්ගේ මේ ආදීහු නෛෂ්ක්‍රම්‍ය පාරමිතාදීන්ට කාරණ යෝයයි දතයුත්තාහ. මේ බෝධි සම්භාර කාරණයන්ගෙන් යුක්තවූ මහා පුරුෂයාණන්හට මහානීහාරය පිණිස කල්‍යාණමිත්‍ර සනනිශ්‍රය වේය යන යමක් කියනලද්දේද එහි මේ සංක්ෂෙපයෙන් කල්‍යාණ මිත්‍රයාගේ ලක්ෂණයි. එනම්:—

මේ ලොකයෙහි කල්‍යාණ මිත්‍රතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයි, ශීලයෙන් යුක්තවූයේ වෙයි, ශ්‍රැතයෙන් යුක්තවූයේ වෙයි, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයි, වීර්‍යයෙන් යුක්තවූයේ වෙයි, සතිමත්කමෙන් යුක්තවූයේ වෙයි, සමාධියෙන් යුක්තවූයේ වෙයි, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි, එහි ශ්‍රද්ධා සම්පත්තිය කරණ කොට ගෙන තථාගතයන් වහන්සේගේ සම්බෝධඥානයද කර්මය හා ඵලයද අදහයි. ඒ කරණකොට ගෙන සම්‍යක් සම්බෝධියට හේතුවූ සත්ත්වයන් කෙරෙහි හිතෙසිබව අත් නොහරියි, ශීල සම්පත්තිය කරණකොට ගෙන සත්ත්වයන්ට ප්‍රිය මනාපවූයේ වෙයි, පාෂාණ ඡත්‍රයක්මෙන් ගරුවූයේ වෙයි, සම්භාවනා කටයුත්තේ වෙයි, වොදක වෙයි, පාපයට ගැහී කරන්නෙක් වෙයි, අවවාද වශයෙන් කියන සුළුවූවෙක් වෙයි, වචනක්ෂම වෙයි, (වොදනා වශයෙන් විවාළ තෙපුල් ඉවසන්නේ වෙයි) ශ්‍රැත සම්පත්තිය කරණකොට ගෙන සත්ත්වයන්ට හිත සුව එළවන්නාවූ හැඟුරාවූ ධර්මකථා කියන සුළුවෙයි, ත්‍යාග සම්පත්තිය කරණ කොට ගෙන අල්පෙච්ඡවෙයි, සන්තුෂ්ටවෙයි, විවෙකයෙහි ඇළුනේ වෙයි, කුලයා කෙරෙහිද ගණයා කෙරෙහිද අමිශ්‍රවූයේ වෙයි, වීර්‍ය්‍ය සම්පත්තිය කරණකොට ගෙන හිත ප්‍රතිපත්තියෙහි පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තේ වෙයි, සතිමත් සම්පත්තිය කරණකොට ගෙන නිරවද්‍ය ධර්මයන්හි එළඹ සිටි සිහි ඇත්තේ වෙයි, සමාධි සම්පත්තිය කරණකොට ගෙන එකඟවූ සිත් ඇත්තේ අවික්ෂිප්තාවූයේ වෙයි, ප්‍රඥාසම්පත්තිය කරණ කොට ගෙන අවිපරිතව දැනගන්නෙක් වෙයි, හෙතෙම සිහියෙන් කුශලා කුශල ධර්මයන්ගේ ගතින් නොයන්නේ නුවණින් සත්ත්වයන්ගේ හිතාහිත තතුවූ පරිදිදෙන් දැන සමාධියෙන් එහි එක්සිත් ඇතිව වීර්‍යයෙන් සත්ත්වයන් අහිතයෙන් වළක්වා හිතයෙහි යොදවයි. එහෙයින් කිහ.

265. "පියෝ ච ගරු භාවනීයෝ වත්තාව වචනක්ඛමෝ,
ගම්භීරංව කථං කත්තා නෝ චට්ඨානෙ නියොජකෝ."යි

මෙසේ ගුණයෙන් යුක්තවූ කල්‍යාණ මිත්‍රයා නිසා මහා සුරුෂතෙම තමන්ගේ හෙතු සම්පත්තිය මතා කොටම පිරිසිදු කෙරෙයි. ඉතා විශුද්ධවූ ආශය ප්‍රයොගද ඇතිව සිව්වැදුරුම් කිලයන්ගෙන් යුක්තවූයේ නොබෝ කලකින්ම අෂ්ටාංඛගයන්

සම්වධානය කොට මහාභිනීහාරය කරන්නේ කොතවත්තා සටහාව ඇත්තේ නියතවූයේ සම්බොධිය පිහිටකොට ඇත්තේ බොධිසත්ත්ව භාවයෙහි පිහිටයි.

උත් වහන්සේගේ බලයෝ සතරදෙනෙක් වෙති. ඔහු කම් අධ්‍යාත්මික බලය හෙවත් ධර්ම ගෞරවයෙන් සම්‍යක් සම්බොධියෙහි ආත්ම සකනිඃශ්‍රිතවූ යම් කැමැත්තක් එකාග්‍රතා නිම්න්ඩ්‍යාශයක් ඇත්තේ වේද, යමක් කරණකොට ගෙන මහා පුරුෂතෙම ආත්මාධිපතිවූයේ ලජ්ජාඩ්‍යාශය ඇත්තේ අභිනීහාර සම්පන්නාව පැරුම් පුරා සම්‍යක් සම්බොධියට පැමිණේද (ඒ අජ්ඣත්තික බලයතම්) බාහිර බලය හෙවත් සම්‍යක් සම්බොධියෙහි අනුත් නිසා යම් කැමැත්තක් එකාග්‍රතා නිම්නඩ්‍යාශයක් ඇත්තේ වේද, යමක් කරණකොට ගෙන මහා පුරුෂතෙම ලොකාධිපති වූයේ මානාඩ්‍යාශය ඇත්තේ අභිනීහාරයත් ගෙන් සම්පූර්ණව පැරුම් පුරා සම්‍යක් සම්බොධියට පැමිණේද, (ඒ බාහිර බලය නම්.) උපනිඃශ්‍රය බලය හෙවත් සම්‍යක් සම්බොධිය පිණිස උපනිඃශ්‍රය සම්පත්තිය යෙහි යම් කැමැත්තක් එකාග්‍රතායෙන් සම්‍යක් සම්බොධිය කෙරෙහි තැමුණාවූ සිත් ඇති බවක් වේද, යමක් කරණකොට ගෙන මහා පුරුෂතෙම තියුණුවූ ඉඳුරන් ඇත්තේ විශද ධාතුක වූයේ සමානිය සකනිඃශ්‍රය කොටගෙන අභිනීහාරයෙන් යුක්තව පැරුම්පුරා සම්‍යක් සම්බොධියට පැමිණේද. (ඒ උපනිඃශ්‍රය බලයතම්) ප්‍රයොග බලය හෙවත් සම්‍යක් සම්බොධියෙහි ඊට සුදුසුවූ යම් ප්‍රයොග සම්පත්තියක් ඇති බවක් නිතර නිතර සකසා කරන බවක්වේද, යමක් කරණකොට ගෙන මහා පුරුෂතෙම විශුද්ධවූ ප්‍රයොග ඇත්තේ අභිනීහාරයෙන් යුක්තව පාරමීන්පුරා සම්‍යක් සම්බොධියට පැමිණේද, (ඒ ප්‍රයොග බලයතම්) මෙසේ ප්‍රත්‍යය සතරකින්ද, හෙතු සතරකින්ද, බලසතරකින්ද යුක්තව මූල පටන් අඤ්ඣාඛ සම්වධානයෙන් කරනලද මේ අභිනීහාරය තෙම පාරමීන්ට මූලහෙතු කාරණා හෙයින් ප්‍රත්‍යය වෙයි. ඒ ධර්මයාගේ පැවැත්ම හෙතුකොට ගෙන මහා පුරුෂයන් කෙරෙහි සිවුවැදෑරුම් ආශ්චර්ය අද්භූත ධර්මයෝ පිහිටත්ද, එනම්:— සියලු සත්ත්ව සමූහයා තමාගේ ඖරස පුත්‍රයන්මෙන් ප්‍රියවූ සිනින් ආරක්ෂා කෙරේ, උත්වහන්සේගේ සිත ඔවුන් කෙරෙහි කෙලසිම් වශයෙන් නැවත නොකෙලෙසේ, සත්ත්වයන්ට හිත සැප එළවීම පිණිස උත්වහන්සේගේ අධ්‍යාශයක් උතසාහයක්

ඇතිවේ, තමන්ගේ බුඩකාරක ධම්මෝදී මිතුමිත්තෙහි වැඩෙත්, මුකිරිමටයෙත්ද, යම් හෙයකින් මහාපුරුෂතෙම ඉතා උසස්වූ පුණ්‍යස්කන්ධයෙන් හා කුශලස්කන්ධයෙන්ද යුක්තවීම හෙතු කොට ගෙන සැප විහරණයෙන් යුකතවූයේ සත්ත්වයන්ට දක්ෂිණාවූයේ එතුම්වූ ගෞරවස්ථානයක්ද අසදෘශවූ පින්කෙතක්ද වෙයි. (ඒ අභිනීහාරය පාරමීන්ට ප්‍රත්‍යයවෙයි) මෙසේ තොයෙක් ගුණ ඇති තොයෙක් අනුසස් ඇති මහාභිනීහාරය තෙම පාරමීන්ට ප්‍රත්‍ය වේයයි දතයුතු. මහාභිනීහාරය තෙම (මූලප්‍රාර්තනාව) යම්සේ පාරමිතාවන්ට ප්‍රත්‍යවේද, එසේම මහා කරුණාව හා උපාය කෞශල්‍යයන් සියලු පාරමී ධම්මයන්ට ප්‍රත්‍යය වෙත්.

එහි උපාය කෞශල්‍යය තම් දානාදීන්ගේ බොධි සම්භාර භාවයට නිමිත්තවූ ප්‍රඥාවයි. යම් මහා කරුණෝපාය කෞශල්‍ය යක් කරණකොටගෙන මහා පුරුෂයන්ගේ ආතම සුඛ නිරපෙක්ෂ බවද නිරන්තරයෙන් අනුන්ට වැඩ කිරීමෙහි තත්පර බවද, ඉතා දුෂ්කාරවූ මහා බොධි සත්ත්ව චරිතයන් හා භෙදයක් නැති බවද, බොධි සත්ත්ව චරිතයෙහි ප්‍රභාදය වැඩීම්ද දර්ශනය ශ්‍රවණය අනුසමරණය යන ත්‍රිවිධ අවස්ථාවෙහිම සත්ත්ව යන්ට හිත සැප ඵළවීමට හෙතු බවද සිඛවන්තේය. ඒ එසේමැයි උන්වහන්සේගේ ප්‍රඥාවෙන් බුඩත්ත්වය සිඛවන්තේය. කරුණා වෙන් බුඩකාරක ධම් සිඛවන්තේය. පඥවෙන් තුමූ එතර වෙති. කරුණාවෙන් මෙරමා එතර කරති. ප්‍රඥවෙන් මෙරමා දුක් දැන ගනිති. කරුණාවෙන් මෙරමා දුකට පිළියම් කරන්ට පටන් ගනිති ප්‍රඥවෙන් දුකට කළකිරෙති. කරුණාවෙන් දුක් පිළිගනිති. එසේම ප්‍රඥවෙන් නිර්ඛාණයට අභිමුඛ වන්නේය. කරුණාවෙන් සසරට පැමිණෙති. එසේම කරුණාවෙන් සසරට අභිමුඛ වන්නේය. ප්‍රඥවෙන් එහි තොඇලෙන්නේය. ප්‍රඥවෙන් හැම තැන්හි විරකත වන්නේය. ප්‍රඥව කරුණාව අනුව ගිය හෙයින් සියලු සත් ඔයන්ට අනුග්‍රහ කිරීම පිණිස තොපවත්නේ කොවෙයි. කරුණාවෙන් සියලු සත්ත්වයන්ට අනුකම්පා කෙරෙති. කරුණාව ප්‍රඥව අනුව ගිය බැවින් සියලු සත්ත්වයන් කෙරෙහි තොඇලුතාවූ සිත් ඇත්තේ තොවෙයි. ප්‍රඥවෙන් මමය මාගේය යන්නක් නැති වන්නේය. කරුණාවෙන් අලස බව හා බැගෑ බව නැති වන්නේය. එසේම කරුණාව හා ප්‍රඥවෙන් පිළිවෙළින් ආතම

සවාමි බව හා පර සවාමි බව, ධෙය්‍යබව, විශ්‍වාසඇති බව, තමා නොතවත බව, හා අනුන් නොතවත බව, තමහට වැඩ සිඩිය හා පරහට වැඩ සිඩිය, නිගීත බව හා අහිංසක බව, ධර්මයට අධිපති බව හා ලොවට අධිපති බව, කෙළෙහි ගුණ දන්නා බව, පුළුපකාර ඇතිබව, මෝහය හා තෘෂ්ණාව දුරලීමය, විදර්ශිත ඥානාදී විද්‍ය සිඩිය හා ප්‍රාතිමෝක්ෂ සංවරාදි ශීල සිඩිය, ශ්‍රඩා බලාදි බල හා අනතරායකර ධර්මයන්ගේ වෛශාරද්‍ය සිඩිය සියලු පාරමිතා ඵලයට විශෂයෙන් උපාය බැවින් ප්‍රඥා කරුණා දෙක සියලු පාරමීන්ට ප්‍රත්‍ය වන්නේය. මේ 'කරුණා ප්‍රඥා දෙක පාරමී ධර්මයන්ට මෙන්ම මූල ප්‍රාර්තනාවටද, ප්‍රත්‍යවෙයි.

එසේම උපායාභය උපමගහ, අවසථානය, භිත චරියාවය යන මොහුද පාරමීන්ට ප්‍රත්‍යයෝදයි දතයුත්තාහුය. ඔවුහු බුඩත්වයට උත්පත්ති සථාන බැවින් බුඩභූමිහුදයි කියනු ලැබෙත්. එහි උපායාභයනම්. බොධි සම්භාර ධර්මයන් (දස පෙරුම්) තහා සිටුවන ව්‍යායියි. උපමගහය නම් බොධි සම්භාර ධර්මයන්ගේ උපාය කෞසල්‍යයවූ ප්‍රඥාවයි. අවසථානය නම් අධිෂ්ඨානයයි. හෙවත් නිශ්චලව පිහිටීමයි. අවලාධිෂ්ඨානයයි කියතලදි. භිත චරියාව නම් මෛත්‍රී භාවනාව හා කරුණා භාවනාවත්ය.

එසේම නෛෂ්ක්‍රම්‍යාඩ්‍යාශය, විවේකාඩ්‍යාශය, අලොභාඩ්‍යාශය අවෙෂාඩ්‍යාශය, අමෝහාඩ්‍යාශය, නිශ්ශරණඩ්‍යාශය යයි සවැදුරුම් අදහසෙක් වෙයි. නෛෂ්ක්‍රම්‍යාඩ්‍යාශය (කෙසේ පැවිදි වෙමුදෝහෝයි ප්‍රව්‍රජ්‍යාවෙහි අභිලාෂ) ඇති බොධි සත්ත්ව වරයෝ කාමයෙහිද ගිහිගෙයි විසීමෙහිද දෙසදක්නාහු වෙත්. එසේම විවේකාඩ්‍යාශය (කෙසේ නම් විවේකී වෙමුදෝහෝයි තදඩහාදි විවේකයෙහි අදහස් ඇති) බොධි සත්ත්වවරයෝ ගණ සංගණිකා යෙහි දෙස් දක්නාහු වෙත්. අලොභාඩ්‍යාශය ඇත්තාහු (අලොභිතම් කෙසේ වෙමුදෝහෝයි) ලොභයෙහි දෙස දක්නාහුවෙත්. අවෙෂාඩ්‍යාශය ඇත්තාහු වෙෂයෙහි දෙස් දක්නාහුය. අමෝහාඩ්‍යාශය ඇත්තාහු මොහයෙහි දෙස් දක්නාහුය. (නිවන් කෙසේ ලබමුදෝහෝයි) නිස්සරණඩ්‍යාශය ඇති බොධි සත්ත්වවරයෝ සියලු භවයෙහි දෙස දක්නාහු

වෙත්. එහෙයින් බොධිසත්ත්වවරයන්ගේ මේ අධ්‍යාශයෝ සඳෙහ දානාදී පාරමීන්ට ප්‍රත්‍යයයෝයයි දතයුතු. ලොභාදියෙහි දෙස් දැකීමෙත් ද, ආලොභාදීන්ගේ අධික භාවයෙන්ද වෙන්ව දානාදි පාරමිහු සිඩ නොවෙත්. අලොභාදීන්ගේ අධික භාව යෙන් වනාහි පරිත්‍යාගාදියෙහි කැමැණු සිත් ඇති බව අලොභා ධ්‍යාශයාදිතායයි දතයුතු. මේ අලොභාධ්‍යාශයාදිහු යම් සේද, එසේම දානාධ්‍යාශයාදීහුද බුධිත්වය පිණිස පිළිපදින බොධිසත්ත්වවරයන්ගේ දානාදි පාරමීන්ට ප්‍රත්‍යවෙති. දානධ්‍යා ශය ඇති බොධිසත්ත්වවරයෝ ඊට ප්‍රතිපක්ෂවූ මාත්සර්‍යයෙහි දොෂ දක්නාහු මනාකොටම දානපාරමිතාව සම්පූර්ණ කෙරෙත්. ශීලාධ්‍යාශය ඇති බැවින් දුශ්ශීලයෙහි ආදීනව දක්නාහු මනාකොටම ශීල පාරමිතාව සම්පූර්ණ කෙරෙත්. නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශය ඇති බැවින් කාමයෙහි හා ගිහිගේ වසි මෙහිද, යථාභූත ඥානාධ්‍යාශය ඇති බැවින් අඥානයෙහි හා විචිකිච්ඡාවෙහිද, වීර්‍යාධ්‍යාශය ඇති බැවින් කුසීත භාව යෙහිද, ක්ෂාන්ති අධ්‍යාශය ඇති බැවින් කොපවසීමෙහිද, සත්‍යා ධ්‍යාශය ඇති බැවින් බොරු කීමෙහිද, අධිෂ්ඨානාධ්‍යාශය ඇති බැවින් අනධිෂ්ඨානයෙහිද, මෛත්‍රී අධ්‍යාශය ඇති බැවින් ව්‍යාපාදයෙහිද, උපෙක්ෂාධ්‍යාශය ඇති බැවින් ලොකධර්මයන්හිද, ආදීනව දක්නාහු මනා කොටම නෛෂ්ක්‍රම්‍යාදි පාරමිහු පුරත්. දානාධ්‍යාශයතාදීහු දානාදී පාරමීන් ඉපදවීමට කාරණවන හෙයින් ප්‍රත්‍යවෙත්.

එසේම අපරිත්‍යාගයෙහි හා පරිත්‍යාගාදියෙහි පිළිවෙළින් ආදීනව ආනිසංස ප්‍රත්‍යවෙක්ෂා කිරීම දානාදි පාරමීන්ට ප්‍රත්‍යවේ. මෙහි ඒ ප්‍රත්‍යවෙක්ෂා විධියයි. - කෙත්වත්, රන් රුවත්, ගව, මහිස, දැසිදස්, අඹුදරු ආදි විසතුවෙහි ඇළුණු සිත් ඇති සත්ත්ව යන් ක්ෂෙත්‍රාදීන් වසතුකාම භාවයෙන් බොහෝ ප්‍රාර්ථනා කරන බැවින්ද, රජ සොරු ආදීන්ට සාධාරණ හෙයින්ද, විවාදයට කාරණ වන හෙයින්ද, සතුරන් ඇතිකරන හෙයින්ද, නිස්සාර හෙයින්ද, වසතුව රැක්ම ඇතිකල්හි අනුන්ගේ වෙහෙසට හෙතු වන හෙයින්ද, විනාශයට කාරණ වනහෙයින් ද, ශොකාදි අනෙකප්‍රකාර දුක් එළවන හෙයින්ද, ඒ වසතුවෙහි ඇල්ම මූලකාරණකොට මසුරු මලින් වළඳනාලද සිත් ඇත්තවුන්ට අපායොත්පත්තිය වන හෙයින්දැයි මෙසේ පරිග්‍රහ වසතුහු වනාහි අනෙකප්‍රකාරවූ බොහෝ අවැඩ එළවන්නාහුයයි දත යුතු. ඒ වසතුන්ගේ පරිත්‍යාගය වනාහි අසභායවූ අභිඥා යෙකැයි පරිත්‍යාගයෙහි අප්‍රමාදය කටයුතු.

තවද වසහුව ඉල්වන්නාවූ යාචක තෙමේ තමාගේ සැඟවිය යුතු අදහස කියන හෙයින් මාගේ විශ්වාසයෙකැයි කියාද, හැරපියා යායුතු තමන් සතු වසහුව පරලොවට ගෙනයවයි කියන හෙයින් මට උපදෙස් දෙන්නෙකැයි කියාද, ගිනිගෙන දිලිහෙන්නාවූ ගෙයක් මෙන් මරණ නමැති ගින්නෙන් දිලිහෙන්නාවූ ලොකයෙහි එයින් මා සතු වසහුව පිටත් කරන්ට සහාය වන යහළුවෙකැයි කියාද, පිටත් කළ වසහුව නොනස්නා පරිද්දෙන් නික්ෂෙප කිරීමට (නිදන්කර තැබීමට) සථානව සිටියේයයි කියාද, දන සංඛ්‍යාත කුශල කර්මයෙහි යහළුවූ බැවින්ද, සියලු සම්පත් තින්ට අග්‍රවූ අර්හත්වයින් දුලිහවූ බුඩභූමියෙහි (සියලු ලොකොත්තර) සම්පතනියට කාරණ වන බැවින්ද. උතුම්වූ කල්‍යාණ මිත්‍රයෙකැයි සැලකිය යුත්තේය. තවද මේ යාචකයා විසින් මම උදරවූ කට්ටුත්තකින් සම්භාවනා කරණලද්දෙමි වෙමි. එහෙයින් ඒසම්භාවනා තොමෝ මාවිසින් නොවරදවා කටයුත්තියයිද, එකාන්තයෙන් නස්නා සුළුවූ ජීවිතය යාචකයන් නොඉල්වන ලද්දේ නමුත් මා විසින් දිය යුතුය. ඉල්වූ කල කැලම දියයුතු යයිද උදාරාධ්‍යාශය ඇත්තන් විසින් යාචකයන් සොයා දන් දිය යුතුය. දන් වනාහි මාගේ කුශල බලයෙන් යාචකයා තෙමේම මා සමීපයට ආයේයයිද, යාචකයාට දානව්‍යාජයෙන් මේ අනුග්‍රහය මැදිම යයි කියාද, මා මෙන් මේ සියලු ලෝ වැසි තෙම මා විසින් අනුග්‍රහ කටයුත්තේයයි කියාද, යාචකයන් නැති කල්හි මාගේ දානපාරමිතාව කෙසේ නම් පිරේදැයි කියාද, මා විසින් යාචකයන් සඳහාම සියලු වසහුව සොයා නිබිඳ යුතුයයි කියාද, යාචකයෝ නොඉල්වාම මාසතු දේ තුමූම කවදා ඇරගනිද්දේ හෝයි කියාද, මම කෙසේනම් යාචකයන්ට ප්‍රියවෙම්ද මනවඩම් දැයි කියාද, ඔවුහු මට කෙසේනම් ප්‍රියවූවාහුවෙත්ද මනවඩද් දැයි කියාද, මම කෙසේ නම් දන් දෙමිනුත් දී අනතයෙහිත් සතුටු සිත් ඇත්තෙම් ප්‍රමුදිත වූයෙම් හටගත් ප්‍රීති සෞමනස්‍යයෙන් යුක්තවෙම් දැයි කියාද, උදාරවූ දානාධ්‍යාශය ඇත්තාහයි මට යාචකයෝ කෙසේ හෝ සිතත් දැයි කියාද, මා නො ඉල්වී යදි යාචකයන්ගේ සිත්දැන කෙසේ නම් දෙන්නෙම්දැයි කියාද, විසතුවත් යාචකයිනුත් ඇතිකල්හි දන්නොදීම මට බලවත් නින්දුවකැයි කියාද, කෙසේ නම් මම මාගේ ශරීරාවයවයන් හා ජීවිතයත් යාචකයන්ට පරිත්‍යාග කෙරෙම්දැයි කියාද පරි

ත්‍යාගයට නැඹුරු බව එළවිය යුතු. නවද මේ වස්තුව නම් යම්සේ පණුවෙක් අපෙක්ෂා රහිතව දමන ලද්දක් අනුභවය්ද එසේම නිරපෙක්ෂකවූ දායකයා අනුව යන්නේයයි දඹ නිරපෙක්ෂතාවෙහි සිත් ඉපදවිය යුත්තේය. ඉල්වන්නාවූ තැනැත්තේ වනාහි ඉදින් ප්‍රියවූ පුද්ගලයෙක් වේ නම් ප්‍රියවූ පුද්ගලයෙක් මා අතින් ඉල්ලන්නේයයි සොමනස ඉපදවිය යුතු නැවත උදාසීන පුද්ගලයෙක් වේ නම් මා අතින් මේ වස්තුව ඉල්වන්නාවූ "මේ තෙම ඒකාන්තයෙන් මේ පරිත්‍යාගය කරණ කොට ගෙන මිත්‍රයෙක් වන්නේය" යි සොමනස ඉපදවිය යුතු. දෙන්නාවූ තැනැත්තේ වනාහි යාවකයන්ට ප්‍රිය වන්නේය. ඉදින් වනාහි වෙරී පුද්ගලයෙක් ඉල්ලා නම් පස මිතුරෙක් මා අතින් ඉල්ලන්නේය. මේ පරිත්‍යාගයෙන් වෙරී තැනැත්තේ ප්‍රිය මිත්‍රයෙක් වන්නේයයි සොමනස් ඉපදවිය යුතු. මේසේ ප්‍රිය පුද්ගලයා කෙරෙහි මෙන් මධ්‍යස්ථ වෙරී පුද්ගලයන් කෙරෙහි මෛත්‍රී පූර්ඛගම කරුණාව එළවා දිය යුතු. ඉදින් වනාහි බොහෝ කලක් මුළුල්ලෙහි පුරුදුව ආ හෙයින් බොධිසත්ත්වයන්ට දෙයධර්ම විෂය කොට ඇති ලොභය උපදී නම් බොධි සත්ත්ව ප්‍රතිඥ ඇත්තහු විසින් මෙසේ සැලකිය යුතු. කෙසේදයත් :- සත්පුරුෂයාණනි, සම්‍යක් සම්බොධිය පිණිස ප්‍රාර්ථනා කරන්නාවූ තොප විසින් සියලු සත්ත්වයන්ට උපකාර පිණිස මේ ශරීරය හරන ලද්දේ තොවේද, ඒ ශරීර පරිත්‍යාගමය කුශලය වේද, එසේවූ තොපට බාහිර වස්තුවෙහිද, ඇල්ම ඉපදවීම ඇතුන්ගේ නැමක් හා සමාන වන්නේය. එහෙයින් තොප විසින් කිසි වස්තුවක ඇල්මක් නොඉපදවිය යුත්තේය. යම්සේ මහත්වූ බෙහෙත් රුකක් ඇති කල්හි එහි මූලින් ප්‍රයෝජන ඇත්තෝ මූල් ගෙනයෙත්ද, එසේම හැටසුඹුළු කොල වෙලෙප් අතු පරඬලා ගෙනි යන මෙකි දේවල් ප්‍රයෝජන ඇති පරිද්දෙන් ගෙනයෙත්ද, මා සතුදැ මොව්හු ගෙනයෙනිසි ඒ රුකට විරොධ කල්පනාවක් නොවේද, එසේම මුළු ලොවට හිතවැඩ පිණිස ව්‍යායාම වඩන්නාවූ මා විසින් දුක්වූ කළ ගුණ නොදන්නාවූ හැමකල්හි අපවිත්‍රවූ ශරීරය අනුන්ට උපකාර පිණිස පමුණුවන කල්හි සුවල්ප මාත්‍රවූද මිථ්‍යා විතර්කයක් (මමය මාගේය යන කල්පනාවක්) නොඉපද විය යුතුය.

එකාහාරයෙන් බිඳෙන්නාවූ විසිරෙන්නාවූ නැසෙන්නාවූ සවභාව ඇති මේ අධ්‍යාත්මික බාහිර මහාභූතයන් කෙරෙහි වෙනස කවරේද? මේ මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මයයි යම් මේ ඇල්මෙක් වේද, ඒ වස්තු හුදෙක් මොහයාගේ පැළඹීමෙක් වන්නේය. එහෙයින් බාහිර වස්තූන් කෙරෙහි මෙන් අධ්‍යාත්මික අත් පා ඇස් ආදියෙහිද මාංසාදියෙහිද නිරපෙක්ෂකව ඒ ඒ භාවනා පාදදිය එසින් ප්‍රයෝජන ඇත්තාහු ගෙනයෙන් වයි හරන ලද සිත් ඇත්තහු විසින් විය යුතුය. මෙසේ සලකන්නාවූ සම්‍යක් සම්බොධියට මෙහෙයන ලද සිත් ඇති කාය ජීවිතයෙහි නිරපෙක්ෂකවූ බොධිසත්ත්වයන්ගේ කායවාඞ්මනඃ කර්මයෝ නිදුකින්ම පිරිසිදු වූවාහුවෙත්. උත්වහන්සේ පිරිසිදුවූ කායවාඞ්මනඃ කර්මයන් ඇත්තාහු පිරිසිදු ආජීවය ඇත්තාහු ප්‍රඥාවෙන් ප්‍රතිපත්තියෙහි පිහිටා හළමනා දෙයෙහි හා ගතමනා දෙයෙහි නුවණින් යුක්තව වඩ වඩා දෙයඩම් පරිත්‍යාගයෙන් හා අභයදාන සඞ්ඛ්‍යාත දානයෙන්ද සියලු සත්ත්වයන්ට අනුග්‍රහ කරන්ට පොහොසත් වන්නාහ. මේ වූකලී දාන පාරමිතාවෙහි ප්‍රත්‍යවෙක්ෂා ක්‍රමය වන්නේය.

ශීල පාරමිතාවෙහි වනාහි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු:- කෙසේදයත්? මේ ශීලය නම් ගංගාදීන්ගේ ජලයෙන් ශුඛ කරන්ට නොපිළිවන්වූ වෙඅමල ප්‍රක්ෂාලන ජලයක් වැන්න. රත් සඳුන් ආදී ශීතල ද්‍රව්‍යයෙන් දුරුකරන්ට නොහැකිවූ රාගාදී පරි දාහයන් දුරුකරන්නාවූ සිසිල් දෙයක. මුත්හර, බටුණු මිණි, කොඩොල් ආදී බොහෝ ජනයන් සැරසෙන්නාවූ අභරණයන්ට වඩා අසාධාරණවූ සත්පුරුෂයන්ගේ ආභරණ විශෙෂයෙක. සියලු දිග භාවන හෙයින් (වන්දනාදි කිසිවකින් නොකරන ලද හෙයින්) අකෘත්‍රිමයවූ සියලු කාලයට සුදුසුවූ සුරභි ගන්ධයෙක (මනා සුවඳෙක). ඉන්ද්‍රිය මහාසාරාදීන් විසින්ද දෙවියන් විසින්ද වැඳුම් පිදුම් ආදිය කටයුතු බව එළවන හෙයින් උත්තමවූ වශී කරණ මන්ත්‍රයක. චාතුම්භාරාජිකාදී දෙවලොකයන්ට නැඟෙන නිස්සෙණියක. ධ්‍යානාභිඥාවන් ප්‍රතිලාභයට මාගීයක. නිවන් නමැති මහපුරයට පමුණුවන්නාවූ මඟෙක ශ්‍රාවක බොධිය, ප්‍රත්‍යෙක බොධිය, සම්‍යක් සම්බොධිය, යන මේ ත්‍රිවිධ බොධින් පිහිටන භූමියෙක. කැමති වන ලද්දාවූ ප්‍රාර්ථනා

කරන ලද්දවූ යමක් යමක් වේද, ඒ ඒ දෙය සමෘද්ධවන්ට උපායයක් වන බැවින් සිතුම්ණී කප්රුක් ආදියත් ඉක්මී පවතියි. මේද වදරණ ලදි බුදුන් විසින් "ඉධග්ඝියසනි ගිහිනෙවෙ සිලවතො වෙඉතො පණ්ඩිච්චසු බහුතා" යි "මහණෙනි, පිරිසිදු බැවින් සිල් වත්හුගේ චිත්ත ප්‍රණිධිය සමෘද්ධවේ." අනිකකුදු වදරණ ලදි. "ආකංඛෙය්‍ය වෙ ගිහිනෙවෙ ගිහිබු සබ්‍රහ්මචාරිනං පියො වස්සං මනාපො ගරු ච භාවනීයොචානි සිලෙසෙසවස්ස පරිපූරකාරිනි' ආදි මහණෙනි, මහණ තෙමේ සබ්‍රහ්මචර්‍යා ඇත්තවුන්ට ප්‍රිය වෙමියි, ගරුවෙමියි, සම්භාව්‍යවෙමියි, ඉදින් කැමැත්තේ තම් ශීලයම සම්පූර්ණ කටයුත්තේය යනාදියයි, තවද "අච්චපවි සාරජ්ජානි බො ආතඤ්ඤ කුසලානි සිලානි" යි. ආතඤ්ඤයෙනි නිරවද්‍යවූ ශීලයෝ විපිළිසර නොවීම ප්‍රයෝජන කොට ඇත්තාහ. "පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සිලවතො සිල සම්පදයා" යි. ගෘහපතියෙනි, සිල්වත්හුගේ එම ශීලසම්පත්තියෙන් මේ ආනිසංසයෝ පස් දෙනෙක් වෙත්යයි යනාදි සූත්‍රයන්ගේ වශයෙන්ද ශීලයාගේ ගුණ විශෙෂයෝ සැලකිය යුත්තාහුය. එසේම අනාගතභයවෙරාදිසූත්‍රාදීන්ගේ වශයෙන් ශීල විපත්තියෙහි ආදීනවද සැලකිය යුත්තේය. ප්‍රීතිසෞමනස්‍ය ඵලවිමට කාරණ වන හෙයින්ද, අත්තානුවාද පරාපවාද දණ්ඩ භය දුගතී භය යන මේ බිය නසන හෙයින්ද නුවණැත්තන් විසින් ප්‍රශංසා කටයුතු බැවින්ද, විපිළිසර නොවීම් කරන හෙයින්ද සැපතට හෙතුවන හෙයින්ද, නෑ මිතුරු සැපත් මැඩ පවත්වන හෙයින්ද සීලය උත්තම ආනිසංස ඇත්තේයයි සැලකිය යුතු. සිල්වත්හට වනාහි තමන්ගේ සීල සම්පත්තිය නිසා එකාන්තයෙන් මා විසින් කුසල් කරන ලද්දේය, කල්‍යාණ ක්‍රියාවක් කරන ලද්දේය, භයට පරිත්‍රාණයක් කරන ලද්දේයයි මහත්වූ ප්‍රීති සොම්නස් උපදනේය. එසේම සිල්වත්හට ඔහුගේ සිත උපවාද නොකෙරෙයි. (පරිභව නොබෙණෙයි) නුවණැත්තාවූ අන්කෙනෙක් නිදු නොකෙරෙති. දණ්ඩ භය දුගීති භය දෙක නටගැන්මක් නැත්තේය. සිල්වත් පුරුෂතෙම යහපත් සවභාව ඇත්තේයයි නුවණැත්තන් විසින් ප්‍රශංසා කටයුතු වන්නේය. මා විසින් පවක් කරණ ලද්දේය. කාලුෂ්‍යයක් කරන ලද්දේයයි දුශ්ශීලයාහට යම් මේ විපිළිසරයක්

..

උපදීද, ඒ විපිළිසරය සිල්වත්හට නො උපදනේය. මේ ශීලය තම් අප්‍රමාදයට කාරණ හෙයින්ද, නොඅව්‍යසනාදි පරිහාර මූඛයෙන් මහත් වැඩක් සිඛ කරණ හෙයින්ද, අභිවෘධියට කාරණ හෙයින්ද, උතුම් සැපයාට කාරණයක් වන්නේය. සිල්වත්වූ හීන ජාති ඇති සත්ත්වයෙක් තමුත් ක්ෂත්‍රිය මහාසාරාදීන් ඒසින් පිදිය යුතු වන්නේය. ශීල සම්පත්ති නොමෝ කුලසම්පත්තිය මැඩ පවත්නිය. "මහරජ ඒ කුමකැයි සිතන්නෙහිද? මෙහි නොපගේ වැඩපල කරන දාසයෙක් වේද?" යන මේ ආදී වචන ඊට සාධක වේ. සොරු ආදීන්ට අසාධාරණ හෙයින්ද, මිය පරලොව යන්නහු අනුව යන හෙයින්ද, මහත් ඵල වන හෙයින්ද, සම්ථාදි ගුණයන්ට පිහිටවන බැවින්ද, ශීලධනය වනාහි බාහිරිවූ ධනය මැඩපවත්නේය. එහෙතම්වූ අණිමා ලඝිමාදිවූ විභූතිශ්වර්‍යයට පිහිටවන හෙයින් ශීලය ක්ෂත්‍රියාදීන්ගේ ඓශ්වර්‍යය මැඩ පවත්නේය. ඒ ඒ සත්ත්වනිකායගෙහි සත්ත්වයන්ගේ ඓශ්වර්‍යය ශීලය නිමිත්තකොට ඇත්නේය. දුශ්ශීලයන්ගේ සියක් අවුරුදු ජීවත් වීමටත් වඩා සිල් වත්හුගේ එක දවසකුදු ජීවත්වීම විශිෂ්ටයයි වදාළ හෙයින්ද, දිවි ඇති කල්හිදුන් ශික්ෂාප්‍රත්‍යඛ්‍යානය නො කළහුගේම මරණය උතුම්යයි වදාළ හෙයින්ද, ශීලය වනාහි ජීවිතයට වඩා විශිෂ්ට වන්නේය. වෛරී පුද්ගලයන්ටත් මනොඥ බව එළවන හෙයින්ද, ජරා රොග විපත්තින්ගෙන් මිඩ පැවැත්වීය නොඇති හෙයින්ද, ශීලය රූප සම්පත්තිය ඉක්ම වන්නේය. ශීලය ප්‍රසාද භක්ති ආදි සථාන විශෙෂයන්ද, රද යුවරද සෙනෙවිරත් ආදි සථානාන්තර විශෙෂයන්ද, මැඩ පවත්නේය. ශීලය සැප විශෙෂයට පිහිට වන බැවින්ද, එකාන්තයෙන් වැඩ සිඛ කරන හෙයින්ද, පරලොව යන්නහු අනුව යන හෙයින්ද, සවභාවයෙන් සෙනහ ඇතිව අත්පා මෙහෙවර කරන්නාවූ බන්ධුජන මිත්‍ර ජනයන්ද මැඩ පවත්නේය. "ඤාතං මාතා පිතා භගිරා" යනාදි වචන ඊට නිදසුනි. එසේම ඇත් අස් රිය පාබල ඇණි යහ සිවුරහ සෙන හින්ද මන්ත්‍ර ඖෂධාදි ඥානවිධි යොග යෙන්ද ආරක්ෂාකට නොහැකි තමත් ආරක්ෂා කරන බැවින්ද, ආත්මාධිප හෙයින්ද, අපරාධිප හෙයින්ද, මහත්වූ විෂය ඇති බැවින්ද, ශීලය ඉතා විශිෂ්ට වන්නේය එහෙයින් වදාළහ බුදුහු:- "ධම්මෝ හවෙ රක්ඛති ධම්මචාරිං" යි. මෙසේ ශීලය නොයෙක් ගුණයෙන්

යුක්තයයි සලකන්නාහට අසම්පූර්ණවූ ශීල සම්පත්තිය සම්පූර්ණ කිරීමට යත්නේය. අපිරිසිදුවූ ශීලය පිරිසිදු බවට පැමිණෙන්නේය ඉදින් එතැනි ඕහට බොහෝකල් අභ්‍යාස වශයෙන් ශීලයට ප්‍රතිපක්ෂවූ චෙතෝදි ධර්මයෝ අතරතුර උපදනාහු නම් බෝධිසත්ත්ව ප්‍රතිඥා ඇත්තහු විසින් මෙසේ සැලකිය යුත්තේය. කෙසේදයත්:- තොප විසින් සම්‍යක් සම්බෝධිය පිණිස ප්‍රාර්ථනා කරන ලද්දේ නොවේද, ශීලයෙන් වෙන්වූවහු විසින් ලෞකික සම්පත්තියටත් පැමිණෙන්ට නොහැක. ලෝකොත්තර සම්පත්තියට පැමිණෙන්ට කැලම නොහැක. සියලු සම්පත්තීන්ට අග්‍රවූ සම්‍යක් සම්බෝධියට පිහිටවූ සීලයෙන් අතිශයින් උත්කෘෂ්ට බවට පැමිණවිය යුතුය. එහෙයින් "කිකිව අණඩං" යනාදි වදාළ ක්‍රමයෙන් මනාකොට සිල්රක්නාවූ තොප විසින් ප්‍රිය සීලී විය යුතු. තවද තොප විසින් ධර්මදේශනා කිරීමෙන් සත්ත්වයන් ත්‍රිවිධ යානයෙහි ඇතුළත් කිරීම හා ශීලසමාධි ප්‍රඥාවන් මිහිකිරීමෙන් සත්ත්වයන්ට ඉතා ගිලිකටයුත්තෙක්ව සත්ත්වයන්ගේ ත්‍රිවිධ බෝධියට ඇතුළත් කිරීම හා ශීලසමාධි ප්‍රඥාවන්ගේ මිහිකිරීම කෙරෙම්දැයි ක්‍රියා සවභාවයෙන්ම පිරිසිදු සිල් ඇතියකු විය යුතුය. තවද ධ්‍යානාදි ගුණ විශෙෂයක් හා යෙදීමෙන් සත්ත්වයන්ට උපකාර කරන්ට සමර්ථ බවද, ප්‍රඥාපාරමිතාදීන්ගේ පිරීමද, ධ්‍යානාදී ගුණයෝද ශීල පාරමිතාවගේ ශුඛියෙන් වෙන්ව සිඛ නොවන්නාහයි මනාකොටම ශීලය පිරිසිදු කටයුත්තේය.

එසේම ගිහිගෙයි විසීම නම් ඉතා අවුල් වත්තේය. කෙලෙස් නැති දුවිල්ලට මඟක් සමානවන්නේයයි යනාදීන් ගිහිගෙයි විසීමෙහිද, අල්පාස්වාදයක් ඇති හෙයින් කාමයෝ ඇවිසැකිල්ල කට බදු උපමා ඇත්තෝයයි යනාදීන්ද, "මවුතොමෝ පුත්‍රයා හා විවාද කෙරෙයි" යනාදින් කාමයෙහිද, යම් සේ පුරුෂයෙක් ණය ගෙන වෙළඳුම් ආදි කර්මාන්තයන්හි යොදවන්නේද යනාදීන් කාමච්ඡන්දයෙහිද, දෙඟ දැකීම පෙරදැරි කොට මේකියතලද ක්‍රමයට විපශ්‍යනාවෙන් "ප්‍රව්‍රජ්‍යාව නම් අභ්‍යවකාසයක් මෙන් නිදහස්ය යනාදීන් ප්‍රව්‍රජ්‍යාදියෙහි අනුසස් සැලකීම වශයෙන්

නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෙහි අනුසස් සැලකිය යුතු. මේ මෙහි සංක්ෂේපයයි විස්තරය වනාහි දීඝනිකාය, විමංස සූත්‍රාදීන්ගේ වශයෙන් දතයුතු.

එසේම ප්‍රඥාවෙන් වෙන්ව දානාදී කුශල කර්මයෝ පිරිසිදු නොවෙත්. තම තමන්ගේ ක්‍රියා සිද්ධියෙහි සමර්ථ නොවෙත්යයි ප්‍රඥාවෙහි ගුණමෙනෙහි කටියුතු. යම්සේ ජීවිතයෙන් වෙන්ව ශරීරයනාත්‍රය නොහොබිද, සප්තනිඝ්‍යාදි තමන්ගේ ක්‍රියාවන්හි යෙදෙන්ට සමර්ථ නොවේද, යම් සේ චක්ෂුරාදි පඤ්චේන්ද්‍රියයෝ විඤ්ඤාණයෙන් වෙන්ව තම තමන්ගේ රූපාදී දර්ශන විෂයෙහි කටයුතු කරන්ට අසමර්ථ වෙත්ද, එසේම ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ ප්‍රඥාවෙන් වෙන්ව සවකෘත්‍ය ප්‍රතිපත්තියෙහි අසමර්ථයෝ වෙතියි ප්‍රඥාව පරිත්‍යාගාදි ප්‍රතිපත්තියෙහි ප්‍රධාන කාරණයක් වේ. දල්වනලද ප්‍රඥාව තමැති ඇස් ඇති මහා බෝධිසත්ත්වයෝ වනාහි තමන්ගේ අඛණ්ඩප්‍රත්‍යඛගයන් දානය කොට්ත් ආත්මෝත්කර්ෂ පරවම්භනය (මේරමාහට නින්ද) නොකරන්නහු වෙත්. බෙහෙත් රැකක්මෙන් විකල්ප රහිත වූවාහු කාලත්‍රයෙහිම හට ගන්නාවූ සොම්නස් ඇත්තාහුවෙත්. ප්‍රඥාවගේ වශයෙන් උපාය කෞශල්‍යය හා යොගය හෙතුකොටගෙන පරිත්‍යාගය තෙම පරහිත ප්‍රවෘත්තියෙන් දානපාරමී බවට පැමිණෙති. තමා සඳහා භව භොග සම්පත් කැමතිව දෙන දානය පහත් වැටියක් මෙන් වන්නේය. (යම්සේ වැට තෙල් ඇතිතාක් පහන දිලිසේද, ඒ තැනිවිට නොදැලේද, එසේම කර්ම ශක්තිය ඇතිවිට විපාක දෙන්නේය. නැතිවිට විපාක නොදෙන්නේයයි කී නියාහි) තෘෂ්ණාදි සංක්ලේශ ධර්මයන් නොතැසීමෙන් ශීල විශුද්ධියක් නොවන්නේය. ශීලවිශුද්ධියක් නැතිකල්හි සමාධි ගුණාධිෂ්ඨානයට පිහිට බවක් කැලම නැත්තේය. නුවණැත්තේම ඒහිභික්ෂු විසිමෙහිද, පඤ්චකාම ගුණයෙහිද, සංසාරයෙහිද ආදීනව හා ප්‍රව්‍රජ්‍යාවෙහිද ධ්‍යානසමාපත්තියෙහිද නිර්වාණයෙහිද අනුසස් මනාකොට සලකන්නේ පැවිදිව ධ්‍යානසමාපත්ති උපදවා නිර්වාණාභිමුඛව යෙස් සන්ද ධ්‍යානසමාපත්ති ආදියෙහි පිහිටුවයි. නුවණින් වෙන්වූ වීර්‍යය අභිඥාව සිද්ධිය නොකරන්නේය. දුරාරමහ බැවිනි. එහෙයින් ප්‍රඥාවෙන් තොරව කරන කායික්‍ය නොකොට තබා පිම උතුම් වන්නේය. ප්‍රඥා සහිතවූ වීර්‍යයෙන් සිඛනොවන්නාවූ

කිසිදෙයක් නම් නැත්තේය. උපායයෙන් යුක්තව කරන කෙසිනි. එසේම නුවණ ඇත්තේම අනුන් විසින් කරන ලද අපකාරාදිය ඉවසන සුභාව අත්තෙක් වෙයි. දුෂ්ප්‍රාඥ තෙමේ නො ඉවසත්තේය. නුවණ නැත්තහුට වනාහි මේරම් විසින් කරන ලද අපකාරයෝ ක්ෂාන්තියට ප්‍රතිපක්ෂවම මතු මතු වැඩෙන්නාහ. නුවණැත්තාහට වනාහි ඒ අපකාරයෝ ක්ෂාන්ති සම්පත් වැඩීම් වශයෙන් සථිරත්වය පිණිසම පවත්නාහුය. නුවණ ඇත්තේම ත්‍රිවිධ සත්‍යයන්ද ඒ සත්‍යයන් ඉපැද්දීමට කාරණයන්ද ඔවුන්ට ප්‍රතිපක්ෂ ධර්මයන්ද තතුවූ පරිද්දෙන් දන අනුන්ට බොරු කාරයෙක් නොවන්නේය. එසේම ප්‍රඥා බලයෙන් තමා උපසම්පාදනය කොට ධෛර්‍ය සම්පත්තියෙන් සියලු පාරමිතාවන්හි නිශ්චල සමාදානයෙහි පිහිටන්නේය. නුවණැත්තේම ප්‍රිය මධ්‍යස්ථ වෛරී පුද්ගලයන්ගේ විභාගයක් නොකොට හැමදෙනා කෙරෙහිම හිත එලවීමෙහි සමර්ථ වන්නේය. එසේම ප්‍රඥාවගේ වශයෙන් ලාභය අලාභය ආදි අෂ්ටලෝක ධර්මය පැමිණි කල්හි නිර්විකාර බැවින් මධ්‍යස්ථ වෙති. මෙසේ සියලු පාරමිතාවන්ටම ප්‍රඥාව පාරිශුද්ධියට කාරණ වන්නේයයි ප්‍රඥාවෙහි ගුණය සැලකිය යුතු. තවද ප්‍රඥාව නැතිව දශාන සමාපත්තියක් (ප්‍රථම ධ්‍යාන සමාපත්තියක්) නැත. අනතුරුවූ දෘෂ්ටිසමාපත්තියකුදු නැත. ශීල සමාපත්තියක කුදු නැත. සීල දෘෂ්ටි සමාපත්ති නැත්තාහට සමාධි සමාපත්තියක කුදු නැත්තේය. සමාධියෙන් අසමාහිත (නොසන්සුන්) වූවහු විසින් ධ්‍යාන ඵලාදි ආත්ම හිත මාත්‍රය කුදු සිද්ධකරන්ට නොහැක. උත්කර්ෂයට ගියාවූ පරහිතය කැලම සිද්ධකරන්ට නොහැක. පරහිත ප්‍රතිපත්තියෙහි පිළිපන්නාවූ තෙප විසින් සකස් කොට ප්‍රඥාව පිරිසිදු කිරීමෙහි අභ්‍යාස කටයුත්තේයයි බෝසතාණන් විසින් තමහට අවවාද දියයුතු. ඒ එසේ මැයි. මහා සත්ත්වයෝම ප්‍රඥානුභාවයෙන් සත්‍යාධිෂ්ඨාන, ත්‍යාගාධිෂ්ඨාන, උපසම්පාධිෂ්ඨාන, ප්‍රඥාධිෂ්ඨාන යන චතුරධිෂ්ඨාන යෙහි පිහිටා සත්‍යය, ප්‍රිය වචනය, අර්ථක්‍රියා, සමානාත්මතාය යන සතර සංග්‍රහ වස්තූන්ගෙන් ලොවට අනුග්‍රහ කරන්නාහු සත්ත්වයන් නෛර්‍යාණික මාර්ගයට බස්වත්. ඔවුන්ගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය යනුදු මූකුර වන්නාහුය. එසේම ප්‍රඥා බලයෙන් රූපස්කන්ධාදි පඤ්චස්කන්ධයෙහිද චක්ඛ්වායතනාදි ද්වාදශායතනයන්ද කෙරෙහිද

විතිවිද පවත්නා නුවණ බහුලකොට ඇත්තෝ "අවිජ්ජා පච්චයා සංඛාරා" යනාදීන් ප්‍රවෘත්තියද, "අවිජ්ජා නිරෝධා සංඛාර නිරෝධෝ" යනාදීන් දක්වන ලද සංසාර නිවෘත්තියද තතුවූ පරිද්දෙන් දැන දුනාදි ගුණ විශෙෂයන් නිමේද භාගිය බවට හෙවත් නිර්‍වාණ ප්‍රති වෙධය හජතය කරන බවට පමුණුවමින් බොධි සත්ව ශික්ෂාවෙහි සම්පූර්ණකාරී වන්නෝයයි. මේ ආදි නොයෙක් ප්‍රකාරයෙන් විස්තරවූ ප්‍රඥා ගුණය මනාකොට සලකා ප්‍රඥා පාරමිතාව වැඩිය යුතු.

එසේම පෙතෙන්නාවූ නිඝ්‍යා ඇති ලෞකික කර්මයෝද හිතවූ වීර්‍යය ඇත්තහු විසින් කොට නිමවා ගත නොහැකි වන්නාහ. පටන් ගත් වීර්‍ය ඇත්තාවූ දුක් නො නසන්නාහු විසින් නොලැබිය හැකි දෙයක් නැත. ඒ එසේ මැයි: හිත වීර්‍ය ඇත්තේ "සසර නමැති මහ වතුරෙන් සියලු සත්ත්වයන් එතර කෙරෙමි"යි පටන් ගත්ට පසු නොහැකි වන්නේය. මධ්‍යම වීර්‍ය ඇති නැනැත්තේ පටන් ගෙන අතර තුරම නිමාවට පැමිණෙන්නේය. උත්කෘෂ්ට වීර්‍ය ඇති පුද්ගල තෙම චතාහි ආත්ම සුඛයෙහි අපෙක්ෂා රහිතව වීර්‍ය වඩා පරතෙරට පැමිණෙන්නේ යයි වීර්‍ය සම්පත්තිය ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තිය. තවද යමක්හුගේ චතාහි තමන්ම සසර නමැති මඩින් එතර වන්ට ආරම්භය වේද, ඔහුගේ වීර්‍යය සිටිලවූ කල්හි මහ දෙළ මුදුන් පමුණුවන්ට නොහැක්කේය. දෙවියන් සහිත ලොකයා එතර කරනු පිණිස කරතලද අභිනීහාර ඇත්තහු විසින් සිතන්ටත් කැලම් නොහැක. තවද රාගාදිවූ දෙඹ සමූහයන් මත්වූ මහ ඇතුන් මෙන් නොවැළකිය හැකි බැවින්ද, ඒ රාගාදීන් මුල් කොට ඇති කෙලියන්ගේ සමාදානය චතාහි ඔහොගත් කඩු ඇති වධකයක්හු හා සමාන බැවින්ද, ඒ පාප කර්මය කාරණ කොට ඇති නරකාදි දුකෙහි චතාහි හැම කලම නොවසන ලද දෙර ඇති බැවින්ද, ඒ අකුශලයෙහි යොදන්නාවූ පාප මිත්‍රයන් හැම කලම සම්පයෙහි හැවසීගෙන සිටින බැවින්ද අඥාන පෘථජන බව ඇති කල්හි ඒ පාප මිත්‍රයන් කී අවවාද කරන බැවින්ද සසර දුකින් තමාම මිදෙන්ට සුදුසු යයිද මිථ්‍යා විතර්කයෝ වීර්‍යානුභාවයෙන් දුරු වන්නෝ යයිද, ඉදින් චතාහි සම්‍යක් සම්බොධිය ආත්මාධීන වීර්‍යයෙන් අවබොධ කරන්ට හැකිවී නම් එබඳු වීර්‍යයෙහි දුෂ්කර යන්නම් කවරේදැයි යන මේ ක්‍රමයෙන් වීර්‍යයෙහි ගුණයෝ, සැලකිය යුත්නාහ.

එසේම ක්ෂාන්තිය වනාහි නිරවශේෂ ගුණයට ප්‍රතිපක්ෂවූ ක්‍රෝධය දුරුකරන හෙයින් ගුණධර්ම සම්පාදනයෙහි සත්පුරුෂයන්ට නිපුණු ආයුධයෙක අනුන් මැඩ පවත්වන්ට සමර්ථවූ ආභරණයෙක. මහණ බමුණන්ට බල සම්පත්තියෙක. කෝතිනි නිවන දිය දහරෙක. සුන්දරවූ කීර්ති සෞඛ්‍ය හටගන්නා ප්‍රදේශයක. පාප පුද්ගලයන්ගේ වාග්විෂ නසන්නාවූ මන්ත්‍රෞෂධයෙක. සංවරයෙහි පිහිටියවුන්ට උත්තමවූ වීර්‍ය ප්‍රකෘතියෙක. ගැඹුරු අදහස් ඇති බැවින් සාගරයෙක. චෙෂ තමැති මහා සාගරයාගේ වෙරළෙක. අපායෙහි දොරකඩ වසන කවුළුවක. දෙව්ලොවට බඹලොවට නගින හිණි මගෙක. සියලු ගුණයන් වසන භූමියෙක. උතුම්වූ කෘ විසි මුනි යන තිදෙර පිරිසිදු කිරිමෙකැයි මෙතෙහි කටයුතු. තවද මේ සත්ත්වයෝ ක්ෂාන්ති සම්පත් නැති බැවින් මෙලොවත් සන්තාප කරවූ ක්‍රෝධ ධර්මය අනුව තැවෙති. පරලොවද තැවෙති. ඉදින් අනුන් විසින් කරනලද අපකාර හෙතු කොටගෙන දුක් උපදීද, ඒ දුකට ක්ෂෙත්‍රවූ ආත්ම භාවයද, ඊට බිජුවටක් වැනිවූ කර්මයද මා විසින් නැති කරන ලද්දේයැයිද; ඒ දුකට මේ ක්ෂාන්තිය සහ තැනි බව කාරණ යැයිද, අපකාර කරන්නහු තැනි කල්හි කෙසේ නම් මට ක්ෂාන්ති සම්පත් සිඛවේයයිද සැලකිය යුතු. ඉදින් වනාහි දැන් මේ තෙම මට අපකාරකයෙක් වී නමුත් පෙර මොහු විසින් මට උපකාර කරන ලද්දේ වේදැයි අපකාරයම ක්ෂාන්තියට කාරණ හෙයින් උපකාරයක් වන්නේයයිද, මේ සියලු සත්ත්වයෝ මට දරුවන් හා සමානයැ, දරුවන් විසින් කරනලද අපරාධයට කවරෙක්නම් කිපේදැයි කියාද, යම් ක්‍රෝධ නමැති යක්ෂා වෙශයකින් මොහු මට අපරාධකෙරේද, යම් ඒ ක්‍රෝධ නමැති යක්ෂා වෙශය තෙම මා විසින් දුරු කටයුතුයයි කියාද; යම් අපකාරයක් හෙතුකොට ගෙන මට මේ දුක් උපන්නේ වීනම් ඊට මමත් කාරණ වෙමියි කියාද; යම් ධර්මකෙණෙකුත් කාරණ කොටගෙන අපරාධය කරන ලද්දේද, යම්කිහු විෂයෙහි අපරාධ කරන ලද්දේද ඒ සියල්ලෝම එකණෙහි ම නිරුබවූහ, දැන්වූකලී කවුරකුට කවරෙක් ක්‍රෝධ කෙරේදැයි කියාද; සියලු ධර්මයන් ක්ෂණික බැවින් කවුරෙක් කවරකුහට අපරාධ කෙරේදැයි ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු විසින්

ක්ෂාන්ති සම්පන්නිය වැඩිය යුතුය. ඉදින් එතෑහි මෝහට බොහෝ කලක් පුරුදු වීමෙන් පරාපකාරය කාරණාකොට ඇති ක්‍රොධය සිත මැඩගෙන සිටීද, ඔහු විසින් මෙසේ සැලකිය යුතු. කෙසේදයත්: මේ ක්ෂාන්තිය තම් අනුත් කළ අපරාධයට ප්‍රතිපක්ෂ ප්‍රතිපත්තියක. ප්‍රත්‍යුපකාර කිරීමක් නොවේ යයිද; අපරාධයම් මට "දුක්ඛඵලනිඝා සඛා" යි දුක් ඉපදවීමෙන් සැදෑහෑ ඉපදවීමටත් සියලු ලොකයෙහි අනභිරති සංඥාවටත් හෙතුවන්නේයයි කියාද; යම් මේ ඉෂ්ටානිෂ්ට රූපාදි ආලම්බනයන් හා සමායෝගයක් වේද ඕ එතෑහි ඉන්ද්‍රියයන්ගේ සවභාවයක් වන්නිය, එහි "අනිෂ්ටවූ රූපාදී ආලම්බනයන් හා සංයෝගය මට නොවන්නේවා"යි යන යම් සිතිවිල්ලක් ඇද්ද ඒ නොලැබිය හැකිවන්නේයයිද; ක්‍රොධ වසඟයට ගියාවූ සත්ත්ව තෙම ක්‍රොධයෙන් උමතුවූයේ වික්ෂිප්තයට පැමිණි සිත් ඇත්තේය. එසේවූ ඔහු කෙරෙහි ක්‍රොධය දියුණුවීමට ප්‍රත්‍යුපකාර කිරීමෙන් කවර ප්‍රයෝජනදැයි කියාද; මේ සියලු සත්ත්වයෝ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ විසින් ඔවරස ප්‍රත්‍රාඥන් මෙන් රක්නා ලද්ද, හුය, එහෙයින් ඒ සත්ත්වයන් කෙරෙහි මාවිසින් සිත් කොප නොකටයුතුයයි කියාද; අපරාධය හා ගුණය යමක්හට ඇතිකල්හි අපරාධය දුරුකොට ගුණවත්වූ මොහු කෙරෙහි මාවිසින් කොප නොකටයුතුයයි කියාද; ගුණයක් නැතිකල්හි තම් විශෙෂයෙන් දයා කටයුතුයයි කියාද; කොපයෙන් මාගේ ගුණය හා කීර්තිය පිරිහෙන්නේයයි කියාද; කිපීමෙන් මට දුර්ණි දුඃඛ ශය්‍යාදි සතුරන් විසින් කැමතිවන ලද අමනොඥ සවරූපයෝ පැමිණෙන්යයි කියාද; මේ ක්‍රොධය තම් සියලු අවැඩට කාරණවූ සියලුවැඩ නසන්නාවූ බලවත් පසම්තුරෙකැයි කියාද; ක්ෂාන්තිය ඇතිකල්හි පසම්තුරුවූ කිසිකෙනෙක් නැතැයි කියාද; අපරාධ කළහු විසින් තමා කළ අපරාධය කාරණකොට මතු ලැබිය යුතු යම් දුකෙක් වේද ක්ෂාන්තිය ඇතිකල්හි ඒද මට නොවන්නේයයි සිතීමෙන්ද; කිපෙන්නාවූ මාවිසින් සතුරා අනුව යන ලද්දේ වන්නේයයි කියාද මා විසින් ක්‍රොධය ක්ෂාන්තියෙන් මැඩ පැවැත්වූ කල්හි ඊට දැසවූ පස මිතුරා මනාකොටම මඩින ලද්දේයයි කියාද; ක්‍රොධය හෙතුකොට ගෙන ක්ෂාන්ති ගුණය හැරපීම මට සුදුසු නොවන්නේයයි කියාද; ගුණ විනාශ කරන්නාවූ ක්‍රොධය ඇති

කල්හි මට ශීලාදි ගුණ ධර්මයෝ කෙසේ නම් සම්පූර්ණ වෙත්දැයි කියාද; ඒ ශීලාදි ගුණ ධර්ම තැති කල්හි කෙසේ නම් මම සත්ත්වයන්ට උපකාර බහුලවූයෙම් ප්‍රතිඥා රූප උතුම් සැප ඵට (නිවනට) පැමිණෙත්නෙමිදැයි කියාද: ක්ෂාන්තිය ඇතිකල්හි ඛාහිරවූ වික්ෂේපයක් තැති බැවින් එකඟවූ සිත් ඇත්තාහට සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය හෙයින්ද, දුඃඛ හෙයින්ද, සියලු ධර්මයෝ අනාත්ම හෙයින්ද, නිර්වාණය අසංස්කෘතාමෘත ශූන්‍යාප්‍රණිහිතාදී භාවයෙන්ද සිතට වැටහෙන්නාහයි කියාද; බුඩ ධර්මයෝද අචින්ත්‍ය අප්‍රමේය ප්‍රභාව ඇත්තාහුයයිද වැට හෙත්නාහ. ඉක්බිති මාගිනු ලොම ක්ෂාන්තියෙහි පිහිටියේ හුදෙක් මේ සංස්කාරාදීහු ආත්ම ආත්මීය භාවයක් නැත්තාහු ධර්ම මාත්‍රවූවාහු නම තමන් ප්‍රත්‍යයෙන් උපදනාහුද නසන්නාහුද වෙති, කිසි තැනකින් නොඑති, කිසි තැනකට නොයෙති, කිසිතැනකත් නොපිහිටති. මේ ධර්මයන් අතරෙන් කිසිවක් කිසි චක්ෂුගේ කාර්‍යයෙහි ව්‍යාපෘත නොවන්නේය, මමය මාගේය යන අහංකාර මමංකාරය පිහිට කොට නැත්තේයයි නුවණට වැටහේ, යම් වැටහීමක් කරණ කොට ගෙන බොධි සත්ත්වයෝ සම්‍යක් සම්බොධියට නියතවූවාහු පෙරළෙන්නාවූ සුභාව යක් නැත්තාහු වෙත්යයි ක්ෂාන්ති පාරමිතාවෙහි ගුණ විශෙෂ ප්‍රත්‍යවෙක්ෂාව දතයුතු.

එසේම සත්‍යයෙන් වෙන්ව ශීල සමාධ්‍යාදි ගුණ ධර්මයන් කොලැබිය හැකි බැවින්ද, ප්‍රතිඥා රූපවූ ප්‍රතිපත්තියෙහි පිහිටීමක් නැති හෙයින්ද, සත්‍ය ධර්මය ඉක්මෙන කල්හි සියලු පාප ධර්මයන් අවුත් වදනා බැවින්ද, අසත්‍යයෙන් අසත්‍යය ගළපන් නාවූ පුද්ගලයා ඇදහිලි නොකළ හැකි බැවින්ද මිත්තෙහිත් ඇදහිය යුතු බස් නැති බැවින්ද, සත්‍ය සමාදානය ඇත්තාහට ශීල සමාධ්‍යාදි සියලු ගුණ ධර්මයන් පිහිටන බැවින්ද සත්‍ය ඥානයෙන් සියලු බොධිසම්භාර ධර්මයන්ගේ පිරිසිදු වීමට හා සම්පූර්ණවීමටත් පැමිණෙන බැවින්ද, සත්‍ය ධර්මය විසංවාදනය නොකිරීමෙත් සියලු බොධිසම්භාර කෘත්‍යයෙන් සිද්ධකරන හෙයින්ද, බොධි සම්භාර ප්‍රතිපත්තියෙහි නිමාවට පැමිණෙන හෙයින්දැයි ආදී ක්‍රමයෙන් සත්‍යපාරමිතාවෙහි ආනිසංස සම්පත් ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තිය.

..

එසේම දානාදියෙහි දැස සමාදානයද, ඒ දානාදියට ප්‍රතිපක්ෂ ධර්මයන් රැස්වූ කල්හි ඒ දානාදීන් නිශ්ඵලව ඉටාගැන්මද, ඒ අවලාඩිඝාතයෙහි ධිරවීර භාවයෙන් වෙන්ව දානාදී බෝධි සම්භාර ධර්මයෝ සම්‍යක් සම්බෝධියට කාරණ නොවන්නාහු වෙත්යයි කියා මේ ආදී ක්‍රමයෙන් අධිඝාන පාරමිතාවෙහි ගුණයෝ සැලකිය යුත්තාහ.

එසේම ආත්ම හිත මාත්‍රයක පිහිටන්නහු විසිනුදු සත්ත්වයන් කෙරෙහි හිත චිත්තයක් තැනිව ඉහලොක පරලොක සම්පත්තියට පැමිණෙන්ට නොහැක. සියලු සත්ත්වයන් නිර්වාණ සම්පත්තියෙහි පිහිටුවන්ට කැමැත්තහු විසින් සත්ත්වයන් කෙරෙහි හිත චිත්තයෙන් වෙන්ව කාලම සියලු සැපතට පැමිණිය නොහැක. සියලු සත්ත්වයන්ට ලොකොත්තර සම්පත් ලබාදෙනු කැමැත්තහු විසින් දැන් ලෞකික සම්පත් කැමැති වීම සුදුසුයයි කියාද; දැන් අදහස් පමණකින් අනුන්ට හිත සැප එළවන්ට නොහැකිවූයෙම් තම කවර කලක ප්‍රයොග සම්පත්තින් ඒ හිත සැප සිඛකෙරෙම්දැයි කියාද; දැන් මා විසින් හිත සැප එළවීමෙන් වඩිනය කරන ලද්දහු පසුව මට ධර්ම සංවිභාගයට සහාය වූවෝ වන්නාහයි කියාද; මේ සියලු සත්ත්වයන් ගෙන් වෙන්ව මට බෝධි සම්භාර ධර්මයෝ සිඛ නොවන්නාහයි කියාද; එහෙයින් සියලු බුඛ ගුණ විභූතිය සිඛ කරන්නට කාරණ බැවින් මට මේ සත්ත්වයෝ උතුම් පින් කෙතක, නිරුත්තරවූ කුසල් හටගන්නා ආකරයෙක, උත්තම ගෞරව ස්ථානයක්හි කියාද; ඉතා විශෙෂකොට සියලු සත්ත්වයන් කෙරෙහි හිතාධ්‍යාශය එළවීය යුත්තේය. තවද කරුණාවට පිහිට බැවින්ද සියලු සත්ත්වයන් කෙරෙහි මෙත් වැඩිය යුතුය කියාද; නිරවධිව කරතලද මෛත්‍රී සිතින් සත්ත්වයන් කෙරෙහි හිත සැප එළවීමෙහි නිරත වූවාහට ඒ සත්ත්වයන්ගේ අහිත දුක් දුරුකරනු කැමති බව බලවත්ව උපදියි. සපිරවූ මුල් ඇති කරුණාව සියලු බුඛ කාරක ධර්මයන්ට ප්‍රථම කාරණයක, පාදයෙක, ප්‍රතිඝා වෙක, මුල් කාරණයෙක, මුඛය, ප්‍රමුඛයයි මේ ආදී ක්‍රමයෙන් මෛත්‍රියෙහි ගුණයෝ සැලකිය යුත්තාහ.

එසේම උපෙක්ඛාව නැති කල්හි සත්ත්වයන් විසින් කරනලද ඵ්‍රකාරයෝ සිතට විකාර උපද වන්නාහයි කියාද; චිත්ත විකාර යෙක් ඇති කල්හි දානාදි බොධි සම්භාර ධර්මයන්ගේ ලැබීමක් නැත්තේ යයි කියාද; මෛත්‍රී ස්නෙහයෙන් ස්නෙහවත්වූ (=පිතවනලද) සිතෙහි උපෙක්ඛාවෙන් වෙන්ව බොධි සම්භාර ධර්මයන්ගේ පිරිසිදු බවක් නොවන්නේයයි කියාද; උපෙක්ඛාව නැත්තේ බොධි සම්භාරයෙහි පුණ්‍ය සම්භාරය හා එහි විපාකද සත්ත්වයන්ට වැඩ පිණිස පිරිනමන්ට නොහැකි වන්නේයයි කියාද; උපෙක්ඛාව නැතිකල්හි දායක ප්‍රතිග්‍රාහක දෙදෙනා කෙරෙහි විභාගයක් නොකොට දාන වස්තු පරිත්‍යාග කරන්ට නොහැකි වන්නේයයි කියාද; උපෙක්ඛාව නැත්තහු විසින් ජීවිත ප්‍රවෘත්තියට සුදුසු වස්තූන්ගේද, ජීවිතයාගේද අන්තරාය මෙනෙහි නොකොට සිල් පිරිසිදු කරන්ට නොහැකි යයි කියාද; එසේම උපෙක්ඛ වශයෙන් (වස්තුවෙහි) නොඇල්ම ඇල්ම සහ සේවනය කරන්නා හට නෛෂ්ක්‍රම්‍ය බලය සිඩවන හෙයින්ද; උත්පත්ති හෙයින් බැලීම් වශයෙන්ම බොධි සම්භාර කෘත්‍යය සම්ඵවන හෙයින්ද; අතිශයින් දැඩි කොට පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තාහට උපෙක්ඛා නොකිරීමෙහි වීර්‍ය්‍යකෘත්‍යය නොකරන හෙයින්ද; උපෙක්ඛාවෙන් යුක්ත වූවාහුටම ඤාණනි චින්තාව සිඩවන හෙයින්ද; උපෙක්ඛා වශයෙන් සත්ත්ව සංස්කාරයන් අවිසංවාදනය කරන හෙයින්ද; ලොකධර්මයට උපෙක්ඛා වීමෙන් සමාදන්වූ ධර්මයන්හි නිශ්චලව පිහිටීම සිඩවන හෙයින්ද; පරාපකාරාදියෙහි නොසැලකීම් වශයෙන් මෛත්‍රී විහරණය සම්ඵවන හෙයින්ද; සියලු බොධි සම්භාර ධර්මයන්ගේ සම්දෘතාධිෂ්ඨාන පාරිපූරි නිෂ්පත්තීහු උපෙක්ඛානුභාවයෙන් සිඩවෙත්යයි මේ ආදි ක්‍රමයෙන් උපෙක්ඛා පාරමිතාවෙහි ගුණ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු මෙසේ අපරිත්‍යාග පරිත්‍යාගයන්හිදු පිළිවෙළින් ආදීනව හා ආනිසංස සැලකීම් දානාදි පරම ධර්මයන්ට ප්‍රත්‍යය වේයයි දතයුතු.

එසේම පරිවාර සහිතවූ පඤ්චලෝස්වරණ ධර්මයෝද පඤ්චාභිඥාවෝද දානාදි පාරමීන්ට ප්‍රත්‍යවන්නාහ. එහි වරණ ධර්මයෝ නම්: ශීල සංවරය, ඉන්ද්‍රියයන් කෙරෙහි වසන ලද දොරටු ඇති බවය, භොජනයෙහි පමණ දන්නා බවය, නිද්‍රාවර්ජිත

කිරීමය; සඩා භිරි ඔත්තප්ප බාහුසච්චවිරිය සති පඤ්ඤා යන මේ සප්පා ධම්මයෝය, සතර රූපාවචර ධ්‍යානයෝය යන මොහුයි. ඔවුන් අතුරෙන් ශීලාදි සතර චරණ ධම්මයන්ට තෙළෙස් දුහඟද, අලෝභජ්ඣාදි ගුණයෝද පිරිවර වෙති. සප්පා ධම්මයන් අතුරෙහි බුද්ධානුස්සතියය, ධම්මානුස්සතියය, ශීලානුස්සතියය, චාගානුස්සතියය, උපසමානුස්සතියය, රූක්ෂ (හෙවත් බුදුරුවන් ආදියෙහි ප්‍රසාද ස්නෙහකැති බැවින් සංවුක්ක ළය ඇති) පුද්ගලයන් දුරු කිරීමය, සිනිදු ළය ඇති පුද්ගලයන් සේවනය කිරීමය, ප්‍රසාද කටයුතුවූ ධම්මයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, එහි නැමුණු බවය යන මේ ධම්මයෝ ශ්‍රද්ධාවට පිරිවර වෙත්. අකුශලාදීන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, අපායෙහි ආදීනව ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, කුශල ධම්මයන්ට උපකාර බව සැල කිමය, භිරිඔතප් නැති පුද්ගලයන් දුරු කිරීමය, භිරිඔතප් ඇති පුද්ගලයන් සෙවනය කිරීමය, එහි නැමුණු බවය, යන මොහු භිරිඔත්තප්ප දෙකට පිරිවර වෙත්. පුථුජ්ජනගත ධම්මාථියන් පිළිබිඳින බවය, සඩ්මානි ජොහය, නිරවද්‍ය විද්‍යුස්ථානාදියෙහි පරිචය, මේරු ඉදුරන් ඇති බවය, කෙලෙස් දුරුකරන බවය, අල්පශ්‍රැත පුද්ගලයන් දුරුකරන බවය, බහුශ්‍රැතයන් සෙවනය කිරීමය, එහි නැමුණු බවය, යන මොහු බහුශ්‍රැත බවට පිරිවර වෙත්. අපාය භය සැලකීමය, යායුතු මහ සැලකීමය, ධම්මයාගේ මහත් බව සැලකීමය, පිතම්බ දෙදෙනාගේ දුරු කිරීම්ය, කුසිත පුද්ගලයන් දුරු කිරීම, පටන්ගත් වීර්‍ය්‍ය ඇති පුද්ගලයන් සෙවනය කිරීමය, සම්‍යක් ප්‍රධානයන් සැලකීමය යන මොහු වීර්‍ය්‍යට පිරිවර වෙත්. හැමතන්හි සිහිනුවණ දෙකය, මුළා සිහි ඇති පුද්ගලයන් දුරු කිරීමය, එළඹ සිටි සිහි ඇති පුද්ගලයන් සෙවනය කිරීමය, එහි නැමුණු බවය, යන මොහු සිහියට පිරිවර වෙත්, පිළිවිසන බවය, අධ්‍යාත්මික බාහිර වස්තූන් පිරිසිදු කිරීමය, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ සම බව කිරීමය, දුෂ්ප්‍රාඥ පුද්ගලයන් දුරු කිරීමය, නුවණැති පුද්ගලයන් සේවනය කිරීමය, ගැඹුරුවූ ස්කන්ධාදි ධම්මයන් කෙරෙහි පැවති ගැඹුරු ප්‍රඥාහුගේ ප්‍රභෙද ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, එහි නැමුණු බවය, යන මොහු ප්‍රඥාවට පිරිවර වෙත්. ශීලාදී චතුස්කය, අටසිස් අරමුණු කෙරෙන් පුථුජ්ජනාගත භාවනාවද, ආවජ්ජනාදියෙහි වසිභාව කරණයද සතර වැදැරුම් ධ්‍යානයන්ට පිරිවර වෙත්.

එහි ශීලාදි ප්‍රයොග ශුද්ධියෙන් සත්ත්වයන්ට අභය දීමෙහිද, ආශය ශුද්ධියෙන් ආමිස දානයෙහිද, ප්‍රයොග ආශය දෙදෙනාගේ ශුද්ධියෙන් ධර්මදානයෙහිද සමෘර්ධ වන්නේයයි යනාදීන් දානාදි බොධිසම්භාරයන්ට වරණ ධර්මාදීන්ගේ ප්‍රත්‍යය බව සූදුසු පරිදි දෙන් නිර්ධාරණය කටයුතු. ඉතා විස්තර වේදෝයි හයින් නිර්ධාරණය නොකෙළෙමු. මෙහේ හෙයින් සම්පත්ති චක්‍රාදි හුද දානාදීන්ට ප්‍රත්‍යය වෙත් යයි දතයුතු.

7 "ඔබුන්ගේ ක්ලේශීම කවරේද?" යන මෙහි සාමාන්‍ය යෙන් තෘෂ්ණාදීන් විසින් පරාමර්ශිතය කරන ලද (=අල්වා ගත්තා ලද) බව පාරමීන්ගේ සංක්ලේශය (=ක්ලේශීම) වෙයි. විශෙෂ යෙන් වනාහි "මේතම් දෑ දිය යුතුය, මෙතම් දෑ නොදිය යුතුය, මොහුට දිය යුතුය, මොහුට නොදිය යුතුය"යි දන වසනුන් හා පිළිගන්නවුන් පිළිබඳ විකල්පයෝ දන පාරමිතාවගේ සංක්ලේශ යෝ වෙත්. උත්තම මධ්‍යම අධම වශයෙන් සත්ත්වයන් හා කාලයන් පිළිබඳ විකල්පයෝ ශීල පාරමිතාවිගේද, කාමයන්හි හා භවයන්හි ඇල්මද, ඒ දෙක සංසිදුවීමෙහි නොඇල්මද පිළිබඳ විකල්පයෝ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවගේද, "මම්ය, මාගේය" යන විකල්පයෝ ප්‍රඥා පාරමිතාවගේද, ලීනෞද්ධත්‍යය හෙවත් පිතම්බ නීවරණයාගේ වශයෙන් හැකිළීමත් උද්ධච්චයාගේ වශයෙන් නොසංසිදීමත් පිළිබඳ විකල්පයෝ වීර්‍යපාරමිතාව ගේද, "තමන්ය අනුන්ය" යි දෙඅක්ෂමාව පිළිබඳ විකල්පයෝ ක්ෂාන්ති පාරමිතාවගේද, නොදිටු දෙයෙහි දැකීමයයි කිම යනාදි මිථ්‍යා විකල්පයෝ සත්‍ය පාරමිතාවගේද, බොධිසම්භාර ධර්ම යන්හි දෙම හා ඔවුන්ට විපක්ෂ ධර්මයන්හි ගුණද පිළිබඳ විකල්පයෝ අධිෂ්ඨාන පාරමිතාවගේද, "මොව්හු මාගේ වැඩ පහස්නෝය මොව්හු මාගේ වැඩ පහස්නෝ නොවෙති" යි හිතා හිත විකල්පයෝ මෛත්‍රී පාරමිතාවගේද, "මොව්හු ඉෂ්ටය, මොව්හු අනිෂ්ටය" යි ඉෂ්ටානිෂ්ටයන් පිළිබඳ විකල්පයෝ උපෙක්ෂා පාරමිතාවගේද සංක්ලේශයෝ වෙත්යයි දතයුතු.

8 "ඔබුන්ගේ ව්‍යවදානය කවරේද?" යන මෙහි තණ්හාදීන් විසින් නොපහරන ලද බවද යටකී විකල්ප රහිත බවද මේ පාරමීන්ගේ ව්‍යවදානය (=පිරිසිදු බව) වේයයි දතයුතු. තණ්හා,

මාන, දිට්ඨි, කොධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මද, පමාදාදි කෙලෙසුන්ගෙන් තොපහරණ ලද්දාවූද දෙය ධම් ප්‍රතිග්‍රාහක විකල්ප රහිතවූද දානාදි පාරමිහු පරිශුද්ධවූවාහු ප්‍රභාසවර වූවාහුද වෙති.

9 "ඔවුන්ට ප්‍රතිපක්ෂ ධම්යෝ කවරහුද?" යන මෙහි සාමාන්‍ය යෙන් සියලු සංක්ලෙශ ධම්ත් හැම අකුසලුත් මේ පාරමී ධම් යන්ට ප්‍රතිපක්ෂයෝ වෙත්. විශෙෂයෙන් වනාහි යට කියන ලද මච්ඡරියාදිහු පාරමිත්ට ප්‍රතිපක්ෂයෝ වෙත්යැයි දතයුතු. තවද දෙය ධම් ප්‍රතිග්‍රාහක දාන ඵලයන්හි අලොභය අදොසය අමොහය යන ගුණයන්ගේ යෙදීම කරණ කොට ගෙන ලොභ දොස මොහ යන මොහු දානපාරමිතාවට ප්‍රතිපක්ෂයෝ වෙත්. කාය වංකාදි දෙශයන් දුරුවන බැවින් ශීලය ලොභාදීන්ට ප්‍රතිපක්ෂ වෙයි. කාම සැපය, අනුන් නැසීමය, ආත්මකලමථානු යොගය යන මොවුන් දුරලන බැවින් නෙෂ්ක්‍රම්‍යය යටකී දෙශත්‍රයට ප්‍රතිපක්ෂ වෙයි. ලොභාදීන් අඛකරන හෙයින්ද, ඤණය අඛ නොකරන හෙයින්ද, ප්‍රඥව ලොභාදීන්ට ප්‍රති පක්ෂ වන්නීය. අලීන අනුඛත්‍ය න්‍යායාරම්භ යන වොවුන්ගේ වශයෙන් ලොභාදීහු වීය්‍ර පාරමිතාවට ප්‍රතිපක්ෂ වෙති. ඉෂ්ට නිෂ්ට ශූන්‍යතා යන මොවුන් ඉවසන හෙයින් ක්ෂාන්ති පාරමිතාවට ලොභාදීහු ප්‍රතිපක්ෂ වන්නාහුය. අනුන්ගේ උපකාරයත් හා අපකාරයත් ඇති කල්හිදු යථා සවභාවයෙන් පවත්නා හෙයින් ලොභාදීහු සත්‍ය පාරමිතාවට ප්‍රතිපක්ෂ වෙති. ලොක ධම්යත් මැඩ සමාදන්වූ පරිදි බොධිසම්භාර ධම්යන් කෙරෙහි නොසෙලවෙන හෙයින් අධිෂ්ඨානයට ලොභාදීහු ප්‍රතිපක්ෂ වෙති. නිවරණයන් හෙත් වෙන්වන හෙයින් මෛත්‍රී පාරමිතාව ලොභාදීන්ට ප්‍රතිපක්ෂ වන්නීය. ඉෂ්ටානිෂ්ටයන් කෙරෙහි දයාව හා ක්‍රොධය වළක්වන බැවින්ද සමව පවත්නා බැවින්ද උපෙක්ෂාවට ලොභාදීහු ප්‍රතිපක්ෂයෝයි දතයුතු.

10 "ප්‍රතිපතනිය කවරේද?" යන මේ ප්‍රශ්නයෙහි පළමු කොට සැපට සුදුසු උපකරණය, ශරීරය, ජීවිතය යන මොවුන් පරිත්‍යාගයෙන්ද, භය දුරුකිරීමෙන්ද, ධම්ය කියාදීමෙන්ද, බොහෝ සෙයින් සත්ත්වයන්ට අනුග්‍රහ කිරීම දාන පාරමිහුගේ

ප්‍රතිපත්තිය වෙයි. එහි දානය වනාහි ආමිස දානය, අභය දානය, ධර්මදානයයි දියයුතු වස්තූන්ගේ වශයෙන් ත්‍රිවිධ වේ. ඔවුන් අතරෙන් බෝසතාණන් විසින් දියයුතු වස්තු අධ්‍යාත්මිකය, බාහිරයයි දෙවැදෑරුම් වේ. එහි බාහිර වස්තුව වනාහි

"අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං
සෙය්‍යා වසථ පදීපෙය්‍යං දාන වත්ථූ ඉමේදස"

යනුවෙන් ආහාරදානය, පානදානය, වස්ත්‍රදානය, යාන දානය, මාලාදානය, ගන්ධදානය, විලෙපන දානය, සෙය්‍යාදානය, ආවාසදානය, ප්‍රදීපදානයයි දියයුතු දාන වස්තූන්ගේ වශයෙන් දශවිධ වේ. ආහාරාදිය බාද්‍යභෝජ්‍යාදීන්ගේ විභාග විසින් බොහෝ ආකාර වෙයි. එසේම රූපාරම්මණ දානයෙහි පටන් ධම්මාරම්මණ දානය අවසන්කොට ඇති ආරම්මණයන්ගේ වශයෙන් දානය සවැදෑරුම් වෙයි. රූපාරම්මණාදිහුද නීලාදීන්ගේ විභාග විසින් තොයෙක් වැදෑරුම් වෙයි. එසේම මිණි-රන්-රිදී-මුතු-පබළු ආදියද, කෙත්වත් ආරාමාදියද, දුසිදස් ගව මහිෂාදියද යන මොවුන්ගේ වශයෙන් තත්වැදෑරුම්වේ. ධනය හා උපකරණයන්ගේ වශයෙන් තොයෙක් වැදෑරුම් වේ. එහි මහා පුරුෂයෝ බාහිර වස්තු දෙන තැනැත්තෝ යම්කුට යමකින් ප්‍රයෝජන වේද, එය ඔහුටම දෙති දෙන්නෝද ඔහුට එයින් ප්‍රයෝජන ඇත්තේයයි තමන්ම දාන දෙති. තොඉල් වන ලද්දේ තමුදු දෙති. ඉල්වනු ලබන කල්හි කැලම දෙති. මුක්තවූ ත්‍යාග ඇතිව (යම් කිසිවක් අපෙක්ෂා තොකොට) දෙති. අමුක්ත ත්‍යාග ඇතිව (කිසිවක් අපෙක්ෂා කොට) තොදෙති. පශ්‍යන්නව දෙති. අපශ්‍යන්නව තොදෙති දාන වස්තුව විද්‍යමාන කාලයෙහි ප්‍රත්‍යුපකාර සත්නිශ්‍රිතව තොදෙති. දානවස්තූන්ගේ පශ්‍යන්නයක් නැති කල්හි සංවිභාගාර්හ විභාග කෙරෙති. පරපණ කෑසත්කාවූ ශස්ත්‍ර විෂ මද්‍යාදි දේ තොදෙති. යමක් අනර්ථයෙන් ප්‍රතිසංයුක්තද ප්‍රමාදය එළවන්නේ වේද, එබඳු කෙළී බඩුද තොදෙති. ඉල්වන්කාවූද ශීලනාශවන්ත ආහාර පානාදි අසත්ප්‍රාය දෙයක් හෝ ප්‍රමාණ රහිත දෙයක්

හෝ නොදෙති. එසේම ඉල්වන ලද්දාහු ගෘහස්ථයන්ට සුදුසුවූ දේද පැවිද්දන්ට ශ්‍රමණ සාරූප්‍ය දේද දෙති. මවුපියෝද, ලේ සහිත නැයෝද, මිත්‍රාමාත්‍යයෝද, පුත්‍රදාරාවෝද, දාසකම්කාරයෝද යන මොවුන් අතුරෙන් කිසිවකුහට පිඬා කොට නොදෙත්. උදාරවූ දාන වස්තුවක් දෙමියි ප්‍රතිඥා කොට රැක්ක දේ නොදෙති. ලාභය, සත්කාරය, කීර්තිය යන මොවුන් ඇසුරු කොට නොදෙති. ප්‍රත්‍යුපකාර සන්නිශ්‍රිතව නොදෙති. සම්‍යක් සම්බෝධියෙන් වෙන්වූ විපාකයක් කැමතිව නොදෙති. යාචකයන් හෝ දාන වස්තුව හෝ පිළිකුල් කරමින් නොදෙති. කායවාක් සංයම රහිතවූ ආක්‍රෝශ පරිභව කරන්නාවූ යාචකයන්ට පවා අපවිත්‍රව නොදෙති. එකාන්තයෙන් ප්‍රසන්න සිත් ඇත්තාහු අනුකම්පා කරන්නාහු සකස් කොටම දෙති. කොතුහල මඩගලිකව නොදෙති. කම්ය හා ඵලයද අදහාම දෙති. යාචකයන් පඤ්චුපාසනාදීන් පරිකෙලෙශ කොට නොදෙති. අපරි කෙලෙශවම දෙති. මෙරමා වංචා කරන අනිප්‍රායෙන් හෝ භෙද කරන අනිප්‍රායයෙන් නොදෙති. අක්ලිෂ්ටවූ සිතින්ම දෙති. පරුෂ වචන ඇතිව හෝ බැම හැකුළු මුහුණින් යුක්තව හෝ නොදෙති. ප්‍රිය තෙපුල් ඇත්තාහු සූදු භාෂිවූවාහු ප්‍රමිත වචන ඇත්තාහුම දෙති. සම්දාන වස්තුවෙක්හි උදාරවූ මනොඥ භාවයෙන් හෝ බොහෝකල් පුරුදු කළ බැවින් හෝ ඇල්ම සහභාව ඇති බැවින් හෝ ලොභය ඉතා අධිකවේයයි දන්නාවූ බොධි සත්ත්වයෝ ඒ ලොභය වහාම දුරුකොට යාචකයන් සොයාද දෙත්. දාන වස්තුව මදවූයේද යාචකයෙක් එළඹ සිටියේ නම් ඒ ගැන නොසිතා තමන්ට පිඬාවිද ඒදැ දෙමින් යාචකයාහට ගෞරව කෙරෙති. අකිනීති පණ්ඩිතයන් මෙනි. මහා පුරුෂයෝ තමන්ගේ අඹුදරු දැසි කම්කරුවන් ඉල්වන ලද්දේ නොදන්වන ලද්දාවූ දෙමනසට පැමිණියාවූ ඔවුන් නොදෙති. මොනවට දන්වන ලද්දාවූ සොම්නසට පැමිණියාවුම ඔවුන් දෙති. එසේ දෙන නැකැත්තෝද දාන දාන යක්ෂ රාක්ෂස පිශාචාදීන්ට හෝ රෞද්‍ර ක්‍රියා ඇත්තාවූ මනුෂ්‍යයන්ට හෝ නොදෙති. රාජ්‍යය දන් දෙන්නා-

හුද යම් කෙනෙක් ලොවට අහිත පිණිසද දුක් පිණිසද අනර්ථ පිණිසද පිළිපන්නාහු වෙද්ද, ඔවුන්ට නොදෙත්. යම් කෙනෙක් ධාර්මිකවූවාහුද දැකැමින් ලොව පසස්නාහුද ඔවුන්ට දෙති. මෙසේ පළමු කොට බාහිර වස්තු පරිත්‍යාගයෙහි ප්‍රතිපත්ති ක්‍රමය දතයුතුයි.

අධ්‍යාත්මික දානය වනාහි දෙපරිද්දෙකින් දතයුතු. කෙසේදයත්: යම්සේ කිසියම් පුරුෂයෙක් කාම ඇදීම් හෙතු කොට ගෙන තමන් පරහට පාවා දේද, ඝටහත්වූ දුන භාවයට පැමිණේද, එසේම මහා පුරුෂයෝ සම්‍යක් සම්බොධිය හෙතු කොට ගෙන නිරාමිෂ සිත් ඇත්තාහු සත්ත්වයන්ගේ නිරුත්තරවූ ඝිත සුව කැමැත්තාහු දාන පාරමිතාව සම්පූර්ණ කරනු කැමැත්තාහු තමන් අනුන්ට පාවා දෙත්. දාස භාවයට පැමිණෙති. අත් පා ඇස් ආදි ශරීර අවයව ඒ ඒ දෙයින් ප්‍රයෝජන ඇත්තවුන්ට කම්පිත වීමක් නැත්තාහු මැළි කමක් නැත්තාහු දානය කෙරෙති, එහි නොඇලෙති. හැකිළීමකට නොපැමිණෙති. බාහිර වස්තු පරිත්‍යාගයෙහි යම්සේද, අධ්‍යාත්මික වස්තු පරිත්‍යාගයෙහිත් එසේමැයි. මහා පුරුෂයෝ දෙපරිද්දකින් බාහිර වස්තු පරිත්‍යාග කෙරෙති. ඒ දෙපරිද්ද නම්: කැමති පරිද්දකින් පරිභෝගය පිණිස යාචකයන්ට ඔවුන්ගේ මන දොළ පුරවමින්ද, තමන්ගේ වසීභාවය පිණිසද, යන දෙපරිද්දෙනි. එහි සවිප්‍රකාරයෙන් මූකතාවාහිවූවාහු මෙසේ "මම නොඇල්ම හෙතු කොට ගෙන සම්‍යක් සම්බොධියට පැමිණෙත්නෙමි"යි මෙසේ අධ්‍යාත්මික වස්තුවෙහිත් (නොඇලීම) දතයුතු. එහි දෙත්තාවූ යම් අධ්‍යාත්මික වස්තුවක් යාචකයාහට ඒකාන්තයෙන් හිත පිණිස පවතිද ඒ දාන වස්තුව දෙත්. අනික් වස්තුවක් නොදෙති. මහා පුරුෂයෝ දාන දාන මාරයාහට හෝ හිංසාභිප්‍රාය ඇත්තාවූ මාරපාක්ෂික දෙවියන්හට හෝ තමන්ගේ ආත්ම භාවය හෝ අංගප්‍රත්‍යඞ්ග හෝ 'ඔවුන්ට අනර්ථයක් නොවේවා'යි නොදෙති. මාරපාක්ෂික දෙවියන්ට යම්සේද, ඔවුන් විසින් අධිෂ්ඨිතවූවන්ටත් එසේම නොදෙති. උමතුවන්ටත් නොදෙති. සෙස්සන්ට වනාහි ඉල්ලීම් හා සමගම දෙති. කුමක් හෙයින්ද යත්? එවැනි ඉල්ලීමක් දුර්ලභ හෙයින්ද, එවැනි දීමක් දුෂ්කර හෙයින්ද වෙති.

අභය දානය වනාහි රජුන් ගෙන්ද, සොරුන් ගෙන්ද, කිස්කෙන්ද, ජලයෙන්ද, වෛරී පුද්ගලයන් ගෙන්ද, සිංහ ව්‍යාඝ්‍රාදී චණ්ඩ මෘගයන් නෙන්ද නා යක් රකුසු පිසස් ආදීන් ගෙන්ද සත්ත්වයන්ට භය එළඹ සිටිකල්හි ඊට පිහිටවීම වශයෙන් දතයුතු.

ධර්මදානය නම් (ලොභාදියෙන්) නොකිලිටි සිත් ඇත්තහුගේ විපල්‍යාස රහිතවූ ධර්මදේශනාවයි. මේලොවින් හා පරලොවින් වන අර්ථ, නිර්‍වාණ සංඛ්‍යාත පරමාර්ථ යන මේ අර්ථයන්ගේ වශයෙන් යුක්ති සංගතවූ හිතොපදේශයයි. ඒ ධර්මදේශනාව කරණ කොට ගෙන ශාසනයට නොබැස ගත්තාවුන්ගේ බස්වා හැන්මද, බැස ගත්තවුන්ගේ මූකුරු වීමද වේ. එහි මේ ක්‍රමය වෙයි: පළමු කොටම සැකවින් දාන කථාවය, ශීල කථාවය, සවර්ග කථාවය කාමයන්ගේ ආදීනවය, නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් කිමය යනුද විස්තර වශයෙන් වනාහි ශ්‍රාවක බෝධියෙහි ඇලුණු සිත් ඇත්තවුන්ට සරණාගමනය, ශීලසංවරය, චක්ෂුරාදී ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇති බවය, ආහාරයෙහි පමණ දන්නා බවය, නිදිදුරු කිරීමෙහි යෙදීමය, (ශ්‍රද්ධාදී) සප්තධර්මයෝය, (පෘථිව්‍යාදී) අටනිස් අරමුණෙහි ක්‍රියා කිරීම් වශයෙන් සමථයෙහි යෙදීමය, (රූපස්කන්ධාදි) විදර්ශනානිමිත්තයෙහි ධර්මයන්හි සුදුසු පරිද්දෙන් දැසග්‍රාහමුඛයෙන් විදර්ශනා වෙහි යෙදීමය, එසේම ශීලවිශුද්ධි ආදීවූ විශුද්ධි ප්‍රතිපදාවය, ශ්‍රෝතාපත්ති මාර්ගාදි ලෝකොත්තර කුශල ධර්මයන්හි මාර්ගීන්‍යමයයි කියනලද සම්මත්තනියාමගහණය, ත්‍රිවිද්‍යාවය, ෂඩභිඥය, සිවුපිළිසිඹියා, ශ්‍රාවක බෝධියයි යන මොවුන්ගේ ගුණයන් වර්ණනා කිරීම වශයෙන් සුදුසු පරිද්දෙන් ඒ ඒ ධර්මයන්හි පිහිටුවීමය, පිරිසිදු කිරීමය යනුද (ක්‍රමයයි) එසේම ප්‍රත්‍යේක බෝධිය හා සම්‍යක් සම්බෝධියෙහිද ඇළුණු සත්ත්වයන්ට සුදුසු පරිද්දෙන් දානාදි දශපාරමිතාවන්ගේ සවභාව කෘත්‍ය ලක්ෂණාදීන් වර්ණනා මුඛයෙන් තුන් කල්හිම ඒ බුදුවරයන්ගේ මහානුභාවය විභාවනයෙහි ක්‍රමයන්ගේද පිහිටුවීමය පිරිසිදු කිරීමය යන මොවුහුද එහි පිළිවෙළ වෙති. මේ ක්‍රමයෙන් මහා පුරුෂයෝ සත්ත්වයන්ට ධර්මදානය දෙති.

තවද මහා පුරුෂයෝ සත්ත්වයන්ට ආමිස දානය දෙන්නාහු මම මේ දානයෙන් සත්ත්වයන්ට ආයුෂය, වර්ණය, සැපය බලය, ප්‍රතිභාණය යනාදී සම්පත්ද සිත්කැලුවූ අග්‍රඵල සම්පත් යයි කියන ලද අමීසයද සිඩ කෙරෙමියි ආහාර දත් දෙති. එසේම සත්ත්වයන්ගේ කාම කෙලෙස පිපාසාවන් සංසිඳවනු පිණිස පැන් දෙත්. එසේම රත්වත් බව පිණිසද කිරිඹතප් හමැති ආභරණයාගේ නිෂ්පත්තිය පිණිසද වස්ත්‍ර දානය කෙරෙත්. එසේම ශීල සුගන්ධයාගේ නිෂ්පත්තිය පිණිස සුගන්ධ දානය කෙරෙති. එසේම බුඩගුණ සොභාවගේ නිෂ්පත්තිය පිණිස මාලා විලෙපන දානය කෙරෙති බොධි මණ්ඩාසන නිෂ්පත්තිය පිණිස ආසන දානය කෙරෙති. එසේම තථාගත ශෙයය්‍යා නිෂ්පත්තිය පිණිස ශෙයය්‍යා දානය කෙරෙති. සරණ භාව නිෂ්පත්තිය පිණිස ආවාස දානය කෙරෙති. පස් ඇස් ලැබීම පිණිස ප්‍රදීප දානය කෙරෙති. ව්‍යාමප්‍රභාව නිපදවනු පිණිස රූප දානය කෙරෙති. බ්‍රහ්මස්වර නිෂ්පත්තිය පිණිස ශබ්ද දානය කෙරෙති. සියලු ලොකයාට ප්‍රිය භාවය පිණිස රස දානය කෙරෙති. බුඩසුඛුමාල භාවය පිණිස ස්ප්‍රෂ්ටව්‍ය දානය කෙරෙත්. ජරා මරණ නැතිවනු පිණිස හෙසජ්ජ දානය කෙරෙති. කෙලෙසදුස්සත්ත්වයෙන් මිදෙනු පිණිස (දුසයන් නිදහස් කිරීමයයි කියන ලද) භූජිස්ස දානය කෙරෙති. සඩමීහිරතිය පිණිස නිරවද්‍යවූ ක්‍රීඩාරතියට හෙතු දානය දෙත්. සියලු සත්ත්වයන් ආර්‍ය්‍ය ජාතියෙන් තමන්ගේ පුත්‍රභාවයට පමුණුවන පිණිස පුත්‍ර දානය දෙත්. සියලු ලොකයාගේ සවාමි භාවයට පැමිණීම පිණිස දාරා දානය කෙරෙත්. ශුභ ලක්ෂණ සම්පත් පිණිස රත්මිණි මුතු ආදිය දෙත්. අනුබ්‍යඤ්ජන සම්පත් පිණිස නත්වැදුරුම් අලංකාරයන් දෙති. සඩම් භාණ්ඩාගාරය (කොෂාධි ගමය) ලබනු පිණිස මුතු මැණික් ආදි සැපත් පිරුණු කොටුගුළු දෙත්. සඩම්රාජ්‍යය ලබනු පිණිස රාජ්‍ය දානය කෙරෙති. ධ්‍යානාදි සම්පත්තිය පිණිස ආරාමොද්‍යාන තඩාග වනයන් දානය කෙරෙති. චක්‍ර ලක්ෂණයන් ගෙන් විභූතිවූ පාදයෙන් බෝමැඩ කරා එළඹෙනු පිණිස චරණ දානය දෙති. චතුරොඝයන් නිසාරණය කරනු පිණිසද සත්ත්වයන්ට සඩම්ය නමැති අතදීපියන්වද අත් දන් දෙති.

ශ්‍රවේන්ද්‍රියාදීන්ගේ ප්‍රතිලාභය පිණිස කන්නාසාදිය දානය කෙරෙති. සම්පැස් ලැබීම පිණිස ඇස් දන් දෙති. දර්ශනය, ශ්‍රවණය, අනුස්මරණය, පරිචයස්වීය යනාදීන්හි හැමකලම් සියලු සත්ත්වයන්ට හිත සැප එළවන්නාවූද සියලු ලෝවැස්සන් විසින් සම්පැසට පැමිණ ජීවත් විය හැක්කාවූද මාගේ ශරීරය වේවායි මිස් ලේ ආදිය දන් දෙති. මුළු ලොවට උතුම් වෙම්වයි කියා ඉස දන් දෙති.

මෙසේ දන් දෙන්නාවූ මහා බොධි සත්ත්වයෝ එක්විසි අනෙස්සෙන් දන් නොදෙති. මෙරමා පීඩා කොට දන් නොදෙති. භයිඳුන් නොදෙති. ලජ්ජාවෙනුත් නොදෙති. දක්ෂිණාගීයන් කෝප කිරීමෙනුත් නොදෙති. ප්‍රණීතාහාර ඇති කල්හි කටුකාහාර නොදෙති. තමන් උසස් කරනු පිණිසත් මෙරමාහට නින්ද කරනු පිණිසත් නොදෙති. පර ලාභ කැමතිව නොදෙති. යාචකයන්ගේ නින්දව සඳහාත් නොදෙති. අනාදරයෙන් නොදෙති. වැළි කෙසේ දේදයන්: සක්‍රස් කොට දෙති. සියතින්ම දෙති. සුදුසු කාලයෙහි දෙති. ආදර කොට දෙති. විභාගයක් නොකොට දෙති. දන් දෙන්නාහු දෙන්ට පළමු කොටත් දෙමිනුත් දී අන්තයෙහිත් යන තුන් කල්හිම සොම්නසින් යුක්තවම දෙති. එහෙයින්ම දන් දී පසු තැවිලි නොවෙති. ප්‍රතිග්‍රාහකයන්ගේ වශයෙන් මානයක් හෝ අවමානයක් නොකෙරෙති. ප්‍රතිග්‍රාහකයන්ට ප්‍රිය තෙපුල් බෙණෙති. යාචකයන්ගේ වචන දනිති. යාචකයන්ගේ යාචඤ්ඤාවට යොග්‍ය වෙති. පිරිවර සහිතව දන් දෙති. ඒ එසේමැයි. ආහාරය දෙන්නාහු ඒ පිරිවර කොට දෙමියි වස්ත්‍රාදීන් සමග දෙති. එසේම වස්ත්‍ර දෙන්නාහු ඒ පිරිවර සහිත කොට දෙමියි ආහාරාදිය සමග දෙති. යානාදියෙහිත් මේ ක්‍රමය මැයි. එසේම රූප දානය කරන්නාහු ශබ්දාදී ආරම්මණයන්ද ඊට පිරිවර කොට දෙති. සෙසු දානයන්හිත් මේ ක්‍රමය මැයි. එහි රූපදානය නම් නීල පීත ලෝහිතාවදාතාදී වණීයන් අතුරෙන් හෝ පුෂ්ප වස්ත්‍රාදී ද්‍රව්‍යයන් අතුරෙන් සමක් ලැබ රූප වශයෙන් සලකා රූප දානය දෙන්නෙමි මේ මාගේ රූප දානයයි සිතා එබඳුවූ දෙය පිළිගැණීමට

සුදුසුවූ දක්ෂිණාගීයන් කෙරෙහි සවසතුකව දන් පිහිටුවාද, රූප දානය නම් මෙසේ වේයි. ශබ්ද දානය වනාහි හෙරි ශබ්දදීන්ගේ වශයෙන් දතයුතු. එහි ශබ්දය වනාහි අල මූල් ආදිය මේන් උපුටාද නිලුපුල් මිටියක් මේන් අතෙහි තබාද දීමට කොහැකිය. සවසතුකව දෙන්නේ ශබ්ද දානය දෙන්නේ නම් වෙයි. එහෙයින් යම් කලෙක ශබ්ද දානය දෙන්නෙමියි බෙර මිහිඟු බෙර ආදීන් අතුරෙන් කිසියම් තූර්‍යයකින් රත්නත්‍රයට පූජා විශෙෂ පවත්වාද පවත්වවාද, ''මේ මාගේ ශබ්ද දානය''යි කියා බෙර ආදිය හෝ තබාද තබවාද, ධර්මකථිකයන්ට කටහඬ උපදවන බෙහෙත් තෙල් උක්සකුරු ආදිය දානය කෙරේද, ධර්ම ශ්‍රවණයට කොෂණය කෙරේද, උදානසවර යොදා අධ්‍යයන කෙරේද බණ කියාද, උපනිසින්නක කථාව කෙරේද, අනු මෙවෙනි කථාවත් කෙරේද කරවාද, එකල ශබ්ද දානය වෙයි. එසේම ගන්ධදානය වනාහි මූල ගන්ධාදීන් අතුරෙන් යම් කිසි ඇලුම් කටයුතුවූ සුගන්ධ වසතුවක් හෝ ගල්වන ලද්දවූ යම් කිසි සුගන්ධියක් ලැබ ගන්ධ වශයෙන් සලකා 'ගන්ධදානය දෙන්නෙමි''යි 'මේ මාගේ ගන්ධදානය'යි කියා බුඩාදි රත්නත්‍රයට පූජා කෙරේද කරවාද, සුගන්ධ පූජාව පිණිස අගිල් සඳුන් ආදි සුගන්ධ වසතු හෝ පරිත්‍යාග කෙරේද, මේ ගන්ධදානය නම්. එසේම මූලාදි රස වශියන් අතුරෙන් ඇලුම් කටයුතු යම්කිසි රස වසතු වක් ලැබ රස වශයෙන් සලකා රසදානය දෙන්නෙමි ''මේ මාගේ රසදානය''යි කියා දක්ෂිණාගීවරුන්ට දේද, රසවසතුක වූම ධාන්‍ය ඟවාදි පරිත්‍යාග කෙරේද, මේ රසදාන නම්. එසේම සප්‍රෂ්ටව්‍ය දානය වනාහි ඇඳ පුටු ආදීන් දානය කිරීම් වශයෙන්ද, ආසන රණ පාපුරණාදීන්ගේ වශයෙන්ද දතයුතු. යම් කලෙක ඇඳ පුටු බිසි බිම්බොහනාදිය හෝ හඳින පෙරවන වසත්‍රාදි සුඛස්පර්ශී ඇති සින් අලවත්තා වූ නිරවද්‍යවූ ස්ප්‍රෂ්ටව්‍ය වසතුවක් ලැබ සපරී වශයෙන් සලකා ''ස්පර්ශී දානය දෙමි'' ''මේ මාගේ ස්පර්ශී දාන ය''යි දක්ෂිණාගීවරුන්ට කියනලද ආකාර ඇති ස්ප්‍රෂ්ටව්‍ය වසතු වක් ලැබ පරිත්‍යාග කෙරේද මේ ස්පර්ශී දානයයි දතයුතු.

ධර්මදානය වනාහි ධර්මාලම්බනය අභිප්‍රෙත ඛැවින් ඔජදාන පානදාන ජීවිතදාන යන දානයන්ගේ වශයෙන් දතයුතු. ඔජාදි ද්‍රව්‍ය අතුරෙන් යම් කිසිවක් ලැබ ධර්මාලම්බනය වශයෙන් සලකා ධර්මදානය කරන්නෙමි මේ මාගේ ධර්මදානයයි ගිතෙල් වෙඩුරු

ආදි ඔජදානය කෙරේද, අම්බපාකාදි අෂ්ටවිධ පානදානය දේද, ජීවිත දානය සලකා සලාක බත් පාක්ෂික බත් ආදිය දේද, අප හසු බැව්ත් පිඬිතවූ ලෙඩුන්ට වෙදුන් එළඹවද්ද, දුල් ඉරවාද, කෙමින් විකාශ කරවාද, සියොත් මැදුරු විකාශ කරවාද, බැදුමෙන් බැඳුණු සත්ත්වයන් ඉත් මුදවා හරිද, කිසිවකු නොතකවයි කියා බෙර හසුරුවාද, සත්ත්වයන්ගේ දිවිරැක්ම පිණිස සුදුසු අනිකුදු දේ කෙරේද කරවාද, මේ ධර්මදානය නම්. යට කියන ලද ආකාර ඇති ඒ සියලු දාන සම්පත් මුළු ලොවට ගිහි පිණිසත් සැස පිණිසත් පිරිණමති. (පවුණුවති) තමන්හටත් සම්‍යක් සම්බොධිය පිණිසද, අකොප්‍යවූ අහීත් ඵල විමුක්තියටද, ක්ෂය නොවන්නාවූ ඡාතුධිපතියටද, ක්ෂය නොවන්නාවූ විශ්‍යාධිපතියටද, ක්ෂයනොවන්නාවූ සමාධියටද, ක්ෂය නොවන්නාවූ ප්‍රතිභාණයටද, ක්ෂය නොවන්නාවූ ඥාණයටද, ක්ෂය නොවන්නාවූ විමුක්තියටද පවුණු වන්නාහ. මේ දානපාරමිතාව පුරන්නාවූ මහා සත්ත්වයන් විසින් ජීවිතයෙහි අනිත්‍ය සංඥාව එළඹ විය යුත්තිය. එසේම වස්තූන්හි බොහෝ දෙනාට සාධාරණ නොවද උත් වහන්සේ විසින් මෙසෙහි කට යුත්තිය. සත්ත්වයන් කෙරෙහිත් මහා කරුණාව නිතර නිතර එළඹ විය යුත්තිය. මෙසේ වසනුවෙහි ගතයුතු සාරය ගන්නාවූ මහා බොධි සත්ත්වයෝ ගිනිගත් ගෙයකින් මෙන් සියලු වසතුවන් තමනුත් පිටත් කෙරෙමින් කිසිවක් ඉතිරි නොකොට දෙති. කිසිවක් කෙරෙහි විහාගයක් නොකෙරෙති. එකාන්තයෙන් නිරපෙක්ෂවම පරිත්‍යාග කෙරෙති. මේ විකාශි දාන පාරමිතාවගේම ප්‍රතිපත්ති ක්‍රමය වන්නේය.

ශීල පාරමිතාවගේ විකාශි මේ මතු පහළ වන්නේ ප්‍රතිපත්ති ක්‍රමයයි: යම්හෙයකින් සමීඥශීලාලංකාරයෙන් සත්ත්වයන් සරහනු කැමති මහා පුරුෂයන් විසින් පළමු කොට තමන්ගේම ශීලය පිරිසිදු කටයුතු වේද, එහි විකාශි අධ්‍යාශයාගේ විශුද්ධියෙන්ද, සමාදානයෙන්ද, අව්‍යතික්‍රමයෙන්ද, ව්‍යතික්‍රමයක් ඇතිකල්හි නැවත ප්‍රකෘතිවත් කිරීමෙන්ද යන සතරාකාරයෙන් සීලය පිරිසිදු වෙයි. එහි විකාශි විශුද්ධවූ අධ්‍යාශය හෙතුකොට ගෙන සම්භර කෙනෙක් ආත්මාධිපතිව නම්)

ප්‍රධාන කොට) පවට පිළිකුල් කරන සුභාවයක් ඇත්තාහු තමා සතන්හි ලජ්ජා සුභාවය උපදවා පිරිසිදු පැවතුම් ඇත්තාහු වෙති. එසේම මෙරමානෙත් සම්මානය ඇති කල්හි සම්භාවනෙක් ලොකාධිපතිව පවට බිය වෙමින් ඔත්තප්ප ධර්ම (=පවට බය) එළවා පිරිසිදු පැවතුම් ඇත්තාහු වෙති. මේසේ මේ දෙපරිද්දෙන්ම අව්‍යතික්‍රමණය කරත්තාහු ශීලයෙහි පිහිටත්. නැවත කිසිසැලෙක සිතිවුළාවෙන් ශීලයාගේ ඛණ්ඩාදි භාවයක් (කැඩුණු බව ආදියක්) වේනම් කියසැලද ඒ හිරි ඔතප් සපුව කරණකොට ගෙන වහාම එසිත් නැති සිටීමාදියෙන් නැවත ප්‍රකෘතිවත් කෙරෙති.

ඒ මේ ශීලය වහාහි චාරිත්‍ර චාරිත්‍ර වශයෙන් දෙවැදෑරුම්වේ. මේ එහි බොධිසත්ත්වයන්ගේ චාරිත්‍ර ශීලයෙහි ප්‍රතිපත්ති ක්‍රමයයි. සියලු සත්ත්වයන් කෙරෙහි යම්සේ සවිඤ්ඤකයෙහුන් ආඝාතයෙක් (ක්‍රොධයෙක්) නූපදීනම් එසේ දයා සිතින් යුක්ත විය යුතුය. පරොපකාරය පිණිස නිරතවූ බැවින් අනුන් අයත් දේ සිටියකුමෙන් ආමිශිණය නොකට යුත්තේය. ඉදින් වහාහි පැවිදි කෙනෙක් නම් සප්ත මෛත්‍රී ධර්ම සංයොගයෙන් වැළකී බැවින් අබ්‍රහ්ම චරියා වෙනුදු දුරුවෙයි. පරඹුවන් කරා යැමෙන් කැලම වැළකෙති. ඉදින් පැවිදිකෙනෙව ගෘහස්ථ කෙනෙක් නම් පරඹුවත් කෙරෙහි හැමකල්හිම පවිටු සිතකුදු නූපදවති. බණන කල සත්‍යවූද හිතවත්වූද ප්‍රියවූද ප්‍රමාණවත්වූද දහැම් කථාවක් සුදුසු කාලයෙහිම කියති. හැමතන්හිම දැඩි ලොභ නැත්තාහු වෙති. ව්‍යාපාද නැත්තාවූ සිත් ඇත්තාහු වෙති. අවිපශ්‍යාස දර්ශිත ඇත්තාහු වෙති. කර්ම සවකිය කොට ඇති ඥානයෙන් යුක්ත වෙති. මහාකොට (ශොභන සථානයට) ගියාවූ මහාකොට පිළිපත්තාවුන් කෙරෙහි පිහිටි ශ්‍රද්ධාව ඇත්තාහු වෙති. පිහිටි ප්‍රේමය ඇත්තාහු වෙති. මෙසේ සතර අපාඥට හා වූතීන දුඃඛයටද මාගිවූ අකුශල කර්ම පථයන් ගෙන්ද අකුශල ධර්මයන් ගෙන්ද වැළක සුවගි මොක්ෂයන්ට මාගියවූ කුශල කර්ම පථයන්හි පිහිටියාවූ මහා පුරුෂයන්ගේ පිරිසිදුවූ කායවාක් ප්‍රයොගයන් ඇතිබැවින් ප්‍රාථනා පරිද්දෙන් සත්ත්වයන්ගේ හිත සැප එළවන්තාවූ මෙත දෙළ වහාම සමෘඩ වන්නේය. පාරමිහු සමෘඩ වන්නාහ.

මෙසේවූ ඒ බෝසත්හු හිංසාවෙන් වැළැක්ම කරණ කොට ගෙන සත්ත්වයන්ට අභය දානය දෙන්නාහු නිරුපද්‍රවයෙන්ම මෛත්‍රී භාවනාව උපදවා වඩන්නාහුය. එකොළොස් වැදෑරුම් මෛත්‍රියෙහි අනුසස් ලබන්නාහුය. දීඝායුෂ ඇත්තාහු වෙති. ලෙඩදුක් රහිත වූවෝ වෙති. සැප බහුල කොට ඇත්තාහු වෙති. මහා පුරුෂ ලක්ෂණ විශෙෂයට පැමිණෙති. දෙස වාසනාවන් සිද පියති.

එසේම නුදුන් දේ ගැන්මෙන් වැළැක්ම කරණ කොට ගෙන සොරු ආදීන්ට අසාධාරණවූ සම්පත් ලබති. මෙරමා විසින් සැක නොකොට හැකිවෙති, සියලු සත්ත්වයන්ට ප්‍රිය වෙති. මත වඩති. විශ්වාස කටයුත්තාහු වෙති. විභව සම්පත්තියෙහි නො ඇලුණු සිත් ඇත්තාහු වෙති. පරිත්‍යාග ශීලීවෙති. ලොභ වාසනාවන් මුල් සිදපියති.

අබ්‍රහ්මචර්‍යාවෙන් වැළැක්මෙන් වස්තුවෙහි ලොල් නුවුවාහු වෙති. සත්‍යුන්වූ කාය චිත්ත ඇත්තාහු වෙති. සත්ත්වයන්ට ප්‍රියද මනාපද වෙති. සැක නොසැට යුත්තාහු වෙති. සුන්දරවූ කීර්ති ඝොෂණයක් පැණ නගින්නේය. මාගමුත් කෙරෙහි නො ඇලුණු සිත් ඇත්තාහු වෙති. ලොභාධ්‍යාශය නැත්තාහු වෙති. නෛෂ්ක්‍රම්‍යය බහුලකොට ඇත්තාහු වෙති. මහාපුරුෂ ලක්ෂණ විශෙෂයට පැමිණෙති. ලොභ වාසනාවන්ද මුල් සිදපියති.

මෘෂාවාදයෙන් වැළැක්ම හෙතු කොට ගෙන සත්ත්වයන්ට ප්‍රමාණවූ කෙණෙක් වෙති. ඇදහිලි කටයුත්තාහු වෙති. ගත යුතු වචන ඇත්තාහු වෙති. දෙවියන්ට ප්‍රිය මනාප වෙති. සුවඳැති මුඛය ඇති වෙති විශෙෂයෙන් රක්තාලද කාය වාක් සමාචාර ඇත්තාහු වෙති. මහාපුරුෂ ලක්ෂණ විශෙෂයටද පැමිණෙති. කෙලෂ වාසනාවන්ද මුල් සිදපියති.

පිශුන වචනයෙන් වැළකීමෙන් පරෝප ක්‍රමයෙන් නොබිඳිය හැකි කය ඇත්තාහු වෙති. බිදුවාපිය නො හැකි පිරිස්ද ඇත්තාහු වෙති. සඞ්ගීයෙහිද භෙදයකට නො පැමිණෙන්නාවූ ශ්‍රාවක ඇත්තෝ වෙති. දැඩ මිත්‍රයන් ඇත්තාහු වෙති. භවාන්තර යෙහි පුරුදුවූ සත්ත්වයන්ටත් එකාන්තයෙන් ප්‍රියවෙති. කෙලෂ බහුල නොවෙති.

පරුෂ වචනයෙන් වැළැක්ම නිසා සත්ත්වයන්ට ප්‍රියද මනාපද වෙති. සැප විඳින සුළු වෙති. මිගිරි තෙපුල් ඇත්තාහු වෙති. සම්භාවනීයද වෙති. උන් වහන්සේට අෂ්ටාඞ්ග සමන්විතවූ බ්‍රහ්මස්වරය ඇති වෙයි.

ප්‍රලාප වැළැක්මෙන් සත්ත්වයන්ට ප්‍රිය වෙති. මනාප වෙති. ගරු වෙති. සම්භාවනා කටයුත්තෝ වෙති. ගතහැකි බස් ඇත්තාහු වෙති. පුරුදුවූ බස් ඇත්තෝ වෙති. මහෙශාක්‍යද වෙති. මහානුභාව සම්පන්නද වෙති. සප්‍රාතෝචිත ප්‍රඥාවෙන් ප්‍රශ්න විසර්ජනය කරන්නට සමර්ථ වෙති. බුඩ භූමියෙහිත් එකම වචනයකිත් නොයෙක් භාෂා ඇති සත්ත්වයන්ගේ නොයෙක් ප්‍රශ්නයන් විසඳන්ට සමර්ථ වෙති.

අනිධ්‍යා නැති බැවින් කැමති කැමති දේ ලබන සුළුවූවාහු වෙති. උදාරවූ සම්පත්තියෙහිද කැමැත්ත උපදිති. ඉන්ද්‍රිය මහාසාරාදීන් විසින් සම්භාවනා කටයුත්තාහු වෙති. සතුරන් විසින් මැඩ පැවැත්විය නොහැක්කාහු වෙති. ඉන්ද්‍රියයන්ගේ විකල භාවයට සෝ පැමිණෙති. තමා හා සමාන එක පුද්ගල යකුදු නැත්තේය.

අව්‍යාපාදය කරණකොට ගෙන ප්‍රියදර්ශිනිය වෙති. සත්ත්වයන් විසින් සම්භාවනා කටයුත්තාහු වෙති. මෛරමා භිතයෙන් සතුටු කරවන බැවින් සත්ත්වයන් නිරාශාසයෙන්ම පහදවති. රූක්ෂ සවභාව නැත්තාහු වෙති. මෛත්‍රී විහරණයෙන් යුකතවූවාහු වෙති. මහෙශාක්‍ය වෙති. මහත් ආනුභාව ඇත්තාහු වෙති.

මිථ්‍යා දෘෂ්ටිය නැති බැවින් සොඳුරු යහළුවන් ලබති. හිස් සිදුමට පැමිණෙන්නාහුද පවු නොකරති. කර්මය සවකීය කොට ඇති බව දන්නා හෙයින් කෞතුහල මංගලික නොවෙති. ශාසනයෙහි ශ්‍රඩාව පිහිටියා වෙයි. මුල්බැස ගත්තී වෙයි. තථාගතයන්ගේ සතර ආශ්චර්‍ය මාර්ගයෙහි කියනලද බෞධිය අදහති. කසල ගොඩක රාජහංසයකු මෙන් සමයාන්තරයන්හි නො ඇලෙති. අනිත්‍යාදි ලක්ෂණත්‍රය දැන ගැනීමෙහි සමර්ථවෙති. කෙලෙවර අනාවරණ ඥානලාභී වෙති. යම්තාක් සම්‍යක් සම්බෝධියට නො පැමිණෙත් තම් ඒතාක් ඒ ඒ සත්ව නිකායෙහි උත්කෘෂ්ට උත්කෘෂ්ට වෙති. උදාරවූ සම්පත්තීන්වද පැමිණෙති.

මෙසේ මේ ශීලය තම් සියලු සම්පත්තීන් ප්‍රතිෂ්ඨා වන්නේය. සියලු බුඩ ගුණයන්ට උත්පත්ති භූමියක් වන්නේය. සියලු බුඩිකාරක ධර්මයන්ට ප්‍රථම කාරණයක. පාදයෙක. වාරයෙක. ප්‍රඥාබලයෙකැයි බුහුමන් උපදවා කාගවාක් සංගම්යෙහිද, ඉන්ද්‍රිය දමනයෙහිද, ආජීව පාරිශුඩි යෙහිද, ප්‍රත්‍යය පරිභෝගයෙහිද, සිහි නුවණ දෙදෙනාගේ බල යෙන් අප්‍රමාදව ලාභය, සාත්කාරය, සිලෝකය යන මොහු සිදෙන මිතුරකු බදු මූඛ ඇති සතුරකුමෙන් සලකා "කිකිව අණඩං" යනාදින් කියනලද ක්‍රමයෙන් මතාකොට ශීලය සම්පා දනය කටයුත්තේය. පළමු කොටම චාරිත්‍ර ශීලයෙහි මේ ප්‍රති පත්ති ක්‍රමයයි.

චාරිත්‍ර ශීලයෙහි වසාහි ප්‍රතිපත්තිය මෙසේ දතයුතු. මේ ලොකයෙහි මහා බොහි සත්ත්වයෝ ගරු කටයුතු කල්‍යාණ මිත්‍රයන්ට කලින් කල සකසා වැඳීමය, ප්‍රත්‍යුපසථාන කිරීමය, දැදිළි බැඳීමය, සාමීචි කර්මය යන මේ දෑ කරන්නාහු වෙති. එසේම ඔවුන්ට ශීලන් උවටැන් කෙරෙති. කය වෙහෙසා වතාවත් කෙරෙති. සුභාෂිතවූ පද අසා සැබූ තෑද පවත්වති. ගුණවතුන් හේ ගුණවණිතා කෙරෙති. අනුන් කළ අපකාර ඉවසන්නාහු වෙති. උපකාරයන් සිහි කරන්නාහු වෙති. අනුන් විසින් දෙනලද පින් අනුමෝදන් වෙති. තමන් පින් සම්මා සම්බුදු බව පිණිසම පිරිනමන්නාහු වෙති. හැමකල්හිම කුශල ධර්මයන් රැස් කිරීමෙහි අප්‍රමාද විහරණ ඇත්තාහු වෙති. වරද, (ඇතිකල ඒ) වරද වශයෙන් දැක එය සහදැමියන්ට තතුවූ පරිදි ප්‍රකාශ කෙරෙති. මත්තෙහින් මතා පිළිවෙත මතාකොට දුරන්නාහු වෙති. එසේම තමහට අනුරූපවූ සත්ත්වයන්ගේ අපෝප සංහිතවූ ඉතිකතව්‍යයන්හි (මේ කටයුතුය යන ප්‍රකාර ඥානයෙහි) දක්ෂවූවාහු අනලස්වූවාහු සහාය භාවයට පැමිණෙති. සත්ත්වයන්ට ව්‍යාධි ආදි දුක් උපන් කල්හි සුදුසු පරිදි පිළියම් කරන්නාහු වෙති. සත්ත්වයන්ට ඤාති භොගාදියෙන් ව්‍යසන පැමිණි කල්හි උඩරණ සභාවයෙහි පිහිටා ශොක දුරු කෙරෙති. නිග්‍රහ කටයුත්තන්ට හැම කල්හිම අකුශලයෙන් තහා සිටුවා කුශලයෙහි පිහිටුවීම පිණිස ධර්මයෙන්ම නිග්‍රහ

කරත්තාහු වෙති. සංග්‍රහ කට්යුත්තන්ට ධර්මයෙන්ම සංග්‍රහ කරත්තාහු වෙති. පෙර මහාබොධි සත්ත්වයන්ගේ ඉතා උදාර වූ දුෂ්කරවූ තොසිතිය හැකි ආනුභාව ඇති සත්ත්වයන්ට එකා නතයෙන් හිත සැප එළවන්නාවූ යම් චරිත කෙනෙක් ඇද්ද, යම් චරිතයක් කරණකොට ගෙන ඒ මහා බොධි සත්ත්ව වරයන්ගේ බොධි සම්භාරයෝ මතා කොටම මූ කිරීමට හියා හුද, ඒ චරිතයන් අසා උවෙහෂට ත්‍රාසයට (තැති ගැන්මට) තො පැමිණෙත්ද, ඒ මහා පුරුෂයෝද මනුෂ්‍යවූවාහුම වෙත්. කම්යෙන්ම ශික්ෂාවන් පරිපූරණය කිරීමෙන් වැඩි හිය භාවතාව ඇත්තාහු එබදුවූ ඉතා උදාරවූ මහත් ආනුභාව සම්පත්තියෙන් බොධි සම්භාර ධර්මයන්හි උත්කෘෂට පාරමී භාවයට පැමිණියාහු වූවාහුද, එබැවින් මා විසිනුදු ශීලාදි ඒ ශික්ෂාවන්හි මතා කොටම එසේ පිළිපැදිය යුතුය. (කෙසේදයත්:) යම් ප්‍රතිපත්තියක් කරණ කොට ගෙන මමත් පිළිවෙළින් ශික්ෂාව සම්පූර්ණ කොට අවශ්‍යයෙන්ම ඒ පදවියට පැමිණෙත්තෙමියි ශ්‍රද්ධාව පෙරදැරි කොට ඇති වීර්‍යය හැර තො පියමින් මතාකොට ශීලයන්හි සම්පූර්ණ කරත්තෙක් වේද (එහෙයින්ම මා විසිනුදු ශීලාදි වත් මතාකොට පිළිපැදිය යුතුය.) එසේම සැහවී හියාවූ යහපත් සවභාව ඇත්තාහු වෙති. විවෘතවූ අපරාධ ඇත්තාහු වෙති. අල්පෙච්ඡ වෙති. සන්තොෂ වෙති විවෙකයෙහි ඇළෙණාහු වෙති. ගණසංගනිකයෙන් දුරුවූවාහු වෙති. දුක් ඉවසන්තාහු වෙති ත්‍රාසන තොවන සවභාව ඇත්තාහු වෙති. උඩත තොවෙති. උස්වූ මානතළ රහිත වෙති. චපල තොවෙති. රළුවචන නැත්තාහු වෙති. තොවිසුරුණු වචන ඇත්තාහු වෙති. සංසුන් ඉදුරන් ඇත්තාහු වෙති. ඥානවූ සිත් ඇත්තාහු වෙති. කුහන ලපනාදී මිථ්‍යාජීව රහිතවූවාහු වෙති. ආචාරයෙන් හා ගොචරයෙන් යුකතවූවාහු සවල්ප මාත්‍රවූ වරද භය වශයෙන් දක්තා සුළුවූවාහු ශික්ෂාපදයන් සමාදන්ව ගෙන මතාකොට හික්මෙති. පටන් ගත් වීර්‍ය ඇත්තාහු වෙති. හරිතලද ආත්මාලය ඇත්තාහු වෙති. කාය ජීවිත දෙක්හි අපෙක්ෂා රහිත වූවාහු වෙති. කාය ජීවිත දෙක්හි සවල්ප මාත්‍ර වූද අපෙක්ෂාව තො ඉවසති දුරු කෙරෙති. විතෝදය කෙරෙති. අධික මාත්‍ර ජීවිතයෙහි ආශාවක් ඇත කියනුම කවරේද? දුශ්ශීල භාවයට හෙතුවූ ක්‍රෝධය උපනාහය යනාදි සියලු උපක්ලෙශයන් අත්හරිති. විනොදනය කෙරෙති. සවල්ප මාත්‍ර වූද විශෙෂාධි ගමයෙන් සතුටු තොවෙති. සැකයට තොපැමි

ණෙති. යම් හෙයකින් ලබන ලද සම්පත්තිය භාතභාගිය හෝ ඊතිභාගිය හෝ නොවේද, එහේ මතු මත්තෙහි විශෙෂාධි ගමිය පිණිස ව්‍යායාම කෙරෙති. මහා පුරුෂයෝ අඛියත්ව පරිභාගය වෙති. මාගීය කියති. බිහිරත්ව හස්ත මුද්‍රාවෙන් සංඥා දෙති. අවියෙන් අනුග්‍රහ කෙරෙති. ගොළුවත්වද එසේමැයි පිළුන්ව පුටු හෝ යාන දෙති. ශ්‍රබා නැත්තන්ව ශ්‍රබා ප්‍රතිලාභය පිණිස වැයම් කෙරෙති. කම්මැලියන්ව උත්සාහ උපදවනු පිණිසද සිහි මුළාවූවන්ව සිහි එළවනු පිණිසද ඥානනා සිත් ඇත්තවුන්ව සමාධි සම්පත්තිය පිණිසද දුෂ්ප්‍රාඥයන්ව ප්‍රඥාධිගමිය පිණිසද ව්‍යායාම කෙරෙති. කාමච්ඡන්දයෙන් මැඩුණාවුන්ව කාමච්ඡන්දය දුරු කරනු පිණිසද වැයම් කෙරෙති. ව්‍යාපාද පිතමිඛ උඛව්ව කුකකුච්ව විචිකිච්ඡා යන නීවරණයන් ගෙන් මැඩුණාවුන්ව ව්‍යාපාද – පෙ – විචිකිච්ඡා දුරුකරනු පිණිස ව්‍යායාම කෙරෙති. කාම විතර්කාදි මිථ්‍යා විතර්කයෙන් දුරු නුවූවන්ව කාම විතර්කාදි මිථ්‍යා විතර්ක විනොදනය පිණිසද ව්‍යායාම කෙරෙති. පූජෝපකාරි සත්ත්වයන්ව කෘතඥතාව නිසා පූජාභාජිවූවාහු වෙති. ප්‍රියවාදි වෙති. සංග්‍රහ කරන්නාහු වෙති. සමානවූ හෝ අධිකවූ හෝ ප්‍රත්‍යුපකාරයෙන් සම්මානනය කරන්නාහු වෙති. විපත්තියක් පැමිණි කල්හි සහාය කෘත්‍යයෙහි පිහිටති. ඒ ඒ සත්ත්වයන්ගේ ප්‍රකෘතියද සවභාවයද දැනගෙන යම්කුත් සමඟ යම්සේ වාසය කටයුතුද, ඔවුන් සමඟ එසේ වාසය කෙරෙති. යමකු කෙරෙහි යම්සේ පිළිපැදිය යුතුද ඔවුන් කෙරෙහි එසේ පිළිපදිති. ඒද වනාහි අකුශලයෙන් තඟා සිටුවා කුශලයෙහි පිහිටුවීම් වශයෙනි. අන් පරිද්දෙකින් නොවේ. ඒ එසේමය: අනුන්ගේ චිත්තානුරක්ෂණය වනාහි හැම වේලෙහිම බොධි සත්ත්වයන්ගේ කුශලාභි වෘධිය පිණිස වේ. එසේම භිතාධ්‍යාශයෙන්ද මෙරමා භිංසා නොකට යුතු. කලහයක්ද නොකටයුතු මකුබවට නොපැමිණ වියයුතු. අනිකෙකුට කුකුසක්ද නුපද වියයුතු. නිග්‍රහ කටයුතු තන්හි චෝදනා නොකටයුතු. ඉතා පහත් ලෙස පිළිපන්නා හට තමා උසස් තන්හි නොතැබිය යුතු. මෙරමා සමඟ සාමීප්‍රකාරයෙන් සෙවනය නොකටයුතු නොවේ. අධික සෙවනයද නොකටයුතු. නොකල සෙවනයත් නොකටයුතු. සෙවනය කටයුතු. සත්ත්වයන් දෙශ කලානුරූපව සෙවනය

කෙරෙති. අනුන් ඉදිරියෙහි ප්‍රිය සත්ත්වයන්ට ගර්හා නොකෙරෙති. අප්‍රිය ජනයන්ට හෝ ප්‍රශංසා නොකෙරෙති. නොහරිතලද විශ්වාසය ඇත්තාහු වෙති. ධාර්මිකවූ උපනිමන්ත්‍රණය ප්‍රතික්ෂේප නොකෙරෙති. අනුන් නොදැන්වීමට නොපැමිණෙති. අධික වශයෙන් පිළි නොගනිති. ශ්‍රද්ධාසම්පත්තියෙන් යුක්තවූවාහු සද්ධර්මනිසංස කථාවෙන් අතිශයින් සතුටු කෙරෙති. ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා සම්පත්තියෙන් යුක්තවූවාහු ශ්‍රද්ධා-පෙ-ප්‍රඥාවෙන් යුක්ත කථාවෙන් සතුටු කෙරෙති. ඉදින් වනාහි බොධි සත්ත්වයෝ අභිඥා බලයට පැමිණියාහු තම ප්‍රමාදයට පැමිණියාවූ සත්ත්වයන්ට අභිඥා බලයෙන් සුදුසු පරිදි දෙන් නිරයාදීන් දක්වන්නාහු සංවේග උපදවා ශ්‍රද්ධා ශීලාදි කැත්තවුන් ශ්‍රද්ධා ශීලාදීන්හි පිහිටුවති. ශාසනයට ඔස්වති. ශ්‍රද්ධාදි ගුණයන්ගෙන් යුක්තවූවන් මුහුකුරවති. මෙසේ මහා පුරුෂයන්ගේ චාරිත්‍රවූ අප්‍රමාණවූ පුණ්‍යසම්භාරයද කුශලසම්භාරයද මතුමත්තෙහි වැඩෙන්නේයයි දතයුතු. තවද "කිංසීලං? කේනට්ඨේන සීලං?" (ශීලය නම් කිම? කවර අර්ථයකින් ශීලය නම්වේද?) යි යනාදීන් ප්‍රශ්නකොට "පාණාතිපාතාදීහි විරමණාසඞ්ගතපටිවත්තනංවා පුරෙජාතාසඞ්ගතාදයෝ ධම්මා සීලං" (ප්‍රාණඝාතයෙන් වළකින්නාහුගේ හෝ වත් පිළිවෙත් පුරන්නාහුගේ චෛතසිකාදි ධර්මයෝ ශීල නම් වෙති.) යනාදි ක්‍රමයෙන් නොයෙක් ප්‍රකාරයෙන් ශීලයාගේ යම් ඒ විස්තර කථා වක් විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දීද, ඒ සියල්ලම් මෙහි ගෙන කැර කිය යුතු. එහි වනාහි හුදෙක් ශ්‍රාවක බොධි සත්ත්වයන් ගේ වශයෙන් ශීල කථා නොමෝ ප්‍රකාශව එන ලද්දීය. මෙහි වනාහි මහා බෝධිසත්ත්වයන්ගේ වශයෙන් කරුණෝපාය කෞශල්‍ය පූර්ඞ්ගම කොට කියයුත්තිය යන මෙපමණක්ම වෙනස යයි දතයුතු. යම් හෙයකින් මහාපුරුෂයෝ ශීලය තමහට තර කාදි සතර අපායෙහි දුකින් මිදෙනු පිණිසත් සුගතියෙහි රාජ්‍ය සම්පත්ති ප්‍රතිලාභය පිණිසත් චක්‍රවර්ති සම්පත්තිය පිණි සත් දෙව සම්පත්තිය පිණිසත් ශක්‍ර සම්පත්තිය පිණිසත් මාර සම්පත්තිය පිණිසත් බ්‍රහ්ම සම්පත්තිය පිණිසත් තෝ පිරි නමත්ද, එසේම තමහට ත්‍රිවිද්‍යාව පිණිසත් ෂඩභිඥා බව පිණිසත් සිවුපිළිසිඹියාව පිණිසත් ශ්‍රාවක බොධිය

පිණිසත් ප්‍රත්‍යෙක බොධිය පිණිසත් නොපිරිතමති. වැළි කුමක් පිණිසද යත්: සම්‍යක් බුදුබවට පැමිණීමෙත් සියලු සත්ත්වයන් නිරුත්තරවූ ගිලාලංකාරයෙත් සරසනු පිණිසම පිරිතමනී යයි දතයුතු. මේ වනාහි ශීල පාරමිතාවගේ ප්‍රතිපත්ති ක්‍රමයයි.

එසේම යම් හෙයකින් කරුණොපාය කෞශල්‍යයෙන් පරිශෝධිතවූ ආදීනව දැක්ම පෙරදැරිකොට ඇති කාමයන්ගෙත් හා භවයන්ගෙත් නිස්සීම වශයෙත් පැවැත්තාවූ කුශල චිත්තොත්පත්තිය (= කුසල් සිත) නෛෂ්ක්‍රම්‍ය පාරමිතා නම්වේද, එහෙයින් සියලු සංක්ලෙශයන්ට වාසස්ථාන බැවින්ද, අඹුදරු ආදීන්ගෙන් මහත් සම්බාධ (ගැහැට) ඇති බැවින්ද, ගොවිකම් වෙළඳම් ආදි නොයෙක් කර්මාන්ත කිරීමෙන් ව්‍යාකුල (=වියවුල් වන) බැවින්ද හිතිඉගසි විසිම නෛෂ්ක්‍රම්‍ය සැපයට අනවකාශ යයි සැලකිය යුත්තේය. කාමයන්ගේ වනාහි කඩු මුවාත ගල්වතලද මී බින්දු ලෙවීමක් මෙත් සවලපවූ ආස්වාද ඇති බවද, බොහෝ අවැඩ එළවන බවද, විදුලිය ආලෝක (එළි) යෙත් ගතයුතු නැටීමක් මෙත් මද කලක් ලැබිය යුතු බවද දතයුතු. උමතුවූවකුගේ ආභරණයක් මෙත් විපරීත සංඥාවෙත් අනුභව කටයුතුය. මල සැඟව්මෙත් වන සුවයක්මෙත් පිළිගම් කටයුතුය. පැහැති ගලනලද ඇඟිල්ලෙත් ගෙන එන ලද ජලයක් මෙත් අතෘප්තිකරය. ක්ෂුධාවෙත් පීඩිතව වළඳන බොජුනක් මෙත් පීඩා සහිතය. බිළියෙහි අවුණනලද ඇමක් මෙත් ව්‍යසන එළවීමට කාරණ වන්තේය. අග්නි සන්තාපයක් මෙත් තුන්කාලයෙහිම දුක් ඉපදවීමට හේතු වන්නේය. වදුරු ලාටුවක් මෙත් බඹුනයට කාරණ වන්නේය. ගිතෙල් වසාපියන්නාවූ අභිනව පත්‍රයක්මෙත් අනවියන් සඟ වන්නේය. සතුරන් වසන ගමක විසිමක් මෙත් භයට කාරණ වන්නේය. සතුරන් පොෂණය කරන්නකු මෙත් කෙලෙශ මාරාදින්ට ගොදුරු වන්නේය. උත්සව සම්පත්තියක් මෙත් විපරි නාම දුඃඛයෙත් දුක් වන්නේය. බිලයක ගින්නක් මෙත් ඇතුළත දවන්නේය. දිරාගිය කැදල්ලක එල්බසිටියාවූ බිරණ නම්වූ තෘණයෙහි බැඳගත් මී පිඬක්මෙත්

නොයෙක් ආදීනව ඇත්තේය. ලුහුදිය බිමක් මෙන් පිපාසයට කාරණ වන්නේය. රහමෙර බිමක් මෙන් සීත ජනයන් විසින් සෙවුනා ලද්දේය. සවල්පවූ ආසාද ඇති බැවින් ඇට සැකිල්ලකට බදු උපමා ඇත්තේයයි යන මේ ආදී ක්‍රමයෙන් කාමයෙහි ආදීනව සලකා ඊට විපර්‍යාස වශයෙන් නෛෂ්ක්‍රම්‍ය යෙහි (පැවිද්දෙහි) අනුසස් දක්නහු විසින් නෛෂ්ක්‍රම්‍ය සැපය, විවෙක සැපය, උපසම සැපය යනාදි සැපයන්හි නිමිත පොත ප්‍රග්හාර සිතින් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෙහි පිළිපැදිය යුතුය. යම් හෙයකින් වනාහි නෛෂ්ක්‍රම්‍යය ප්‍රව්‍රජ්‍යාව මුල්කොට ඇත්තේ වේද, එහෙයින් පළමු කොට ප්‍රව්‍රජ්‍යාවෙහි පිහිටිය යතුය. ප්‍රව්‍රජ්‍යාවෙහි පිහිටියාවූ මහා සත්ත්වයන් විසින්ද බුඩොත්පාදයක් නැති කල්හි කර්‍මවාදි ක්‍රියාවාදි තාපස පරිව්‍රාජකයන්ගේ ප්‍රව්‍රජ්‍යාව කටයුතුය. සම්‍යක් සම්බුඩයන් ලොව පහළවූ කල්හි උන්වහන්සේලාගේ ශාසනයෙහිම පැවිදිවිය යුතුය. පැවිදිව ඝට කියනලද ශීලයෙහි පිහිටියවුන් විසින් ඒ ශීලපාරමිතාව පිරිසිදු කරනු පිණිස ධුත ගුණයෝ සමාදන් විය යුත්තාහ. සමාදන් වන ලද ධුතධර්‍ම ඇති මහා පුරුෂයෝ ඒ ධුතාංගයන් මනාකොටම පරිහරණය කරන්නාහු අලෝභ වූවාහු සන්තුෂ්ට වූවාහු සලෙලඛ (සැහැල්ලු පැවතුම්) පවිවෙක (විවෙකයෙහි ඇල්ම) අසංසෘෂ්ට, වීර්‍යාරම්භ, සුභරතාදි ගුණ තමැති ජලයෙන් ප්‍රක්ෂාලනය කරනලද කෙලෙස් මල ඇති බැවින් නිරවද්‍යවූ ශීලගුණ ඇත්තාහු පිරිසිදු සියලු සමාචාර ඇත්තාහු පුරාතනවූ ආර්‍ය්‍යවංශත්‍රයෙහි පිහිටියාහු භාවනා රාමතායයි කියනලද සතර වැනි ආර්‍ය්‍ය වංශය ලබනු පිණිස සතළිස් වැදෑරුම් ආරම්මණයන් කෙරෙහි සුදුසු පරිද්දෙන් උපචාරය අප්පණාය ප්‍රභෙද ගතවූ ධ්‍යානය උපදවා වාසය කෙරෙත්ද, මෙසේ උන්වහන්සේ විසින් මනාකොටම නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පුරණ ලද්දී වෙහි. මෙතන්හි තෙළෙස් දුහඟ සමඟ දසකසිණය, දසඅසුභය, දසානුස්සතිය, සතර බ්‍රහ්ම විහරණය, සතර ආරූපයෝය, ආහාරයෙහි ප්‍රතිකූල සංඥාවය, සතර ධාතූන්ගේ ව්‍යවස්ථානයයි කියනලද එසම ව්‍යවස්ථානය යන සම සතළිස් කමටහන්ද භාවනා ක්‍රමයද විස්තර වශයෙන් කියයුත්තාහ. යම් හෙයකින් ඒ සියල්ල විශුඩි මාගී

යෙහි සවිස්තර කොට කියන ලද්දේද, එහෙයින් එහි කියනලද ක්‍රමයෙන්ම දතයුතු. හුදෙක් එතැහි එහි ශ්‍රාවක බෝධි සත්ත්වයන්ගේ වශයෙන් කියන ලද්දේය. මෙහි එතැහි මහා බෝධි සත්ත්වයන්ගේ වශයෙන් කරුණෝපාය කෞශල්‍ය පෙරදැරිකොට කිය යුතුයයි යන මෙතෙක්ම විශෙෂයයි දත යුතුය. මෙසේ මේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමය දතයුතුය.

තවද ප්‍රඥාපාරමිතාව සම්පාදනය කරනු කැමැත්තහු විසින් යම්සේ අන්ධකාරය සමග නො පවතින්නාවූ ප්‍රදීපාලෝකයක් මෙන් ප්‍රඥාව මොහය සමග නොපවතීද, එහෙයින් පළමු කොටම බෝධි සත්ත්වයන් විසින් මොහයට හෙතුවූ කාරණයෝ දුරු කට යුත්තාහුය. එහි මේ මොහ කාරණයෝ තම් වෙති: දුර පෙතසුන්හි හා අධි කුශල ධර්මයෙහි නො ඇල්මය, තෙමේරිය හෙවත් කුශල ක්‍රියාවෙහි කායයාගේ හැකිලෙන බවය, ජෘම්භාය හෙවත් අලස බවය, ගණසංගනිකායෙහි ඇලුම් ඇති බවය, නිද්‍රා ශීලී බවය, (නුවණෙහි) නිශ්චය නැතිබවය, අකුතූහල බවය, මිථ්‍යානිමානය, නොපිළිවිස කරන කථා ඇති බවය, කයට මනාකොට පරිහාර නොකිරීමය, එකහවූ සිත් නැතිබවය, දුෂ්ප්‍රාඥ පුද්ගලයන් සෙවනය කිරීමය, ප්‍රඥවත් පුද්ගලයන් සෙවනය නොකිරීමය, තමහට අවඥ කිරීමය, මිථ්‍යා විකල්පය, විපරිතාභි නිවෙසය, කායදරථ බහුල බවය, සංවෙග ශීලී නොවන බවය, පඤ්චනීවරණ ධර්මයන් ඇති බවය, සැකෙවින් යම් යම් අකුශල ධර්මකෙතෙකුත් සෙවනය කරන්නා හට නූපන්නාවූ ප්‍රඥව නූපදීද, උපන්නාවූ ප්‍රඥව පිරිහේද, මෙසේ මේ සම්මොහයට හෙතු කාරණයන් දුරුකරන්නහු විසින් බහු ශ්‍රැත භීමෙහි හා ධ්‍යානාදියෙහි යෙදීම කටයුතුය. එහි මේ බහුශ්‍රැත භාවයාගේ විෂය විභාගයයි:-

රූපාදි පඤ්චස්කන්ධයෝද, චක්ෂුරාදි ද්වාදශායතනයෝද, චක්ෂුර්ධාත්වාදි අෂ්ටදශ ධාතූහුද, දුඃඛ සත්‍යාදි චතුරාර්‍ය්‍ය සත්‍යයෝද, චක්ෂුරින්ද්‍රියාදි බාවිස (දෙවිසි) ඉන්ද්‍රියෝද, ද්වාදශාඞ්ග ප්‍රතීත්‍ය සමුත්පාදයද එසේම කායානුපස්සනාදි සතර සතිපට්ඨානාදිවූ කුශල ධර්ම ප්‍රභෙදයද, ලොකයෙහි යම් කිසි ශිල්ප ස්ථානයෝ වෙද්ද, නිරවද්‍යවූ සත්ත්වයන්ගේ හිත සැප

විධාන යොගයවූ යම්කිසි ව්‍යාකරණ (කලායැයි සම්මත තැනක පෙතේ) විශෙෂයෙක් ඇද්ද මේසේ මේ ප්‍රකාරවූ සියලුම ශ්‍රුත විෂය උපාය කෞශල්‍ය පූර්ඛගම කොට ඇති ප්‍රඥාවෙන්ද, සමාධියෙන්ද, වීර්‍යයෙන්ද මනාකොට ඉගෙන ගැනීමය, ඇසීමය, දැරීමය, අභ්‍යාස කිරීමය නැවත නැවත විචාරීමය යන මෙයින් අවගාහනය (දැන ඉගෙන) ඒ තමා දැනගත් ධර්මයෙහි අනුන් යෙදවීමෙන් ශ්‍රුතමය ප්‍රඥාව උපදවිය යුත්තිය.

එසේම සත්ත්වයන්ගේ ඉතිකතිව්‍ය යන්හි සෝතාපත්තික ප්‍රතිභාණය (හෙවත් කැමතන්හි සත්ත්වයන්ගේ සැප ඵල වන ඒ ඒ ධර්මයන්ගේ නිෂ්පත්ති කාරණයන්හි තත් ක්ෂණයෙහිම පැවති නුවණ) යයි කියන ලද්දවූ ආය (අනිවෘත්තියෙහි) අපාය (අනතිවෘත්තියෙහි) කෞශල්‍ය ප්‍රඥාවද හිතෙහි බව නිසා ඒ ඒ තන්හි සුදුසු පරිද්දෙන් පැවැත්විය යුත්තිය. තවද සකෘදාදී සවභාව ධර්මයන්ගේ ආකාර කල්පනා කිරීම් මුඛයෙන් ඔවුන් නුවණට වැටහෙන්නාහු වසින් විනාමය ප්‍රඥාව උපදවිය යුත්තිය.

සකෘදාදීන්ගේ සවකීය ලක්ෂණයද සාමාන්‍ය ලක්ෂණයද පරිග්‍රහණ වශයෙන් ලෞකික ප්‍රඥාව උපදවන්නහු විසින් පූර්භාග භාවනා ප්‍රඥාව සම්පාදනය කටයුත්තිය. මේසේ මේ නාම රූප මාත්‍රය වනාහි සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යයෙන් උපද නේද නිරුඬ වන්නේද වෙයි. මෙහි (හෙවත් මේ ශරීරය) කරන්නාවූ කිසිවෙක් හෝ කරවන්නාවූ කිසිවෙක් හෝ නැත්තේය. ඇතිව නැතිවන්නාවූ අර්ථයෙන් අනිත්‍යය, උදයව්‍යයෙන් පෙළෙන්නාවූ අර්ථයෙන් දුකය, තමා වශයෙහි නොපවත්නාවූ අර්ථයෙන් අනාත්මයයි අධ්‍යාත්මික බාහ්‍ය රූප ධර්මයන් නිරවශෙෂ කොට පිරිසිඳ දැනගැන්මෙන් එහි (ශරීරයෙහි) ආලය කැර අන්‍ය සත්ත්වයනුදු එහි (ශරීරයෙහි) ආලය කරවා හුදෙක් කරුණා වශයෙන් යම් තාක් බුඬ ගුණයෝ හසන තලයට නොපැමිණෙත්ද, ඒ තාක් ශ්‍රාවක බොධිය ආදීවූ ඝාතත්‍රයෙහි සත්ත්වයන් ඇතුළත් කිරීමෙන් හා නුවණ මිහි කිරීමෙන් පිහිටුවමින් ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ද අභිඥාවන්ද ලෞකිය වසීභාවයට (=වශඟබවට) පමුණුවමින් ප්‍රඥාවෙහි

මස්සකප්‍රාප්ත වන්නේය. එහි සෘඩි විධඥතය, දිව්‍යශ්‍රෝත ධාතුඥතය, චෙතොපරියඤ්ඤණය, පූර්වේනිවාසානුස්මෘති ඥතය, දිව්‍ය චක්ෂුර්ඥතය, යථාකර්මූපග ඤ්ඤණය, අනාගතංස ඤ්ඤණ යයි පරිහණඩ සහිතවූ ලෞකික පඤ්චාභිඥයහි කියනලද යම් මේ භාවනාමය ප්‍රඥවක් වේද, ස්කන්ධායතන ධාතු ඉන්ද්‍රිය සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාදාදි ප්‍රභෙද ඇති (ප්‍රඥව භටගැන්මට) හුම් භූත ධර්මයන් කෙරෙහි ඉගනීම් පිළිවිසීම් වශයෙන් නුවණ පුරුදු කොට ගිල විශුද්ධිය චිත්ත විශුද්ධියයි මූල භූතවූ විශුද්ධි දෙදෙනා කෙරෙහි පිහිටා දිවිසි විසුද්ධිය, කංඛාවිතරණ විසුද්ධිය මග්ගාමග්ග ඤ්ඤණ දස්සන විසුද්ධිය, පටිපදා ඤ්ඤණ දස්සන විසුද්ධිය, ඤ්ඤණ දස්සන විසුද්ධියයි ශරීර භූත මේ පඤ්ච විශුද්ධිහු සම්පාදනය කරන්නහු විසින් ලෞකික ලොකොත්තර ප්‍රභෙද ඇති යම් භාවනා ප්‍රඥාවක්ද (ඒද) වැඩිය යුතුය.

ඔවුන්ගේ සම්පාදක විධානය යම් හෙයකින් "එකොපි හුත්වා බහුධාපි හොති" යනාදි 'සෘඩි විකුර්ණය කරනු කැමැත්තාවූ ආදි කර්මික යොගාවචරයා විසින්ය"යි යනාදි වශයෙන්ද, "ඛන්ධා" (ස්කන්ධය) යනු "රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥනස්කන්ධය"යි යනාදි වශයෙන්ද විෂය විභාගය සමග විශුද්ධිමාගීයෙහි සවිස්තාරයෙන් විස්තරකොට කියනලද්දේද, එහෙයින් එහි කියනලද ක්‍රමයෙන් දතයුතු. එහි වනාහි හුදෙක් ශ්‍රාවක බෝධි සත්ත්වයන්ගේ වශයෙන් ප්‍රඥව ප්‍රකාශව ආවාය. මෙහි මහා බෝධි සත්ත්වයන්ගේ වශයෙන් කරුණෝපාය කෞශල්‍යය පෙරදැරි කොට කිය යුත්තිය. ඤ්ඤණදස්සන විසුද්ධියට තොපමුණුවා පටිපදා ඤ්ඤණ දස්සන විසුද්ධියෙහිම විදර්ශිතාව තැබිය යුත්තියයි යන මේම එහි විශෙෂය වෙයි. මෙහි මේ ක්‍රමයෙන් ප්‍රඥා පාරමිතාවගේ ප්‍රතිපත්ති ක්‍රමය දතයුතු.

තවද යම් හෙයකින් සම්‍යක් සම්බොධිය පිණිස කරතලද අනිනිහාර ඇති මහා සත්ත්වයන් විසින් පාරමී පරිපූරණය සඳහා හැමකල්හි ආඛ්‍ය පරිකරණයෙන් යුක්ත ප්‍රයුක්ත විය යුතුද, එහෙයින් කලින් කල "මාවිසින් කවර පුණ්‍ය සම්භාරයෙක් හෝ ඤ්ඤණ සම්භාරයෙක් රැස්කරන ලද්දේද", "මාවිසින් අද කවර පරාර්ථයක් හෝ කරනලද්දද"යි දවස දවස ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු විසින් සත්ත්වයන්ට හිත පිණිස උත්සාහ කටයුතුය

සියලු සත්ත්වයන්ටම උපකාරී පිණිස තමන් සතු වස්තුව කාය ජීවිත දෙක්හිද නිරපෙක්ෂකවූ සිතින් පරිත්‍යාග කරයුතුය. කයින් හෝ වචනයෙන් යම් කිසි කර්මයක් කෙරේද, ඒ සියල්ල සම්‍යක් සම්බෝධිය පිණිස තැබූණු සිතින්ම කරයුතුය බෝධිය පිණිස පිරිතැමිය යුතුය. උදුරවූද ලාමකවූද කාමයන්ගෙන් වෙන්වූ සිත් ඇති විය යුතුය. සියලු ඉතිකර්ත්‍යතාවයන්හි උපාය කෞශල්‍යය එළවා පිළිපැදිය යුතුය. ඒ ඒ සත්ත්ව භිතයෙහි පටන් ගත් වීර්‍ය්‍ය ඇතිවිය යුතුය. ඉෂ්ටානිෂ්ටාදි සියල්ල ඉවසිය යුතුය. අවිසංවාදි විය යුතුය. සියලු සත්ත්වයෝ අනොධිසොඵරණ මෙත්තාවෙන් හා කරුණාවෙන් පැතිරවිය යුත්තාහ. සත්ත්වයන්ට යම් කිසි දුඃඛොත්පත්තියක් වේද, හෙවත් උපදනා යම් කිසි දුකෙක් ඇද්ද, ඒ දුඃඛොත්පත්තිය (ඒ සියලු දුක්) තමා කෙරෙහි කැමතිවිය යුතුය. සියලු සත්ත්වයන්ගේ පින් අනුමෝදන් විය යුතුය. බුදුවරයන්ගේ මහත්ත්වය මහානු භාවය එක්වත් සැලකිය යුතුය. කයින් වචනින් මනසින් යම්කිසි කුශල කර්මයක් කෙරේද, ඒ සියල්ල බොධි ඥානය පෙරදැරිකොට කරයුතුය මෙසේ මේ ක්‍රමයෙන් දානාදියෙහි යුක්ත ප්‍රයුක්තවූ දැඩි වීර්‍ය්‍ය ඇත්තාවූ මහා සත්ත්වයන්ට දවසක් පාසා අප්‍රමෙයවූ පුණ්‍ය සම්භාරයද ඤාණ සම්භාරයද රැස්වන්නේය. තවද සත්ත්වයන්ට පරිභොගය පිණිසද පරිපාලනය පිණිසද තමාගේ ශරීරයත් ජීවිතයත් පුදා ක්ෂුධා පිපාස ශීතොෂ්ණ වාත තාපාදි දුඃඛයට ප්‍රතිකාර සෙවිය යුතුය, එළවිය යුතුය. කියතලද ප්‍රකාර දුකට ප්‍රතිකාර කිරීමෙන් උපන් යම් සැපයක් තෙමේ විඳිද, එසේම සිත්කලු ආරාමොද්‍යාන ප්‍රාසාද තඩාගාදින්හිද අරණ්‍යායතනයන්හිද යන සියලු තන්හි කයට සිතට තැවුලි යක් නැති බැවින් නිවුණාවූ ආතම ඇත්තේ සැප විඳින්නේය. බුඩානු බුඩ ප්‍රත්‍යෙක බුඩ මහා බොධි සත්ත්වයෝද නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපත්තියෙහි පිහිටා ඉහාත්මයෙහි සැප විහරණ ඇත්තාවූ මෙබඳු ධ්‍යාන සම්පත්ති සුඛයක් අනුභව කෙරෙත්යයි යන යමක් අසාද, ඒ සියලු සැපය සියලු සත්ත්වයන් කෙරෙහි සිමා රහිතව එළවන්නේයයි මේ පළමු කොට අසමාහිත භූමියෙහි පිහිටියහුගේ ක්‍රමය වේ සමාහිත භූමියෙහි පිහිටියේ තෙමේ යථානුභූතවූ විශෙෂාධිගමයෙන් උපන්නාවූ ප්‍රීතිය, පස්සඩ්ධිය, සැපය, සමාධිය, යථාභූත සුඛය, ඤාණය, යන මේ ධර්මයන් සත්ත්වයන් කෙරෙහි පිහිටුවමින් බොධිය පිණිස

පිරිසමසි. එසේම මහත්වූ සංසාර දුඃඛයෙහිද හා ඊට හේතුවූ සොළොස්නියංසංසාර දුඃඛයෙහිද නිමිත්තවූ සත්ත්ව සමූහයා දැක එහිද සිදීම්, බිඳීම්, පැළීම්, නිරය ඇතුළු නැවීම්වලින් උපන්නාවූ තියුණුවූ කටුකවූ දුඃඛවේදනාවෙන් අතුරක් නැතිවද බොහෝ කලක් විඳින්නාවූ තිරිසන් සත්ත්වයන්ද; ඔවුනොවුන් කිපීම්, නැතිගැන්ම්, පිඩා කිරීම්, නැසීම්, මේරමා අයත් වීම්වලින් මහත් දුක් අනුභව කරන්නාවූ නිරිසනුන්ද; ඝිනි මැලින් හැවසීගත්තාවූ ශරීර ඇති දෙහොත් හිස තබා මොරගා හඬන්නාවූ මුඛයෙන් නික්මෙන ගිනි සිළු ඇති ක්ෂුධා පිපාසාදියෙන් දන්නාවූ වියලෙන් නාවූ වමනය කරනලද කෙළ ආදිය ආහාර කොට ඇත්නාවූ දුක් අනුභව කරන්නාවූ නිරුඩ්ඨාම තණ්හාදී ප්‍රේතයන්ද; වසනු පැතෙන් ඝණය මුල් කොට ඇති මහත් විනාශයට පැමිණෙන්නාවූ අත් පා සිදීම් ආදී කම් සටුලට පැමිණීමෙන්ද දැකීමට අප්‍රිය බවය, දිළිඳු බවය යනාදියෙන්ද, ක්ෂුධා පිපාසාදියෙන්ද, බලවතුන් විසින් අභිභවනය කරන හෙයින්ද, මේරමා උස්සලන හෙයින්ද, පරාධීන හෙයින්ද, තාරකික ප්‍රේතය තිරිසනුන්ය යන මොවුන් ඉක්මවා පවත්නාවූ අපාය දුක විශෙෂයක් නොකොට දුක් අනුභව කරන්නාවූ මනුෂ්‍යයන්ද; පඤ්ච කාම විෂය අනුභව කිරීමෙන් වියෂිප්තවූ සිත් ඇති බැවින් රාගාදි පරිදාහයෙන් දන්නාවූ වාත වෙගයෙන් නැඟි ගිනිදැලින් සමෘඩවූ වියලි දර ගොඩෙහි ඇවිලෙන ගිනි කඳන් මෙන් නොසන්හුන් කාම පරිදාහ ඇති අනුන් යටත් පැවතුම් ඇති කාමාවචර දෙවියන්ද; මහත් ව්‍යාඝාතයෙන් ඉතා දුරවූ ආකාශයට නගින්නාවූ පක්ෂීන් මෙන්ද; බලවත් දුනුවායන් විසින් වුහුටු ඊයක් මෙන්ද බොහෝ කලක් පැවතුම් ඇති කල්හිදු අනිත්‍යය කෙළවර කොට ඇති බැවින් ආයු කෙළවර නොගිය මුණාවූ ජාති ජරා මරණ ඇති රූපාවචර අරූපාවචර දෙවියන්ද; දක්නාවූ බෝසතුන් විසින් මහත් සංවෙග ඵලමා (සක්ඛියෝ) මෛත්‍රීයෙන් හා කරුණාවෙන් නිරවධිව පැතිරවිය යුත්තාහ. මෙසේ කා විසි මුනි යන තිදෙරින් බොධිසම්භාර ධර්මයන් අතුරක් නැතිව රැස්කරන්නහු විසින් පාරමිතා ගම්සේ පිරීමට පැමිණෙන්ද, එසේ සකස්ව නිතොරව නොමැලිව උත්සාහ පැවැත්විය යුතු. විශ්වාපාරමිතාව පිරිය යුතු.

තවද අවිභාග්‍යවූ අපරිමෙයවූ විපුලවූ උදරවූ නිර්මලවූ උපමා විෂයාතික්‍රාන්තවූ ගුණ සමූහයට නිධානවූ බුද්ධභාවය සඳහා නො පසුබැස ඉදිරියට පැන සමාධ කරන්ට යොග්‍යවූ වීර්‍යය නම් නො සිතිය හැකි ආඛ්‍යාව ඇත්තේමය. ඒ වනාහි බොහෝ දෙනා විසින් අසන්වත් නොපිළිවන් වෙයි. පිළිපැදීම කාලම් නො පිළිවනි. ඒ එසේමය:

ත්‍රිවිධවූ අභිනීහාර චිත්තොත්පත්තිය, චතුර්විධ බුද්ධ භූමිහුය, සතර සංග්‍රහ වස්තුය, කරුණාව එකරස කොට ඇති බවය, සියලු ධර්මයන්හි නො ඇල්මය, සියලු සත්ත්වයන් කෙරෙහි පුත්‍ර සංඥාවය, සතර දුකින් නො කළකිරීමය, සියලු දාන වස්තු පරිත්‍යාග කිරීමය, එසින් අභිමාන රහිත බවය, අධිශීල ශික්ෂාව ඉවීමය, ඒ (අධිඝ්‍යාශයෙහි)ද නිශ්චල බවය, කුශල ක්‍රියාවන්හි ප්‍රීති හා ප්‍රමොදය ඇති බවය, විවෙකයට නැමුණු සිත් ඇති බවය, ධ්‍යානයෙහි යෙදීමය, නිරවද්‍ය ධර්මයෙන් (හෝ සැපයෙන්) තෘප්තියට නො පැමිණීමය, අසන ලද ධර්මය අනුන්ට භිතාඛ්‍යාශයෙන් දෙශනා කිරීමය, සත්ත්වයන් න්‍යාය ප්‍රතිපත්තියෙහි පිහිටු වීමය, වීර්‍යාරම්භයෙහි සථිර බවය, ධීර වීර ගුණ ඇති බවය, පරාපවාද පරාපකාර දෙක්හි විකාරයක් නැති බවය, සත්‍යාධිඝ්‍යානය, සමාපත්ති සැපය වසඟ කොට ඇති බවය, අභිඥා බලයට පැමිණීමය, ලක්ෂණත්‍රයාගේ අවබොධය, සතිපට්ඨානාදියෙහි යෙදීමෙන් හා කර්මාභියොගයෙන් ලොකොත්තර මාර්ගය ලැබීමට පාරමිතාවන්ගේ පිරීමය. නවලොකොත්තරා වක්‍රානතියයි මේ ආදිවූ සියලු බොධි සම්භාර ප්‍රතිපත්තිය වීර්‍යානුභාවයෙන්ම සමාධ වන්නේයයි ප්‍රථමාභිනීහාරයෙහි පටන් යම්තාක් සම්‍යක් සම්බොධි ඥානය සිඛවේද, ඒතාක් වීර්‍යය අත්නොහරින්නාහු විසින් සකස් කොට නිරතුරුව වීර්‍ය පාරමිතාව පිරිය යුතුය. යම්සේ මතු මත්තෙහි විශෙෂ එළවන්නේ වේද, එසේ සම්පාදනය කටයුතුයයි කී නියාහි. යටකියනලද වීර්‍යපාරමිතාව සම්පාදනය කරන කල්හි ක්ෂාන්තිපාරමිතා, සත්‍ය පාරමිතා, අධිෂ්ඨාන පාරමිතා දිවුද, දාන ශීලාදිවුද සියලුම බොධි සම්භාර ධර්මයෝ ඒ වීර්‍යාදිට අයත් පැවතුම් ඇති බැවින් සමාධ වූවාහු නම් වෙති. ක්ෂාන්ති පාරමිතාදියෙහිත් මේ ක්‍රමයෙන්ම ප්‍රතිපත්තිය දතයුත්තීය.

මෙසේ සත්ත්වයන්ට සැපයට සුදුසුවූ උපකරණයන් පරිත්‍යාගයෙන් බොහෝ සෙයින් අනුග්‍රහ කිරීම දානයෙන් වන්නාවූ ප්‍රතිපත්තිය නම් වෙයි. සත්ත්වයන්ගේ දිවිරැක්ම, සම්පත් රැක්ම, පුත්‍රදාරාවන් රැක්ම, කෙලාම් කිමාදියෙන් ඔවුනොවුන් නොබිඳීම, ප්‍රිය සෙපුල් කිම, වැඩට නිසිබස් කිම, තැළීම් ආදී හිංසා නොකිරීම ශීලයෙන් වන්නාවූ ප්‍රතිපත්තිය නම් වෙයි. සත්ත්වයන්ගේ ආමිස පිළිගැන්ම ධර්මදානාදියෙන් නොයෙක් ප්‍රකාරවූ හිතවරියාව නෙත් ක්‍රම්‍යයෙන් වන්නාවූ ප්‍රතිපත්තියයි. සත්ත්වයන්ගේ හිත සිඩියට නිසිවූ කරුණෙහිපායකෞශල්‍යය සන්තානයෙහි පිහිටීම ප්‍රඥාවෙන් වන්නාවූ ප්‍රතිපත්තියයි. ඒ ප්‍රඥා ප්‍රතිපත්තියෙහි උත්සාහය පටන් ගැන්ම, පවත් ගත් වීර්‍යය නොහැර්ම යන මොහු වීර්‍ය පාරමිතාවගේ ප්‍රතිපත්තිහුයි. සත්ත්වයන්ගේ අපරාධ සහනය කිරීම ක්ෂාන්ති පාරමිතාවෙන් වන්නාවූ ප්‍රතිපත්තියයි. සත්ත්වයන් වංචා නොකිරීම්, ඔවුන්ට උපකාර කිරීමෙහි සමාදානය, අවිසංවාදනය යන මේ ආදිය සත්‍යපාරමිතාවෙන් වන්නාවූ ප්‍රතිපත්තියයි. සත්ත්වයන්ට උපකාර කිරීමෙන් තමහට අනර්ථ පැමිණෙන කල්හිදු නිශ්චලව පිහිටීම අධිෂ්ඨාන පාරමිතාවෙන් වන්නාවූ ප්‍රතිපත්තිය වෙයි. සත්ත්වයන්ට හිතසුව එක්වන් සිතීම මෛත්‍රී පාරමිතාවෙන් වන්නාවූ ප්‍රතිපත්තියයි; සත්ත්වයන්ගේ උපකාර අපකාර දෙක්හි වෙහෙසකට නොපැමිණීම (මධ්‍යස්ථාකාරයෙන් පැවැත්ම) උපෙක්ෂා පාරමිතාවෙන් වන්නාවූ ප්‍රතිපත්තිය නම් වෙයි. මෙසේ අප්‍රමාණ සත්ත්වයන් අරබයා අනුකම්පා කරනලද සියලු සත්ත්වයන් ඇතිමහා බොධි සත්ත්වයන්ගේ පාථග්ජනයන් හා අසාධාරණවූ අප්‍රමාණවූ පුණ්‍ය සම්භාරය හා ඤාණ සම්භාරය රැස්කිරීම මෙහි ප්‍රතිපත්තියයි දතයුතු. මේ පාරමිතාවන්ගේ යම් ප්‍රතිපත්තියක් කියන ලද්දීද, ඒ ප්‍රතිපත්තියගේද සකස්කොට සම්පාදනය කිරීම පාරමිතා ප්‍රතිපත්ති නම් වන්නීය.

11 "ඔවුන්ගේ විභාගය කවරේද?" යන මේ ප්‍රශ්නයෙහි දශපාරමිතාය, දශ උපපාරමිතාය, දශ පරමාර්ථ පාරමිතාය යී සම්තිස් පෙරුම් කෙනෙක් වෙති.

එහි කරතලද මහානිනිහාර ඇති පරහිත කරණයෙහි විශෙෂයෙන් තැමුණු අදහස් හා ප්‍රයොග ඇති බොධි සත්ත්ව යන්ගේ කෘෂ්ණ (අකුශල) ධර්මයන් හෙන් ව්‍යාකීර්ණ කුශල ධර්මයෝ පාරමිහු නම් වෙත්මය. ඔවුන් (අකුශලයන්) හෙන් ව්‍යාකීර්ණ නොවූ කුශල ධර්මයෝ උපපාරමිහු නම් වෙති. කෘෂ්ණ ශුක්ල ධර්මයන් හා මිශ්‍ර නොවූ ධර්මයෝ පරමාර්ථ පාරමිහු යයි සම්භර කෙනෙක් කියති.

පටන් ගත්නාවූ කාලයෙහි පුරනුලබන්නාහු පාරමිහු නම් වෙති. බොධිසත්ත්ව භූමියෙහි සිට පුරන ලද්දාහු උප පාරමිහු නම් වෙති. බුඩ භූමියෙහි සිට සර්‍වාකාරයෙන් සම්පූර්ණ කරන ලද්දාහු පරමාර්ථ පාරමිහු නම් වෙති. නොහොත්: බොධිසත්ත්ව භූමියෙහි පැවති දානාදීහු පරහිත කරණ හෙයින් පාරමිහු නම් වෙති. ආත්ම හිත කරන හෙයින් උප පාරමිහු නම් වෙති. බුඩ භූමියෙහි බල වෛශාරද්‍ය සමධිගමයෙන් ආත්ම හිත පරහිතයයි කියනලද උභය හිත පරිපූරණය කරන හෙයින් පරමාර්ථ පාරමිහු නම් වෙතියි මෙසේ ආදී මධ්‍යපර්‍යවසාන යන්හි හා ප්‍රණිධිය, ආරම්භය, පරිනිෂ්ඨානය යන තුන් තන්හි ඒ පාරමින්ගේ විභාගය වේයයි සම්භර ආචාර්‍ය්‍ය කෙනෙක් කියති.

දෙෂයන්ගේ ව්‍යුපසමය හා කරුණාව ප්‍රකෘති කොට ඇති භව සුඛ, විමුක්ති සුඛ, පරම සුඛ, යන මේ තැපයන්ට පැමිණි බෙෝසතුන්ගේ කුසල් රැස් කිරීමේ භෙදයෙන් ඒ ත්‍රිවිධ විභාග වේ යයි අභ්‍යාචාර්‍ය්‍යවරයෝ කියති.

ලජ්ජා, සති, මාන, ආශ්‍රය කොට ඇති ලෞකොත්තර ධර්මාධිපතිවූ ශීල සමාධි ප්‍රඥවන් ගරුකොට ඇත්තාවූ එතර කරවන ලද්දවූ එතරවන ලද්දවූ එතර කරවත්තාවූ අනුබුඩ පචෙකබුඩ සම්මාසම්බුඩයන් වහන්සේලාගේ පාරමිය, උප පාරමිය, පරමාර්ථ පාරමියයි බොධිසත්ත්ව සම්පත්ති වශයෙන් ඔට කියනලද විභාගයයි කිසි ආචාර්‍ය්‍ය කෙනෙක් කියති.

තවත් ආචාර්‍ය්‍ය කෙනෙක් චිත්තාප්‍රණිධියේ පටන් වාග්ප්‍රණිධිය යම්තාක්ද ඒ තාක් පැවති බොධිසම්භාරයෝ පාරමිහුයයිද

වාන්ප්‍රණිධියේ පවත් කායප්‍රණිධිය දක්වා පැවති බොධි සම්භාරයෝ උප පාරමිහු යයිද, කාය ප්‍රණිධියේ පවත් බුදු බව දක්වා පැවති බොධිසම්භාරයෝ පරමාර්ථ පාරමිහු යයිද කියති.

අන්‍යාචාර්‍යයී කෙනෙක් අනුත් විසින් දෙනලද පින් අනුමෝදන් වීම වශයෙන් පැවති බොධිසම්භාරයෝ පාරමිහුයයිද, අනුත් ලවා කරවීම් වශයෙන් පැවැත්තාහු උප පාරමිහු යයිද, තමා විසින් කිරීම වශයෙන් පැවැත්තාහු පරමාර්ථ පාරමිහු යයිද කියති.

එසේම සසර සැප ඵලවන්තාවූ පුණ්‍ය ඥාන සම්භාරය තෙම පාරමී යයිද, තමහට පමණක් නිවන් සුව ඵලවන්තාවූ පුණ්‍ය ඥාන සම්භාරය උප පාරමී යයිද, අනුන්හට ඒ දෙවැදෑරුම් සුව ඵලවන්තාවූ පුණ්‍ය ඥාන සම්භාරය තෙම පරමාර්ථපාරමී යයිද ඇතැම් ආචාර්‍යයී කෙනෙක් කියති.

(1) පුත්‍රදාරාවන් හා මුක්තා මාණික්‍යාදි වස්තූන්ගේ පරිත්‍යාගය තෙම දානපාරමී නම්. තමන්ගේ ආත්මපරිත්‍යාගය තෙම දාන උපපාරමී නම්. (ජාතකට්ඨ කථාවෙහි "අඞ්ග පරිච්චාගෝ පාරමියෝ නාම, බාහිර හණ්ඩ පරිච්චාගෝ උප පාරමියෝ නාම, ජීවිත පරිච්චාගෝ පරමත්ථපාරමියෝ නාම" යයි මිට අන්‍ය ක්‍රමයකින් පාරමී උප පාරමී දෙදෙන දක්වා තිබෙන්. අඞ්ගපරිත්‍යාගයට වඩා පුත්‍රදාරාපරිත්‍යාගය බලවත් හෙයින් එසේ කිහයි කියති.) තමන්ගේ ජීවිත පරිත්‍යාගය තෙම දැන පරමාර්ථ පාරමී නමැයි කියා දැන පාරමිතාවෝ තුන්දෙනෙක් වෙති. එසේම (2) පුත්‍රදාරාදිවූ ත්‍රිවිධ පරිත්‍යාගයට හෙතු ව්‍යතික්‍රමණය නොකිරීම් වශයෙන් ශීල පාරමිතාවෝ තුන්දෙනෙක් වෙති. (3) ඒ ත්‍රිවිධ වස්තුවෙහිම ආලය සිඳපියා නික්මීම් වශයෙන් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෝ තිදෙනෙක් වෙති (4) උපකරණය අඞ්ගය ජීවිතය යන තුනෙහි තෘෂ්ණාව මුලින් උදුරා සත්ත්වයන්ට වැඩ අවැඩ විනිශ්චය කිරීම් වශයෙන් ප්‍රඥාපාරමිතාවෝ තුන්දෙනෙක් වෙති. (5) කියනලද ප්‍රභෙද ඇති පරිත්‍යාගාදියට වැයම් කිරීම් වශයෙන් වීර්‍ය්‍ය පාරමිතාවෝ තුන්දෙනෙක් වෙති (6) උපකරණය අඞ්ගය ජීවිතය යන මේ තුනට අනන්තරාය කරන්නවුන්ට ක්ෂමා කිරීම්

වශයෙන් ක්ෂාන්ති පාරමිතාවෝ තුන්දෙනෙක් වෙති. (7) උපකරණය අඞ්ගය ජීවිතය යන මොවුන් නිසා සත්‍යය අත් නොහැරීම් වශයෙන් සත්‍ය පාරමිතාවෝ තුන්දෙනෙක් වෙති. (8) දානාදි පාරමිතාවෝ කොපය නොසොටු හැකි අධිෂ්ඨාන වශයෙන් සමාඛ වත්තාහයි උපකරණාදීන්ගේ විනාශයෙහිදු අවලාධිෂ්ඨාන වශයෙන් අධිෂ්ඨාන පාරමිතාවෝ තුන්දෙනෙක් වෙති (9) උපකරණාදීන් විනාශ කරන සත්ත්වයන් කෙරෙහිත් මෛත්‍රිය අත්නොහැරීම් වශයෙන් මෛත්‍රී පාරමිතාවෝ තුන්දෙනෙක් වෙති. (10) කියනලද වසතුත්‍රයට උපකාර අපකාර සත්ත්ව සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථතා ප්‍රතිලාභ වශයෙන් උපෙක්ෂා පාරමිතාවෝ තිදෙනෙක් වෙතියි මේ ආදි ක්‍රමයෙන් මේ පාරමීන්ගේ විභාගය දතයුතු.

12 "ඔවුන්ගේ සංග්‍රහය කවරේද?" යන මේ ප්‍රශ්නයෙහි මේ පාරමිතාවෝ වතාහි විභාග හෙතින් සමතිස් වැදෑරුම් වත්තාක් මෙන් දානපාරමිතාදීන්ගේ වශයෙන්ද දස වැදෑරුම් වෙති. එසේම දාන ශීල ක්ෂාන්ති වීර්‍ය ධ්‍යාන ප්‍රඥ යන මොවුන්ගේ සවභාවයෙන් සවැදෑරුම් වෙති.

ඔවුන් අතුරෙනුදු නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව ප්‍රව්‍රජ්‍යා වශයෙන් ලැබෙන කල්හි ශීලපාරමිතා වෙතිම සංග්‍රහ කරනලදී. නිවරණයන්ගෙන් වෙන්වීම් වශයෙන් ලැබෙන කල්හි ධ්‍යාන පාරමිතාවෙහි සංගෘහීතවේ. සෙසු අකුශලයන් හෙත් වෙන්ව කුශල ධර්‍ම වශයෙන් ලැබෙන කල්හි දානාදි සයෙන්මද සංගෘහීත වේ. සත්‍යපාරමිතාව වාග් විරති සත්‍ය පක්ෂයෙහිදී ශීල පාරමිතාවගේම එක දෙශයක් වේ. ඥාන සත්‍ය පක්ෂයෙහිදී ප්‍රඥාපාරමිතාවෙහි සංග්‍රහ කරනලදී. මෛත්‍රී පාරමිතාව ධ්‍යාන පාරමිතා වෙහිම සංගෘහීත වේ. උපෙක්ෂා පාරමිතාව වතාහි ධ්‍යාන ප්‍රඥ පාරමිතාවත් හෙත්ම සංගෘහීත වේ. අධිෂ්ඨාන පාරමිතාව සියලු පාරමිතාවන් හෙත්ම සංගෘහීත වේ.

ඇට දක්වනලද පරිදි ඔවුනොවුන් හා සම්බන්ධය ඇති මේ දානාදි දස වැදෑරුම් ගුණයන්ගේ පසලොස් යුගලාදිහු පසලොස් යුගලා (යුග්මා) දීන් සිඛකරන්නාහු වෙති. කෙසේද? යත්: දාන ශීල යුගලයෙන් පරහිත කරණය, පර අහිත අකරණය යන යුගලයාගේ සිඛිය වෙයි. දාන ක්ෂාන්ති යුගලයෙන්

අලෝභාදෙෂ යුගලයාගේ සිඛිය වෙයි. දාන වීර්‍ය්‍ය යුගලයෙන් ත්‍යාග ශ්‍රැත යුගලයාගේ සිඛිය වෙයි. දාන ධ්‍යාන යුගලයෙන් ක්‍ෂාම වෙෂ ප්‍රහාණ යුගල සිඛිය වෙයි. දාන ප්‍රඥ යුගලයෙන් ආඝ්‍රී යාන ධුර යුගල සිඛිය වෙයි. ශීල ක්‍ෂාන්ති වයෙන් ප්‍රයොගය ආසය යන දෙදෙනාගේ සිඛිය වෙයී. ශීලය වීර්‍ය්‍යය යන දෙකින් භාවනා මයයාගේ සිඛිය වෙයි. ශීලය ධ්‍යානය යන දෙකින් දුශ්ශිල්‍ය පඤ්චිත්‍යාන ප්‍රහාණ දෙක සිඛි වෙයි. ශීලය ප්‍රඥවය යන දෙකින් දානවයයාගේ සිඛිය වෙයී. ක්‍ෂාන්ති වීර්‍ය්‍ය යුගලයෙන් ක්‍ෂමාවය තෙජසය යන දෙදෙනාගේ සිඛිය වෙයි. ක්‍ෂාන්ති ධ්‍යාන යුගලයෙන් විරොධ අනුරොධ ප්‍රහාණ යුගල සිඛිය වෙයි. ක්‍ෂාන්ති ප්‍රඥ යුගලයෙන් ශූන්‍යතා ක්‍ෂාන්ති ප්‍රතිවෙධ විකයාගේ සිඛිය වෙයි. වීර්‍ය්‍ය ධ්‍යාන දවිකයෙන් ප්‍රග්ග්‍රහ අවික්‍ෂෙප විකයාගේ සිඛිය වෙයී. වීර්‍ය්‍ය ප්‍රඥ විකයෙන් සරණ දුකයාගේ සිඛිය වෙයි. ධ්‍යාන ප්‍රඥ විකයෙන් යාන විකයාගේ සිඛිය වෙයි.

දානය ශීලය ක්‍ෂාන්තිය යන ත්‍රිකයෙන් ලොභ වෙෂ මොහ ප්‍රහාණ ත්‍රිකයාගේ සිඛිය වෙයි. දානය ශීලය වීර්‍ය්‍යය යන ත්‍රික යෙන් භොග ජීවිත ඤාය යන මොවුන්ගේ සාරාදාන ත්‍රිකයාගේ සිඛිය වේ. දාන ශීල ධ්‍යාන ත්‍රිකයෙන් පුණ්‍යක්‍රියා වස්තු ත්‍රිකයා ගේ සිඛිය වෙයි. දාන ශීල ප්‍රඥ ත්‍රිකයෙන් ආමිසදාන අභයදාන ධර්මදාන ත්‍රිකයාගේ සිඛිය වෙයි. මෙසේම අවශෙෂ ත්‍රිකයන් ගෙන්ද චතුෂ්කයන් ගෙන්ද ලැබෙන ලැබෙන පරිද්දෙන් ත්‍රික යෝද චතුෂ්කයෝද යෙදිය යුත්තාහ

මෙසේම මේ සවැදෑරුම්වූත් පාරමීන්ගේ චතුරධිෂ්ඨාන යන්ගේ සංග්‍රහය දනයුතු. සියලු පාරමීන්ගේ සමූහ සංග්‍රහ වශයෙන් වනාහි සතර අධිෂ්ඨාන කෙතෙක් වෙති. ඒ කව රේදැ? සත්‍යාධිෂ්ඨානය, ත්‍යාගාධිෂ්ඨානය, උපශමාධිෂ්ඨානය, ප්‍රඥාධිෂ්ඨානය, යන මොහුයි. ඒ වනාහි මේ කරණ කොට ගෙන පිහිටා සිටීනුයි හෝ මෙහි හෝ පිහිටානුයි. පිහිටීම් මාත්‍රයම් හෝ අධිට්ඨාන නම් වේ. (කරණාධාරසාධන භාවසාධන වශයෙන් කළ විග්‍රහයි) සත්‍යය වූයේත් හේමය අධිෂ්ඨානවූයේත් හේම නුයි සච්චාධිට්ඨාන නම්. සත්‍යයාගේ අධිෂ්ඨානය හෝ සච්චා ධිට්ඨාන නම් මොහුට සත්‍යය අධිෂ්ඨානයයි කියා හෝ සච්චා ධිට්ඨාන නම්. සෙසු තන්හිත් මෙසේ මැ යි.

එහි සාමාන්‍යයෙන් ප්‍රථම කොට ලොකොත්තර වශයෙන් කරන ලද අභිනීහාර ඇති, අනුකම්පා කරන ලද සියලු සත්ත්වයන් ඇති, මහාසත්ත්වයන්ගේ ප්‍රතිඥානුරූප පරිදි සියලු පාරමිතාවන්ගේ පරිග්‍රහ වශයෙන් සත්‍යාධිෂ්ඨානයද, පාරමිතාවන්ට ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ දුරු කිරීම් වශයෙන් ත්‍යාගාධිෂ්ඨානයද, සියලු පාරමිතා ගුණයන් කරණ කොට ගෙන සන්සිඳීම් වශයෙන් උපසමාධිෂ්ඨානයද, ඒ පාරමිතා ගුණයන් කරණ කොට ගෙන පරවැඩ කිරීමෙහි උපායකෞශල්‍ය වශයෙන් ප්‍රඥාධිෂ්ඨානය ද දතයුතු.

විශෙෂයෙන් වනාහි යාවක ජනයන් විසංවාදනය නොකොට දන් දෙන්නෙමියි කියා අනුදැනීම් වශයෙන් ප්‍රතිඥා විසංවාදනය නොකොට දෙන හෙයින් (දානය) ද, විසංවාදනය නොකොට අනුමෝදන් වන හෙයින්ද මිසුරු කම් ආදි ප්‍රතිපක්ෂ ධර්මයන් දුරු කරන හෙයින්ද, (දෙයධර්ම ප්‍රතිග්‍රාහක දානයද,) දාන වස්තු ක්ෂයවූ කල්හි ලොභ දෙස මොහ හය සංසිඳුවන හෙයින්ද, සුදුසු පරිද්දෙන් කල්වූ පරිද්දෙන් අධිෂ්ඨාන කළ පරිද්දෙන් දෙන හෙයින්ද, කුශල ධර්මයන්ට ප්‍රඥව උත්තර හෙයින්ද දානය චතුරධිෂ්ඨානය පදස්ථාන කොට ඇත්තේය. එසේම සංවර සමාදානය සෝ ඉක්මවන හෙයින්ද, දුශ්ශීල භාවය දුරු කරන හෙයින්ද, දුශ්චරිතයන් සංසිඳුවන හෙයින්ද, පඤ්ඤුත්තර හෙයින්ද, ශීලය චතුරධිෂ්ඨානය පදස්ථාන කොට ඇත්තේය. එසේම ප්‍රතිඥානුරූපව ඉවසන හෙයින්ද, පරාපරාධ විකල්ප පරිත්‍යාග කරන හෙයින්ද, ක්‍රොධපරිදීපනය ව්‍යපසමනය කරන හෙයින්ද, පඤ්ඤුත්තර හෙයින්ද, ක්ෂාන්ති සෝමෝ චතුරධිෂ්ඨානය පදස්ථාන කොට ඇත්තීය. ප්‍රතිඥානුරූපව පරහිත කරන හෙයින්ද, විශද පරිත්‍යාග ඇති හෙයින්ද, අකුසල් සංසිඳුවන හෙයින්ද, පඤ්ඤුත්තර හෙයින්ද, වීර්‍යය චතුරධිෂ්ඨානය පදස්ථාන කොට ඇත්තේය. ප්‍රතිඥානුරූපව ලොකහිතය එක්වත් සිතන හෙයින්ද, නීවරණ පරිත්‍යාගයෙන්ද, සිත සංසිඳුවන හෙයින්ද පඤ්ඤුත්තර හෙයින්ද, ධ්‍යානය චතුරධිෂ්ඨානය පදස්ථානකොට ඇත්තේය. ප්‍රතිඥානුකූලව පරවැඩ කිරීමෙහි උපාය කුසල භාවයෙන්ද, අනුපාය ක්‍රියා පර්‍යාගයෙන්ද, මොහයෙන් නැඟි පරිදාහයන් සංසිඳුවන හෙයින්ද, සම්ඵස්සා ප්‍රතිලාභයෙන්ද, ප්‍රඥා සෝමෝ චතුරධිෂ්ඨානය පදස්ථාන කොට ඇත්තීය.

එහි ඥෙය පරිඥානුවිධානයන් ගෙන් සත්‍යාධිෂ්ඨානය වෙයි විසඳුකාම ක්ලේශකාමයන්ගේ පරිත්‍යාගයෙන් ත්‍යාගාධිෂ්ඨානය. වෙයි. දෙඟ දුඃඛ ව්‍යුපශමයෙන් උපශමාධිෂ්ඨානය වෙයි. අනුබොධ ප්‍රතිවෙධයන් ගෙන් ප්‍රඥාධිෂ්ඨානය වෙයි. ත්‍රිවිධ සත්‍ය යෙන් පරිඥාතිතවූ දෙඟත්‍රයට විරෝධි වූයේ සත්‍යාධිෂ්ඨාන නම්, ත්‍රිවිධ ත්‍යාගයෙන් පරිඥාතිතවූ දෙඟත්‍රයට විරෝධි වූයේ ත්‍යාගාධි ෂ්ඨාන නම්, ත්‍රිවිධ ව්‍යුපශමතයන් ගෙන් පරිඥාතිතවූ දෙඟත්‍රයට විරෝධිවූයේ උපශමාධිෂ්ඨාන නම්, ත්‍රිවිධ ඥතයෙන් පරිඥාතිතවූ දෙඟත්‍රයට විරෝධි වූයේ ප්‍රඥාධිෂ්ඨාන නම්, විසංවාදන නොකිරි මෙන්ද, ප්‍රතිඥානු විධානයෙන්ද, සත්‍යාධිෂ්ඨාන පරිඥාතිතවූ ත්‍යා ගොපශම ප්‍රඥාධිෂ්ඨානයෝද, ප්‍රතිපක්ෂයන් පරිත්‍යාග කරන හෙයින්ද, සියලු පරිත්‍යාගයන් ඵල කොට ඇති හෙයින්ද, ත්‍යාගාධි ෂ්ඨාන පරිඥාතිතවූ සත්‍යෝපශම ප්‍රඥාධිෂ්ඨානයෙන්ද, ක්ලේශ පරිඛ්‍යානයන් සංසිඳුවන හෙයින්ද, කර්මෝපශමතය කරන හෙයින්ද කර්මපරිඛ්‍යානයන් සංසිඳුවන හෙයින්ද, උපසම්‍යාධිෂ්ඨාන පරිඥාතිතවූ සත්‍ය ත්‍යාග ප්‍රඥාධිෂ්ඨානයෝද, ඥන පූර්ඞගම හෙයින්ද, නුවණට අනුව පවත්නා හෙයින්ද, ප්‍රඥාධිෂ්ඨානය පරිඥාතිතවූ සත්‍යෝපශමාධිෂ්ඨානයෝද දතයුත්තාහ. මෙසේ සියලු පාරමීහු සත්‍ය ප්‍රභාවිතයහ. ත්‍යාගයෙන් ප්‍රකාශ කරනලදහ. ව්‍යුපශම යෙන් වර්ධනය කරන ලදහ. ප්‍රඥාවෙන් පිරිසිදු කරනලදහ.

තවද සත්‍යය වනාහි ඒ පාරමිතාවන්ට ජනක (උත්පත්තිය) හෙතුය, ත්‍යාගය පරිග්‍රාහක හෙතුය, උපසමය අභිවෘද්ධිහෙතුය, ප්‍රඥාව පරිශුද්ධි හෙතුය. එසේම සත්‍ය ප්‍රතිඥා ඇති බැවින් ආදි යෙහි සත්‍යාධිෂ්ඨානයද, කරනලද ප්‍රාර්ථනා ඇත්තහුගේ පර වැඩ පිණිස ආත්ම පරිත්‍යාග කරන හෙයින් මධ්‍යයෙහි ත්‍යාගාධිෂ්ඨා නයද, සියලු උපශමයන් අවසාන කරන හෙයින් අන්තයෙහි උප ශමාධිෂ්ඨානයද, ප්‍රඥාධිෂ්ඨානය ආදි මධ්‍ය පරියොසානයන්හිද දතයුතු ඒ ප්‍රඥාව ඇති කල්හි සම්භව වන හෙයින්ද ඒ ප්‍රඥාව නැති කල්හි සම්භව නොවන හෙයින්ද යථාප්‍රතිඥා භාවයෙන්ද වේ.

එහි ගෘහපතිවූ මහාපුරුෂයෝ වතාහි නිතර ආත්ම හිත පරහිත කරවූද ගරු ප්‍රිය භාවය කරන්නාවූද සත්‍යාධිෂ්ඨාන, ත්‍යාගාධිෂ්ඨානයන් කරණකොට ගෙන ආම්ප දූනයෙන් මෙරමා හට අනුග්‍රහ කෙරෙති. එසේම පැමිදිවූවාහු ආත්ම හිත පරහිත කරවූද ගරු ප්‍රිය භාවය කරන්නාවූද උපශමාධිෂ්ඨාන ප්‍රඥාධිෂ්ඨානයන් කරණ කොට ගෙන ධර්මදූනයෙන් මෙරමා හට අනුග්‍රහ කෙරෙති.

එහි කොයෙක් භවයන්හි බෝසතාණන්ගේ චතුරධිෂ්ඨාන යන්ගේ පරිපූරණය වේ. සම්පූර්ණ චතුරධිෂ්ඨාන ඇත්තාහුගේ චතාහි අන්තිම ආත්මයෙහි උත්පත්තිය වේයයි ඇතැම් කෙනෙක් කියත්. එහි වතාහි ගර්භාවක්‍රාන්තිය, සථිතිය, අභිනිෂ්ක්‍රමණය යන තන්හි ප්‍රඥාධිෂ්ඨාන සමුදාගමයෙන් සිහි ඇත්තාහු සම්‍යක් ප්‍රඥා ඇත්තාහු සත්‍යාධිෂ්ඨානයාගේ සම්පූර්ණවීම හෙතුකොටගෙන උපන් ඇසිල්ලෙහිම උතුරු දිගට මුහුණ ලා සත් පියවරින් වැඩ සියලු දිග්බලා සත්‍යාත්‍ර පරිවර්තිවූ වචනයෙන් "අග්ගොහා හමස්මි ලෝකස්ස, ජෙට්ඨොහා හමස්මි ලෝකස්ස, සෙට්ඨොහා හමස්මි ලෝකස්ස"යි තුන් වරක් සිංහනාද කළයේක. උපශමාධිෂ්ඨානයාගේ සමුදාගමයෙන් (හෙතුවෙන්) ජීර්ණාතුර මෘත ප්‍රව්‍රජිත සවරූපයන් දැක්කාවූ චතුර්විධ ධර්ම ප්‍රදේශයෙහි දක්ෂවූවාහුගේ යෞවන ආරෝග්‍ය ජීවිත සම්පත්ති මදයන්ගේ සංසිදීමය, ත්‍යාගාධිෂ්ඨාන සමුදාගමයෙන් මහත්වූ ඤාති සමූහයාගේද හස්තප්‍රාප්තවූ චක්‍රවර්ති රාජ්‍යයාගේද නිරපේක්ෂකවූ පරිත්‍යාගය යන මොහු වෙති.

සම්‍යක් සම්බෝධි සම්බන්ධ සංඛ්‍යාත තෘතීය සථානයෙහිදී චතුරධිෂ්ඨානයාගේ පරිපූර්ණයයි සමහර කෙනෙක් කියති. එහි වතාහි ප්‍රතිඥාරූප පරිදෙන් සත්‍යාධිෂ්ඨාන සමුදාගමයෙන් චතුරාර්‍ය සත්‍යයාගේ අවබෝධය වෙයි. එයින් සත්‍යාධිෂ්ඨානය පරිපූර්ණ විය. ත්‍යාගාධිෂ්ඨාන සමුදාගමයෙන් සියලු කෙලෙහොප කෙලෙස පරිත්‍යාගය වෙයි. ඒ කරණ කොට ගෙන ත්‍යාගාධිෂ්ඨානය පරිපූර්ණ විය. උපශමාධිෂ්ඨාන සමුදාගමයෙන් උත්තම උපශමයට පැමිණීම වෙයි. එයින් උපශමාධිෂ්ඨානය පරිපූර්ණ විය. ප්‍රඥාධිෂ්ඨාන සමුදාගමයෙන් අනාවරණ ඥානයාගේ ප්‍රතිලාභය වෙයි. එයින් ප්‍රඥාධිෂ්ඨානය පරිපූර්ණ විය. සම්‍යක් සම්බෝධියාගේද පරමාර්ථ භාවය නිසා ඒ අයිබය.

ධර්මචක්‍ර ප්‍රවර්තන නාමිය සථානයෙහි චතුරධිෂ්ඨානයාගේ පරිපූර්ණ වේයයි අන්‍යාචාර්‍යයෝ කෙතෙක් කියති. එහි වනාහි සත්‍යාධිෂ්ඨාන සමූද්‍ය ගමයෙන් යුක්ත වූවාහුගේ දෙලොස් ආකාරයකින් ආර්‍ය්‍ය සත්‍ය දෙශනායෙන් සත්‍යාධිෂ්ඨානය සම්පූර්ණ විය. ත්‍යාගාධිෂ්ඨානය සමූද්‍ය ගමයෙන් යුක්තවූවාහුගේ සඬ්ගී මහාඨාගය කිරීමෙන් ත්‍යාගාධිෂ්ඨානය පරිපූර්ණ වී. උපශමාධිෂ්ඨාන සමූද්‍ය ගමයෙන් යුක්ත වූවාහුගේ තෙමේ උපශමය වූයේ මෙරමා උපශමය කිරීමෙන් උපශමාධිෂ්ඨානය සම්පූර්ණ වී. ප්‍රඥාධිෂ්ඨාන සමූද්‍ය ගමයෙන් යුක්ත වූවාහුගේ වෙතෙය ජනයන්ගේ ආසයානුසයාදිය දැනගැනීමෙන් ප්‍රඥාධිෂ්ඨානය සම්පූර්ණ වී. බුදුකිස තොනිමි බැවින් ඒද අසිඛය.

පරිනිර්‍වාණ සංඛ්‍යාත සිවුවෙනි සථානයෙහි චතුරධිෂ්ඨානය සම්පූර්ණවියයි අන්‍ය ආචාර්‍ය්‍යයෝ කෙතෙක් කියත්. එහි වනාහි පරිනිර්‍වාණය කළ නෙයින් පරමාර්ථ සත්‍ය සම්පත්තියෙන් සත්‍යාධිෂ්ඨානය සම්පූර්ණ වෙයි. සඵොපධීන්ගේ පරිත්‍යාගයෙන් ත්‍යාගාධිෂ්ඨානය සම්පූර්ණ වෙයි. සියලු සංස්කාරයන්ගේ සංසිඳුවීමෙන් උපශමාධිෂ්ඨානය පරිපූර්ණ වෙයි. ප්‍රඥා ප්‍රයෝජන පරිනිෂ්ඨානයෙන් ප්‍රඥාධිෂ්ඨානය පරිපූර්ණ වෙයි.

එහි විශෙෂයෙන්ම මෛත්‍රියට ක්‍ෂෙත්‍රවූ ඉපැද්මෙහි සත්‍යාධිෂ්ඨාන සම්පත්තියෙන් යුක්තවූ මහා පුරුෂයන්ගේ සත්‍යාධිෂ්ඨානයාගේ පරිපූරණය අභිව්‍යක්ත (ප්‍රකට) කරනලදි. විශෙෂයෙන් කරුණාවට ක්‍ෂෙත්‍රවූ අභිසම්බොධියෙහි ප්‍රඥාධිෂ්ඨාන සම්පත්තියෙන් යුක්තවූවාහුගේ ප්‍රඥාධිෂ්ඨාන සම්පත්ති පරිපූරණය අභිව්‍යක්ත කරනලදි. විශෙෂයෙන් මුදිතාවට ක්‍ෂෙත්‍රවූ ධර්මචක්‍ර ප්‍රවර්තනයෙහි ත්‍යාගාධිෂ්ඨානයෙන් යුක්තවූවාහුගේ ත්‍යාගාධිෂ්ඨාන පරිපූරණය අභිව්‍යක්ත කරනලදි. විශෙෂයෙන් උපෙක්‍ෂාවට ක්‍ෂෙත්‍රවූ පරිනිර්‍වාණයෙහි උපශමාධිෂ්ඨානයෙන් යුක්තවූවාහුගේ උපශමාධිෂ්ඨාන පරිපූරණය අභිව්‍යක්ත කරන ලද්දේයයි දතයුතු.

එහි සත්‍යාධිෂ්ඨානයෙන් යුක්තවූවාහුගේ සංවාසයෙන් ශීලය දතයුතු. ත්‍යාගාධිෂ්ඨානයෙන් යුක්තවූවාහුගේ මනා ව්‍යවහාරයෙන් ශ්‍රුතිය දතයුතු. උපශමාධිෂ්ඨානයෙන්

යුක්තවූවාහුගේ විපත්තියෙහි සථාමය දතයුතු. ප්‍රඥාධිෂ්ඨානයෙන් යුක්තවූවාහුගේ ඥානවිශාවෙන් ප්‍රඥව දතයුත්තිය. මේ ක්‍රමයෙන් ශීල ආජීව විතත දෘෂ්ටි විශුද්ධිහු දතයුත්තාහුය.

එසේම සත්‍යාධිෂ්ඨානය හෙතුකොට ගෙන අනුන් තොරවටන හෙයින් වෙශාඝතියට තො පැමිණෙත්. තාහාගාධිෂ්ඨානය හෙතුකොට ගෙන වස්තූන්හි තො ඇලෙන බැවින් ලොභයෙන් අගතියට තොයෙති. උපශමාධිෂ්ඨානය හෙතුකොට ගෙන අපරාධ තො කරන හෙයින් භයාගතියට තොයෙත්. ප්‍රඥාධිෂ්ඨානය හෙතුකොට ගෙන ඨථාසවභාවය අවබොධ කරන හෙයින් මොහාගතියට තොයෙත්.

එසේම ප්‍රථමාධිෂ්ඨානයෙන් දොෂයෙන් දූෂිත තොවී ඉවසන සුළු වෙත්. ඒතීයාධිෂ්ඨානයෙන් ලොභයෙන් ලුබ්ධ තොව ආහාරාදිය වළඳනසුළු වෙති. තෘතීයාධිෂ්ඨානයෙන් අහිතයෙන් වැළකෙන සුලුවෙත්. චතුර්ථාධිෂ්ඨානයෙන් මොහයෙන් මුළා තොව ප්‍රහාතව්‍ය ධම්මයන් ප්‍රහාණය කෙරෙති. ප්‍රථමාධිෂ්ඨානයෙන් නෛෂ්ක්‍රම්‍ය සුඛප්‍රාප්තිය වෙයි. ඉතිරි අධිෂ්ඨානයන් ගෙන් විවේක උපශම සම්බොධි සුඛප්‍රාප්තිහු දතයුත්තාහ.

එසේම විවෙකයෙන් උපන් ප්‍රීති සුඛය සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය අප්‍රීතියෙන් උපන් කායසුඛය සතිපාරිසුද්ධියෙන් හටගත් සුඛොත්පත්තිහුය යන මොහු මේ චතුරධිෂ්ඨානයෙන් පිළිවෙළින් වෙත්යයි මෙසේ තොයෙක් ගුණානුබන්ධයෙන් යුත් චතුරධිෂ්ඨානයන් හෙත් සියලු පාරමී සංග්‍රහය වේයයි දතයුතු.

යම්සේ මේ චතුරධිෂ්ඨානයෙන් සියලු පාරමිතාවන්ගේ සංග්‍රහය වේද, එසේම කරුණා ප්‍රඥා දෙකින්ද සංග්‍රහය වේයයි දතයුතු. සියලු බොධි සම්භාරය තෙම කරුණා ප්‍රඥා දෙකින් සංග්‍රහ කරන ලද්දේය. කරුණා ප්‍රඥා දෙකින් පරිහාණිතවූ දානාදි ගුණයෝ බොධි සම්භාර නම් වෙත්, බුඩබව සිඩිය කෙළවර කොට ඇත්තාහයි මෙසේ පාරමිතාවන්ගේ සංග්‍රහය වේයයි දතයුතු.

13 "ඔවුන්ගේ සම්පාදනොපාය කවරේද?" යන මේ ප්‍රශ්න යෙහි සම්‍යක් සම්බොධිය උදෙසා සියලු කුශලාදි සම්භාරයාගේ අවෙකල්ලකාරිතා යොගයෙන් නිරවශෙෂයෙන් සම්හරණය කිරීමය, එහිද ආදර බහුමාන යොගයෙන් සක්කාව්වකාරිතාය, (සකස්ව කරන බවය) නිරන්තර යොගයෙන් (අතරක් නැතිව පුහුණු කිරීමෙන්) සාතව්වකාරිතාය, අතරතුර කෙළවරකට නොපැමිණීමෙන් විරකාලාභියොගය යන මේ චතුරංග යොගය වනාහි මේ පාරමීන්ගේ සම්පාදනොපාය වෙයි.

එසේම බුධිත්වය පිණිස පිළිපදින්නාවූ මහාබොධිසත්ත්වයන් විසින් සම්‍යක්සම්බොධිය පිණිස බුදුවරයන්ට පළමු කොටම තමන්ගේ ආත්මය "මම මේ ආත්මභාවය බුදුන්ට පාවාදෙමි"යි පාවාදිය යුතුය. ඒ ඒ පරිගෘහීත වස්තුද ප්‍රතිලාභයෙන් පළමු කොටම දානමුඛයෙහි විසදිය යුතුය. මට උපදනාවූ යම් කිසි ජීවිත පරිෂ්කාර කෙතෙක් ඇද්ද, ඒ සියල්ල යාචකයන් ඇති කල්හි දෙන්නෙමි ඔවුන්ට දී ඉතිරිවූවක්ම මා විසින් අනුභව කටයුතුය. මෙසේ වනාහි මතාකොට පරිත්‍යාගය කළ කාලයෙහි උත්වහන්සේගේ චිත්තාභි සංස්කාරයෙහි සවිඤ්ඤාණකවූ හෝ අවිඤ්ඤාණකවූ හෝ යම් පරිග්‍රාහ වස්තුවක් උපදීද, එහි පූජියෙහි දීමෙහි නොකරතලද පුරුදුදය, පරිග්‍රහ වස්තූහුගේ මද බවය, උළාර මනොඥ භාවය, පරිභෂය චින්තායයි දන විනිබන්ධයෝ (විවිධ බන්ධනයෝ) සතර දෙනෙක් වෙති.

ඔවුන් අතුරෙන් යම් කලෙක දෙයධර්මය ඇති කල්හි, යාචකයා නුදු එළඹ සිටි කල්හි මහාබොධි සත්ත්වයන්ගේ සිත ඊට නොනැමේද, නුදුවාද, ඒ කරණකොට ගෙන "මම එකාන්තයෙන් පෙර දීමෙහි නොකළාවූ පුරුදු ඇත්තෙමි, එහෙයින් දැන් දෙනු කැමති බව මාගේ සිතෙහි නොපවතියි"යි මෙහි නිශ්ඨාවට යායුතුය. උත්වහන්සේ මෙසේ මිත්මතු මාගේ සිත දානාභිරතියෙහි ඇලෙන්නේය, එබැවින් "මම මෙවක් පටන් දන් දෙන්නෙමි, මා විසින් පළමු කොටම පරිග්‍රාහ වස්තු යාචකයන්ට පරිත්‍යාග කරන ලද්දේ නොවේදැ"යි මුකත ත්‍යාගීව පිරිසිදු සිත් ඇතිව දෙය ධර්ම පරිත්‍යාගයෙහි ඇලුම් ඇතිව දානසංවිභාගයෙහි ඇලුම් ඇතිව දන් දෙති මේසේ මහාබොධි සත්ත්වයන්ගේ පළමුවන දාන විනිබන්ධය නැසුණේ වෙයි, විශෙෂයෙන් නැසුණේ වෙයි, මුල්සිදුණේ වෙයි.

එසේම මහාසත්ත්වයෝ දෙයධර්මය මැදවූ කල්හිද විකලවූ කල්හිද මෙසේ සලකති කෙසේද? "මම වනාහි පෙර නුඹුන් බැවින් දැන් මෙසේ ප්‍රත්‍යයෙන් විකල වූයෙමි, එහෙයින් දැන් මා විසින් මදවූ හෝ ඝිනවූ හෝ ලද යම් දැන වසතුවකින් තමාට පිඬාකොටත් දත් දිය යුතුමය, මම මත්තෙහි දැන පාරමිතාව මුදුන් පමුණුවමි"යි කියායි. උත්වහන්සේ ලද දෙයකින් මුක්ත ත්‍යාගීව පිරිසිදු අත් ඇතිව දැනයෙහි ඇලුම් ඇතිව යාචකයන්ගේ වචන දැන දැනයෙහි හා සංවිභාගයෙහි ඇලුම් ඇතිව දත් දෙති. මෙසේ මහාසත්ත්වයන්ගේ දෙවැනිවූ දැන විනිබන්ධය කැසුණේ වෙයි, විශෙෂයෙන් කැසුණේ වෙයි, මුල් සිදුණේ වෙයි.

එසේම මහාසත්ත්වයෝ දැන වසතුවෙහි මනොඥභාවයෙන් නොදෙනු කැමති බව සිත්හි උපන්කල "සත් පුරුෂයෙනි, නුඹ විසින් ඉතා උදරවූ කැමැත්ම ශ්‍රෙෂ්ඨවූ සම්‍යක්සම්බොධිය පතන ලද්දේ නොවේද, එහෙයින් නුඹ විසින් ඒ සඳහා උදරවූ මනොඥවූ දෙය ධර්මයන් දියයුතුය"යි සලකති. උත්වහන්සේ මුක්ත ත්‍යාගීව-පෙ-දැනයෙහි හා සංවිභාගයෙහි ඇලුම් ඇතිව උදරවූ මනොඥ දෙයම දෙති. මෙසේ මහා සත්ත්වයන්ගේ තුන් වැනිවූ දැන විනිබන්ධය කැසුණේ වෙයි. මනාව කැසුණේ වෙයි. මුල් සිදුණේ වෙයි.

එසේම මහාසත්ත්වයෝ දත් දෙන්නාහු යම් කලක දැන වසතුවගේ ක්ෂයවීමක් දකිත්ද, උත්වහන්සේ එවිට මෙසේ සලකති. "යම් මේ ක්ෂය වන සවභාවයක් වේද, විනාශ වන සවභාවයක් වේද ඒ වනාහි භොගයන්ගේ සවභාවයෙක, තවද මාවිසින් පෙර එබඳු දැනයන් නොදෙනලද හෙයින් මෙසේ භොගයන්ගේ ක්ෂය වීමක් පෙනේ. එබැවින් සවලපවූ හෝ මහත්වූ හෝ යථාලබ්ධවූ දැන වසතුවකින් දත් දෙන්නෙමි, මම මතු දැනපාරමිතාව මුදුන් පමුණුවන්නෙමි"යි කියායි. උත් වහන්සේ මුක්ත ත්‍යාගීව-පෙ-දැනයෙහි හා සංවිභාගයෙහි ඇලුම් ඇතිව ලද දෙයකින් දත් දෙති. මෙසේ මහාසත්ත්වයන්ගේ සිවු වැනිවූ දැන විනිබන්ධය කැසුණේ මනාව කැසුණේ මුල් සිදුණේ වෙයි. මෙසේ දැන පාරමිතාව විනිබන්ධවූ යම් යම් අනථ කෙනෙක් ඇද්ද, ඔවුනොවුන් සුදුසු පරිද්දෙන් සලකා දුරු කිරීමද, උපායද දැනපාරමිතාවෙහි යම්සේද, ශීල පාරමිතාදියෙහිත් එසේමයයි දතයුතු.

තවද මහාසත්ත්වයන්ගේ බුදුවරයන්ට යම් පරිත්‍යාගයක් ඇද්ද, ඒ වනාහි සියලු පාරමිතාවන්ගේම මහාකොට සම්පාදනොපායවෙයි. බුදුවරයන්ට ආත්මය පරිත්‍යාගකොට සිටියාවූ මහාබොධි සත්ත්වයෝ වූ කලි ඒ ඒ තන්හි බොධි සම්භාර ධර්මයන් සම්පූර්ණ කිරීමට හැටෙන්නෝ ව්‍යායාම කරන්නෝ ශරීරයද සුඛොපකරණයන්ද සිදලන්නාවූ සහසය නොකට හැක්කාවූ දුරහි සම්භවවූ ක්‍රියාවන්හිද සත්ත්ව සංස්කාරයන් විසින් එළවන ලද නිවුවූ ප්‍රාණය පැහැරගන්නාවූ අනර්ථයන් ඇති කල්හිද මාවිසින් මේ ආත්ම භාවය බුදුන්ට පරිත්‍යාග කරන ලද්දේය. මෙහි යමෙක් යමෙක් වේතම් එහි කිමෙක්දැයි ඒ හෙතු වෙන් කම්පිත නොවෙති. නො වෙවිලති. මදකුදු වෙනසකට නොපැමිණෙති එකාන්තයෙන් කුශලාරම්භයෙහි නිශ්චල අධිෂ්ඨානය ඇත්තෙක් වෙයි. මෙසේ ආත්ම සන්තනියිතනයද පාරමීන්ගේ සම්පාදනොපාය වෙයි.

තවද සැකෙවින් කරන ලද අභිනිහාර ඇති බොධිසත්ත්වයන්ගේ ආත්මය කෙරෙහි ඇති ස්නෙහයාගේ කෙළවර කිරීමද, මෙරමා කෙරෙහි ස්නෙහය වැඩීමද මේ පාරමිතාවන්ගේ සම්පාදනොපාය වෙයි. සම්‍යක්සම්බොධි සමධිගමනය පිණිස කරන ලද ප්‍රාර්ථනා ඇති යථාසවභාවයෙන් දැනගැනීමෙන් සියලු ධර්මයන්හි ඇලීමක් නැත්තාවූ මහාබොධි සත්ත්වයන් වහන්සේගේ ආත්ම ස්නෙහය නිරවශෙෂයෙන් ගෙවියන්නේය. මහාකරුණා සමාසේවනයෙන් සියලු සත්ත්වයන් ප්‍රිය පුත්‍රයන් මෙන් දක්නාවූ මහා සත්ත්වයන් වහන්සේගේ ඒ සත්ත්වයන් කෙරෙහි පවත්නාවූ මෛත්‍රී කරුණා ස්නෙහය වැඩෙන්නේය. ඉක්බිත්තෙන් ඒ ඒ අවස්ථාවට සුදුසුව සවසන්නාන පරසන්නාන යෙහි ලොභ වෙෂ මොහයන් පහ කිරීමෙන් දුරු කරනලද මානසය්‍යාදී බොධිසම්භාර ප්‍රතිපක්ෂ ධර්මයන් ඇති මහා පුරුෂයෝ චතුරධිෂ්ඨානයන්ට අනුව ගියා වූ දන ප්‍රියවචන අර්ථචර්‍යා සමානාත්මතායයි කියනලද සතර සංග්‍රහ වස්තුවෙන්ද අතිශයින්ම සත්ත්වයන්ට සංග්‍රහ කිරීමෙන් මතු යානත්‍රයට බැස්වීමත් මිහිකරවීමත් කෙරෙති, මහාසත්ත්වයන්ගේ වනාහි මහාකරුණාව හා මහාප්‍රඥාවත් දනයෙන් සරසන ලද්දේය. දනය ප්‍රිය වචනයෙන්ද, ප්‍රියවචනය අර්ථචර්‍යාවෙන්ද, අර්ථචර්‍යාව සමානාත්මතායෙන්ද සරසන ලද්දේය. සංග්‍රහ කරන ලද්දේය. සියලු සත්ත්වයන් තමන් කෙරෙහි විශෙෂයක් නොකොට

බොධිසම්භාර ධර්මයන් (කෙරෙහි) පිළිපදින්නාවූ බෝසතාණන් වහන්සේලාට හැමතන්හි සමාන සැප දුක් ඇති බැවින් සමානාත්මතාවගේ සිද්ධයවෙයි. බුදුබවට පැමිණියන්ගේද චතුරධිෂ්ඨාන පරිපූරිතාභිවෘද්ධිවූ ඒ සතර සංග්‍රහ වස්තූන්හෙත්ම සත්ත්වයන්ට බොහෝ සෙයින් සංග්‍රහ කිරීම කරණ කොටගෙන අනිතිවෙශතය සිද්ධවෙයි. ඒ එසේමය. සම්‍යක් සම්බුද්ධයන්ගේ ත්‍යාගාධිෂ්ඨානයෙන් දානය පරිපූරිතය, අභිවෘද්ධිය. සත්‍යාධිෂ්ඨානයෙන් ප්‍රිය වචනයද ප්‍රඥාධිෂ්ඨානයෙන් අර්ථචර්‍යාවද උපශමාධිෂ්ඨානයෙන් සමානාත්මතාවද පරිපූරිතය, අභිවෘද්ධිය. තථාගතවරයන්ගේ චතාභි පරිනිර්ඝාණයෙන් සියලු ශ්‍රාවකයන් හා පසේබුදුවරයන් හා සමානාත්මතාව වෙයි. එහි චතාභි උත්වහන්සේලාගේ අවිශෙෂයෙන් එකීභාවය වෙයි. විමුක්තියගේ නානාත්වය නැත්තේය. එහෙයින් කියනලදි.

266 "සව්වෙව වාගි උපසන්තෙනා පඤ්ඤවා අනුකම්පිකො,
සමහතසබබසම්භාරො ඤාණාමත්ථං ච සාධයෙ.

267 මහාකාරුණිකො සත්ථා හිතෙසිව උපෙක්ඛකො,
නිරපෙක්ඛාව සබබත්ථ අහො ! අච්ඡරියො ජිනො.

268 විරත්තෙනා සබබධම්මෙසු සත්තෙසු ච උපෙක්ඛකො,
සදා සත්තහිතෙ යුත්තෙනා අහො ! අච්ඡරියො ජිනො.

269 සබබදා සබබසත්තානං හිතායව සුඛාය ච,
උස්සුත්තෙනා අකිලාසුව අහො ! අච්ඡරියො ජිනො"යි

එහි භාවය:- සබවස පිහිටියාවූ ත්‍යාග ශීලිවූ සංසුන් ඉඳුරන් ඇත්තාවූ නුවණැත්තාවූ අනුකම්පා කරන්නාවූ රැස්කර ගත්තාලද සියලු බොධිසම්භාර ධර්මයන් ඇති මහබෝසතාණන් වහන්සේ කවර නම් ලෞකික ලොකොත්තර අර්ථයක් සිදුකර නොගන්නාහුද සම්පාදිසිද්ධිය කරගන්නාහු මැයි.

මහත් කරුණාවක් ඇත්තාවූ අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනය කරන්නාවූ වැඩ පතන්නාවූ මධ්‍යස්ථවූ හැම තන්හි සෙවත් ලෞකික දෙයෙහි අපෙක්ෂාවක් නැත්තාවූ පස්මිරුන් දින්නාවූ බොධි සත්ත්වයෝ අහෝ ! ආශ්චර්‍යයී වේනි.

සියලු දෙයෙහි නොඇලුණාවූ සත්ත්වයන් කෙරෙහි උපෙක්ෂා-කවූ හෙවත් මැදහත් පැවතුම් ඇත්තාවූ හැම කල්හි සත්ත්වයන්ට හිත වැඩ සාදා දීමෙහි යෙදුණාවූ පස්මරුන් දිනන්නාවූ බොධි සත්ත්වයෝ අහෝ! ආශ්චර්‍ය්‍ය වෙත්.

හැම කල්හි සියලු සත්ත්වයන්ට වැඩ පිණිසද සැප පිණිසද උත්සාහවත් වූවාහු එයින් පිඛාවට නොපැමිණෙති. පස්මරුන් දිනන්නාවූ මහා බොධි සත්ත්වවරයෝ අහෝ! ආශ්චර්‍ය්‍ය වෙති.

14 "ඔවුන්ගේ සිඛකිරීම කෙතෙක් කලකින්වේද"යි යන මේ ප්‍රශ්නයෙහි ප්‍රථමකොට යටත් පිරිසෙයින් සතර අසංඛ්‍යයක් හා මහා කල්පයන් පිළිබඳ ලක්ෂයෙක හෙවත් චතුර සංඛ්‍ය කල්ප ලක්ෂයෙක, මැදත් පිරිසෙයින් අෂ්ටාසංඛ්‍යයක් හා මහා කල්පලක්ෂයෙක හෙවත් අෂ්ටාසංඛ්‍ය කල්පලක්ෂයෙක. උඩත් පිරිසෙයින් ෂොඩශාසංඛ්‍යයක් හා මහා කල්පලක්ෂයෙක. හෙවත් ෂොඩශාසංඛ්‍ය කල්පලක්ෂයෙක. මේ කාලවිශෙෂයෝද පිළිවෙළින් ප්‍රඥාධික ශ්‍රඛාධික වීර්‍යාධික බොධිසත්ත්වයන්ගේ වශයෙන් දතයුත්තාහ. ඒ එසේමය. ප්‍රඥාධිකවූ බොධිසත්ත්වවර-යන්ට ශ්‍රඛාව මදවත්නීය. ප්‍රඥාව තියුණු වත්නීය. ශ්‍රඛාධිකවූ බොධිසත්ත්වවරයන්ට ප්‍රඥාව මධ්‍යම වත්නීය. (ශ්‍රඛාව තියුණුවත්නීය) වීර්‍යාධිකවූ බොධිසත්ත්වවරයන්ට ප්‍රඥාව මදවත්නීය. (වීර්‍යය තියුණුවත්නීය) ප්‍රඥානුභාවයෙන් වනාහි සම්‍යක් සම්බොධියට පැමිණිය යුතුවේ යයි අර්ථකථාවෙහි කියනලද්දේය. සමහර කෙනෙක් වනාහි වීර්‍යයාගේ තීක්ෂණ මධ්‍යම මෘදුභාවයෙන් බොධිසත්ත්වවරයන්ගේ මේ කාල විභාගය වත්තේයයි කියති. සාමාන්‍යයෙන් වනාහි අතීත්ඵල විමුක්තිය ඉහුකරවත්නාවූ ධර්‍මයන්ගේ තීක්ෂණ මධ්‍යම මෘදු භාවයෙන් යටකී කාලභෙදයෙන් උත්වහන්සේලාගේ බොධිසම්භාරධර්‍මයන් සම්පූර්ණවීමට යෙත්නුයි. මේ කාලභෙදයෝ තුන්දෙනම යොග්‍යවූවාහු යයි කියත්මය.

උග්ඝටිතඥය, විපචිතඥය, නෙය්‍ය යන ප්‍රභෙදයෙන් ත්‍රිවිධ වූ බොධිසත්ත්වයෝ අභිනීහාරක්ෂණයෙහිම සමාන වෙති. ඔවුන් අතුරෙන් යමෙක් උග්ඝටිතඥවේද, හෙතෙම ඉදින් ශ්‍රාවක බොධියෙහි පිහිටියේවිතම් (ශ්‍රාවක බොධියෙන් නිවන්දකිනු කැමති වේතම්) සම්‍යක් සම්බුඛයන් වහන්සේගේ අභිමුඛයෙන් සතර

පදෙයන් යුත් ගාථාවක් අසන්නේ ම ගාථාවෙහි තුන්වන පදය නිමවන්ට පළමුකොට ම ෂඩභිඥාවන් හා සිවුපිළිසිඹියාවන් සමඟ අර්හත්ඵලයට පැමිණෙන්ට සමර්ථවූ උපනිශ්‍රය ඇත්තෙක් වෙයි. දෙවන විපච්චිතඤ්ඤ බොධිසත්ත්වතෙම ඉදින් ශ්‍රාවක බෝධියෙහි පිහිටියේ නම් බුදුන් හමුවෙහි සතරපදයෙන් යුත් ගාථාවක් අසන්නේ ගාථාවෙහි සතරවනපදය නිමවන්ට පළමුකොට ම ෂඩභිඥාවන් සමඟ අර්හත්ඵලයට පැමිණීමට සමර්ථවූ උපනිශ්‍රය ඇත්තෙක් වෙයි. අනික් තෙය පුද්ගලතෙම බුදුන්ගේ හමුවෙහි සතර පද ගාථාවක් අසන්නේ ගාථාව නිමාවූ කල්හි ෂඩභිඥාවන් සමඟ අර්හත් ඵලයට පැමිණෙන්ට සමර්ථවූ උපනිශ්‍රය ඇත්තේ වෙයි. මේ ත්‍රිවිධ බොධිසත්ත්වවරයෝම කාල හෙදයක් නැතිව කරනලද ප්‍රාර්ථනා ඇත්තාහුද බුදුවරයන්ගේ සම්පයෙහි ලබන ලද විවරණ ඇත්තාහුද අනුක්‍රමයෙන් පාරමී ධර්මයන් පුරන්නාහු යථොක්ත ප්‍රභෙද ඇති කාලයෙන් සම්‍යක් සම්බොධියට පැමිණෙන්නාහුය. ඒ ඒ කාලප්‍රභෙදය සම්පූර්ණ නොවූ කල්හි ඒ ඒ මහා බොධිසත්ත්වවරයෝ දවසක් දවසක් පාසා වෙස්සන්තර දානය හා සමානවූ මහදන් දෙන්නාහුද, එබඳු වූම ශීලාදි සියලු පාරමී ධර්මයන් රැස්කරන්නාහුද, පසුව මහා පරිත්‍යාගයන් සම්පූර්ණ කරන්නාහුද, ඤාතත්ථචරියාය ලොකත්ථචරියාය බුද්ධත්ථචරියාය යන ත්‍රිවිධචර්යාවන් පරමකොටියට පමුණුවන්නාහුද අතරතුරෙක සම්‍යක් සම්බුබයෝ වන්නාහ යන මේ කාරණය විද්‍යමාන නොවේ කවරහෙයකින්දයත්? නුවණ මුහු නොකරන බැවින් හා බුදුකුරුදම් නොනිමෙන බැවිනි. කලට පැහෙන්නාවූ ගොයමක් මෙන් කියන ලද කාල විශෙෂයාගේ පරිච්ඡේදයෙන් සම්‍යක් සම්බොධිය සමඟ වන්නේය. ඉන් මෙදෑතුරෙක සියලු උත්සාහයෙන් උත්සාහ කරන්නාවූ බොධිසත්ත්වවරයන් විසිනුදු සම්‍යක් සම්බොධියට පැමිණෙන්ට නොහැකි වන්නේමය. පෙරුම් පුරා කියනලද කාල විශෙෂයෙන්ම බුදුබව සිඛවන්නේයයි දතයුතු.

15 "ඔවුන්ගේ ආනිසංසය කවරේද?" යන මේ ප්‍රශ්නයෙහි කරනලද අභිනීහාර ඇති මහාසත්ත්වයන්ගේ යම් ඒ ආනිසංස කෙසෙක්-

270. "එවං සබ්බඞ්ගසම්පන්නා බොධියා නියතා තරා,
සංසාරං දීඝමඩ්ධානං කපපකොටිසතෙහිපි;
අවිවිමහි නුපපජ්ජන්ති තථා ලොකන්තරෙසු ච.

271. නිජ්ඣාමතණ්හා ඛුප්පිපාසා න හොන්ති කාලකඤ්ජකා,
න හොන්ති බුද්ධා පාණා උපපජ්ජන්තාපි දුග්ගතිං.

272. ජාගම්හා මිනුසෙසු ජච්චන්ධා න භවන්ති තෙ,
සොණ්ඩවෙණ්ඩලූනා න න්ති න භවන්ති මූගපක්ඛිකා

273. ඉත්ථි භාවං න ගච්ඡන්ති උභතොබ්‍යඤ්ජනපණ්ඩකා,
න භවන්ති පරියාපන්නා බොධියා නියතා නරා.

274. මූත්තා ආතන්තරිකෙහි සබ්බත්ථ සුඛගොචරා,
මිච්ඡාදිට්ඨිං න සෙවන්ති කම්මකිරියදස්සනා.

275. වසමානාපි සග්ගෙසු අසඤ්ඤං නුපපජ්ජරෙ,
සුඛාවාසෙසු දෙවෙසු හෙතු නාම න විජ්ජති.

276. තෙකඛම්මනිත්තා සපුරිසා විසංයුත්තා භවාභවෙ,
වරන්ති ලොකන්ථරියා පූරෙන්තා සබ්බපාරමී"ති

මෙසේ ඇට කී සියලු ගුණයන්ගෙන් යුක්තවූ සම්‍යක් සම් බොධියට නියතවූ බොධිසත්ත්වවරයෝ කප්කෙළ සියගණන කිහුදු දිගුකලක් මුළුල්ලේ සසර සැරිසරා ඇවිදින්නාහු "අවීචි මහානරකයෙහි නූපදින්. එසේම ලොකාන්තරික නරකයෙහිත් නූපදිති. නිජ්ඣාමතණ්හාය, ඛුප්පිපාසාය, කාලකඤ්ජකය යන මේ ප්‍රෙත නිකායයන්හි නූපදිති. තිරිසන් යොනියෙහි උපදනා හුද වටුවන්ට කුඩා සතුන්ව නූපදිති. මනුෂ්‍ය ජන්මයෙහි උපදනා කල්හිදූ ජාත්‍යන්ධ නොවෙති. ජාති බධිර නොවෙති. ජාති මූග (ගොළු) නොවෙති. ජාති පිළු නොවෙති. සත්‍රී නොවන්නාහ. උභතොබ්‍යඤ්ජනක පණ්ඩකයන් කෙරෙහි අන්තර්ගත නොවෙති. ආතන්තරයෝ කම්යෙන් මිදුනාහුය. කම්වාදී ක්‍රියාවාදී සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු මිථ්‍යා දෘෂ්ටිකයෝ නොවෙති. දෙව්ලොව උපදිනත් අසංඥ තලඉගෙහි නූපදනාහ. පඤ්ච ශුද්ධාවාස දෙවියන් කෙරෙහිත් (අනාගාම්ව උපදනා හෙයින්) ඉපැද්මට කාරණයක් නැත් තෝය." (මේ අටලොස් අභව්‍යසථානයන්ට නොපැමිණෙති.) "කුදු මහත් භවයන්හි නොඇලුනාවූ නෙෂ්ක්‍රම්‍යයට නැමුණාවූ බොධිසත්ත්වවරයෝ සම්තිස් පැරුම් පුරත්නාහු ලොකා ඵවයිව පිණිස හැසිරෙති"යි මෙසේ වණිනා කරන ලද්දහුද. ඕවිහු වකාහි ආනිසංසයෝම වෙති. තවද "සතෝ සම්පජානෝ ආනන්ද, බොධිසත්තෝ තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං

ඔක්කාමති" යනාදීන් වදාළ සොළොස් වැදෑරුම් ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍ම ප්‍රකාරයෝ "සීතං උපගතං භෝති උණ්හං ච උපසම්මති" යනාදීහුද "ජායමානෙ ඛො භාරිපුත්ත බොධිසත්තෙ අයං දස සහස්සී ලොකධාතු සංකම්පි සම්පකම්පි සම්පවෙධි" යනාදීන් දක්වා වදාළ දෙතිස් පුර්‍වනිමිත්තානෙෝද, අනිකුත් බොධිසත්ත්වවර යන්ගේ අභිප්‍රාය සිද්ධියද, කර්‍මාදියෙහි වසීභාවයද යනාදිවූ ජාතක බුද්ධවංශාදියෙහි දක්වනලද ප්‍රකාර ඇති ඒ හැම බොධිසත්ත්ව යන්ගේ ආනිසංසයෝයයි දතයුත්තාහ. තවද යම් පරිද්දකින් දක්වනලද ප්‍රභෙද ඇති අලොභාදෙෂාදි ගුණ යුගලයෝද ආනිසංසයහයි දතයුත්තාහ. තවද යම්හෙයකින් බොධිසත්ත්වයෝ අනිනීහාරයේ පටන් හිතෙෂි භාවයෙන් සියලු සත්ත්වයන්ට පියෙකු හා සමාන වෙද්ද, දක්‍ෂිණාඟි වන බැවින් ගරුබුහුමන් කටයුතු වෙද්ද, ගුණ විශෙෂ යොගයෙන් පරම පුණ්‍යක්‍ෂෙත්‍රයක් වෙද්ද, බෙහෙවින් මනුෂ්‍යයන්ට ප්‍රිය වෙද්ද, අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙද්ද, දෙවියන් විසින් පාලනය කරනු ලැබෙද්ද, මෛත්‍රිය හා කරුණාවෙන් පරිභාවිත සන්තාන ඇති බැවින් වල්මුවාදීන් විසිනුත් මැඩලිය නොහැකි වෙද්ද, යම් යම් සත්ත්ව නිකායක උපදින් නම් ඒ ඒ සත්ත්ව නිකායෙහි උදාරවූ ශරීර වර්‍ණයෙන්ද උදාරවූ යසසින්ද උදාරවූ සැපයෙන්ද උදාරවූ බලයෙන්ද උදාරවූ ආධිපත්‍යයෙන්ද, සෙසු සත්ත්වයන් අභිභවනය කෙරෙද්ද, පුණ්‍ය විශෙෂ යොගයෙන් නීරොග වෙද්ද, ශරීර දුක්නැත්තාහු වෙද්ද, සුවිශදවූ අතිශයින් පිරිසිදුවූ ශ්‍රද්ධාව ඇති වෙද්ද, සුවිශදවූ සුපරිශුද්ධවූ වීර්‍යය, සමාධිය, ප්‍රඥාවය යන මොවුහු වෙද්ද, මදවූ කෙලෙස් ඇත්තෝ වෙද්ද, මදවූ විද්‍යා ඇත්තෝ වෙද්ද, මදවූ පරිදාහ ඇත්තෝ වෙද්ද, මදවූ කෙලෙස් ඇති බැවින් සුවව වූවෝ වෙද්ද, අනුන් විසින් පෙන්වා දෙන ලද වරද ගෞරවයෙන් පිළිගන්නාහු වෙද්ද, ඉවසන්නාහු වෙද්ද, සුරත වෙද්ද, මටසිලුටු තෙපුල් ඇත්තෝ වෙද්ද, පිළිසඳරෙහි සමර්‍ථ වෙද්ද, ක්‍රොධ නැත්තෝ වෙද්ද, බඳ වෛර නැත්තෝ වෙද්ද, ගුණමකු නොවෙද්ද, ඊර්‍ෂ්‍යා නොකරන්නෝ වෙද්ද, මසුරුමල නැත්තෝ වෙද්ද, තමා කෙරෙහි තැති ගුණ පහළ නොකෙරෙද්ද, ඇති දෙස් මූවහ නොකෙරෙද්ද, අවවාද යට නොනැමෙන දැඩි සවභාවය නැත්තාහු වෙද්ද, අධිකමානය නැත්තාහු වෙද්ද, එකට එක කරන සවභාවය නැත්තාහු වෙද්ද, අප්‍රමාද වූවාහු වෙද්ද, අනුන්ගෙන් වත්තාවූ පිඬා ඉවසිය හැක්කාහු වෙද්ද, අනුන් නො පෙළද්ද, යම් ගමක රටක

වෙසෙත්නම්, එහි සත්ත්වයන්ට නූපන්නාවූ භයාදි උපද්‍රවයෝ නූපදිද්ද, උපන්නාවූ උපද්‍රවයෝ සංසිඳෙද්ද, (ප්‍රමාද දෝෂය කින්) යම්කිසි අපාය යෙක්හි උපදින්නම් එහි බොහෝදෙනා මෙන් අධික මාත්‍රාදුකින් නොපෙළෙද්ද, බොහෝ සෙයින් සංවේගයට පැමිණෙද්ද, එසෙයින් මහා පුරුෂයන්ට සුදුසු පරිද්දෙන් ඒ ඒ භවයන්හි ලභ්‍යමානවූ සත්ත්වයන්ට පිතෘ සම භාවය, දක්ෂිණාහී භාවය ආදීවූ මේ ගුණ විශේෂයෝ ආනි සංසයෝ යයි දතයුත්තාහ.

එසේම ආයුස්සම්පත්ය, රූපසම්පත්ය, කුලසම්පත්ය. භෝගසම්පත්ය, ඇදහියයුතු බස් ඇති බවය, මහානුභාවතාය ආදිය මොහුද මහා පුරුෂයන්ගේ පාරමී ධර්මයන් පිළිබඳ ආනිසංසයෝයයි දතයුත්තාහ. එහි ආයුස්සම්පත්නම් ඒ ඒ උත්පත්තියෙහි දිගිායුෂ්ක වන බව හා චිරස්ථිතික වන බවය. ඒ කරණකොටගෙන පටන් ගත්තාලද්දාවූ කුශල සමාදානයෝ කෙළවරට පවුණුවති. බොහෝ පින්ද උපදවති. රූප සම්පත්නම් සෙසෙස් රූ ඇති බවයි, දැකුම් කටයුතු බවයි, පැහැදීම් එළවන බවයි. ඒ කරණකොටගෙන රූපයෙහි ප්‍රසාද ඇති සත්ත්වයන්ට පැහැදීම් එළවන්නේ වෙයි. බුහුමන් කටයුතු වෙයි. කුල සම්පත්නම් උසස්වූ කුලයන්හි ඉපදීමයි. එයින් ජාති මදදිමදයන්ගෙන් මත්වූවන් විසින්ද ළඟට එළඹිය යුතුවේ, පඤ්චුපාසනය කටයුතු වේ. ඒ කරණකොටගෙන ඔවුන් නිර්වි සෙවන කෙරෙයි. භෝගසම්පත් නම් මහත් සම්පත් ඇති බවයි. මහෙශාක්‍ය බවයි. මහ පිරිවර ඇති බවයි. ඒ කරණකොටගෙන සංග්‍රහ කටයුත්තන්ට සතර සංග්‍රහ වසතු වෙන් සංග්‍රහ කරන්ටත් නිග්‍රහ කටයුත්තන්ට ධර්මයෙන් නිග්‍රහ කරන්ටත් සමර්ථ වෙයි. ඇදහිය යුතු බස් ඇති බව නම් ඇදහිය යුතු බවයි. පැහිය යුතු බවයි. ඒ කරණකොටගෙන සත්ත්වයන්ට ප්‍රමාණවූවෙක් වෙයි. නො ඉක්ම විය හැකි අණ ඇති වෙයි. මහානුභාවතාව නම් ආනුභාවයාගේ මහත් බවයි. ඒ කරණකොටගෙන අනුන් විසින් මැඬලිය නොහැකි වෙයි. තුමූම එකාන්තයෙන් දැහැමින්ද සෙමින්ද ඇවෑහුත ගුණයන් ගෙන්ද අනුන් මැඩපවත්වති. මෙසේ ආයුස්සම්පත්ති ආදීහු මහා පුරුෂයන්ගේ පාරමී ධර්මයන්ගේ අනුභාව වෙති තුමූන් අප්‍රමාණවූ පුණ්‍ය සම්භාරයාගේ වැඩීමට හේතුවූවාහු සත්ත්වයන් යානත්‍රයට බැස්වීමටත් කාරණ වූහයි දතයුත්තාහුය.

16 "ඔවුන්ගේ ඵලය කවරේද?" යන මේ ප්‍රශ්නයෙහි සැකෙවින් සම්මාසම්බුදුබව ඒ පාරමීන්ගේ ඵලය වෙයි. විස්තර වශයෙන් වාත්තිංශත්වර මහා පුරුෂ ලක්ෂණය. අශීත්‍යනුබ්‍යඤ්ජනය බ්‍යාමප්‍රභාය යනාදි තොයෙක් ගුණ රැසින් බබලන්නාවූ රූපකාය සමපත් ආධාරකොට ඇති දශබල චතුවෛශාරද්‍යය ෂඩ් අසාධාරණඥානය අෂ්ටාදශබුද්ධ ආවේණික බුද්ධධර්ම යන මොවුන් ආදිකොට ඇති අනන්තාපරිමාණ ගුණ සමූහයෙන් හොබනාවූ සඩ්ගීකාය ශ්‍රී සමාධියද, තොයෙක් කල්ප ලක්ෂගණන කිනිදු සම්‍යක් සම්බුඩයන් විසිනුදු වදුරා කෙළවර කරන්ට නොහැකි යම්තාක් බුඩ ගුණයෝ ඇද්ද. මේ වනාහි ඔවුන්ගේ ඵලය වේ. භාග්‍යවතුන් වහන්සේ විසින්ද වදුරනලදී:-

277 බුඩොපි බුඩසස භණෙය්‍ය වණ්ණං
කපපම්පි වෙ අඤ්ඤමහාසමානෝ
ඛීයෙථ කපෙපා විරදීඝමන්තරෙ
වණ්ණෝ න ඛීයෙථ තථාගතස්ස' සි.

කපක්පුරා දවස මුළුල්ලෙහි තමන් වැනිවූ බුදුකෙනෙකුන් විසින් අනික් එක බ්‍යකුදු නොවදුරා බුදුගුණ වහන් දීඝ කාල යක්හුගේ ඉක්මීමෙන් කල්පය ගෙවියත්තේය; බුදුගුණ නොගෙවෙන්නේය. මෙසේ මේ පාරමී ධර්මයන්හි ප්‍රකීර්ණක කථාව දතයුත්තීය.

දෙශනා නිගමනය.

පෙළෙහි වූකලි යම් කෙනෙකින් "දත්වා දුතබබකං දුතං" යනාදී සියලු පාරමීන් පිඩුකොට දක්වා පසුව "කොසජ්ජං භයතෝ දිස්වා" යනාදීන් අවසාන ගාථා දෙක වදුළ සේක්ද. ඒ වනාහි යම් බඳුවූ වීර්‍යාරම්භ, මෛත්‍රීභාවනා, අප්‍රමාද විහරණ යන මොවුන් කරණකොටගෙන යථොක්ත බුඩකාරක ධර්මයෝ විසඳ භාවයට ගියාහුනම්, සම්‍යක් සම්බොධියයි කියතලද, තමන් වහන්සේගේ විමුක්තිය මූකරවන ලද්දාහුනම්, ඒ වීර්‍යාරම්භාදී ධර්මයන්හෙන් වෙනෙත ජනයන්ටද විමුක්තිය මිහිකිරීමට අවවාද දෙනු පිණිසයි.

කොසජ්ජං භයතෝ දිස්වා විරියාරම්භඤ්ච ඛෙමතෝ,
ආරඛවීරියා භෝථ එසා බුඩානසාසනී. (370)

විවාදං භයතෝ දිස්වා අවිවාදඤ්ච ඛෙමතෝ,
සමග්ගා සඛිලා හොථ එසා බුද්ධානසාසනී. (371)

පමාදං භයතෝ දිස්වා අපපමාදඤ්ච ඛෙමතෝ,
භාවෙථට්ඨඞ්ගිකං මග්ගං එසා බුද්ධානසාසනී" ති (372)

වදුරතලද ඒ ගාථාවන්හි "**කොසජ්ජං භයතෝ දිස්වා විරියාරම්භඤ්ච ඛෙමතෝ**" යන පදයෙන් ප්‍රතිපක්ෂ ධර්මයෙහි ආදීනව දැක්වීම් වශයෙන්ද වීර්‍යාරම්භයෙහි ආනිසංස දක්වති. "**ආරබ්ධ විරියා හොථ**" යන මෙයින් වීර්‍යාරම්භයෙහි යොදවති. ඇම්හෙයකින්:-

278 සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං

(කායාදී චාරිත්‍රයෙන් සිදුවන්නාවූ හැම අකුසල් කොකිරීම්ද, ලෞකික ලොකොත්තර සියලු කුසලයන් ඉපදවීම්ද, උපදවනලද කුශලයාගේ වැඩීම්ද, පඤ්ච නීවරණයන් කෙරෙන් තමාගේ සිත පිරිසිදු කිරීම්ද යන මේ සියල්ල සියලු බුදුවරයන්ගේ අනුශාසනයයි) යනු සැකෙවින්ද, විස්තර හෙයින් වනාහි සකල බුද්ධවචනයෙහි ප්‍රකාශිතවූ සම්‍යක්සම්පත් එකාන්තයෙන් සම්‍යක් ප්‍රධානාදින්ගෙන් වන්නාහුද එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වීර්‍යාරම්භයෙහි යොදවා "**එසා බුද්ධානසාසනී**" යයි වදළහ. එහි මේ කෙටි අදහස වෙයි.

"සියලු සංක්ලෙශ ධර්මයන්ට මූල්වන හෙයින් සියලු අකුශල විධායක"යයි කුසීත භාවය හය වශයෙන්ද, ඊට ප්‍රතිපක්ෂ වශයෙන් කාමයෝගාදි සතර යොගයෙන් නිර්භය භාවය ඵලවන හෙයින් වීර්‍යාරම්භයද, නිර්භය වශයෙන් දැක අධිශීල ශික්ෂා සම්පාදන වශයෙන් වීර්‍යයාගේ පටන් ගැන්මෙක් වේද, සම්‍යක් ප්‍රධානානුයොගයෙක් වේද, "පටන් ගත්තාලද වීර්‍ය්‍ය ඇතිවවු"යයි මනාකොට යෙදීමෙක් වේද, මේ වනාහි භාග්‍යවත් බුදුවරයන්ගේ අනුශාසනයයි. ඉතිරි ගාථාවලත් මෙසේම අර්ථ දතයුතු. මේ වනාහි විශෙෂය වෙයි.

ෂඩ්විධ විවාද වස්තූන්ගේ වශයෙන් විවාද කිරීම භය වශයෙන්ද. ඊට ප්‍රතිපක්ෂවූ මෛත්‍රී වාක්කර්මය කොහොත් "අවිවාද යට හෙතුවූ ෂඩ්විධ සාරණීය ධර්මය"යි කියනලද අවිවාදය නිර්භය වශයෙන්ද දැක සමගිවවු, කයිනුදු සිහිනුදු වෙන්කොවවු,

මොළොක්වූ සවභාව ඇත්තාහුවවූ, මෙහි සඳී ප්‍රකාරයෙන් විවාදයට නොපැමිණ සවැස්සරුම් සාරණීය ධර්මයන් පිරීම් වශයෙන් සමගිව විසීමෙහි යම් මේ යෙදවීමක් ඇද්ද ඕතොමෝ සම්‍යක් සම්බුඩයන්ගේ අනුශාසනාව වන්නීය. ඒ එසේ මැයි. "සමගිව වසන්නාහු ශීල සමාධීන්ගේ සමාන භාවයට ගියාහු විවාද නොකරන්නාහු නිර්විධ ශික්ෂාව සම්පූර්ණ කෙරෙත්ය"යි සමගිව විසීමෙහි යෙදවීම ශාස්තෘන් වහන්සේ තමන්ගේ අනුශාසනාවයයි දක්වත්.

ප්‍රමාදය හය වශයෙන්ද අප්‍රමාදය නිර්භය වශයෙන්ද දැක අෂ්ටාඩගික මාර්ගය වඩවූ. මෝ වනාහි සම්‍යක් සම්බුඩයන්ගේ අනුශාසනාව වන්නීය එහි ප්‍රමාදය යනු පමා වීමයි. කුශලධර්මයන් කිරීමෙහි මුළාවීමද අකුශල ධර්මයන්හි සිතවිහිදුවීමද වෙයි. මෙම වදරන ලද මැයි "තත්‍ථ කතමෙ පමාදෙ? කාය දුච්චරිතෙ වා වචී දුච්චරිතෙ වා මනො දුච්චරිතෙ වා පඤ්චසු වා කාම ගුණෙසු චිත්තවොසසගගො වොසසගගානුපපදනං කුසලානං වා ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනුට්ඨිතකිරියතා ඔලීනවුත්තිතා නික්කිත්තඡන්දතා නික්කිච්චා ධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං යො එවරූපො පමාදෙ, පමජ්ජනා පමජ්ජනත්තං අයං වුච්චති පමාදෙ"යි එහි අර්ථ:- එහි ප්‍රමාදය නම් කිම? "කාය දුශ්චරිතයෙහි හෝ වාග් දුශ්චරිතයෙහි හෝ මනෝ දුශ්චරිතයෙහි හෝ පඤ්චකාම ගුණ යෙහි හෝ සිත විහිදුවා හැරීමෙක් වේද, සිහිය නැවත නැවත විහිදුවීමෙක් වේද, දැනීදී පින්දහම් කිරීමෙහි නොසකස් කොට කරන බවෙක් වේද, නිතොර නොකරන බවක්වේද රත්තත්‍ර යෙහි අනුට්ඨිත ක්‍රියා ඇති බවෙක් වේද, නිරතොර නොකරන බැවින් පසු බැස්මෙක් වේද, කුශල ක්‍රියාවෙහි බහා තබන්නලද විර්‍ය්‍ය ඡන්දය ඇත්තේ වේද, බහා තබන්නලද විර්‍ය්‍ය ධුර ඇත්තේ වේද හෙවත් බර නො උසුලන බවෙක් වේද කුශල ධර්මයන් සෙවනැසක් නොකෙරේද, නොවැඩීමෙක් වේද, බහුල නොකිරීමෙක් වේද. මෙබඳු යම් ප්‍රමාදයෙක්, ප්‍රමාදවන ආකාර යෙක් ප්‍රමාදවන බවෙක් වේද. ඒ ප්‍රමාදයයි කියනු ලැබේ" යනුයි අප්‍රමාදය යනු ප්‍රමාද නොවීමයි. ප්‍රමාදයට විරුඩ වශ යෙන් හේ දතයුතුයි. අර්ථ වශයෙන් වනාහි අප්‍රමාදය නම් සිහි යෙන් වෙන්ව නොවසීමයි. හෙවත් සිහියෙන් යෙදීමයි නිතර එළඹ සිටි සිහියට මේ නම්. අන්‍යාචාර්‍යවරයෝ වනාහි සති

සම්පජඤ්ඤඤ (සිහි නුවණ) ප්‍රධානකොට ඇති තථා ප්‍රවෘත්ත සතර අරූප ස්කන්ධයෝ අප්‍රමාදයයි කියත්, යම්හෙයකින් අප්‍රමාද භාවනාවයයි වෙත්වූ භාවනාවෙක් නැද්ද, යම්කිසි පුණ්‍ය ක්‍රියාවක්, කුශල ක්‍රියාවෙක් ඇද්ද, ඒ සියල්ල අප්‍රමාද භාවනායයි දතයුතුයි. විශෙෂයෙන් වනාහි නිවනට උපනිශ්‍රයවූ සරණ ගමනය, කායිකවාචසික සංවරය පටන් සියලු ශීලභාවනාය, සමාධිභාවනාය, සියලු ප්‍රඥාභාවනාය, සියලු කුශලයන්ගේ වැඩීමය, නිරවද්‍ය ධර්මයන්ගේ වැඩිමය යන මේසියල්ල අප්‍රමාද භාවනායයි දතයුතු.

අප්‍රමාද යන මේ පදය වනාහි මහත් අර්ථයක් ප්‍රකාශ කරන්නේය; මහත් අර්ථයක් පරිග්‍රහණයකොට (අල්වාගෙන) සිටියි. සියලු තෙවළා බුදු බණ අළලා අප්‍රමාද පදයාගේ අර්ථ කියන්නාවූ ධර්මකථිකතෙම කොතොවින් යන්තේයයි නොකිය යුතු කවර හෙයකින්ද යත්? අප්‍රමාද පදයාගේ මහත් බැවිනි. එහෙයින්ම කුසිනාරානුවර යුග්මශාලාන්තරයෙහි පරිනිර්වාණ සමයෙහි වැදහොත්තාවූ සම්‍යක් සම්බුඩයන් වහන්සේ අභිසම්‍යක් සම්බොධියෙහි පවත් පත්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙහි තමන් වහන්සේ විසින් වදාළතාක් ධර්ම එකම පදයකින් හකුළුවා දක්වන්නාහු "අප්පමාදෙන සම්පාදෙථ"යි වදාළෝ එහෙයින් වදාළහ:- "යෙසඤ්ඤාපි භික්ඛවෙ යානි කානිචි ජඞ්ගමානං පාණානං පදජාතානි සඞ්ඛානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති, හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්ත තෙන. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බ තෙ අප්පමාදමූලකා අප්පමාද සමොසරණා අප්පමාදෙ, තෙසං අග්ගමක්ඛායති" යි එහි අර්ථ:- මහණෙනි, පසින් යන්නාවූ සතුන්ගේ යම්කිසි පියවර කෙතෙක් ඇද්ද, ඒ සියලු පියවර ඇත් පියවරෙහි ඇතුළු වෙති ඇත් පියවර මහත් බැවින් ඔවුන්ට අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි එපරිද්දෙන්ම මාගේ ශාසනයෙහි යම්කිසි කුශල ධර්මකෙනෙක් ඇද්ද, ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ හෙතු ඵලාදි සවරූපයෙන් අප්‍රමාදයෙහි රැස්වන්නාහුය. ඒ අප්‍රමාදය ඒ කුශල ධර්මයන්ට අග්‍රයයි කියනු ලැබේය"යි එහි අප්‍රමාදය භාවනාව ශික්ෂා ප්‍රාප්ත කොට දක්වන්නාවූ ශාස්තෘන් වහන්සේ "භාවෙථෙතඤ්හිතිකං මහග්ඝං" යි වදාළෝ.

එහි අර්ථ:- ශීලය, සමාධිය, ප්‍රඥාය යන සකල්ත්‍රයෙහි සංගෘහීතවූ සම්‍යක් දෘෂ්ටිය ආදිකොට ඇති අෂ්ඨාඞ්ගික මාර්ගයෙක් වේද; ඒ වඩවූ. තමන්ගේ සන්තානයෙහි උපදවී. දර්ශනයයි කියනලද ස්‍රෝතාපත්ති මාර්ගයෙහි තොසිට මතු මාර්ත්‍රය උපදවීම් වශයෙන්ද වඩවූ. එසේ තොපගේ අප්‍රමාද භාවනා තොමෝ ශිඛා ප්‍රාප්ත වන්නීය යනුයි. "එසා බුද්ධානුසාසනී" යනු: කුශල ධර්මයන්හි යම් මේ තොපමාවීමෙක් ඇද්ද එහිම උත්සාහ උපදවා ආර්‍ය්‍ය මාර්ගය වැඩීමෙක් ඇද්ද, මෝ භාග්‍යවත්වූ බුදුවරයන්ගේ අනුශාසනා වන්නීය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අතීත් ඵලය කුළුනැන්වීමෙන් වරියාපිටක දෙශනාව නිමවා වදාළසේක.

මෙසේ පරමාර්ථයන් නෙත හැර දක්වා වරියාපිටකාර්ථ කථාව අවසාන කරන්නාවූ භදන්තාචාර්‍ය්‍ය ධර්මපාල මහා සවාමිපාදයෝ

279. විසුද්ධවරිතෝ සත්ථා බුද්ධවරියඤ්ච පාරගූ
සබ්බවරියාසු කුසලෝ ලෝකාචරියෝ අනුත්තරෝ.

280. යං අච්ඡරියධම්මානං සබ්බමච්ඡරියාතිගෝ,
අත්තනෝ පුබ්බවරියානං ආනුභාවවිභාවනං.

281. දෙසෙසි තාථෝ වරියාපිටකං යඤ්ච තාදිතෝ,
ධම්මසඞ්ගාහකාථේරා සඞ්ගායිංසු තථේව ච

282. තස්ස අත්ථං පකාසෙතුං පොරාණට්ඨකථානයං,
නිස්සාය යා සමාරබ්ධා අත්ථසංවණ්ණනා මයා,

283. සා තත්ථ පරමත්ථානං නිධානෙව්ව ඨපිතරහං,
පකාසතා පරමත්ථ දීපනී නාම නාමතෝ

284. සමපත්තා පරිනිට්ඨානං අනාකුලවිනිච්ඡයා,
සාධිකා අට්ඨවීසාධ පාළියා භාණවාරතෝ.

285. ඉති තං සංඛරොනෙතන යං තං අධිගතං මයා,
පුඤ්ඤං තස්සානුභාවෙන ලොකනාථස්ස සාසනං

286. ඔහාහෙත්වා විසුද්ධාය සීලාදිපටිපත්තියා
සබ්බෙපි දෙහිනෝ හොන්තු විමුත්තිරසභාගිනෝ.

287. චිරං තිට්ඨතු ලොකස්මිං සම්මාසම්බුද්ධසාසනං.
තස්මිං සගාරවා නිච්චං හොන්තු සබ්බෙපි පාණිනෝ

288. සම්මා වස්සතු කාලෙන දෙවොපි ජගතීපති,
සද්ධම්මනිරතෝ ලොකං ධම්මෙනෙව පසාසතු'සි කිහ.

අම්බලම්ගොඩ සුතඤ්ඤරූම මහාවිරාධිපති,
විද්‍යාලොකවිශ්වවිද්‍යාලය පරිවෙණාධිශ්වර ශ්‍රී සද්ධම්මාරතිශ්වර
ධර්මකීර්ති ශ්‍රී විමලවංශ ධර්මානන්දාභිධාන
අමරපුරනිකායේ අධිකරණ නායක මහා සථවිරයන් වහන්සේ
විසින් පරෝපකාරය පිණිස හෙළු බසින් ලියනලද
සිංහල වරියා පිටකාර්ථවර්ණනාව මෙතෙකින් නිමාවිය.

ග්‍රන්ථකාරයන්ගේ පරිචයඃ

—ෟ—

අසති දක්ෂිණලඞ්කායාඃ - සම්‍යක්සම්බුද්ධශාසනේ,
පුරි විශ්‍රාමශාලාදි - සප්ත කාම්කානිවිශ්‍රුතා

මුනීනාමාශ්‍රමස්තත්‍ර - සුනාඤ්ඤාරාම සංඥයා,
විශ්‍රුතෝ විද්‍යතේ විද්‍ව - නිඝෙකතමිව භාසුරඃ

අභූත් තත්‍රාධිපෝ ධීමාන් - ශ්‍රී සුමඞ්ගල සංඥිතඃ
වල්ලිග්‍රාම යතීශස්‍ය - වර්ණිතස්‍ය කවීශ්වරෛඃ

ප්‍රසාදලබ්ධවිද්‍යෙන - මහාධන්‍යෝ මහාශයඃ,
ශ්‍රීඝෝෂිතසමාඛ්‍යාත - ඝෝෂිතෝ ගුණඝෝෂිතඃ

තදීයශිෂ්‍යපුත්‍රෙණ - ධම්මානන්දතපස්විනා,
විද්‍යාලොක සමාඛ්‍යාත - විද්‍යාමන්දිරශාසිතා

වයම්භීදුයිනී චයම්ඃ - පිටකාලඞ්කථා මයා,
සෙංහලීං වාචමාරොප්‍ය - ජනාඒතෙහ දර්ශිතා.

මදාචාර්‍යවරස්‍යෙව - ශිෂ්‍යපුත්‍රාද් විවක්ෂණාත්,
ප්‍රඥාලොකයුතෙලේඛඃ - සමරාම්‍යුපකෘතිරිහ.

යදත්‍ර විද්‍යතෙ භ්‍රාන්තිර් - මත්ප්‍රමාදසමුද්භවා,
සම්සන්තාං තාමුපෙක්ෂන්තාං - යථාඊදෘවිවෙචකාඃ.

ශ්‍රමෙණානෙන යත් පුණ්‍යං - සඤ්චිතං තඩිතාඝ මේ
භවතාද් භවතාං භූයඃ - කුශලාභ්‍යුදයාය ව.


ශම්.

ශුද්ධි පත්‍රය

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ.
3	23	මසීතිං	වාසීතිං
8	11	කිදිසා	කීදිසා
18	17	අන්නරාව	අන්තරාව
70	30	එකංසෙ	එකංතෙ
102	19	(ධතය)	(ධතඝ) ණය
121	7	සව්තිසා	තව්තිසා
132	14	රත්යහුල්	රත්යහුල්
136	20	හයෙතා	හයතෝ
140	16	ගොවර	ගොවරා
143	18	කහි	තහිං
148	11	රජ්ජ්රාවෝ	රජ්ජුරාවෝ
153	25	මානාඛ	මානඛ
183	13	සඛරොධෙ	සඹරොධෙ
188	21	සාමඤ්ඤු	සාමඤ්ඤු
189	7	නිසිතතසස	නිසිත්තාසස
191	4	කිව්වෙජනාහාං	කිවෙජතාහං
213	32	සොරාගෙන්	සොර ගෙන්
114	6	පබුජ්ඣතා	පබුජ්ඣිතා
115	10	කාළහුය	කළාහුය
116	17	කල්ලහි	කල්හි.
116	26	තතෝ	තතෝ
116	29	එකමතා	එකමතා
226	22	තාපය	තාපස
280	22	නිම්නන	නිමිත්ත
286	2	පරිම්	පිරිම් –
286	4	ප්‍රථිතාව	ප්‍රාථිතාව
289	23	තතාගතෝ	තථාගතෝ
290	12	තැන්තේ	තැත්තේ
290	20	ප්‍රාග්භාර	ප්‍රාග් භාර
294	17	සම්පත්තියයෙහි	සම්පත්තියෙහි

පිට	පෙළ	අශුඛ	ශුඛ.
296	12	උමමහා	උම්මහාය
302	13	බාහිරිවූ	බාහිරවූ
306	30	ප්‍රථජත	ප්‍රථග්ජත
309	31	කෘත්‍යයෙන්	කෘත්‍යයන්
308	22	කිරිම්	කිරීමය
314	19	ඉෂට	ඉෂ්ටා
328	2	ඇදි	ආදි
328	10	සැස	සැප.
328	32	තමා)	(තම්
330	10	පත්තය	පත්තිය.
335	21	වාතතාපාදි	වාතාතපාදි
335	29	පම්පත්ති	සම්පත්ති
336	28	(සක්ඛයෝ)	(සත්ත්වයෝ)
346	21	පරුෂයන්ගේ	පුරුෂයන්ගේ

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු